# THE WOMAN IN RED

# රතුවන හැඳි කත

සහ තවත්

## ෂර්ලොක් හෝම්ස් කථා



චන්දන මෙන්ඩිස්

# රතු වත හැඳි කත

සහ තවත්

ෂර්ලොක් හෝම්ස් කථා

අසංක්ෂිප්ත පරිවර්තනය

**චන්දන මෙන්ඩිස්**

**චන්දන මෙන්ඩිස් ප්‍රකාශන**

141/2, දුව් පාර, මැද්දගාන, කෝට්ටේ



Reading Purpose Only.. Not For Print.

www.sinhalelibrary.com

http://sherlockholmesinvestigations.blogspot.com

## දොස්තර ජෝන් වොට්සන් ගෙන්.......

මගේ මේ ඇමතුම ෂර්ලොක් හෝම්ස්ගේ මිතුරු මිතුරියන් වෙතයි. ඔහුගේ වර්තමාන තත්ත්වය ගැන ඔබ සියලුදෙනා දැනුවත් කිරීම මගේ යුතුකමක් යයි මම විශ්වාස කරමි.

රූමටික සන්ධි ප්‍රදාහය නිසා ඔහු ඉඳහිට, දණහිස් හා වැලමිටි ආබාධවලට ලක්වෙන බව සැබෑ ය. එහෙත් මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා හොඳ සනීපයෙන් ජීවත්ව සිටින බව ඇසීම ඔබේ සතුටට හේතු වනු ඇත. ඔහු පහුගිය අවුරුදු කිහිපය මුළුල්ලේම ජීවත්ව සිටින්නේ, ඊස්ට්බෝන් නගරයේ සිට සැතපුම් පහක් දුරින් පිහිටි කුඩා ගොවිපොළකයි. මේ කාලය ඇතුළත ද විසඳා දෙන මෙන් ඉල්ලා, ඔහු වෙත ඉදිරිපත් කෙරුණු ගැටලු සංඛ්‍යාව ඉතා විශාලය. ඉතාම අධික මුදලක් ගෙවීමට සූදානම් බව පවසා ඔහු වෙත ගෙන ආ ගැටලු රැසක් ද මේ අතර විය. එහෙත් හෝම්ස් මේ සියල්ල ප්‍රතික්ෂේප කළේය. ඒ අපරාධ පරීක්ෂණ වෘත්තියෙන් තමා විශ්‍රාම ගත්තේ සදහටම බව පවසමිනි. බ්‍රිතාන්‍යයට එරෙහිව ජර්මනිය යුද්ධ ප්‍රකාශ කිරීම නිසා, ඔහුගේ පිළිවෙතේ යම් වෙනසක් කිරීමට හෝම්ස්ට සිදුවිය. ඔහුගේ විශ්ලේෂණාත්මක බුද්ධියේ හා ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේ ප්‍රයෝජනය තම රට වෙනුවෙන් යෙදවීමට ඔහු තීරණය කළේය. ලෝක ඉතිහාසය වෙනස් මගකට යොමු කළ, හෝම්ස්ගේ ඒ කටයුතු පිළිබඳව ද මම මෙහි සඳහන් කරමි. මා ළඟ එකතු වී තිබුණු ඔහුගේ මුල් කාලයේ වික්‍රමාන්විත පරීක්ෂණ කිහිපයක් ද මේ පොතට ඇතුළත් කිරීමට මම අදහස් කළෙමි.

දොස්තර ජෝන්. එච්. වොට්සන්

http://sherlockholmesinvestigations.blogspot.com

# රතු වත හැඳි කත

සහ තවත්

ෂර්ලොක් හෝම්ස් කථා



මේසය උඩට වැටුණේ ඉතාම අලංකාර

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only.. Not For Print.

www.sinhalaelibrary.com

මෙම ග්‍රන්ථයට ඇතුළත් වන්නේ පහත සඳහන් කථාන්තරවල සිංහල පරිවර්තන ය.

1. THE JEW'S BREAST - PLATE
2. THE ADVENTURE OF THE SHEFFIELD BANKER
3. THE ADDLETON TRAGEDY - THE SINGULAR CONTENTS OF AN ANCIENT-BRITISH BARROW
4. THE CASE OF THE WOMAN IN RED
5. THE ADVENTURE OF THE GAMBLER

http://sherlockholmesinvestigations.blogspot.com

## පටුන


| | |
|---|---|
| 1. මැණික් පළඳනාව | 13 |
| 2. පොලිසියට ඕනෑකර තිබේ | 47 |
| 3. ශාපලත් සොහොන | 89 |
| 4. රතු වත හැඳි කත | 135 |
| 5. සූදුඅන්තුවා | 188 |


http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print.

The author – translator gratefully acknowledges his debt to the late Sir Arthur Conan Doyle and his estate for permission to use the characters and settings created by him.



# ෂර්ලොක් හෝම්ස්ගේ හදිසි "අභාවය"

1891 මැයි මස 04 වැනි දින ස්විට්සර්ලන්තයේ රයිෂන්බාක් දිය ඇල්ල අසලදී සිදුවූ මාරක පොරබැදීම පිළිබඳව අපේ පාඨකයන්ට මතක ඇතුවා නිසැකය. එහිදී කිහිඹුණු ප්‍රපාතය තුළට ඇද වැටුණු ෂර්ලොක් හෝම්ස් ගැන කිසිදු ආරංචියක් නොලැබිණි. ඉමහත් කම්පාවට පත් දෙස්තර වොට්සන් ලියා තිබූ කරුණු සමහරක් ඔබ වෙත යළි ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

"විශේෂඥයන් කිහිපදෙනෙකු විසින් රයිෂන්බාක් දියඇල්ල සමීපයේ අඩිපාර අවට පරීක්ෂණ කරන ලදී. හෝම්ස් හා මොරියාටි අතර ඇතිවූ පොර බැදීමේදී දෑත් පටලවා ගෙන සිටි දෙදෙනාම භයානක ප්‍රපාතයට ඇදවැටෙන්නට ඇති බවට සැකයක් නොමැති බැව් විශේෂඥයෝ පැවසූහ. මළසිරුරු සොයාගැනීමට උත්සාහ දැරීම කිසිසේත් කළ නොහැකි නිෂ්ඵල ක්‍රියාවක් බව දැනගන්නට ලැබිණි.

රයිෂන්බාක් දියඇල්ල සමීපයේ ගැඹුරු ප්‍රපාතයේ, උතුරන දියකඳ හා සුදෝසුදු පෙණකැටි මධ්‍යයේ, නීතිය සුරැකීම සඳහා හැමදා ක්‍රියා කළ වත්මන් පරපුරේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා ද භයානකම අපරාධකාරයා ද සදහටම වැළලී තිබෙනු ඇත."

- අන්තරාය අධ්‍යයක

මෙය සිදුවූයේ 1891 දී යැයි පැවසුණත් එය ලොවට හෙළිකිරීම සිදුවූයේ, ස්ට්‍රෑන්ඩ් සඟරාවේ 1893 නොවැම්බර් කලාපයෙනි. එය සඳහන්වූයේ මෙසේයි.

"ෂර්ලොක් හෝම්ස් මහතා මියයයි! ඔහුගේ මරණය පිළිබඳ තොරතුරු අපගේ නත්තල් (දෙසැම්බර්) කලාපයේ පළවේ."

"ටිට්බිට්ස්" නම් සඟරාවක ද මෙසේ පළ වී තිබිණ. "ෂර්ලොක් හෝම්ස්ගේ අකල් මරණයෙන් පසු, මහත් පාඨක ලෝකයම කම්පාවට පත්වී ඇත. ශෝකය දැනවෙන සංගීතය වාදනය කරන බැන්ඩ් වාදක කණ්ඩායම්, ලන්ඩන් නගරයේ කිහිපතැනක අපට දක්නට ලැබිණ. විදේශීය පුවත්පත් පවා මේ ආරංචිය ඔවුන්ගේ ප්‍රධාන පුවෘත්තිය ලෙස මුල්පිටුවේ පළකළහ. ස්ට්‍රෑන්ඩ් සඟරාවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී, සභාපති ජෝර්ජ් නිවුන්ස්, මෙම "ශෝකජනක" පුවත හෙළිකළේය. එවිට සෙසු සාමාජිකයෝ සිය විරෝධතා එල්ලකරමින් කථාවට බාධා කළහ.



Reading Purpose Only.. Not For Print.
www.sinhalaelibrary.com

"හෝම්ස් මහතාගේ ජීවිතය බේරාදෙන මෙන් අපි බැගෑපත්ව, නොනවත්වා ම ඉල්ලා සිටියා. එහෙත් එය ප්‍රතික්ෂේප වූ බැව් ඔබට දන්වා සිටින්නේ ඉමහත් සිත්වේදනාවෙන්" නිවුනස් කීය.

"පැරණි මිත්‍රයෙකු නොසිතූ මොහොතක අප අතරෙන් සමුගැනීම ගැන අපගේ සිත්වල ඇතිවූයේ දැඩි ශෝකයකි" ටිට්බිට්ස් අනාරාවම කීය.

සමහර පුවත්පත් හා සඟරාවල අවමඟුල් දැන්වීම හා ශෝකය පළකරමින් ලියූ කවි පංති පළවිණි.

"....... කොනන් ඩොයිල් මහතා ලොවුර බිහිකළ වීරයාගේ වික්‍රමාන්විත ක්‍රියා මාසයක් ගණනේ කියවමින් සිටි පාඨකයෝ ඔහුගේ අකල් වියෝවෙන් භීතියටත්, සංවේගයටත් පත්ව සිටිති. මෙම ඛේදජනක මරණය ස්විට්සර්ලන්තයේදී සිදුවී ඇත." දෙසැම්බර් 20 වැනිද "ස්කොච්" සඟරාවේ ලිපියක් සඳහන් විය.

"මාරක ලියුම රැගෙන ගිය ස්විස් ජාතික තරුණයා කෝ?" යනුවෙන් ස්ට්‍රෑන්ඩ් සඟරාවේ පළ වූ ලිපියක, මෙසේ ද සඳහන් විය. "...... මෙම ශ්‍රේෂ්ඨ රහස් පරීක්ෂකයාගේ මරණය ඇසින් දුටුවෙකුගේ නිවැරදි සාක්ෂි නොමැත."

හෝම්ස්ගේ 'මරණය' පිළිබඳ පුවත ඇමරිකාවේ පැතිර යෑදී "හාපර්ස් වීක්ලි" සඟරාවේ මෙසේ සඳහන් විය.

"....... ෂර්ලොක් හෝම්ස් මහතා මියගිය බවට ආරංචියක් පැතිර ගියත් ඔහුගේ මළසිරුර මෙතෙක් හමුවී නොමැත. කෙසේ වෙතත් එම් තරම් භයානක ප්‍රපාතයකට ඇද වැටුණු ඔහු බරපතල තුවාල ලබා මියයන්නට ඇතැයි විශ්වාස කළ හැක. හෝම්ස් මහතා කුමන තත්ත්වයෙන් හෝ ජීවතුන් අතර සිට හමුවේ යයි, ලොවපුරා ඔහුගේ මිත්‍රයෝ අපේක්ෂාවෙන් බලා සිටියහ."

1894 දී ආතර් කොනන් ඩොයිල් ගැන පුවත්පතකට ලියූ ලිපියක ඩබ්. ජේ. ඩෝසන් මෙසේ සඳහන් කරයි.

"...... බ්‍රිතාන්‍ය යටත් විජිතයට අයත් රටවල විනිශ්චයකාරවරු ජූරිය ඇමතීමේදී ෂර්ලොක් හෝම්ස්ගේ කියමන් උපුටා දක්වීමට පසුබට නොවූහ. සමහර අදක්ෂ පොලිස් භටයන් සාක්ෂිදීමේදී ගොත ගසමින් කරුණු පටලවා ගත්විට, ඔවුන් ලන්ඩනයේ මහේස්ත්‍රාත්වරුන්ගේ දැඩි දෝෂ දර්ශනයට ලක්විය. "ගිහිං ෂර්ලොක් හෝම්ස් හමුවෙලා මේ අවුල ලිහාගෙන එනවා. එතකොට ඔයාගේ මොළේ පෑදේවි" විසඳාගත නොහැකි වූ



අභිරහස් හා සොරකම් ගැන කථා කෙරුණු සෑම විටකම කාගේත් දෙතොලග රැව්දුන් නම වූයේ ෂර්ලොක් හෝම්ස් යන්නය."

හෝම්ස් "ඝාතනයට" ලක්වීම ගැන බැඩියෙන්ම චෝදනා එල්ල වූයේ, මොරියාර්ටි නොව කොනන් ඩොයිල්ට බව රහසක් නොවේ.

"උඹ නම් මහා තිරිසනෙක්....." එක් වයස්ගත කාන්තාවක් ඩොයිල්ට ලියා එව්වාය. තමාට ගිමිවූ දෝෂාරෝපණ ගැන 1896 දී කොනන් ඩොයිල් නිදහසට කරුණු දක්වමින් කියා සිටියේ.

"....... හෝම්ස් මහත්මයාගේ මරණය ගැන බොහෝ දෙනා මට චෝදනා එල්ල කරන්නේ ඉතාමු අකාරුණික හා කර්කශ අයුරෙන්. නමුත් මෙය සාමාන්‍ය මිනීමැරුමක් නොව ආත්මාරක්ෂාව සඳහා කළ මිනීමැරුමක් බව කියනු කැමැත්තෙමි. එදා මා ඔහු මරා නොදැමුවා නම්, ඔහු 'අතින්' මා ඉක්මනට මරණයට පත්වෙනු නිසැකය. නිරීක්ෂණ හා නිගමන ක්‍රමයක් ලෙස එකට අමුණමින්, නොනවත්වාම අභිරහස් කථා ලිවීම පහසු කටයුත්තක් නොවේ."

හෝම්ස් මියගියා නම් වහාම ඔහුගේ මරණ සහතිකය ඉදිරිපත් කරන්නැයි ඉල්ලමින් ලිපි යොමුකළ පාඨක සංඛ්‍යාව ද සුළු පටු නොවේ.

1893 දෙසැම්බර් 30 වැනිද "ෆුඩේ" නම් පුවත්පතේ කාටූන් චිත්‍රයක් පළවිය. ස්ට්‍රෑන්ඩ් සඟරාවේ ප්‍රධානියා වූ ජෝජ් නිවුනස් පියන විවෘත කළ මිනීපෙට්ටියක් දෙස බලාසිටියේ ඉමහත් කම්පාවෙනි. කොනන් ඩොයිල් ද මදක් ඈත සිට එදෙස බලාසිටියේය. මිනීපෙට්ටියේ තිබුණේ ෂර්ලොක් හෝම්ස්ගේ මළසිරුරය.

එහි සඳහන්ව තිබූ දෙබස මෙසේය.

**ජෝජ් නිවුනස් :** දෙයියන්ට ඔප්පු වෙච්චාවේ! ඩොයිල් මහත්තයෝ. ෂර්ලොක් හෝම්ස් මැරිලද?

**ෂර්ලොක් හෝම්ස් :** (මිනීපෙට්ටියේ සිට නිවුනස් අමතමින්) මෙතන ඒ තරම් අවුලක් නෑ ලොක්කා. මට පණදෙන්න පොවන්න ඕනකරන බෙහෙත මොකක්ද කියලා දෙස්තර මහත්තයා දන්නවා!

වන්දනා මෙන්ඩිස්



ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්



# මැණික් පළඳනාව

"වොට්සන්, මං ඔබට කලිනුත් කියල ඇති, සරසවියෙන් පිටවෙලා රහස්පරීක්ෂණ වෘත්තිය පටන්ගත් මගේ මුල් කාලය ගැන. මං මුලින්ම ලන්ඩනයේ නවාතැන් ගත්තේ මොන්ටේගු වීදියේ කාමරයක"

"ඒ බව නම් ඔබ මට කියල තියෙනවා" මම කීවෙමි. "ඒ වුණත් ඒ කාලෙ ඔබ යෙදුණු පරීක්ෂණවලින් එකක් හෝ දෙකක් ගැන පමණයි මට කියල තියෙන්නෙ"

"හොඳයි. මං ඔබට මෙතුවක් කාලයක් නොකියූ එකක් කියන්නම්" හෝම්ස් කීය. "මොන්ටේගු වීදියේ ඒ නිවස තිබුණේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට බොහොම ළඟින්. ඒ කියන්නෙ පෙනෙන දුරින්. ඒ කාලෙ මට පරීක්ෂණයක් ලැබුණේ බොහොම කලාතුරකින්. ඉතින් විවේක වෙලාවට මං ආශාවෙන් කළ දෙයක් තමයි කෞතුකාගාරයට යෑම, ගිහින් එහි තිබෙන කෞතුක වස්තූන් හොඳට කාලවේලා අරගෙන නැරඹීම. ඔය කාලෙදි තමයි මං එඩ්වෝඩ් මෝටිමර් සමග මිත්‍රත්වයක් ඇතිකර ගත්තෙ. ඔබ ඔහු ගැන විස්තර අහල තියෙනවද?"

"ඒ තරම් දුරට විස්තරයක් දන්නෙ නැහැ. නමුත් ඔහු පුරාවිද්‍යාව පිළිබඳ විද්වතෙක් කියල නම් අහල තියෙනවා"

"ඔහුගේ ක්ෂේත්‍රය පුරාවිද්‍යාව බව නිවැරදියි" හෝම්ස් කීය. "ඒ කාලයේ මැදපෙරදිග පුරාවිද්‍යාව ගැන ඉඳපු මුල් පෙළේ පුද්ගලයින් කිහිපදෙනාගෙන්, අංක එකේ විද්වතා මෝටිමර් කියල කිව්වොත් වඩාත් නිවැරදියි. ඊජිප්තු පුරාවිද්‍යාව ගැන පමණක් ඔහු පොත් ගණනාවක් ලියා තිබෙනවා. ඊජිප්තුවේ තීබ්ස්වල ඔහු කළ කැණීම්වලින්, මෝටිමර්, ෆේරෝ ජිනකගේ සොහොනක් හොයාගෙන තිබුණා. අවුරුදු දෙකක් තිස්සේ ඒ සොහොන්ගෙයි ජීවත්වෙමින් එහි මිහිදන් කළ අනෙක් පුද්ගලයන් ගැන ඔහු පර්යේෂණයක් කර තිබුණා. ඊට අමතරව ඔහු නයිල් නදිය අසබඩ රජවරුන්ගේ නිම්නයේත්, දිගින් දිගටම කැණීම් කළ අයෙක්. ඔබට මතකද මං දන්නෙ නෑ වොට්සන්, අර ක්ලියෝපැට්රාගෙ මමිය හමුවුණා කියල ගිය කතාව. ෆයිලේවල හෝරස් දෙවියන්ගේ



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print.

දෙවොලේ ඇතුළු කාමරයක තිබිලා ඒ මමිය* හොයාගත්තේ මගේ මිත්‍රයා වෝඩ් මෝටිමර් විසින්.

මේ ඔක්කොම කිරීමට ඔහුට හැකිවුණේ සෑහෙන තරම් තරුණ වයසේදී. ඒ කියන්නේ අවුරුදු තිස් එකේදී. ඔබ දන්නවා නේද බ්‍රිතාන්‍ය කෞතුකාගාරය පුරාවස්තු වර්ග අනුව කොටස් කිහිපයකට බෙදලයි තියෙන්නේ. මැදපෙරදිග පුරාවස්තුවලටම වෙන්වුණු කොටස තියෙන්නේ බෙල්මෝ වීථියට මුහුණදලා. ඒ නිසා ඒක ක්ෂේත්‍රයේ අය හඳුන්වන්නේ බෙල්මෝ වීථියේ කෞතුකාගාරය කියලා. මං ඔය කියන කාලෙදී, මේකෙ අධ්‍යක්ෂක තනතුර පුරප්පාඩුවුණා. පුරාවිද්‍යා අධිකාරිය මඟින් ඒකෙ අලුත් අධ්‍යක්ෂකවරයා හැටියට තෝරා ගැනුණේ මගේ මිත්‍රයා වෝඩ් මෝටිමර්. එම තනතුරට පත්වෙද්දී, ඔහුට නිලබලයෙන් තවත් ගෞරවයක් හිමිවෙනවා. ඒ තමයි ලන්ඩන් විශ්වවිද්‍යාලයේ, පුරාවිද්‍යා පීඨයේ, පෙරදිග පුරාවිද්‍යාව පිළිබඳ අංශ ප්‍රධාන තනතුර. ඒ වෙනුවෙන් ඔහුට හිමි වැටුප ගැන මං අමුතුවෙන් කියන්න උවමනා නැහැ.

කෞතුකාගාරයේ මෝටිමර්ට හිමිවුණු අලුත් තනතුර, ඔහුට ටිකක් අමාරු එකක් වීමට තිබුණේ එකම හේතුවයි. ඒ තමා, ඒ තනතුර ඊට කලින් දැරූ තැනැත්තාගේ කීර්ති නාමය. ඔහු තමයි පුරාවිද්‍යාව පිළිබඳ මහාචාර්ය ඇන්ඩ්‍රියස්. ඔහුත් මේ ක්ෂේත්‍රයේ සුප්‍රකට පුද්ගලයෙක්. මහාචාර්ය ඇන්ඩ්‍රියස්ගේ කීර්ති නාමය මුළු යුරෝපය පුරාම පැතිරුණු එකක්. ඔහුගේ දේශනවලට සවන්දෙන්න ලෝකය පුරාම රටවල්වලින් ශිෂ්‍යයින් ආවා. කෞතුකාගාරය ඉතාම ක්‍රමානුකූලව පවත්වාගෙන යෑම හා හොඳින් පාලනය කිරීම ගැන, මහාචාර්යතුමාට හැමෝගෙන්ම හිමිවුණේ අප්‍රමාණ ගෞරවයක්. මෙතරම් හොඳට කෞතුකාගාරයේ කටයුතු කරගෙන ගිය මහාචාර්ය ඇන්ඩ්‍රියස්, වයස අවුරුදු පනස්පහේදී ඒක්වරම තම ඉල්ලා අස්වීම භාරදුන්නා. ඔහු ඉතා ආශාවෙන් කළ රැකියාව වුණත්, විනෝදාංශය වුණත් මේ කෞතුකාගාරයේ කටයුතු පවත්වාගෙන යෑම. ඉතින් ඔහු හිටිහැටියේම ඉල්ලා අස්වීම භාරදුන්නාම ඒක කාගේත් මවිතයට හේතුවුණා.

මහාචාර්යතුමා පදිංචිව හිටියේ කෞතුකාගාරයේ භාරකරු හැටියට එතැනම තිබූ නිලනිවසේ. රැකියාවෙන් අස්වීම නිසා දැන් ඉතින්

* නරක් නොවන සේ බෙහෙත් ගැල්වූ ඊජිප්තු රජවරුන්ගේ මළසිරුරු





ඒකෙනුත් ඉවත්වෙන්න මහාචාර්ය ඇන්ඩ්‍රියස්ට සිදුවුණා. ඔහු හා ඔහුගේ දියණිය එයින් ඉවත්වෙලා යද්දී, නිල නිවස ලැබුණේ මගේ මිත්‍රයා වෝඩ් මෝටිමර්ට. අවිවාහකයෙක් වුණු ඔහු, ඒ නිවසේ පදිංචිවුණේ තනියම.

මෙම තනතුරට මෝටිමර් පත්වීම ගැන ඔහුට මහාචාර්ය ඇන්ඩ්‍රියස් ලියුමක් එවා තිබුණා. ඒකෙ මෝටිමර්ට සුභපැතුම් දීර්ඝව ලියා ඔහු මේ ක්ෂේත්‍රයේ පෙන්වා ඇති දක්ෂකම් නිසා, මෝටිමර් මේ තනතුරට හැම අතින්ම සුදුස්සෙකු බව මහාචාර්යතුමා කියා තිබුණා. කෞතුකාගාරයේ මෙම අංශයේ කෞතුක භාණ්ඩ විශාල ප්‍රමාණයක් තිබුණා. මේ හැම එකක්ම තමන්ගේ අනුප්‍රාප්තිකයාට පෙන්වලා විස්තර කරදෙන්න, මහාචාර්ය ඇන්ඩ්‍රියස්ට උවමනා වී තිබුණා. ඉතින් ඒ කටයුත්තට යොදාගත් දවසේ මාත් මෝටිමර් සමඟ ගියා.

මෙතරම් කාලයක් තමා ඉතා ආදරයෙන් රැකබලාගත් කෞතුක භාණ්ඩ පෙන්වාදෙමින්, මහාචාර්යතුමා අපව කෞතුකාගාරය පුරාම කැඳවාගෙන ගියා. මේ කටයුත්තට තවත් දෙදෙනෙක් සහභාගිවුණා. ඒ තමයි මහාචාර්යතුමාගේ එකම දියණිය එල්සි ඇන්ඩ්‍රියස් මෙනෙවිය සහ කපිතාන් විල්සන් නම් තරුණයෙක්. එල්සි ඇන්ඩ්‍රියස් මෙනෙවිය ඉතාම සුන්දර තරුණියක්. ඇය සමඟ සිටි කපිතාන් විල්සන්, මේ තරුණියගේ අතගැනීමට බලාපොරොත්තුවෙන් හිටි තරුණයා බවත් අපට එදා දැනගන්න ලැබුණා.

කෞතුකාගාරයේ තිබුණා කාමර පහළොවක්. ඒ අතරින් ඉතාම විශිෂ්ට තැනක් ගත්තේ බැබිලෝනියන්, සිරියන් පුරාවස්තු තිබුණු කාමර සහ මැද ශාලාව. ඒකෙ තිබුණේ ඊජිප්තු සහ යුදෙව් පුරාවස්තු. මහාචාර්යතුමා සාමාන්‍යයෙන් කතාබහ අඩු කෙනෙක්. රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකර සිටි ඔහුගේ හිසේ, ඉදිරිපසින් තට්ටය පෑදිලා. එක් එක් පුරාවස්තුව පෙන්වලා ඒ ගැන විස්තර කර දෙද්දී ඔහුගේ දෙනෙත් දීප්තියෙන් බැබළුණා. ඒවායේ දුර්ලභකම ගැනත් වටිනාකම ගැනත් ඔහු විස්තර කළා. මේ තරම් ආදරයෙන් ඔහු රැකබලාගත් දේවල්, වෙනත් කෙනෙකුගේ භාරයට පත්කරන්නට සිදුවීම ගැන ඔහුගේ හිතට දැනෙන්න ඇත්තේ දැඩි ශෝකයක්.

"මෝටිමර් මහත්මයා" මහාචාර්යතුමා කිව්වා. "ඔබ වැනි මේ ක්ෂේත්‍රයේ පළපුරුදු විද්වතෙකුට මේවා අලුත් දේවල් නෙමෙයි. ඒ වුණත් ඔබේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහත්තයා නම් මේ දේවල් බලන්න කැමැතිවේවි."



"මේ තරම් දුර්ලභ වස්තුවක් යුරෝපයේ මොනම කෞතුකාගාරයකවත් නැහැ"



Reading Purpose Only.. Not For Print.
www.sinhalaelibrary.com



එක් වීදුරු අල්මාරියක උඩින් බැලූ මට අපූරු වස්තුවක් දකින්න ලැබුණා. එය එක පැත්තක් අඟල් හයක් පමණ දික්වූ, හරි හතරැස් රත්රන් ආභරණයක්. ඒක දෙපැත්තේ රත්රන් කොකු දෙකක් තිබුණා. රත්රන් කොටුව මැද තිබුණා, ඊට සවිකළ මැණික් ගල් දොළහක්. මෙවා විවිධ වර්ණවල මැණික්. නමුත් ඒවා එකම හැඩයේ, එකම ප්‍රමාණයට කැපූ ඒවා. ඒ හැම මැණිකක් මතුපිටම ඊජිප්තු රූපාක්ෂර කැටයම් කර තිබුණා. බැලූ බැල්මට මට මෙය පෙනුණේ පුංචි දියසායම් පෙට්ටියක් වගෙයි.

"හෝම්ස් මහත්මයා. ඔබ අහල තියෙනවද යුරිම් සහ තම්මිම් ගැන?" මහාචාර්යතුමා මගෙන් ඇහුවා.

"මං ඔය වචන අහල තියෙනවා. ඒත් ඒ මොකක් ගැනද කියල මං හරිහැටි දන්නේ නෑ" මං කිව්වා.

"යුරිම් සහ තම්මිම් කියන්නේ මෙන්න මෙකට" මහාචාර්යතුමා කිව්වා. "යුදෙව් ආගමේ ඉහළම පූජකවරයා ඔහුගේ බෙල්ලේ මේ ආභරණය පළඳිනවා. ඔවුන් මේක සලකන්නේ ඉතාම උතුම් ශුද්ධ වූ වස්තුවක් හැටියට. හරියට රෝමන්කාරයින් කැපිටෝල්හි සිබිලයින් ග්‍රන්ථවලට දක්වූ භක්තියට සමානයි. ඔබට පෙනෙනවා ඇති මේකෙ මැද, මැණික්ගල් දොළහක්, පේළි තුනකට ඇබ්බ බව. ඒවා හැම එකක්ම වර්ගයෙන් එකිනෙකට වෙනස්. වම්පැත්තේ ඉහළ කෙළවරෙන් පටන්ගත්තාම රතුකැටයක්, වෛරෝඩියක්, මරකත මැණිකක්, ඉන්ද්‍රනීල මැණිකක්. ඊළඟ පේළියේ සහ පුෂ්පරාගයක්, පද්මරාගයක්, දියමන්තියක් සහ අගස්තියක්. ඊළඟ පේළියේ අග්නි මාණික්‍යයක්, නිල් පුෂ්පරාගයක්, කළු දියමන්තියක් සහ චන්ද්‍රකාන්ති මාණික්‍යයක්"

ඔබට කියන්න වොට්සන් ඒක ඉතාම අලංකාර ආභරණයක්. ඒකෙ තිබුණේ ඕනෑම කෙනෙකුගේ සිත් වශීකරවන පෙනුමක්.

"මේ පළඳනාවෙ මොකුත් ඓතිහාසික වටිනාකමක් තියෙනවද?" මං ඇහුවා.

"මේක ඉතාම පෞරාණික වස්තුවක්" මහාචාර්යතුමා පිළිතුරු දුන්නා. "ඒ වගේමයි. මේක අපට මිලකරන්න බැරි තරම් වටිනවා. සොලමන් රජුගේ දේවමන්දිරයේ තිබූ මුල්ම ළය පළඳනාව මේකය කියල හිතන්න අපට සාක්ෂි තියෙනවා. මේ තරම් වටිනා, මේ තරම් දුර්ලභ වස්තුවක් යුරෝපයේ මොනම කෞතුකාගාරයකවත් නැහැ. ඒ ගැන මං ඔබට සහතික කරල කියන්නම්. මෙතැන ඉන්න කපිතාන්

විල්සන් වටිනා මැණික් පිළිබඳ විශේෂඥයෙක්. මේව මොන තරම් අගනා, පළඳු නොමැති මැණික්ද කියලා ඔහු ඔබට කියාවි."

"කපිතාන් විල්සන් ඔහුගේ පෙම්වතිය එක්ක හිටියේ වීදුරු කැබිනෙට්ටුවට අනෙක් පැත්තේ. ඔහු මුහුණේ කිසි හිනාවක් නොතිබුණු ආඩම්බර පුද්ගලයෙක්.

"ඔව්. ඒක ඇත්ත" ඔහු කිව්වා. "මීට වඩා අලංකාර මැණික් ගල් මං ජීවිතේටම දැකල නෑ"

"ඊළඟට මේ ගල් රත්තරන් තහඩුවට සවිකරල තියෙන හැටි හරිම අපූරුයි. පුරාණ කාලයේ මිනිස්සු මේ තරම් දක්ෂ......" මහාචාර්යතුමා යමක් කීමට හදද්දි කපිතාන් විල්සන් ඒකට බාධාකරල මෙහෙම කිව්වා.

"රත්රන් කැටයම් ශිල්පය ගැන කියනවා නම් ඒක වඩාත් හොඳින් පෙනෙනවා, අර ඉටිපන්දම් හතක් සවිකළ හැකි පුවරුවේ" ඔහු කිව්වේ තවත් කැබිනෙට්ටුවක තිබූ රනින් නිමකළ වස්තුවක් පෙන්වමින්. "එකවර ඉටිපන්දම් හතක් සවිකළ හැකි මෙහෙ තිබෙන සියුම් කැටයම් ඔවුන් කොහොම කළාද කියල අපට හිතාගන්නත් අමාරුයි. අද කාලෙ තියෙන නවීන යන්ත්‍රසූත්‍රවලින් වත් මේ වගේ සියුම් කැටයම් කිරීම අමාරු වැඩක්"

මේ වගේ දුර්ලභ පුරාවස්තු ගැන විස්තර, ඒ ක්ෂෙත්‍රයේ ඉහළම විද්වතෙකුගෙන් අහන්න ලැබීමත් වාසනාවක් කියලයි මට හිතුණේ.

පුරාවස්තු පෙන්වාදීමේ කටයුත්ත මහාචාර්යතුමා අවසන් කළේ, මුළු කෞතුකාගාරයම මගේ මිතුරාට භාරදෙමින්. මහාචාර්යතුමා ගැන මගේ හිතේ ඇතිවුණේ දුකක්. ඒ වගේම මෝටිමර් මෙවැනි වටිනා තැනක අධිපති තනතුර තරුණ වයසෙදීම ලබාගන්න තරම් වාසනාවන්ත වුණා. ඒක ගැන කෙනෙකුගේ හිතේ ඊර්ෂ්‍යාවක් ඇතිවුණත් පුදුමයක් නෑ. සතියක් ගතවෙද්දි වෝඩ් මෝටිමර් බෙල්මෝර් වීථියේ කෞතුකාගාරය නිල වශයෙන් භාරගෙන, එහි නිල නිවාසයේ පදිංචියටත් ආවා.

සතිදෙකක් පමණ ගතවී ගියා. තමන්ට අලුත් තනතුරක් ලැබුණු සතුට වෙනුවෙන් මගේ මිත්‍රයා පුංචි සාදයක් පවත්වන්න තීරණය කළා. අපි අවිවාහක යාළුමිත්‍රයන් හයදෙනෙක් හිටියා. ඔහු අපි හයදෙනාට රාත්‍රී කෑමට ගෙදරට එන්න කියල ආරාධනා කළා. එද රෑ කෑම ඉවරවෙලා කවුරුත් විසිර යද්දි මෝටිමර් හෙමින්ම මගේ





කබායේ අතින් අල්ලා ඇද්දා. මට තේරුණා ඔහු ඒ කළේ සංඥාවක් බව. මාව තවත් ටිකක් වෙලා රඳවාගන්න ඔහුට උවමනාවුණු බවයි මට හිතුණේ.

"හෝම්ස්. ඔබ ඉන්නේ ළඟනේ" ඔහු කිව්වේ කෙඳිරිලි හඬෙන්. "ඔය යාර සීයක දුර කොයිවෙලේ ගියාම මොකද? මං කැමතියි ඔබ තවත් ටිකක් වෙලා මා එක්ක රැඳෙනවා නම්. අපි හෙමින් සීරුවේ සුරුට්ටුවක් බිබී කතාකරමු. මට තියෙනවා ඔබගෙන් පොඩි උපදෙසක් ගන්නත්."

ඉතින් මං සුවපහසු ඇඳි පුටුවක වාඩිවෙලා, මෙට්‍රොනාස් සුරුට්ටුවක් දල්වා ගත්තා. ඔහුගේ අන්තිම අමුත්තත් පිටවෙලා ගියාට පස්සේ, මෝටිමර් මං ළඟට ඇවිත් පුටුවක් ඇදගෙන හිඳගත්තා. තමන්ගේ කබායේ ඇතුළුසාක්කුවෙන් ලිපියක් එළියට ගත් ඔහු, එය මා දිහාවට දිගු කළා.

"හෝම්ස්. මට අද උදේ තැපෑලෙන් මෙන්න මේ ලියුම ලැබුණා. මෙක නිර්නාමික ලියුමක්. මෙක කියවලා බලල මට උපදෙසක් දෙන්න" ඔහු කිව්වා.

"වොට්සන්. ඒ වගේ ලියුමක් ලැබුණාම දුන් කාලෙ මං යොදන සූක්ෂම පරීක්ෂණ ක්‍රම ඔබ දන්නවා ඉතින්. ඒ කාලෙත් මං ඒවා බොහොමයක් දැනගෙන හිටියා. නමුත් මෝටිමර්ගේ ලියුම පරීක්ෂාකරන්න, මං ඒවා යොදගත්තේ නැහැ. මං මුලින්ම ලියුම කියවා බැලුවා.

**"මහත්මයාණනි,**

**ඔබේ භාරයට පත්වී ඇති වටිනා පෞරාණික වස්තූන් ගැන, දැඩි සෝදිසියකින් සිටීම සුදුසු බව ඔබට දන්වනු කැමැත්තෙමි. දැනට මේ සඳහා යොදා තිබෙන්නේ එක් මුරකරුවෙකු පමණි. මෙය කිසිසේත් ප්‍රමාණවත් නැත. ඔබේ භාණ්ඩ පරෙස්සම් කර ගැනීමට දැඩි අවධානයකින් සිටින්න. නැතිනම් ඔබට මුහුණදීමට සිදුවන්නේ කිසිසේත් යළි නිවැරදි කරගැනීමට නොලැබෙන අවාසනාවන්ත සිදුවීමකටයි"**

"එපමණද?" මං ඇහුවා

"ඔව් එපමණයි" ඔහු කිව්වා. "ඔය ලියුමෙන් ඔබට මොනවද හිතාගන්න පුළුවන්?"

"අපට මෙන්න මේ දේ මුලින්ම හිතාගන්න පුළුවනි" මං කිව්වා. "මේ ආයතනයේ ආරක්ෂාව සඳහා යොදන්නේ එක් මුරකරුවෙකු පමණක් බව දන්නේ කවුද?"

"කීපදෙනෙකුම හොඳාකාර දන්නවා. එය අනුමාන කරන තවත් අය ඉන්න පුළුවන්."

"මට ස්ථිරවම කියන්න පුළුවනි, මේක ලියල තියෙන්නේ, ඔබ මුලින් කියූ හොඳින්ම දන්නා කීපදෙනාගෙන් කෙනෙක්. ඔබ මේ තනතුරට නම් කළාට පස්සේ ඔබ වෙත ලැබුණු පෞද්ගලික ලියුම් ඔබ ළඟ තියෙනවාද?"

"ඔව් මා ළඟ ලියුම් කිහිපයක් ඇති" කී ඔහු ලියුම් කීපයක් අරගෙන ආවා. මං ඒවා ටිකක් පරීක්ෂාකර බැලුවා. එයින් එක් ලිපියක අත් අකුරුවල හා සලකුණුවල, මුල් ලියුමේ ඒවාට තරමක සමානකමක් මා දුටුවා.

"මේ බලන්න මෝටිමර්" මං කිව්වේ ලියුම් දෙක එකට ළංකරමින් "දෙවැනි ලියුමේ ලියා ඇති committed හා පළමු ලියුමේ congratulate කියන වචන දෙක බලන්න. ඒ දෙකේම තියෙන e අකුරේ ලොකු සමානකමක් තියෙනවා. එහෙම නේද? ඊළඟට බලන්න දෙවැනි ලියුමේ I do කියලා ලියද්දී ඔහු කැපිටල් I අකුර ලියා ඇතිහැටි. පළමුවැනි ලියුමේ I would කියලා ලියද්දීත් ඒ ආකාරයේම I අකුරක් නේද ලියල තියෙන්නේ. ඊළඟට බලන්න ලියුම් දෙකේම සිම්පල් i අකුරු දිහා. එතැනදී ඔබට පෙනේවි i අකුරට තිත තැබීමේදී දෙකේම තියෙන්නේ එකම ආකාරයේ i i තිතක් බව. වෙලාගන කළොත් මේ වගේ සමානකම් රාශියක්ම අපට හොයාගන්න පුළුවනි. මේ ලියුම් ලියූ තැනැත්තා වාක්‍යයක් අවසන් කිරීමේදී නැවතීමේ ලකුණ යොදන්නේ තිතකට වඩා ඉරි කෑල්ලක් වගේ. බලන්න එක ලියුමක clear, සහ අනිත් ලියුමේ charge,

ඔබට අද උදේ ලැබුණු ලියුම ලියද්දී ඔහු තරමක උත්සාහයක් දරල තියෙනවා, අත් අකුරුවල වෙනසක් කරන්න. නමුත් පහුවෙද්දී ඒක අනපුරු වෙලා නැත්නම් අමතක වෙලා ගිහින්. මට සහතික වෙන්න පුළුවන් නිර්නාමික ලියුම ලියලා තියෙන්නේ, ඔබට සුභ පතලා මේ ලියුම එවූ තැනැත්තා. ඒක එව්වේ කවුද?" මං ඇහුවා.

"හෝම්ස්. ඒක එව්වේ මහාචාර්ය ඇන්ඩ්‍රියස්!"



http://sherlockholmesinvestigations.blogspot.com



මං මගේ මිත්‍රයා දිහා බැලුවේ මවිතයට පත්වෙලා. මෝටිමර්ට ශුභපතා එවා තිබුණු ලියුම අනික් හැත්තු හරවා මං බැලුවා. ඒකෙ තිබුණා මාටින් ඇන්ඩ්‍රියස් කියලා ඔහුගේ අත්සන.

අත්අකුරු විද්‍යාව ගැන තරමක දැනීමක් ඇති කෙනෙකුට වුණත් මෙයෙ තේරුම් ගන්න පුළුවනි" මං කිව්වා. "මේ නිර්නාමික ලියුම ලිව්වේ මහාචාර්යතුමා. හොරුන්ගෙන් පරෙස්සම් වියයුතුයි කියලා අලුත් භාරකාරයාට අනතුරු අඟවන්නයි එහෙම ලියුවේ. නමුත් ඔහු ඒක මේ ආකාරයට දැනුම් දුන්නෙ ඇයි? ඒකට හේතුව නම් මට කියන්න බැහැ"

"අන්න ඒ කාරණය තමා මං හෝම්ස්ගෙන් අහන්න සූදානම් වුණේ" මෝටිමර් කිව්වා. "සොරුන් ගැන භයක් තියෙනවා නම් ඇයි මහාචාර්යතුමාට බැරි ඒක පෞද්ගලිකවම මට දැනුම්දෙන්න?"

"මෝටිමර්. ඔබ බලාපොරොත්තුවෙන්නේ ඒ ගැන ඔහුගෙන් අහන්නද?"

"මං කළයුත්තේ මොකක්ද? මට ඒක හිතාගන්න අමාරුයි. සමහරවිට ඔහු කියාවි ඒ නිර්නාමික ලියුම එව්වේ ඔහු නෙමෙයි කියලා. එතකොට?"

"කොහොම වුණත් මෝටිමර්" මං කීවා. "මේ අවවාදය දීල තියෙන්නේ මිත්‍රශීලීව. මං ඔබ නම් මං ඒක ඒ හැටියෙන්ම ක්‍රියාත්මක කරනවා. මේ වටිනා බඩු මංකොල්ලකෑමක් නවත්වන්න තරම් ඔබ යොදා ඇති ආරක්ෂාව සෑහෙනවද?

"මට හිතෙන්නේ එහෙමයි" මෝටිමර් කිව්වා. "මහජනයාට මේ කෞතුකාගාරය නරඹන්න දෙන්නෙ උදේ 10 ඉඳන් හවස 5 වෙනතුරු. හැම කාමර දෙකක් සඳහාම භාරකරුවෙක් ඉන්නවා. ඔහු ඒ කාමර දෙකේ බඩු ගැන හොඳ කල්පනාවෙන් ඉන්නේ"

"ඒ වුණත් රෑට කොහොමද ආරක්ෂාව?"

"මහජනයා පිටවෙලා ගියාම පස්සේ අපි ඉස්සරහ යකඩදොර වහලා යතුරුදමනවා. ඒක මොන හොරෙකුටවත් කඩන්න බැහැ. මුරකාරයා දක්ෂ පුද්ගලයෙක්. ඔහු ඉන්නේ කෞතුකාගාරයට ඇතුළුවෙන තැනම තියෙන ඔහුගේ කුටියේ. නමුත් ඔහු හැම පැය තුනකටම වරක් හැම කාමරයක්ම පහුකරගෙන ඇවිද යනවා. හැම කාමරයකම රාත්‍රිය පුරා විදුලි බුබුලක් දැල්වෙනවා"

"මීට වඩා අමතර දෙයක් කරන්න අමාරුද?" මං ඇහුවා. "ඒ කියන්නේ දවල් කාලයේ සේවයේ යෙදී ඉන්න ආරක්ෂකයන් පිරිස රෑටත් යොදගන්න?".



http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙම දෙයක් අපට කරන්න අමාරුයි හෝම්ස්" ඔහු කිව්වා. "ඒකට අපට විශාල මුදලක් අවශ්‍යවෙනවා. ඉහළින් මුදල් අනුමත නොවී මට බෑ මොනම තීරණයක්වත් තනිවම ගන්න"

"එහෙම නම් ඔබ පොලීසියට දන්වලා පොලිස් ආරක්ෂාව ලබාගන්න" මං කිව්වා.

"ඔව් ඒක හොඳයි. කෞතුකාගාරයේ දොරටුව ළඟ රෑ දවල් දෙකේම පොලිස් භටයෙකු රඳවා තියන්න කියලා මං ඔවුන්ගෙන් ඉල්ලා හිටින්නම්"

"ඔව්. එහෙමවත් කරන එක හොඳයි" මං කිව්වා. "නිර්නාමික ලියුම එවූ නැනැත්තා එහෙම කරන්න ඇත්තේ මොකක් හරි හේතුවක් ඇතුව. වෙන කරන්න දෙයක් නෑ. අනාගතයේ සිදුවෙන්නේ මොකක්ද කියලා බලාඉඳීම පමණයි ඔබට කරන්න පුළුවන්. ඔහු එහෙම කළේ ඇයි කියලා බාගවෙලාවට එතකොට දැනගත හැකිවේවි"

ඒ ගැන කතාබහ අපි එතැනින්ම අවසන් කළා. ආපහු මගේ කාමරයට ආවට පස්සෙත් මට මතක්වුණේ මේ ගැන. මහාචාර්ය ඇන්ඩ්‍රියස් මේ විදියට නිර්නාමික ලිපියක් එව්වේ ඇයි? මං දිගින් දිගටම කල්පනා කළේ ඒ ගැන. කෞතුක භාණ්ඩවලට අවදානමක් ඇති බව ඔහුට වැටහෙන්න ඇති. හොරකමක් ළඟදීම වෙයි කියල ඔහු ඉවෙන් වගේ තේරුම්ගත්තද? එහෙම නම් ඒක කෙළින්ම මෝටිමර්ට දැනුම්දෙන්න ඔහු අකමැති ඇයි? මේ ගැන කල්පනාකරන්න, ගන්නාම එය මගේ මොළේ තවතවත් අවුල්කරන ප්‍රහේලිකාවක් වුණා. ඒ නිසාම එද රෑ සැලහෙන වෙලාවක් යනතුරු මට නින්ද ගියේ නෑ.

පහුවද උදේ මට ඇහැරුණේ, මං සාමාන්‍යයෙන් අවදිවෙන වෙලාවත් පහුවෙලා. මං ඒ වේලාවේ අවදිවුණෙත් පුදුමාකාර විදියකට. කවුදෝ මගේ කාමරයේ දොරට නොනවත්වා තඩිබාන හඬෙන් මං තිගැස්සිලා ඇහැරුණා. දොර ඇරිය මට දකින්න ලැබුණේ මගේ මිත්‍රයා මෝටිමර්. ඔහුගේ මුහුණේ තිබුණේ මහ පටලැවිල්ලකට මුහුණදුන් ලකුණු. ඔහු සාමාන්‍යයෙන් බොහොම පිළිවෙළට අඳින පළඳින කෙනෙක්. නමුත් එද උදේ ඔහුගේ ඇඳුම් පැළඳුම්, නිකම් ඇඟේ පටලවාගත් ගමන්.

"කෞතුකාගාරයට හොරු පැනලද?" මං ඇහුවා.

"එහෙම දෙයක් තමයි මට පෙනෙන්නෙ" ඔහු කිව්වා, "අර වටිනා මැණික්......! අර යුරීම හා තම්ම් ළය පළඳනාවෙ මැණික්.....!" ඔහු



http://sherlockholmesinvestigations.blogspot.com



කිව්වේ අමාරුවෙන් හතිදමමින්. "මං මේ පොලීසියට යන ගමන්. හෝම්ස් ඔබට පුළුවන් ඉක්මනින් එතැනට යන්න!" කී ඔහු දිව්වා.

මං ඉක්මනට හැඳ පැළඳගෙන එතැනට ගියා. නමුත් මං යනකොටත් ඔහු පොලිස් නිලධාරයෙක් කැඳවාගෙන එතැනට ආපසු ඇවිත්. ඒ සමගම තවත් වයස්ගත මහත්මයෙකුත් එතැනට ඇවිත් හිටියා. ඔහු දියමන්ති වෙළඳාම පිළිබඳ සුප්‍රසිද්ධ ජෝසන් සහ සමාගමේ අධ්‍යක්ෂකවරුන්ගෙන් කෙනෙක්. මැණික් ගැන විශේෂඥ දැනුමක් තිබූ ඔහු පර්විස් නම් මහත්මයෙක්. මැණික් විශේෂඥයෙකුගේ අදහස් උවමනාවුණු හැමවිටකම, පොලීසිය කැඳෙව්වේ පර්විස් මහත්මයාව. ළය පළඳනාව එළියට අරගෙන කැබිනෙට්ටුවේ වීදුරුව මත තියලා, හැමෙගේත් දෑස් ඒකට යොමුවී තිබුණා.

"මෙකෙ මැණික්ගල් කවුරුන් හෝ ගලවන්න උත්සාහ කරල තියෙනවා" මෝටිමර් කිව්වා. "අද උදේ මං මෙතැනින් යද්දී, ඒ දිහා බැලූ ගමන් මට එය පෙනුණා. මං ඊයෙ හැන්දෑවෙත් ඕක පරීක්ෂාකරල බැලුවා. ඒ හින්ද මේක වෙලා තියෙන්නේ ඊයෙ රාත්‍රියෙ බව මට විශ්වාසයි"

ඔහු කිව්වා වගේ ඒ පළඳනාව, කවුරුන් හෝ ආයුධ මගින් කළ පළුදුවීමකට ලක්වී තිබුණා. ඒක මං හැඳිනිල්ලම දුටුවා. උඩින්ම තිබූ මාණික්‍ය පේළිය - ඒ කියන්නේ රතු කැටය, වෛරෝඩිය, මරකත මැණික හා ඉන්ද්‍රනීල මාණික්‍යය වටේටම රත්රන් තහඩුවේ පළුදුවීම් තිබුණා. හරියට කවුරුන් හෝ ඒ වටේට ආයුධයකින් පළුදු කළා, සීරුවා වගේ. මැණික් ගල් හතර එලෙසම තිබුණා. නමුත් මේ හානිය වෙලා තිබුණේ වටේට තිබූ රත්රන් රාමුවට පමණයි.

"මට නම් පෙනෙන්නේ" පොලිස් නිලධරයා කිව්වා "කවුරුන් හරි මේ මැණික්ගල් ගලවා ඉවත්කරන්න උත්සාහ කරලා වගෙයි"

"මගේ භය තියෙන්නේ" මෝටිමර් කිව්වා "ඔහු උත්සාහ දරලා විතරක් නොවෙයි, ගල් හතර ඉවත්කරගන්න සමත්වෙලා දෝ කියලයි. බොහොම දක්ෂ ලෙස ඇත්ත මැණික්වලට සමානව සකස්කළ ව්‍යාජ ගල් හතරක්, හොඳ මැණික් තිබුණු තැන්වලට සවිකරලා"

මැණික් විශේෂඥයාගේ හිතෙත් එවැනිම සැකයක් ඇතිවුණා. ඔහු අන්වීක්ෂයක උපකාරයෙන් එම මැණික් සියුම්ව පරීක්ෂාකර බැලුවා. ඉන්පසු නොයෙක් අන්දමේ පරීක්ෂාවන්ට එම මැණික් භාජනය කළා. අන්තිමේදී ඔහු මගේ මිත්‍රයාට කථාකළේ බොහොම



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

සන්තෝෂයෙන්. "මගේ ශුභපැතුම් පිළිගන්න මෝටිමර් මහත්මයා. මං ඔබට සහතික වෙන්නම්. මේ මැණික්ගල් හතර ඇත්ත මැණික්ගල්. ඒවා ව්‍යාජ ඒවා නොවෙන බවට මං සහතික වෙනවා"

"මොනවා? ඔබට හොඳටම විශ්වාසද ඒ බව?"

"ඔව් මහත්මයා. මට අබමල් රේණුවක සැකයක් නෑ" පර්විස් මහත්මයා කිව්වා. "මැණික් විශේෂඥයෙකු ලෙස මා ලබා ඇති කීර්තිනාමය ඇපයට තබා, මං ඔබට සහතිකය දෙනවා. මේ ගල් තත්ත්වයෙන් ඉතාම අනර්ඝ මැණික් ගල් හතරක්"

මගේ මිත්‍රයාගේ සුදුමැලිවී තිබුණු මුහුණ යළිත් රෝස පැහැයට හැරුණා. ඔහු කථාකළේ සැනසුම් සුසුමක් හෙළමින් "දෙවියන්ට ස්තූතිවේවා. සත්‍යය එය නම්, මෙක කළ අහාර තක්කඩියට උවමනා වෙලා තිබුණේ මොකක්ද?"

"බාගවෙලාවට ඔහු මේ මැණික් ගල් ඉවත්කරන්න උත්සාහ දරන්න ඇති. නමුත් ඔහුගේ ඒ කටයුත්තට අතරමගදී බාධා පැමිණෙන්න ඇති" පර්විස් මහතා කිව්වා.

"එහෙම උවමනාවක් තිබුණා නම්, ඔහු මැණික්ගල් ඉවත්කරන්නේ වරකට එක බැගින් නේ. නමුත් දැන් මේ ගල් හතර වටේම රත්රන් රාමුව පළුදු කරලා. ඒත් ගල් එලෙසම තියෙනවා."

"මෙක මහා පුදුමාකාර සිදුවීමක්" පොලිස් නිලධරයා කිව්වා. "මේ වගේ දෙයක් මීට කලින් කවදාක හෝ සිදුවුණු බවක් මට මතක්කරන්නත් අමාරුයි. අපි මුරකාරයාගෙන් අහල බලමු"

මුරකාරයා එතැනට කැඳෙව්වා. ඔහු හමුදාභටයෙකුගේ හැඩහුරුකමක් මෙන්ම, අවංක මුහුණක් තිබූ පුද්ගලයෙක්. මේ සිදුවීම නිසා ඔහු හිටියේ හිතේ හරි කැලඹීමෙන්.

"මට කිසිම ශබ්දයක් ඇහුණේ නෑ මහත්මයා" ඔහු කිව්වේ, පොලිස් නිලධරයාගේ ප්‍රශ්නයට පිළිතුරු ලෙස. "මම වෙනදටත් කරන, පුරුදු විධියට හතරපාරක්ම මුරසංචාරය කළා. ඒ වුණත් සැකකටයුතු කිසිම දෙයක් මට දකින්න ලැබුණේ නෑ. මං මේ රැකියාවට ඇවිත් දැන් අවුරුදු දහයක් වෙනවා. ඒත් කවදාවත් මෙහෙම දෙයක් සිදුවුණේ නෑ"

"ජනෙල්වලින් හොරෙකුට ඇතුළට එන්න බැරිද?"

"කොහොමටවත් බෑ මහත්මයා"

"එහෙම නැත්නම් ඉදිරි දොරටුවෙන්, ඔබට නොපෙනී ආවා වෙන්න බැරිද?"







"මේ තත්ත්වයෙන් ඉතාම අනර්ඝ මැණික්ගල් හතරක්"

http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com
Reading Purpose Not For Print

"ඇතුළේ සංචාරය කරන වෙලාවෙදි හැරෙන්න, මං හැමවිටම ඉන්නෙ එතැනමයි"

"මේ කෞතුකාගාරයට ඇති අනෙක් දොරටු මොනවාද?"

"ෆෝඩ් මෝටිමර් මහත්මයාගෙ පෞද්ගලික කාමරවලට යාහැකි දොරටුවක් තියෙනවා."

"නමුත් රාත්‍රියට ඒක යතුරුදමා වහලයි තියෙන්නෙ" මගේ මිත්‍රයා කිව්වා. "පාරේ යන කෙනෙකුට මගේ කාමරවලට ඇතුළුවෙන්න නම් ඒකෙන් එළියට ඇති දොර විවෘත කරන්න වෙනවා"

"ඔබේ සේවකයන් කවුරුහරි ඒ පැත්තෙන් ඇතුළුවුණා කියල හිතන්න බැරිද?"

"ඔවුන්ගේ කාමර තියෙන්නේ සම්පූර්ණයෙන්ම මේ ගොඩනැගිල්ලෙන් වෙන්වෙලා"

"බොහොම හොඳයි" පොලිස් නිලධාරයා කිව්වා. "මේක හොඳටම නොපැහැදිලි අවුලක්. කොහොම වුණත් පර්විස් මහත්මයා සහතික කරන විදියට, මෙතැන මොකුත් අපරාධයක් වෙලා නැහැනේ"

"ඒ ගල් හතර නියම මැණික් බවට මට දිවුරන්න පුළුවනි" පර්විස් මහතා කිව්වා.

"එහෙනම් අපට හිතන්න තියෙනුත්තේ, මේක ද්වේශසහගත චේතනාවකින් කරන ලද්දක් කියලයි" පොලිස් නිලධරයා කිව්වා. "ඒ වුණත් මං කැමැතියි මෙතැන ටිකක් වටේට ඇවිදලා බලන්න. බලමු මේකට ආව අමුත්තා කවුද කියල හඳුනාගන්න මොනවා හරි හෝඩුවාවක් තියෙනවද කියල"

ඔහු මුළු උදේ වරුවම ඒකට ගතකළත් මොකුත් හොයාගන්න බැරිවුණා. කොහොමවුණත් විවර දෙකක් ඇතිබව ඔහු සඳහන් කළා. ඒව නම් අපි කලිනුත් දුටුව තැන්.

එකක් පොළොවේ ලෑලිවල තිබුණා පහතට නැමියහැකි ලෑලි දොරක්. ඒකෙන් ඇතුළුවීමට හැකියාව තිබුණේ පොළොව යට තිබූ විදුලිපරිපථ කාමරයට. අනෙක කොල්දරය උඩ, කැඩීබිඳී ගිය ලී බඩු ගබඩාකරන තැන. ප්‍රදර්ශන කුටි තිබූ ශාලාවේ ඉහළින් සිවිලිමක් හෙවත් ලෑලි සොල්දරයක් තිබුණා. මේ ලෑලි තට්ටුවේ සමහර තැන්වල වීදුරු තහඩු සවිකර තිබුණා. ඒ මගින් දවල් කාලයට ප්‍රදර්ශන ශාලාවට හොඳ ආලෝකයක් ලැබුණා. වීදුරු තහඩුවලට අවහිර නොවන ලෙස සොල්දරය නැත්නම් අටුව උඩ පරණ ලීබඩු ගබඩාකර තිබුණා.



http://sherlockholmesinvestigations.blogspot.com



"මට කිසිම ශබ්දයක් ඇහුණෙ නෑ මහත්මයා"

http://sherlockholmesinvestigations.blogspot.com

අපි ඒ අවුවට නැග එයත්, පොළොව යට විදුලි පරිපථ කාමරයත් පරීක්ෂා කර බැලුවා. ඒවා දූවිලිවලින් වැසී තිබුණා. මෑතකදී කිසිවෙක් ඒ පැත්තට ආ බවට කිසිම සලකුණක් තිබුණේ නෑ. එපමණක් නෙමෙයි. එවැනි තැනකට එන්න නම් හොරෙක් පළමුවෙන්ම අගුළුදමා තිබෙන ප්‍රධාන දොරටුවෙන් ඇතුළුවී සිටින්න ඕන. ඒ හින්ද අවසානයේ මේ ගැන කිසිම තීරණයකට එන්න අපට හැකිවුණේ නැහැ.

"දැන් ඉතින් අපි මොකද කරන්නේ?" මෝටිමර් මගෙන් ඇහුවා.

"අපි මහාචාර්ය ඇන්ඩ්‍රියස් හමුවෙලා කතාබහ කරලා බලමු." මං යෝජනා කළා. "මේ ගැන මොනවා හරි අදහසක් දෙන්න ඔහුට හැකිවේවි." පොලීසිය ඔවුන්ගේ සෝදිසි කටයුතු දිගටම කරද්දී, එද හවසම මහාචාර්යතුමා හමුවෙන්න යන්න අප තීරණය කළා.

"මං හිතන්නේ අර ලියුම් දෙකම අරගෙන ගියොත් හොඳයි" මෝටිමර් කිව්වා.

"ඒ මොකටද?"

"මං ඒ ලියුම් දෙකම ඔහුට පෙන්වලා අහනවා, ඒ විධියට අනතුරු ඇඟවීමේ අරමුණ මොකක්ද කියලා. අන්තිමට ඔහු කී අයුරින්ම යම් දෙයක් මෙතැන සිද්ධවුණා. මං ඔහුගෙන් විමසනවා, ඒ වගේ දෙයක් ඔහුගේ ඔලුවට ආවේ ඇයි කියලා"

"ඔබේ කැමැත්තක්"

මහාචාර්යවරයා පදිංචිවෙලා හිටියේ නෝවුඩ්හි කුඩා නිවසක. අප පිළිගැනීමට ඉදිරියට ආ සේවිකාව, ඔහු නිවසෙන් ඉවත ගොස් ඇතිබව දැනුම් දුන්නා. මෙයින් අපේ හිත්වල ඇතිවුණේ ලොකු කැලඹීමක්.

"කවදද මහාචාර්යතුමා ගියේ?" මං ඇහුවා . "මේ ඇවිත් ඉන්නේ ජෝඩ් මෝටිමර් මහත්මයා. ඔහු තමයි මහාචාර්යතුමාට පස්සේ කෞතුකාගාරයේ අධ්‍යක්ෂක හැටියට වැඩ භාරගත්තේ. අපි ආවේ ඉතාම වැදගත් කාරණයකට මහාචාර්යතුමා හමුවෙන්න. ඔහු කොහේද ගියේ?"

"මහත්මයා" සේවිකාව කිව්වා. "මහාචාර්යතුමාගේ දියණිය ඇන්ඩ්‍රියස් මෙනෙවිය නම් ගෙදර ඉන්නවා. මහාචාර්යතුමා ගියේ කොහේද, එන්නේ කවදද යන තොරතුරු ඇය දන්නවා ඇති. මං ඇයට එන්න කියන්නද?"



http://sherlockholmesinvestigations.blogspot.com



"අනේ ඔව්. ඒක අපට ලොකු පහසුවක්"

අපට විසිත්තකාමරයේ අසුන්ගන්න කී සේවිකාව නිවස ඇතුළට ගියා.

මං ඔබට කලින් කිව්වා මහාචාර්යතුමා ගේ දියණිය ඉතාම ශෝභාසම්පන්න තරුණියක් බව. ඇයට තිබුණේ ඉතාම කලාතුරකින් දකින්න ලැබෙන අන්දමේ රූ සපුවක්. මුලින් මං ඇය දුටු දවසේ ඇගේ දෑස් වල තිබුණේ බබළන කාන්තියක්. ඉතින් මං බලාපොරොත්තුවෙන් හිටියේ, මේ රූමත් තරුණිය අප පිළිගන්න පැමිණේවි කියල.

මිනිත්තු කිහිපයක් ගතවෙද්දී ඇය විසිත්ත කාමරයට ආවා. නමුත් මෙද ඇගේ පෙනුමෙන් අප දෙන්නා පත්වුණේ මහා පුදුමයකට. කලින් දවසේ සිටි රූමත් තරුණිය හොඳටම වෙනස් වෙලා. ඇගේ මුහුණ සුදුමැලි වෙලා, විරූපී වෙලා තිබුණා. කලින් කාන්තියෙන් බැබළුණු දෙනෙත් මලානික වෙලා. ඇය හිටියේ කෙනෙකු හා කතාබහ කිරීමට පරම කැමැත්තකින් නොවෙන බව හැඳිනීමට පෙනුණා.

"තාත්තා ස්කොට්ලන්තය බලා පිටත්වෙලා ගියා." ඇය කීවා. "දිගින් දිගටම විවේකයක් නැතිව රාජකාරියේ යෙදීම නිසා, ඔහු ලොකු විඩාවකට පත්වෙලා හිටි බවයි මට පෙනුණේ. ඒ නිසා විවේකයක් ගතකරන්න ගියා. ඊයේ තමයි මෙහෙන් ගියේ"

"ඇන්ඩ්‍රියස් මෙනෙවිය. ඔබත් ඉන්නේ බොහොම විඩාපත් ස්වභාවයකින්" මගේ මිත්‍රයා කිව්වා.

"ඇත්තෙන්ම ඔව්" ඇය පිළිතුරු දුන්නා. "තාත්තගේ සෞඛ්‍ය තත්ත්වය අයහපත් අතට හැරිලා. මං ඉන්නේ ඒ ගැන හිතේ හරි කැලඹීමෙන්"

"ස්කොට්ලන්තයේ ඔහු පදිංචි තැන ලිපිනය අපට දෙන්න පුළුවන්ද?"

"ඔව්" ඇය කීවා. "එහෙදි ඔහු නවතින්නේ ඔහුගේ සහෝදරයාගෙ නිවසේ. ඩේවිඩ් ඇන්ඩ්‍රියස් දේවගැතිතුමා, අංක 1, ඇරන් විලාස්, ආඩ්‍රොසාන්"

මෝටිමර් ඒ ලිපිනය සටහන් පොතේ ලියාගත්තා. අප ආවේ කුමන කටයුත්තකටද කියන එක තරුණියට දැනුම් දෙන්නේ නැතිව අපි එන්න පිටත්වුණා.



http://sherlockholmesinvestigations.blogspot.com

www.Sinhalaelibrary.com

"අපි ආයෙමත් ප්‍රශ්නයේ මුලටම ආවා. එහෙම නේද හෝම්ස්?" මගේ මිත්‍රයා ඇහුවා. "මං කුමක් කළ යුතුයි කියලද ඔබ හිතන්නේ?"

"ඒක මට හරියටම කියන්න අමාරුයි. අපට ඇදල බලන්න තියෙන්නේ එකම නූලයි. ඒ තමයි මහාචාර්යතුමා නිර්නාමිකව එවූ ලියුම...."

"හරි. මමත් හිතන්නේ එහෙමමයි" මගේ මිත්‍රයා කිව්වා. "මං හෙට උදේ පාන්දරින්ම ස්කොට්ලන්තය බලා පිටත්වෙලා යනවා"

පසුවද උදේ පාන්දරින්ම කවුදෝ මගේ දොරට තට්ටුකරන හඬ ඇසී මං අවදිවුණා. දොර ඇරී මට දකින්න ලැබුණේ ලියුම් කැබැල්ලක් රැගෙන ආව පණිවුඩකරුවෙක්. ලියුම මගේ මිත්‍රයාගෙන්.

**"හිතවත් හෝම්ස්,**

**වහාම එන්න. ප්‍රශ්නය වඩ වඩාත් සංකීර්ණවීමට පටන්ගෙන ඇත.**

**මෝටිමර්"**

වහාම හැඳපැළඳගෙන මං පිටත්වෙලා ගියා. මගේ මිත්‍රයා කෞතුකාගාරයේ මැද 'කාමරයේ, ඉහළ' පහළ ඇවිදිමින් හිටියේ හිතේ හරි කැලඹීමෙන්. මුරකරන සේවකයා ඒ ශාලාවේම කොනක සීරුවෙන් හිටගෙන හිටියා.

"මගේ හිතවත් හෝම්ස් !" මා දුටු ගමන්ම මගේ මිත්‍රයාට කෑගැසුණා. ඔබ ආ එක බොහොම ශොඳයි. මේක මහ අවුල් ජාලයක් වෙලයි තියෙන්නේ. මේක කොහොම විසඳා ගතයුතු දෙයක්ද කියල මට නම් තේරෙන්නේ නැහැ"

"ඇයි ඒ පාර මොකද වෙලා තියෙන්නේ?"

ළය පළඳනාව තැන්පත්කර තිබූ කැබිනෙට්ටුවට ඔහු අත දිගු කළා. "ගිහින් බලන්න"

මං එතැනට ගිහින් බැලුවා.

"දෙයියෝ සාක්කි" මට කෑගැහුණේ, මා නොදැනුවත්වම. ළය පළඳනාවේ මුලින් පේද්දුකර තිබුණේ උඩම පේළිය. මෙ සැරේ මැදපේළියේ මැණික් වටේට රත්රන් තහඩුව පළුදු කර තිබුණා. මැණික් ගල් දෙළහෙන් අටක්ම දැන් කාගේ හෝ අතපත ගෑමකට ලක්වෙලා. පහළම තිබූ මැණික්පේළිය සවිකර තිබූ තැන පමණක්, පෙර පරිදිම පළුදු නොවී බොහොම සුමටව තිබුණා.



http://sherlockholmesinvestigations.blogspot.com



"ඊයේ අර මැණික් විශේෂඥයා අපට සහතික කර කිව්වා, උඩම පේළියේ මැණික් කැට හතරම සැබෑ මැණික් බව. දැන් මේ තියෙන්නෙත් ඒවා බවට මට සැකයක් නෑ. ඒ මොකද අර මරකත මැණිකේ එක් දරයක් ඊයෙත් දුර්වර්ණවී තිබුණා. අදත් ඒක එලෙසම තියෙනවා. ඉතින් මං හිතන්නේ නෑ, ඒ වටිනා මැණික් එහෙමම තිබියදී දෙවැනි පේළියේ මැණික් කවුරු හරි මාරු කරන්න ඇති කියල. සිම්සන්. ඔබ කියන්නේ ඔබට කිසිම ශබ්දයක් ඇහුණේ නෑ කියල. එහෙම නේද?"

"කිසිම අසාමාන්‍ය ශබ්දයක් ඇහුණේ නෑ මහත්මයා" මුරකරු කිව්වා. "නමුත් අද උදේ මං මේ හරියෙන් යද්දී, මං බැලුවා මේ ආභරණය දිහා. එතකොට මට තේරුණා ඊයේ රෑ කවුරු හරි මේක අතපත ගාල තියෙන බව. එතකොටයි මං වහාම ඔබතුමාට දැනුම් දුන්නේ. ඊයේ රෑත් මං හරියටම පැය භාගයකට වරක් කෞතුකාගාරය ඇතුළේ හැමතැනකම ගමන් කළා. කිසිම කෙනෙකුගේ ශබ්දයක් මට ඇහුණේ නෑ. මනුස්සයෙක්ව දුටුවේත් නෑ"

"එන්න හෝම්ස්. අපි කෑම ටිකක් කාල ඉඳිමු" මගේ මිත්‍රයා මාව උදේ ආහාරය සඳහා කැඳෙව්වා. මුරකාරයා ඔහුගේ රාජකාරිය සඳහා පිටවී යද්දී මං මෝටිමර් සමඟ ඔහුගේ කාමරයට ගියා.

"ඔබට මොනවද හිතෙන්නේ?" ඔහු ඇහුවේ මට තේකෝප්පයක් වත්කරන ගමන්.

"මෙහෙම දෙයක් මං ජීවිතේට අහල නෑ" මං කිව්වා. "කවුරුහරි මේ විධියේ තේරුමක් නැති වැඩ කරන්නේ ඇයි කියල මට නම් හිතාගන්න බෑ. මේක මොළේ නරක්වුණු කෙනෙකුගේ වැඩක් විය යුතුයි. ඔබ මොකද කියන්නේ?"

"මේක යුදෙව් ආභරණයක් නේ." ඔහු කිව්වා. "මට හිතෙනවා යුදෙව් විරෝධී පුද්ගලයෙකු විසින් ද්වේෂ සහගතව කරන වැඩක්ද කියලා. දැන් මං මොකක්ද මීළඟට ගතයුතු පියවර?"

"මුරකාරයා - සිම්සන් ගැන ඔබට මොනවද කියන්න පුළුවන්?" මං ඇහුවා.

"ඔහුව සැකකරන්න තරම් හේතුවක් නැහැ. හැබැයි ඔහු තමයි මේ ගොඩනැගිල්ල තුළ ගැවසෙන එකම පුද්ගලයා."

"ඒ වුණත් ඔහු මොකද්ද මෙහෙම විනාශකාරී වැඩක් කරන්නේ?" මං ඇහුවා. "වටිනා මැණික්ගල් හොරකම් කරගෙනත්



http://sherlockholmesinvestigations.blogspot.com

නැහැ. ඔහු මෙහෙම දෙයක් කරන්නෙ මොන අරමුණකින්ද? සිම්සන් මොකක් හරි සිහිමද ගතියකින් පෙළෙන කෙනෙක්ද?"

"කොහොමටවත් නැහැ. ඒ ගැන මට සහතික වෙන්න පුළුවනි"

"හොඳයි. මෙකට කළ යුතු වැඩේ ගැන මං කියන්නම්. ඔබ එය ක්‍රියාවේ යොදවන්න කැමැති නම්" මං කිව්වා. "ආභරණ කැබිනෙට්ටුව තියෙන මැද ශාලාවේ සිලිමේ ලොකු වීදුරුවක් දමල තියෙන තැන ඔබට මතක එන්ද? අර මහලේ සවිකළ වීදුරුවකින් ඉරඑළිය වැටෙන්න තියෙන තැන? අපි සොල්දරයට නැගලා, ඒකෙ හැංගිලා වීදුරුවෙන් බලාගෙන ඉමු. අපේ මේ අද්භූත අමුත්තා ඒක රෑට කුරුටුගාන්නෙ මැණික් ගල් හතර ගණනේ නම්, අද රෑටත් ඔහු එයි. ශාලාවේ කොහොමටත් විදුලි ආලෝකය දල්වෙනවානෙ. උඩ සොල්දරයේ අප හැංගිලා ඉන්න හැටි, ඔහුට පෙනෙන්නේ නැහැ. වැඩේ සම්පූර්ණ කරන්න අද ඔහු එන බව මට හොඳටම විශ්වාසයි."

"ඒක අපූරු අදහසක්" කිව් මෝටිමර් ඒ අදහසට එකඟවුණා.

"අපි මේක රහසක් හැටියට තියාගමු. පොලිසියටත් සිම්සන්ටත් මේ ගැන කියන්න එපා. රෑ දහය වෙන කොට මං ඔබ හමුවෙන්න එනවා"

එදා රාත්‍රී දහයට මං පොරොන්දුවුණු විධියට මෝටිමර්ගේ කාමරයට ගියා. ඔහු හිතේ තිබූ කලබල ගතිය බොහොම අමාරුවෙන් යටපත් කරගෙන හිටියා. පාරේ ගමන්කළ අශ්වකරත්ත වල ශබ්දය දිගටම ඇසුණා. ඒ නිසා තවත් රෑ වෙනතුරු අපේ රාජකාරිය පටන් නොගැනීමටයි අපි හිතුවේ.

මහපාරේ ශබ්ද අඩුවෙනකොට රෑ මැදියමට කිට්ටුයි. මෝටිමර් සහ මම සොල්දරයට නැග්ගා. පහළට ශබ්දයක් නොඇසෙන විධියට පරෙස්සමින් පය තබමින් අප ගියේ, මැද ශාලාව මැද පිහිටි වීදුරු තහඩුව ළඟට. එම වීදුරුව ඇතුළතින් දූවිලි තට්ටුවක් බැඳිලයි තිබුණේ. පහළ පැහැදිලිවම බලාගැනීමට හැකිවෙන අයුරින් වීදුරුවේ තැන් දෙකක දූවිලි අප පිස දැම්මා. අප සිටි තැනට ළයපළඳනාව තබා තිබූ වීදුරු කැබිනෙට්ටුව පැහැදිලිවම පෙනුණා. නමුත් පහළ සිට බලන කෙනෙකුට අපව පැහැදිලිව දකින්න හැකියාවක් තිබුණේ නැහැ.

පහළ ශාලාවේ තිබූ දීප්තිමත් ආලෝකය නිසා ප්‍රදර්ශනය සඳහා තබා තිබූ කෞතුක භාණ්ඩ, හැම එකක්ම වගේ පැහැදිලිව පෙනුණා.







ශාලාවේ එක් කෙළවරක තිබුණේ ඊජිප්තු මමී පෙට්ටි කිහිපයක්. ඊජිප්තු රජදරුවන් විසින් බෙහෙත් ගැල්වූ මළසිරුරු තැබීමට, මිනිස් සිරුරේ හැඩයට තැනූ මේ යෝධ පෙට්ටි ගණනාවක් බිත්තියට හේත්තුකර තිබුණා. තවත් තැනක සක්කාරා වල පිරමීඩයකින් ගෙන එනු ලැබූ, බද්මයේ අඳින ලද හේරෝ චිත්‍ර. මෙම්ෆිස් හා කර්නැක් වලින් ගෙන එනු ලැබූ ඊජිප්තු දෙවිවරුන්ගේ පිළිම තවත් තැනක තිබුණා. තීබ්ස් වල සොහොන් ගෙවල් වලින් ගලවාගෙන එනු ලැබූ රූපාක්ෂර සහිත පුවරු කිහිපයක්ම තවත් තැනක තිබුණා. නමුත් මේ හැම එකකටම වඩා අලංකාර වස්තුව වුණේ කැබිනෙට්ටුව තුළ තිබූ යූරිම් - තම්මිම් යුදෙව් පළඳනාවයි.

තවත් පැයක් හෝ ඊට ටිකක් වැඩි වේලාවක් අපි නිහඬව බලාගෙන හිටියා. එක්වරම මගේ මිත්‍රයා හුස්මක් ඉහළට ඇද්දේ මගේ අත දැඩිව අල්ලා ගනිමින්.

මේ ශාලාවේ එක් තැනක ඊජිප්තු මමී දැමීමට හැදූ විශාල පෙට්ටි තිබූ බව මං ඔබට කිව්වා. අපි දෙන්නා ඉමහත් පුදුමයට පත්වුණේ එම පෙට්ටියක වුණු සෙලවීම දැකලා. එක පෙට්ටියක පියන හෙමින් හෙමින් එසවෙන්න පටන්ගත්තා. මීළඟට ඒ සිදුර අතරින් එළියට ආවේ සුදුමැලි කෙට්ටු අතක්. ඒ අත පෙට්ටි පියන සම්පූර්ණයෙන්ම එළියට තල්ලු කරද්දී අනෙක් අතත් එළියට ආවා. මීළඟට එළියට ආවේ මුහුණක්. ඒ අපට හුරුපුරුදු මුහුණක්. කාගෙද මේ මුහුණ? මහාචාර්ය ඇන්ඩ්‍රියස් ගේ මුහුණ!

ගුහාවකින් එළියට එන නරියෙක් වගේ, මහාචාර්යතුමා මමී පෙට්ටියෙන් එළියට ආවේ බොහොම පරෙස්සමින්. ඔහු මුහුණ හැම පැත්තකටම හරවා බැලුවේ, නැවත නැවතත් හොඳින් කන් යොමුකළේ, හොරෙක් වගේ. අඩිමයෙන් අඩිය ඉදිරියට තබමින් ඔහු ඉස්සරහට ගියේ බොහොම හෙමින්. එක් වරක් වීදිය දෙසින් යම් ශබ්දයක් ඇහුණා. ඒකට තිගැස්සී ඔහු එතැනම නැවතුණා. ඊට පසු ඒ ශබ්දය තවත් ඇසුණේ නැතිවුණාම ඔහු යළිත් ඉදිරියට ගියා.

ඔහු ගිහින් නැවතුණේ අර යූරිම් තම්මිම් ළය පළඳනාව තිබුණු කැබිනෙට්ටුව ළඟ. සාක්කුවෙන් යතුරු කැරැල්ලක් එළියට ගත් ඔහු, ඉතා පරෙස්සමෙන් යතුරක් තෝරාගෙන, ශබ්දයක් නොනැගෙන සේ කැබිනෙට්ටුව ඇරියා. ඊට පස්සේ ළය පළඳනාව අරගෙන, සාක්කුවෙන් ගත් කුඩා ආයුධ කිහිපයක් පාවිච්චි කරමින් ඔහුගේ රාජකාරිය පටන්ගත්තා.

මගේ මිත්‍ර මෝටිමර් කෝපයෙන් වෙවුළමින් හුස්ම ඉහළ පහළ ගත් හැටි මට පෙනුණා. මෙබඳු දෙයක් කිසිසේත් බලාපොරොත්තු විය නොහැකි පුද්ගලයෙකු අතින්ම, මෙහෙම දෙයක් වීම අපට අදහාගන්න බැරි සිදුවීමක්. මෝටිමර් මගේ කබා අතෙන් ඇද්දේ සංඥාවක් හැටියට.

"මේක විශ්වාස කරන්න පුළුවන් දෙයක්ද හෝම්ස්?" ඔහු කෙඳිරුවා " මේ යකා එක්කො පිස්සෙක්. නැත්නම් දුෂ්ටයෙක්"

"එයින් කොයි එකාද කියල් තෝරාගන්න අපට වැඩිවෙලා යන එකක් නැහැ. එන්න මා සමඟ" මං කිව්වේ අප පහළට යායුතු බව ඔහුට සංඥා කරමින්. මෝටිමර්ගේ පෞද්ගලික කාමරයට පිවිසි අප, එහි දොර ශබ්දයක් නොනැඟෙන සේ ඇරගෙන ආවේ කෞතුකාගාරයට. පාවහන් ඉවත්කරලා අපි මැදසාලයට පානැගුවා.

ඔහු තවමත් හිස පහත් කරගෙන තම කටයුත්තේ යෙදිල හිටියා. අප ඔහුට ළංවූ බව ඔහු දැනගෙන හිටියේ නැහැ. අප ඔහු සමීපයට යද්දී මහාචාර්යතුමා තිගැස්සී එක්වරම හිස ඔසවා වටපිට බැලුවා. ඔහුට භයෙන් කෑගැහුණා. ඊළඟට ඔහු ශාලාවෙන් බරාඳයට පිවිසිලා ඒක දිගේ දිව්වා.

"සිම්සන්! සිම්සන්!" මෝටිමර් උද්වේගයෙන් කෑගැසුවා. එතකොටම අප දුටුවා මුරකරුවා බරාඳයේ ඈත කෙළවරින් මතුවෙන හැටි. මුරකරුවා දුටු විගසම ඇන්ඩ්‍රියස්ගේ දිවීම නැවතුණා. මීළඟට ඔහු දෙපැත්තෙන් ආ අපගේ අත්වලට හසුවුණා.

"ඔව් මහත්වරුනි" මහාචාර්යතුමා කිව්වේ හතිදමමින්" මං එන්නම් ඔබ සමග. මෝටිමර් මහත්මයා. කරුණාකර ඔබේ කාමරයට යමු. මගේ නිදහසට කරුණු ඉදිරිපත් කළ යුතු බව මං දන්නවා"

මගේ මිත්‍රයා හිටියේ කොයිතරම් තරහෙන්ද කිව්වොත් ඔහු එක වචනයක්වත් කථාකළේ නැහැ. අපි දෙන්නා මහාචාර්යවරයා දෙපසින් ගමන්කළා. මුරකරුවා ආවේ අප පිටුපසින්. අප අර කැබිනෙට්ටුවට ළංවුණාම, මෝටිමර් යුද්ධම - තම්බ ළය පළඳනාව අතට අරගෙන පරීක්ෂා කර බැලුවා. ඒ වෙනකොටත් යටම පේළියේ එක් මැණික් ගලක් වටා පළුදුවීම තිබුණා.

"දෙවියනේ! මොකක්ද ඔබ මේ කරන වැඩේ තේරුම?" මෝටිමර් මහාචාර්යතුමාට කෑගැහුවේ තමන්ගේ හිතේ තිබූ දැඩිකෝපය පිටකරමින්."



http://sherlockholmesinvestigations.blogspot.com



".... මොකක්ද ඔබ මේ කරන වැඩේ තේරුම?"

www.sinhalaelibrary.com

http://sherlockholmesinvestigations.blogspot.com

"මං දන්නවා" මහාචාර්යතුමා කිව්වා. "මෙක පිළිකුල් සහගත වැඩක්. ඔබ ඔහොම හිතන එක ගැන මට පුදුමයක් නෑ. කරුණාකර මාව ඔබේ කාමරයට ගෙන යන්න"

"ඒ වුණත් මෙක මෙහෙම දල යන්න බෑ" කිව් මෝටිමර් ළය පළඳනාව අතට ගත්තා. අප තුන්දෙනා මෝටිමර්ගේ කාමරයට ඇතුළුවෙද්දී මුරකරුවා එළියේ රැඳුණා. අප එහි දෙරවසද්දී, කිසිවක් තේරුම් ගන්න අමාරුවුණු සිම්සන්ගේ මුහුණ මා දුටුවා.

කාමරයට ඇතුළුවුණු ගමන් මං යළිත් වරක් බැලුවේ මහාචාර්ය ඇන්ඩ්‍රියස් දිහා. ඔහුගේ මුහුණ සුදුමැලි වී ඩහදිය දමමින් තිබුණා. මං හිතුවේ ඔහු කොයි මොහොතක හෝ ක්ලාන්ත වී බිම ඇදවැටේවි කියලයි. ඔහු වහාම මෝටිමර්ගේ හාන්සිපුටුවේ වාඩිකරල මං බ්‍රැන්ඩි ස්වල්පයක් බොන්න දුන්නා, මඳ වේලාවක් ගතවෙද්දී ඔහු තරමක් සාමාන්‍ය තත්ත්වයකට පත්වුණු බවයි අපට පෙනුණේ.

"දුන් ටිකක් හරි" මහාචාර්යතුමා කිව්වා. "පහුගිය දවස් ගණනක් තිස්සේ මගේ හිතේ තිබුණේ දරාගන්න බැරි කම්පනයක්. මෙක තවදුරටත් බලාගෙන ඉන්න බැදී බව මට තේරුණා. මේ තරම් දිගු කාලයක් මං පාලකයාව හිටි කෞතුකාගාරයේම, හොරෙකු හැටියට අත්අඩංගුවට පත්වීම. මට මෙක භයානක හීනයක් වගේ. ඒ වුණත් ඒ ගැන මං ඔබට දෙස් කියන්නෙ නෑ. ඔබට කරන්න වෙන විකල්පයක් නෑ. මගේ එකම බලාපොරොත්තුව වුණේ මා ගැන සොයාගන්න කලින් මෙක අවසන් කරන්න. අද තමයි මට මේ කටයුත්තේ යෙදෙන්න තිබුණු අන්තිම දවස"

"ඔබ කොහොමද මෙහි ඇතුළුවුණේ?" මෝටිමර් ඇහුවා.

"ඔබේ පෞද්ගලික දෙරටුව තමයි මං ඒ සඳහා ප්‍රයෝජනයට ගත්තේ. නමුත් මං එහෙම කළේ යහපත්, සාධාරණ අරමුණකින්. හැමවිස්තරයක්ම දැනගත්තට පස්සේ ඔබ් මා සමග කෝපවෙන එකක් නැහැ.

ඔබේ මේ පෞද්ගලික කන්තෝරු කාමරයෙන් එළියට යන සහ කෞතුකාගාරයට ඇතුළුවෙන දොරවල් සඳහා, මගේ ළඟ අමතර යතුරු තිබුණා. මෙහෙන් අස්වෙලා යද්දී මං ඒවා ආපහු භාර දුන්නේ නැහැ. ඉතින් රහසේම කෞතුකාගාරයට ඇතුළුවීම මට අපහසු නොවුණු බව ඔබට අපෙනෙනවා ඇති. හවසට සෙනග වීථිවලින් ඉවත්වෙන්න කලින්, කෞතුකාගාරයට ඇවිත් මම් දුම්මට


http://sherlockholmesinvestigations.blogspot.com



තිබූ අර ලොකු මම් පෙට්ටියක මම හැංගුණා. ඊට පස්සේ මං වැඩෙහි යෙදෙන අතරේ සිම්සන් කාමර සෝදිසි කරන්න එද්දිත් මං හැංගුණේ එතැනමයි. ඔහු ඒ කටයුත්තට එන වෙලාව ගැන මට හොඳ දැනුමක් තිබුණා. ඔහුගේ අඩි ශබ්දය මට හැමවිටම කල්තියා ඇහුණා. මං පිටවෙලා ගියෙත් ආව පාරෙන්මයි."

"ඔබ බොහොම අවදානම් විධියටයි ඒක කරල තියෙන්නෙ?"

"මට වෙන විකල්පයක් තිබුණේ නෑ"

"නමුත් ඇයි ඔබ මෙහෙම දෙයක් කළේ?" මෝටිමර් ඇහුවේ මේසය උඩ තැබූ ආභරණයට අත දිගු කර පෙන්වමින්.

"මෙකට මට වෙනත් කිසිම ආකාරයක විසඳුමක් හිතාගන්න බැරිවුණා." මහාචාර්යතුමා කිව්වා. "මං හුඟක් කල්පනා කළා. නමුත් ඒක එළිවුණොත් සිදුවෙන්නෙ කුමක්ද? අපේ ජීවිත වලට මුහුණදෙන්න බැරිවිධියේ ලොකු අපකීර්තියක් බව මට වැටහුණා. එහෙම වුණොත් ඇතිවෙන නින්දාව, අවමානය, ලැජ්ජාව, මට ඉවසා දරාගන්න බැරිවෙනවා. ඒ නිසා මං මේ විධියට කටයුතු කළේ යහපත් චේතනාවෙන්. නමුත් ඔබට ඒක විශ්වාසකරන්නත් අමාරු වෙවි. මං මේ කියන දේ ඇත්තද බොරුද කියලා ඔබට තේරේවි. ඒකට මගේ කතාවට හොඳින් අවධානය යොමුකරන්න.

"මං වෙනත් පියවරක් ගන්න කලින්, ඔබ කියන දේට ඇහුම්දෙන්නම්" මෝටිමර් කිව්වා.

"කිසිම දෙයක් හංගන්නෙ නැතිව හැමදෙයක්ම එළිකරන්නයි මං තීරණය කළේ" මහාචාර්යතුමා කිව්වා. "මං එළිකරන කරුණු ඔබට කොයිතරම් දුරට ප්‍රයෝජනවත් වේවිද මම දන්නෙ නෑ. නමුත් අපේ ජීවිත ගැනත් හිතලා ඔබ ක්‍රියාමක් කරාවි කියලා මං විශ්වාස කරනවා"

"අත්‍යවශ්‍ය කරුණු නම් දැන් එළිවෙලා ඉවරයි" මෝටිමර් කිව්වා. "ඒ වුණත් ඔබට මේ කිසිදෙයක් තේරුම් ගන්න බෑ. මගේ කථාව තේරුම්ගන්න මං සති කිහිපයක් අතීතයට යා යුතුයි. එතකොට ඔබට හැමදෙයක්ම පැහැදිලි වෙන විධියට කියාදෙන්න මට හැකිවෙවි.

කපිතාන් විල්සන් කියල තමාව හඳුන්වාදෙන පුද්ගලයා ඔබට හමුවුණා නේද? තමාව හඳුන්වාදෙන කියල මං කිව්වෙ ඇයි කියල දන්නවද? ඔහුගේ ඇත්ත නම ඒක නෙමෙයි. ඒ බව වටහාගන්න


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

තරම් කාරණා, දැන් මට දැනගන්න ලැබිල තියෙනවා. ඔහු මගේ පවුලට හිතවතෙකු විධියට ළංවුණේ කොහොමද? මගේ දියණියගේ ආදරය දිනාගත්තේ කොහොමද? ඒවා බොහොම දීර්ඝ කතා. ඒවා ඔබට විස්තර කරල දෙන්න මං කාලය ගතකරන්නේ නැහැ. ඔහු මා ළඟට ආවෙ විදේශ රටවල ඉන්න මගේ මිත්‍රයන්ගෙන්, හඳුන්වාදීමේ ලිපි අරගෙන. ඒ නිසා මගේ හිතේ ඔහු ගැන සැකයක් ඇතිවුණේ නෑ. මගේ ඒ මිත්‍රයන් නිසා විල්සන්ට විශේෂ සැලකීමක් කරන්න මට සිදුවුණා. ඊළඟට ඔහුගේ හැසිරීමෙන් හා කතාබහෙන් මගේ හිත ඇදගත්තා. ඔහුට කෞතුකාගාරයට නිදහසේ යන්න එන්න පුළුවන් විධියට මාව රවටා ගත්තා. ඒ කෛරාටික කතාබහෙන් හා කුට ආචාරශීලී බවෙන්ම මගේ දියණියගේ ආදරය දිනාගන්නත් ඔහුට පුළුවන් වුණා.

මැදපෙරදිග රටවල පුරාවස්තු ගැන, ඔහුගේ තිබුණේ ලොකු උනන්දුවක්. ඔහුට ඒවා ගැන හොඳ දැනුමක් තිබුණා. හවස් වෙලාවල අප සමඟ කාලය ගතකරද්දී ඒවා ඔහුට උවමනා වුණා මේ කෞතුක වස්තූන් නරඹන්න. අවේලාවේ කෞතුකාගාරයට ගිහින් මේ දේවල් නැරඹීමට ඔහු මගෙන් අවසර ලබාගත්තා. මේ ක්ෂෙත්‍රය ගැන මගේ තිබුණු කැමැත්ත නිසා මෙවැනි ඉල්ලීම් දිහා මං බැලුවේ අනුකම්පා සහගතව. ඔහු නිතර නිතර, තනියම, කෞතුකාගාරය පාළුවට ගිය වෙලාවේ මේවා නිරීක්ෂණය කිරීම ගැන, මගේ හිතේ සැකයක්වත් පුදුමයක්වත් ඇතිවුණේ නැහැ.

ඔහු මගේ දුව එල්සි සමග විවාහ ගිවිස ගත්තාට පස්සේ හැමදම හැන්දෑවට අපේ ගෙදර ආවා. එහෙම ආවම පැයක් හෝ දෙකක් අනිවාර්යයෙන්ම ගතකළේ කෞතුකාගාරයේ. මං නොහිටි වෙලාවලදීත්, ඕනෑම කෞතුක භාණ්ඩයක් තනියම අතපත ගා බලන්න ඔහුට නිදහස තිබුණා. ඔහු එහෙම කරනවාට මගේ විරුද්ධත්වයක් තිබුණේ නෑ. මගේ රාජකාරි වලින් ඉවත්වෙලා ගියාමයි ඒවා කෙළවරක් වුණේ.

මං රැකියාවෙන් ඉල්ලා අස්වෙලා නෝවුඩ්හි පදිංචියට ගියේ පුරාවිද්‍යාව පිළිබඳ පොතක් ලියන්න. ඒක බොහොම කාලයක් තිස්සේ මගේ හිතේ තිබුණු ආශාවක්. මෙහෙන් අස්වෙලා ගිය ඉක්මනින් තමයි මට තේරුණේ මේ විල්සන් නම් පුද්ගලයා ගැන. මගේ පවුලට සම්බන්ධ කරගන්න පියවරගත්තු මේ තැනැත්තාගේ



http://sherlockholmesinvestigations.blogspot.com



චරිත ස්වභාවය හරිහැටි මට තේරුණේ එතකොටයි. ඒ කොහොමද කියල කිව්වොත්, විදේශගතව හිටි මගේ මිත්‍රයන් කිහිපදෙනෙකුගෙන්ම පහුගිය කාලයේ මට ලියුම් ලැබුණා. ඒවා කියෙව්වාම මං පත්වුණේ මහත් පුදුමයකට. විල්සන් කියන පුද්ගලයා ගෙන ආ ලියුම්, වංචනික ලෙස සකස් කළ පට්ටපල් බොරු ඒවා බව මට වැටහී ගියා. මං ඒකෙන් දැඩි මානසික කම්පනයකට පත්වුණා. මේ වංචනිකයා මෙහෙම ලියුම් සකස්කරගෙන, මේ විධියට ආවේ මොන කුට අරමුණකින්ද? මගෙන් පැහැරගැනීමට හෝ ලියවා ගැනීමට තරම් විශාල වස්තුවක් මා රැස්කරගෙන නැහැ. මං දුප්පතෙක්.

එහෙම නම් මොකටද ඔහු ඇවිත් තියෙන්නෙ? මට එතකොටයි මතක්වුණේ. යුරෝපයේ තිබෙන වටිනාකමින් ඉතාම ඉහළ මැණික් කිහිපයක් තියෙන්නේ මගේ භාරයේ බව. මේ පුද්ගලයා නිදහසට නොයෙක් කරුණු කියමින්, අවේලාවේ කෞතුකාගාරයේ ගැවසුණු හැටි මට මතක්වුණා. මේ මිනිහා මහ විශාල මංකොල්ලයක් සැලසුම් කළ අංක එකේ තක්කඩියෙක් විය යුතුයි. මං කොහොමද මේ මිනිහගෙන් ගැළවෙන්නේ? ඒක පැත්තකින් මොහු ගැන මගේ දුව ආලයෙන් අන්ධවෙලා, විවාහ ගිවිසගෙනයි ඉන්නේ. ඔහුව පොලීසියට අල්ලා දුන්නොත් ඇයට අත්වෙන ඉරණම කුමක්ද? මේ ප්‍රශ්න හැම එකක්ම, එක විට මගේ මොළයට එන්න ගත්තා. මේක කිසිම විසඳුමක් නැති උභතෝකෝටික ප්‍රශ්නයක්ද? මට පිස්සු නොහැදුණා විතරයි. අන්තිමට මගේ හිතට පොඩි අදහසක් ආවා. මං ඔබට නිර්නාමික ලියුමක් ලියන්න තීරණය කළා.

බෙල්මෝර් වීථියේ කෞතුකාගාර නිල නිවසේ ඉඳලා නෝවුඩ්හි පදිංචියට ගියාම ඔහුගේ යාම් ඊම් අඩුවේවි කියලයි මං මුලදී හිතුවේ. ඔහුගේ හිතේ මගේ දුව ගැන ආදරයක් ඇත්තටම තිබූ නිසා වෙන්න ඇති; ඔහු දිගටම අපේ ගෙදර ආවා. මුලින්ම ඔහුගේ ස්වභාවය මට හරිහැටි දැනගන්න ලැබුණු දවසේ, මං මගේ සේවිකාවට කාරණාවක් දැනුම් දුන්නා. ඊළඟට කපිතාන් විල්සන් අපේ ගෙදරට ආවම ඔහුව විසිත්ත කාමරයට කැඳවන්න එපා; ඔහුව එවන්න මගේ කාමරයට. බලාපොරොත්තු වුණු ලෙසින්ම ඔහු එද හවස අපේ ගෙදරට ආවා.

"කපිතාන් විල්සන්" මං කීවේ ඔහුට කථාකරන්න ඉඩක් නොතබමින් "ඔහේ මට දුන්නු නම ඒක වුණාට ඔහේගේ ඇත්ත



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

නම ඒක නොවෙන බව මං දැන් දන්නවා. ඔහේ අපේ පවුලට ලංවුණේ ඇයි කියන කාරණාවත් දන්නවා. මගේ මිත්‍රයින් එවන ලියුම් වගේ වංචනිකව ලියුම් සකසලා, හොර අස්සන් ගහලා, ඔහේ කරල තියෙන්නේ ඉතාම නින්දිත වැඩක්. ඔහේ සූදනම් වෙන්නේ මේ කෞතුකාගාරයේ තිබෙන වටිනාම මැණික් මංකොල්ල කන්න බව මං හොඳහැටි තේරුම් අරගෙනයි තියෙන්නේ. ඒක ඔහේට කරන්න බැරිවෙන විධියට මාත් ලමානව හරි කරනවා. හොරමැරකම් කිරීම ඔහේ හිතනා තරම් පහසුවෙන එකක් නැහැ. ඔහේ වගේ හොරෙක්, වංචාකාරයෙක් මගේ බෑනා කරගන්න මට උවමනාවක් නැහැ. ඔය වගේ පුද්ගලයෙකු සමග විවාහවෙන්න එල්සි කොහොමටවත් කැමැතිවෙන්නෙ නැහැ. මං ජීවිත කාලයක්ම ගතකළේ මේ රටට අයිති පුරාවස්තු ආරක්ෂා කරන්න. ඔහේ ඒවා හොරකම් කරගන්න කලින් මේ ගැන මට දැනගන්න ලැබුණු එක දෙවියෝ බැලුවා වගෙ වැඩක්. ඒ ගැන මං දෙවියන්ට ස්තුතිකරනවා."

ඔහු හොරෙක් වුණත් දැඩි ආත්ම ශක්තියක් ඇති පුද්ගලයෙක්. මං කියූ කිසිදේකින් ඔහු සැළුණේ නෑ; පුදුමයකට පත්වුණු බවක් පෙන්නුවෙත් නෑ. මං කියල ඉවරවෙනතුරු හොඳට අහගෙන හිටියා. ඊළඟට ඔහු කාමරය හරහා ගිහින් සීනුව නාද කළා. ඒකට සේවිකාව එතැනට ආවා. "කරුණාකර ඇන්ඩ්‍රියස් මෙනෙවියට මෙහාට එන්න කියන්න" ඔහු සේවිකාවට කිව්වා.

මගේ දුව කාමරයට දිව ආවා. කාමරයේ දොර වසා දැමූ ඔහු ඇගේ අතින් අල්ලා ගත්තා.

"එල්සි" ඔහු කිව්වා. "මම වංචනිකයෙක් බව ඔයාලගෙ තාත්තට දැනගන්න ලැබිලා. ඔයා කලින් දැනගෙන හිටි දේ දැන් ඔහු දන්නවා"

ඇය නිශ්ශබ්දව බලාගෙන හිටියා.

"ඔයාගෙ තාත්තා කියනවා අපි දෙන්නට විවාහවෙන්න ඉඩදෙන්න බැහැලු"

ඇය ඔහුගේ අත අත්හැරියේ නැහැ.

"එල්සි" ඔහු කීවේ යළිත් ඇගේ මුහුණ දිහා බලමින්. "මගේ තිබුණු නරක ගතිගුණ ඉවත් කරලා මාව හොඳ මිනිහෙක් කළේ ඔයා. මගේ ජීවිතයට හොඳ බලපෑමක් කර ඇති එකම පුද්ගලයා ඔයා විතරයි. මට පොරොන්දු වුණු විධියට තවමත් ඔයා මට ආදරේද? නැත්නම් මාව අත්හැර දමනවාද?"



http://sherlockholmesinvestigations.blogspot.com




"ජෝන්, මං ඔයාට කවදාවත් අත්අරින්නේ නෑ"

http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

"ජෝන්" ඇය කීවේ ආකාවනාත්මක විලසින්. "මං ඔයාව කවදාවත් අත්හරින්නේ නෑ. මුළු ලෝකයම මට විරුද්ධව ආවත් කවදාවත් මං ඔයාව අත්හැරදමන්නේ නෑ."

"මං මගේ දුවට කරුණු වටහා දෙන්න උත්සාහ කළා; නොයෙකුත් තර්ක ඉදිරිපත් කළා. ආයාචනා කළා. නමුත් ඒ කිසිවක් ඇය කනකට ගත්තේ නැහැ. මං කියූ කිසිවකින් වැඩක් වුණේ නැහැ. මේ මිනිහා සම්පූර්ණයෙන්ම ඇයව ඔහුගේ වසගයට අරගෙන.

මහත්වරුනි. මගේ ආදරණීය බිරිඳ මියගියේ මේ කෙල්ල කුඩාකාලෙ. එද ඉඳල මං ඇයව ආරක්ෂා කළේ මගේ ඇස්දෙක වගේ. මට වෙන දරුවෙක් වත් ආදරය යොමුකළ හැකි ඥතියෙක් වත් නැහැ. ඒ වුණත් අර භයානක වංචාකාරයාගෙන් ඇයව බේරාගන්න, මට කිසිම හැකියාවක් තිබුණේ නැහැ. මගේ හිතේ ඇතිවුණේ දරාගන්න බැරි කම්පනයක්. බොහෝවෙලාවට ඔහුටත් ඒක තේරෙන්න ඇති."

"මහත්මයා" ඔහු කිව්වා. "තත්ත්වය ඔබ හිතන තරම් නරක එකක් නොවෙන්න පුළුවනි. මෙච්චර කාලයක් මං ඉතාම නරක විදියට කාලය ගතකළ කෙනෙක් බව ඇත්තයි. නමුත් එල්සිගේ ආදරය නිසා මගේ ඒ ගතිගුණ හැමදෙයක්ම වෙනස්වුණා. මගේ පිළිවෙළ සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න එල්සිට හැකිවුණා. ඇයට ලැජ්ජාවක් ඇතිවෙන දෙයක් මීට පස්සේ කවදාවත් නොකරන්න මං ඇයට පොරොන්දු වුණා. මං ඒ පොරොන්දුව දුන්නේ ඊයේ. මීට පස්සේ කවදාවත් මං කලින් ගිය ඒ වැරැදි මාර්ගයේ මං යන්නෙ නෑ. ඒකට මං හිතාහදාගෙන ඉවරයි"

ඔහු ඒ විදියට කථාකළේ, දැඩි අධිෂ්ඨානයක් ඇතිකරගත් පුද්ගලයෙකු ලෙසින්. කථාව අවසන් කළ ඔහු සාක්කුවට අත දමලා කුඩා කාඩ්බෝඩ් පෙට්ටියක් එළියට ගත්තා.

"මගේ ඒ අධිෂ්ඨානය මං ඒ විදියටම පිළිපදින බව, මං ඔබට ඔප්පු කරන්නයි මේ හදන්නෙ" ඔහු කිව්වා. "එල්සි මේ බලන්න ඔයා මාව හරි මාර්ගයට යොමුකිරීම නිසා ලැබෙන ප්‍රතිඵල. මහත්මයා ඔබ කලින් කියූ කාරණා ඇත්ත. ඔබ ආරක්ෂා කළ වටිනා මැණික් හොරකම් කර ගන්නයි මං සැලසුම් කළේ. ඒ වගේ වටිනා දේවල් හොරකම් කිරීම මට අභියෝගයක් වුණා. ඒක භාරගන්න මං



http://sherlockholmesinvestigations.blogspot.com



"මේසය උඩට වැටුණේ ඉතාම අලංකාර මැණික් ගල්....."

www.Sinhalaelibrary.com
Reading Purpose Only Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

බොහොම කැමැතිවුණා. ඒ නිසාද යුදෙව් පළඳනාවේ මැණික්ගල් හොරකම් කරන තීරණයට මං ආවා."

"මං ඒ බව දැනගත්තා"

"ඒ වුණත් එක දෙයක් ඔබ දැනගත්තෙ නෑ"

"ඒ මොකක්ද?"

"මං ඒව හොරකම් කරගෙන ඉවරයි!"

"දෙයියෝ සාක්කි! ඔය ඇත්තද?"

"ඔව්, මෙ පෙට්ටියේ තියෙන්නේ ඒ මැණික් ගල් දෙළහ."

කුඩා පෙට්ටිය විවෘත කළ ඔහු, එය මගේ මේසය උඩ අනෙක් පැත්තට හැරෙව්වා. මගේ ඇඟේ රෝමෝද්ගමනය වුණා. ඇඟ සීතල වුණා. මේසය උඩට වැටුණේ ඉතාම අලංකාර මැණික්ගල් දෙළහක්. රූපාක්ෂර කොටා තිබූ ඒවා ඇත්තම මැණික් බවට මගේ හිතේ සැකයක් ඇතිවුණේ නැහැ. ඒ පුරිම් හා තම්මිම් පළඳනාවේ ගල් දෙළහ.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" මට කෑගැහුණා. "ඔබ කොහොමද අහුනොවී බේරුණේ?"

"මේ මැණික් ඉවත්කරද්දී ඒ තැන්වලට මං ඉමිටේෂන් ගල් හෙවත් පාට වීදුරු කැලි දෙළහක් සවිකළා. ඒවා මං සාදවා ගත්තේ විශේෂයෙන්ම ඇණවුම් කරලයි"

"එහෙම නම් අර පළඳනාවෙ දැන් තියෙන්නෙ පාට කළ වීදුරු කැබලිද?"

"ඔව්. දැන් සති කීපයක ඉඳලම තියෙන්නේ ඒ ඉමිටේෂන් ගල්"

කිසිදෙයක් කතාකරගන්න බැරුව මට ගල් ගැහුණා. මගේ දුව නුහුමැලි වෙලා බලාගෙන හිටියේ ඇයටත් කිසිවක් කතාකරගන්න බැරුව. ඒත් ඇය අර මිනිහගේ අත නම් අත්හැරියේ නැහැ.

"එල්සි, ඔයාට පෙනෙනවා නේද? මේ දේ කරන්න තරම් මට ආත්ම ශක්තියක් තිබුණු බව?"

"මට පෙනෙනවා. වරද ගැන පසුතැවිලි වෙමින් හොඳ මිනිහෙක් වෙන්න ඔයාට හැකි බව මට පෙනෙනවා" ඇය කීවා.

"ඒ මට ඔයාගෙන් ලැබුණු උපදෙස් හා ආදරය නිසා" ඔහු කිව්වා. "මහත්මයා, මේ මැණික් ගල් මං ඔබ ළඟ තියල යනවා. ඒවට ඔබට කැමති දෙයක් කරන්න. ඔබ මට විරුද්ධව මොනවා හරි කරන්න බලාපොරොත්තු වෙනවද? එහෙනම් ඔබ මතක තබාගත යුතු



http://sherlockholmesinvestigations.blogspot.com



කාරණයක් තියෙනවා. ඔබ ක්‍රියා කරන්නේ ඔබේ එකම දුවගේ අනාගත ස්වාමිපුරුෂයාට විරුද්ධව බව."

එහෙම කියූ ඔහු කාමරයෙන් පිටවී ගියා.

මඳවෙලාවක් නිහඬව සිටි මහාචාර්ය ඇන්ඩ්‍රියස් යළිත් කතාව පටන් ගත්තා.

"මං මුහුණදුන්නේ හරිම උභතෝකෝටික ප්‍රශ්නයකට. පුරිම් - තම්මිම් පළඳනාවේ මැණික් ගල් මා ළඟ තියෙනවා. නමුත් මං කොහොමද ඒවා ආයෙමත් තිබිය යුතු තැනට පත්කරන්නේ? එහෙම කරන්න හැදුවොත් එක පැත්තකින් ඔහු අමාරුවේ වැටෙන්න පුළුවනි. අනෙක් අතට මාව, මහා ලැජ්ජාසහගත අපකීර්තියකට පටලැවෙන්න පුළුවනි. මගේ දුව අර තක්කඩියාව කොහොමටවත් අත්නොහරින බව මං දැනගිටියා. ඒ මොකද පුංචිකාලෙ ඉඳන් ඇගේ පිළිවෙල මං දන්න නිසා. ඊළඟට මට අනෙක් අතට හිතුණේ, ඔහු දැන් හොඳ මිනිහෙක් බවට පත්වෙලා, මැණික් ගල් තමන්ගේ කැමැත්තෙන්ම ආපහු දුන් නිසා, මෙක හෙළිකිරීම හරිද කියන එකයි. මං දිගින් දිගටම කල්පනා කළා. අන්තිමට මට හිතුණේ එය කළ යුතු හොඳම ක්‍රමය මෙක කියලයි. මට උවමනා වුණේ කාටවත් නොදැනෙන්න, නොතේරෙන්න, නියම මැණික් ගල් ආපහු තිබිය යුතු තැනට පමුණුවන්න. මා ළඟ තිබුණු යතුරු වලින්, මට හිතුණු වෙලාවක කෞතුකාගාරයට ඇතුළුවෙන්න පුළුවනි.

මුරකාර සිම්සන්ගේ ඉරියව් මං අවුරුදු ගණනාවක සිට දන්නවා. ඔහු ශාලා ඇතුළේ සංචාරය කරන වෙලාවන් මං දන්නවා. ඔහුගේ අඩිශබ්දය මං හොඳින් හඳුනනවා. ඒ නිසා ඔහුට අහුනොවී මට ඉෂ්ට කරගන්න පුළුවන් බව මට හොඳටම විශ්වාසයි. මේක කිසිම කෙනෙකුට නොදන්වා කිරීමට මං තීරණය කළා. මගේ දුවටවත් මං මේ ගැන කිව්වේ නැහැ. ඇයට මං කිව්වේ ස්කොට්ලන්තයේ මගේ සහෝදරයා සමග නිවාඩුවක් ගතකරන්න යන බව.

මේ කටයුත්ත පහසුවෙන්න, මං කෞතුකාගාරය කිට්ටුවම බෝඩිං හවුසියේ නිවසක කාමරයක් කුලියට ගත්තා. මං පුවත්පතක රැකියාවක් කරන නිසා, රාත්‍රිකාලයේ එළියට යන්න වෙන බව මං ඔවුනට කිව්වා.

පළමුවෙනි දවසෙ ම මං කෞතුකාගාරයට ඇතුළුවෙලා පළඳනාවේ උඩ පේළියේ වීදුරු කැබලි ඉවත්කරලා, නියම ගල්



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

සවිකළා. ඒක හරි අමාරු වැඩක්. ඒ ගල් හතර සවිකරන වැඩේට මුළු රාත්‍රියම ගතවුණා. සිම්සන්ගේ අඩිශබ්දය ඇහෙන වෙලාවට ඉක්මනට ගිහිං, මම මගේ පෙට්ටියේ හැංගුණා. රත්තරන් කාර්මික වැඩ ගැන මට දැනුමක් හෝ දක්ෂකමක් තිබුණේ නැහැ. හොරාට නම් ඒ ගැන සුවිශේෂ හැකියාවක් තිබුණා. මෙකෙ වෙනසක් නොපෙනෙන විදියට සවිකරන්නයි මට උවමනා වුණේ. ඊළඟ රාත්‍රියේ මං තවත් මැණික් ගල් හතරක් නියමිත තැනට සවිකළා. අද රාත්‍රියේ මට ඒ කටයුත්ත ඉවරකරන්න තිබුණා. නමුත් අවාසනාවකට වගේ ඊට බාධා ඇතිවුණේ නොහිතූ විදියකට.

මහත්වරුනි. මං ඔබට හෙළිකළේ සම්පූර්ණ සත්‍යයයි. එය කොයිතරම් ඉහළට ගෙන යා යුතුද යන්න තීරණය කළ යුත්තේ ඔබමයි. මගේ හිතේ සැනසීම නං සතුට, මගේ දුවගේ අනාගතය, ආදී මේ හැමදෙයක්ම රැඳී තිබෙන්නේත් ඔබේ අතේ. ඊට අමතරව හරි මගට වැටී ඇති මේ පුද්ගලයා හොඳ මිනිහෙක් වීමටත් ඉඩකඩක් තිබෙනවා. ඒ හැමදෙයක්ම රැඳී තියෙන්නෙත් ඔබ ගන්නා තීරණය මත."

මඳ වේලාවක් අප අතර පැවතුණේ නිහඬතාවයක්. කිසිදෙයක් හිතාගන්න බැරුව මගේ මිත්‍රයා මෝටිමර් කල්පනා කරන බවයි මට පෙනුණේ.

"මගේ ඒ තීරණය කුමක්ද කියා මං කියන්නම්" අන්තිමේදී මෝටිමර් කිව්වා. "හැමදෙයක්ම මෙතැනින් අවසන් වේවි. හොඳින් කෙළවර වේවි. රත්රන් ආභරණ ශිල්පය ගැන විශේෂඥයෙක් හෙට ඇවිත්, බුරුල් වෙලා තියෙන මැණික්ගල් ඒවා තිබිය යුතු නියම පිළිවෙළට සවිකරාවි. මෙන්න මං ඔබේ අතට අතදී ඔබෙන් සමුගන්නවා. මහාචාර්ය ඇන්ඩ්‍රියස්. මං විශ්වාස කරනවා, මං ආත්මාර්ථකාමී නොවී කටයුතු කළා කියලා."

අවසන් වශයෙන් ඔබට කිවයුතු දෙයක් තියෙනවා වොට්සන්. මාසයක් ඇතුළත එල්සි ඇන්ඩ්‍රියස් මෙහෙවිය, අර තරුණයා සමඟ විවාහවුණා. අද ඔහු සමාජයේ බොහොම ගරු බුහුමන් ලබන ප්‍රභුවරයෙක්. ඒ නිසාම ඔහුගේ නම වත් මේ කථාන්තරයවත් පාඨකයන් වෙත ගෙන යෑමට ඔබට අවසර නෑ. මේ කථාව "අතිශය රහසිගත" ලිපිගොනුවේ, ගොනුකර තබන්න. කොහොම වුණත් මගේ අවංක හැඟීම නම් ගරු බුහුමන් ලැබිය යුත්තේ ඒ තරුණයා නොව, ඔහු හරිමගට ගත් අර තරුණ කාන්තාව කියලයි."





www.sinhalaelibrary.com

# පොලීසියට ඕනෑකර තිබේ

1895 වසරේ හේමන්ත සෘතුව ගෙවී යද්දී මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා යෙදුණු තවත් විත්‍රමානවිත පරීක්ෂණයකට සහභාගිවීමට මට අවස්ථාව සැලසිණ.

මගේ බිරිඳ මේරි දිගු කලක් තිස්සේ වරින්වර අසනීප තත්ත්වයෙන් පසුවූවාය. දිගු නිවාඩුවක් ගතකිරීම සඳහා ඇයට ගම්පදයක පළාතකට යාම යෝග්‍ය යයි මම යෝජනා කළෙමි. එම නිවාඩුව ගතකිරීම සඳහා ඇගේ මිතුරියක කැඳවාගෙන යන මෙන් මම ඉල්ලා සිටියෙමි. මේරිගේ සිරුරේ තිබූ දුර්වලතාවය අනුව ශරීර සෞඛ්‍යය සුවඅතට හැරීම සඳහා වඩාත්ම යෝග්‍යවන්නේ ස්විට්සර්ලන්තය බව, වෛද්‍ය ක්ෂේත්‍රයේ මගේ හිතමිතුරන්ගේ අදහස විය. අන්තිමේදී ඇගේ පැරණි පාසල් මිතුරියක වූ කේට් විට්නි මේ ගමන සඳහා කැමති කරවා ගැනීමට මගේ බිරිඳට හැකිවිය. මේ කේට් විට්නි පිළිබඳව මම මීට පෙර පරීක්ෂණ වාර්තාක (අතුරුදන් වූ ව්‍යාපාරිකයා) සඳහන් කර ඇත්තෙමි.

මගේ ශල්‍යාගාරය වෙත පැමිණෙන රෝගීන් සංඛ්‍යාව ද මේ අතරවාර, බොහෝ සෙයින් වැඩිවී තිබිණ. මාස ගණනාවක් තිස්සේ දිනින් දිගටම වෛද්‍ය වෘත්තියේ යෙදීම නිසා, මම අතිශයින්ම වෙහෙසට පත්ව සිටියෙමි. මෙය මට ද විවේක නිවාඩුවක් අවශ්‍ය වූ කාලයක් විය. එහෙත් ස්විට්සර්ලන්තයේ ඇල්ප්ස් කඳුකරයේ මාස ගණනාක දීර්ඝ නිවාඩුවක් ගතකිරීමට මට අවකාශයක් නොතිබිණ. දිගු කලක් තිස්සේ මගෙන් ප්‍රතිකාර ගනිමින් සිටි පවුලක වයස්ගත මහත්මයෙක් මේ කාලයේ බරපතල ලෙස රෝගාතුර විය. ඔහු ගැන නොසලකා නිවාඩුවක් ගතකිරීමට යෑම, මට කිසිසේත් කළ හැක්කක් නොවිය. මගේ බිරිඳ හා ඇගේ මිතුරිය ස්විට්සර්ලන්තය බලා පිටත්වී ගොස් සති තුනකට පමණ පසු, මගේ රෝගියා බරපතල තත්ත්වයෙන් මිදී ක්‍රමයෙන් සුවය ලැබීමට පටන්ගත්තේය. දිවා රෑ නොබලා වෙහෙසවෙමින් සිටි මම, කෙටි නිවාඩුවක් ලබාගැනීමට තීරණය කළෙමි. මගේ ශල්‍යාගාරයේ රෝගීන් ගැන

බලා ප්‍රතිකාර කිරීම, මා හිතවත් වෛද්‍ය ඇන්ස්ට්‍රුදර්ට පැවරුවෙමි. අනතුරුව වැඩරාජකාරි අමතක කර දමා විවේකයක් ගැනීමට මා යා යුත්තේ කොහේදැයි මම කල්පනා කළෙමි.

මගේ සිහියට එක්වරම නැගුණේ, මා හිතවත් මිතුරා ෂර්ලොක් හෝම්ස්ය. ඔහු හමුවීමට, මට මාසගණනකින් වත් අවස්ථාවක් ලැබී නොතිබිණි. ඔහු මේ දිනවල යෙදෙන හදිසි පරීක්ෂණ කිසිවක් නොමැති නම්, මා සමඟ නිවාඩුවක් ගතකිරීමට යෑමට ඔහු කැමැති වනු නොඅනුමානය. කෙසේ හෝ ඔහු කැමතිකරවා ගැනීමට මම තීරණය කළෙමි. මේ තීරණය ගෙන පැය භාගයක් ගතවෙද්දී මා සිටියේ, බේකර් වීදියේ අපේ පැරණි නිවහනේ, මට හුරුපුරුදු විසිත්ත කාමරයේ දෙරටුව අසලය. එහි දොර විවෘතව තිබිණ.

මගේ මිත්‍රයා ඔහුට සුපුරුදු ලෙස පිඩුකබායෙන් සැරසී කවිච්චිය මත වැතිරී සිටියේය. ඔහුගේ පයිප්පය ද දල්වාගෙන එයින් දුම් පිටකරමින් හෝම්ස් සිටියේ දෙරටුවට පිටුපස හරවාගෙනය. මම ශබ්දයක් නොනගා පියවර දෙකක් විසිත්ත කාමරය තුළට තැබීමි.

"ඇතුළට එන්න වොට්සන්!" ඔහු සතුටෙන් කෑගැසුවේ ආපසු හැරී බැලීමටවත් තැත් නොකරමිනි. "මට කියන්න මගේ මොන වාසනාවක් නිසාද, ඔබ මේ පැත්තට පහළවුණේ කියල."

"හෝම්ස්. ඔබට නම් තියෙනවා ඉතාම තියුණු ශ්‍රවණේන්ද්‍රියක්" මම කීවෙමි. "කන් දෙක ඇහීම මුවෙකුගේ වගේ. ඔබ මේ විදියට මට නොපෙනෙන්න ආව නම්, අඩිශබ්දෙන් ඔබව හඳුනාගන්න මට හැකිවේවි කියල මං හිතන්නෙ නෑ."

"ඒ විදියට නම් ඔබව හඳුනාගැනීම වෙනත් අසීරු කාරණයක් මිත්‍රයා" හෝම්ස් කීය. "ඒ වුණත් බලන්න; අපේ තරප්පු පෙළේ හොඳ ආලෝකයක් නෑ; සෑහෙන්න අඳුරුයි. නමුත් ඔබ උඩට ආවෙ එක්වරකට තරප්පු දෙක බැගින් ඉහළට නගිමින්. එහෙම එන්න පුළුවන්කමක් තියෙන්නේ, දීර්ඝකාලයක් මේ උඩුමහලේ පදිංචිව හිටි කෙනෙකුට විතරයි. නමුත් දොරේ පිටපැත්තේ පාපිස්සේ කකුල පැටලී, ඔබ වැටෙන්න ගියා. ඔය පාපිස්ස එතැනට දමලා මාස තුනක් විතර වෙනවා. නමුත් ඔබ අන්තිමට මෙහේ ආවෙ මාස හතර පහකට කලින්. එතකොට හැමදෙයක්ම සරලයි. ආවේ කවුද කියලා මට තවත් විශේෂ දැනුම්දීමක් කරන්න අවශ්‍ය නෑ. සුවපහසු තැනකින් වාඩිවෙන්න වොට්සන්" කී ඔහු මා වාඩිවූ අසුන වෙත,



http://sherlockholmesinvestigations.blogspot.com



තුනෙන් කිහිපයක් විසිකළේය. "සුරුට්ටු දුම් පෙට්ටිය ඇත්තේ ඔය ඔරලෝසුව පිටුපස්සෙ."

මම අසුනේ සුවපහසු ලෙස වාඩිවී සුරුට්ටුවක් දල්වාගතිමි. මගේ මිත්‍රයා ඔහුගේ මුහුණ මා දෙසට හරවා බලාගෙන සිටියේ, දඟකාර සිනාවක් දෙතොලට නගාගෙනය.

"මගේ හිතවත් වොට්සන්, ඔබේ ඔය අරමුණ ඉෂ්ට කරගන්න බැරිවේවි. ඔබට උදව්වෙන්න පිළිවෙළක් මට නෑ." ඔහු කීය. "දැන් පැය බාගෙකට කලින් මට විදුලිපුවතක් ආවා. ඒකෙ හැටියට මට දින කිහිපයකට විවේකයක් ලැබෙන එකක් නෑ. ඔබ ආවෙ කොහේ හරි විනෝද ගමනක් යන්න, මාවත් හවුල් කරගන්නද? ඒවා නම් හරියන්නෙ නෑ මිත්‍රයා"

"මේක නම් හරි පුදුම කතාවක්නෙ හෝම්ස්" මම කීවෙමි. "මං හිතන්නෙ ඔබ මේ නොයෙක් දේවල් නිරීක්ෂණය කරලා, නිගමනවලට එනවා කියන කතාව පට්ටපල් බොරුවක්. ඔබ ඒ හපන්කම කරන්නේ පේන කීමෙන්. මුහුණ දිහා බලලා අනුන්ගේ සිත කියවීමෙන්. මං අහල තියෙනවා ඉන්දියාවෙ සාමිවරුන්ටත් ඒ හැකියාව තියෙනවා කියල. ඔබත් අතුරුදන්වෙලා හිටි කාලෙ ටිබෙටයේ කාලය ගතකළානේ."

පයිප්පය අතටගත් හෝම්ස් මගේ ඒ ප්‍රකාශයට මිනිත්තු කිහිපයක්ම හඬනගා සිනාසුණේය.

"ඔබේ පිළිවෙළ මං හොඳින් දන්නවා වොට්සන්" අන්තිමේදී ඔහු කීය. "ඒ හින්ද පේන කියන්න උවමනාවක් නෑ. හැමදෙයක්ම හරි සරලයි. ඔබේ ශල්‍යාගාරයේ ඔබ වැඩකරන්නේ හැන්දෑවෙ පහේ ඉඳන් හතට. නමුත් අද හැන්දෑවේ හයට ඔබ මගේ විසිත්ත කාමරයට එනවා සැහැල්ලුවෙන් හිනාවෙවී. ඒකෙන් තේරෙන්නේ ඔබ ශල්‍යාගාරයේ වෙදකම කාටහරි වෛද්‍යවරයෙකුට බාරදීලා. ඔබට අසනීප ගතියක් පෙනෙන්න නෑ. නමුත් ඉන්නේ විඩාපත්වෙලා. එතකොට මට හිතාගන්න පුළුවන් මෙහෙම දෙයක්. ඔබ ඉන්නේ එක්කෝ නිවාඩුවක් ගතකරමින්, එහෙමත් නැත්නම් නිවාඩුවක් ගතකරන්න කොහේ හරි යන්න සූදානමෙන්. ඔබේ කබායේ උඩසාක්කුවේ දමාගෙන ඉන්නවා රෝගීන්ගේ උණ බලන උණකටුව. ඒ කියන්නේත් අද හැන්දෑවේ ඔබ ලෙඩෙක් බලල තියෙනවා. එහෙම නම් නිවාඩුව පටන්ගන්නේ හෙට. මාසතුනකට



http://sherlockholmesinvestigations.blogspot.com

වැඩි කාලයක් මගේ කාමරයට ආවෙ නැති වොට්සන් මෙන්න එනවා හදිසියේම මාව දකින්න. ඔහුගේ එක් සාක්කුවක තියෙනවා බ්‍රැඩ්ෂෝගේ නාවික හා දුම්රියගමන් කාලසටහන් අඩංගු කෝෂ ග්‍රන්ථය. අනික් සාක්කුවේ තියෙනවා සංචාරකයන්ට හෝටල් වෙන්කර ගැනීමේ සැලසුම් පොත. එහෙනම් ඔබ ඇවිත් තියෙන්නෙ මොකකටද කියන එක හරිම පැහැදිලියි. ඔබේ අරමුණ අපි දෙන්නා එකතුවෙලා හවුලේ මොකක් හරි ගමනක් යමු කියන්න බව සහතිකයි."

"ඒ හැමදෙයක්ම ඇත්ත" කී මම වචන කිහිපයකින් මගේ හිතේ තිබූ සැලැස්ම පැහැදිලි කළෙමි. "ඔබට මේ ගමනට මා සමඟ හවුල්වෙන්න බැහැ කියන කරුණ අහන්න ලැබීමෙන් මගේ බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම කුඩුවුණා."

හෝම්ස් මේසය මත තිබූ විදුලිපුවතක් ගෙන එය කියවා බැලුවේ නළල රැළිකර යළිත් කල්පනා කරමිනි. අනතුරුව ඔහු, එය මා දෙසට දිගු කළේය.

"අපි දෙන්නා හවුලේ සොයුණු බොහොම විනෝදජනක, ඒ වගේම වික්‍රමාන්විත පරීක්ෂණ ඔබට මතකද වොට්සන්?" ඔහු ඇසීය. "මේකත් ඒ වගේ එකක් නම්.... මං එයාගෙන් ඉල්ලාහිටිනවා ඔබේ ඔය විනෝදගමන වෙනුවට මගේ මේ පරීක්ෂණයට හවුල්වෙන්න එන්න කියලා. බැලුබැල්මට නම් පෙනෙන්නේ මේක එදිනෙද දකින්න ලැබෙන සාමාන්‍ය ගැටලුවක් වගේමයි."

ඔහු දුන් විදුලිපුවත දිගහැර මම කියවා බැලීමි.

"ෂර්ලොක් හෝම්ස් මහතා. 221 බී, බේකර් වීදිය. ලන්ඩනය - වංචනික කටයුත්තක් පිළිබඳව පරීක්ෂාකිරීම සඳහා කරුණාකර වහාම ෂෙෆීල්ඩ් වෙත එන්න.

ජාවිස්,

බ්‍රිටිෂ් කොන්සොලිඩේටඩ් බැංකුව"

"මං පිළිතුරු විදුලිපුවතක් යැව්වා, එන බව දන්වලා" ඔහු කීය. "සාන්ත පැන්ක්‍රාස් දුම්රියපොළෙන් පාන්දර 1.30ට ෂෙෆීල්ඩ් බලායන දුම්රියෙන් එන බව දන්නුවා. ඒ මොකද මට ඊට කලින් යන්න හැටියක් නැ. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ කෙරුණු හොරකමක් ගැන මං මේ දිනවල පරීක්ෂණ පවත්වාගෙන යනවා.


http://sherlockholmesinvestigations.blogspot.com



ඒ ගැන වැදගත් තොරතුරක් ලබාගන්න අද රෑ මං නැගෙනහිර ලන්ඩනයට යා යුතුයි."

මේ අවස්ථාවේ සේවක ළමයා හවස පුවත්පත් ගොන්නක් ද රැගෙන විසිත්ත කාමරයට ඇතුළුවිය.

"ෂෙෆීල්ඩ්හි කලබැගෑනිය ගැන තවත් කථාකරන්න කලින්, අපි බලමු හැන්දෑවෙ පත්තරවලින් කියන්නෙ මොනවද කියල" කී හෝම්ස් පුවත්පත් තෝරා පිටු පෙරළුවේය. "ඊව්නිං නිවුස්, ග්ලෝබ්, ස්ටෑන්ඩඩ් ආදී පත්තර නම් තියෙනවා..... ...... ආ මේ තියෙන්නේ මෙන්න මේක වෙන්න ඇති." ඔහු පුවත්පතක පළවී තිබූ ප්‍රවෘත්තියක් මට පෙන්නුවේය.

## ෂෙෆීල්ඩ් හි ගනුදෙනුකරුවෙක් විශාල මුදල් වංචාවක!

ෂෙෆීල්ඩ් නගරයේ බැංකු ගණනාවක නිලධරයන් රවටා, මේ පුද්ගලයා විසින් වංචාකරගෙන ඇති මුදල රන්පවුම් හයදහසකට අධික බැවි අපට දැනගන්නට ලැබී ඇත. ඔහු එසේ කිරීමට සමත්වී ඇත්තේ ව්‍යාජ ලෙස සැකසූ චෙක්පත් දුසිමක ආධාරයෙනි. වංචාකළ මුදල් ප්‍රමාණය කොපමණදැයි තවමත් ගණන් බලා නැත. අපගේ ෂෙෆීල්ඩ් වාර්තාකරු මේ සෑම බැංකුවකම කළමනාකරුවන් හමුවීමට සමත්විය. එහෙත් සම්පූර්ණ තොරතුරු හෙළිදරව් කිරීමට ඔවුහු මැළිවූහ.

පත්‍රය මුද්‍රණයට යන අවස්ථාව වනවිට අපට දැනගන්නට ලැබී ඇති තොරතුරු මෙසේය. 1881 ජනවාරි මාසයේදී බ්‍රිටිෂ් කොන්සොලිඩේටඩ් බැංකුවේ ෂෙෆීල්ඩ් ශාඛාවේ සේවයට ජේබ්ස් බූත් නම් මහත්මයෙක් බැඳුණේය. ඔහු පදිංචිව සිටියේ ෂෙෆීල්ඩ්හි බ්‍රූම්හිල් පෙදෙසේය. ඉතාම සූක්ෂම අන්දමින් වංචනිකව සැකසූ චෙක්පත් දොළහක්, ඊයේ බැංකු දොළහකට දී, විශාල මුදලක් වංචා කරගත් බූත්, දැන් ආගිය අතක් නැත.

මෙය දීර්ඝකාලයක් තිස්සේ හිතාමතා සැලසුම්කළ අපරාධයක් බව පෙනීයයි. ෂෙෆීල්ඩ්හි ප්‍රධාන බැංකුවක සේවකයෙකු වීම මගින්, නගරයේ ධනවත් ගනුදෙනුකාරයින් රැසකගේ අත්සන් අධ්‍යයනය කිරීමට, ඔහු අවස්ථාවක් සලසාගත්තේය. ඒ සමඟම ඔහු බැංකු දොළහකම ජංගම ගිනුම් විවෘතකොට, ඒවා සමඟ නිරතුරුවම ගනුදෙනු කළේය. මේ මගින් බැංකු දොළහේම කාර්යමණ්ඩල පෞද්ගලිකව හඳුනාගැනීමට ද ඔහු සමත්විය.

www.sinhalaelibrary.com


http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු අනුගමනය කළේ මෙම ක්‍රියාමාර්ගය යයි දැන් හෙළිවී ඇත. තමාගේ ගිණුමේ නමට විශාල මුදලකට ලියන ලද වංචනික චෙක්පත බැගින් ඔහු බැංකු ශාඛාවලට භාරදී තම ගිණුමේ නැන්පත් කර ඇත. සැකයකට ලක්නොවන පරිදි මෙම චෙක්පත් රේඛනය කොට තිබිණි. මීළඟට ඔහු වංචනික චෙක්පතේ වටිනාකමෙන් අඩක පමණ මුදලක් තමාගේ ගිණුමෙන් ආපසු ගත්තේය.

මේ වංචාව ගැන හරි හැටි දැනගැනීමට හැකිවූයේ අද - අගෝස්තු 31 වැනිදා (බ්‍රහස්පතින්දා) උදෑසනය. මේ අනුව තක්කඩියාට පැනයාමට පැය 20ක කාලයක් තිබිණැයි සමහරු පවසති. මේ කෙසේ වෙතත් ඔහු පසුපස හඹායෑම සඳහා, ඔවුන්ගේ දක්ෂම රහස්පරීක්ෂකයන් ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසිය විසින් දැනටමත් යොදවා ඇත. අමු තක්කඩියා අල්ලාගැනීම සඳහා බේකර් වීථියේ ලෝකප්‍රකට අපරාධ පරීක්ෂක ෂර්ලොක් හෝම්ස් මහතාගෙන් ද උදව් ඉල්ලා ඇතිබැව් විශ්වාස කටයුතු ආරංචි මාර්ගවලින් හෙළිවේ."

"ඊළඟට තියෙනවා වොට්සන්, හොරාගේ බාහිරපෙනුම ගැන දීර්ඝ විස්තරයක්. ඒක අපි තියමු පසුව ප්‍රයෝජන ගැනීමට" හෝම්ස් කීවේ පුවත්පත හකුළා තබමිනි. "මේ බූන් කියන හොර තක්කඩියා අල්ලා ගැනීම, ඒ තරම් පහසු කටයුත්තක් වේය කියල මං හිතන්නේ නෑ. ඔහුට රටෙන් පැනගන්න තිබුණේ පැය 20 ක් බව ඇත්ත. නමුත් ඔහු ඒ කටයුත්ත අවුරුද්දක පමණ කාලයක ඉඳල සැලසුම් කරල තියෙනවා. ඒ කියන්නේ පැන යායුතු ක්‍රමය ගැනත් ඔහු හොඳින් හිතා බලල තියෙන්න ඇති. ඉතින් මොකක්ද වොට්සන් ඔබ කියන්නෙ? පහුගිය කාලේ අප යෙදුණු සමහර පරීක්ෂණ ගැන බලනකොට, ඔබ මෙහෙම දෙයක් දැකල තියෙනවද? අපට ලැබුණු ඉතාම අපූරු සිත් ඇදගන්නා පරීක්ෂණ සමහරක්, මුලදී ඒ තරම් අපූරුබවක් පෙන්නුවේ නැහැමින්ද?"

"ඒක හරි" මම කීවෙමි. "බොහොම වෙලාවට ඒවල තිබුණේ සිත් ඇද නොගන්නා ලක්ෂණ. මගේ තීරණය ගැන කියනවා නම්; මං තීරණය කළා විනෝදචාරිකාව අත්හැරදමල ඔබ එක්ක ෂෙෆීල්ඩ් යන්න"







"විශිෂ්ටයි. ඔන්න එහෙනම් ඒක තීන්දුයි" අතිශය සතුටට පත් මගේ මිත්‍රයා කීවේ, මගෙන් සමුගැනීමට සූදානම් වෙමිනි. "වොට්සන්. දැන් මං යන්න ඕන මං අර කලින් සඳහන් කළ රාජකාරියට. මතක තියාගන්න. පාන්දර 1.30ට සාන්ත පැන්ක්‍රාස් දුම්රියපොළට!"

* *

මම කල්වේලා ඇතිව දුම්රියපොළට ගොස්, ප්‍රවේශපත්‍රයක් මිලට ගෙන, වේදිකාවට පිවිසුණෙමි. දුම්රිය පිටත්වන වේලාව ළංවුණත්, මගේ මිත්‍රයාගේ ලකුණක් හෝ නොවීය. දුම්රිය සේවකයෙක්, මැදිරිවල විවෘතව තිබූ දොරවල් වසාදැමීමට පටන්ගත්තේ උස් හඬක් නැගෙන පරිද්දෙනි. තවත් මොහොතක් ගතවෙද්දී, හෝම්ස්ගේ කෙට්ටු උස් සිරුර, ප්‍රවේශපත්‍ර කාර්යාලය පැත්තේ සිට වේදිකාව දෙසට එන අයුරු දක්නට ලැබිණ.

"වොට්සන්. ඔන්න මං ආවා" ඔහු කීවේ ප්‍රීතිමත් හඬෙනි. "මට වෙලාවට එන්න බැරිවේවි කියල ඔබට හිතෙන්න ඇති. අද හැන්දෑවරුවම අර කටයුත්තට ගතවුණා. කිසිම විවේකයක් තිබුණේ නෑ."

"ඔබ කොහොම හරි වෙලාවට එනබව මං දැනගෙන හිටියා" මා පැවසුවේ, අප පළමුවන පංතියේ දුම්රිය මැදිරියකට නැග, එහි මුහුණට මුහුණ ලා පිහිටි ආසන දෙකක වාඩිවෙද්දීය. "හෝම්ස්. ඔබ බොහොම ක්‍රමානුකූලව නියම් වෙලාවට වැඩකරන කෙනෙක් නිසා, දුම්රිය වරද්දගන්න තරමට ප්‍රමාදවෙන්නෙ නැතිබව මං දන්නවා. මං පුදුමයට පත්වෙන්නෙ, ඔබ නියමිත වෙලාවට මිනිත්තු දහයක් කලින් දුම්රියපොළට ආවොත්"

"දැන් අපි ටිකක් නිදාගන්න බලමු" හෝම්ස් කීය. "හෙට දවස අපට රාජකාරි බහුල එකක් වෙනවාට කිසිම සැකයක් නෑ"

තමාට හිතුණු වෙලාවට ගැඹුරු නින්දකට පිවිසීමට, ඔහුට පුදුමාකාර හැකියාවක් තිබිණි. ඒ හැකියාවම යොදා ගනිමින් හිතුණු වෙලාවට නොනිදා සිටීමට ද ඔහුට හැකිවිය. විසඳීමට දුෂ්කර වූ සංකීර්ණ ගැටලු මතුවූ විට, ඔහු දින කිහිපයක් එක දිගට, රෑ දවල් දෙකම නොනිදා අවදියෙන් සිටියේය.





www.sinhalaelibrary.com

දුම්රිය මැදිරිය තුළ දල්වා තිබූ පහන්වලින් දීප්තිමත් එළියක් විහිදිණි. මැදිරිය අඳුරු වනසේ ඔබ පහන්වල ආවරණ ඇද දමූ හෝම්ස්, තම අසුනේ වකුටුවී හිස පහත්ට නමාගත්තේය. මිනිත්තු දෙකක් ගතවෙද්දී ඔහු රිද්මයානුකූලව හුස්මගන්නා හඬ මට අසන්නට ලැබිණි. ඒ අනුව ඔහු නින්දට වැටුණු බව මම තේරුම් ගතිමි. එවැනි හැකියාවක් නොතිබුණු මම දෙනෙත් පියාගෙන සැහෙන වෙලාවක් අසුනේ සිටියෙමි. නින්ද බලාපොරොත්තුවෙන් මා සිටියත්, එය ළඟා නොවන සැටියකි. අපේ දුම්රිය ඝනාන්ධකාරය තුළින් වේගයෙන් ඉදිරියට ඇදීගියේය. නොනවත්වා ගමන්කළ එය විටෙක පසුකළේ, හොඳින් ආලෝකමත් වූ දුම්රියපොළකි. හෝම්ස් මට පැහැදිලිව දක්නට ලැබුණේ එවැනි වෙලාවකය.

මට හොඳින් නින්දයන්නට ඇත්තේ, අප නොටිංහැම් ද පසුකර යාමෙන් පසුව වියයුතුය. කොයිතරම් වෙලාවක් එලෙස ගමන් කරන්නට ඇද්දැයි මට නොදැනිණ.

එක්වරම ප්‍රබල ඝෝෂා හඬක් නංවමින් දුම්රිය ගමන්කළ නිසා තද නින්දෙන් මට ඇහැරිණි. ඒ වනවිට එළිය වැටෙන්නට පටන්ගෙනය. මැදිරියේ පහන් ආවරණ ද ඉවත්කොට තිබූ නිසා මැදිරිය තුළ ද ආලෝකමත් විය. මගේ මිත්‍රයා අසුනේ හිඳගෙන, බ්‍රැඩ්ෂෝගේ දුම්රිය හා නැව්ගමන් කාලසටහන් පොත අධ්‍යයනය කරමින් සිටියේය. මා අවදිවනු දුටු ඔහු මා ඇමතුවේය.

"වොට්සන්. මං හිතන්නේ අපි ඒ පසුකළේ ඩෝ ඇන්ඩ් වොට්ලි ළඟ. එහෙම නම් අපි නව මිනිත්තු කිහිපයක් යද්දී ෂෙෆීල්ඩ්වලට ළඟාවේවි. ඔබට පෙනෙනවා ඇති මං මෙච්චර වෙලා, කාලය නාස්ති නොකළ බව. මං කාලය ගතකළේ බ්‍රැඩ්ෂෝ එක පරීක්ෂාකර බැලීමට. කිසි සැකයක් නෑ, අපි වාගේ අයට මේ තරම් ප්‍රයෝජනවත් වෙනත් කිසිම පොතක් ළියවෙලා නෑ."

"ඒත් මේ වෙලාවේ ඔබට ඔය පොතෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද?" මම ඇසුවෙමි.

"ඒක ප්‍රයෝජන වෙන්නත් පුළුවන්, නොවෙන්නත් පුළුවන්" හෝම්ස් කීවේය. "ඒ කොහොම වුණත් සියලුම අදාළ තොරතුරු හොඳින් දැනගෙන ඉඳීම හරිම වැදගත්. බොහොම වෙලාවට මේ ජේබ්ස් බූත් කියන මිනිහා රටින් පනින්න තීරණය කරල ඇති.







එහෙම නම් ඔහු ඒ කටයුත්තෙදි, මෙකෙ අඩංගු තොරතුරු ප්‍රයෝජනයට ගන්නා බවට සැක නෑ.

ඔබට තදින්ම නින්ද ගිහින් තිබුණු වෙලාවෙ මේ දුම්රිය නැවැත්තුවා ලෙස්ටර් දුම්රියපොළේ. මං එතැනදී "ෂෙෆීල්ඩ් ටෙලිග්‍රාෆ්" පුවත්පත මිලට ගත්තා. මෙන්න අහන්න ඒකෙ තියෙන විස්තර.

ජේබ්ස් බූත් ඔහුගේ අන්තිම වංචනික චෙක්පත මාරුකරල තියෙන්නෙ, අගෝස්තු 30 වැනිදා. ඒ කියන්නෙ බදාදා හවස හරියටම 2යි 15ට. ඒ නෝත් බ්‍රිටිෂ් බැංකුවේ, සැවිල් වීදියේ ශාඛාවෙන්. ඔහු බැංකුවෙන් බැංකුවට ගමන්කරලා තියෙන්නේ කුලී අශ්වකරත්තයක. මේ කියන බැංකුවේ ඉඳලා, ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් දුම්රියපොළට යන්න ගතවෙන්නෙ ඇත්තෙ මිනිත්තු තුනයි. පත්තරේ තියෙන තොරතුරුවලින් මං තේරුම් ගත්තෙ මෙහෙමයි. ඔහු බැංකුවකින් බැංකුවකට ගිහින් තියෙන්නේ, ඉතාම ක්‍රමානුකූලව සැලසුම් කළ වටරවුම් මාර්ගයක. අර දුම්රියපොළට ළඟම බැංකුවෙන් ඔහුගේ කටයුතු අවසන් කළේ ඇයි? එතකොට ඔහුට දුම්රියපොළට ළඟාවෙන්න පුළුවනි තවත් මිනිත්තු තුනකින්. ඒ කියන්නෙ 2.18ට.

මොකක්ද ඒකෙ වැදගත්කම? ෂෙෆීල්ඩ්වල ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් දුම්රියපොළෙන් හවස 2.22ට ලිවර්පූල්බලා පිටත්වෙන දුම්රියක් තියෙනවා. ඒක ලිවර්පූල්වලට ළඟාවෙන්නෙ හවස 6.30 වෙන්න මිනිත්තු කීපයකට කලින්. හවස 6.30ට ලිවර්පූල් වරායෙන් "එම්ප්‍රස් ක්වීන්" නම් මගී නෞකාව පිටත්වෙනවා. "වයිට්ස්ටා" නැව් සමාගමේ "එම්ප්‍රස් ක්වීන්" අත්ලාන්තික් සාගරය හරහා යාත්‍රා කරන්නේ, ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් වෙත. පලායෑම සඳහා බූත් ඒ මාර්ගය තෝරාගත්තා වෙන්නත් පුළුවනි. එහෙම නැත්නම් ඔහුට තවත් විකල්පයක් තියෙනවා"

"ඒ මොකක්ද?"

"ෂෙෆීල්ඩ් දුම්රියපොළෙන් තවත් සීඝ්‍රගාමී දුම්රියක් පිටත්වෙනවා හවස 2.45ට. ඒක ගමන්කරන්නේ නැගෙනහිරට. ඒක ගිහින් හල් දුම්රියපොළට ළඟාවෙනවා හවස 4.30ට. හල් වරායෙන් හවස 6.30ට ඕලන්දයේ ඇම්ස්ටර්ඩෑම් බලා නැවක් පිටත්වෙනවා. ඒ "කොමට්" නම් දුම්නැව.

"හැබෑද?" මා ඇසුවේ පුදුමයෙනි. "බූත්ට පැන යා හැකි ප්‍රධාන මාර්ග දෙක දැනටම ඔබ දන්නවාද?"

"ඔව් වොට්සන්. හොරාව එංගලන්තයෙන් ඉක්මනින් පැන යාහැකි මාර්ග දෙකක් තියෙනවා. මේ ගැනත් අපි සිහි තබාගත යුතුයි."

හෝම්ස්ගේ කතාබහ නිමවෙද්දී, අප ගමන්ගත් දුම්රිය, දුම්රියපොළකට ළඟාවීමට නිරිංග නදකරන ශබ්දය ඇසිණ.

"4.05ටත් කිට්ටුයි" මම කීවෙමි.

"ඔව්" හෝම්ස් කීය. "අපි මිනිත්තු එකහමාරක් ප්‍රමාදයි. කොහොමටත් අපි බඩපිරෙන්න උදේ කෑම කාලා, සැර කෝපි කෝප්ප දෙක තුනක්, බීලා හිටියොත් හොඳයි. ඒකට අපට පැය දෙකක් තුනක් වුණත් වෙන්කරන්න පුළුවනි"

* * *

උදේ ආහාරයෙන් පසු අපි ෂෙෆීල්ඩ් පොලිස් ස්ථානය බලා පිටත්වී ගියෙමු. මේ සිද්ධිය පිළිබඳව වෙනත් අලුත් කරුණු කිසිවක් දැනගන්නට ලැබී නොමැති බව එහිදී හෙළිවිය. ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ රහස්පරීක්ෂක ජී. ලෙස්ට්‍රේඩ් මහතා, කලින් දා හැන්දෑවේ ලන්ඩනයේ සිට පැමිණ ඇති බවත්, මෙම අපරාධ පරීක්ෂණය ඔහුට නිල වශයෙන් භාරදී ඇතිබවත්, ෂෙෆීල්ඩ් හි පොලිස් ප්‍රධානියා පැවසුවේය.

ජේම්ස් බූත් රැකියාව කළ බැංකුවේ කළමනාකාර ජාවිස්ගේ හා බූත් නේවාසිකව සිටි බ්‍රෑම්හිල්හි නිවසේ හිමිකාරියගේ ලිපින අපි පොලිසියෙන් ලබාගත්තෙමු.

අප මුලින්ම පිටත්වී ගියේ, බ්‍රිටිෂ් කොන්සොලිඩේටඩ් බැංකුවේ කළමනාකාර ජාවිස් මහතා හමුවීම සඳහාය. ෆුල්වුඩ්හි පිහිටි ඔහුගේ නිවස වෙත අප ළඟාවෙන විට වේලාව උදේ හතයි තිහ පසුවෙමින් තිබිණ. අප පිළිගෙන, විසිත්ත කාමරයට කැඳවාගෙන ගිය සේවකයෙක්, අපගේ පැමිණීම ගැන තම ස්වාමියාට දැනුම්දුන්නේය.

අවුරුදු පනහක් පමණ වයසැති මිටි, තරබාරු ජාවිස් මහතා ඉක්මනින් විසිත්තකාමරය වෙත පැමිණියේය. රතු පැහැති මුහුණක් තිබූ ඔහු පෙනුමින් දිස්වූයේ, අතිශයින්ම ධනවත් පුද්ගලයෙකුගේ පෙනුමය.



http://sherlockholmesinvestigations.blogspot.com



"මගේ ප්‍රමාදය ගැන සමාවෙන්න මහත්වරුනි" ඔහු කීය. "ඔබ හුගක් උදෙන්ම ඇවිත්"

"ඇත්තෙන්ම ඔව් ජාවිස් මහත්මයා" හෝම්ස් කීය. "හුගක් උදෙන් පැමිණීම ගැන සමාව අයැදිය යුත්තේ අපි. බූත් මහතාගේ සිද්ධිය ගැන අප දැන ගතයුතු කරුණු රාශියක් තිබෙනවා. මං කැමතියි ඔබ වෙත ඒ ප්‍රශ්න ඉදිරිපත් කරන්න."

"මං බොහොම කැමතියි ඒවාට පිළිතුරු දෙන්න" ජාවිස් කීය.

"බූත් මහත්මයා ඔබේ බැංකුවේ සේවයට බැඳුණේ කවදද?"

"81 අවුරුද්දේ ජනවාරි මාසයේ"

"ඔහු ෂෙෆීල්ඩ්වලට ඇවිත් මුලින්ම පදිංචිවුණේ කොහේද කියන එක ඔබ දැනහිටියාද?"

"ඔව්, ඇක්ගේට් පාරේ නිවසකයි ඔහු නේවාසිකයෙකු වුණේ. මං හිතන්නේ එද ඉඳන් දිගටම ඔහු හිටියේ එහි"

"ඔහු ඔබේ බැංකුවේ සේවයට බැඳෙන්න කලින්, ඔහුගේ පෞද්ගලික තොරතුරු මොනවාද ඔබ දන්න තරමින්? මං අදහස් කළේ ඔහුගේ ඉතිහාසය"

"මං දන්නේ කරුණු බොහොම ස්වල්පයයි මහත්මයා" ජාවිස් කීය. "ඔහුගේ මවුපියන් දෙදෙනාම මියගිහින්. අපේ බැංකුවේ ලීඩ්ස් ශාඛාවේ සේවය කරලා, එතැනින් ඔහු විශිෂ්ට සහතික ගෙන ආවා. ඒ ඇරෙන්න ඔහු ගැන වෙන කරුණු කිසිවක් මං දන්නෙ නෑ."

"ඔබට පෙනුණේ ඔහු බොහොම විශ්වාස කටයුතු ක්‍රියාශීලි අයෙක් විදියටද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. මට දකින්න ලැබුණු විදියට ඔහු වැඩරාජකාරිවලට දක්ෂ බුද්ධිමත් අයෙක්. මං හිතන්නේ මා යටතේ ඉඳපු දක්ෂම පුද්ගලයින් කිහිපදෙනා අතරින් එක් අයෙක් කිව්ව හැකි"

"ජාවිස් මහත්මයා" හෝම්ස් කීය. "ඔහුට ඉංග්‍රීසි හැරෙන්න වෙනත් භාෂා කථාකරන්න හැකියාවක් තිබුණද?"

"නැහැ. ඒ වගේ විදේශ භාෂා නිපුණත්වයක් ඔහුට තිබුණෙ නෑ. ඒක මට විශ්වාසයි. ඒ මොකද විදේශීය රටවලින් බැංකුවට එන ලිපි ගැන කටයුතු කරන්න අපට ඉන්නවා විශේෂ ලිපිකරුවෙක්. බූත් මහත්මයා වෙත යොමුවුණු ලිපිත් අර ලිපිකරුවා වෙත යැවූ බව මං දන්නවා"



http://sherlockholmesinvestigations.blogspot.com

"ජාවිස් මහත්මයා" හෝම්ස් කීය. "දැන් මං ඔබට ඉදිරිපත්කරන ප්‍රශ්නය, බැංකු කටයුතුවලට අදාළ එකක්. අපි මෙහෙම කියමු. කෙනෙක් වංචනික ලෙස සකස්කළ චෙක්පතක් බැංකුවට දීලා මුදල් ලබාගත්තා කියල හිතමු. ඒක වංචනික එකක් බව දැනගන්න බැංකුවට කොයිතරම් කාලයක් ගතවෙනවද?"

"එක් එක් අවස්ථාවෙ හැටියට ඒ කාලවේලාව වෙනස් වෙනවා මහත්මයා" ජාවිස් කීය. "අපි හිතමු ඉදිරිපත් වෙන්නෙ එකම චෙක්පතයි කියලා. ඒක විශාල වටිනාකමක එකක් නොවෙයි නම්, "හොර" එකක් බව තේරුම්ගන්න සෑහෙනු කාලයක් ගතවෙන්න පුළුවනි; සමහරවිට සතියක් හෝ දෙකක් ගතවේවි. නමුත් ඉල්ලා සිටින මුදල විශාල එකක් නම් ඒ වෙලාවෙම පරීක්ෂාවට ලක්වෙනවා. එතකොට එවේලේම අහුවෙන්න පුළුවනි. මෙතැන වංචනික චෙක්පත් දූසිමක් ඉදිරිපත් වෙලා තියෙනවා. එයින් එකක්වත් වංචනික බව පැය 24ක් ඇතුළත අහුනොවුණොත් තමයි පුදුමෙ. ඊටත් වැඩිකාලයක් යනතුරු මේක අහුනොවී කරන්න කවුරු හරි උත්සාහ කළා කියලා හිතමු. එහෙම නම් ඒ මිනිහා සිහි කල්පනාව හොඳ මිනිහෙක් වෙන්න බෑ."

"බොහොම ස්තුතියි මහත්මයා" හෝම්ස් කීවේ අපුහෙන් නැගීසිටිමිනි. "ඒවා තමයි මට දැනගන්න උවමනාවුණු ප්‍රධානම කරුණු. මොකක් හරි වැදගත් දෙයක් අපට දැනගන්න ලැබුණොත්, මං ඔබට දැනුම් දෙන්නම්"

"මං ඔබට අතිශයින්ම ණයගැතියි හෝම්ස් මහත්මයා" බැංකු කළමනාකරු කීය. "මේක මගේ මොළය සම්පූර්ණයෙන්ම අවුල් කළ කාරණයක්. මෙතැනින් ඉදිරියට කළ යුත්තේ මොකක්ද කියන එක අපට හිතාගන්න අමාරුයි. හෝම්ස් මහත්මයා ඔබ කැමැති ඕනම දෙයක් කරන්න. අපෙන් බාධාවක් නෑ. ආ....... ඒක නෙමෙයි. බූත් පදිංචිව හිටි ගෙදර අයිතිකාරියටත් මං පණිවුඩයක් යැව්වා. මං දැනුම්දුන්නා ඔබ පරීක්ෂා කරන තුරු බූත්ගේ කාමරයේ කිසිම දෙයක් එහා මෙහා කරන්න එපා; අතපතගාන්න එපා කියල"

"ඒක බොහොම බුද්ධිමත් උපදෙසක් මහත්මයා" හෝම්ස් කීය. "මං හිතන්නෙ ඒක ඔබ අපට කළ උදව්වක්"

"හෝම්ස් මහත්මයා" ජාවිස් කීය. "අපේ බැංකුවේ ප්‍රධානීන් මට මේ කරුණත් දැනුම්දීල තියෙනවා. මේ පරීක්ෂණය සඳහා ඔබේ



http://sherlockholmesinvestigations.blogspot.com



වියදම් කරුණාකරල සටහන් කරගන්න. ඒ මුදල් වහාම ගෙවන්න අපේ බැංකුව සූදානම්"

මිනිත්තු කිහිපයකට පසු අප සිටියේ, බරුම්හිල්හි ඇජ්ගේට් පාරේ පර්නල් මහත්මියට අයත් නිවස ඉදිරිපිටය. ජේබිස් බූත් මහතා මෙම නිවසේ අවුරුදු හතක පමණ කාලයක් නේවාසිකව සිටි බැව් අපට අසන්නට ලැබිණ. අප සීනුව නාදකරද්දී, තරුණ සේවිකාවක් ඉදිරියට පැමිණියාය.

"පර්නල් නෝනා උඩ තට්ටුවේ" ඇය කීවාය. "බූත් මහත්මයාගෙ කාමරය පරීක්ෂා කරන්න පොලීසියෙන් මහත්මයෙක් ඇවිත් ඉන්නවා......"

"අපි ආවෙත් ඒ කටයුත්තට තමා" හෝම්ස් කීය. "අපි ආවෙ ලන්ඩන් සිට...... කොන්සොලිඩේටඩ් බැංකුවේ ජාවිස් මහත්මයා තමා අපව කැඳෙව්වෙ. මගේ නම ෂර්ලොක් හෝම්ස්......"

"හරි මහත්මයා" සේවිකාව කීවාය. "ජාවිස් මහත්මයා ඔබ ගැන අපට දැනුම්දුන්නා. කරුණාකරල මේ පැත්තෙන් එන්න. අපි උඩතට්ටුවට යමු."

ඉදිරියෙන් දිවගිය ඇ අප පිළිබඳ තොරතුරු, සිය ස්වාමිදූවට පැවසුවාය. වයස අවුරුදු හතළිහක් පමණ වූ පර්නල් මහත්මිය තවකාර තැනැත්තියක බැව් අපි තේරුම් ගත්තෙමු. කාමර පරීක්ෂාවේ යෙදීසිටි පොලිස් නිලධාරියා අපේ හිතවත් ලෙස්ට්‍රේඩ්ය. ඔහු තම කටයුතු අවසන් කරමින් සිටි බැව් පෙනිණ.

"සුභ උදෑසනක් හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය. "වැදගත්ම තැනට එන්න, ඔබ හුඟක් ප්‍රමාද වැඩිවුණා කියලයි මට හිතෙන්නෙ. උවමනා කරන තොරතුරු හැම දෙයක්ම මං හොයාගත්තා. හොරා අල්ලාගන්න උවමනා හෝඩුවාවන්, හැම එකක්ම මට ලැබුණා."

"ඒක අහන්නත් සන්තෝසයි" හෝම්ස් කීය. "එහෙම නම් අපි ඔබට ප්‍රශංසා කළ යුතුයි. ඔබගේ විරුද්ධත්වයක් නැත්නම් මමත් කාමරය සෝදිසි කරල බලන්නම්. අස්සෙ අපට බැරිය අප හොයාගත් කරුණු සංසන්දනය කරල බලන්න"

"ඔබේ කැමැත්තක්" ලෙස්ට්‍රේඩ් පිළිතුරු දුන්නේ උඩඟු ආකාරයෙනි. "ඇත්තම කියනවා නම් ඔබ කරන්නේ කාලය නාස්තිකිරීමක්. මං හොයාගෙන තියෙන්නේ මොනවද කියල දන්නවා නම් ඔබ එහෙම කරන් එකකුත් නෑ."



http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙම වුණත්" හෝම්ස් කීය. "මගේ හිතේ තියෙන ආසාවට ඉඩදෙන්න කියල මං ඔබෙන් ඉල්ලා හිටිනවා"

ගිනිඋදුන් පඩියට හේත්තු වී සිටි මගේ මිත්‍රයා කාමරය සෝදිසි කිරීමට පටන්ගත්තේය. මිනිත්තු දෙකක් ගතවෙද්දී ඔහුට සිවුරුහන් කෙරිණි. ඊළඟට ඔහු හැරුණේ ගෙවල් අයිතිකාරිය දෙසටයි.

"පර්නල් මහත්මිය. මේ කාමරයේ තිබෙන ගෘහභාණ්ඩ හැම එකක්ම ඔබට අයිති ඒවා වෙන්න ඇති?"

"ඔව් මහත්මයා"

"බිත්තියේ අතන එල්ලා තිබී අසුගිය බද්ද ගලවා ඉවත් කළ පින්තූරය......?" හෝම්ස් කීවේ ගිනි උදුන් අඩියට ඉහලින් බිත්තිය දෙසට ඇඟිල්ල දිගුකරමිනි. "....... ඒක අයිතිව තිබුණේ බූත් මහත්මයාට වෙන්න ඇති?"

හෝම්ස් අත දිගු කොට පෙන්වූ දිශාව වෙත මම මගේ නෙත් යොමු කළෙමි. බිත්තිය සැරසීමට තිබූ කඩදාසියේ එක් තැනක හතරැස් කොටුවක් ලෙස තද වර්ණයක තිබූ අයුරු මම දුටුවෙමි. කාමරයේ කිසිවක් අතපත ගාන්නට එපා යයි, පර්නල් මහත්මියට උපදෙස් ලැබෙද්දී, ඇය බිත්ති පිරිසිදුකර නොතිබෙන්නට ඇත. එසේ නොවන්නට පින්තූරය එල්ලා තිබූ තැන තිබූ මකුළුදැල් ඇය කොස්සෙන් පිරිසිදු කර දමනු නියතය.

ඇය මුව අයාගෙන හෝම්ස් දෙස පුදුමයෙන් මෙන් බලා සිටියාය.

"බද්ද උදේ බූත් මහත්මයාමයි ඒ පින්තූරෙ පහළට ගත්තේ" ඇය කීවාය. "ඒක ඔහුම සිතුවම් කළ චිත්‍රයක්ලු. ඒක ඉතාම අලංකාර, වටිනා එකක් කියලයි ඔහුගේ අදහස වුණේ. මට නම් ඒකෙ ඒ හැටි අලංකාරයක් තිබුණේ නෑ.

ඔහු ඒක කඩදාසියකින් ඔතලා අරගෙන ගියා. මං ඇහුවාම කිව්වා ඒක යාළුවෙකුට තෑගිකරන්න බලාපොරොත්තු වෙනවා කියල. ඒ වෙලාවෙ මට පුදුමත් හිතුණා. ඔහු මේ තරම් අගය කළ චිත්‍රය එහෙම ආටෝප ගියාට කෙනෙකුට දෙව්ද කියල මට සැක හිතුණා. නමුත් දැන් නම් හොඳට තේරෙනවා, ඇයි ඒක ඉවත්කරගෙන ගියේ කියල"

"ඔව්" හෝම්ස් කීය. "ඒක ඒ තරම් විශාල එකක් නොවෙන බව මට පෙනෙනවා. ඒක ඒයසායම් චිත්‍රයක්ද?"



http://sherlockholmesinvestigations.blogspot.com



"ඔව් මහත්මයා" ඇය කීවාය. "පාළු විල්ලුවේ චිත්‍රයක්. ඒකෙ මැද මෙසයක හැඩේට පිහිටි ගල්පර්වත කුළුක් තිබුණා."

"බූත් මහත්මයා නිතර නිතර චිත්‍ර සිතුවම් කළ කෙනෙක් ද?" හෝම්ස් ඇසීය.

"නැහැ මහත්මයා. ඔහු මෙහේ ඉන්න කාලෙ නම් එක චිත්‍රයක්වත් සිතුවම් කළේ නෑ. පුංචි කාලෙ ඔහු චිත්‍රකලාවට හුගක් කැමැත්තෙන් හිටි බව මට කිව්වා. පස්සෙ ඒක අත්හැර දැම්මලු"

මීළඟට හෝම්ස් යළිත් වරක් කාමරය සිසාරා තම දෙනෙත් ඛටේටම යොමු කළේය. පියානෝව මත තබා තිබූ ඡායාරූපයක් දුටු ඔහුට කෑගැසිණ.

"දෙවියනේ! මෙයා නේද ජේම්ස් බූත් මහත්තයා?" හෝම්ස් ඇසීය. "ඔහුගේ හැඩරුව ගැන පුවත්පත්වල පළකරල තිබුණු විස්තරය හරි බව මේකෙන් පෙනෙනවා."

"ඔව්. ඒක ඇත්ත" පර්නල් මහත්මිය කීවාය. "මේක හොඳ පැහැදිලි ඡායාරූපයක්"

"මේ ඡායාරූපයට ඔහු පෙනී හිටලා කොච්චර කල් වෙනවද?" හෝම්ස් ඇසුවේ එය අතට ගනිමිනි.

"සති කිහිපයයි වෙන්නෙ මහත්මයා" ඇය කීවාය. "ඡායාරූපය ගත් ඡායාරූප ශාලාවේ ළමයා මේක ගෙදර අරගෙන එද්දී මමත් හිටියා. ඒ පාර්සලයේ තිබුණේ ඡායාරූප දෙකක් විතරයි. මේකයි තවත් එකකුයි. ඒ අනික් එක ඔහු මට තෑගි කළා."

"ඔබේ කතාව හරිම සිත් ඇදගන්නාසුලු එකක්" හෝම්ස් කීය. "මෙකෙ හැටියට ඔහු ඇඳගෙන ඉන්නෙ මහත ඉරි තියෙන ඇඳුම් කට්ටලයක්. බද්ද එළියට යද්දිත් ඔහු සැරසිලා හිටියෙ මේ ඇඳුමෙන්ද?"

"ඔව්. ඔය ඇඳුමමයි"

රාමුකර තිබුණු ඡායාරූපය අතට ගත් හෝම්ස් පිටිපස අලවා තිබූ දුඹුරු කඩදාසිය ඉරුවේය. අනතුරුව රාමුව වටේට සවිකර තිබූ කුඩා ඇණ කිහිපයක් තම පෑන පිහිය ආධාරයෙන් ඉහළට නැමුවේය. ඉන්පසු ඡායාරූපය එය අලවා තිබූ කාඩ්බෝඩ් කැබැල්ල සමග රාමුවෙන් ඉවතට ගත්තේය. ඡායාරූපය කාඩ්බෝඩ් කැබැල්ලෙන් ගලවා ඉවත්කිරීම අපහසු වූයේ නැත. සාක්කුවෙන් තම කාචය එළියට ගත් හෝම්ස් ඡායාරූපය පිටුපස සටහන්ව තිබූ යම් යම්දේ



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

පරීක්ෂා කර ඒවා තම සටහන් පොතේ ලියාගත්තේය. ඒ ඡායාරූපයේ අංකය, දිනය හා ඡායාරූප ශාලාවේ නම හා ලිපිනය බැව් මම දුටුවෙමි.

"එද බද්ද බූත් මහත්මයා එළියට යන්න සූදානම් වෙලා ඔබට මොනවා හරි කියන්න ඇති නේද?" හෝම්ස් විමසුවේය. "එහෙම කිව් වැදගත් දෙයක් ඔබට මතක්කරන්න පුළුවන්ද?"

"ඒ හැටි දෙයක් කිව් බවක් මට මතක නෑ මහත්මයා" ඇය කීවාය. "ඔහුගේ උදෑසන චොක්ලට් කිරි කෝප්පය නිදනකාමරයට අරගෙන ගියේ මම. ඒ වෙලාවෙ ඔහු කිව්වා..... ....."

"මොහොතක් ඉන්න" හෝම්ස් ඇයට බාධාකළේය. "බූත් මහත්මයා සිරිතක් වශයෙන් හැමදම උදේට චොක්ලට් කිරි කෝප්පයක් බීමට පුරුදු වෙලා හිටියද?"

"අපොයි ඔව් මහත්මයා" කාන්තාව පිළිතුරු දුන්නාය. "ශීත සෘතුවේ වුණත් ග්‍රීෂ්ම සෘතුවේ වුණත් ඒකෙ වෙනසක් වුණේ නෑ. චොක්ලට් කිරි එක ඔහු අනිවාර්යයෙන්ම බිව්වා. උදේ නැගිට්ට ගමන් ඒක ගෙනෙන්න කියලා සීනුව නාද කළා. මං හිතන්නේ ඔහු උදේ කෑම වේල නොකා වැඩට යාවි. ඒත් චොක්ලට් කිරි එකක් බොන්න නොලැබුණොත් ඒකිසාවටවත් ඊන ඒකක් නෑ. ඉතින් මං ඔබට කලින් කිව්ව වගේ, එද උදේ ඒක අරගෙන ගියේ මම මයි. කාලගුණයේ වෙනස්වීමක් ගැන ඔහු මොකක් හරි කිව්වා. ඊළඟට මං කාමරයෙන් පිටවෙන්න සූදානම් වෙද්දි ඔහු කිව්වා;

"..... ආ..... ඒක නෙමෙයි පර්නල් නෝනා. අද හැන්දෑවෙන් මට විගණන වැඩ සඳහා පිටත්වෙලා යන්න තියෙනවා. සති කීපයකට මං ආපහු එන්නෙ නෑ. මං මගේ ගමන්මල්ල සූදානම්කරල ඉවරයි. ඒක අරගෙන යන්න මං හවසට එන්නම්."

"සැකයක් නෑ" හෝම්ස් කීය. "ඔහු එක්වරම මෙහෙම දෙයක් කිව්වාම ඔබ පුදුමයට පත්වෙන්න ඇති?"

"ඒ තරම් පුදුමයකට පත්වුණේ නැහැ මහත්මයා" ඇය කීවාය. "ප්‍රාදේශීය බැංකුවල විගණන කටයුතුවලට යෑම ඔහුට නිතර නිතර පැවරුණු රාජකාරියක්. ඒ නිසා සෑහෙන කාලයක ඉඳන් මේක මට පුරුදුයි. කොයි වෙලේ ඔහුට බැහැර යන්න සිදුවේද කියන එක කවුරුවත් දන්නෙ නෑ. ගියත් ඔහු එක දිගට සතිදෙකකට වැඩි කාලයක් පිට පළාතක රැඳී ඉන්නෙ නෑ. ඒක මොහොතින් මෙහෙම පිටවී යෑම මට හොඳට පුරුදුයි. ඒකෙන් මට කරදරයක් වුණේ නෑ"


http://sherlockholmesinvestigations.blogspot.com



"මේ විදියට ඔහුට අමතර රාජකාරි පැවරෙන්න වෙලා දැන් කොයිතරම් කාලයක් වෙනවද?...... මාස කීපයක්?"

"ඊට හුගක් වැඩියි මහත්මයා..... මං හිතන්නේ මාස දහයක් විතර..... නැත්නං ඊටත් වැඩිද කොහෙද්දයි..... ගිය නත්තල් කාලෙද....."

"මේ අමතර වැඩ නිසා ඔහු සෑහෙන වෙහෙසකට පත්වෙන්න ඇති.....?"

"ඒක ඇත්ත හෝම්ස් මහත්මයා. ඒකෙන් ඔහු හරිම මහන්සියකට පත්වුණු බවයි පෙනුණේ. උදෙන් වැඩ දවලුත් වැඩ. හවසත් වැඩ..... ඉවරයක් නෑ. ඔහු බොහොම නිශ්ශබ්ද කෙනෙක් නේ මහත්මයා. කාමරේටම වෙලා ඉන්නවා මිසක් හැන්දෑවට ඇවිදින්නවත් ගියේ නෑ."

"බූත් මහත්මයා ඔහුට අයිති බඩු බාහිරාදිය හුගක් මෙගේදල ගියාද?"

"බොහොම ස්වල්පයයි" ඇය කීවාය. "ඒවත් කිසිවැඩකට නැති පරණ දේවල්. ඔහු හොහරක් වුණත් බොහොම අවංක කෙනෙක්. ඔහු බද්ද මගේ බෝඩිං ගාස්තුව ගෙව්වා, ලබන සෙනසුරාද වනතුරු"

"ඒක හොඳ යහපත් වැඩක්" හෝම්ස් කීවේ සිනාමුසු මුහුණෙනි. "ඒක නෙමෙයි. යන්න කලින් ඔහු තමන්ට අයිති වටිනා දේවල් කාටහරි නැගි දුන්නු බවක් ඔබ දන්නවද?"

"යන්න ළංවෙලා නෙමෙයි මහත්මයා" ඇය කීවාය. "පහුගිය මාස කිහිපයක් තිස්සේම ඔහු තමන්ට අයිති පොත්පත් ඔක්කොම වගේ ගෙනගියා. මං හිතන්නේ ඒවා විකිණුවා. ඒ පරණ පොත් දාහරක් බොහොම වටිනා ඒවා බවයි ඔහු මට කිව්වේ"

මේ කතාබහ සිදුකෙරෙන අතරේ ලෙස්ට්‍රේඩ් එතැන වාඩිවී සිටියේ නොඉවසිල්ලෙනි. එය අපට තේරුම්ගත හැකිවූයේ ඔහු නොනවත්වාම ඇඟිලිවලින් මේසයට තට්ටුකරමින් සිටි ආකාරය නිසාය. අන්තිමේදී ලෙස්ට්‍රේඩ් එතැනින් නැගී සිට අප ඇමතුවේය.

"මට තවත් බලාගෙන ඉන්න බෑ. මේ ඕපාදූප කතා ඔහේලට කරගන්න ඇරල. මං ගිහින් ලන්ඩනයට විදුලිපුවතක් යවන්න ඕන..... බූත් වහාම අත්අඩංගුවට ගන්න කියලා මං නියෝග කරනවා. හෝම්ස් මහත්මයා. ඔබ නොයෙක් දේවල් හොයාගන්න


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

අතිදක්ෂයෙක් කියලනේ කියන්නෙ. එවුණාට මේ තීනත පොවන කඩදාසිය හොයාගන්න ඔබට බැරිවුණා. මං ඒක හොයාගත්තෙ බූත්ගේ කුණුකූඩෙ තිබිල. ඔබ ඒක අරගෙන ටිකක් කියවලා බැලුව නම්, අනවශ්‍ය ලෙස කරදර නොවී බේරෙනවා" ලෙස්ට්‍රේඩ් පැවසුවේ ජයග්‍රාහී ලීලාවෙනි.

විශාල තීන්ත පොවන කඩදාසිය අතට ගත් හෝම්ස් එය කැටපත ඉදිරියට අල්ලා බැලුවේය. ඒ අසලට ළංවී මම ද කඩදාසියේ ප්‍රතිබිම්බය වෙත නෙත් යොමු කළෙමි. බූත් මහතා විසින් ලියනලද ලිපියක් මට පැහැදිලිවම දකගත හැකිවිය. බූත්ගේ අත්අකුරු හෝම්ස් මේ වනවිටත් ජාවිස් මහතාගෙන් ලබාගෙන තිබූ නිසා, මෙය බූත් ලියූ ලිපියක් බව ස්ථිර වශයෙන්ම අපි දැනගතිමු.

එය ලිවර්පූල්හි නැව් සමාගමක කාර්යාලයට ලියූ ලිපියකි. ලිවර්පූල් සිට නිව්යෝර්ක් බලා යාත්‍රාකරන "එම්ප්‍රස් ක්වීන්" නෞකාවේ පළමු වැනි පංතියේ කාමරයක් වෙන්කර ගැනීමට ඔහු අයැදුම්කර තිබිණ. ඒ සඳහා මුදල් ගෙවමින් ඔහු ලියූ චෙක්පතේ තීන්ත පෙවීම ද අපි දුටුවෙමු. ජේ. බූත් යනුවෙන් චෙක්පත පහළින් අත්සන් කොට තිබිණි.

තීන්ත-පොවන කඩදාසිය දැඩි අවධානයක ලක්කරමින් හෝම්ස් පැය කාලක් පමණ ගතකළේය. ඔහු ඒ සඳහා උත්තල කාචයද යොදගත් බැව් මම දුටුවෙමි. ලිවර්පූල් නැව් සමාගමට චෙක්පත තැපැල් කළ ලිපියේ ලිපිනයද තීන්ත පොවන කඩදාසියෙන් වියළා තිබිණ. ඒ මගින් නැව් කඩුසුතු කාර්යාලයේ නම හා ලිපිනය බලාගෙන හෝම්ස් එය ද සටහන් කරගත්තේය.

"මගේ හිතවත් ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීවේ තීන්ත-පොවන කඩදාසිය පොලිස් නිලධරයා අතට දෙමිනි. "මං හිතුවාට වඩා ඔබ බොහොම වාසනාවන්තයි. ඔබ බලාපොරොත්තුවෙන්නෙ ඊළඟට මොන වගේ පියවරක් ගන්නද?"

"මං වහාම කේබල් පණිවුඩයක් යවනවා නිව්යෝර්ක් පොලීසියට" ලෙස්ට්‍රේඩ් කීය. "එම්ප්‍රස් ක්වීන් නෞකාවෙන් මේ හක්කඩියා නිව්යෝර්ක් වරායට ගොඩබැහැපු ගමන්, ඔහුව හිරභාරයට ගන්න කියලා මං ඉල්ලා හිටිනවා. ඒ ඔක්කොටම කලින් මං හරිහැටි දැනගන්න ඕන, මේ නැව අයර්ලන්තයේ ක්වීන්ස්ටවුන්





වරායෙ නවත්වනවද කියලා. ඊට අපේ ඇඟිලි අතරින් රිංගලා යන්න ඉඩදෙන්න බෑ"

""එම්ප්‍රස් ක්වීන්" වෙනත් කිසිම වරායක නවත්වන්නෙ නෑ" හෝම්ස් කීය. "මං ඒක කලින්ම හොයල බලලයි තිබුණේ. ඒ මොකද බූත් මහත්මයා එංගලන්තයෙන් පැනයන්න "එම්ප්‍රස් ක්වීන්" යොදු ගැනීමට ඉඩ ඇති බව මං අනුමාන කළා"

ලෙස්ට්‍රේඩ් මා වෙත ඇසක් වසා ඉඟියක් කළේය. ඒ හෝම්ස් මේ කියන්නේ බොරු බව තමා දන්නා බව ඇඟවීමට ඉඟියකි. මේ අවස්ථාවේ මගේ මිත්‍රයා සිවියේ ගෙහිමි කාන්තාවට ස්තුතිකරමිනි.

"ඔහුව අල්ලාගන්න මීට වඩා තොරතුරක් සපයන්න මට බැරිවීම ගැන මං කණගාටුවෙනවා මහත්මයා" ඇය කීවාය. "මෙහේදි නම් ඔහු හැසිරුණේ නියම මහත්මයෙකු විදියට. ඒ වුණත් ඔහු බොහොම හරි අල්ලාගත යුතු තක්කඩියෙක්"

"ඔබ ලබාදුන් තොරතුරු අපට හුඟක්ම ප්‍රයෝජනවත් වේවි පර්නල් මහත්මිය" හෝම්ස් කීය. "ඒකෙ සැකයක් නෑ. මං මේ කල්පනා කළේ මටයි, දෙස්තර වොට්සන්ටයි මේ ගෙදර දින කිහිපයකට නවාතැන් ගන්න පුළුවන් වේවිද කියල....."

"ඇත්තෙන්ම ඔබට නවාතැන් ගන්න පුළුවන් මහත්මයා" ඇය කීවාය. "මට ඒක සතුටට කරුණක්"

"බොහොම ස්තුතියි පර්නල් මහත්මිය. එහෙම නම් අද රාත්‍රී ආහාරය සඳහා රෑ හතට පමණ අපව බලාපොරොත්තු වෙන්න."

* * *

අප නිවසෙන් එළියට ආ වහාම තම රාජකාරි සඳහා පොලිස් ස්ථානය බලා යායුතු බව ලෙස්ට්‍රේඩ් දැනුම්දුන්නේය. නෞකාව නිව්යෝර්ක් වරායට ළඟාවූ වහාම, බූත් අත්අඩංගුවට ගෙන රඳවා තැබීමට, නිව්යෝර්ක් පොලිස් ප්‍රධානියා වෙත දැනුම්දීමට ලෙස්ට්‍රේඩ් බලාපොරොත්තු විය. තමන් කරන්නට යන්නේ කුමක්ද යන්න ගැන, හෝම්ස් දැක්වූයේ දැඩි නිශ්ශබ්දතාවයකි. එහෙත් තවත් කරුණු කිහිපයක් ගැන සොයා බැලීමට කිරුම්හිල්හි රැඳී සිටියයුතු බව ඔහු පැවසුවේය. නමුත් ඒ අදහා තමා තනිව යායුතු බැව් ඔහු මට අවධාරණය කළේය.



www.sinhalaelibrary.com

"මතක තියාගන්න වොට්සන්" ඔහු කීය. "ඔබ මෙහේ ආවෙ නිවාඩුවකට, විවේකයකට. මාත් එක්ක තැන්තැන්වල රස්තියාදු වෙන්න සිදුවුණොත් ඔබට මාවත් එපාවේවි. ඒ හින්ද දවස ගතකරන්න සුදුසු විධියක් ගැන ඔබම කල්පනා කරල බලන්න. මට මතක හැටියට ෂෙෆීල්ඩ් කෞතුකාගාරයේ තමයි තියෙන්නේ ආදිමානවයා ගැන තිබෙන හොඳම පුරාවස්තු එකතුව. නියැන්ඩතාල් මානවයාගෙ සහ තවත් පෞරාණික හිස්කබල්, ශිලායුගයේ ගල් ආයුධ තවත් මෙවලම්. මේවා ඔබේ හිත් ඇදගන්නවාට සැකයක් නෑ. ඔබට කාලය ප්‍රයෝජනවත් අයුරෙන් යොදවිය හැකි තවත් තැනුත් නැතිවෙන්න බෑ."

මා වඩාත්ම ප්‍රියකරන කටයුත්ත කෞතුකාගාර නැරඹීම නොව හෝම්ස්ගේ රහස්පරීක්ෂණ කටයුතුවලට හවුල්වීමය. එහෙත් මේ පිළිබඳව තර්ක කිරීමෙන් ඵලක් නොවන බව මම දැන සිටියෙමි. මට පවා මුලදී කාරණා සඟවමින් ඔහු පරීක්ෂණවල යෙදුණු අයුරු තේරුම් කිරීමට අපහසුය. ඔහු කුලීරියක් නැගී පිටත්ව යද්දී මම නගරය දෙසට පා නැගුවෙමි.

හෝම්ස් පැවසූ අයුරින්ම ෂෙෆීල්ඩ් කෞතුකාගාරය ඉතා විශිෂ්ට එකක් විය. මම ඉතා ආශාවෙන් එය නැරඹුවෙමි. එක් දිනකින් නරඹා නිමකළ නොහැකි තරම් කෞතුක භාණ්ඩ එහි විය. එංගලන්තයේ විසූ ආදි මානවයන්ගේ පමණක් නොව, පුරාණයේ විසූ බිහිසුණු උරගයන්ගේ ඇටසැකිලිද කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කොට තිබිණි. දහවල් ආහාරයෙන් පසුව ද පැයකට වැඩිකාලයක් මම කෞතුකාගාරය නැරඹුවෙමි. ඉන්පසු මැංචෙස්ටර් පාර දිගේ ඇවිදගියෙමි. හැන්දෑවේ විල්ලුවේ දර්ශන නරඹා, පිරිසිදු වාතය ආශ්වාස කර, ඇෂ්ගේට් පාර්ට් පිවිසෙද්දී මට දැනුණේ දැඩි මහන්සියකි. එපමණක් නොවී, මාස ගණනකින් නොදැනුණු ආහාරයේ බඩගින්නක් ද දැනිණ.

මා පර්නල් මහත්මියගේ නිවසට ළඟාවුවත් මගේ මිත්‍රයා ආපසු එහි පැමිණ නොසිටියේය. ඔහු එනවිට රාත්‍රී හතයි තිහ පමණ වී තිබිණ. ඔහුගේ බලාපොරොත්තු කඩවීයාම නිසාදෝ හෝම්ස් සිටියේ එතරම ප්‍රියමනාප ගතියකින් නොවේ. ඔහු ගියේ කොහේද, එම වැඩකටයුතුවල සාර්ථක අසාර්ථක බව කෙසේද යන්න මා විමසුවත් හෝම්ස්ගෙන් ඒවාට පිළිතුරු නොලැබිණ. ඒ කෑමෙන් පසු හාන්සිපුටුවක වැටුණු ඔහු පයිප්පය දල්වාගත්තේය. ඉන්පසු






දිගින්දිගටම කල්පනා කළේ මා සමඟ කතාබහකට මොහොතක් හෝ ගත නොකරමිනි.

පසුවද උදේ අප ආහාරය අවසන් කරමින් සිටියදී ලියුම්කවරයක් රැගත් සේවිකාව අප වෙත පැමිණියාය.

"බැංකුවේ ජාවිස් මහත්මය එවල තියෙන්නේ, ෂර්ලොක් හෝම්ස් මහත්මයාට" ඇය කීවාය.

කවරය විවෘත කළ හෝම්ස් ලිපිය අතටගෙන කියවා බැලුවේය. ඔහුගේ මුහුණේ මතුවූයේ කෝපයට පත් සලකුණුය.

"ලැජ්ජා නැති මිනිහෙක්" හෝම්ස්ට කියැවිණි. "මෙන කියවල බලන්න වොට්සන්. මීට කලින් පරීක්ෂණයක් භාරදීපු කෙනෙක්, කවදවත් මට මේ වගේ අපහාසයක් කළේ නෑ."

මම ඒ ලිපිය කියවා බැලීමි.

ද සෙඩාර්ස්
පුල්වුඩ
සැප්තැම්බර් 02.

ජේබිස් බූත් මහතාගේ වංචනික කටයුතු හා අතුරුදන්වීම පරීක්ෂාකිරීම සඳහා ෂර්ලොක් හෝම්ස් මහතාගේ මැදිහත්වීම ගැන බ්‍රිටිෂ් කොන්සොලිඩේටඩ් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් ජාවිස් මහතා සිය ස්තූතිය පුදකරයි.

ජේබිස් බූත් පැනගිය ආකාරයත්, දැන් ඔහු සිටිනා තැනත්, තමා සාර්ථක අයුරින් සොයාගෙන අවසන් බව ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලීසියේ ලෙස්ට්‍රේඩ් මහතා අප වෙත දන්වා ඇත. මේ අනුව බූත් අද හෙටම අත්අඩංගුවට පත්වෙනු ඇත. එම තත්ත්වය යටතේ හෝම්ස් මහතාගේ වටිනා කාලය මේ වෙනුවෙන් කැපකිරීම අනවශ්‍ය බව අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහසය"

"බොහොම පහසුවෙන් ඇත බේරාගෙන? එහෙම නේද වොට්සන්?" හෝම්ස් කීවේ කෝපයෙනි. "හොරා ලෙස්ට්‍රේඩ්ගේ කනෙන් රිංගලා පැනගියොත් මං පුදුමවෙන්නෙ නෑ. මීට පස්සෙ මේ පරීක්ෂණයට මං කොහොමටවත් සම්බන්ධ වෙන්නෙ නෑ. ඔවුන් මට ආයාචනා කළත් මං ඒකට අතගහන්නෙ නෑ. මට හිතට අමාරු, මේ වංචනික කටයුත්තෙ හා පලායාමෙ තියෙනවා මීට




www.sinhalaelibrary.com

පෙර අප දැක නැති ආකාරයේ ලක්ෂණ. ඒ නිසාම මේක බොහොම සිත් ඇදගන්නා ගැටලුවක්. මේක අපේ මිතුරු ලෙස්ට්‍රේඩ් හිතනා තරම් සරල එකක් නොමෙයි."

"ඇයි ඔබ හිතන්නේ ලෙස්ට්‍රේඩ් හරිපාරට වැටිලා නැහැ කියලා?"

"ටිකක් ඉවසල බලන්න වොට්සන්" හෝම්ස් කීවේ තම ගුප්ත ස්වභාවය තවදුරටත් රැකගනිමිනි. "මතක තියාගන්න ජේම්ස් බ්‍රූන් තවමත් පොලීසියට අහුවෙලා නෑ"

හෝම්ස්ගේ රහස් පරීක්ෂණ සේවාව බැංකුව විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් එක්තරා වාසියක් ද අපහට සැලසිණ. එනම් අපට දින හතර පහක කාලයක් නිදහසේ ගතකිරීමට අවස්ථාව ලැබීමය. කෙසේ වෙතත් විමර්ෂණ කටයුතු කිහිපයක් සඳහා තමා වහාම ලිවර්පූල් බලා යායුතු බව මගේ මිතුරා පැවසුවේය.

අප ලිවර්පූල් වෙත ළඟාවන විට දහවල් එකොළහ පසුවී තිබිණි. වෛද්‍ය විද්‍යාලයේ මා ඉගෙන්කාලයේ මගේ ලබැඳි මිතුරෙක් වූ ක්‍රිස් ස්ටොක් ලිවර්පූල්හි ශල්‍යාගාරයක් පවත්වාගෙන ගියේය. බොහෝ කලකින් මට ඔහු හමුවී නොතිබිණ. හෝම්ස් තමන්ගේ වැඩකටයුතුවල නිරත වන අතරේ මම මගේ මිතුරා හමුවීමට යෑමට කැමති බව හෝම්ස්ට කිව්වෙමි.

"ඒක හොඳයි වොට්සන්" හෝම්ස් කීය. "මගේ වැඩකටයුතු හැමදෙයක්ම නිදහසේ කරගෙන, මං එන්නම් ජෝජ් ස්ටීවන්සන් හෝටලයට. මං එද්දි සමහරවිට හවස් වෙන්නත් පුළුවනි. ඔබේ මිතුරා හමුවෙලා ඉවරවෙලා ඔබත් එතැනට එන්න"

වෛද්‍ය ක්‍රිස් ස්ටොක් දහවල් ආහාරය සඳහා චිකිත්සාගාරයෙන් පිටවී යාමට පෙර, ඔහු අල්ලාගැනීමට මට හැකිවිය. මා දුටීමෙන් අප්‍රමාණ ප්‍රීතියට පත් ඔහු, මා තම නිවසට කැඳවාගෙන ගියේ තවත්වරුවේ චිකිත්සාගාරයේ වැඩකටයුතු වෙනත් වෛද්‍යවරයෙකුට පවරමිනි. අපගේ පැරණි අත්දැකීම් ගැන කතාබහ කරමින් දහවල් ආහාරය ගන්නා අතරේ කාලය ගෙවී යනු අපට නොදැනිණ. මා ස්ටොක්ගේ නිවසෙන් පිටවී යද්දී සවස හය පමණවී තිබිණි. මා හෝටලය වෙත යද්දී හෝම්ස් එහි පැමිණ සිටියේය.

"කොහොමද ඔබේ වැඩකටයුතු සාර්ථක වුණාද?" මම විමසුවෙමි.







"ඒ හැටිම සාර්ථකයි කියල කියන්න බෑ වොට්සන්. දැන් අපට තියෙන්නේ නිශ්ශබ්දව ඉඳගෙන මේක නිරීක්ෂණය කිරීමයි. අද රෑට අපි මේ හෝටලයේ නැවතිලා කල්පනා කරමු, නිවාඩුව ගතකරන්න කොහේටද යන්නෙ කියලා"

එද රාත්‍රී සාකච්ඡාවෙන් පසුව අපි නිවාඩුව ගතකිරීමට ඩාබිෂයර් ප්‍රාන්තයේ හාදර්සේජ් නම් කුඩා ගම්මානය තෝරා ගතිමු. තෙරක් නොපෙනෙන ඩාබිෂයර් විල්ලුව අසබඩ පිහිටි පැරණි නිවාඩු නිකේතනයක, අපි සතියකට කිට්ටු කාලයක් ගතකළෙමු. සම්පූර්ණ විවේකයකින් පසු අප ආපසු ලන්ඩනයට ළඟාවෙද්දී, සිතට මෙන්ම ගතට ද නැවුම්, ප්‍රබෝධමත් ගතියක් දැනිණ,

ස්විට්සර්ලන්තයේ නිවාඩුව සඳහා ගිය මගේ බිරිඳ මේ වනවිටත් ආපසු ඇවිත් නොසිටියාය. ෂර්ලොක් හෝම්ස්ට ද මෙය එතරම් කාර්යබහුල සමයක් නොවීය. ආපසු බේකර් වීදියට යනු වෙනුවට මගේ නිවසේ රැඳී සිටීමට මම අපහසුවෙන් ඔහු කැමතිකරවා ගතිමි.

කෙසේ වෙතත් ෂෙෆීල්ඩ්හි බැංකුවංචාකරු පිළිබඳ තොරතුරු පුවත්පත්වල පළවේදැයි අපි දැඩි විමසිල්ලෙන් බලාසිටියෙමු. ලෙස්ට්‍රේඩ් විසින් කළ සොයාගැනීම්වල විස්තර පුවත්පත්වල පළවිය. අප ෂෙෆීල්ඩ්වලින් පිටත්ව ආ දිනට පසුද, ජේම්ස් බ්‍රූන් ගුහුබැඳයාම ගැන තොරතුරු රැසක් පුවත්පතට ඇතුළත්ව තිබිණ.

"..... අත්ලන්තික් සාගරයේ දළ රළ පෙළ රාජකීය තේජසින් තරණය කිරීමට, "එම්ප්‍රස් ක්වීන්" නෞකා නොමෝ සමත්වෙමින් සිටින්නීය. අපරාධකරුවා නෞකාවේ ඉහළ පහළ ගමන් කරන්නේ තමාට නුදුරු අනාගතයේ අත්වීමට ඇති ඉරණම ගැන අංශු මාත්‍රයක හෝ දැනුමක් නොමැතිවය. ඔහු නවලෝකයට සම්ප්‍රාප්තවෙද්දී, යුක්තිධර්මයේ හා සාධාරණත්වයේ යෝධ හස්තය අත්ලන්තික් සයුරට ඉහළින් දිගුවී ඇති බව කෙසේ නම් අනුමාන කරන්නද? තමා ගලග්‍රහණයෙන් ගැනීමට නිව්යෝර්ක්හි දඩබල්ලන් සූදනමින් සිටින බව, බ්‍රූන් සිහිනෙන්වත් නොසිතනු ඇත....."

මෙවා කියවූ හෝම්ස් පුවත්පත පහත දමද්දී, ඔහුගේ මුහුණට සිනාවක් නැගිණ. එහෙත් ඔහුගේ හදපත්ලෙන් නැගුණු අදහස කුමක්ද යන්න මට තේරුම් ගැනීමට නොහැකි විය.

"එම්ප්‍රස් ක්වීන්" නිව්යෝර්ක් නගරයට සේන්දුවන දවස උදාවිය. එද සවස පුවත්පත අතට ගනිද්දී හෝම්ස්ගේ මුහුණේ තිබූ





www.sinhalaelibrary.com

නොඉවසිලිමත් බව හා කැලඹීම මම පැහැදිලිවම දුටුවෙමි. අන්තිමේදී අපේ කුතුහලය තවත් ඉදිරියට ගෙනයන තොරතුරක් පුවත්පතේ සඳහන් විය.

"මගදී කිසිදු කරදරයකින් තොරව නෞකාව උදේ හයට ලෝංඅයිලන්ඩ් වෙත ළඟාවිය. එහෙත් නැවේ කොලරා රෝගියෙකු සිටින බව දැනගන්නට ලැබී ඇත. මේ අනුව නිව්යෝක් වරායේ බලධරයෝ වහාම ක්‍රියාත්මක වූහ. නිරෝධායන ආඥාපනත අනුව "එම්ප්‍රස් ක්වීන්" දින දෙළහක් වරාය රක්ෂිතයේ නැංගුරම් දමා තැබීමට බලධරයන් විසින් නියෝග කරනු ලැදි. මේ අනුව එම කාලය තුළදී නැවේ ගමන්ගත් මගීනට හෝ කාර්යමණ්ඩලයට ගොඩබිමට පැමිණීමට අවසර නොමැත."

දින දෙකකට පසු පුවත්පතේ මේ ගැන තවත් ආරංචියක් පළවී තිබිණි.

"..... එම්ප්‍රස් ක්වීන් නෞකාවේ මගීන් අතර ජේබ්ස් බූත් මහතා සිටින බව සැකයකින් තොරවම දැනගන්නට ලැබී ඇත. නෞකාව වෙත ගිය ඇමරිකානු සෞඛ්‍ය පරීක්ෂකයෙකු, බූත් මහතා (පුවත්පත්වල පළවූ විස්තර අනුව) හඳුනාගෙන, ඔහු සමඟ කතාබහ කර ඇතැයි කියවේ. ආරක්ෂක නිලධාරීන්ගේ අවධානය යටතේ සිටින ඔහුට පැනයාමට, කිසිදු අවකාශයක් නැතැයි තතු දන්නෝ පවසති. බූත් රහසිගතව රටෙන් පැනගිය ආකාරය දක්ෂ ලෙස හෙළිකරගත්තේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ ලෙස්ට්‍රේඩ් මහතාය.

"එම්ප්‍රස්" ක්වීන් නිව්යෝක් වරායේ දින දෙළහක කාලයක් රක්ෂිතයේ රඳවන බව අසන්නට ලැබුණු වහාම ලෙස්ට්‍රේඩ් මහතා ක්‍රියාත්මක විය. ඔහු නිව්යෝක් බලා යාත්‍රාකරන "ඕෂනියා," නෞකාවට නැගුණේය. මෙම නෞකාව සැප්තැම්බර් 11 වැනිදා වනවිට නිව්යෝක් වෙත ළඟාවීමට නියමිතය. මේ අනුව ජේබ්ස් බූත්ට ගොඩබැසීමට අවසර ලැබුණු වහාම ඔහු අත්අඩංගුවට ගැනීම, ලෙස්ට්‍රේඩ් මහතා විසින් පෞද්ගලිකව සිදුකරනු ඇත."

එම පුවත කියවූ මගේ මිත්‍රයා අතිශය විස්මයට පත්විය. ඔහු එතරම් පුදුමයට පත්වූ අවස්ථාවක් මෑත කාලයක මම දැක නැත්තෙමි. හෝම්ස්ට එතරම් පුදුමයට පත්වීමට තිබූ කරුණ කුමක්දැයි මට තේරුම් ගැනීමට නොහැකි විය. තම පැරණි බ්‍රයර්





පයිප්පය කටේ ගසාගෙන, හාන්සිපුටුවකට වී දෙපා උඩට ගෙන සිටි හෝම්ස් වචනයක් හෝ කථා නොකොට කල්පනා කළේය.

"වොට්සන්" ඔහු අන්තිමේදී කීවේ ඇහීමකට පත් ස්වරයෙනි. "එක අතකින් බලනකොට ෂෙෆීල්ඩ්හි පරීක්ෂණය මට අත්ඇරල දාන්න කිව් එකත් හොඳයි. ඒ මොකද දැන් කාරණා සිදුවෙගෙන යන පිළිවෙළ මටත් තේරුම්ගන්න අමාරුයි. මම අවුල්ජාලයේ පැටලිලා මටත් මෙක විසඳගන්න බැරිවුණාම, මාත් මෝඩයෙක් ලෙස සැලකෙන්න ඉඩතිබුණා."

ඊළඟ දින කිහිපයේදීම හෝම්ස්ගේ අභිමානයට ලැබුණේ පරාජිත ස්වභාවයකි. තමා කළ නිරීක්ෂණ මඟින් එළැඹුණු නිගමන සම්පූර්ණයෙන්ම වැරදිබව දකින්නට ලැබුණු විටදී ඔහු පත්වන්නේ අතිශයින්ම කම්පාවට හා [illegible].

බූත් අත්අඩංගුවට ගැනීමට නියමිත තීරණාත්මක දිනය වූ සැප්තැම්බර් 18 වැනිදා ද ළඟාවිය. අපි සියලු පුවත්පත් හැම එකක්ම පරීක්ෂාකර බැලුවෙමු. එහෙත් මෙම කරුණ ගැන කිසිදු තොරතුරක් නොවීය. 19 වැනිදා උදෑසන පුවත්පත්වල ද අපරාධකරුවා අත්අඩංගුවට ගත් බවක් සඳහන් නොවිණි. සැලකියයුතු ප්‍රවෘත්තියක් පළවූයේ 19 වැනිදා සවස ග්ලෝබ් පුවත්පතේ ය. ඒ, අපරාධකරුවා යළිත් වරක් පැනගොස් ඇති බවට කෙටි ඡේදයකි.

ඊළඟ දින කිහිපයේ ජේබ්ස් බූත්, "එම්ප්‍රස් ක්වීන්" ලෙස්ට්‍රේඩ්, "ඕෂනියා" ආදී නම් සඳහන් කරමින් පුවත් රැසක් පළ වූවත් ඒවායේ අඩංගු කරුණු පරස්පර විරෝධීබවක් දක්නට ලැබිණ. තවත් සමහර පුවත් වාර්තාකරුවන් කළ අනුමාන කිරීම් මිස, සැබෑ සිදුවීම් නොවීය. කෙසේවෙතත් ස්කොට්ලන්ඩියාඩ් පොලිසියේ ලෙස්ට්‍රේඩ් මහතා තනිවම ආපසු එංගලන්තය බලා ඒමට පිටත්වී ඇති බවත්, සැප්තැම්බර් 23 හෝ-24 වැනි දින ඔහු රැගත් නැව ලිවර්පූල් වරායට ළඟාවෙන බවත් "ඩේලිමේල්" පුවත්පතේ පළවී තිබිණ.

24 වැනිදා උදේ හෝම්ස්, මා සමඟ ඔහුගේ බේකර්වීදියේ නිවහන වෙත ගියේය. එදා සවස අපි දුම්බොමින්, විසිත්තකාමරයේ කතාබහ කරමින් සිටියෙමු. සේවක ළමයා වූ බිලී එක්වරම එහි ඇතුළුවී ලෙස්ට්‍රේඩ් මහතා පැමිණ ඇති බැව් දැනුම්දුන්නේය.

"එවන්න, එවන්න. ඔහුව වහාම එවන්න." හෝම්ස් කීවේ අප්‍රමාණ සන්තෝෂයෙන් දෑත් එකට පිරිමදිමිනි.



www.sinhalaelibrary.com

ලෙස්ට්‍රේඩ් කාමරයට ඇතුළුවී පුටුවේ හිඳගනිද්දී, ඔහුගේ තිබුණේ කලකිරුණු ස්වභාවයකි. අධික ඉල් හිගකමකට මුහුණදී රෝගීවූ අයෙකුගේ මෙන්, ඔහුගේ මුහුණ සුදුමැලිව තිබූ අයුරු මට පැහැදිලිව පෙනිණ.

"හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය. "මට එච්චර ලේසියට වරදින්නෙ නැහැ. ඒ වුණාට මේ ෂෙෆීල්ඩ් සිද්ධියෙදි මං සම්පූර්ණයෙන්ම පරාජය වුණා. සිදුවුණේ මොකක්ද කියල, මටම හිතාගන්න බෑ."

"අනේ දෙවියනේ!" හෝම්ස් කීවේ ප්‍රසන්න ස්වභාවයකිනි. "මොනවද ලෙස්ට්‍රේඩ් මේ කියන්නේ? ඔබ කියන්නේ ඔබට අර තක්කඩියා තවමත් අහුවුණේ නැහැ කියලද?"

"නැහැ නේන්නං" මහාලිස් නිලධරයා පිළිතුරු දුන්නේ කෝපයෙනි. "මං දන්නෙ නෑ කවදාවත් ඌව අල්ලාගන්න, කාටවත් හැකිවේවිද කියල"

"මය තරම් ඉක්මනට බලාපොරොත්තු කඩකරගන්න එපා" හෝම්ස් කීය. "ඉස්සරවෙලා අපට කියන්න සිද්ධවුණේ මොකක්ද කියල. ඊටපස්සේ මං බලන්නම්, ඔබට උදව්කළ හැකි මොකක් හරි ක්‍රමයක් තියෙනවාද කියල"

එම වචනවලින් දිරිමත්වූ පොලිස් නිලධරයා, තම කථාන්තරය කියන්නට පටන්ගත්තේය. දැඩි අවධානයෙන් අපි ඊට සවන්යොමු කළෙමු.

"..... මහත්වරුනි, ඔබ දන්නවා ෂෙෆීල්ඩ්හිදී මං කළ සොයාගැනීම" ලෙස්ට්‍රේඩ් කීය. "එහෙන් මට ඒත්තු ගියා, අපට ඕනකරන මිනිහා "එම්ප්‍රස් ක්වීන්" නෞකාවෙන් නිව්යෝක් බලා ගමන් අරඹා ඇති බව. මං හිතියේ ඔහුව අත්අඩංගුවට ගන්න නොඉවසිල්ලෙන්. ඊළඟට මට අහන්න ලැබුණා නිරෝධායන රෙගුලාසි යටතේ ඔහු යාත්‍රාකළ නැව දින 12කට වරායේ රඳවා ඇති බව. මට ඕනවුණා මේ තක්කඩියාව මගේ දෑතින්ම අල්ලාගන්න. මූ මහා කට්ට කෛරාටික මිනිහෙක්, එහෙම කෙනෙක් නිව්යෝක් පොලිසියේ ඇස්වලට වැලි ගහල, වරායේදී පැනයන්නත් ඉඩතියෙනවා. එහෙම ගියොත් ඌ අවුරුදු සියයකටවත් සොයාගන්න ලැබෙන්නෙ නෑ. මං වහාම පිටත්වුණා නිව්යෝක් බලා. ඒකට ගතවෙන කාලය දින පහයි. නමුත් ඒක මට මෙතරම් දිගට දැනුණේ නෑ කුවමදවත්.





අපේ නැව නිව්යෝක් වරායට ළඟාවුණේ සැප්තැම්බර් 11 වැනිද හැන්දෑවෙ. එතැනින් මං වහාම ගියා නිව්යෝක් පොලිසියේ ප්‍රධානියා හමුවෙන්න. ඔහුගෙන් මට දැනගන්න ලැබුණා, ජේබ්ස් බූත් "එම්ප්‍රස් ක්වීන්" නැවේ ඉන්නා බවට කිසිම සැකයක් නැතිබව. නැවට ගිය සෞඛ්‍ය පරීක්ෂකයෙකුට ජේබ්ස් බූත්ව දකින්න ලැබිලා; එපමණක් නොවෙයි ඔහු සමග කථාකරලත් තිබුණා. නැවේදී ඒ හමුවුණු බූත්ගේ පෙනුම, පුවත්පත්වල දී තිබුණු විස්තරයට අකුරටම ගැළපුණු බව සෞඛ්‍ය පරීක්ෂකයා කියා තිබුණා. එතකොට නිව්යෝක් පොලිසියෙන් කරල තිබුණේ මොකක්ද? ඔවුන් ෆෝසයිත් නම් තමන්ගේ රහස්පරීක්ෂකයෙක් නැවට යවල තිබුණා, ඒ අපරාධකාරයා ගැන වැඩිදුර හොයල බලන්න. ඒ වගේම, බූත් සිරභාරයට ගැනීමට ඇති සැලසුම ගැන නැවේ කපිතාන්ට දැනුම්දීලා, ඔහුගේ සහයෝගය ලබාගන්න. මේ රහස්පරීක්ෂකයාට දැනගන්න ලැබුණු කරුණු මොනවාද දන්නවද? අර තක්කඩියා මුහුදු ගමන සඳහා නැවේ කාමරය වෙන්කරගෙන තිබුණේ ජේබ්ස් බූත් නමින්මයි. ඔහු ව්‍යාජ නමක් යොදාගෙන නැහැ. ඔහු වෙස්වළාගන්න කිසිම උත්සාහයක් දරලත් නැහැ. ඔහු ඉඳල තියෙන්නේ සාමාන්‍ය පෙනුමෙන්මයි. ඔහු වෙන්කරගෙන තිබුණේ පළමුවැනි පංතියේ කාමරයක්.

නැවේ කාමර භාර නිලධරයා ජොන්සන් මහතාගෙන් රහස් පරීක්ෂක ෆෝසයිත් ප්‍රශ්නකරල තිබුණා. ඔහු කිව්වලු බූත් නම් පුද්ගලයා ගැන ජොන්සන්ගේ හිතේ මුල ඉඳලම සැකයක් තිබුණු බව. බූත් පුළුවන් හැමවිටකම ඔහුගේ කුටියටම වෙලයි ඉඳල තියෙන්නෙ. අනෙක ඔහු නැවේ සේවකයන්ට සහ අනික් මගීන්ට පෙන්වාගෙන ඉඳල තියෙන්නේ, තමන් තරමක් දුරට ආබාධිත කෙනෙක් බව. ඒ නිසා තමාට බාධා හිරිහැර නොකළ යුතු බවටත් ඇඟෙව්වලු. බොහොම වෙලාවට ඔහු තමන්ගේ කෑම වේල තමන්ගේ කාමරයට ගෙන්වාගෙනයි අනුභව කරල තියෙන්නේ. අනෙක් මගීන් සමග එකට කෑම ගන්න භෝජනාගාරයට ගියේ කලාතුරකින්ලු.

ඊට අමතරව නැවේ සේවකයන්ට මෙන්ම සමහර මගීන්ටත් හිතිල තියෙනවා බූත් යම්කිසි මානසික විකෘතියකට ලක්වුණු පුද්ගලයෙක් කියල. බූත්ගේ කාමරයට කිට්ටුව කාමරවල ලැගුම්ගෙන හිටි මහත්වරු කිහිපදෙනෙක්ම කියල තියෙනවා බූත් හැසිරුණේ හරිම අද්භූත ආකාරයකට කියල.



www.sinhalaelibrary.com

මෙයින් පහසුවෙන්ම මට හිතාගන්න හැකිවුණා, බූත්ට උවමනාව තිවුණේ හැකිතරම් දුරට අන් අයට නොපෙනී ඉන්න බව.

ඔහු ගැන අප විමසිලිමත්වුණු බව බූත්ට දැනගන්න අප ඉඩහැරියෙන් නෑ. නිරෝධායන රක්ෂිතයේ නැව තිබෙන කාලයේ බූත්ගේ හිතේ සැකයක් ඇතිනොවෙන විදියට ක්‍රියාකරන්න නැවේ කපිතාන් හා මගීන් භාර නිලධරයා එකඟවුණා. නමුත් ඒ අතරේ බූත් ගැන හොඳ කල්පනාවෙන් සිටීමටත් තීරණය වුණා. මගීනට නැවෙන් පිටවෙන්න ලැබෙන්නේ වරායේ දින දෙළහක් සම්පූර්ණ කළාට පස්සේ. ඒ කියන්නේ සැප්තැම්බර් 18 වැනිද. අන්න ඒ දවසේ ජේබ්ස් බූත් අත්අඩංගුවට ගන්න අපි එකඟතාවයකට ආවා."

මේ වෙලාවේ ලෙස්ට්‍රේඩ්ගේ කථාවට බාධාකරමින් සේවක ළමයා විසිත්තකාමරය වෙත පැමිණියේය. ඔහු අතේ විදුලිපුවතක් විය. හෝම්ස් එය කියවූයේ මඳ සිනාවක් ද ඇතිවය. ඊළඟට ඔහු විදුලිපුවත දෙකට නමා සාක්කුවේ දමාගත්තේය.

"මේකට මං පිළිතුරක් යවන්නෙ නෑ බිලී" යයි සේවක ළමයාට පැවසූ විට, ඔහු දෙරවසාගෙන යන්නට ගියේය.

"ඉතින් ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය. "ඔබේ සිත්ඇදගන්නාසුලු කථාව දිගටම කියන්න."

"සැප්තැම්බර් 18 වැනිදට "එම්ප්‍රස් ක්වීන්" නැවේ මගීනට ගොඩබහින්න නියමිත වෙලාවක් කලින් දන්වලා තිබුණා. මමත්, නිව්යෝර්ක් පොලිසියේ ප්‍රධානියාත්, රහස් පරීක්ෂක ෆෝසයිත් තුන්දෙනා එම වෙලාවට පැය භාගයකට කලින් නැවට ගියා. නැවේ කාමර වෙන්කිරීම භාර නිලධරයා - ජොන්සන් මට ඒ වෙලාවෙ නැව්තට්ටුව මතදී හමුවුණා. ඔහු කිව්වා අපි එන්න පැය කාලකට කලින් ජේබ්ස් බූත් මහත්මයා ඔහුට හමුවුණු බව. ජොන්සන් සමඟ කතාබහ කළ බූත්, ඊළඟට තමන්ගේ කාමරය වෙත යන බව කියා ගියාලු. බූත් තමන්ගේ කාමරයට ඇතුළුවෙන හැටි ජොන්සන් බලාගෙන ඉඳල තියෙනවා. ඔහු තවත් සෑහෙන වෙලාවක් බලාගෙන හිටියලු බූත් කාමරයෙන් එළියට එව්ද කියලා. නමුත් ආවෙ නැහැලු.

"හොඳයි අන්තිමටම මිනිහා අපට කොටුවුණා එහෙනම්!" මට කියවුණා.





ඊළඟට අපි නැවේ කාමර තිබෙන අංශය වෙත ගියා. බූත්ගේ කාමරයේ දෙරට කිහිපවිටක්ම තට්ටුකළා. නමුත් පිළිතුරක් ලැබුණේ නෑ. ඊළඟට දෙර අරින්න බැලුවාම දෙර අගුළුදමලා. කාමර වෙන්කිරීම භාර නිලධරයා කිව්වේ මේක පුදුමවෙන්න දෙයක් නොවෙයි කියලයි. බූත් බොහොම වෙලාවට කුටියේ ඉන්නේ දෙරඅගුළු දමාගෙනලු. සමහර වෙලාවට කෑම ගෙන එන සේවකයා දෙරට තට්ටු කළත් දෙර අරින්නෙ නැකිලු. ඒ නිසා කෑම ටික එළියේ බන්දේසියක් මත තියා යන්න සිදුවෙනවාලු.

අපට තවත් බලාගෙන ඉන්න හැකියාවක් තිබුණේ නෑ. තවත් බලාගෙන හිටියොත් ප්‍රමාද වෙන නිසා අපි තීරණය කළා දෙර කඩන්න. බරමිටියකින් පහර තුන හතරක් එල්ල කරද්දී සරනේරු ළඟින් දෙර ගැළවුණා. අපි ඔක්කොම කාමරයට කඩාවැදුණා. හෝම්ස් මහත්මයා. ඔබට හිතාගන්න පුළුවන්ද, අපේ හිත්වල ඇතිවුණු පුදුමය? කාමරය හිස්! අපි ඒ කාමරය ඉතා සූක්ෂ්මව සෝදිසි කළා. නමුත් බූත් ඒ කාමරය ඇතුළෙ හිටියේ නෑ!"

"මොහොතක් ඉන්න" හෝම්ස් කීය. "ඉදරේ යතුර ඔබ දුටුවාද? ඒක තිබුණේ දෙරේ ඇතුළුපැත්තේ යතුරු කවෙද?"

"නැහැ මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය. "යතුර පෙනෙන හරියක තිබුණේ නෑ. මේ වෙනකොට නැව ටිකෙන් ටික මගීපර්යන්තයට ළංවෙමින් තිබූ බව අපට දකින්න ලැබුණා. එය දෙපැත්තට පැද්දෙමින් ගියේ මගී පාලම දිහාවට.

මීළඟට අපි කරන්න ඕන මොකක්ද කියන එක අපට හිතාගන්න බැරුව ගියා. බූත් නැවේ කොහේ හරි හැංගිලා ඇති කියලයි අපට හිතුණේ. නමුත් ඔහුව හොයමින් නැව පරීක්ෂාකරන්න කාලයක් ඉතිරිවෙලා තිබුණේ නෑ. තවත් මිනිත්තු කිහිපයකින් මගීන් නැවෙන් පිටවෙන්න නියමිතව තිබුණා.

අන්තිමේදී මට පුළුවන් වුණා නැවේ කපිතාන්ව මේ විදියේ වැඩ පිළිවෙළකට එකඟකරවා ගන්න. නැවක් වරායකට ළංවුණාම මගීනට පිටවෙලා යන්න, නැවේ ඉදල ජැටියට මගී පාලම් හතරක් හෝ ඊට වැඩිගණනක් දමනවා. මං කපිතාන්ගෙන් ඉල්ලා හිටියා අපට කරන උදව්වක් වශයෙන්, නැවේ ඉදල ජැටියට එකම එක මගීපාලමක් පමණක් දමන්න. අකමැත්තෙන් වුණත් ඔහු ඊට එකඟවුණා. එතකොට මට පුළුවනි මගීන්ගේ සම්පූර්ණ නාමලේඛනයක් මා ළඟ තියාගෙන පරීක්ෂාකරන්න.



www.sinhalaelibrary.com

මං කළෙත් එයයි. මගේ උදව්වට ආවා කාමර වෙන්කිරීම භාර නිලධරයා, මගීන් භාර නිලධරයා සහ තවත් සේවකයන් තිහපදෙනෙක්. එතකොට බූත්ට නැවෙන් පිටවී යන එක ලේසි නෑ. අපි හිතමු ඔහු මොනවා හරි වෙස්වළාගැනීමක් කළා කියල. ඒ වුණත් මා සමග ඉන්න නැවේ කාර්ය මණ්ඩලය, පිටවී යන්න හදන මගියා හඳුනාගන්න තුරු ඔහුට එතැනින් යන්න ලැබෙන්නේ නෑ. එතකොට බූත් වෙස්වළාගත්තත් ඔහුට අපෙන් රිංගලා යන්න පිළිවෙළක් නෑ.

මෙක මගේ අදහසක්. නැවේ කාර්යමණ්ඩලයත් මේකට එකඟවුණා. මේ ක්‍රමය මගේ සතුටට හේතුවුණේ මෙහිදී අපේ කණෙන් රිංගායෑමේ ක්‍රමයක් නොතිබුණු නිසා.

මගී නාමලේඛනය මගේ අතේ තිබුණා. මගීන් එක්කෙනා, එක්කෙනා ඉදිරියට ආවා. ඔහු හෝ ඇය හඳුනාගැනීමට සේවකයන්ගේ සහාය ලැබුණා. හඳුනාගත් මගීන් යවද්දී මං ඒ නම ලේඛනයෙන් කපාහැරියා. "එම්ප්‍රස් ක්වීන්" නෞකාවේ පළමුවැනි පංතියේ මගී ලේඛනයේ බූත්ගේ නමත් එක්ක, නම 193ක් තිබුණා. මං ලකුණු කරගෙන 192ක් පිටවුණා. නොහැපී ඉතුරුවුණේ බූත්ගේ නම විතරයි.

අපේ හිත්වල ඇතිවුණු කලකිරීම හා කැලඹිල්ල ඔබට හිතාගන්න අමාරුයි හෝම්ස් මහත්මයා" කී ලෙස්ට්‍රේඩ් තලලේ ඩහදිය පිසදමා ගත්තේය. එම සිද්ධිය සිහිවීමෙන් පවා ඔහුට ඩහදිය දැමීමට පටන්ගෙන තිබිණි.

"ඊළඟට අපි තීරණය කළා දෙවැනි පංතියේ මගීන්ට පිටවෙන්න ඉඩ සලසන්න. ලේඛනයේ ඔවුන් හිටියා 324 දෙනෙක්. ඒ 324 දෙනාම හඳුනාගෙන පිටවී ගියා. අඩු ගාස්තු අයකළ තුන් වැනි පංතියේ මගීන් 310ක් හිටියා. ඔවුන් හැමදෙනකුම ලේඛනයේ හැටියට පිටවුණා. එක්කෙනෙක්වත් අඩුවුණෙත් නෑ; වැඩිවුණෙත් නෑ. ඔය විදියට ජේබ්ස් බූත් ඇරෙන්න මගීලේඛනයේ හිටි හැමකෙනෙක්ම නැවෙන් පිටවී ගියා. ඔවුන් පමණක් නෙමෙයි, නැවේ සේවක මණ්ඩලය සෑම කෙනෙක්ම පවා කපිතාන්ගේ උදව්වෙන් හඳුනාගෙන, අනන්‍යතාවය තහවුරු කළා. එතකොට සේවකයෙක් හැටියට වෙස්වළාගෙන නැවෙන් පිටවෙන්නත් බූත්ට ඉඩක් තිබුණේ නෑ.





www.sinhalaelibrary.com



එහෙම නම් ඔහු නැව තුළ සැඟවී සිටිය යුතුමයි. නමුත් මගේ හිතට තවත් සැකයක් ආවා. ඔහු මේ නැවේ විශාල බඩුපෙට්ටියක් ඇතුළේ හැංගුණාවත් ද? මේ වෙනකොට නැවේ බඩුබාන්න විශාල දොඹකර ජැටියට ළංවෙමින් තිබුණේ. මං මගේ හිතේ ඇතිවුණු සැකය ගැන ඇමරිකාවේ රහස්පරීක්ෂක ෆෝසයින්ට කිව්වා. ඔහු වහාම ක්‍රියාත්මක වුණා. මනුස්සයෙකුට හැංගිලා ඉන්න තරම් ලොකු, ට්‍රන්ක පෙට්ටි, ගමන්මලු සහ ඇලිපෙට්ටි හැම එකක්ම ප්‍රවේශමකර බලන්න ඔහු විධිවිධාන නිකුත්කළා. රේගුවේ නිලධරයන්ගේ උදව්ව නිසා ඒ කටයුතු අපහසුවුණේ නෑ. ඒකට තවත් පැය 2ක් ගතවුණා. අන්තිමට රේගුනිලධරයන් අපට දැනුම්දුන්නේ ඒ ක්‍රමයට කිසිම මනුස්සයෙක් එළියට නොආ බව.

එතකොට බූත් එළියට නොඒමේ අබිරහසට තිබුණේ එකම විසඳුමයි. ඒ කියන්නේ ඔහු "එම්ප්‍රස් ක්වීන්" නැව ඇතුළේ කොහේ හරි හැංගිලා ඇති. අපි තීරණය කළා නැව තියුණු සෝදිසියකට ලක් කරන්න. ඒ සඳහා අපට නිව්යෝක් පොලීසියේ අධිකාරීතුමා පලපුරුදු පොලිස්භටයන් විසිදෙනෙක් ලබාදුන්නා. නැවේ කපිතාන්ගේ අවසරයත් සේවක මණ්ඩලයේ සහායත් ලැබුණු අපි නැවේ සෑම අඟලක් නෑරම සෝදිසි කළා. නැවේ තට්ටුව, ගබඩාකාමර, එන්ජින් කාමර, මගීකාමර, හැම අස්සක් මුල්ලක් නෑරම සෝදිසි කළා. බළලෙකුට හැංගිලා ඉන්න පුළුවන් තැනක්වත් අපි සෝදිසි නොකර අත්ඇරියෙ නෑ. ඒත් ජේබ්ස් බූත් ඒ කොතනකවත් හිටියෙ නෑ!

ඉතින් හෝම්ස් මහත්මයා, මං මුහුණදුන් අත්දැකීම ඔන්න ඕකයි. 18 වැනිදා උදේ එකොළහ වෙනකොට බූත් "එම්ප්‍රස් ක්වීන්" නැවේ හිටිය බවට කිසිම සැකයක් නෑ. නමුත් අපි මොනතරම් සූක්ෂ්මව හොයා බැලුවත්, ඔහුම වෙච්ච දෙයක් නෑ. හැන්දෑවෙ පහ වෙනතුරු හෙව්වත් බූත්ගේ කෙස්ගහක තරම් දෙයක් අපට දකින්න ලැබුණේ නෑ."

මා කිසිදිනෙක දැක නොතිබූ අයුරින් ලෙස්ට්‍රේඩ්ගේ මුහුණ කළුවී විරූපී වී තිබිණ. ජීවිතයේ කිසිදක නොවූ අයුරින් ඔහුට මුහුණදීමට වූ මෙම සිදුවීම නිසා, මුහුණෙන් එලෙස හැඟීම් ප්‍රකාශවීමේ පුදුමයක් ද නැත. විමතියට අත් ලකුණු මගේ මුහුණෙන් පවා පැවසෙන්නට ඇත, එහෙත් ෂර්ලොක් හෝම්ස් හාන්සිපුටුවේ

පිටුපසට දිගාවී සිටියේ සැහැල්ලු අයුරෙනි. ඔහුගේ සිතට නැගුණු සිතාව යටපත් කරගැනීමට උත්සාහ දරමින් සිටි නිසාදෝ හෝම්ස්ගේ මුළු සිරුරම හෙමින් ගැස්සෙන අයුරු මම නිරීක්ෂණය කළෙමි.

"ඉතින් අන්තිමේදී ඔබ කර තිබේන නිගමනය මොකක්ද ලෙස්ට්‍රේඩ්?" හෝම්ස් ඇසුවේ මඳවේලාවකට පසුවය. "මොකක්ද ඔබ මීළඟට ගන්න බලාපොරොත්තුවෙන පියවර?"

"මොනම ආකාරයක දෙයක්වත් මගේ මොළේට එන්නෙ නැහැ හෝම්ස් මහත්තයා." ලෙස්ට්‍රේඩ් කීය. "මීළඟට කළ යුත්තේ මොකක්ද කියල මට හිතාගන්න බැහැ. මේක වෙන්න බැරි දෙයක්. විසඳුමක් නැති අබිරහසක්. මං මේ ඔබ හමුවෙන්න ආවේ ඔබෙන් උදව්වක් බලාගෙන. හෝම්ස් මහත්තයා, කරුණාකරල මට කියන්න මං කළයුත්තේ මොකක්ද කියල. මේය විසඳන්න මට ගතහැකි, සම්පූර්ණයෙන්ම වෙනස් විදියේ ක්‍රියා මාර්ගයක් ගැන ඔබට හිතාගන්න පුළුවන් ඇති. මොකක්ද මං කළයුත්තේ?"

"හොඳයි ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීවේ පොලිස්නිලධරයා දෙස නෙත් කොණින් බලා දඟකාර අයුරෙන සිනාසෙමිනි. "ඔබට උවමනා වෙයි කියල හිතනවා නම්, මං දෙන්නම් ඔබට ජේම්ස් බ්‍රූන් දැන් ඉන්නා තැන ලිපිනය.....!"

"දැන් ඉන්නා තැන මොකක්?" ලෙස්ට්‍රේඩ්ට කෑගැසෙද්දී ඔහු නොදැනීම පුටුවෙන් ඉහළට එසැවිණි.

"ඔහුගේ වත්මන් ලිපිනය" හෝම්ස් කීවේ සන්සුන් ස්වරයෙනි. "නමුත් ලෙස්ට්‍රේඩ් ඊට කලින් මං ඔබට අවධාරණය කළයුතු කාරණයක් තියෙනවා. මේ පරීක්ෂණය භාරගන්න කියලා මට ආයාචනය කළේ කොන්සොලිඩේටඩ් බැංකුවේ ජාවිස් මහත්මයා. නමුත් ඔහු අපට අන්තිමට සැලකුවේ බොහොම නරක, අපහාසාත්මක විදියට. ඒ නිසා මින් ඉදිරියට මේ පරීක්ෂණය ගැන මගේ නම සඳහන් වෙනවාට මං කැමති නෑ. ඔබ මොන දේ කළත්, මොන තරම් සාර්ථකව මේ අබිරහස විසඳුවත්. ගැටලුවට විසඳුම ලැබුණේ මගෙන් කියන එක ඔවුනට කියන්න එපා. ෂර්ලොක් හෝම්ස් කියන නම මතක් කරන්නවත් එපා. මට ඒ පොරොන්දුව දෙනවද ලෙස්ට්‍රේඩ්?"

"ඔව් මහත්මයා". ලෙස්ට්‍රේඩ් කීය.


http://sherlockholmesinvestigations.blogspot.com



තම සාක්කු සටහන්පොතෙන් පිටුවක් ඉරාගත් මගේ මිත්‍රයා, එහි යමක් ලියන අයුරු මම බලාසිටියෙමි.

ඒ. වින්ටර් මහතා.
නැකරේ මහත්මිය භාරයේ
ග්ලොසොප් පාර,
බරුම්හිල්
ෂෙෆීල්ඩ්.

"ඔබ හොයමින් ඉන්න පුද්ගලයා මේ ලිපිනයේ ඉන්නවා" හෝම්ස් කීවේ කඩදාසි කැබැල්ල පොලිස් නිලධරයා අතට දෙමිනි. "මං ඔබට තදින්ම අවවාද කරන්න කැමතියි. මොහොතක්වත් පමාවෙන්න එපා. ඒහාම ගිහිං ඔහුව අත්අඩංගුවට ගන්න. ඔබගේ සිත්ඇදගන්නා කතාව කියන අතරේ මට විදුලිපුවතක් ලැබුණා. ඒකෙන් කියවුණේ නිවාඩුවකට ගිහිං හිටි වින්ටර් මහත්මයා, යළිත් නවාතැනට පැමිණ ඇති බවයි. ඔහු යළිත් කිසිදක ආපහු නොඑන්නම, මෙතැනින් පිටවෙලා යන්න යාවි. ඒක බොහොම ඉක්මනින්ම සිදුවෙන්න ඉඩතියෙනවා. නමුත් මට හිතෙනවා ඔහු දින දෙකතුනක් රැඳී ඉඳීවි කියලා"

"හෝම්ස් මහත්මයා. ඔබ නම් සාත්තුවරයෙක් වැනි උතුම් පුද්ගලයෙක්" ලෙස්ට්‍රේඩ් කීවේ අසුනෙන් නැගී සිටිමිනි. ඔහුගේ මුහුණෙන් හෝම්ස් වෙත පළවූයේ සිය හෘදයාංගම කෘතඥතාවය පැවසෙන බැල්මකි. ඒය මා කිසිදිනෙක දැක නැති තරම් ප්‍රබල එකක් බව කිවයුතුය.

"මාව පල්මෝඩයෙකු වෙලා තිබුණු මේ වෙලාවෙ, ඔබ මගේ කීර්තිනාමය ආරක්ෂා කර දුන්නා" ලෙස්ට්‍රේඩ් කීය. "මෙකට ගෞරවය එක අංගුමාත්‍රයක් ලැබීමට මං සුදුසු නෑ. නමුත් එහි සම්පූර්ණ ගෞරවය මටම ලබාගන්න කියලා ඔබ මට බලකරනවා. නමුත් ඔබ මේ ගැටලුව විසඳුවේ කොහොමද කියන එක මට ලොකු අබිරහසක්"

"බ්‍රූන්ගේ නිව්යෝක් ගමන ගැන මගේ අදහස් අපි පස්සේ හමුවුණු වෙලාවක මං කියන්නම්" මගේ මිත්‍රයා කීය. "ඒක නෙමෙයි ලෙස්ට්‍රේඩ්. ඔබ පුදුමයටත් පත්වේවි. මේ ආච්බෝල්ඩ් වින්ටර් හෙවත් ජේම්ස් බ්‍රූන් ඔබට මීට පෙර හමුවෙලා ඇති. කවුද දන්නෙ?


http://sherlockholmesinvestigations.blogspot.com

ඔබ සමහරවිට ඔහු සමග ඔබ කතාබහ කරලත් ඇති. ඒ මොකද ඔහු ඇමරිකාවෙ ඉඳල ආපහු එංගලන්තයට ආවෙ ඔබ ආව නොකාවෙමයි. ඔහු ෂෙෆීල්ඩ් නගරයට ළඟාවුණේ, ඔබ ලන්ඩනයට එන්න ස්වල්පවේලාවකට කලින්. ඔහුගේ ඇති කළුපාට උඩුරැවුලක්. ඔහු කළුපාට උපැස්යුගලකුත් පැළඳගෙන ඉඳිවි."

"හ හා!" ලෙස්ට්‍රේඩ්ට කෑගැසිණ. "ඔය කියන විදියේ මිනිහෙක් මං ආව නැවේ හිටියා නේන්නං...! ඔව්. ඔහුගේ නම ..... වින්ටර්. ඒ ඔහු වෙන්න ඇති. මං මොහොතක් පමාවෙන්නෙ නෑ" කී පොලිස් නිලධරයා ඉක්මනින් අපේ කාමරයෙන් පිටවී ගියේය.

* * *

"මගේ හිතවත් වොට්සන්" හෝම්ස් කීවේ හාන්සිපුටුවේ පිටුපසට හේත්තුවී ඔහුගේ පයිප්පය දල්වාගනිමිනි. "ඔබේ මුහුණත් අපේ ලෙස්ට්‍රේඩ්ගේ මුහුණ වගේ නේ. මොකද මේ හැටි පුදුමයට පත්වෙලා?"

"හෝම්ස්. මං හිතන්නේ ඔබට මෙච්චර කාලයකට විසඳන්න ලැබුණු එකම පරීක්ෂණයකවත් මේ වගේ අබිරහසක් තිබුණේ නෑ. එහෙම නේද? "එම්ප්‍රස් ක්වීන්" නොකාවෙ ඉඳපු බූත් කොහොමද අර විදියට අතුරුදන්වුණේ?"

"ඔව්. ඒක හරිම පුදුමාකාරයි තමා." හෝම්ස් කීය. "ඒක විසඳුව හැටි මං ඔබට කියන්නම්.

මෙ පරීක්ෂණයෙදි අපි මුලින්ම සලකා බැලියයුතු කරුණක් තියෙනවා. ඒ තමයි, මේ අපරාධකාරයා කොයිතරම් බුද්ධිමත්, කපටි පුද්ගලයෙක්ද කියන එක තක්සේරු කරගැනීම. ජේබ්ස් බූත් අන්තිමටම දක්ෂ කෛරාටිකයෙක් බවට කිසිම සැකයක් නෑ. ඒ බව ජාවිස් මහත්මයාත් කිව්වා ඔබට මතක ඇති. අපරාධය කරන්න මාස දෙළහකට කලින් සිට ඔහු ෂෙෆීල්ඩ් නගරය පුරා බැංකු ගිණුම් විවෘතකිරීම ඒකට හොඳ සාක්ෂියක්.

මෙ අපරාධය ඔහු සැලසුම් කරලා තියෙන්නෙ, කොයිතරම් කාලයක ඉඳලද කියන එක, අපට පැහැදිලිවම පෙනෙනවා. ඉතින් මං මේ පරීක්ෂණය පටන්ගත්තේ මෙහෙම දෙයක් හිතේ තියාගෙන. අපට උවමනාකරන අපරාධකාරයා, අල්ලාගන්න අමාරුවෙන



http://sherlockholmesinvestigations.blogspot.com



කපටියෙක්. ඒ මොකද ඔහුට තමන්ගෙ පැනයාම සැලසුම්කරන්න අවුරුද්දක කාලයක් තිබුණා.

මේ පරීක්ෂණය විසඳීම සඳහා මට මුලින්ම හෝඩුවාවක් ලැබුණේ පර්නල් මහත්මියගෙන්. ඇය කිව්වා බූත් මහත්තයා සමහරවිට සති ගණන් ඇගේ ගෙදරින් බැහැරව සිටියා කියල. මොකටද? බැංකු විගණන කටයුතුවල යෙදීමට. ඔහු කලින් සේවය කළ බැංකුවට ගියාම මං විමසල බැලුවා. මට දැනගන්න ලැබුණා බූත්ට එහෙම අමතර වැඩක් බැංකුවෙන් පවරලා නොමැති බව. එහෙම නම් ඇයි ඔහු තමන්ගේ ගෙහිමි කාන්තාව රවටන්නෙ? ඇයි මේ වගේ බොරු ගෙතුවේ?

මං ඒ ගැන කල්පනා කළා. එතකොට මගේ හිතට ආවා මෙහෙම දෙයක්. ඒ තමයි, මේ අපරාධකාරයා ෂෙෆීල්ඩ් නගරයේ ද්විත්ව ජීවිතයක් ගතකරන්න ඇති බව. ඒ කියන්නේ එක කාලසීමාවකදී පුද්ගලයින් දෙදෙනෙකු හැටියට පෙනීසිටිමින් ජීවත්වීම. මෙහිදී බූත්ගේ අරමුණ වුණේ මොකක්ද? ඔහු අපරාධය සිදුකරන්නේ එක් පුද්ගලයෙකු හැටියට පෙනී ඉඳිමින්. එනම් ජේබ්ස් බූත් හැටියට. ඊළඟට ඔහු ඒ චරිතයෙන් සම්පූර්ණයෙන්ම අයින්වෙලා අනෙක් චරිතයට පිවිසෙනවා. කල්තියාම එහෙම ද්විත්ව චරිත රඟපෑමක යෙදෙන එකේ ලොකු වාසියක් තියෙනවා. ඒ මොකක්ද? වංචාවක් කළ හොරා වෙස්වළාගෙන පැනයාවි කියලයි අනික් අය බලාපොරොත්තුවෙන් ඉන්නෙ. එහෙම මොහොතක ඔහු නොසැලකිලිමත් විදියට වෙස්වළාගැනීමක් කරන්නෙ නෑ. ඔහු කරන්නේ පහුගිය අවුරුද්දක කාලය තුළ රඟපෑ භූමිකාවට පිවිසීම පමණයි. එතකොට මට පැහැදිලිවම පෙනුණා, මෙක රටෙන් පැනගැනීමෙ අරමුණෙන් යම් සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට බූත් විසින් යොදාගෙන ඇතිබව.

ඊළඟට අපට දකින්න ලැබෙනවා තවත් සිත්ඇදගන්නා කාරණා කිහිපයක්. ඒ තමයි බූත්ගේ චිත්‍රය සහ පොත්පත්. මං මෙහෙම හිතුවා. ඔය වගේ තත්ත්වයකට මං මුහුණදුන්නා නම් මං මොකක්ද කරන්නෙ? පොත්පත් සිතුවම් ඒව ඔක්කොම සැහැල්ලු, පහසුවෙන් එහාමෙහා ගෙනයාහැකි දේවල්. ඔහු මෙතරම් අගයකරන දේවල් මොනවටද අහිමිකරගන්නෙ? ඒවා කොටස් වශයෙන් යම්කිසි තැනකට අරගෙන ගිහිං එතන ආරක්ෂාකර තියනවා. එතකොට



http://sherlockholmesinvestigations.blogspot.com

පස්සේ පුළුවනි තමන්ට උවමනා වෙලාවක ඇවිත් අරගන්න. එවිට මට මතක්වුණා, ඔහු මේ දේවල් ගන්න ආපහු ආවාම මට හැකි වෙන්න ඕන ඔහුව අල්ලාගන්න. නමුත් කොහොමද මේ තැන මං හොයාගන්නේ?

ඔබට මතක ඇති කුණුකූඩයේ තිබ් ලෙස්ට්‍රේඩ්ට හමුවුණු නීත්තපොවන කඩදසිය. ඒකෙන් අපට පහසුවෙන් කියවාගන්න හැකිවුණා බූත් "එම්ප්‍රස් ක්වීන්" නෞකාවෙන් නිව්යෝක් බලා යාත්‍රාකරන්න, පළමු වැනි පන්තියේ කාමරයක් වෙන්කරවාගෙන ඇති බව.

මුලින් මට හිතුණේ මේක අප නොමග යවන්න කළ බොරු වංචාවක්දෝ කියලයි. තමන් යන්නේ නිව්යෝක් කියල අපට පෙන්වලා, ඔහුට පුළුවනි යුරෝපයට එනින්න. කොයි එකවුණත් මේ හෝඩුවාව ගැන සොයා නොබලා අත්හැර දැමීම සුදුසු නෑ. ඒ නිසා එද දෙවැනි දවසේ ලිවර්පූල්වලදී මං ගියා නැව් කටයුතු කාර්යාලයට.

මට දැනගන්න ලැබුණා ජේම්ස් බූත් නම් කෙනෙක් "එම්ප්‍රස් ක්වීන්" නැවේ පළමු වැනි පන්තියේ කාමරයක් වෙන්කරවාගෙන තිබූ බව. ඔහුගේ ෂෙෆීල්ඩ්හි ලිපිනය හැටියට දීලා තිබුණේ පර්නල් මහත්මියගේ නිවසේ ලිපිනය"

"නමුත් හෝම්ස් ඔහු වංචනික කටයුත්තකට සූදානම් වුණා නම්, ආපසු ලිපිනය නොදී ඉන්න තිබුණා නේද?"

"බූත්ට නැව් කටයුතු ගැන හොඳ වැටහීමක් තිබුණා" හෝම්ස් කීය. "නැවක යාත්‍රාකරන්න කාමර වෙන්කරවා ගන්න කොට, එම මගියාගේ නිවසේ ලිපිනය, නැව් සමාගම අනිවාර්යයෙන්ම ලබාගන්නවා. ඒ මොකද නැවේ හදිසි අලුත්වැඩියා කටයුත්තක් හෝ අයහපත් කාලගුණය නිසා නැවේ පිටත්වීම ප්‍රමාදනම්, ඔවුන් ඒ බව මගියාට දන්වනවා. එහෙම කරන්න ඔවුන් නීතියෙන් බැඳී ඉන්නවා. එහෙම පිටත්වෙන වෙලාවේ හෝ දිනයේ වෙනසක් වුණොත් නැව් සමාගම විදුලිපුවතක් මගින් මගියාට දැනුම් දෙනවා.

දැන් මගේ නිගමනය වී තිබුණේ ජේම්ස් බූත් නැවේ කාමරයක් වෙන්කරගෙන යාත්‍රාකරනවා වගේම, ඔහුගේ අනික් භූමිකාව රඟපාන පුද්ගලයා හැටියටත් කාමරයක් වෙන්කරවාගෙන ඇති. අපි මෙහෙම කල්පනා කරමු වොට්සන්. අන් අයට හොර රහසේ



http://sherlockholmesinvestigations.blogspot.com



වෙනස් පුද්ගලයන් දෙදෙනෙකු හැටියට දින පහක් හෝ හයක් නෞකාවක රඟපාන්න ඔබට සිදුවුණා කියල හිතමු. ඒකට ඔබ සූදානම් කරගතයුතු මූලික අවශ්‍යතා මොනවද? එයින් ප්‍රධානම එක තමයි, එක ළඟින් කාමර දෙකක් ලබා ගැනීම. බූත් අමතර මුදලක් ගෙවලා හරි මෙහෙම දෙයක් කරන බව අපට නිගමනය කරන්න පුළුවනි.

බූත් අරගෙන තිබුණේ අංක 51 කාමරය. මං බැලුවා මේ ළඟින්ම කාමර අරගෙන තිබුණු මගීන් ගැන. අංක 50 කාමරය ලැබී තිබුණේ කැප්‍රියාටි නම් ඉතාලි ජාතික තරුණයෙකුට. ඔහු අවුරුදු විසිපහක වයසේ ටෙනිස් ක්‍රීඩකයෙක් බවත්, ඒ සඳහා ඇමරිකාවට යන බවත් නැව්කටයුතු කාර්යාලයේ කාමර වෙන්කිරීම් භාරව හිටි තරුණියට මතක තිබුණා. ගෙවීම් ඔහු කරල තිබුණේ මුදලින්. අනෙක් පැත්තේ කාමරය වූ අංක 52 කාමරය වෙන් කරගෙන තිබුණේ අවුරුදු 45ක් වයසැති ආච්බෝල්ඩ් වින්ටර් නම් මහත්මයෙක්. ඔහුගේ ආපසු ලිපිනය කුමක්ද කියා මං විමසුවා. ඒක මං ඔබට කලින් කියූ නැකඩ් මහත්මිය භාරයේ, ග්ලොසොප් පාර, බරුම්හිල්, ෂෙෆීල්ඩ්"

"මට පුදුමයි හෝම්ස්" මම එම කථාවට බාධා කළෙමි. "ඇයි ඔහු ඒ ලිපිනයත් නැව් සමාගමට දුන්නේ?"

"ඒකට හේතුව මේයයි වොට්සන්. "එම්ප්‍රස් ක්වීන්" නෞකාව පිටත්වීමට නියමිතව තිබුණේ අගෝස්තු 30 ද බදාදා හවස 6.30ට එද අවල් දෙකයි කාලටත් ඔහු ෂෙෆීල්ඩ්වල. අම්හෙයකින් මොනවා හරි හේතුවක් නිසා නැවේ ගමන කල්ගියා කියල, බදාදා පාන්දරම විදුලිපුවතකින් දැනුම්දුන්නා කියල හිතමු. ඒක අර ගෙවල් දෙකටම ලැබෙනවා. එතකොට ඔහුට ඕනෙනම් අර හොර චෙක්පත් ඉදිරිපත් කිරීම, එදට කරන්නෙ නැතුව ඉන්නත් පුළුවනි. නමුත් සල්ලි හොරකම් කරගත්තා වුණත් ඔහුට ඒ හැටි ප්‍රශ්නයක් නෑ. ඔහුට පුළුවනි වින්ටර් හැටියට, නැකඩ් මහත්මියගේ නිවසේ ලැගුම්ගන්නත්. ඊළඟට නැව පිටත්වෙන දවස දන්වා තවත් විදුලිපුවතක් ලැබුණාම, ඔහු ලිවර්පූල් වෙත යන්නේ කාගේවත් සැකයකට භාජනය නොවී"

"හරි දැන් මට තේරෙනවා" මම කීවෙමි.

"මොකක් ගැනද මං කිය කිය හිටියේ..... ආ ඔව්. වින්ටර් මහත්මයා කාමර වෙන්කළ ආකාරය ගැන. ඔහු ඒ සඳහා පෞද්ගලිකවම නැව් සමාගමට ඇවිත් චෙක්පතක් භාරදීලා කාමරය



http://sherlockholmesinvestigations.blogspot.com

වෙන්කරවාගෙන තිබුණා. ග්‍රීන්ඩ්ලේස් බැංකුවේ ෂෙෆීල්ඩ් ශාඛාවේ චෙක්පතකින්, ඔහු ගෙවා තිබුණේ, ජේම්ස් බූත්ගේ චෙක්පත නැව් සමාගමට ලැබුණු දවසෙමයි. ඔබට ඒ කාරණය පැහැදිලිද?"

"ඔව් පැහැදිලියි" මම කීවෙමි. "ඇයි ඔහු ඒ විදියට කළේ? මේ චෙක්පතත් කලින් වගේ තැපෑලෙන් එවන්න තිබුණා නේ"

"එහෙම කළොත් බූත්ගේ කාමරයට අල්ලපු කාමරයම ලැබේවිද කියල සහතික වෙන්න බැහැනේ" හෝම්ස් කීය. "ඔහු බූත් නමින් එවූ චෙක්පත නැව්සමාගමට ලැබෙන දිනයටම ඇවිත්, ඒ කාමරයේ අංකය බලලා අල්ලපු කාමරය වෙන්කර ගත්තාම කාටවත් සැක හිතෙන්නේ නෑ."

"ඒ අනුව වින්ටර්ගේ ලිපිනය හොයාගැනීම ඔබට පහසුවුණා?" මම ඇසීමි.

"ඔව්. මං වහාම ඒක සටහන් කරගත්තා" හෝම්ස් කීය. "මට ඔබට කියන්න බැරිවුණා තවත් කාරණාවක්. එදා පර්නල් මහත්මියගේ නිවසේ ඔහු අලුත්ම ඡායාරූපයක් තියල ගියේ පොලීසිය නොමඟ යවන්න කියල ඔබ දන්නවනේ. නමුත් ඒකෙ පිටුපසින් මං ලියාගත්තා, ඡායාරූපයේ අංකය හා ඡායාරූපශාලාවේ ලිපිනය. මට හැකිවුණා ඒකෙ පිටපතක් බ්‍රැම්හිල්හි ඡායාරූප ශාලාවෙන් ලබාගන්න.

නැව්කාර්යාලයෙන් ලබාගත්ත තොරතුරු නිසා මං තීරණය කළා වහාම යළිත් ෂෙෆීල්ඩ් එන්න. ඔබ වෛද්‍ය ස්ටොක් සමඟ ප්‍රිය සම්භාෂණයේ යෙදෙද්දී මං ආවා ෂෙෆීල්ඩ් වෙත. මං අර ලිපිනය හොයාගෙන ගියා. මං ගිහින් ඇහුවා "මට වින්ටර් මහත්මයා හමුවෙන්න පුළුවන්ද?" කියලා.

"වින්ටර් මහත්මයා දවස් කිහිපයකට කලින් ගියේ." තැකරේ මහත්මිය කිව්වා. "ඔහු යළිත් කවද්ද එව්ද කියල කියන්න බැහැ. ඇයි උවමනාව මොකක්ද?"

මෙහෙම වෙලාවට සම්පූර්ණ සත්‍යය හෙළිකරන එක මගේ සිරිත නෙමෙයි. නමුත් එදා නම් මට ඒක නොකර බැරිවුණා. මම, බැංකුවකින් සිදුවූ මුදල් හොරකමක් ගැන සොයා බලන ලන්ඩන් රහස්පරීක්ෂකයෙක් බව ඇයට දැනුම්දීලා, මගේ කාඩ්පත පෙන්නුවා.

"කවදද ඔහු අන්තිමට ඇවිත් ගියේ?" මම ඇහුවා.



http://sherlockholmesinvestigations.blogspot.com



"ඔහු ආවෙ ගිය බදාදා - අගෝස්තු මාසෙ 30 වැනිදා. එදා ඔහු මගේ කාමර සඳහා ගෙවිය යුතු සම්පූර්ණ නේවාසික ගාස්තුවත් ගෙවලයි ගියේ."

"ඔහු මොනවා හරි මෙහේ ගෙනැවිත් තියල ගියාද?"

"ඔව් මහත්මයා. ඔහු චිත්‍රයක් අරගෙන ආවා. ඒක කඩදාසියකින් ඔතලා තිබුණේ. මං ඒක දිගඇරලා බැලුවෙ නැහැ. කලින් ඔහු වරින්වර පොත්වගයක් ගෙන ආවා."

ඇය මෙහෙම කිව්වාම මං මේ පිවිසෙන්නේ නිවැරදි මාර්ගයට බව මට වැටහුණා. "ඔහු වයස අවුරුදු පනහක පමණ, මුහුණේ රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකළ කෙනෙක්ද?" මං ඇහුවා.

"වයස නම් පනහක් විතර තමා" ඇය කිව්වා. ඒත් ඔහුට කළුපාට උඩු රැවුලක් තියෙනවා. අඳුරු කළ උපැස් යුගලක් පාවිච්චි කළා."

මං ඡායාරූප ශාලාවෙන් කලින් ලබාගත් බූත්ගේ ඡායාරූපයට පැන්සලෙන් උඩුරැවුලක් හා උපැස් යුගලක් ඇඳලා තැකරේ මහත්මියට පෙන්නුවා.

"මේ නම් වින්ටර් මහත්මයා තමයි" ඇය කිව්වා. "උඩුරැවුල මීට වඩා ටිකක් ගොරෝසුයි. නමුත් මේ වින්ටර් මහත්මයා තමයි. කිසි සැකයක් නෑ."

"ඔහු දිගටම මෙහේ නවාතැන් ගෙන හිටියද? කොහේද ඔහු රක්ෂාව කළේ?" මං ඇහුවා.

"වින්ටර් මහත්මයා, වෙළඳ ද්‍රව්‍ය ප්‍රවර්ධනය සඳහා රටපුරා සංචාරය කළ අලෙවි ප්‍රවර්ධකයෙක්" ඇය කිව්වා. "මේ පැත්තට ආවොත් මගේ ගෙදර තමා නැවතුණේ. එක මාසෙකට ඔහු දින දහයකට වඩා මේ ගෙදර ඉන්නෙ නෑ. නමුත් මගේ බෝඩිං ගාස්තු අඩුනැතුව ගෙව්වා"

"ඔහු නොවරදවාම කෑමට බීමට ගත්ත විශේෂ දේවල් මට කියන්න පුළුවන්ද?"

"ඔව් මහත්මයා" ඇය කිව්වා. "ඔහුට උදේට රෑට කෑමට මොනවා ලැබුණත් ප්‍රශ්නයක් නෑ. නමුත් උදේ පාන්දර නැගිට්ට ගමන් චොක්ලට් කිරි බොන්න ඕනෑ. උණ ගැනුණත්, බඩේ අමාරුවක් හැදුණත් ඔහු චොකලට් කිරි එක නම් නොබී අත්ඇරියෙ නෑ."

එතකොට වොට්සන් ඔබට පෙනෙනවා ඇති වින්ටර් සහ බූත් දෙදෙනෙක් නොවෙයි, එක්කෙනෙකු බව. වෙස්මාරු කරගැනීමට



http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුට උවමනා වුණේ කළුපාට උපැස්යුගළ හා බොරු උඩුරැවුලක් පමණයි. ඒ ටික ඇත්තෙන්ම හෝටලයේ නානකාමරයකදී වුණත් කරගන්න පුළුවනි.

දැන් මට තේරුම් ගියා, නමින් පසුපස ලුහුබඳින රහස්පරීක්ෂකයන් මඟහරින්න ඔහු දීර්ඝකාලයක් ආචිබෝල්ඩ් වින්ටර් හැටියට ජීවත්වෙන්න බලාපොරොත්තු වෙන බව.

ඔහු "එම්ප්‍රස් ක්වීන්" නෞකාවේ පළමුවැනි පංතියේ කාමර දෙකක් එක ළඟින් වෙන්කර තිබ්බා. එකක් බූත් නමින්. අනික වින්ටර් නමින්. දීර්ඝ මුහුදු ගමන පුරාම මේ චරිත දෙක මාරුවෙන් මාරුවට රඟපෑවා. වැඩිකාලයක් ඔහු මඟීන් අතර පෙනී හිටියේ වින්ටර් හැටියට. ඒක බොහොම නිහඬ චරිතයක්. එහෙම නැති දවස්වල ආබාධිත, බාගෙදුර මලුව නුරක්වුණු බූත් හැටියට. ඒ මඟින් මඟීන්ගේ අවධානය බූත් නම් චරිතය වෙත ඇදගන්න පුළුවන් බව ඔහු දැනහිටියා. අනික් අයට බූත්ව පෙනුණේ ඉඳහිට වුණත් මඟීන්ට හොඳට මතක තියෙන විධියට ඔහු රඟපෑවා.

කොහොමද ඔහු නැවේ කාර්ය මණ්ඩලයට නොපෙනෙන්න වෙනස් කාමර දෙකක ලැගුම් ගත්තේ? මං හිතන්නේ බූත් හැටියට එක කාමරයක නින්දට යන ඔහු රෑකාලයේ කවුරුවත් ඒ හරියේ නොගැවසෙන වෙලාවට අනික් කාමරයට යන්න ඇති. ගිහිං වෙස්මාරු කරගෙන වින්ටර් ලෙස ඒකෙ ජීවත්වෙනවා. එදට බූත්ගේ කාමරය අගුළුදමලා කෑම බඳුන් ගන්නවත් ඔහු කාමරයේ දොර අරින්නේ නැහැ. සුහදශීලී ප්‍රසන්න මහත්මයෙක් හැටියට වින්ටර් මහජනයා අතර ගැවසෙන්න ඇති. නමුත් ඔවුන් දෙදෙනාගේ පෙනුමේ සමානකම් අනෙක් අය හඳුනාගනීවි කියන සැකය නිසා, වින්ටර් වැඩිය අනෙක් අය අතරට නොඑන්නත් ඇති කියල මට හිතෙනවා. සමහරවිට බොරු කොණ්ඩයක් වැනි දෙයක් දමලා ඔහු වෙස්මාරු කිරීමේ තවත් පියවරක් ඉදිරියට යන්නත් ඇති. ඔබට තවමත් නොපැහැදිලි මොනවා හරි තියෙනවාද වොට්සන්?"

"වින්ටර් හැටියට තක්කඩියා ආපසු ආව ගමන්, ඒ බව දන්වලා විදුලිපුවතක් ගෙන්වාගන්න ඔබ සමත්වුණේ කොහොමද?" මම ඇසීමි.

"මෙතැනදී මං එක් දුෂ්කරතාවයකට මුහුණ දුන්නා" හෝම්ස් කීය. "නැකරේ මහත්මියගේ හිතවත්කම වින්ටර් මහත්මයා වෙත





තිබුණහොත් මොකක්ද සිදුවෙන්නෙ? රහස් පරීක්ෂකයෙක් ඇවිත් ඔහු ගැන හොයා බලලා ගිය බව ඔහු ආපහු ආව ගමන් ඇය දැනුම්දෙනවා. ඊළඟට ඔහු එතැනින් පැනයන්නේ අන්ධකාර අහසක විදුලිකෙටීමක් නොපෙනී යන තරමේ ඉක්මනින්. ඒ නිසා මට සිදුවුණා, තරමක අවදානම් ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්න. ඒ මොකක්ද? සම්පූර්ණ සත්‍යය හෙළිකරල ඇගේ සහයෝගය ඉල්ලා සිටීම. මං ඇයට කිව්වා සංචාරක වෙළෙන්දෙක් හැටියට පෙනී ඉන්නා වින්ටර් මහත්මයා, ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට පමණක් නොව ඇමරිකාවටත් උවමනා "දරුණු" අපරාධකාරයෙකු බව. මං දරුණු කියන වචනය පාවිච්චි කළ වහාම ඇගේ ඇඟ කිළිපොළා ගිය බව මට තේරුණා. මං ඇයට පෙන්නුවා බූත්ගේ ඡායාරූපය සමඟ පුවත්පත්වල මුල් පිටුවේ පළවූ ලිපිය. ඇය ෂෙෆීල්ඩ්වල කෙනෙක් නිසා ඒක බොහොම උනන්දුවෙන් කියවා තිබුණා. ඊළඟට මම පුවත්පතේ පළවූ ඡායාරූපයට උඩුරැවුලක් හා උපැස්යුගලක් ඇන්දම තවත් යමක් කියන්න උවමනා වුණේ නැහැ. වින්ටර් අල්ලාගන්න පොලීසියට සහයෝගය නොදුන්නොත්, ඊළඟට හිරබාරයට පත්වෙන්නේ ඇය බව මං මතක්කර දුන්නා. ඒ, අපරාධකාරයාට පැනයාමට ආධාර හා අනුබල දීම යන චෝදනාව යටතේ. ඇගේ පරෙස්සම ගැන හිතලා හොර රහසේම මට විදුලිපුවතක් වහාම එවන්න කියලා මං ඇයට මේ ගෙදර ලිපිනය දුන්නා."

"එක්සත් ජනපදයට ගොඩ බැහැපු බූත් ඇයි එහේ නොරැඳී ආපසු එංගලන්තයට ආවේ? ලෙස්ට්‍රේඩ් පවා කිව්වා ඔහු ඇමරිකාවේ හැංගුණා නම් හොයාගැනීම අපහසු බව?" මම ඇසීමි.

"ඔබ කියන කාරණාව ඇත්තයි වොට්සන්" හෝම්ස් කීය. "නමුත් මෙහෙම හිතන්න. ජේම්ස් බූත් නම් බැංකු හොරා නිව්යෝක් වරායෙන් ගොඩ බැහැලා ඇමරිකාවේ වෙසෙන බව නිව්යෝක් පොලීසිය දන්නවා. ඒක එයාලගෙ පොත්වල සටහන්වෙලා රටපුරාම යනවා. බූත් වෙස්මාරු කරගත්තත් ඔහුට ඇමරිකාවේ ජීවත්වෙන්නේ හිතේ පුංචි සැකයක් බියක් ඇතුව. නමුත් ඔහු වින්ටර් හැටියට ආපහු එංගලන්තයට ආවොත් මොකද වෙන්නේ? මුළු ලෝකයම හිතන්නේ අපරාධකාරයා ඉන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ කියල. කිසිකෙනෙක් ජේම්ස් බූත්ව එංගලන්තයේ

හොයන්න උනන්දු වෙන්නේ නෑ. හෙව්වත් ප්‍රශ්නයක් නෑ. ඉන්නේ ආචිබෝල්ඩ් වින්ටර් මිස බූත් නෙමෙයි.

ඉතින් ඔහු මොකක්ද කළේ? ඊළඟට ආපහු එංගලන්තය බලා එන නැවෙන් යාත්‍රාකිරීම. ලෙස්ට්‍රේඩ් කළෙත් ආපසු එංගලන්තයට ඒම. ඉතින් දෙන්නා ඒ නැවේ එකට ආව එකේ පුදුමයක් නෑ. මගේ අනතුරු ඇඟවීම හොඳින් තේරුම් අරගෙන හිටි නැකරේ මහත්මිය වින්ටර්ගේ පැමිණීම දන්වලා රහසේම විදුලිපුවතක් එව්වා."

"හෝම්ස්. මේ අබිරහස විසඳීමේ සම්පූර්ණ ගෞරවය හිමිවිය යුත්තේ ඔබටයි." මම කීවෙමි. "ඒ වුණත් දැන් සිදුවෙන්නේ වෙනත් දෙයක්. ගෞරවය හිමිවෙන්නේ, මොකුත් කරගන්න බැරිව අමාරුවේ වැටුණු ලෙස්ට්‍රේඩ්ට."

"ඒකෙන් මට ප්‍රශ්නයක් නෑ මිතුයා" හෝම්ස් කීවේ තම වයලීනය අතට ගනිමිනි. "ගැටලුව විසඳීමෙන් මං විශාල තෘප්තියක් ලැබුවා. ඒකෙන්ම මට පුළුවනි සෑහීමකට පත්වෙන්න. ඒක නෙමෙයි වොට්සන්. අද හැන්ඩෑවෙ කොවෙන්ට් උද්‍යානයේ ෆ්ලෝරල් ශාලාවේ ක්‍රිස්ටීන් නීල්සන් සංගීතවේදිනියගේ ගායන හා වාදන ප්‍රසංගයක් පැවැත්වෙනවා. මා නම් ඒකට යනවාමයි. ඔබ කැමතිද මාත් එක්ක එන්න?"



http://sherlockholmesinvestigations.blogspot.com

# ශාපලත් සොහොන

මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා අභිරහසක් විසඳීමට භාරගැනීමේදී, එයින් තමාට විශාල මුදලක් ගාස්තු වශයෙන් ලැබේද නොලැබේද යන්න කිසිවිටෙකත් සැලකුවේ නැත. තම ගාස්තුව වශයෙන් ඉහළ මුදලක් අයකරගැනීමට තිබූ, එහෙත් ඔහුගේ සිත් ඇදගැනීමට අසමත්වූ ගැටලු භාරගැනීම හෝම්ස් ප්‍රතික්ෂේප කළේය. ඒ බව මම බොහෝවිට දැක ඇත්තෙමි. එමෙන්ම ගැටලුව ඔහුගේ සිතේ කුතුහලයක් ඇතිකිරීමට සමත්වූයේ නම්, එය විසඳීම හෝම්ස් නොපැකිළ භාරගත්තේය. එයින් තමාට කිසිදු වාසියක් නොලැබෙන බව දැන දැනත් ඔහු ඒවා විසඳීමට කාලය ගතකළේ සතුටෙනි.

1894 වසර ෂර්ලොක් හෝම්ස්ට වැඩකටයුතු බහුල වූ වර්ෂයක් බව මම මීට පෙර සඳහන් කර ඇත්තෙමි. මෙම පරීක්ෂණවල සටහන්වලින්, මගේ විශාල ලිපිගොනු තුනක් සම්පූර්ණයෙන්ම පිරීගියේය. ඔහුට කිසිදු මූල්‍යමය වාසියක් නොලැබුණු පරීක්ෂණ කිහිපයක් ද එහි ඇතුළත්ය.

එක් උදෑසනක, බේකර් වීදියේ නිවහන වෙත ලැබුණු පුවත්පත් දිගහැරගෙන කියවන අතරේම, අපි උදේ ආහාරය ගනිමින් සිටියෙමු.

"වොට්සන්. ඔබ මට කිව්වා නේද....." හෝම්ස් එක්වරම මගෙන් විමසුවේය. "ඔබේ හිතමිත්‍ර වෛද්‍ය ස්ටැම්ෆර්ඩ්, සර් ඇන්ඩ්‍රූ ලුවිස්ට ප්‍රතිකාර කරනවා කියල?"

"ඔව්" මම පිළිතුරු දුන්නෙමි. "අර සුප්‍රසිද්ධ වෛද්‍ය විශේෂඥ විලියම් ග්‍රීඩන්ගෙනුත්, තමන්ගේ රෝගියා ගැන ස්ටැම්ෆර්ඩ් විමසා බැලුවලු. ඒ වුණත් සර් ඇන්ඩ්‍රූ ලුවිස්ට තිබුණු රෝගලක්ෂණ ගැන අහල වෛද්‍ය ග්‍රීඩන් පවා පුදුමයට පත්වුණාලු"

"හැබෑට?" හෝම්ස් ඇසීය. "ඒ රෝගලක්ෂණ මොනවාද කියල ඔබට මතකද?"

සති කිහිපයකට පෙර ස්ටැම්ෆර්ඩ් සමඟ බිලියඩ් ක්‍රීඩාවේ යෙදෙද්දී කළ කතාබහ මම සිහිකළෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com

"සර් ඇන්ඩ්රූ ගොදුරු වෙලා තියෙන්නෙ මුළු සිරුරම එකවගේ දුර්වල වුණු රෝගයකට. ඒකෙදි දකින්න ලැබුණලු සමේ තුවාල හා වණවීම, හිසකැක්කුම, ක්ලාන්තය, වමනය, කෙස්හැලීයාම ආදිය. ඊට අමතරව ඔහුගේ මොළයටත් ඒක එක්තරා විධියකට බලපාල තිබුණු බවයි ස්ටැම්ෆඩ් කියන්නෙ. තමා මොකක්දෝ ශාපයකට ගොදුරුවුණා කියල සර් ඇන්ඩ්රූ හිතාගෙන ඉන්නවලු"

"ඉතින් ඒ ගැන ස්ටැම්ෆඩ්ගෙ අදහස මොකක්ද?"

"ඒ ලෙඩේ මොකක්ද කියලා ඒක ගැන ඔහුට කිසිම වැටහීමක් නෑ" මම කීවෙමි. "ඒගොල්ලො වෛද්‍ය ග්‍රීඩන් අනුමාන කරල තියෙනවා මේක සර් ඇන්ඩ්රූට ඝර්ම කලාපීය රටකදී බෝවුණු විරල රෝගයක් කියලා. සර් ඇන්ඩ්රූගේ පුතා මියගිහින් තියෙන්නෙත් මේ රෝගයෙන්මයි. ඒ හුඟක් තරුණ කාලෙ - වයස අවුරුදු විසිගණන්වලදී. ග්‍රීඩන් කියල තියෙනවා බොහොම කාලයකට පෙර දෙන්නාටම රෝගය බෝවී ඇති බවත්, පුතා ළාබාල කාලෙදීම විෂබීජයට ගොදුරුවුණු නිසා ඉක්මනින්ම මියයන්නට ඇති බව. කුඩා කාලයේදී රෝගවලට ඇගේ ඇති ප්‍රතිශක්ති ගතිය හුඟක් අඩුයිනෙ. ඇයි හෝම්ස් ඒ ගැන ඇහුවෙ?"

"ග්‍රීඩන් - ස්ටැම්ෆඩ් දෙන්නටම සර් ඇන්ඩ්රූගෙ ජීවිතය බේරාගන්න හැකිවෙලා නෑ. මේ අද පත්තරේ තියෙන්නෙ ඔහුගේ මරණය ගැන විස්තරයක්." කී හෝම්ස් පුවත්පත මා අතට දුන්නේය.

මම එය කියවා බැලීමි. සර් ඇන්ඩ්රූ ලුවිස් පිළිබඳ දීර්ඝ විස්තරයක් එහි පළවී තිබිණි. ඔහු විසින් කළ පුරාවිද්‍යාත්මක කැණීම්, ගවේෂණ හා ඔහු කළ සොයාගැනීම් ගැන ද එහි සඳහන් විය. ඊට අමතරව එම පුරාවිද්‍යාඥයා දැරූ තනතුරු, ලබාගත් ගෞරව සම්මාන ගැන ද සඳහන්ව තිබිණි. සර් ඇන්ඩ්රූ ලුවිස් කළ විශිෂ්ට සොයාගැනීම් එක්රැස් කර, ප්‍රදර්ශනය සඳහා තබා ඇති කෞතුකාගාරවල නාමලේඛනයක්, එම පිටුවේම වෙනත් තැනක පළවී තිබිණි. පසුකාලීනව ඔහුගේ වෘත්තීය කටයුතු ආන්දෝලනාත්මක ලෙස්වූ අයුරු ද, ඔහු මහජනයා අතරට නොපැමිණ පෞද්ගලිකව දිවි ගෙවූ අයුරු සඳහන් කරමින් ලිපිය අවසන් විය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ!" මට කියැවිණි. "බලාගෙන ගියාම ඔහු නම් බොහෝම දරුණු ශාපයක ගොදුරක් වෙලා"



http://sherlockholmesinvestigations.blogspot.com



"වොට්සන් ඇයි ඔබ එහෙම කියන්නෙ?" මගේ මිත්‍රයා ඇසුවේය.

"එහෙම කියන්නෙද?" මම ඇසීමි. "පත්තරයේ සඳහන් වෙලා තියෙන කාරණා ටිකක් මං කියවන්නම්. ඔන්න අහගෙන ඉන්න."

"..... සර් ඇන්ඩ්රූ ලුවිස් වෙත චෝදනා එල්ල වූයේ ඇඩිල්ටන්හි පෞරාණික සොහොන්බිම කැණීමේදී ඔහු ක්‍රියාකළ ආකාරය පිළිබඳවය. මෙය ශාපයකට ලක්වූ භූමියක් ලෙස ජනප්‍රවාදයේ පවතී. සිය ආදරණීය පුතණුවන්ගේ අභාවය සිදුවූ කාලයේදීම මෙම චෝදනා එල්ලවීම නිසා, සර් ඇන්ඩ්රූගේ සිතේ ඇතිවූ ශෝකය දෙගුණ තෙගුණ වන්නට ඇත. විවිධ තැන්වලින් ඔහුට චෝදනා එල්ල වෙද්දී, ඒවාට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට, සර් ඇන්ඩ්රූ උත්සාහ නොකළේය. ඔහු පැවසුවේ, තමා සැමවිටම කටයුතු කළේ අවංක චේතනාවෙන් බවයි. තම සහෝදර විද්‍යාඥයාට මෙසේ ප්‍රහාර එල්ල කිරීම අනෙක් පුරාවිද්‍යාඥයෝ හෙළා දුටුවහ. එහෙත් තමාට එල්ල වූ චෝදනාවලින් සර් ඇන්ඩ්රූගේ සිත තදින්ම පෑරෙන්නට ඇතුවා නිසැකය. ඔහු පුරාවිද්‍යාත්මක කැණීම්වල යෙදීම සම්පූර්ණයෙන්ම අත්හැර දැමීය. පුරාවිද්‍යාත්මක සඟරාවලට ඉඳහිට ලිපි සැපයූ ඔහු දේශන ඉදිරිපත් කළේ ඉතා කලාතුරකිනි.

අන්තිමේදී ඔහු මරණය කරා ළඟාවූයේ බ්‍රිතාන්‍ය වෛද්‍ය ක්ෂේත්‍රයේ විශිෂ්ටයන් පවා පරාජයට පත්කරමිනි. මේ අනුව තම ගම්මානයේ ඇති අතිශය පෞරාණික සොහොන් බිම ශාපලත් එකක් යයි ඇඩිල්ටන් ගම්වාසීනට පිළිගැනීමට සිදුවී ඇත. සර් ඇන්ඩ්රූගේ මරණය ගැන ශෝකවන ඥාතීන් ලෙස ඉතුරුවී සිටින්නේ එක් අවිවාහක දියණියක පමණි.

"මොකක්ද හෝම්ස් මේ සේරේම තේරුම?" මම ඇසීමි. "මොකක්ද ඔහුට විරුද්ධව එල්ලවුණු චෝදනාව?"

"වගකීමකින් තොරව කටයුතු කරන ජාතික පුවත්පත්වල වැඩ" හෝම්ස් කීවේ කලකිරීමකට පත් හඬෙනි. "ඔහුගේ මරණය සිදුවී ඇති මේ වෙලාවෙ ඔහුට එල්ලවුණු චෝදනා ගැන දිගින් දිගටම සඳහන් කරන එක වැරැද්දියි. ඔහුට චෝදනා එල්ලකරල තිබුණේ ඇඩිල්ටන්හි කැණීම්වලදී ඔහුට සහයවුණු එඩ්ගා නම් පුරාවිද්‍යාඥයෙක්. ඔහු කියල තිබුණා මෙහෙම දෙයක්. සොහොන්



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

බිමේ කැණීම්වලදී මුද්‍රා තබා තිබූ ලෝහ භාජනයක් හමුවුණාලු. පිටත එක් විශේෂිත ආකාරයක කැටයම් තිබූ මෙය, පසුව කෞතුකාගාරයකට භාරදීල තියෙනවා. එය හම්බවුණු අවස්ථාවේ ඒ තුළ අඩංගුව තිබූ සියලුම දේ, පසුව කෞතුකාගාරයට භාරදෙද්දී තිබුණෙ නැහැලු. ඔහු ඒක වචනවලින් සඳහන් කර නොතිබුණත්, අදහස් කර තිබුණේ මෙහෙම දෙයක්... "ඒ බඳුන තුළ තිබූ යම්කිසි වටිනා වස්තුවක් සර් ඇන්ඩ්‍රූ රහසේම හංගාගන්න ඇති."

පත්තරේ සඳහන්ව තිබිලා ඔබ දුන් කියවූ මේ කතාවට එද පුරාවිද්‍යාඥයින් හැම දෙනෙකුගේම අප්‍රසාදය හා විරෝධය එල්ලවුණා. ඇඩිල්ටන් සිද්ධිය ගැන මෙහෙම දෙයක් කියනතුරු, පුරාවිද්‍යාඥ එඩ්ගා ඔහුගේ ක්ෂෙත්‍රයේ සැලකෙන පිළිගැනීමකට ලක්වී සිටියා. නමුත් මේකෙන් පස්සේ ඔහුත් පැත්තකට තල්ලුවී ගියා. දැන් ඔහු ලන්ඩන් නුවරයට ආසන්න නගරයක, කනිෂ්ට විශ්වවිද්‍යාලයක ආචාර්යවරයෙක් කියලයි මට අහන්න ලැබුණේ."

අපි යළිත් පුවත්පත් කියවීමට පටන්ගත්තෙමු. හෝම්ස් කියවා අවසන් කළ පුවත්පත් මා අතට දී අලුත් ඒවා දිගහැරීමට පටන්ගත්තේය. මගේ අතේ තිබූ එක් පුවත්පතක් ඉවතදැමීමට මා සැරසෙද්දී, එක් පිටුවක පහතින් වූ ශීර්ෂපාඨය වෙත මගේ නෙත් යොමුවිය.

## ඇඩිල්ටන්හි ශාපය
## සුප්‍රකට පුරාවිද්‍යාඥයෙක් අභාවප්‍රාප්ත වෙයි.

මම එය ද කියවීමට පටන්ගතිමි. මගේ අවධානය දිනාගැනීමට සමත්වූයේ ලිපියේ අවසන් කොටසය.

"මෙන්න මේ ලිපිය හොඳයි ඩෝක්ටර්ට කියවන්න දුන්නා නම්" අන්තිමේදී මම කීවෙමි.

"ඇත්තට? මොනවද ඕකෙ තියෙන්නෙ?"

"මෙකෙ තියෙනවා හොඳ විස්තරයක්" මම කීවෙමි. "ඇඩිල්ටන් විල්ලුව මැද කඳුගැටයක් මුදුනේ පිහිටා තිබෙන, ඇඩිල්ටන් පෞරාණික සොහොන්බිම ගැන තොරතුරු ගම්වාසීන් හොඳින් දන්නවා කියන්නේ. මේ ශාපලත් සොහොන කියන භයානකම එක, කුඩා සොහොන් ගෘබ රාශියකට මැදිවෙලා, මැදින්මලු පිහිටා තියෙන්නෙ. මතක ඇති කාලයක පටන් ඔය තැන ගැන කාටත්


http://sherlockholmesinvestigations.blogspot.com



අහන්න ලැබිල තියෙන්නෙ බොහොම බිහිසුණු කථාලු. මොනතරම් දැඩි ශීත සෘතුවක් ඇවිත් මොනතරම් ගණකමට හිමවැටුණත්, ඒ හිම ඉස්සරවෙලාම දියවෙන්නේ, ඔය සොහොනෙලු. ගමේ මිනිස්සු ඒකට දාල තියෙන නම ශාපලත් සොහොන. ඒ මොකද කිසිම දවසක එතැන පොළොවේ කිසිම දෙයක් වැවෙන්නෙ නැතිලු. අදටත් එතැන එක තණකොළ ගහක් නැතිබවයි කියන්නෙ....."

"වොට්සන්" හෝම්ස් මගේ කථාවට බාධාකළේය. "ඉක්මනටම හිම දියවී යන, තණකොළ ගහක් වැවෙන්නෙ නැති සොහොන් ගැන, අපට ගම්බදව කොයිතරම් අහන්න ලැබෙනවද. මේ එංගලන්තයේ දෙව්මැදුරුවල සොහොන්ගැබ්වලින් බාගයක පිළිවෙළ එහෙමයි කියලා මිනිස්සුන්ගෙන් ඇහුවොත් කියාවි."

"ඒ කාරණාව මං පිළිගන්නවා" මම කීවෙමි. "පුදුමාකාරම දේ ඒක නොවෙයි. ඇඩිල්ටන්වල ගම්වාසියන් කියනවාලු මෙහෙම දෙයක්.

සර් ඇන්ඩ්‍රූ අර සොහොන විවෘත කළාට පස්සෙ, ඇඩිල්ටන් ගම්මානය පුරාම පුදුමාකාර රෝගයක් පැතිරිගියාලු. එහි රෝග ලක්ෂණ, සර් ඇන්ඩ්‍රූට හැදුණු රෝගයට බොහොම දුරට සමානයි. ඒ වුණත් ඒ හැටි ගණනක් පුද්ගලයින් එයින් මරණයට පත්වෙලා නෑ. නමුත් ඒ ප්‍රදේශයේ මළදරු උපත් විශාල ගණනක් සිදුවෙලා තියෙනවා. උපන් දරුවන්ගෙනුත් විශාල ගණනක් ආබාධිත අයලු. ගමේ මිනිස්සු කියන්නේ මේ තත්ත්වයට සර් ඇන්ඩ්‍රූ වගකිවයුතුයි කියලයි. කාටවත් හිරිහැරයක් නොවී තිබුණු සොහොන විවෘතකිරීම නිසා ඒක මුළුගමටම ශාපයක් වුණාලු. ඔබ මොනවද හෝම්ස් ඒ ගැන කියන්නෙ?"

ඔහු මඳවේලාවක් කල්පනාකළේය. "කණගාටුවට කරුණ මේකයි" ඔහු කීය. "පුවත්පත්වල ඔහොම දෙයක් පළවී තිබුණු පළියටම අපට ඔය හැමදෙයක්ම විශ්වාස කරන්න බෑ. මේ ගැන හොඳට හොයල බලල අපි සත්‍යය හොයාගන්න ඕන. ඔය කියන කතාවල් ඇත්ත නම් මේක මහා පුදුමාකාර සිදුවීමක්. වෛද්‍යවරයෙක් හැටියට ඔබේ මතය මොකක්ද වොට්සන්?"

"බාගවෙලාවට වෛද්‍ය ග්‍රීඩන්ගේ මතය ඇත්ත වෙන්න පුළුවනි" මම කීවෙමි. "සර් ඇන්ඩ්‍රූ ලෝකය පුරාම තැන් තැන්වල ගවේෂණ කළා. ඊජිප්තුවේ කයිරෝ ඉඳල සැතපුම් දහස්ගණනක්


http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

දකුණට තිබෙන ෆාරාවෝ සොහොන් ගැබ් හා පිරමීඩ ගණනාවකම ඔහු කැණීම් කරල තියෙනවා. සමහර ඊජිප්තු සොහොන් අවුරුදු හාර පන්දහසක් පැරණි ඒවා කියලයි කියන්නේ. ඔහු මේවා ඇතුළට වෙලා සතිගණන් ගවේෂණ කටයුතුවල යෙදෙන්න ඇති. එයින් ඇතිවෙන තත්ත්වය මොනා වගේද කියල අපට කියන්න අමාරුයි. ඒ සොහොන්ගැබ්වල අවුරුදු දහස්ගණන් පැරණි මළසිරුරු තියෙනවා. ඉතින් ඒවා සමග මොනා විදියේ ක්ෂුද්‍රජීවීන් හිටියාද කියා කවුද දන්නේ? ප්‍රංශයේ ලුවී පාස්චර් හොයාගෙන තියෙන හැටියට, රෝගවලින් සියයට අනූවකටම මුල විෂබීජ; ඒවා ගැන අපි කිසිම දෙයක් දන්නේ නැතිතරම්යි. ඒ වගේ විෂබීජයක් සර් ඇන්ඩ්‍රූගේ ඇඟට ඇතුළුවුණා කියල හිතමු. ඔහු ඒක සිරුරේ තියාගෙන ජීවත්වෙනවා. කල්ගතවෙද්දි ඔහුගෙන් ඒක පුතාටත් බෝවෙනවා. සමහර ලෙඩරෝග තියෙනවා, කාලයක් සිරුරේ යටපත්ව තිබිලා, රෝග ලක්ෂණ පසුව මතුවෙන. මෙකත් එහෙම එකක් වෙන්න පුළුවනි"

"ඔව්. බාගවෙලාවට එහෙම වෙන්න ඇති" හෝම්ස් කීය. "වොට්සන්. කරුණාකරලා මගේ ඔය ලිපිද්‍රව්‍ය ටික මෙහාට දෙන්න"

ඔහු ලිපියක් ලියන්නට පටන්ගත්තේය. ඇඩිල්ටන් සිද්ධිය ඔහුගේ සිහිතන් ගිලිහී යන්නට ඇතැයි මම විශ්වාස කළෙමි. එහෙත් දින කීපයකට පසු යළිත් වරක් උදේ තේ මේසයේදී හෝම්ස් මේ ගැන කතාකළේය.

"සර් ඇන්ඩ්‍රූ ලුවිස්ගේ මරණය ගැන අප කළ කතාබහ ඔබට මතකද වොට්සන්?"

"ඔව්...... ඇයි?"

හෝම්ස් මේසය මත තිබූ ලිපියක් අතට ගත්තේය. "මේ සිද්ධිය ගැන පුවත්පත්වල පළවූ දෙයින් මගේ හිතේ කුතුහලයක් ඇතිවුණා." ඔහු කීය. "ඒ නිසා මං ලියුවා ලියුමක්. කාටද? ඇඩිල්ටන් ප්‍රදේශය අදාළ ප්‍රාන්තයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාට"

"හැබෑට? ඔහු මොකද කියන්නේ?"

"මං විමසලා යැව්වා, සර් ඇන්ඩ්‍රූ ලුවිස්ගේ කැණීම නිසා, ප්‍රදේශයේ ජනයාට අභිරහස් ලෙස රෝගයක් වැළඳුණා කියන කතාව ඇත්තක්ද කියලා" හෝම්ස් කීය. "මේ බලන්න ඔහු ඒ ගැන දීර්ඝ විස්තරයක් කියා එවා තිබෙනවා.



http://sherlockholmesinvestigations.blogspot.com



මේක ශාපයක් කියන විශ්වාසය නම් බහුබූත කතාවක්ලු. ඔහු ඒ ගැන නම් කොහොමටවත් විශ්වාස කරන්නෙ නැතිලු. නමුත් සර් ඇන්ඩ්‍රූ අර ශාපලත් මිනීවළ කියන එකේ කළ කැණීම්වලින් පස්සේ ඇඩිල්ටන්වල වෙනසක් වුණාලු. මහජනයාගේ සෞඛ්‍ය ප්‍රශ්න රැසක් තමන්ට දකින්න ලැබුණාලු. සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා මේ ගැන තමන්ගේ අවධානය යොමුකරල තියෙනවා. ඔහුට කොහොමවත් තේරුම්ගන්න අමාරු ජෛවහීනතාවයකට (ලේ අඩුකමකට), මේ පළාතේ ජනයා ගොදුරුවෙලා තියෙනවා. අර මළ දරුඋපත් සහ ආබාධිත දරු උපත් කරාට ඇත්තලු. ඒ කියන්නේ වෙන පළාත්වලට වඩා, ඇඩිල්ටන්වල සිදුවූ ආබාධිත දරු උපත් ගණන වැඩි බව වෛද්‍යවරයා නිරීක්ෂණය කරල තියෙනවා. ඒ වගේමයි මියගිහින් ඉපදුණු දරුවන් ගණන. ඔහු කියන්නේ මේ අවාසනාවන්ත තත්ත්වය සහ පුරාවිද්‍යාත්මක කැණීම එකට සම්බන්ධ කරන්න බැරිලු. ඔහු හිතනවා මේ පළාතේ පානීය ජලයේ මොකක් හරි වරදක් නිසා, මෙහෙම දෙයක් සිද්ධවුණා කියලයි"

"හෝම්ස් ඒ අදහස ගැන මොනවද කියන්නේ?"

"ඔය ශාපයක් ගැන නම් මං කොහොමටවත් විශ්වාස කරන්නෙ නෑ" හෝම්ස් කීය. "ඒ වගේමයි මේක අහම්බ සිදුවීමක් කියල කියන්නත් බෑ. අවුරුදු දහස් ගණනක් නිද්‍රෝපගතව කාගෙන්වත් හිරිහැරයක් නොවී තිබුණු සොහොනක් සර් ඇන්ඩ්‍රූ විවෘතකළා. ඒක අපරාධයක්..... ඒක නිසා තමන්ගේ හිසමතට ශාපයක් වැදුණා කියලනේ ඇඩිල්ටන් මිනිස්සු කියන්නේ. ඒ මතය නම් මං සම්පූර්ණයෙන්ම බැහැර කරනවා. එහෙම වුණත් ඔය කැණීමත් ලෙඩ රෝග සහ මරණත් එකට සම්බන්ධ කරන යමක් තියෙන්න පුළුවනි. ඒක මං බැහැර කරන්නෙ නෑ. පානීය ජලය ගැන කතාකරනවා නම් අපට කියන්න තියෙන්නේ මෙහෙම දෙයක්. ඇඩිල්ටන් කියන්නේ කඳුපන්තියකට මැදිවුණු, නිම්නභූමියක පිහිටි ගමක්. මේ කඳු හැම එකක්ම අභ්‍යන්තරය හුණුගල්වලින් නිර්මාණය වුණු ඒවා. එහෙම ප්‍රදේශවල ජලය ඉතාම පිරිසිදු බවට ප්‍රසිද්ධයි. හුණුගල් මිශ්‍ර ලවණ ස්තර මැදින් ගලා එන ජලය, බීමට හොඳ පිරිසිදු ජලය කියල මතයක් තියෙනවා නේද? ඇයි වොට්සන් දකුණු ඩාබිෂයරයේ ගම්මානවල හැම ග්‍රීෂ්ම සෘතුවකම උත්සව



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

පැවැත්වෙන්නේ? එංගලන්තය පුරාම වසංගත රෝග පැතිරී ගිහින් ලක්ෂ ගණනක් මරුමුවට පත්වුණු වෙලාවෙ, දකුණු ඩාබිෂයරය ආරක්ෂා වුණේ කොහොමද? හුණුගල් ස්ථර මැදින් වැටී තිබුණු, ඔවුන්ගේ ජල උල්පත්වලින් ලැබුණු පිරිසිදු විෂබීජ රහිත ජලය නිසා"

"ඒ කාරණා ප්‍රයෝජනයට අරගෙන, මේ සිද්ධිය තේරුම් කළ හැකි උපකල්පනයක් ඔබට තියෙනවාද හෝම්ස්?"

"ප්‍රමාණවත් තරම් දත්ත අප්ට තවමත් ලැබුණෙ නෑ මිත්‍රයා" හෝම්ස් කීය. "දත්ත නොමැතිව යමක් පැහැදිලි කරන්න, තීරණ ගන්න යෑම විශාල වැරැද්දක්. ඒ හින්ද අපි මේ සිදුවීම ගැන තොරතුරු එකතු කරමු. එතකොට අපට බලාගන්න පුළුවනි, මේ අබිරහස පිටුපස තියෙන්නෙ මොකක්ද කියලා"

හෝම්ස් යළිත්වරක් මා සමග මේ ගැන කථාකළේ පසුවද සවස්වරුවේය.

"වොට්සන්. අද හැන්දෑවට ඔබ මොකක් හරි වැඩක් යොදගෙන ඉන්නවද?"

"නෑ"

"මට හිතුණා දේශනයක් අහන්න යන්න"

"දේශනයක්? කාගෙද?"

"දේශනය පවත්වන්නෙ ඇඩිල්ටන් සිද්ධියට සම්බන්ධ ආචාර්ය එඩ්ගා..... අපි අර ඊයෙ කතාවුණේ ඔහු ගැන. ඕල්ඩ්රිජ් ආයතනයේ ශාලාවෙ ඔහුගේ දේශනයක් පැවැත්වෙනවා. ඔහුගේ මාතෘකාව ග්‍රහතාරකා සහ පාෂාණ. ශ්‍රීමත් නෝමන් ලොක්යර් කලකට පෙර මතයක් ඉදිරිපත් කළා, පෞරාණික ආගමික සිහිවටනවල ඉදිකිරීම ගැන. ඔහු කිව්වා මේවා ඉදිකිරීමේදී ග්‍රහලෝකවල චලනය සැලකීමට ගත් බව."

ඕල්ඩ්රිජ් ආයතනය පිහිටා තිබුණේ දකුණු ලන්ඩනයේ ඈත කෙළවරකය. එඩ්ගා මහතාගේ දේශනයට සවන්දීමට එතරම් පිරිසක් පැමිණ සිටියේ නැත. අවුරුදු හතළිහක් පමණ වයස්ගත දේශකයාට දිග කෙස් වැටියක් තිබිණ. ලොකු වීදුරු සහිත උපැස්යුගලත් කෙස්වැටියත් නිසා විද්‍යාඥයෙකුගේ බුද්ධිමත් පෙනුමක් ඔහු වෙතින් දිස්විය. ඔහු, තමා විසින්ම ගන්නා ලද ඡායාරූප රාශියක් ආලෝක පෙට්ටිය මගින් බිත්තියට ප්‍රක්ෂේපනය


http://sherlockholmesinvestigations.blogspot.com



කළේය. එයින් බොහොමයක් දනුම බෙදදෙන ආකාරයේ ඒවා වූ අතර සමහරක් සිත් ඇදගන්නා දර්ශන විය. ලොක්යර්ගේ සංකීර්ණ සිද්ධාන්තය සරල බසින් තේරුම් කරදීමට එඩ්ගා උත්සාහ දරුවේය.

දේශනය අවසානයේදී රැස්ව සිටි සෙනග එතැනින් පිටව් යාමට පටන්ගත්හ. එඩ්ගා මහතා තම ඡායාරූප අඩංගු වීදුරු කැබලි, ලී පෙට්ටියක ඇදෙව්වේය. අසුනෙන් නැගී සිටි හෝම්ස් ඒ දෙසට යද්දී මම ඔහු පසුපස ගියෙමි.

"මහත්මයා. අපි ඔබේ කථාව අහගෙන හිටියේ බොහොම ආශාවෙන්" හෝම්ස් කීය.

"ස්තුතියි මහත්වරුනි" දේශකයා කීවේ සිනාමුසු මුහුණෙනි. "ඔබ දෙදෙනා පුවත්පත් වාර්තාකරුවන් නොවේය කියල මං විශ්වාස කරනවා"

"ඇයි ඔබ එහෙම කියන්නෙ?" හෝම්ස් ඇසීය.

"සර් ඇන්ඩ්රූ ලුවිස්ගේ මරණයෙන් පස්සේ පුවත්පත් වාර්තාකරුවන් මං ගැන අවධානය යොමුකරලයි තියෙන්නෙ. ඔවුනට කිසිදෙයක් කියන්න මං කැමති නෑ"

"අපි පුවත්පත්වලට සම්බන්ධ අය නෙමෙයි" හෝම්ස් කීය. "ඒ ගැන අපි ඔබට සහතික වෙන්නම්. මගේ නම ෂර්ලොක් හෝම්ස්. මේ මගේ මිත්‍රයා දෙස්තර වොට්සන්"

දේශකයාගේ දෙනෙත් මඳක් විශාල වූ අයුරු උපැස්යුගලේ වීදුරු හරහා පෙනිණ. මොහොතක් හෝ දෙකක් නිහඬව සිටි ඔහු අනතුරුව කථාකළේය.

"විශේෂඥ රහස්පරීක්ෂක හෝම්ස් මහත්මයා නේද? මොන හේතුවක් නිසාද ඔබේ අවධානය පුරාවිද්‍යාව දෙසට යොමුවුණේ?"

"පෞරාණික දේවල් ගැන මගෙත් ලොකු කැමැත්තක් තියෙනවා" හෝම්ස් කීය. නමුත් මේ වෙලාවෙ නම් මට ඔබේ උදව් අවශ්‍ය වෙලා තියෙන්නෙ, සර් ඇන්ඩ්රූ ලුවිස්ගේ මරණය ගැන කරන පරීක්ෂණයට"

"සර් ඇන්ඩ්රූගේ මරණය?" එඩ්ගා මහතාට කියැවිණ. "ඇයි ඒක මිනීමැරුමක් කියලා ඔබට කවුරුහරි කිව්වද?"

"නෑ එඩ්ගා මහත්මයා" හෝම්ස් කීය. "මෙතැන මිනීමැරුමක් කොහොමටවත් නෑ. කවුරුත් දන්න විදියට සර් ඇන්ඩ්රූ මියගියේ ස්වාභාවික විදියට. නමුත් එක් විශේෂ කාරණයක් මතුවෙලා


http://sherlockholmesinvestigations.blogspot.com

තියෙනවා. ඇඩ්ල්ටන් සොහොන්බිම විවෘත කළාට පස්සෙ ඒ ගම්ප්‍රදේශයේ පැතිර ගිය මරණය, ලේඩරෝගවලත් සර් ඇන්ඩෲගෙ මරණයත් අතර පුදුමාකාර ලෙස සමීප සම්බන්ධයක් තිබෙන බවයි සමහරු කියන්නෙ?"

"එහෙම නම් ඇඩ්ල්ටන් ශාපය කියල හඳුන්වන දේ ඔබ විශ්වාස කරනවද?"

"කොහොමටවත් නෑ" හෝම්ස් කීය. "නමුත් ඒ කැණීම්වලින් පස්සෙ ඇඩ්ල්ටන් ප්‍රදේශයේ භයානක රෝගයක් පැතිරී ගිය බවට ඔා ළඟ සාක්ෂි තියෙනවා. මෙතැන සැඟවිලා තියෙන රහස මොකක්ද කියලා මං හොයාගන්න ඕන. ඇඩ්ල්ටන් ගම්වාසීන්ගේ යහපත සඳහා, ඒ හේතුව හරියටම හඳුනාගැනීම අප කළ යුතුම වැඩක්"

"මට කිසිම වෛද්‍ය විද්‍යාත්මක දැනුමක් නෑ හෝම්ස් මහත්තයා" එඩ්ගා කීය. "ඉතින් මං කොහොමද ඔබට උදව් වෙන්නෙ?"

"වෛද්‍ය විද්‍යාත්මක දැනුමක් නැතිවුණත් අපට උදව්වෙන්න ඔබට බැරිකමක් නෑ" හෝම්ස් කීය. "එදා ඔය සොහොන පිහිටි කඳුමුදුනෙ සිදුවුණේ මොකක්ද? කැණීම සම්බන්ධයෙන් හැමදෙයක්ම මට කියන්න"

හෝම්ස්ගේ ඉල්ලීම ගැන මඳවේලාවක් කල්පනා කළ පුරාවිද්‍යාඥ එඩ්ගා මහතා අන්තිමේදී තීරණයකට පැමිණි බැව් පෙනිණ. එබැවින් ඔහු කළ කටයුත්ත - ඡායාරූප තහඩු ලී පෙට්ටියට ඇසිරීම අවසන්වන තුරු අපි බලා සිටියෙමු.

"සර් ඇන්ඩෲ කැණීම් කරන්න හුඟක්ම කැමැති තැන තමා ඇඩ්ල්ටන් විල්පුවේ සොහොන්බිම" එඩ්ගා මහතා කීය. "ඔහු විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් කාලෙ ඉඳලම එතැනට අවධානය යොමුකරල තියෙනවා. ශාපලත් සොහොන කියල හඳුන්වන තැන ඔබ දැනටමත් දන්නවා ඇති. මේ ස්ථානයේ සිදුවුණු අරුමපුදුම දේවල් ගැන කවුරුත් මවිතයට පත්වුණා. හැමතැනකටම කලින් එතැන හිම දියවී ගිය හැටි, එකම තණකොළ ගහක් හෝ නොවැවී එතැන පස නිරාවරණව තිබුණු හැටි; මේ ආදී දේවල් සර් ඇන්ඩෲගෙ මොළයට හරියට වද දුන්නා. කාගෙ හරි ශාපයක් නිසා එතැන මේ විදියට සිදුවෙනවා කියල නම් ඔහු කල්පනා කළේ නෑ. නමුත් ඔහු කිව්වේ, මෙතැන අනෙක් සොහොන්බිම්වලට වඩා



http://sherlockholmesinvestigations.blogspot.com



යමකිසි විශේෂයක් තිබිය යුතුයි කියලයි. ඒ විශේෂය ඒ අබිරහස හොයාගන්න, ඔහුගේ හිතේ තිබුණු ලොකු උනන්දුවක්.

ඉතින් අවුරුදු දහයකට කලින් එක් ග්‍රීෂ්ම කාලයක අපි ඇඩ්ල්ටන්වලට ගියා. ඒ දවස්වල තිබුණේ යහපත් කාලගුණයක්. ඇඩ්ල්ටන් කියන්නේ සුන්දර ගම්මානයක්. නමුත්..... හෝම්ස් මහත්මයා..... මගේ කීම විශ්වාස කරන්න. වැඩි දවස් යන්න කලින් මට හිතුණා, මේ ප්‍රදේශයට ශාපයක් එල්ලවී තිබෙනවා කියන කතාව බොරුවක් නොවෙන බව"

"ඇයි ඔබට එහෙම හිතුණේ?"

එඩ්ගා මහතා අත දිගුකොට ඔහුගේ ඡායාරූප අඩංගු වීදුරු තහඩු පෙන්නුවේය. "මට භාරවෙලා තිබුණු එක් කටයුත්තක් තමයි සර් ඇන්ඩෲ වෙනුවෙන් ඡායාරූප ගැනීම. පෞරාණික සොහොන්බිමට අදාළ හැම තැනකම ඡායාරූප ගහකරන්න කියලා ඔහු මගෙන් ඉල්ලා සිටියා. කැණීම් පටන්ගන්න පෙරත්, කරද්දීත්, අවසන් වූ පසුත් මං ඡායාරූප ගත්තා. මට අනික් කිසිම තැනක් ඡායාරූපගතකිරීම අපහසුවුණේ නෑ. ශාපලත් සොහොන හැරෙන්න. අපේ කණ්ඩායම ඒ සොහොන ඉදිරිපිට ඉන්න ඡායාරූපයක් මං මුලින්ම ගත්තා. ඒක කිසිසේත් පැහැදිලි වුණේ නෑ. මං හිතුවා ඒක මගේ දළසේයා තහඩුවේ වැරැද්දක් කියලා. නමුත් එදගත් අනික් ඡායාරූප හැමඑකක්ම හොඳට ආවා. ශාපලත් සොහොන ළඟ ගත් හැම එකක්ම නරක්වුණා. එතැනදී ගත් ඡායාරූපවල දළසේයා තහඩුවේ කිසිම රූපයක් සටහන්වුණේ නෑ."

"කොහොමද එහෙම දෙයක් වුණේ?" හෝම්ස් ඇසීය.

"ඒ හැම එකකම තිබුණා මීදුම ගලා ආවා වගේ පෙනුමක්" එඩ්ගා කීවේය. "මං ඡායාරූප ගත්තෙ හොඳ දීප්තිමත් හිරු එළිය තිබුණු දවස්වල. අනෙක තහඩු නිෂ්පාදකයා නියම කළ උපදෙස් අනුව ආලෝකය ලබාදීලා. නමුත් එතැන ගත් ඡායාරූප පමණක් විනාශවෙලා. කටුක ශීත සෘතුවලදී ලන්ඩන් නගරය හරහා ගලන "පේස්ට් සුප්" වගේ ඝනකම් මීදුම ගැන ඔබ දන්නවා නේ. ඡායාරූප තහඩුවේ පෙනුණේ අන්න ඒ වගේ දර්ශනයක්"

"ඒකට හේතුව මොකක්ද කියල ඔබට දැනගන්න ලැබුණද?"

"නැහැ, මට ඒ කිසිදෙයක් දැනගන්න ලැබුණෙ නැහැ. මුල ඉඳලා අන්තිම හරිය වෙනතුරු එහෙම තිබිලා, එකපාරටම ඒක නැතුව ගියා!"



http://sherlockholmesinvestigations.blogspot.com

"එකපාරටම නැතිව ගියා?"

"ඔව්. ශාපලත් සොහොන, ඡායාරූපවල සටහන් වෙන්න පටන්ගත්තා. ඊටපස්සේ කිසිම නොපැහැදිලිතාවයක් ඇතිවුණේ නෑ. මීදුමගතිය ඔක්කොම ඉවත්වුණා. මට එතකොට හැකිවුණා සොහොන ඡායාරූප ගතකරන්න. ඒ වෙනසට හේතුවුණේ මොකක්ද කියන කරුණ මට කවදාවත් දැනගන්න හැකිවුණේ නෑ."

"ඔබ කිව්වා තවත් මොනවා හරි දුෂ්කරතාවලට මුහුණදෙන්න සිදුවුණු බවක්. එහෙම නේද?" හෝම්ස් ඇසුවේය.

"ඇත්තෙන්ම ඔව්" එඩ්ගා පිළිතුරු දුන්නේය. "සර් ඇන්ඩ්රූ සහ අපේ කණ්ඩායමේ කිහිපදෙනෙක්ම, බරපතල ලෙස රෝගාතුරවුණා."

"ඒ මොන රෝගයක්ද?" මම ඇසීමි.

"රෝගය මොකක්ද කියල හඳුනාගන්න, ඒ පළාතේ වෛද්‍යවරයාටත් බැරිවුණා" එඩ්ගා කීය. "ඇඟපුරා කැසීම සහ ක්ලාන්තය තමයි මුලින්ම ඇතිවුණේ. මුලින්ම අපි හිතුවෙ අප නවාතැන්ගත්තු, ගමේ තානායමේ ඇඳ ඇතිරිලිවල අපිරිසිදු කමක් නිසා ඇතිවුණු දෙයක් කියල. සමහරු කිව්වා ඒක තානායමේ කෑම නිසා සිදුවුණු දෙයක් කියල. නමුත් අපේ කණ්ඩායමේ අය කොටස් දෙකකට බෙදිලයි හිටියෙ. දෙගොල්ල නැවතිලා හිටියේ තානායම් දෙකක. ඒ තානායම් තිබුණේ ගමේ දෙකෙළවරක, එකකට එකක් ඈතින්. ඊළඟට අපේ අය කියන්න පටන්ගත්තා මේක ඒ පළාතේ බැටලුවන් හෝ එළදෙනුන් නිසා ඇතිවුණු ලෙඩක් කියල. ඒ වුණාට මට නම් හිතුණේ ඒක මහ පිස්සු කතාවක් කියලයි. කොහොම හරි ටික දවසක් යද්දි මේක හෙමින්ම නැතිවෙලා ගියා. හරියට අර ඡායාරූපවලින් මීදුම නැතිවෙලා ගියා වගේ."

"වෙන මොනවද?"

"ඒ කාලෙම පටන්ගත්තා සර් ඇන්ඩ්රූගේ පෞද්ගලික ප්‍රශ්න"

"ඒ මොනවද?"

"සර් ඇන්ඩ්රූගෙ පුතා ඈන්තනි සේවය කරමින් හිටියෙ යුද්ධ හමුදාවෙ" එඩ්ගා කීය. "හදිසියේම එක් දවසක් ඔහු තම පියා හොයාගෙන ඈඩිල්ටන් වෙත ආවා. ඒ යකා මහ මෝඩ හිතුවක්කාර තරුණයෙක්. ඔහු මොනවා හරි සූදුවලට ගිහිං හතරඅතේ ණය වෙලා, තමන් භාරයේ තිබුණු හමුද මුදලුත් අයථා ලෙස පරිහරණය


http://sherlockholmesinvestigations.blogspot.com



කරලා. මං හිතන්නෙ කොහොම හරි, හමුදාවේ ප්‍රධානීන් ඔහුව අනිවාර්ය නිවාඩු යවලා. විශාල මුදලක් ආපහු හමුදාවට ගෙවන්න ඔහුට නියමවෙලා තිබුණා. තමන්ගෙ පුතා තමන්ට ඇතිකළ අපකීර්තිය ගැන සර් ඇන්ඩ්රූ හිටියෙ හරි ලැජ්ජාවකින් වගේම කෝපයකින්. ඒ මදිවට සල්ලි ඉල්ලලා පුතා දිගින් දිගටම පියාට කරදර කළා. පුතා ඈඩිල්ටන් වෙත ඇවිත් බලෙන්ම ලැගුම් ගත්තෙ පියා නැවතී හිටිය තානායමේමයි. පුතා නොනවත්වා කළ ඉල්ලීම්වලට කන්දෙන්න පියා සූදානම් වුණේ නෑ. ඊළඟට පුතා මොකද කළේ? ඔහු අප කැණීම් කළ සොහොන්බිමටත් ආවා. ඇවිත් පියාට කරදර කරමින් එතැන රැඳී හිටියා. මේක සර් ඇන්ඩ්රූට මහා කරදරයක් වුණු බව අමුතුවෙන් කියන්න උවමනා නෑ.

ඔය කාලෙදීම, සර් ඇන්ඩ්රූගෙ පුතුයා ඈන්තනි ප්‍රූවිස් හදිසියේම රෝගී වුණා. අර අපට තිබුණු වගේ සුළු සුළු රෝගාබාධ නෙමෙයි, ඔහු බරපතළ ලෙස අසනීපවුණා. මේ දවස්වෙනකොට අපි කැණීම් කටයුතු අවසන් කරලයි හිටියෙ. අසනීපයෙන් හිටි පුතුයා ඈඩිල්ටන්වලම රඳවලා, සර් ඇන්ඩ්රූ ලන්ඩනය බලා ගියා. එහෙත් ඔහු පළපුරුදු විශේෂඥ වෛද්‍යවරුන් කිහිපදෙනෙකු ඈඩිල්ටන් වෙත එව්වා. නමුත් වැඩක් වුණේ නෑ. ඒ ඉලන්දාරියා සති කිහිපයක් ඇතුළත මියගියා. ශාපය ගැන විශ්වාස කිරීම අමාරු නැහැ කියලා, මං කියූ දෙය ඔබට දැන් තේරෙනවද?"

"ඊළඟට ඔබත් ආපහු ලන්ඩනයට ආවාම තමයි පුවත්පත්වලින් අර මහා ආන්දෝලනයක් පටන්ගත්තේ. එහෙම නේද?" හෝම්ස් ඇසීය.

"ඒ ගැන ඔබ මට දෙස් එවරණ එකක් නැහැ කියලා මං හිතනවා" එඩ්ගා කීය. "දැන් නම් මට මෙහෙම දෙයකුත් හිතෙනවා. ඒ කාරණා මං එළියට දැම්මේ වැරදි කාලයකදී. කොහොමවුණත් මං සති ගණනාවක් කල්පනා කර කර ඉඳලා තමයි ඒ ලිපි පත්තරේට ලිව්වෙ. මගේ හිතේ ඇතිවුණු සිතිවිලි එවා, මට විශ්වාස කරන්න බැරිව ගියා. නමුත් මගේ හෘදසාක්ෂියට එකඟවෙලා, ඒ සියල්ල එළිකරන්න මට සිදුවුණා. ඒ දිනවලම තමා සර් ඇන්ඩ්රූගේ පුතා මියගියේ. මං බොහොම ගෞරවයෙන් සැලකූ කෙනෙකුට, මේ විදියේ ප්‍රහාරයක් එල්ලකිරීම ගැන මට කණගාටු හිතුණා. විශේෂයෙන්ම ඒ වගේ ශෝකජනක අවස්ථාවක.


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

කොහොමවුණත් මං ඉදිරිපත් කළ කරුණු කවුරුවත් ගණන් ගත්තෙ නෑ. සර් ඇන්ඩ්‍රූට කාගෙන්වත් අනුකම්පාව හිමිවුණා. මවුන් මට චෝදනා කළා, සර් ඇන්ඩ්‍රූ ඔහුගේ වෘත්තියෙන් පහකළා කියල. අන්තිමට ඒකෙන් මට වෙච්ච දෙයකුත් නෑ" එඩ්ගා කථාව අවසන් කළේය.

"මොකක් ගැනද ඔබ මේ කතාකරන්නෙ?" මම ඇසීමි. "සිදුවුණේ මොකක්ද, කවුද ඒකට සම්බන්ධවුණේ, ඒ කොහොමද, කියන ඒව එකක්වත් මට හරියට පැහැදිලි නෑ."

"ඇඩිල්ටන් මංජුසාව ඔබ දැකල තියෙනවද?" එඩ්ගා ඇසීය. "බර්නාඩ් කෞතුකාගාරයේ ඒක ප්‍රදර්ශනයට තබල තිබුණා. දිගින් අඩි තුනක් පමණ පළල අඩි එකහමාරක් පමණ ඕවාල හැඩයේ, ගන ලෝකඩවලින් තැනූ එකක්. මිනිස්සු එතැන වටවෙලා, ඡායාරූප ගන්න, කලබලකරන්න පටන්ගත්තාම ඔවුන් ඒක ඉවත්කළා."

"මං දැකල නෑ" මම කීවෙමි.

"අපි ඒක හොයාගත්තෙ සොහොන් ගැබ මධ්‍යයේ තිබිල" එඩ්ගා කීය. "සාමාන්‍යයෙන් ඔම් වගේ පෞරාණික සොහොන් ගැබක තැන්පත් කර තිබෙන දේවල් දකින්න ලැබෙන්නේ මීට වඩා වෙනස් ආකාරයකට. ගල්ලෑලිවලින් තැනූ කුටියක් තමයි මුලින්ම හමුවෙන්නේ. ඒවායේ තිබෙනවා මිනීඅළු පිරවූ මැටිභාජන, පිළිස්සුණු හෝ බිඳුණු මිනිස් අස්ථි, මරණයේදී එතැන තැන්පත් කළ, මියගිය තැනැත්තා සතුව තිබූ දේවල්..... ඒ කියන්නේ පබළු ඇට මාල, පාෂාණවලින් තැනූ ආභරණ, ලෝකඩවලින් තැනූ අවිආයුධ වගේ දේවල්.

ඇඩිල්ටන් සොහොන් ගැබේ අපට මේ දේවල් හමුවුණා. අපි ඒවා හැමදෙයක්ම ඉවත්කරගෙන යටට කැණීම් කරගෙන ගියා. සෑහෙන යටට ඔය විදියට පස් හෑරුවට පස්සෙ තමයි, මං ඔබට කියූ මංජුසාවෙ උඩපියන දකින්න ලැබුණේ. ඒක දුටුවාම අපි අප්‍රමාණ සන්තෝෂයකට පත්වුණා. හරිම අසාමාන්‍ය, ඉතාම දුර්ලභ දෙයක් අපට හමුව ඇති බව අපි තේරුම්ගත්තා. ඉතින් අපි ඉතාම පරෙස්සමෙන් පිටතින් කැණීම් පටන්ගත්තා. අර ගල්ලෑලිවලින් සාද තිබූ කුටියේ පැති ලෑලි ඉවත්කරලා, අපි යටට හෑරුවා. ක්‍රමයෙන් ඇතුළට හාරාගෙන ගිහින්, පස්තට්ටු හා ගල්පුවරු ඉවත්කළාම අපට දකින්න ලැබුණේ මොකක්ද? ඉතාම දුර්ලභ


http://sherlockholmesinvestigations.blogspot.com



ආකාරයේ විශිෂ්ට මංජුසාවක්. ලෝකඩවලින් තනා තිබූ ඒකට තිබුණේ ඕවාල හැඩයක්. එය මතුපිට රිදීපාටෙන් අලංකාර කැටයම් රාශියක් තිබුණා. ඒ වගේ දෙයක් මං ජීවිතේටම දැකල තියෙන්නේ එච්චරයි."

මදවේලාවකට නිහඬ වූ ආචාර්ය එඩ්ගාගේ දෙනෙත් සීලිම දෙසට යොමුවිය. එදා ඒ අවස්ථාවේ සිදුවූ දේවල් සිහිකිරීමට මෙන් ඔහුගේ දෙනෙත් යන්තමින් පියවුණු අයුරු අපි දුටුවෙමු. තත්පර කිහිපයකින් ඔහු යළිත් වරක් කථාව ඇරඹුවේය.

"එදා හැන්දෑවෙ එතැන හිටියේ සර් ඇන්ඩ්‍රූත් මමත් පමණයි. අසනීප කිහිපදෙනෙකුම හිටි නිසා ඔවුන් වැඩට ඇවිත් හිටියේ නැහැ. ඇවිත් හිටිය අනික් අයත් තේ බොන්න ගිහින්. වැඩක් කරන්න පටන්ගත්තාම සර් ඇන්ඩ්‍රූ ලෙඩරෝග ගැන බලන කෙනෙක් නෙමෙයි. ඔහු දිගටම වැඩකරනවා. මමත් සර් ඇන්ඩ්‍රූ එක්ක දිගටම හිටියා. ඔහුගේ වැඩ්වලට සහායවුණා. ඒ මොකද ඇඩිල්ටන් විල්ලුව බොහොම භයානක තැනක් හැටියට ප්‍රසිද්ධයි.

අපි අර මංජුසාව සොහොන් ගැබෙන් එළියට මතුකර ගනිද්දී හොඳටම හැන්දෑවෙලා, කළුවර වැටෙන්නත් පටන්අරගෙන. අපි උත්සාහ කළේ ඒක තිබුණු තැනින් ගළවා බිමනට ගන්නයි. නමුත් අපි දෙන්නාට විතරක් ඒක කරන්න පුළුවන් වුණේ නැහැ. ඒකෙ අපට දැනුණේ පුදුම බරක්. අන්තිමේදී සර් ඇන්ඩ්‍රූ මෙහෙම කිව්වා.

"දැනට අපි මේක වහල දමු එඩ්ගා. හෙට උදේ අනික් අයත් එක්ක ඇවිත් ඕක එළියට ගමු. මේක තිබෙන පිළිවෙළ අනික් අයත් දැකපුවාවෙ."

ඔහු එහෙම කිව්වාම ඒක ආවරණය කරල දන්නයි මම සූදානම්වුණේ. නමුත් ඊට කලින් අන්තැරුමක් එතැනට ළංකරගෙන මංජුසාව මුදුනේ තිබුණු කැටයම මොකක්ද කියල මම පරීක්ෂාකරල බැලුවා. එහි තිබුණු කැටයම දුටුවාම මගේ අ වෙව්ලා ගියා මහත්මයා"

"ඒ මොකක් නිසාද?"

"මරණය මහත්මයා මරණය!" පුරාවිද්‍යාඥයා කීවේ තැතිගත් ස්වරයෙනි. "ඒ අලංකාර මංජුසාව මුදුනේ තිබුණේ මරණය පිළිබිඹු කරන රූපසංඥ, ඒ වගේ දෙයක් මං මීට කලින් දැකල නැහැ මහත්මයා. ඒ කාලෙ ජීවත්වුණු මිනිස්සු හරි බුද්ධිමත්. ඔවුන්


http://sherlockholmesinvestigations.blogspot.com

පුනරුත්පත්තිය හෙවත් නැවත ඉපදීම ගැන දැනගිටියා. නැවත ඉපදීම ඔවුන් විශ්වාස කළා. ඒ නිසා මනුස්සයෙක් මියගියාම, ඔහුගේ මළසිරුර පුළුස්සලා, අළුවීක බඳුනක තැන්පත් කළා. ඒ බඳුනේ පිටත ඔවුන් සලකුණු කළේ ජීවයේ සලකුණු. ඒ කියන්නේ ඉර හඳ සහ තාරකා, ගස්, සතුන්, කුරුල්ලන්, ජලය, කරත්ත රෝදය හැඩයේ ලකුණක්. සාමාන්‍යයෙන් අපට බොහොම වෙලාවට මිනී අළු බඳුන්වල දකින්න ලැබෙන්නේ ඒ සලකුණු. නමුත් මේක එහෙම නෙමෙයි"

"මොනවද ඔබට මේකෙ දකින්න ලැබුණෙ?" හෝම්ස් ඇසීය.

"මේකෙ තිබුණේ මිනී ඔලු හා මිනී ඇට්කටුවල සලකුණු"

"මොනවද ඒකෙන් ඔබ තේරුම් ගත්තෙ?"

"ඒ වෙලාවෙ නම් මගේ හිතේ ඇතිවුණේ ලොකු කුතුහලයක්. ඒ වගේම ආශාවක්. මට හිතුණා මේකෙ ඇතුළෙ ඇත්තෙ මොකක් හරි වටිනා විශේෂ දෙයක් වෙන්න ඇති කියල. මේ තරම් මහන්සිවෙලා, ඒ මිනිස්සු මේ විදියේ ලොකු මංජුසාවක් නිර්මාණය කරන්න ඇත්තෙ මොනවා හරි වැදගත් දෙයක් තැන්පත් කරන්න වෙන්න ඇති කියල මට හිතුණා. කොහොමවුණත් අන්තිමේදී සර් ඇන්ඩ්‍රූත් මමත් ඒක වහල දමල විල්ලුවෙන් පිටවෙලා ගියා.

අපි හොඳින් දැනගිටියා එක් කාරණයක්. ඒ ෆුඩිල්ටන්වල කිසිම ගම්වාසියෙක් ඇඳිරි වැටුණට පස්සෙ සොහොන්බිමට නොඑන බව. අපේ නවාතැනට අපි ළඟාවෙද්දී හොඳටම කළුවර වැටිලා අවසන්. අනික් අය කවුරුත් වගේ නින්දට ගියා. නමුත් මට නින්ද ගියේ නෑ. මට දිගින් දිගටම මතක්වුණේ අප සොයාගත් ලෝකඩ මංජුසාව. මොකක්ද මේක ඇතුළේ තැන්පත් කරල තිබුණේ? මගේ හිත දිවගියේ ඒ පැත්තට.

පහුවද උදේ අපි නැවතත් කලින් දා කැණීම් කළ තැනට ගියා. මංජුසාව ආවරණය කිරීමට අප යොදා ගල්පුවරුව හා පස් ඉවත් කරලා අපි වටේටම පොළොව හෑරුවා. ඊළඟට පරෙස්සමෙන් ඒක ඔස්සලා ඉවතට අරගෙන එහි පියන විවෘතකළා. ඒ වහාම අපට තේරුණා එය හුගක් බරට තිබුණේ ඇයි කියල. අනෙක මට තේරුණා අපට හොරෙන් කවුරු හරි මේක විවෘතකර ඇති බව.

මේ මංජුසාව ඝනකම් ලෝකඩවලින් සාද තිබුණාට, ඊයම්වලින් සෑදූ ඇතුළත ආවරණයක් තිබුණා. මංජුසාව හුගක් බර වෙන්න හේතුවුණේ මේ ඊයම් ආවරණය බව අපි තේරුම්ගත්තා. ඔබ



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com



දන්නවා කල්යාමේදී ඊයම්වල දිරායෑමක් හෙවත් ඔක්සිකරණය වීමක් වෙන්න පුළුවන් බව. එතකොට අළු වැනි ද්‍රව්‍යයක් - මං හිතන්නේ ඒ ලෙඩ් ඔක්සයිඩ්, සෑදෙනවා. අර ඊයම්වලින් තැනූ ඇතුළත ආවරණය හුගක් තැන්වලින් මං කියූ විදියට "දිරාගොස්" තිබුණා. අප ඒක ඉවතට ගන්න උත්සාහ කරද්දී එය කැබලිවලට කැඩිලා මංජුසාව ඇතුළටම වැටුණා. අනෙක් අය මේ දිහා පුදුමයෙන් බලා ඉඳිද්දී මං එක් කාරණයක් නිරීක්ෂණය කළා. ඒ තමයි මේ දූවිලි වැනි සියුම් ඊයම් අළු තට්ටුවට මිනිස් අතකින් බාධා පැමිණි ඇති බව. වෙනත් වචනවලින් කියනවනම් කවුරුහරි ඒක ඇතුළට අත්දෙක දමා, යමක් ඉවත්කරගෙන තියෙනවා. ඒ බව මං පැහැදිලිවම දුටුවා. ඇඟිලි තිහිපයක ලකුණු දෙපසෙන් ඒ මත සටහන් වී තිබුණා.

එහෙම දෙයක් සිදුවුණේ කොහොමද? ඒකට හේතුවක් මට හිතාගන්න බැරිවුණා. මං හිතාගෙන හිටියේ බොහොම කාලෙකට පස්සේ ඒක මුලින්ම හොයාගත්තෙ අපියි කියල. නමුත් ඇත්ත ඒකද? මං බැලුවා මංජුසාව ඇතුළත"

"මොනවද තිබුණෙ?" මම ඇසීමි.

"ඔබ බර්නාඩ් කෞතුකාගාරයේදී ඒවා දකින්න ඇති සමහරවිට. පුරාවිද්‍යාඥයා කීය. "ඉතා අලංකාර ලෝකඩ කැටපත් ජෝඩුවක්, බෝට්ච්චි, පබළු, ලෝකඩ රැඳවනයකට සවිකළ අලංකාර ලෙස කැපූ පළිඟු කැටයක්, ලෝහමය කුඩා ආයුධ, අස්ථි කැබලි හා අළු තැන්පත් කළ මුට්ටි දෙකක්. මගේ මිත්‍රයන් හිතුවේ මේක ඉතාම සතුටුදායක විදියේ සොයාගැනීමක් කියලයි. නමුත් ඔවුන් හිතුවා වැරදියි."

"ඇයි ඔබ එහෙම කියන්නේ?" හෝම්ස් ඇසුවේය.

"ඒ මොකද මීට පෙර අප කළ කැණීම්වලදී අපට හම්බනොවුණු දෙයක් මෙතැන තිබුණෙ නෑ. නමුත් මංජුසාවෙ පිටත සලකුණු කළ අර හිස්කබල් හා මිනී ඇටවලින් කියුවේ වෙනත් භයානක දෙයක්. එහෙම අනතුරු ඇඟවෙන විදියේ දෙයක් මේ මංජුසාවෙ ඇතුළෙ තිබිල අපට හමුවුණේ නෑ. අන්න ඒකෙන් මං දැනගත්තා කවුරුහරි මේ මංජුසාවෙන් යමක් හොරකම් කරගෙන ඇති බව." කී එඩ්ගා මහතා දිග සුසුමක් හෙළුවේය.



http://sherlockholmesinvestigations.blogspot.com

"මෙ විධියේ පෞරාණික දෙයක් කලින් ද හැන්දෑවෙ හොයාගත් බව, දැනගෙන හිටියේ සර් ඇන්ඩ්රූ සහ මං විතරයි. නමුත් රාත්‍රියේදී කවුරු හරි ඒක විවෘතකරලා, ඊයම් ස්ථරය බිඳලා, මොකක් හරි දෙයක් ඉවත් කරගෙන. ඒක පැහැදිලියි. ඒක කරන්න ඇත්තේ වෙන කවුරුද, සර් ඇන්ඩ්රූ මිස?"

කථාව අවසන් කළ බවක් පෙන්නූ පුරාවිද්‍යාඥයා එතැනින් පිටවී යාමට සූදානමෙන් තම ලී පෙට්ටිය අතට ගත්තේය. එහෙත් ඔහු යළිත් වරක් කථාව පටන්ගත්තේය.

"හෝම්ස් මහත්තයා. මං ඔබට කලින් කිව්වා වගේ අපි ඇඩිල්ටන්වලින් පිටවෙලා ආවා. තමන්ගේ පුත්‍රයාගේ අසනීපය ගැන සර් ඇන්ඩ්රූ හදින්ම කම්පාවට පත්වෙලයි හිටියේ. විශේෂයෙන්ම දැඩිව ගිලන්වීම නිසා තම පුත්‍රයා ඇඩිල්ටන්හි රඳවා ඒමට සිදුවීම ගැන. සර් ඇන්ඩ්රූ විතරක් නෙමෙයි මමත් හිටියෙ හරි කම්පාවකට පත්වෙලා. ඇයි අපි ඉතා අමාරුවෙන් කැණීම් කර සොයාගත් දුර්ලභ වස්තුවක වටිනා යමක්, හොරෙකු විසින් පැහැර ගැනීම ගැන. ඒ හොරා, මගේ ප්‍රධානියා, මගේ හිතවතා මෙන්ම මෙතෙක් කල් මගේ ගෞරවයට ලක්වුණු කෙනෙත්තා. ඉතින් මගේ හිතේ ඇතිවුණු කම්පාව මොන වගේද කියල ඔබට හිතාගන්න පුළුවන් නේද? ඉතිරිහරිය හැමදෙයක්ම ඔබ දන්නවා"

"මට අහන්න තියෙන්නේ තවත් එක ප්‍රශ්නයයි" හෝම්ස් කීය. "ඇඩිල්ටන්වල නානායම්වලින් සර් ඇන්ඩ්රූ නැවතී හිටියෙ කොයි එකේද?"

"ගෝට් ඇන්ඩ් බූට්ස් කියන නානායමේ" කියා මොහොතක් පුදුමයෙන් මෙන් අප දෙස බලාසිටි පුරාවිද්‍යාඥයා එතැනින් නික්ම ගියේය.

පසුවද උදයේ හෝම්ස් මා කැඳවාගෙන ගියේ සර් ඇන්ඩ්රූගේ නිවස වෙතය. අප පුවත්පත් වාර්තාකරුවන් යයි සිතූ ගෘහසේවකයා සූදානම් වූයේ අප නිවසෙන් එළවා දැමීමටය. එහෙත් මගේ මිත්‍රයා තම ආගන්තුක පත්‍රය ඉදිරිපත්කොට, සර් ඇන්ඩ්රූ ලූවිස්ගේ දියණිය හමුවීමට අවශ්‍ය බැව් පැවසුවේය.

කළු පැහැති ඇඳුමකින් සැරසී සිටි තරුණ කාන්තාවක් අප හමුවට පැමිණියාය. ඒ සර් ඇන්ඩ්රූගේ දියණියයි. සින්තියා ලූවිස් ආර්යාව නමින් හැඳින්වුණු ඇය, අප සමග කතාබහ කිරීමට කැමැත්ත පළකළාය.


http://sherlockholmesinvestigations.blogspot.com



"හෝම්ස් මහත්මයා. දෙස්තර වොට්සන්" ඇය කීවාය. "මගේ පියා ජීවත්ව හිටියදී ඔබ දෙන්නාව දකින්න ලැබුණා නම් කොයිතරමක් සන්තෝෂ වෙයිද? හෝම්ස් මහත්තයාගේ පරීක්ෂණ ගැන දෙස්තර මහත්තයා ලියන කථා, මගේ තාත්තා කියෙව්වේ හරිම ආශාවෙන්. ඔබ තර්කානුකූලව හැමදෙයක්ම විසඳන හැටි මගේ පියා හරියට අගය කළා"

"ඔබ කියන ඔය කරුණාවන්ත වදන්වලට, මං කෘතඥවෙනවා සින්තියා ආර්යාවෙනි" හෝම්ස් කීය. "මං ආවෙ ඔබේ ඒ පියා ගැන තොරතුරු ටිකක් දැනගන්න."

"මගේ පියා ගැන?" ඇය ඇසුවාය. "මොනවා? ඔහුගේ මරණය සිදුවූ ආකාරය ගැන ඔබේ හිතේ සැකයක් තියෙනවාද? ශ්‍රීමත් විලියම් ග්‍රීඩන් නම් කියා තිබුණේ වෙනත් දෙයක්. ඔහු කියනවා මගේ පියා මියගියේ ඊජිප්තුවේ පෞරාණික ස්ථාන කැණීමේදී, ඔහුගේ සිරුරට ඇතුළුවුණු විෂබීජයක් නිසා කියල. ග්‍රීඩන් කියන්නේ මගේ සොහොයුරාගේ මරණයට හේතුවත් එයයි කියල"

"සින්තියා ආර්යාවෙනි" හෝම්ස් කීය. "මං මේකට සම්බන්ධවුණු නිසාම, මෙතැන අපරාධයක් සිදුවෙලා කියල හිතන්න එපා. පුවත්පත්වල පළවුණේ සර් ඇන්ඩ්රූගේ මරණය සිදුවුණේ ඇඩිල්ටන් ශාපය නිසා කියල....."

"..... බොරු බහුබූත කථා" ඇය හෝම්ස්ට බාධා කළාය. "ඇන්තනී - මගේ සොහොයුරා මියගිය වෙලාවෙත් මිනිස්සු ඔය විදියේ පිස්සුකතා කිව්වා"

හෝම්ස් හිස සෙලෙව්වේ ඇය කියූ දෙය අනුමත කරන අයුරෙනි. "කොහොම වුණත්" හෝම්ස් කීය. "සර් ඇන්ඩ්රූ ඔය සොහොන විවෘත කළාට පස්සේ ඇඩිල්ටන්වල ඉතාම පුදුමාකාර රෝගයක් පැතිරී ගිය බව ඇත්තයි. ඒ ගැන මට විශ්වාස කටයුතු මාර්ගයකින් දැනගන්න ලැබුණා."

"මොනවා හෝම්ස් මහත්තයා?" ඇය ඇසුවාය. "ඔබත් විශ්වාස කරනවද ඔය මෝඩ මිනිස්සු "ශාපය" කියල හඳුන්වන බහුබූත?"

"නැහැ ආර්යාවෙනි. මං එහෙම දෙයක් එක මොහොතකටවත් විශ්වාස කරන්නෙ නෑ. නමුත් මං මෙහෙම දෙයක් නිරීක්ෂණය කරල තියෙනවා. සමහරු ඔය අද්භූත සිදුවීම් ලෙස විශ්වාස කරන දේවල් තියෙනවා. තවත් අය මිථ්‍යා විශ්වාස ලෙස හඳුන්වන ඒවා


http://sherlockholmesinvestigations.blogspot.com

තියෙනවා. තවත් සමහරු අහම්බෙන් එක්විටම සිදුවන ඒවා යනුවෙන් හඳුන්වන ඒවා තියෙනවා. මේ හැම එකකටම බොහෝවිට තියෙන්නේ එකම ප්‍රභවයක්. එකම ආරම්භයක්. මට හිතෙනවා මෙතැන තියෙන්නෙත් ඒ වගේ දෙයක් වෙන්න පුළුවනි කියලා."

"ඔබේ ඔය පරීක්ෂණවලින්....." ආර්යාව කීවාය. "මගේ පියාගේ හා මගේ සොයුරාගෙ වගේ තවත් මරණ සිදුවෙන එක වළක්වන්න පුළුවන් නම්, මං කැමතියි ඕනෑ උදව් වෙන්න. ඔබට මගෙන් උවමනා කරන්නේ මොන වගේ උදව්වක්ද, මහත්මයා?"

"සින්තියා ආර්යාවෙනි. සර් ඇන්ඩෲ ඔහුගේ අන්තිම දිනවල කල්පනා කරමින් සිටියේ මොනවා ගැනද, පැවසුවේ මොනවාද කියල මම දැනගන්න කැමතියි"

ඇගේ මුහුණෙන් දිස්වූයේ අතිශය කණගාටුවට පත් බැල්මකි. "මුලින්ම ඔහු අසනීපවුණු වෙලාවේ ඔහුට උවමනාවුණා ඇඩ්ල්ටන් ගැන ඔහුගේ වාර්තාව ලියලා ඉවරයක් කරන්න. ඒක මීට කලින් ප්‍රකාශයට පත්කරන්න, මගේ පියාට ඉඩක් ලැබුණෙ නැහැ..... ඔබ දන්නවානෙ එඩ්ගා සමඟ තිබුණු අරවුල. අන්න ඒක නිසා, ඒක කවදාවත් ලියල ඉවරයක් කරගන්න බැරිවුණා.

ඊළඟට අයියාගේ මරණය ගැනත්, මගේ පියා දෙස් පවරාගත්තේ තමන්ටමයි. මගේ පියා අසනීපවෙලා සැහෙන්න දුර්වල වෙලා ඉඳිද්දිත් ඔහුට උවමනා වුණා ඇඩ්ල්ටන් වෙත යන්න. මගේ පියාණන් කිව්වේ අයියා මිහිදන් කළ තැනට ගිහින් ඔහුගෙන් සමාව ඉල්ලා සිටිය යුතුයි කියල. යන්න ඕනෙ කිව්වට මං ඒකට කැමැතිවුණේ නෑ. නමුත් යන්න ඕනෙම නං මාවත් එක්ක යන්න කියලා මං පියාණන්ගෙන් ඉල්ලා හිටියා. ඔහු ඒකට කැමැතිවුණේ නැහැ. ඔහුට උවමනාවුණේ තනියම යන්න. අන්තිමට ඔහු ඒ දේ කළා!"

ඇය ගිනි උදුනට ඉහළින් බිත්තියේ එල්ලා තිබූ තම පියාගේ ඡායාරූපය දෙස මඳවේලාවක් බලා සිටියාය.

"ඊට පස්සේ පියාණන්ගේ සෞඛ්‍ය තත්ත්වය බොහොම ඉක්මනින් පිරිහෙන්න පටන්ගත්තා" ඇය කීවාය. "ඇඳටම වෙලා නොහිටි වෙලාවලට ඔහු තමන්ගේ කන්තෝරු කාමරයට වෙලා ලිව්වා. නොනවත්වාම ලියන එක තමයි කළේ."



http://sherlockholmesinvestigations.blogspot.com



"ඔහු ලියූ ඒ දේවල් දැනට ඔබ ළඟ තියෙනවාද?" හෝම්ස් ඇසීය.

"නැහැ මහත්මයා" ඇය කීවාය. "ඔහුගේ මරණයෙන් පස්සේ මං ඒ සමහරක් කියවලා බැලුවා. ඒවා කිසිම තේරුමක් නැති, වැඩකට නැති බනුබුන වගෙයි මට තේරුණේ. ඉතිං මං ඒවා පුළුස්සලා විනාශකරල දැම්මා"

"අපට පුළුවන්ද ඔහුගේ පර්යේෂණාගාරය බලන්න?"

"ආ ඔව්, පුළුවනි" කී ඇය අසුනෙන් නැගී සිටියාය. කාමරයෙන් පිටවූ ඇය පසුපස අපි ගමන් කළෙමු.

ඇය ළඟාවූයේ නිවස පිටුපස තිබූ එක් විශාල කාමරයක් වෙතය. එයට ආලෝකය ලැබුණේ, අලංකාර උද්‍යානයකට මුහුණදමා තිබූ උස් ජනේල තුනකිනි. කාමරයේ බිත්ති වැසියන තරමට පොත්පත් ඇසිරූ රාක්ක රැසක් විය. කාමරය මධ්‍යයේ තිබුණේ ලොකු දිග මේසයකි. පර්යේෂණ කටයුතු සඳහා යොදාගත්තේ එය බව අපි තේරුම් ගත්තෙමු. එහි තැන් තැන්වල නොයෙකුත් උපකරණ, ආයුධ හා පුරාවිද්‍යාත්මක සුන්බුන් දක්නට ලැබිණ. කාමරයේ එක් කෙළවරක කුඩා ලියන මේසයක් විය.

"මගේ පියා ඔහුගේ පර්යේෂණ කටයුතු හැමදෙයක්ම කළේ මෙතැන" ආර්යාව කීවාය. "හෝම්ස් මහත්මයා ඔබට කැමැති තරමක් පරීක්ෂා කර බලන්න. මගෙන් ප්‍රශ්නයක් නෑ. ඒව අවසන්වුණාම විසිත්ත කාමරයට එන්න. මං තේ සූදානම් කරන්නම්" පවසා ඇය කාමරයෙන් පිටවී ගියාය.

"මං හිතන්නේ අපි මුලින්ම බලන්න ඕන ඔහු විමර්ශණය කළ පොත් මොනවාද කියල" හෝම්ස් කීවේ වටපිට බලමිනි.

"කොහොමද ඒක කරන්නෙ?"

"පොත්රාක්ක පරීක්ෂා කරල බලන්න වොට්සන්. ඔහු පුරාවිද්‍යාඥයෙක්. ඒ ක්ෂෙත්‍රයට සම්බන්ධ නැති අසාමාන්‍ය විදියේ පොත් මොනවා හරි තියෙනවාද බලන්න"

"ඒක නම් මට ඉතාම අමාරු කටයුත්තක් හෝම්ස්" මම කීවෙමි. "විශිෂ්ට ගණයේ පුරාවිද්‍යාඥයෙක් සාමාන්‍යයෙන් කියවන්නේ මොන පොත්ද කියල මට හිතාගන්න අමාරුයි. ඉතින් මං කොහොමද අසාමාන්‍ය ඒවා තෝරන්නේ?"

මා කියූ දෙය නොතකා හෝම්ස් දිගු මේසය අසල ඉහළ පහළ ඇවිදීමට පටන්ගත්තේ කල්පනා කරමිනි. මම පොත් රාක්ක



http://sherlockholmesinvestigations.blogspot.com

පරීක්ෂා කර බැලීමි. පුරාවිද්‍යාව පිළිබඳව ලියැවුණු සඟරා විශාල ගණනක් එහි විය. සමහරක් ඒවා තිබුණේ විදේශ භාෂාවලිනි. ඉතිහාසය, පුරාවෘත්ත, ජනකථා ආදි දේ ගැන ලියැවුණු පොත්පත් ද දක්නට ලැබිණ. එහෙත් ඔහුගේ වෘත්තියට පරිබාහිර වූ "අසාමාන්‍ය" යයි කිවහැකි කෞතුයක පොතක් මම නුදුටුවෙමි.

"පුරාවිද්‍යාවට අදල දේවල් මිසක් ඔහු වෙන යමක් කියවන්න අරගෙන නැහැ" මම කීවෙමි. "මට නම් තේරෙන්නෙ එහෙමයි"

"හොඳයි එහෙම නම් අපට ඉතුරුවෙලා තියෙන්නේ ඔහුගේ මේස මත තිබෙන දේවල් හොයා බලන එක විතරයි"

ලියනමේසය මතින් සොයාගැනීමට හැකිවූ දෙයක් නැතිතරම්ය. ලියුම් හා කෙටි සටහන් රැඳවීමට කුඩා කුටි වෙන්කර තිබූ රාක්කය, සම්පූර්ණයෙන්ම හිස්ව තිබූ අයුරු අපි දුටුවෙමු. මේසය මත තිබූ කරුණු සටහන් කරගන්නා පොත් දෙකකම මුලපිටු ඉරා ඉවත්කර තිබිණ.

"මෙතැන මොකුක්වත්ම ඉතුරුවෙලා නැහැනෙ හෝම්ස්" මම කීවෙමි.

"මොකක්වත් හොයාගන්න හැකිවේවිද කියන්න බැහැ" කී හෝම්ස් සාක්කුවෙන් කාචය ගෙන සටහන් පොත්වල මුලින්ම තිබූ හිස් පිටු පරීක්ෂා කිරීමට පටන්ගත්තේය. මඳවේලාවක් ඒ සඳහා ගතකළ ඔහු කලබල වූ අයුරක් පෙනිණ.

"වොට්සන්. ඔබ ළඟ සිගරට්ටුවක් හෙම තියෙනවද?" ඔහු එක්වරම විමසුවේය.

මම මගේ සිගරට් අසුරණය සාක්කුවෙන් ගෙන එය විවෘත කළෙමි.

"ඔබ හිතාගෙන හිටි තරම් සාර්ථක ලෙස අශ්වයින් වැඩකරල නැහැ වගෙයි නේද?" හෝම්ස් ඇසුවේ මඳ සිනාවක් ද ඇතිවය.

"මොකක්?"

"නැහැ. මං කිව්වේ අශ්වරේස්වලට ඔබ දාපු ඔට්ටු වැඩකරල නැහැ වගෙයි?" හෝම්ස් කීය. "ඒව දිනල තිබුණ නම් මේ වගේ බාල සිගරට් ඔබ බොන්න ගන්නෙ නැහැනේ. කමක් නැහැ. මේ වෙලාවෙ මේක ඕනවටත් වඩා ඇති."

සර් ඇන්ඩ්රූගේ සටහන් පොත් දෙක මේසය මත තැබූ ඔහු සිගරට්ටුව දල්වා ගත්තේය. මිළහට එය තදින් උරමින් සිගරට් අළු පරෙස්සමින් කඩදාසිය මතට දමා, ඇඟිල්ලෙන් ඒවා පිරිමැදීමට පටන්ගත්තේය. මඳවේලාවකින් ඔහුගේ දෙනෙත් දීප්තිමත් වූ බව මම දුටුවෙමි.

"මේ බලන්න" ඔහු කීවේ එක් සටහන්පොතක මතුපිට කඩදාසිය පෙන්වමිනි. "අළු ගෑවාම කඩදාසිය අඳුරුපාට වුණා. කලින් පිටුවේ පැන්සලෙන් ලියද්දී, ඒ පැන්සල් පාර මේ පිටුවටත් වැදිලා. ඔබට පෙනෙනවා නේද, ඒ හරිය සුදුපාටට ඉතිරි වෙලා තියෙන හැටි? බලමු මොනවද ලියල තියෙන්නේ කියල"

හෝම්ස් කඩදාසිය ආලෝකය දෙසට ඇල්ලීය. "අපට තේරුම් ගන්න අමාරු වචන වගයක් ලියල තියෙනවා වොට්සන්..... ..... අසරණ ඇන්තනිගේ මරණය.....

දැන් අපි බලමු දෙවැනි කඩදාසිය." එයට ද පෙර පරිදිම සිගරට් අළු පිරිමැද මගේ මිත්‍රයා යළිත් කඩදාසිය ආලෝකය දෙසට හරවා පරීක්ෂා කළේය.

"ඊයමද ? ඊයමද? ඊයමද?"

"මෙතෙක ලියල තියෙන්නේ, එච්චරයි වගේ. හැමතැනකදීම ප්‍රශ්නාර්ථ ලකුණක් යොදලා."

කඩදාසි දෙකම ගුලිකොට කබා සාක්කුවට දමා ගත් හෝම්ස් කීවේ "මං හිතන්නේ අපට සින්තියා ආර්යාවගෙන් සමුගැනීමට වෙලාව හරි"

ඇය සමඟ අපි තේ පානය කළෙමු. "ඔබේ ආදරණීය පියාණන්ගේ මරණය ඔබට ඒ තරම් අබිරහසක් නොවෙන්න පුළුවනි" හෝම්ස් කීය. "නමුත් ඒකට අදළ කරුණු හෙළිකරගන්න මං බලාපොරොත්තු වෙනවා. මගේ පරීක්ෂණය අවසන්වුණාට පස්සෙ ඒ ගැන මං ඔබට දන්වන්නම්."

කෙසේ වෙතත් මගේ මිත්‍රයා පැවසූ දේ මෙන්ම ක්‍රියාකළ ආකාරය මට නම් තේරුම් ගැනීමට නොහැකි විය. ඒවා මගේ සිතේ ඇතිකළේ පටළැවිල්ලකි. කුලීරිතයෙන් ආපසු යමින් සිටියදී මම ඒ බව හෝම්ස්ට පැවසුවෙමි.

"වොට්සන්! වොට්සන්!" ඔහු කීවේ හිස දෙපසට සලමිනි. "මේ පුංචි ගැටලුව වෙත මගේ අවධානය යොමුකළේ ඔබයි. එතැන ඉඳන් මම කළේ, මට ලැබුණු හෝඩුවාවන් තර්කානුකූලව විග්‍රහකරමින් ඉදිරියට යෑම පමණයි. මේ අතරෙදී මට ලැබුණ දත්ත


http://sherlockholmesinvestigations.blogspot.com


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

ඉතා ස්වල්පයක්. මං විශ්වාස කරනවා මට හැකිවේවි ඒවා ආධාරයෙන් ගැටලුව සාර්ථක ලෙස විසඳා නිමකරන්න. මං මේ ගැටලු විසඳන්න යොදාගන්න ක්‍රම ගැන ඔබට හොඳ වැටහීමක් තියෙනවා නෙ වොට්සන්. මං හිතන්නෙ මේ වෙනකොට ඔබට යමක් හිතාගන්න පුළුවන් වෙලා ඇති?"

"එවැනි කිසිවක් මට නම් හිතාගන්න අමාරුයි"

"එහෙම නම් මං කියන මේ කරුණු ගැන ඔබේ හිත යොමුකරන්න. අපි ඒවා එකින් එක අරගෙන බලමු" මගේ මිත්‍රයා කිවේ දකුණු අතේ ඇඟිලි දිගහැර ඒවා එකින් එක නැමීමට සූදානමෙනි. "මුලින්ම ඇඩ්ල්ටන්වල මිනිසුන්ගේ තියෙනවා විශ්වාසයක්. ඔවුන් හොඳින් දන්නවා ඔවුන්ගේ පෞරාණික සොහොන්බිම ගැන. ඒකෙ තියෙනවා ශාපලත් මිනීවළ නමින් ඔවුන් හඳුන්වන තැනක්. එතැනට හිමවැටිලා හිමෙන් වැසීගියාට, ඒව ඉක්මනින්ම දියවී ඉවත්වෙනවා. තණකොළ හෝ කිසිම පැළෑටියක් එතැන පස්මත වැඩෙන්නේ නෑ. හරිද?

දෙවැනි කාරණය මේකයි. පළාතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා මට සහතික කරල කිව්වා එක කරුණක්. සර් ඇන්ඩරූ ඒ මිනීවළේ කැණීම් කළාට පස්සෙ, ඇඩල්ටන් ගම්වාසීන් අද්භූත රෝගයකට ගොදුරුවෙන්න පටන්ගත් බව.

අංක තුනː එඩ්ගා නම් පුරාවිද්‍යාඥයාට හොඳටම විශ්වාසයි, මිනීවළේ තිබී ගොඩට ගත් මංජුසාවෙන් කවුරු හරි යමක් රහසිගතව, හොරකම් කරගත් බව. මේ කරුණුවලින් ඔබට නිගමනයකට එන්න අමාරුද?"

එසේ නිගමනයකට එම අපහසු බැව් මම හෝම්ස්ට කීවෙමි. එවිට ඔහු උරහිස් හකුළමින් යටිතොල ඉදිරියට දිගු කළේය. ඒ මට නිගමනයකට එම අපහසුවීම ගැන තමා පුදුමයට පත්වන බව හැඟවීමකි. එහෙත් මේ කරුණු තවදුරටත් විග්‍රහකිරීමට ඔහු උත්සාහයක් දැරුවේ නැත.

"මොකක්ද ඔබ ඊළඟට කරන්න බලාපොරොත්තුවෙන්නෙ?" මම ඇසීමි. එයින් ගැටලුව පැහැදිලි කරගත හැකි ඉඟියක් ලැබෙතැයි මම සිතුවෙමි.

"මං හිතුවා වොට්සන් ඔබ ඒක අනුමාන කරන්න ඇති කියලා" හෝම්ස් කීය. "අපි යන්න ඕන ඇඩ්ල්ටන්වලට. සිද්ධියට අදාළ තැන



http://sherlockholmesinvestigations.blogspot.com



පරීක්ෂා කරල බලන්න ඕන. කථාවට කියන්නේ "අපරාධය සිදුවුණු භූමිය" කියල නේ."

"ඒ වුණාට හෝම්ස් ඔබ විශ්වාස කළා නේද, මෙතැන අපරාධයක් සිදුවෙලා නැහැ කියලා?"

"මං මේක පටන්ගනිද්දී නම් මට පෙනුණේ මේක අපරාධයක් සිදුවී නොමැති වෛද්‍යමය ගැටලුවක් කියලයි" හෝම්ස් කීය. "දැන් නම් පෙනෙන්නේ අප යන මග අවහිර කරමින් අපරාධයක් වැටී ඇති ආකාරයක්. මෙතැන නිසැකවම අපරාධයක් සිදුවෙලා තියෙනවා වොට්සන්. සුළුපටු එකක් නෙමෙයි. දීර්ඝ කාලීන ප්‍රතිඵල ඇතිවිය හැකි අපරාධයක්!"

පසුවදා සවස අපි ඇඩ්ල්ටන් වෙත ළඟාවීමු. ගල්වලින් තැනූ නිවාස සහිත මේ ගම්මානය, එක් දිගු වීදියකට සීමාවී තිබිණ. නිවාස තිබුණේ මේ වීදිය දෙපසිනි. ගම පටන්ගන්නා තැන හා අවසන් වන තැන තානායම බැගින් තිබිණි. මේ සියල්ලම පිහිටා තිබුණේ උස් කඳුගැටයක් ද සහිත ඉතා විශාල ඇඩ්ල්ටන් විල්ලුව මධ්‍යයේය. අපි "ගෝට් ඇන්ඩ් බූට්ස්" තානායම වෙත ගොස් ලැගුම් ගත්තෙමු.

මුලින්ම මේ ගමේ සිටි එකම වෛද්‍යවරයා හමුවීමට යාමට හෝම්ස් තීරණය කළේය. වයස අවුරුදු හතළිහක් පමණ වූ අයිරිෂ් ජාතික වෛද්‍ය ලියරි තම ශල්‍යාගාරයේදී අප සාදරයෙන් පිළිගත්තේය.

"විශේෂඥ අපරාධ පරීක්ෂකයෙක් මොකටද ලන්ඩන් නගරයේ ඉඳල මෙහෙ ආවෙ?" වෛද්‍යවරයා ඇසුවේ අප කවුරුන්දැයි හෝම්ස් කළ හැඳින්වීමකට පිළිතුරු වශයෙනි.

"මෙහේ මිනීමැරුම් මංකොල්ලකෑම් ගැන අහන්නවත් ලැබෙන්නෙ නෑ. ඉඳහිට, ඒ කියන්නේ ඔය පතල්වල පඩි දවස්වලට පතල් කම්කරුවෝ මත්පැන් බීල කෝලාහල කරගන්නවා. ඒ ඇරෙන්න මේ ගමේ....."

"ඒ වුණාට ලියරි මහත්මයා, මේ ගමේ තියෙනවා නේද නොවිසඳුණු අද්භූත සිදුවීමක්?" හෝම්ස් ඇසීය.

"අද්භූත සිදුවීමක්?" වෛද්‍යවරයා ඇසුවේ නළල රැලිකරමිනි. "ඔබ බුද්ධිමත් තර්කානුකූලව හිතන කෙනෙක්. මං හිතන්නේ ඔය කියන්නේ ශාපලත් මිනීවළේ කතාව වෙන්න බැ?"



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

"ශාපයක් ගැන නම් මමත් විශ්වාස කරන්නෙ නෑ මහත්මයා" හෝම්ස් කීය. "නමුත් ඇඩ්ල්ටන් ශාපය නිසා නොයෙක් දේවල් සිද්ධවුණා කියල පුවත්පත්වල පළවුණා. ඔවුන් කීවෙ ඒක ඇත්තක් කියල. ඒවා ගැන යළිත් මතක් කරනවා නම්; මුලින්ම ඇන්තනි ලුවිස්ගෙ අකල් මරණය. ඊළඟට මේ ප්‍රදේශයෙන් දුටු අසාමාන්‍ය මළදරු උපත් හා ආබාධිත දරු උපත් සංඛ්‍යාව. ඊළඟට ගම්වාසීන්ගෙ ආයු කාලය අඩුවීම හා ලෙඩරෝග ඉහළ යාම. ඊට අමතරව පනුගියද සර් ඇන්ඩෲ ලුවිස් හඳුනා නොගත් රෝගයකින් මරණයට පත්වීම, මේ හැමදේයක්ම, එකට බැඳුණු එකම අවුල්ජාලයක කොටස් නෙමෙයි කියලද ඔබ කියන්නෙ?"

"මේක අද්භූත සිදුවීමක්, ශාපයක් කියන මතයට ඔබ වගේම මමත් එකඟ නෑ." වෛද්‍ය ලියරි කීය. "ඒ වුණත් ඔබ කිව් කරුණුවල යම්කිසි සම්බන්ධයක් තියෙන බව නම් පැහැදිලියි." තම කබා සාක්කුවට අත දමා පයිප්පය අතට ගත් වෛද්‍යවරයා එය දල්වා ගත්තේය. ඔහුගේ කුටාගේ ඉතිරිහරිය කියැවුණේ පයිප්පය බොන අතරතුරය.

"ඔබ දන්නවද හෝම්ස් මහත්තයා, මං මගෙ වෛද්‍ය වෘත්තිය පටන්ගත්තු පිළිවෙළ? වෛද්‍ය විද්‍යාලයෙන් පිටවෙලා තරුණයෙකු ලෙස මං මුලින්ම ආවෙ මේ පළාතට. මේ ගම්මානයට මගෙ හිත තදින්ම ඇදීගියා. ඉතාම සුන්දර ගම්මානයක්. සනීපවත් දේශගුණය. පිරිසිදු වතුර. යහපත් කරුණාවන්ත මිනිස්සු. ඒ හැමදෙයක්ම මේ ඇඩ්ල්ටන් ගමේ තිබුණා. මගේ මොළය අවුල්වෙන විදියේ ඉතා සංකීර්ණ සෞඛ්‍ය ප්‍රශ්න මෙහේ තිබුණෙ නෑ. මේ පළාතේ වැසියන්ට බරපතළ ලෙඩරෝග කිසිවක් තිබුණෙ නැහැ. ගල්අඟුරු පතල්වල වැඩකළ අයට, ඊකියාවෙදි සිදුවුණු, හදිසි අනතුරු ඉඳහිට තිබුණා. වයසට ගියාම හැදෙන හන්දිපත් රුදාව ආදී සුළු ප්‍රශ්න තිබුණා. ඒව තමයි මෙහේ තිබුණු ලෙඩරෝග. ඒ මගේ මුල් කාලයේදී. ඊට පස්සෙයි තමයි ඔය ශාපලත් සොහොන කියන එක විවෘත කළේ. ඊට පස්සෙ මෙහේ ඇතිවුණු වෙනස්කම් ශාපයක් කියල හැඳින්නුවත් වැරැද්දක් නැහැ. කවුරුවත් එහෙම හැඳින්වීමෙ පුදුමයකුත් නෑ."

"සොහොන්බිමේ කැණීම් කළ අයට ඇතිවුණු රෝගාබාධ ගැන ඔබට මොනවද කියන්න පුළුවන්?" හෝම්ස් විමසුවේය.


http://sherlockholmesinvestigations.blogspot.com



"මං පිළිගන්නවා. මේක අසවල් රෝගය කියල නම්කරන්න පිළිවන් විශේෂ රෝගයක් මට හඳුනාගන්න බැරිවුණා." වෛද්‍ය ලියරි කීය. "නමුත් ඒ රෝගලක්ෂණ ඒ තරම් බරපතළ ඒවා නෙමෙයි. මේ කැණීමේ කටයුත්තට ඇඩ්ල්ටන් වෙත පැමිණි අය තරුණයන්. ඔවුන් බොහොම දෙනෙක් පුරාවිද්‍යාව හදාරන්න, විශ්වවිද්‍යාලයේ පොතේපතේ වැඩ කළ අය. ඒ මිසක් කාෂ්ටක ගිනිඅව්වේ, එළිමහනේ පොළොව හාරන කම්කරුවන්ගේ වැඩ හුරුපුරුදු අය නෙමෙයි. මට නම් හිතුණේ මේ රෝග ලක්ෂණවලට හේතුව වුණේ දැඩි හිරුරශ්මියට දිගටම නිරාවරණයවීම කියලයි"

"එතකොට ලුවිස් තරුණයා?"

"ඒක සම්පූර්ණයෙන්ම වෙනස් කතාවක්. ඒ කාලෙ මං ඔය පුරාවිද්‍යාඥයන් එක්ක සම්බන්ධයක් තිබුණෙ නෑ. ඇන්තනි ලුවිස් මා ළඟට ආවෙ ඔහුගේ පිළිස්සුණු ඇත්වලට ප්‍රතිකාර ගන්න. මං හිතුවේ ඔහු බොහොම ගිනියම් ලෙස රත්වී තිබුණු දෙයක් අත්දෙකෙන්ම අල්ලා ඇතිබවයි. නමුත් ඔහු මට කිව්වා තමන් එහෙම දෙයක් නොකළ බව. නමුත් දෙඅත්ලේ තැන් තැන් තද රතුපැහැයට හැරී, පසුව විශාල දියබුබුළු හැදී පුපුරාගොස්, වණ තුවාල බවට පත්වුණා. හරියට ගින්නෙන් පිළිස්සුණාම දකින්න ලැබෙන ආකාරයේ දියබුබුළු විධියමයි. මං ඔහුට ආලේපන කිහිපයකින් ප්‍රතිකාර කළා. පසුව මට හිතුණෙ එය මේ රටේ දක්නට නොලැබෙන, විදේශ රටකදී බෝවුණු නමේ රෝගයක් විය යුතුයි කියලයි. තමන් කුඩා කාලයේදී තම පියා සමඟ විදේශයක ජීවත්වී ඇති බව ඔහු මට කිව්වා."

"ඊට පස්සෙ?"

"ඊටපස්සෙ තත්ත්වය තවත් නරක අතට හැරුණා." වෛද්‍යවරයා කීය. "ඔහු නිතර නිතර ක්ලාන්ත වෙන්න පටන්ගත්තා. අපස්මාර රෝගියෙකුගේ මෙන් වරින්වර ශරීරය ගැහෙන්න පටන්ගත්තා. ඔහු අධික හිසකැක්කුමට හා වමනයට ගොදුරු වුණා. දවස් කිහිපයක් යද්දී ඇඳෙන් නැගිටින්න බැරිතරමට ඔහු දුර්වල වුණා. සර් ඇන්ඩෲ ලුවිස් ලන්ඩනයට ගිහිං, හාර්ලි වීදියේ ඉන්න ඉහළම විශේෂඥයින් මෙහේට එව්වා. තරුණයාට ප්‍රතිකාර කරන්න ඔවුනට මං, මගේ උපරිම සහයෝගය ලබාදුන්නා. නමුත් වැඩක්වුණේ නෑ. අපේ ප්‍රතිකාර මධ්‍යයේමයි ඔහු මියගියේ."


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

"රෝගය පැතිරී ගියේ කොහොමද?" හෝම්ස් විමසුවේය.

"ඒක බොහොම ඉක්මනට පැතිරුණා හෝම්ස් මහත්තයා" ලියර් කීය. "ලුවිස් තරුණයා තරම් බරපතල තත්ත්වයට කවුරුවත් පත්වුණේ නෑ. මට මතකයි. ඊළඟට ලෙඩේ හැදුණේ "ගෝට්" තානායමේ සපත්තු පිරිසිදු කළ ඉලන්ද්‍රියට. ඇන්තනි ලුවිස් මියගිහින් සතිකිහිපයකට පස්සේ ඒ කොලුවා - ජෝජ් මියගියා. මං ඒ ගැන තානායමෙන් අහල බැලුවා. වැඩක් නැති වෙලාවලට, ලුවිස්ගේ කාමරයට වැදිලා, මුහුදුබඩ ජීවිතය, සටන්පුහුණුව ගැන විස්තර අහන්න ඒ තරුණයා පුරුදුවෙලා හිටියලු. ඉතින් ඇන්තනි ලුවිස්ගෙන් රෝගය බෝවීමේ පුදුමයක් නෑ.

ඊළඟ ගොදුර වුණේ නාකි මැක්ස්වයිනි. රැකියාවෙන් විශ්‍රාම අරගෙන හිටි ඔහු, දවසේ සම්පූර්ණ කාලයම ගතකළේ "ගෝට්" තානායමේ. ඔහු හුගක් වයස්ගත කෙනෙක්. මිනිහා ඒ වෙනකොට මත්පැන්වලට හොඳටම ඇබ්බැහි වෙලයි හිටියේ. ඒ නිසා මෙයාගෙන් නොමැරුණා නම් නිසැකවම මත්පැන් නිසා මැරෙනවා. කොහොමවුණත් මැක්ස්වයිනි අන්තිම වනතුරුම මේ රෝගයේ ලක්ෂණ පෙන්නුම් කළේ නෑ. ඔහුට තිබුණා ලේ පිටවුණු නොනැවතුණු වමනයක්. නමුත් ගිලිස්සුම් තුවාල තිබුණේ නෑ. ඒ නිසා මං හිතුවා, ඒ දීර්ඝ කාලයක් අධික ලෙස මත්පැන්බීම නිසා ඇතිවුණු, අක්මාව දියවීම කියලා. කොහොම වුණත් පස්සේ තමයි මට හිතුණේ මේක ලුවිස්ලාට වැලඳුණ අබිරහස් රෝගය කියලා.

එතකොට තමයි මම මේ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා හමුවෙන්න ගියේ. අපි දෙන්නා "ගෝට් ඇන්ඩ් බූට්ස්" තානායමට ගිහිං එහි හැමතැනක්ම හොඳට පරීක්ෂා කළා - කෑමබීම, වතුර, ඇඳ ඇතිරිලි. සැකකටයුතු කිසිම දෙයක් අපට දකින්න ලැබුණේ නෑ. අපට පෙනුණේ එතැන ඉතාම පිරිසිදු බව පමණයි"

"ඔබේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා නම් කියන්නේ මේ රෝගය අපිරිසිදු ජලය නිසා ඇතිවුණු එකක් කියලයි?" මම කීවෙමි.

"පිස්සු විකාර!" වෛද්‍ය ලියර් කීය. "එයා එහෙම කියන්නේ මොකද දන්නවද? වෙන මොකක්වත් හේතුවක් එයාට හිතාගන්න බැරිනිසා මහත්මයා. මේ පළාතේ ළිං ඔක්කොම හරිම ගැඹුරුයි. අනික ළිං ඔක්කොම හුණුගල් ස්ථරය හරහා හෑරූ ඒවා. මෙහේ ළිං ගණනාවක වතුර මං අන්වීක්ෂයෙන් පරීක්ෂා කරල බැලුවා.


http://sherlockholmesinvestigations.blogspot.com



කිසිදෙයක් නෑ. රසායනික සංයුතිය විශ්ලේෂණය කරවා බැලුවා. අමතර ඛණිජ ලවණ ස්වල්පයක් ඇමරෙන්න වෙන මොකක්වත් නෑ. ඒ ඛණිජ මොනවද? ඔබ අහල ඇති මිනිස්සු විශාල මුදලක් ගෙවල නාන්න යන තැන් ගැන..... අර ලෙඩ රෝග සුවකරන උණුදිය උල්පත්..... ඖෂධීය ගුණයක් තියෙනවා කියන දියබුබුළු. අන්න ඒවල තිබෙන ඛණිජ පමණයි. වෙන මොකුත් නෑ"

"හොඳයි වෛද්‍ය ලියර්" හෝම්ස් කීය. "මේ අද්භූත සිදුවීම මොකක් නිසා සිදුවුණු දෙයක් කියලද ඔබ හිතන්නේ? මොකක්ද ඔබේ මතය?"

"පහුගිය අවුරුදු දහය තිස්සේම මං ඒ ගැන මගේ මොළය වෙහෙසවමින් කල්පනා කළා" වෛද්‍යවරයා කීය. "එකම කාරණයක් හැරුණාම....."

"..... ඔව් මොකක්ද ඒ කාරණය?" හෝම්ස් විමසුවේය.

"මං කියන්න හැදුවේ මෙයයි. අබිරහස් රෝගයට ගොදුරුවෙලා මියගිය පුළු පිරිස හැරුණාම, මද වශයෙන් රෝගයට ගොදුරුවුණු කොටසකුත් හිටියා. මරණත් අවසන්වෙලා, රෝගයෙන් පෙළුණු අයත් සුවය ලැබුවාම, අපි හිතුවා මේ අද්භූත සිදුවීම එතැනින් අවසන් කියලා. නමුත් ඊළඟට ආවා අර ඔබට අහන්න ලැබුණු දරුඋපත්..... අර ආබාධිතව උපන් දරුවන්. මේකයි ඒකයි දෙකම එකට සම්බන්ධ ඇති කියල එද නම් මට හිතුණේ නෑ. නමුත් දැන් නම් මට විශ්වාසයි ඒ දෙකම එකට සම්බන්ධයි කියල"

"ඇයි ඔබ එහෙම හිතන්නේ?"

"භූගෝලීය පිහිටීම"

"මොනවා? කොහේ භූගෝලීය පිහිටීමද?" මම ඇසීමි.

"මං අදහස් කළේ තානායම හා ඒ අවට වාසය කළ අයගේ නිවාසවල භූගෝලීය පිහිටීම කියන කරුණ" වෛද්‍යවරයා කීය. "ඇන්තනි ලුවිස් මියගියේ ගෝට් තානායමේදී. සපත්තු මදින තරුණයා මියගියා..... ඔහුත් සේවය කළේ ගෝට් තානායමේ. මැක්ස්වයිනි බීවේත් එතැන. ඔහු තරම් අධිකව මත්පැන් පානය නොකළත්, මේ අබිරහස් රෝගය වැලඳුණු අය තවත් හිටියා. ඔවුන් හැමදෙනෙක්ම "ගෝට්" තානායමේදී එකට මත්පැන් බීව අය. මළදරු උපත් හා ආබාධිත දරු උපත් සිදුවුණාම, මං ඒ හැම එකක් ගැනම හොඳට හොයල බැලුවා. ඒ හැම උපතකම එකම රටාවක්


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

මට දකගැනීමට හැකිවුණා. ඒ දරුවන් ඉපදුණු පවුල් හැම එකක්ම පදිංචිවෙලා හිටියේ ගමේ එක් කෙළවරක. ඒ කෙළවරේම තමයි "ගෝට්" තානායම තිබුණෙත්. වෙනත් වචනවලින් කියනවා නම් ඔවුන්ගේ පදිංචිය තිබුණේ ඒ තානායමට බොහොම ළඟින්."

හෝම්ස්ට ඇසීමට තවත් ප්‍රශ්න තිබූ බැව් මම තේරුම් ගතිමි. "ඔය අබිරහස් රෝගයක් කියල ඔබ කියූ දේ දැන් ඉවරෙටම ඉවරද? මේ ශාපය ඇඩිල්ටන්වලින් ඉවත්වෙලා ගිහින්ද?"

"ඔව් ඉවරයි" වෛද්‍ය ලියර් කීය. "දැනට නම් ඉවරයි. ඒක මෙහාට ආවෙ කොහොමද කියන ඒක අපි දන්නෙ නෑ. ඒක මෙහෙන් ගියේ කොහොමද කියල අපි දන්නෙ නෑ. ඒක මොකක්ද කියලත් අපි දන්නෙ නෑ. ඉතින් මං කොහොමද දන්නෙ ඒක ආයි මෙහේ ඒවිද නොඒවිද කියල? මං කොහොමද මහත්මයා වෛද්‍යවරයෙක් හැටියට ඒක මිනිසුන්ට සහතික කරලා කියන්නෙ? මේ වගේ භයානක රෝගයක් ආයිත් කවදවත් ඇඩිල්ටන්වලට එනු එකක් නෑ කියල, මට සහතික වෙන්න බෑ"

"මං විශ්වාස කරනවා" හෝම්ස් කීය. "නුදුරු අනාගතයේදීම ඒ ගැන ඔබට සහතික වෙන්න මට අවස්ථාව ලැබෙයි කියල. දොස්තර මහත්මයා. ඔබ ළඟ තවත් මොනව හරි තොරතුරු තියෙනවද, අපට ප්‍රයෝජනවත් වේවි කියල ඔබ හිතන?"

වෛද්‍ය ලියර්ට සිනාපහළ විය. "මහත්වරුනි. ඔබ අහල තියෙනවා නේද මිනිස්සු කියනවා, හැම කළුවලාකුළක ම රිදී රේඛාවක් තියෙනවා කියල? මං බොහොම පුංචි කාලෙ මගේ ආච්චි මට කියූ දෙයක් තමයි; කොයිතරම් නරක අවාසනාවන්ත තත්ත්වයක වුණත්, හොඳ දේක අංශු මාත්‍රයක් හරි තියෙනවා කියන එක. මෙකෙත් එහෙමයි. මේ ගමේ හිටියා මේකට අදාළ නැති රෝගීන් දෙන්නෙක්. ඔවුන් දීර්ඝ කාලයක සිට අසනීපයෙන් සිටි අය. ඇඩිල්ටන් පුරා අවාසනාව, මරණය හා ලෙඩරෝග පැතිරී යද්දී අර දෙන්නා එයාලගෙ අසනීපවලින් සුවය ලැබුවා. ඔබ මේ බව පුවත්පත්වල නම් දකින්න නෑ. ඒ මොකද පත්තරකාරයින්ට වැඩිපුර විකුණන්න පුළුවන් නරක ආරංචි නිසා"

"මොකක්ද ඒ සිදුවීම?"

"එක් කෙනෙක් මේරි කමින්ස්" ලියර් කීය. "ඇය තමයි "ගෝට්" තානායමේ අයිතිකාර කමිංස්ගේ දියණිය. ඒ කාලෙ ඇගේ වයස



http://sherlockholmesinvestigations.blogspot.com



අවුරුදු දහයක් විතර. ඇය ඒ කාලෙ ඉතාම ලස්සන තරුණියක්. මේ සිද්ධියට අවුරුද්දකට පමණ කලින් ඉඳල ඇය අසනීපවෙලා ප්‍රතිකාරගන්න මා ළඟට ආවා. ඇගේ රෝග ලක්ෂණ වුණේ, තදබල හිසකැක්කුම, ක්ලාන්ත ගතිය සහ ඇස්පෙනීම දුර්වලවීම. පසුව ඇගේ ඇස්වලට පෙනුණු දර්ශන පථය ක්‍රමයෙන් කුඩාවෙන්න පටන්ගත්තා. ඇයට පෙනුණේ උමගක මේ පැත්තෙන් අනික් පැත්ත බලන කෙනෙකුට පෙනෙනවා වගේ, මැදහරිය විතරයි. මේ කාලෙ වෙනකොට සොහොන් කැණීම් කරල නැති නිසා, අලුත් ලෙඩක් ගැන අපට හිතුණෙ නෑ. මං මොන මොන ප්‍රතිකාර කළත් වැඩක් වුණේ නෑ. ඇගේ රෝගය ක්‍රමයෙන් උත්සන්න වෙන්න පටන්ගත්තා. ඔබ පිළිකා ගැන අහල ඇති මං හිතන්නේ. ඇගේ මොළයේ පිළිකාවක් හැදිලා එහෙම වෙලා කියල මං අනුමාන කළා. ඔබ දන්නවාද සිදුවුණු දේ. මිනීවළ හාරලා අනික් අය රෝගී වෙන අතරේ මේරි කමිංස්ගේ රෝගී ගතිය සුවඅතට හැරුණා. ඇය ක්‍රමයෙන් සම්පූර්ණ සුවය ලැබුවා. ඇය අදටත් ජීවත්වෙන්නෙ ඔය අපූරුවට; කිසිම ලෙඩක් නෑ.

අනෙක් රෝගියා හෙන්රි මහත්මිය. ඇයගේ ගෙදර තිබුණෙ "ගෝට්" තානායමට අල්ලපු වත්තෙ. ඇය වයස්ගත කාන්තාවක්. ඇගේ කකුල් දෙකේම සහ සමහර කාලවලට අත්වලත් වැලඳුණු චර්ම රෝගයකින් ඇය පීඩා වින්දා. දියර ගලන, දද සහිත මේ හමේ රෝගය, තමන් තරුණ කාලෙ ඉඳලම තිබුණු බවයි හෙන්රි මහත්මිය මා සමග කියල තිබුණේ. සොහොන කැණීම් කරල දින ගණනකින් මේ කුෂ්ඨ රෝගය සම්පූර්ණයෙන්ම අතුරුදන්වුණා. ඒක නිට්ටාවටම සුවවුණා. නමුත් අවාසනාවකට වගේ ඇගේ ගෙදරම ජීවත්වුණු හෙන්රි මහත්මියගේ ලේලිය කණගාටුදායක ඉරණමකට මුහුණදුන්නා. කැණීම් කළ දවස්වල දෙමස් ගැබිනියකව සිටි ලේලියට පසුව ලැබුණු දරුවා ආබාධිත දරුවෙක් වුණා."

"හරිම පුදුමයි" හෝම්ස් කීය. "දොස්තර මහත්මයා. ඔබේ වටිනා කාලය හුගක් ඔබ අප වෙනුවෙන් යෙදෙව්වා. ඒ ගැන අපි ඔබට බොහොම ස්තුතිවන්ත වෙනවා. මට හිතෙන්නේ, අපි දැන් මේ අබිරහස සොයා යන ගමනේ නියම මාර්ගයට පිවිසිලා කියලයි. අපි මේකෙ අවසානයට ළඟාවුණාම ඔබට හැමදෙයක්ම කියන්නම්"

එද රාත්‍රී අපි "ගෝට්" තානායමේ නවාතැන් ගත්තෙමු. අපට සංග්‍රහ කිරීමට පැමිණි කාන්තාව මේරි කමිංස් බව අපට දැනගන්නට



http://sherlockholmesinvestigations.blogspot.com

ලැබිණ. අවුරුදු දහයකට පෙර කුමන රෝගයකට ගොදුරු වුවත්, එහි ලකුණක්වත් දුන් ඇය වෙතින් දක්නට නොවීය. ඇය බුද්ධිමත්, ක්‍රියාශීලී, මදක් තරබාරු, තිස්වියට ළංව සිටි ගම්බද කතක් බව අපි දුටුවෙමු. රාත්‍රී ආහාරයෙන් පසු අප ගිනි උදුන අසල සිටියදී, ඇය කෝපි රැගෙන අප වෙත ආවාය.

"කමිංස් මෙනෙවිය" හෝම්ස් කීවේ ඇය වෙතට හැරෙමිනි. "මේ දෙස්තර වොට්සනුත් මමත් ඇඩිල්ටන් වෙත ඇවිත් ඉන්නෙ ඇයි කියල ඔබ දන්නවද?"

ඇය එක්වරම පුදුමයෙන් මෙන් අප දෙස බැලුවාය. ඇය කථාකලේ තත්පර කිහිපයකට පසුවය.

"ඒව ගැන හොයල බලන එක මට අයිති වැඩක් නෙමෙයිනෙ මහත්මයා." ඇය කීවාය. "ඒ වුණත් ඔබ ඇවිත් ඉන්නෙ ශාපලත් සොහොන ගැන මොකක් හරි විපරම් කරන්න බව මට ආරංචි වුණා"

"ඔව් ඒක හරි" හෝම්ස් කීය. "කැමැති නැද්ද මෙහෙන් වාඩිවෙලා, ටිකක් අපිත් එක්ක ඒ ගැන කතාබහ කරන්න? ඒ සොහොන විවෘත කළ දවස්වල මේ පළාතේ ඇතිවී ගිය ලෙඩරෝග ගැන හොයා බලන්නයි අපි ආවෙ. මට ආරංචිවුණා මෙහෙම දෙයක්....." හෝම්ස් කියද්දී ඇය අප අසලින් හිඳගත්තාය.

"කමිංස් මෙනෙවිය" හෝම්ස් කීය. "ඔබ ඒ කටයුත්ත නිසා රෝගී වූ කෙනෙකු නොවෙයි; තිබුණු රෝගයක් සුවකරගත්තු කෙනෙක්ලු. ඒ ගැන විස්තර දැනගන්න අපි කැමතියි. අපි ඔබේ පෞද්ගලික දේවල් මෙහෙම අහන එක කමක් නැද්ද මං දන්නෙ නෑ....."

"කිසිම ප්‍රශ්නයක් නෑ මහත්මයා" ඇය කීවාය. "දන්නා හැමදෙයක්ම මං ඔබට කියන්නම්.

මං ඔය අසනීපෙට ගොදුරු වෙලා, එතකොට අවුරුදු එකහමාරක් විතර වෙන්න ඇති. දවසින් දවස ඒක නරක අතට හැරෙමිනුයි තිබුණෙ. මුලින්ම මට තිබුණෙ ඉඳහිට දැනුණු ඔලුව කැරකිල්ල. ඊළඟට මාව ක්ලාන්ත වෙන්න පටන්ගත්තා. ඊළඟට ආවා ඉවසන්න බැරි හිස කැක්කුම. ඒවා කොච්චර දරුණු වුණාද කිව්වොත් මට වෙලාවකට පිස්සු වගේ. ඇස් පෙනීම හොඳටම අඩුවේගන ගියා. ලියරි දෙස්තර මහත්තයා ඔහු දන්නා හැම


http://sherlockholmesinvestigations.blogspot.com



බෙහෙතක්ම දුන්නා. ඒත් වැඩක් වුණේ නෑ. අසනීපය එන්න එන්නම වැඩිවුණා. ඔහු කිව්වා මගේ ඔලුව ඇතුළේ..... මොකක්ද..... මොකක්ද කියල..... මට ඒ වචනෙ දැන් හරියට මතක නෑ. මට ලන්ඩනයට ගිහිං රෝහලකට ඇතුළුවෙලා මොළයේ ශල්‍යකර්මයක්ද කොහෙද කරන්න වෙයි කිව්වා. මං ඒ කතාවට හරියට භයවුණා මහත්මයා. ඊළඟට ටික දවසක් යද්දී මගේ අසනීපෙ හොඳවෙන්න පටන්ගත්තා. හැබෑවු වේගෙන්ම ඒක හොඳවුණා. දෙවියන්ගෙ පිහිටෙන් එද ඉඳන් අද වෙනතුරු එක දවසක්වත් මං අසනීපවෙලා ඇඳේ හිටියෙ නෑ මහත්මයා"

"හරිම පුදුමාකාරයි" හෝම්ස් කීය. "ඔබේ අසනීපය සුවවුණේ මොකක් නිසා කියලද ඔබ කියන්නෙ?"

"මිනිස්සු කියන්නෙ ඇඩිල්ටන් පුරා ලෙඩරෝග ඇතිකළේ, අර ශාපලත් සොහොන විවෘත කළ එක කියල නේ." ඇය කීවාය. "ඒ වුණාට මට නම් කියන්න තියෙන්නේ එක දෙයයි. මගේ අසනීපෙ හොඳවුණේ ඒක නිසා"

"ඔබට මතකද සර් ඇන්ඩෲ ලූවිස්ගේ පුතා..... ඇන්තනි ලූවිස් තරුණයා?" හෝම්ස් ඇසීය.

"මට හොඳට මතකයි" ඇය කීවාය. "අනේ අසරණ ඉලන්දාරියා. ඒ කොල්ලා එයාගෙ තාත්තා එක්ක හරියට රණ්ඩු කළා. කොහොම වුණත් ඔහු අපරාදේ ඉක්මනින් මියගියා නේ"

"කමිංස් මෙනෙවිය" හෝම්ස් කීය. "මං මෙහෙම දෙයක් ඇහුවට මොකුත් හිතන්න එපා. ඒ ලූවිස් තරුණයා එක්ක ඔබේ හැඳුනුම්කමක් හෝ හිතවත්කමක් තිබුණද?"

හෝම්ස්ගේ ප්‍රශ්නයෙන් ඇය එක්වරම තිගැස්සුණාය. ඒ සමගම ඇගේ මුහුණ ලැජ්ජාවෙන් රතුවූ බව මම දුටුවෙමි. මදවේලාවක් යනතුරු ඇයට කිසිත් කථාකර ගැනීමට නොහැකි විය. ලැජ්ජාවෙන් මෙන් මුහුණ පහතට හරවා ගෙන සිටි ඇය හිස ඔසවා විසිත්ත කාමරය දෙපස බැලුවාය. ඒ තමා කියන දෙයට සවන්දීමට කිසිවෙකු ළඟක සිටීදැයි සැකහැර දැනගැනීමට මෙනි. කිසිවෙකු නොමැති බව දැනගත් පසු, කටහඬ අඩුකර ගොතගසමින් මෙන් කථාකිරීමට පටන්ගත්තාය.

"මහත්මයා..... මං ඒ දවස්වල හරි පුංචියි..... ලාබාලයිනේ. මට ඒ කාලෙ මං හිතන්නේ වයස අවුරුදු 16ක් 17ක් ඇති. මට ලෝකේ


http://sherlockholmesinvestigations.blogspot.com

ගැන එච්චර දනුම්තේරුම් තියෙන කාලෙ නෙමෙයි..... මං හිතුවා ඒ ඉලන්දරියා අපූරු කඩවසම් කොල්ලෙක් කියලා..... ඔහුගේ හැඩවැඩවලට කතාබහට මගේ හිත ටිකක් ඇදුණා....."

".....ඇන්තනි ලුවිස් ඔහු ළඟ තිබුණු වටිනා යමක් ගැන ඔබට කිව්වද?" හෝම්ස් විමසුවේය. "නැත්නම් ඔබට පෙන්නුවද?"

"මහත්තයා කොහොමද ඒක දැනගත්තේ?" මේරි කමිංස් හෝම්ස්ගෙන් ඇසුවේ මවිතයට පත් අයුරෙනි. මීළඟට ඇගේ සිතේ සැකයක් ඇතිවූ ලෙසින් අප දෙදෙනා අදසම් බැලුවාය.

"මට ඒක දැනගන්න ලැබුණා කමිංස් මෙනෙවිය" හෝම්ස් කීවේ දෙනෙත් ගිනි උදුන දෙසටම යොමුකරගෙනය. "ඔබට කැමති නම් මට ඒ ගැන කියන්න. ඒක රහසක් හැටියට තබාගන්නා බවට මං පොරොන්දු වෙනවා."

"ඇන්තනි මට කිව්වා ඒක රහසක් කියලා....."

"මං ඒ ගැන දන්නවා" හෝම්ස් කීය. "ඒ විස්තර මට කියන්න කිසි භයක් වෙන්න එපා. මට දැනගන්න උවමනා ඒක සිදුවුණු පිළිවෙළ විතරයි. මොකක්ද ඔහු ළඟ තිබුණේ? කොහොමද ඔබ ඒක දැක්කේ?"

දෙනෙත් බිමට යොමුකරගෙන මඳවේලාවක් කල්පනා කළ ඇය මීළඟට හෝම්ස් දෙස බැලුවාය. මොහොතක් බලාසිටි ඇය තීරණයකට පැමිණියාක් මෙන් කථාව පටන්ගත්තාය.

"මේ තානායමේ අමුත්තන්ගේ කාමර පිරිසිදු කිරීම ඒ කාලෙ මට පැවරිලා තිබුණා." ඇය කීවාය. "ඒත් අමුත්තන් ආව වෙලාවලට, මොහොතක්වත් කාමරයේ රැඳෙන්න එපා කියලයි තාත්තා මට උපදෙස් දීල තිබුණේ. ඒක මට තාත්තා නිතරම කියා තිබුණු කාරණයක්.

එක දවසක් මං ඇන්තනි මහත්මයා නොහිටි හැන්දෑවෙලාවක, ඔහුගේ කාමරය අතුගාමින් හිටියා. එකපාරටම ඔහු කාමරය ඇතුළට ආවේ කලබලයෙන්. මං සූදානම් වුණේ වහාම කාමරයෙන් පිටවී යන්නයි. මට යන්න බැරිවිදියට දොරටුව අවහිර කරල ඔහු මට කථාකළා.

"මේරි මෙහෙම ඉන්න" ඔහු කිව්වා.

"බෑ බෑ මට යන්න ඕන..... මට යන්න ඉඩ අරින්න" මං කිව්වා.

"හරි. මං ඔයාට යන්න දෙන්නම්. මං ඔයාට වටිනා දෙයක් පෙන්වන්නද?" කී ඔහු, තමන්ගේ ඇඳ යටින් ට්‍රන්ක පෙට්ටියක්



http://sherlockholmesinvestigations.blogspot.com



එළියට ඇද්දා. ඒක ඇරලා ඔහු එළියට ගත්තේ මැටිවලින් හද තිබූ බඳුනක්. ඒක මැටි පියනකින් වහලා තිබුණා.

"මොකක්ද ඒ?" මං ඇහුවේ හිතේ ඇතිවූ කුතුහලයෙන්.

"ඒක තමයි මේ ලෝකෙ තියෙන ඉතාම පුදුමාකාරම දෙය" ඔහු කීවේ සිනාසෙමින්. "මේකෙන් මට පුළුවනි මේ ලෝකෙ ලොකුම පොහොසතා වෙන්න" එහෙම කියමින් නොනවත්වාම හිනාවුණු ඔහු මගේ අතකින් අල්ලාගත්තා.

"මේරි ඔයාගෙ අතින් මේ මැටි බඳුන අල්ලා බලන්න" කී ඔහු මගේ අත මැටි බඳුන මත තැබුවා. ඒක තිබුණේ ගින්දර වගේ උණුසුමක්. මං වහාම මගේ අත ආපිටට ගත්තා.

ඊළඟට ඔහු කාමරයේ දැල්වුණු ලාම්පුවේ දැල්ල අඩුකළා. කාමරය අඳුරුවුණාම, ඔහු අර මැටිබඳුනේ පියන ඉවත්කළා. එතකොට එයින් නිකුත්වුණේ පුදුමාකාර විදිහේ නිල්පැහැති ආලෝකයක්. හරියට නිල්පාට වතුර තියෙන ලොකු පොකුණක වතුර කැලතෙනවා වගේ, ඒ එළියත් බැබළෙමින් ඒ මේ අතට සෙලවුණා. හිතේ ඇතිවුණු පුදුමයෙන් මට හුස්මගන්න පවා අපහසුවුණා.

"ඒ මොකක්ද?" මගේ කටින් පිටවුණේ මං නොදැනීම.

"මේරි ඒ තමයි මගේ වාසනාව" ඔහු කිව්වා. "මගේ තාත්තා මට මොනව කළත් මං දැන් භය නෑ. ඔයා දන්නවද මං තමයි මේ ලෝකෙ ලොකුම පොහොසතා වෙන්නේ. හැබැයි මේක රහසක්. මේක මං ළඟ තියෙන බව කවුරුවත් දන්නෙ නැහැ. ඒ රහස කාටවත් කියන්නෙ නැහැ කියලා මට පොරොන්දු වෙන්න මේරි" එහෙම කියූ ඔහු අර මැටිබඳුන වහලා ආපහු ඒක ට්‍රන්කපෙට්ටිය ඇතුළට දැම්මා.

"ඔබ හිතන්නේ ඒ මොකක් කියලද?" හෝම්ස් ඇගෙන් විමසුවේය.

"ඔබට ඇත්තම කියන්නම් මහත්මයා." ඇය කීවාය. "එදා දුටුවා පමණයි. මං එහෙම දෙයක් අද වෙනතුරු ජීවිතේට දැකලා නෑ. ඒක ඉන්ද්‍රජාලිකයෙකුගේ මැජික් දර්ශනයක් වගේ. මං තවත් දෙයක් ඔබට කියන්නම් මහත්මයා" කියූ මේරි කමිංස් අසුනෙන් නැගිට්ටාය. "මං මේ කාරණාව කවදාවත් කාටවත් කිව්වෙ නෑ. මට වෙලාවකට හිතෙනවා මගේ ඔලුව ඇතුළේ තිබුණු අසනීපය හොඳ වුණේ ඔහුගේ මැජික් මැටිබඳුන නිසා කියල. ඔබට හිතෙන්නේ ඒක පිස්සු කතාවක් කියලද?"



http://sherlockholmesinvestigations.blogspot.com

"මං එහෙම හිතන්නෙ නෑ කමිංස් මෙනෙවිය" හෝම්ස් කීය. "මටත් හිතෙනවා ඔබගේ මතය නිවැරදියි කියලා. මං කැමතියි ඔබෙන් තවත් උදව්වක් ඉල්ලන්න. ලුවිස් මහත්මයා සිටි ඒ කාමරයේ අද වෙනත් අමුත්තෙක් ලැගුම්ගෙනද?"

"නැහැ" ඇය කීවාය. "ඇයි මහත්මයාට උවමනාද ඒ කාමරේට මාරුවෙන්න?"

"නෑ එහෙම උවමනාවක් නෑ" හෝම්ස් කීය. "නමුත් මං කැමතියි ඒ කාමරයේ ඇතුළත බලන්න"

ඇය, අප එහි කැඳවාගෙන ගියාය. පහත් සීලිමක් සහිත නිදන කාමරයක් වූ එහි ජනේලයෙන් ඇඩ්ල්ටන් විල්ලුව දකගැනීමට ලැබිණ.

"මේ ළගම තියෙන නිවස කාගෙද?" හෝම්ස් විමසුවේ විවෘත කළ ජනේලයට නුදුරින්ම පිහිටි නිවස පෙන්වමිනි.

"ඒ හෙන්ටි මහත්මියගේ නිවස" මේරි කීවාය. "ඇගේ චර්ම රෝගයක් තිබුණා, ඒකත් හොඳවුණා. නමුත් අසරණ ලුවිස් තරුණයා, මැක්ස්වයිනි, ජෝජ් ද පාවහන් ඔපදමන්නා ඔක්කෝම අකාලයේ මියගියා"

"ඇත්තෙන්ම මෙක හරි පුදුමාකාර දෙයක්" කී හෝම්ස් කාමරයෙන් එළියට ආවේය. අපි ඔහු පසුපස පැමිණියෙමු.

එද රාත්‍රියේ නින්දට සුදානම්ව කාමරයට ගිය මගේ මිත්‍රයා, බොහෝවෙලා යනතුරු කල්පනා කරමින් සිටියේය.

පසුවද උදෑසනින්ම අවදිවී කාමරයෙන් පිටවී සිටි හෝම්ස්, මට යළිත් දකින්නට ලැබුණේ උදෑසන තේ මේසයේදීය. ඔහු සිටියේ සතුටෙන් බැව් මම තේරුම් ගතිමි. තේ පානය සඳහා යද්දී මඳ සීතල ගතියක් ද මට දැනිණ. දේශගුණයේ වෙනසක් පැමිණ ඇති බැව් මම වටහාගතිමි. කලින්ද රාත්‍රියේ සුළු හිම වැටීමක් ද සිදුවී තිබිණ.

මෙතෙක් දවස් හෝම්ස් කළ කී දේ තේරුම් ගැනීම මට අපහසු විය. එහෙයින් එයට උත්සාහයක් දැරීම අවා මම අත්හැර දැමුවෙමි.

"දැන් ඉතින් මොනවද ඊළගට?" මම මගේ මිත්‍රයාගෙන් ඇසුවෙමි.

"මං ඔබට කිව්ව නේ වොට්සන්. අපි මෙහේ ආවෙ අද්භූත සිදුවීම වුණු තැන "සියැසින්" දැනගන්න. ගමේ ඡායාරූප ශිල්පියා ආ වහාම අපි යමු අපකීර්තිමත් සොහොන බලන්න"



http://sherlockholmesinvestigations.blogspot.com



අප උදේ ආහාරය ගෙන අවසන් වෙද්දී මේරි කමිංස් පණිවුඩයක් රැගෙන ආවාය. ගමේ ඡායාරූප ශිල්පියා වූ ස්වේන් තානායමට පැමිණ ඇති බවයි පණිවුඩය.

"අපි "ගෝට්" තානායමේ කුඩා අශ්වකරත්තය තුලියට ගත්තෙමු. ඡායාරූප ශිල්පියාගේ බඩුබාහිරාදිය එහි පටවා ගෙන අපි විල්ලුව බලා පිටත්වුණෙමු.

"හෝම්ස් මහත්තයා" ස්වේන් කීය. "ඊයේ රාත්‍රි දිගටම වගේ හිම වැටුණා. ඒ නිසා අද විල්ලුවේ දර්ශන වඩාත් අලංකාර වේවි."

කුඩා කඳුගැටය පිහිටා තිබුණේ විල්ලුවේ මැදට වන්නටය. එහි මුදුන මුහුදු මට්ටමට අඩි 1100 ඉහළින් පිහිටි එකක් බැව් අසන්නට ලැබිණ. කෙසේ වෙතත් කන්ද මුදුනටම ළගාවිය හැකි පාරක් විල්ලුව හරහා වැටී තිබිණ. මෙය වංගු සහිත එකක් වුවත් අශ්වකරත්තයෙන් මුදුනටම යා හැකි බව රියැදුරා පැවසුවේය. කඳුපාර හිමතට්ටුවකින් වැසී තිබුණත් කරත්තය කඳුමුදුනට ඇදගෙන යාමට අශ්වයා සමත්විය.

කඳු මුදුන හා එයට ළංව තිබූ ඉහළ කොටස ද ගනකම් හිමතට්ටුවකින් වැසී තිබිණ. සුදුපාට, යෝධ ලෝම පොරෝණාවක් මෙන් විහිදී තිබූ හිම තට්ටුව, උදෑසන හිරුරැසින් දිලිසිණ. අප අශ්වකරත්තයේ ගමන්ගන්නා අතරේ හෝම්ස් හිස එළියට දිගු කරගෙන විමසිල්ලෙන් අවට නිරීක්ෂණය කළේය. සෑමතැනක්ම සුදු පැහැයෙන් වැසී තිබූ නිසා, ඔහුට දැකගතහැකි දර්ශනයේ කිසිදු වෙනසක් නොවීය. එහෙත් එක්වරම ඔහුට කෑගැසිණ.

"අන්න තියෙනවා!" කී ඔහු අත දිගුකොට පෙන්වීය. අපේ වම්පසට වන්නට කඳුබෑවුමේ එක් තැනක් හිම නොතිබීම නිසා අඳුරු පැහැයෙන් තිබිණ. අපි කරත්තය නවත්වා එතැනට ළංවී බැලුවෙමු. හිම හෝ තණකොළ නොමැතිව එතැන පොළොවේ පස් එළියට නිරාවරණව තිබිණ.

"ඔබ මේ ශාපලත් සොහොනෙ කවදා හරි ඡායාරූප ගහකරල තියෙනවද?" හෝම්ස් ඡායාරූප ශිල්පියාගෙන් විමසුවේය.

"නැහැ මහත්මයා" ඔහු කීය. "ඒක ඡායාරූපයක් අපතේ යන වැඩක්. ඒ මොකද මෙතැන ඡායාරූපයක් බලන්න මේ පළාතේ කිසිම කෙනෙක් කැමැති වෙන එකක් නෑ"



http://sherlockholmesinvestigations.blogspot.com

කෙසේ වෙතත් හෝම්ස්ගේ උපදෙස් අනුව ස්වේන් මහතා ශාපලත් සොහොනේ ඡායාරූප කිහිපයක්ම ගත්තේය.

එය පොළොව මට්ටමෙන් මදක් ඉහළට සිටින සේ පස් ගොඩගැසීමෙන් සෑදී තිබිණ. එහි අයින දිගට ගල්පුවරු කැබලි හා බොරළු කැට එකතුකොට තිබූ අයුරු දක්නට ලැබිණ. සර් ඇන්ඩ්‍රූගේ සේවකයන් විසින් එහි මැද ආයුධවලින් ඇතුළට හාරා තිබූ හැටි වඩාත් ළංවී බලද්දී මම දුටුවෙමි. කෙසේ වෙතත් එම අඳුරු පැහැති පස්ගොඩේ තිබුණේ විනාශකාරී මුස්පේන්තු පෙනුමකි. ඒ හැඟීමක් කෙනෙකුගේ සිත තුළ ඇතිකිරීමට, ඔහු මිථ්‍යා ඇදහිලි විශ්වාස කරන්නෙකු වීම අවශ්‍ය නැත. ස්වේන් මහතාගේ වැඩකටයුතු නිමවූ පසු අපි අශ්වකරත්තයේ නැගී ආපසු ගම්මානය බලා පිටත්වූයෙමු.

දහවල් ආහාරය වේලාවේ මගේ මිත්‍රයාගේ දක්නට ලැබුණේ ප්‍රීතිමත් ස්වභාවයකි. මම ඒ ගැන් ඔහුගෙන් විමසුවෙමි. "මගේ හිතේ ඇතිවුණු සතුට හංගන්න බෑ වොට්සන්" ඔහු කීය. "අද උදේ ගිය ගමනෙදි මට අවශ්‍යව තිබූ අවසන් සාක්ෂියත් මට ලැබුණා. මගේ ඒ පරීක්ෂණයට සොබාදහමෙනුත් සහයෝගයක් ලැබුණා. කොයි එකටත් වැඩි හොඳට ඡායාරූප කිහිපයක් ගැනීමට මම ස්වේන්ටත් නියම කළා"

අප කෑම අවසන් කර කෝපි බොන අතරේ ඡායාරූප ශිල්පී ස්වේන් මහතා අප හමුවීමට පැමිණියේය. ඔහුගේ කටහඬේ තිබුණේ සමාව අයදින කම්පාවට පත් ස්වරයකි.

"හෝම්ස් මහත්තයා. මගේ ඡායාරූපවලට මොනවා වෙලාද කියන්න මට නම් තේරෙන්නෙ නැහැ. විල්ලුවේ ගත් අනෙක් ඡායාරූප හැම එකක්ම ඉතාම පැහැදිලිවට ඇවිත් තියෙනවා. ඒත් අර බූත සොහොනේ ඡායාරූප හතරම නරක් වෙලා. ඒවා ඔක්කොම අපැහැදිලියි." කී ඔහු දළඹේයා තහඩු කීපයක්ම අපට ප්‍රදර්ශනය කළේය. හෝම්ස් ඒවා ජනේලය අසලට ගෙනගොස් පරීක්ෂාකරන අතරේ මම ද බලා සිටියෙමි.

ශාපලත් සොහොනේ ඡායාරූප හතරම ගන මීදුමක් ගලා ගියාක් මෙන් බොඳවී අපැහැදිලිවී තිබිණි.

"මතකද හෝම්ස් අඩිගා කියූ කථාව" මම ඇසීමි. "ඔහුගේ ඡායාරූපවලටත් මේ දේම නේද සිදුවුණා කිව්වෙ?"



http://sherlockholmesinvestigations.blogspot.com



"හරියට හරි වොට්සන්" හෝම්ස් කීය. "ඒ කියන්නේ අපේ පරීක්ෂණය මෙතැනින් අවසන් වෙනවා. ස්වේන් මහත්මයා. මං ඔබට හදපත්ලෙන්ම ස්තූතිවන්ත වෙනවා"

ඡායාරූප ශිල්පියා මහත් විමතියකට පත්වූ බව ඔහුගේ මුහුණෙන්ම පෙනිණ. හෝම්ස් ගෙවූ මුදල් තම කබායාක්කුවට දමාගත් ස්වේන් එතැනින් පිටවී ගියේය.

කෝපි බී අවසන් කළ මගේ මිත්‍රයා සාක්කු ඔරලෝසුව එළියට ඇද වෙලාව පරීක්ෂා කළේය.

"අද හැන්දෑවෙ ලන්ඩන් බලා යන සීඝ්‍රගාමී දුම්රිය අල්ලාගන්න අපට බැරිවෙන එකක් නෑ වොට්සන්. සීනුව නාද කරලා සේවක ළමයාට කියන්න අපේ ගමන්මලු සූදානම් කරන්න කියලා"

අප ලන්ඩන් බලා යන අතරේ මගේ මිත්‍රයා දිගින්දිගටම කථාකළේ අපරාධකාරයන්ගේ ලෝකය පිළිබඳවය. ලන්ඩන් පාතාල ලෝකයේ මිනීමරුවන්, බැංකු බිඳින්නන්, ව්‍යාජ නෝට්ටු මුද්‍රණය කරන්නන්, මං පහරන්නන් ආදී දහසකුත් එකක් අපරාධකරුවන් ගැන ඔහු තොරතුරු කීය. එහෙත් ඒවාට කන්දීමට මගේ උනන්දුවක් නොවීය. මා උනන්දුවෙන් බලාසිටියේ, අප සාර්ථක ලෙස අවසන් කළා යයි ඔහු කී, ඇඩිල්ටන් අභිරහස ගැන් අසා ගැනීමටය. එහෙත් ඔහු ඒ ගැන කීමට උනන්දුවක් දක්වූයේ නැත. තවත් බලාසිටීමට නොහැකි තැන, මම ඒ ගැන විමසුවෙමි.

"හෝම්ස්. මට ඔය එකක්වත් දැනගන්න උවමනා නෑ. දෙයියන්ගෙ නාමෙන් කියන්න. මොකක්ද මේ ඇඩිල්ටන්වල අභිරහස? මට ඒ ගැන කිසිම දෙයක් තේරුම් ගන්න අමාරුයි."

මා කථාකළ ආකාරයට ඔහු හඬනගා සිනාසුණේය. එයින් මගේ සිතේ ඇතිවූයේ තරහකි.

"මගේ හිතවත් වොට්සන්. මෙන්න මේ කාරණය ඔබට මතකද මං දන්නෙ නෑ. අපි දෙන්නා මුලින්ම හඳුනාගත් දවස්වල, මං මෙවැනි දෙයක් ඔබට කිව්වා. තර්කානුකූලව කරුණු විශ්ලේෂණය කිරීම මගින් කළහැකි සොයාගැනීම් අප්‍රමාණයි. පුංචි වැලිකැටයකින් පුළුවනි, මහා සාගරයක පැවැත්ම ගැන නිගමනයකට එන්න. මං එහෙම කිව්වා නේද?"

"ඔව්" මම කීවෙමි. "නමුත් ඉතාම සුළු දේවල්වලින්, ඔබට දැවැන්ත සොයාගැනීම් කරන්න පුළුවන් බව, මං ඒ කාලෙ දැනගිටියෙ නෑ"



http://sherlockholmesinvestigations.blogspot.com

"මෙ පහුගිය දවස්වල මම යෙදිලා හිටියේ, මගේ වෘත්තියේ මං යෙදුණු, ඉතාම සිත්ඇදගන්නා ආකාරයේ පරීක්ෂණයක." හෝම්ස් කීය. "සිත් ඇදගන්නා කියල මං කියන්නෙ මේකයි. ඒ අබිරහස් දෙය මට දකින්න ලැබුණෙ නෑ. එය ප්‍රධාන ලෙස පරිහරණය කළ අය මට හමුවුණෙත් නෑ. නමුත් එහෙම දේයක් තිබුණු බව නිගමනය කරන්න මට හැකිවුණා. ඒ කොහොමද? මං ඇසූ දේ හා සොයාගත් කරුණු විශ්ලේෂණය කොට, තර්කානුකූලව ඒවා ඉදිරියට ගෙන ගියා"

"ඒ වුණාට ඔබ ඉදිරියට ගියේ මාවත් කැඳවාගෙන නොවෙයි" මම කීවෙමි. "මොකුත් තේරුම් ගන්න බැරිව මම මඟ අතරමංවුණා. ඔබ ඉදිරියට ගියා"

හෝම්ස් යළිත් සිනාසුණේය. මෙවර ඒ සිනාවේ තිබුණේ අනුකම්පා සහගත මිත්‍රශීලී බවකි.

"අපි මුලින්ම පටන්ගනිමු වොට්සන්. පුවත්පත්වලින් අපට දැනගන්න ලැබුණේ මොනවද? ශාපලත් සොහොනේ පස්මත, තණකොළ හෝ කිසිම පැළෑටියක් නොවැවෙන බවත්, හිම නොරැඳී ඉක්මනට දියවී යන බවත්. මගේත් මුලින් හිතුවෙ මේක, ජනප්‍රවාද නිසා ඇතිවුණු අතිශයෝක්ති කථාවක් කියලයි. නමුත් එඩ්ගා නම් පුරාවිද්‍යාඥයා කියූ දේවල් ඔබට අහන්න ලැබුණ නේ. ඒකෙන් ඔබට තේරුම් ගැනීමට හැකිවුණේ මොකක්ද?"

"මොකක්වත් තේරුම් ගත්තෙ නෑ!" මම කීවෙමි.

"වොට්සන්! ගල් අඟුරු ආකරවලින් ගල්අඟුරු හාරන පළාත්වල ඔබ මේක දැකල ඇති. පොළොවේ ගැඹුරෙන් හාරලා ගොඩට ගන්න අඟුරු, පොළොව මතුපිට දමල තියෙන තැන්වල ඇති වෙනස්කම් ඔබ දැකල නැද්ද? ඒ මත වැටෙන හිම නොරැඳී ඉක්මනින් දියවෙලා යනවා. තණකොළ හෝ වල්පැළෑටි නොවැවෙන ගල් අඟුරු ගොඩවල්?"

"එහෙම තැන් දැකල තියෙනවා" මම කීවෙමි. "නමුත් ඒ, යටින් ගින්දර ඇවිළෙන තැන්වල කියලයි මං හිතුවේ."

"සාමාන්‍ය පස් පොළොවේ මතුපිටට කිට්ටුව කොයින්ද ගින්දර?" ඔහු ඇසීය. "ඇත්ත තත්ත්වය ඒක නොවෙයි වොට්සන්. ඒ විදියට හිම දියවෙන්නේ ගල් අඟුරු ඉල්ලමේ ඇතුළතින් ශක්තිය පිටවෙන මොකක් හරි ක්‍රියාවලියක් සිදුවෙන නිසා. මේ ශක්තිය


http://sherlockholmesinvestigations.blogspot.com



පිටවෙන්නේ තාපය වශයෙන් වියහැකියි. කොහොම හරි උණුසුම් බව වැඩිවෙද්දී කිසිම පැළෑටියක් එතැන වැවෙන්නෙ නෑ. ශාපලත් සොහොන ඇතුළෙත් සිදුවෙන්නෙ මේම ක්‍රියාවලියම වෙන්න පුළුවන්"

"උදාහරණයක් කිව්වොත්.....?"

"මටත් මුලින්, එක්වරම ඒ ගැන හිතාගන්න බැරිවුණා" ඔහු කීය. "ටිකක් කල්පනා කරද්දියි මට මතක්වුණේ පිච්බ්ලෙන්ඩ් ගැන"

"පිච්බ්ලෙන්ඩ්? ඒ මොනවද?"

"ඔබ අහල නැද්ද වොට්සන් පිච්බ්ලෙන්ඩ් ගැන? ඒ තමයි යුරේනියම් නම් මූලද්‍රව්‍යය ලබා ගැනීම සඳහා පොළොවෙන් ලබාගන්නා ඉල්ලමක්. රසායනික සංඝටක හා අපද්‍රව්‍ය අඩංගු පිච්බ්ලෙන්ඩ් ලෝකයේ විවිධ තැන්වල ස්වාභාවිකව පිහිටලා තියෙනවා. ජර්මන් පතල්කම්කරුවන් බොහොම කාලයක ඉඳල මේ ගැන දැන හිටියා. ඒකෙන් තමන්ගේ ඇඟ පිළිස්සෙන්න පුළුවන් බවත්, ලෙඩරෝග හැදෙන්න පුළුවන් බවත් ඔවුන් දැනගෙන තිබුණා.

මහාචාර්ය මොරියාටි සමඟ සටනින් පස්සේ මං අතුරුදන්ව සිටි කාලයේ මං කළ කටයුතු ගැන ඔබට කිව්වා මතකද? මතක නෑ? ඇයි මං ගිය අවුරුද්දෙදි ප්‍රංශයේ මොන්ට් පෙලියර් රසායනාගාරයේ නොයෙක් රසායනවිද්‍යා පරීක්ෂණවල යෙදී හිටියා නොවැ. එයින් එකක් ගල් අඟුරු තාර ආසවනය කිරීමේ පරීක්ෂණ.

මොන්ට් පෙලියර්හි රසායන හා භෞතික විද්‍යා පර්යේෂණවල යෙදුණු විද්‍යාඥයින් විශාල ගණනක් හිටියා. යුරෝපයේ විවිධ රටවලින් පැමිණ සිටි අය මට හමුවුණා.

මා සමඟ එකට පර්යේෂණවල යෙදුණු ප්‍රංශ ජාතික භෞතික විද්‍යාඥයෙක් හිටියා. ඔහුගේ ලොකු උනන්දුවක් තිබුණේ විද්‍යුත් චුම්බකත්වය ගැන. ඔහුගේ නම ජාක් කියුරි. ඔහු මට අඳුන්වලා දුන්නා, ඔහු සමඟ එකට පර්යේෂණ කළ, රසායන හා භෞතික විද්‍යාඥයන් කිහිපදෙනෙක්ම. එක්කෙනෙක් තමයි බෙකරල් නම් විද්‍යාඥයා. තවත් කෙනෙක් ජාක් කියුරිගේ සොහොයුරා පියරි කියුරි. ඔහුත් හරිම දක්ෂයෙක්. ඔහු වයස අවුරුදු 16දී භෞතික විද්‍යාව ගැන උපාධියක් ලබාගෙන තිබුණා. පියරි කියුරි විවාහ


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

ගිවිසගෙන හිටි පෝලන්ත ජාතික විද්‍යාඥවරියක් හිටියා. ඇගේ නම මාරි ස්ක්ලොඩොව්ස්කා. ඇයත් මේ පරීක්ෂණවලට සහභාගි වුණා. ඔවුන් හැමදෙනෙකුම කිව්වේ පිච්බ්ලෙන්ඩ්වලින් මොකක් හරි අපට නොපෙනෙන ශක්තියක් නිකුත්වෙන බව. බෙකරල්ට දකින්න ලැබිල තිබුණා මෙහෙම දෙයක්. ඡායාරූප ගැනීමට යොදගන්නා දළසේයා තහඩුවක් මත යුරේනියම් ලවණයේ ස්ඵටික කීපයක් ගෙන අන්ධකාරයේ තැබුවාම, අර ස්ඵටිකවල සේයාව, දළසේයා තහඩුවේ සටහන් වෙනවා. සේයා තහඩුව රසායන ද්‍රව්‍යවලින් සෝදලා ගත්තාම ඒක පැහැදිලිවම දකගන්න පුළුවනි. ඔවුන් කියන්නේ යුරේනියම්වල අපේ ඇහැට නොපෙනී පිටවී යන යම්කිසි ශක්තියක් හෝ බලයක් තිබෙන්න පුළුවන්ලු"

"දෙයියන්ට ඔප්පුවෙච්චාවේ" මට කියැවිණ. "මේක නවීන විද්‍යාවට වඩා ඉන්ද්‍රජාලික් ගුරුකම් වගෙයි මට පෙනෙන්නෙ"

"මං ඔබට සහතික වෙන්නම් වොට්සන්. මෙතැන කිසිම ඉන්ද්‍රජාලික වැඩක් නෑ" හෝම්ස් කීය. "මේවා සම්පූර්ණයෙන්ම නවීන විද්‍යාත්මක සියුම් පර්යේෂණ. මාරි ස්ක්ලොඩොව්ස්කා සහ ඇගේ පෙම්වතා පියරි කියුරි - බාගද මේ වනකොට ඔවුන් විවාහවෙලත් ඇති, ඔවුන් තේරුම් අරගෙන තිබුණා පිච්බ්ලෙන්ඩ්වල සැඟවී තිබෙන, තේරුම් කරන්න බැරි ශක්තියක්....."

"..... හෝම්ස්. අපේ පරීක්ෂණය ගැන කිව්වොත්....." මා පැවසුවේ ඔහු නියම මාතෘකාවෙන් ඉවතට යතැයි සිතෙනි.

"ඒකට තමයි මං මේ එන්නෙ" හෝම්ස් කීය. "මගේ ඇඩ්ල්ටන් නිරීක්ෂණ ගැන කල්පනා කරද්දී, මං අර කියූ විද්‍යාඥයින්ගේ සොයා ගැනීම් උපකාර කරගෙන මට හැකිවුණා යම්කිසි උපකල්පනයකට එන්න. ඒ තමයි මේ ශාපලත් සොහොන ඇතුළත පිච්බ්ලෙන්ඩ් හෝ එවැනි රසායනික ද්‍රව්‍යයක් සඟවා ඇති බව. එතකොට අර හිමදියව් යෑම සහ තණකොළ නොවැවීම තේරුම් ගැනීම අපහසු නෑ. නමුත් කොහොමද ලෙඩ රෝග ඇතිවුණේ? ඒකට අපට පිළිතුරක් ලැබුණා පුරාවිද්‍යාඥ එඩ්ගාගෙන්.

සොහොනෙන් හොයාගත් බර ලෝකඩ බඳුන, එද රාත්‍රියේ කවුරුන් හෝ කඩා විවෘත කර ඇති බව ඔහු දක තිබුණා. ඔහුගේ දළසේයා තහඩු නරක්වුණෙත්, සොහොනේ තිබූ අර ද්‍රව්‍යයේ නොපෙනෙන ශක්තිය නිසා. ඔහු ඒක තේරුම් ගත්තේ නෑ. නමුත්



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com



පසුව ගත් ඡායාරූප යම් තරමකට සාර්ථක වුණේ, අර මිනීමලු ඇඳපු ලෝකඩ බඳුන එතැනින් ඉවත්කළ නිසා. මෙතැන වංචාකාරයා, අපරාධකාරයා සර් ඇන්ඩ්රූ කියලයි එඩ්ගා හිතල තිබුණේ. නමුත් ඇත්තටම හොරකම කරල තියෙන්නේ තරුණ ඇන්තනි ලූවිස්. තාත්තා කැණීම් කරලා ආපසු එනතුරු පුතා බලාගෙන ඉන්න ඇති. තමන් කළ සොයාගැනීම ගැන, සර් ඇන්ඩ්රූ එද රෑ තමන්ගේ පුතාට කියන්න ඇති. එද රාත්‍රී කවුරුත් නින්දට ගියාට පස්සේ, තරුණයා සොහොනේ ගැඹ ලෝකඩ මංජුසාව ඇරලා, අද්භූත ද්‍රව්‍යය තැන්පත්කර තිබූ මැටි බඳුන හොරකම් කර ගත්තා. ඒක තමා ඔහු මේරි කම්පැනියට පසුව ඔපන්වලා තිබුණේ. ඔහු ඒ විදියට හොරකම් කළේ තාත්තා ඔහුට මුදල් නොදුන් නිසා. එක් පැත්තකින් තාත්තාගෙන් පළිගන්නා. අනික් පැත්තෙන් මේ වටිනා වස්තුවක් කියා ඔහු සිතූදෙය විකුණා මුදල් ගන්න. නමුත් අන්තිමට ඒකෙන් තරුණයා කළේ මරණය ළංකර ගැනීම."

"හැබෑ තේන්නම්" මම කීවෙමි. "දැන් නම් මට කාරණා ටික ටික පැහැදිලි වෙනවා. ඔය කියනු භයානක දෙයින් මොකක් හරි භයානක රශ්මියක් පිටවෙන්න ඇති. ඔහු ඒක ඇඳයට තියාගෙන නිදගත්තා නම් ඉතිරි හරිය අපට හිතාගන්න පුළුවනි"

"හරියට හරි වොට්සන්. මං ඒකයි ඔබට කිව්වේ, අප යන මාර්ගය අපරාධයකින් අවහිරවී ඇති බව. මේ විනාශකාරී බඳුන "ගෝට් ඇන්ඩ් බූට්ස්" තානායම අවට ගමේ අනික් අයටත් බලපෑම් ඇතිකළා. සමහර දෙනෙකුට මරණය හා බරපතල රෝග ඇති කළා. තවත් සමහර අයගේ රෝගවලට එයින් යහපතක් වුණු බවයි පෙනෙන්නේ."

"හෝම්ස් මට එක් ප්‍රශ්නයක් තියෙනවා" මම කීවෙමි. "එද එඩ්ගා අපට කිව්වා ශාපලත් සොහොනේ ඔවුනට හමුවූ ලෝකඩ මංජුසාව එසවීමට බැරි තරම් බර බවත්. ඒ නිසා එතැන තියෙන්න ඇරලා, රෑ පිටවෙලා ආ බව. ඉතින් ඇන්තනි ලූවිස් තරුණයා කොහොමද ඒක තනියෙන් එළියට ගත්තේ? අනික ඔහු පිට පළාතක කෙනෙක්. ඔහු කොහොමද විල්ලුව මැද කඳුගැටයේ තිබුණු සොහොන හොයාගත්තේ?"

"ඔය කරුණ ගැන මටත් මතක්වුණා වොට්සන්. සොහොන තිබුණු තැන හොයාගැනීම නම් ඔහුට අමාරුවෙන්න නැහැ. ඒ



http://sherlockholmesinvestigations.blogspot.com

මොකද එඩ්ගාම අපට කිව්වා, තරුණයා සර් ඇන්ඩ්රූ හොයාගෙන ඔවුන් කැණීම් කළ තැනට ආවා කියල. ඊළඟට ඔවුන්ගේ කැණීම් උපකරණ, බොහෝවිට කුඩාරමක් ඒ ස්ථානයේ තියෙන්න ඇති.

අර බර මංජුසාව එළියට ගත්ත හැටි ගැන කියනවා නම් මං හිතන්නේ ඇන්තනි ලුවිස්ට උදව්කාරයෙක් ඉන්න ඇති. සැකයක් නෑ ඒ "ගෝව්" තානායමේ ඔහුගේ මිත්‍රයා; ජෝර්ජ් නම් සපත්තු ඔපදමූ ඉලන්දරියා. දවල් දවසෙ ඇන්තනිගේ හමුදාවෙ කටයුතු අසා දැනගනිමින් හිටි ජෝර්ජ් හොඳ මිත්‍රයෙක් බවට පත්වෙන්න ඇති. රාත්‍රියේ සොහොන හාරන්න යද්දි, ඇන්තනි වෙන කාටද කථාකරන්නෙ, තමන්ගේ තරුණ ශක්තිමත් මිත්‍රයාට මිස?"

"බාගවෙලාවට ඒ ජෝර්ජ් තරුණයා ඉක්මනින් රෝගී වෙලා මියගියේ ඒ නිසාම වෙන්නත් ඇති?" මම කීවෙමි.

"සැකයක් නෑ. ඒක තමයි" හෝම්ස් මා කී දෙය අනුමත කළේය. "ඒක නෙමෙයි වොට්සන්, මොකක් ගැනද අපි කිය කිය හිටියෙ?..... ආ අර ගමේ සමහර අයගෙ ලෙඩ රෝග හොඳවුණු එක ගැන. හෙන්ට්‍රි මහත්මියගේ, මේරි කුමිංස්ගේ ලෙඩරෝග හොඳවුණු එකෙන් පෙනෙන්නේ, මේ භයානක ද්‍රව්‍යය කුමක්වුවත්, ඒක සම්පූර්ණයෙන්ම විනාශකාරී එකක් නොවෙයි කියලයි. එහෙම නේද? යුරෝපා මහාද්වීපයේ මේ පිළිබඳ පරීක්ෂණ කරන අපේ මිත්‍රයන්ට හැකිනම්....."

"මොකක් කරන්නද?" මම ඇසීමි.

"මේ අද්භූත ශක්තිය හෝ බලවේගය යම් ආකාරයකට පාලනය කරලා, ඒක ප්‍රයෝජනයට ගන්න..... එහෙනම් ඒක ආශිර්වාදයක් වේවි. මතක තියාගන්න වොට්සන්. ලෙඩරෝග හොඳ කරන්න කියලා ඔබ සහ ඔබේ මිත්‍රයන් වෛද්‍ය විද්‍යාවේ පාවිච්චි කරන ඖෂධ මොනවද? ඒවත් මනුෂ්‍ය ශරීරයට භයානක විෂ. නමුත් ඒවා ඉතා සුළු ප්‍රමාණවලින්, ඒවායේ ස්වභාවය වෙනස් කරගෙන යොදගන්නේ ලෙඩරෝග හොඳ කරන්න, මිනිසුන් ජීවත්කරන්න"

"ඒක හරි. මේරි කමිංස්ගේ මොළය ඇතුළේ වැඩෙමින් තිබුණේ ගෙඩියක් බව මට තේරුම් ගන්න පුළුවනි" මම කීවෙමි. "ඒක විනාශකරන්න ඔය භයානක ද්‍රව්‍යයට හැකිවුණා නම්, ඒක ආශිර්වාදයක් විය යුතුමයි. නමුත් ඒකෙ බලපෑමෙන් සර් ඇන්ඩ්රූ මියගියේ ඇයි? ශාපලත් සොහොන මතුපිට තවමත් හිම රැඳෙන්නෙ



http://sherlockholmesinvestigations.blogspot.com



නැත්තෙ ඇයි? තවමත් ඒකෙ මොනවා හරි ඉතිරිවෙලා තියෙනවද?"

"තමන්ගේ පුතා කළ හොරකම සර් ඇන්ඩ්රූ පසුව තේරුම් ගන්න ඇති." හෝම්ස් කීය. "සමහර විට ඇන්තනි තරුණයා පාපෝච්චාරණය කරන්න ඇති. නැත්නම් තානායමේ ඉලන්දරියා ජෝර්ජ්ගෙන් අසා දැනගන්න ඇති. කොහොම හරි ඇන්තනි ළඟ තිබුණු ට්‍රන්ක පෙට්ටිය තමන් භාරයට අරගෙන සර් ඇන්ඩ්රූ ඒක කලින් තිබුණු තැනටම ගිහිං දම්මන්න ඇති. ඒ කරද්දී ඔහුට රශ්මිය හෝ ඒ අද්භූත මොකක් හරි වැදුණු නිසා, ඔහු අවුරුදු දහයක් ජීවත්වෙලා මරණයට පත්වුණා. අර පුරාණ මිනිස්සු ලෝකඩ බඳුනේ පිටත මිනීමළු ඇඳලා හඟවලා තිබුණෙ එහි භයානක බව. නමුත් ඒ සංඥවල වැදගත්කම මුලින් කවුරුවත් තේරුම් ගත්තෙ නෑ."

"ඔබ මොකක්ද මේ ගැන ඉදිරියට කරන්න බලාපොරොත්තු වෙන්නෙ?" මම ඇසීමි. "මේ ගැන මගේ පාඨකයන් වෙත සම්පූර්ණ කථාන්තරයම ඉදිරිපත් කළොත්.....?"

"එපා වොට්සන්! කොහොමටවත් එපා!" මගේ මිත්‍රයා විරෝධය පළකළේය. "ඔබ මේක විස්තර සහිතව ඔබේ පාඨකයන් වෙත ගෙනගියොත් මොකක්ද දන්නවද වෙන්නෙ? මේ ගැන ගැඹුරටම හදාරමින් පර්යේෂණ කරමින් සිටින මගේ මිත්‍රයන්ට ඒකෙන් අසාධාරණයක් වෙනවා. මං ඔබ සමඟ කිව්ව ඔවුන්ගේ සොයාගැනීම තවමත් ජාත්‍යන්තර විද්‍යාඥ සම්මන්ත්‍රණවලදී ප්‍රකාශයට පත්කරල නෑ. මේ පිළිබඳව දිගටම පර්යේෂණ කරල ඔවුන් විශිෂ්ට ලෙස ජයග්‍රහණය කරන බව මට විශ්වාසයි. ඊට කලින් ඔබ මේ ගැන ලොවට හෙළිකළොත්, ඔවුනට ලැබිය යුතු නිසි ගෞරවය නොලැබී යනවා. එපමණක් නොවෙයි. ඒක ඔවුන්ගේ ඉදිරිගමනට බාධාවක්..... ඒක නෙමෙයි වොට්සන්. මේ සිද්ධිය ගැන සම්පූර්ණ විස්තරයක් මං වහාම ලියල යවන්න ඕන මගේ මිත්‍රයා ජාක් කියුරිට."

හෝම්ස්ගේ නියෝගය නිසා මෙම කථාව පාඨකයන් වෙත ඉදිරිපත් නොකිරීමට මම තීරණය කළෙමි. එබැවින් මෙම වාර්තා මගේ "අතිශයින්ම රහසිගත" ලිපිගොනුව තුළට දමා ට්‍රන්ක පෙට්ටියේ තැන්පත් කරන්නෙමි. බෙකරල්, කියුරි ආදීන් ඔවුන්ගේ



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

ජයග්‍රහණ ලොවට හෙළිකළ සඳ, කවද හෝ මේ කථාව පාඨකයා වෙත ගෙන ඒම ගැන සිතා බැලිය යුතුය.

ශාපලත් සොහොනට බාධා නොකළහොත් ඇඩ්ල්ටන්හි අබිරහස් රෝගය නැවත හිස ඔසවීමට ඉඩක් නොමැති බව දන්වමින්, හෝම්ස් සින්තියා ආර්යාවට හා වෛද්‍ය ලියරිට දන්වා යැව්වේය. අපරාධකාරයා තරුණ ඇන්තනි ලුවිස් මිස සර් ඇන්ඩෲ නොවන බව, පුරාවිද්‍යාඥ එඩිගාට යැවූ ලිපියක හෝම්ස් විශේෂයෙන් සඳහන් කළේය. ඒ අනුව එඩිගා මහතා පුවත්පත්වලට ලිපියක් සපයමින්, සර් ඇන්ඩෲ ලුවිස් නිදෙස්කොට, තමා අතින් නොදනුවත්කමින් සිදුවූ වරද ගැන සමාව අයැද සිටියේය.

පසුවදන.

ඇඩ්ල්ටන් ඛේදවාචකය සිදුවී දැන් අවුරුදු විසිපහක් ගතවී ඇත. මේ කාලය තුළදී නවීන විද්‍යාවේ විශිෂ්ට සොයාගැනීම් හා නිෂ්පාදන රැසක් සිදුවුණු බැව් අපට දැකගන්නට ලැබිණ. බෙකරල් පෞද්ගලිකව හෝම්ස් සමග කියා තිබුණේ, එනම් යුරේනියම්වල ඉල්ලම්වලින් පිටවූ අද්භූත "කිරණ" විශේෂය පිළිබඳව ලොවට හෙළිකළේය. ඒ, අපේ පර්යේෂණය අවසන් වූ දිනවලමය. යුරේනියම්වලින් පිටවූ "බෙකරල් කිරණ" වඩාත් ප්‍රබල ලෙස නිකුත්කිරීමේ හැකියාවක් පිච්බ්ලෙන්ඩ්වල අඩංගු යම් ද්‍රව්‍යයකට ඇති බව පෝලන්ත ජාතික විද්‍යාඥවරියක් සොයාගත්තාය. ඒ මාරි ස්ක්ලොඩොව්ස්කාය. ඇය මේ වනවිට පියරි කියුරි සමග විවාහවී මාරි කියුරි බවට පත්ව සිටියාය. ඔවුන්ගේ ඒ සොයාගැනීම් වෛද්‍ය විද්‍යාවේ ප්‍රතිකාර සඳහා යොදාගැනුන මේ වනවිටත් මිනිස්ජීවිත දස දහස් ගණනක් බේරාගැනීමට සමත්වී ඇත.


http://sherlockholmesinvestigations.blogspot.com

# රතුවත හැඬි කත

1885 සිට 1890 දක්වා කාලය එංගලන්තයේ අපරාධකාරයින් විශාල ලෙස ක්‍රියාත්මක වූ කාලයක් බව, මගේ සටහන් පරීක්ෂා කිරීමේදී පෙනීයයි. මෙයින් බොහොමයක් දෙනා එම සමාජ විරෝධී කටයුතුවල නිරතවූයේ අතිශයින්ම රහසිගතවය. එයින් සෑහෙන ගණනක් දෙනා හෝම්ස්ගේ උදව්වෙන් පොලීසිය මගින් අත්අඩංගුවට ගැනිණ. අතළොස්සක් පමණක් නීතියේ රැහැණින් ගැළවී පලායාමට සමත්විය.

චාල්ස් ඔගස්ටස් මිල්වර්ටන්, රයිගේට් ප්‍රහේලිකාව, නැපැලෙන් ආ තෑග්ග නමින් මා ඉදිරිපත් කළ කථා මේ යුගයට අයත් ඒවාය. ශ්‍රීමත් ස්පෙන්සර් තර්ස්ටන්ගේ ඛේදජනක මරණය, ලීබඩු වෙළඳසලක බිම්මහලේ පවත්වාගෙන ගිය සුඛෝපභෝගී යාචක සංගමයේ කථාව, ඕලන්ද රජපවුල හා බැඳුණු අතිශය රහසිගත සිදුවීම මෙතෙක් ඉදිරිපත් නොකළ කථා කිහිපයකි. ඒවා පාඨකයා වෙත ඉදිරිපත්කිරීමට මම කිහිපවාරයක්ම මගේ මිත්‍රයාගෙන් අවසර ඉල්ලා සිටියෙමි. එහෙත් මෙතෙක් ඊට අවසර නොලැබිණි. ඒවා අනාගතයේදී ඔබ වෙත ගෙන ඒමට හැකිවෙතැයි විශ්වාස කරමි.

එය අප බේකර් වීදියේ නිවහනේ ගතකළ තවත් නිහඬ දිනයකි. කලින් ද රාත්‍රියේ සිටම දනුණු හිසකැක්කුමක් නිසා උදෙන්ම ඇඳට වූ මගේ මිත්‍රයා, උදේ දහය පමණ වෙද්දී විසිත්තකාමරයට පැමිණියේය. ඒ ඔහුගේ ස්ට්‍රැඩිවේරියස් වයලීනය ද අතින් ගෙනය. ගිනිඋදුන සමීපයේ අසුනකට වූ ඔහු, පැය කාලක් පමණ ශෝකය දනවන ආකාරයේ වාදනයක යෙදුණේය. මීළගට ඔහු එය නවත්වා තියුණු හඬක් නැංවූ කෙටි වාද්‍යඛණ්ඩ රැසක් වාදනය කළේය. එහි කිසිදු මිහිරි බවක් මට නම් නොදැනිණ. මීළගට වයලීනය පසෙකින් තැබූ හෝම්ස්, පයිප්පය මුව රඳවාගෙන එය දල්වාගත්තේය. ලා නිල් පැහැති දුම්ගුළි කිහිපයක් ඉහළ නැංවූ ඔහු, දෙනෙත් සිවිලිම දෙසට යොමුකළේය. ඒ, යමක් කීමට සූදානමෙන් බැව් මම තේරුම් ගතිමි.


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

"වොට්සන්, මං දුටුවා ඔබ මෑතකදී පාඨකයා වෙත ඉදිරිපත් කළ කථාන්තර හත අටක්ම. ඒවා හැමඑකක්ම පාඨකයන් කියවීමට ප්‍රියකරනා, සිත් ඇදගන්නා ශෛලියකින් ලියැවී තිබෙන බව ඇත්තයි..... ඒ වුණත්....."

"ඇයි හෝම්ස් ඒ වුණත් කියන්නෙ? මොකක්ද ඒවල තියෙන වැරැද්ද?"

"වැරැද්ද මෙකයි. මං පරීක්ෂණවලදී කරුණු සියුම්ව නිරීක්ෂණය කරන ආකාරය, ඔබ කථාවල ඉදිරිපත් කර ඇති හැටි, හොඳ මදි. ඒවා මගින් මං නිගමනවලට ආ අයුරු සාමාන්‍ය පාඨකයාට ප්‍රමාණවත් ලෙස තේරුම් කර නෑ....."

"මෙකයි හෝම්ස්" මම කීවෙමි. "කථාවක් කීමේදී, ඔබ නිරීක්ෂණවල යෙදුණු හැටි දිගින් දිගටම විස්තර කරන්න ගියාම, කථාව නීරස වෙනවා.. ඒ වගේමයි නිරීක්ෂණ මගින් නිගමනවලට පැමිණි හැටි කීමත්. ඒවා හුඟක්ම වැදගත් බව ඇත්තයි. ඒත් ඒවා නිසා කතා රසයට බාධාවක් වෙන්න හොඳ නෑ"

"ඒ වුණත් වොට්සන්, ඇයි ඔබ, මම දුම්බොන පිළිවෙළ, මගේ ඇඳුම් පැළඳුම්, මං කනබොන හැටි ගැන, දිගටම විස්තර කරන්නෙ? මං දුම්බීමට යොදගන්නේ වෙරිවුඩ් පයිප්පයක්ද, පිගන්මැටි පයිප්පයක්ද කියන එක පාඨකයාට වැදගත් නෑ. අනික මං විවිධ අවස්ථාවලදී යොදගන්නා දුම්කොළ වර්ග ගැන පවා ඔබ කියනවා. ඒව මොනවටද පාඨකයන්ට?"

"මගේ හිතවත් මිත්‍රයා" මම කීවෙමි. "ඔබේ දුම්බීම ගැන නම් මේ වෙලාවේ මතක් කළ එක හොඳයි. ඒ ගැන පාඨකයාට කිව්වෙ ඇයි කියන එක මං පසුව කියන්නම්. නමුත් මේ ටික අහන්න. ඔබේ ඔය දිගින් දිගටම එන හිසකැක්කුමට හේතුව නම් දුම්බීම බව මට විශ්වාසයි. අනික ඔබ මෑතකාලයේ පරීක්ෂණ හත අටකම යෙදුණා, කිසිම විවේකයක් නොගෙන. විශේෂයෙන්ම ඕලන්ද රජපවුල ගැන ගැටලුවේදී හේග් හා ඇම්ස්ටඩෑම්වලදී යෙදුණු පරීක්ෂණ. ඊළඟට ඉක්මනින්ම ශ්‍රීමත් ස්පෙන්සර් තර්ස්ටන්ගේ මරණය ගැන හොයන්න පටන්ගත්තා. මට මතක හැටියට ඔබ දිනකට පැය 16ක් 18ක් නොකඩවා මහන්සිවුණා. එහෙම මහන්සිවීම ඔබේ ශරීර සෞඛ්‍යයට කොහොමටවත් හිතකර නැහැ....."

"ඔන්න ඔන්න වොට්සන්. ඔබ ඔය උත්සාහ කරන්නේ පරණ ගීයක් ගායනා කරන්න. .....මං දන්නවා. ඔබ මට කියන්න හදන්නේ



http://sherlockholmesinvestigations.blogspot.com



පිටපළාතකට ගිහිං හොඳ විවේකයක් ගතකරන්න කියලද?" හෝම්ස් ඇසුවේ මුවපුරා සිනාසෙමිනි.

"මං එහෙමම කියන්නෙ නෑ" මම කීවෙමි. "නමුත් හෙට අපි වෛද්‍ය විශේෂඥයෙකු හමුවෙන්න වෙලාවක් යොදගෙන තියෙන බව අමතක කරන්න එපා. ක්වීන් මේරි රෝහලේ විශේෂඥ වෛද්‍ය ක්වින්සි මොන්රෝ ගැන ඔබට මතක ඇති. ඔහු මටත් ඉගැන්නූ ගුරුවරයෙක්. අපි මුලින්ම ඔහු හමුවෙලා බලමු. ඔහුගේ අදහස මොකක්ද කියලා"

"වෛද්‍යවරයා, මට මේ වැඩකටයුතු ඔක්කොම අත්ඇරලා විවේකගන්න කියාවිද වොට්සන්?" හෝම්ස් මගෙන් විමසුවේ තරමක සැකයකින් මෙන්ම හිතේ කැලඹීමකිනි.

"ඒක ගැන මට නම් මොකුත් කියන්න බෑ මිත්‍රයා" මම පිළිතුරු දුනිමි.

පසුවද අපි ක්වීන් මේරි රෝහල වෙත ගොස් විශේෂඥ වෛද්‍ය මොන්රෝ හමුවීමු. හෘදරෝග මෙන්ම අනෙකුත් කායිකරෝග පිළිබඳ විශේෂඥයෙකු වූ ඔහු, අවුරුදු තිහක පමණ දීර්ඝ පළපුරුද්දක් තිබූ වෛද්‍යවරයෙකි. ස්වභාවයෙන්ම කාරුණික පුද්ගලයෙකු වූ මොන්රෝ හෝම්ස්ගේ රැකියාවේ ස්වභාවය, ආහාරය, දුම්බීම හා විවේකයක් ලැබෙන කාලවේලා ගැන විමසුවේය. එයට පිළිතුරු ලෙස හෝම්ස් පැවසූ කරුණු සියල්ලටම, වෛද්‍යවරයා ඉවසීමෙන් කන්දුන්නේය. අනතුරුව ඔහු දීර්ඝ ලෙස මගේ මිත්‍රයා පරීක්ෂාකර බැලීය.

"ෂර්ලොක් හෝම්ස් මහත්තයා" වෛද්‍ය මොන්රෝ අවසානයේ කථාව පටන්ගත්තේ වෙදනළාව ගලවා ඉවතින් තබා, පුටුවේ පිටුපසට හේත්තුවෙමිනි. "මේ මගේ ශිෂ්‍යයා දොස්තර වොට්සන්, ඔබේ හපන්කම් ගැන, සඟරාවලට ලියන ලිපි, මට විවේක හැමවෙලාවකම මං කියවනවා. මං ඒවා කියවන්නේ බොහොම ආශාවෙන්. ගැටලු සහගත අපරාධ විසඳීමට ඔබ අතිදක්ෂයෙක්. ඒකෙ සැකයක් නෑ. නමුත්....."

එසේ කී වෛද්‍යවරයා නිහඬව හෝම්ස්ගේ මුහුණ දෙස බලාසිට යළිත් මා වෙත නෙත් යොමුකළේය.

"වෛද්‍ය මොන්රෝ, ඇයි ඔබ නමුත් කියල නැවැත්තුවේ?" මම ඇසීමි.



http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස් මහත්මයාගෙ රෝග ලක්ෂණවලින් මට එක් දෙයක් පැහැදිලිවම කියන්න පුළුවනි" වෛද්‍යවරයා කීය. "ඔබ මේ විදියට දිගින් දිගටම නොනවත්වාම වෙහෙසවුණොත්..... .....ඉක්මනින්ම අංගභාග රෝගයට ගොදුරුවෙන්න පිළිවන්!"

මෙය අසා මම තැතිගත්තෙමි. හෝම්ස්ගේ මුහුණේ ද මතුවූයේ තැලැඹුණු ගතියකි.

"තත්ත්වය ඒ තරමටම දරුණුද?" මම ඇසීමි.

"දැනට නම් ඒ තරමම දරුණු නැහැ" වෛද්‍ය මොන්රෝ කීය. "හෝම්ස් මහත්මයාගේ රුධිරපීඩනය තියෙන්නේ හුගක් ඉහළ මට්ටමක. මං දන්නවා ඔබේ රැකියාවේ හැටියට, රෑ දවල් නොබලා අවිවේකීව දිගින්දිගටම වැඩකරන්න සිදුවෙනවා. ඒක ඔබේ හෘදයට හා රුධිරවාහිනී පද්ධතියට කොහොමටවත් හිතකර නැහැ. රුධිරපීඩනය ක්‍රමයෙන් වැඩිවෙලා ඔබේ මොළයේ සියුම් ලේ නහරයක් පිපිරී ගියොත්.....? හෝම්ස් මහත්මයා. මං ඔබෙන් ඉල්ලා හිටින්නේ, දීර්ඝ නිවාඩුවක් ගන්න කියලයි. එක්කො ස්විට්සර්ලන්තයට ගිහිං මාසයක් පමණ ගතකරන්න. නැත්නම් ලන්ඩනයෙන් පිටවෙලා එංගලන්තයේම ඈත පිට්සර පළාතකට යන්න. නැත්නම් මුහුදුබඩ පළාතකට ගිහිං මාසයක් ගතකරන්න. අධික මේදය හා ලුණු අඩංගු ආහාර හා දුම්බීම අඩුකරන්න. මගේ උපදෙස් පිළිගත්තොත් ඔබට දීර්ඝකාලයක් නිරෝගීව ජීවත්වෙන්න ලැබෙන බවට සැක නෑ. දැනට මං ඔබට එක ඖෂධයක් දෙනවා. ඒ සතියක කාලයට පමණයි. හොඳ විවේකයක් ගනිද්දී ඖෂධ උවමනා වෙන්නෙ නෑ. මේ අමාරුව දිගටම තිබුණොත් විතරක් යළිත් මාව හමුවෙන්න"

හෝම්ස්ගේ රෝග තත්ත්වය බරපතල නොවීම ගැන, මම සැනසුම් සුසුම් හෙළුවෙමි. මගේ මීළඟ ඉලක්කය වූයේ, හෝම්ස් දීර්ඝ නිවාඩුවක් සඳහා ඈත පළාතකට කැඳවාගෙන යාමය. මෙවර නිවාඩුව සඳහා ලැංකැෂයර් ප්‍රාන්තයේ, මෝකැම්බි නගරයට මදක් ඈතින් පිහිටි හේෂාම්හි, නිවාඩු නිකේතනයකට යාමට මම තීරණය කළෙමි. ලන්ඩන් නගරයෙන් පිටවී යාමට, තමාට අපහසු බව හෝම්ස් කොපමණ කීවත්, ඊට කන් නොදී මම සංචාරක උපදේශක ආයතනයක උදව්වෙන් තානායමක කාමර වෙන්කරවා ගතිමි.

අප ලන්ඩන් නගරයෙන් පිටත්ව ගියේ එක් හිමිදිරි උදෑසනකය. අඩුම වශයෙන් සති තුනක නිවාඩුවක් වත් ගත යුතුයයි මා පවසද්දී,


http://sherlockholmesinvestigations.blogspot.com



මගේ මිත්‍රයා ඊට විරෝධය පළකළේය. එහෙත් නිදන්ගත රෝගයකට ගොදුරු වී, ඊට නිසි ප්‍රතිකාර නොලැබුවහොත් අත්වෙන ප්‍රතිඵල භයානක බව මම ඔහුට පහද දුන්නෙමි.

"හෝම්ස්. මං ඔබට හැමවිටම කියන දෙයක්" මම කීවෙමි. "මං මේව කියන්නේ මිත්‍රයෙක් හැටියට පමණක් නොවෙයි. ඔබේ පෞද්ගලික වෛද්‍යවරයා හැටියටත්"

"මං දන්නවා වොට්සන්, මං දන්නවා" යනු කීවේ අප ගමන් කළ පළමුවැනි පංතියේ දුම්රිය මැදිරියේ කවුළුවෙන් ඇතුළට ආ, සිසිල් සුළඟේ පහස විඳිමිනි. "මට හිතට අමාරු බේකර් විදියට ඇවිත් ආපහු හැරිලා යන මගේ අනුග්‍රාහකයන් ගැන."

"ඇයි; අද හෙට ඔවුන්ගේ ගැටලු විසඳාදෙන බවට, ඔබ කාටවත් පොරොන්දු වෙලා තිබුණද?" මම ඇසීමි.

"මොකද නැත්තේ?" හෝම්ස් කීය. "එක්කෙනෙකුට නෙමෙයි මං කීපදෙනෙකුට එන්න කියල තිබුණා. ඔබට මතක ඇති පෘතුගාලයේදී දියේ ගිළී, අබිරහස් ලෙස මරණයට පත්වුණු ඉංග්‍රීසි ජාතික පොලිස් කාන්තාව ගැන සිද්ධිය. ඒක අරගෙන ආවේ ටෝබියස් ග්‍රෙග්සන්. ඊළඟට ඉන්දියාව බලා යාත්‍රාකළ නෞකාවක ගිය ශ්‍රීමත් විලියම් බැසිල් ග්‍රෙගරිට වුණු දෙයක් නෑ. ඔහු ඉන්දියන් සාගරය මැද්දී නැවෙන් අතුරුදන් වෙලා. ඊළඟට රෙබෙකා නිකලස් නම් තරුණ මෙනෙවියක් ගැටලුවක් අරගෙන ආවා. මට ඒක ඔබට කියන්නත් බැරිවුණා....."

"දැනට අපි ඕවා ගැන අමතක කරමු හෝම්ස්" මම කීවෙමි. "සති තුනකට අමතක කරමු. මට මතකයි ලැන්කැස්ටර්වල තියෙනවා හොඳ කෞතුකාගාරයක්. එංගලන්තයේ පැරැණි ලියවිලි හා පෞරාණික කෝර්නිෂ් භාෂාව ගැන ඔබ කරන අධ්‍යයනයටත් මේ ගමන ප්‍රයෝජනවත් වේවි."

සවස්වෙද්දී අපි ලැංකැෂයර් ප්‍රාන්තය වෙත පැමිණියෙමු. ලැන්කැස්ටර් හා මෝකැම්බි අතර දුම්රියක් පීලිපැනීම නිසා දුම්රිය ගමනාගමනය තාවකාලිකව නවත්වා ඇති බැව් අපට දැනගන්නට ලැබිණ. ලොකු අශ්වකරත්තයක් කුලියට ගෙන, අපි මෝකැම්බි හරහා හේෂාම් වෙත පැමිණියෙමු.

අපගේ නවාතැන්පොළ වූයේ හේෂාම් ගම්මානයේ මුහුදු වෙරළ අසබඩ පිහිටි "ග්‍රේට් ඇට්ලැන්ටික්" නම් විශාල සංචාරක නිවහනය.


http://sherlockholmesinvestigations.blogspot.com

කාමර ගණනාවකින් සමන්විත වූ මෙම තානායම, වෙරළට යාබද කඳුගැටයක් මත පිහිටා තිබිණ. අපගේ කාමරයේ ජනෙල් වීදුරුව තුළින් දකියහැකි වූයේ ක්ෂිතිජය දක්වා විහිදුණු අත්ලන්තික් සාගරයයි. සැතපුම් දහස් ගණනක් ඈත සිට මුහුදුරළ සිප ආ සුළඟේ තිබූ ලුණුරසය දෙතොලට දැනිණ. ඒ අමගම මුහුදේ රළ නැඟූ ඝෝෂාව කන්කලු සංගීතයක් මෙන් දවස පුරාම අසන්නට ලැබිණ.

සවස තේ පානයෙන් පසු අපි මුහුදුවෙරළේ ඇවිදීමට ගියෙමු. සංචාරක නිවහනේ විශාල සෙනඟක් ලැගුම්ගෙන නොසිටි නිසා අපට සෑහෙන නිදහසක් දැනිණ. වෙරළේ ඉදිරියට ඇවිද ගිය අපි ගල්කුළක් මත වාඩිවූයෙමු. බොහෝ ඈතින් යාත්‍රා කළ නෞකාවක ඡායාවක් ක්ෂිතිජයට ළංව පෙනිණ. මගේ මිත්‍රයා නිහඬව ඒ දෙස බලාගෙනම සිටියේය.

"බලන්න හෝම්ස්. ලන්ඩන් නගරයේ බේකර් වීදියෙයි, මෙතැනයි තියෙන වෙනස" මම කීවෙමි. "මෙතැන සති තුනක් ගතකරන්න පුළුවන් නම්, මොළයට විතරක් නෙමෙයි; මුළු සිරුරටම ලැබෙනවා හොඳ විවේකයක්. මං හිතන්නේ ඔබේ ඔය ලෙඩරෝග හැමදෙයක්ම හොඳවේවි"

හෝම්ස්ගේ මුහුණට සිනාවක් නැගිණ. ඔහු කතාබහ පටන්ගත්තේ, මා කියූ දෙය අනුමත කරන්නාක් මෙන් හිස සොලවමින් මිනිත්තු කිහිපයක් ගතකිරීමෙන් පසුවය.

"ඔබේ කතාව ඇත්ත වොට්සන්. මේ වගේ අලංකාර නිසංසල තැනක් එංගලන්තයේ තියෙන බව මං කවදාවත් දැනගෙන හිටියෙ නෑ. මං මේ ගමන එන්න කැමැතිවුණේ අර අංශභාග රෝගය ගැන වෛද්‍යවරයා කියූ දේවල්වලට, මගේ හිතේ ඇතිවුණු භය නිසා. නමුත් දැන් නම් මට හිතෙනවා ඉඳලා හිටලා හරි මේ වගේ තැනකට ඇවිත් විවේකයක් ගන්න පුළුවන් නම් හරිම හොඳයි කියලා."

"මේ මහත්වරු පිහිනන්න යනවා නම් වෙරළ තීරයේ උතුරු පැත්තට යන්න" තානායමේ පාලකයා අපට පැවසුවේ පසුවද අප උදේ ආහාරය ගනිමින් සිටියදීය. "මේ ඉස්සරහ තිබෙන පඩිපෙළෙන් මුහුදට බැස්සාම, වෙරළ පාළුයි. යාර දෙසීයක් ඇවිදගෙන ගියාම හොඳ නාන හරිය. හැතැක්ම කාලක් ඉස්සරහට ගියොත් හම්බවෙනවා රෂ්ටන් ධීවර ගම්මානය. තවත් ඉස්සරහට ගියොත් වැල්මත් ගම හා ධීවර වරාය. මේ දිගටම නාන්න, මුහුදෙ සැරිසරන්න හරියට සෙනඟ එනවා."


http://sherlockholmesinvestigations.blogspot.com



"ඒ හරියෙ මුහුදු රළ එච්චර සැර නැතුව ඇති?" මම ඇසීමි.

"මේ මෝකැම්බ් බොක්කෙ කොයි හරියකවත් මුහුදු රළ එච්චර ප්‍රචණ්ඩ නෑ." තානායම්කරු කීය. "නමුත් මිනිස්සු රෂ්ටන් හරියෙ කිමිදෙන්නෙ වෙනත් අදහසකින්"

"ඒ මොකටද? විසිතුරු මසුන් අල්ලන්නද?"

"නෑ මහත්මයා. මීට අවුරුදු 70කට 80කට එපිට මුහුදුබත් වුණු නැවක සුන්බුන් තියෙනවා රෂ්ටන් වෙරළ කිට්ටුව. මේ ළඟදීත් කිමිදුණු කීපදෙනෙකුට රන්කාසි ගොඩක් ලැබිල තිබුණා."

"හැබෑට? ඒ ගැන විස්තර මොකුත්ම අපි දැනගෙන හිටියෙ නෑ?" හෝම්ස් කීය.

"මෙකයි මහත්තයා වෙලා තියෙන්නේ." තානායම්කරු කීවේ. අපේ කෝප්පවලට තේ වත්කරමිනි. "1810, 1820 අතර කාලෙ "මේරි එලිසබෙත්" කියන ඉංග්‍රීසි නැව ලිවර්පූල් වරායෙන් නිව්යෝක් බලා යාත්‍රාකරල තියෙනවා. මේකෙන් ඇමරිකාව බලා ගමන් කළේ ධනවත් ඉංග්‍රීසි ව්‍යාපාරිකයන් පිරිසක්ලු. ඔවුන්ගේ අරමුණ වෙලා තියෙන්නෙ ඒ කාලේ මේ රටේ හොඳ ඉල්ලුමක් තිබුණු ඛනිජ ද්‍රව්‍ය අරගෙන එන්නලු. ඒවාට ගෙවීම සඳහා ඔවුන් රත්රන් කාසි හා රත්රන් පොලු පෙට්ටිවල පටවා නැවේ ගෙනිහිං තියෙනවා. ලිවර්පූල් වරායෙන් පිටවුණු නැවට දවස් බාගයක් ඉදිරියට යන්න හම්බවුණේ නෑ. ඒ පැත්තෙන් හමා ආව මහා කුණාටුවකට අහුවුණා. හමාපු කුණාටුවෙ තදකමට නැව් කප්පිත්තා, නැව ආපහු හරවාගෙන එන්න තීරණය කළාලු. නමුත් ඔහුට නැව ලිවර්පූල් වරායට ගෙනියන්න වත් හැකියාවක් තිබිල නෑ. මෝකැම්බ් බොක්ක දිහාට ගහගෙන ආව නැව ගල්පරයක වැදිල සුනුවිසුනු වුණාලු. ජීවිතය නැතිවුණේ නම් එක නාවිකයෙකුගේ විතරයි. අනික් හැමෝම ජීවිත බේරාගත්තා!"

"අපි අද ඒ පැත්තට ඇවිදින්න යමු" මම යෝජනා කළෙමි.

"ඇවිදින්න වුණත් පිහිනන්න වුණත් වඩාත් හොඳ ඒ පැත්ත තමයි මහත්මයා" තානායම්කරු කීය. "ඒ මොකද දකුණට ගියොත් වෙරළ අයින දිගටම හුගක් ගල්පර තියෙනවා. මුහුද ගැඹුරත් වැඩියි. පහුගිය කාලෙ ඒ පැත්තෙ යෝධ මෝරෙක් සැරිසැරුවා කියල, මාළු මරන්න ගිය අය කියනවා. ඒ ඔක්කොටම වඩා විෂ සහිත මුහුදු මාළුන් ඉන්නේ ඒ හරියේ. ඒ හින්ද ඒ පැත්තේ නාන්න යන එක අවදානම්"


http://sherlockholmesinvestigations.blogspot.com

උදේ ආහාරය අවසන් කළ අපි තානායම්කරුගේ උපදෙස් පරිදි වෙරළ තීරය දිගේ උතුරට ගමන්කළෙමු. එංගලන්තයේ නොයෙක් ප්‍රදේශවලින් පැමිණ සිටි විශාල පිරිසක්, මුහුදේ ස්නානය කරමින් සිටියහ. "මේරි එලිසබෙත්" නෞකාවේ සුන්බුන් එකතුකිරීම ප්‍රදේශයේ තරුණයන්ගේ විනෝදාංශය මෙන්ම රැකියාව බවට ද පත්ව තිබූ අයුරු අපි දුටුවෙමු. මුහුදේ කිමිදී සොයාගත් බඩු, ඔවුහු අලෙවිය සඳහා ගෙන ආහ. එංගලන්තයේ පැරණි කාසි කිහිපයක්, පිගන් මැටිවලින් තැනූ පැරණි පයිප්පයක් හෝම්ස් මිලට ගත්තේය. රාජ්‍ය ලාංඡනය සහිත ලෝකඩ බොත්තම් කිහිපයක් හා නෞකාවක අනුරුවක් මම මිලයට ගත්තෙමි.

"වෙන මොනවද විකුණන්න තියෙන බඩු?" පෞරාණික බඩු අලෙවිකළ එක් තරුණයකුගෙන් මම ඇසීමි.

"හැමදාම උදේට වෙරළට ආවොත් මහත්තයලටම පුළුවනි බලාගන්න" ඔහු කීය. "තාත්ත එහා අය බඩු මිලටගන්නවා. අපි කිසිදෙයක් තියාගන්නෙ නෑ. පොලීසිය ඇවිත් කරදර කරනවා"

පෞරාණික දේවල් රජයට භාර නොදී අලෙවිකිරීම, නීතිවිරෝධී කටයුත්තක් බව එවිට මට සිහිවිය.

"අපේ අයියලා කිමිදෙන්නෙ අන්න අර ඈතින් තියෙන ගල්පරය ළඟ" තරුණයා කීවේ වෙරළට සැතපුම් තුන්කාලක් දියඹ දෙසින්වූ ගල්පරයක් දෙසට අත දිගුකරමිනි. "මේරි එලිසබෙත්" හැපිලා තියෙන්නෙ ඒකෙ - ඉතින් වටිනා බඩු තියෙන්නෙ එතැන. හැබැයි එතැන මුහුද හරි ගැඹුරුයි. අවුරුද්දකට විතර කලින් අපේ යාළුවෙක් එතැන දියේ ගිලිල මැරුණා. මාස තුනකට හතරකට කලින් එක්කෙනෙක් මෝරෙකුට අහුවුණා; යන්තම් පණ බේරගත්තෙ. "මේරි එලිසබෙත්" නැවෙන් මැරුණු එකම නාවිකයා මැරුණේ එතැනදිලු. ඒනිසා එයාගෙ හොල්මන් තියෙනවා කියලයි සමහරු කියන්නෙ. මේක හරි අවදානම් රස්සාවක්."

බ්‍රිතාන්‍ය නාවික හමුදාවේ පැරණි නැව්වල, කාලතුවක්කුවල ඉතා කුඩා ලෝකඩ අනුරූ කිහිපයක්ම ඔවුනට හමුවූ බව මේ තරුණයා කීය. සිහිවටන ලෙස එවැනි දේවල් මිලට ගැනීමට හෝම්ස් මෙන් මම ද දැඩි ආශාවකින් පසුවූයෙමු.

අපි සවස්වරුවේ ලැන්කැස්ටර් පුස්තකාලයට ගොස් "මේරි එලිසබෙත්" නෞකාව ගැන තොරතුරු එක්රැස් කළෙමු. "මේක හරිම සිත්ඇදගන්නා ක්ෂේත්‍රයක් වොට්සන්" හෝම්ස් කීවේ වැදගත්


http://sherlockholmesinvestigations.blogspot.com



පොත් කිහිපයකින් කරුණු සටහන් කරගනිමිනි. "සමුද්‍ර පුරාවිද්‍යාවේ කරුණු එක්රැස් කරන කෙනෙකුට, ඒක තමන්ගේ ජීවිතකාලය තුළදී කරල නිමකරන්න බැරිතරම්. මේ සත්සමුද්‍ර පුරාම ගිළුණු නැව් කොයිතරම් ඇද්ද. ඒවායින් තවමත් හොයාගන්න පුළුවන් වෙලා තිබෙන්නෙ, නැව් ගණන ඉතාම ස්වල්පයයි. ඒවායේ සුන්බුන්වලින් කොයි තරම් දැනුම් සම්භාරයක් එකතු කරගන්න හැකිවේවිද? ඔබට මතක ඇති මීට ඉහතදීත් මං මේකට අදල කාරණයක් කියලා තියෙන බව"

"මොකක්ද? මට නම් මතක නෑ" මම කීවෙමි.

"ඇයි වොට්සන් මං කිව්වෙ. මග අපරාධ පරීක්ෂණ විශේෂඥයෙකු නොවුණා නම්, මට තෝරාගන්න වෘත්තීන් කිහිපයක්ම තිබුණා කියලා... රසායන විද්‍යාඥයෙක්, නළුවෙක්, සංගීතඥයෙක්, සමුද්‍ර පුරාවිද්‍යාඥයෙක්...."

මගේ මිත්‍රයාගේ සිත සම්පූර්ණයෙන්ම වෙනත් පැත්තකට ඇදීයාම ගැන මගේ සිතේ ඇතිවූයේ අපමණ සන්තෝෂයකි. දැන් ඔහුට නිදිමරමින් කල්පනා කිරීමට හැටලු නොමැත. අපගේ විවේක දවස් ගතවී ගියේ අපට ද නොදැනෙන අයුරෙනි. සෑම දිනකම උදේ ආහාරයට පෙර මුහුදේ පිහිනීමට සහ අප ආපසු ආවේ. උදේ දහයට පමණ ය. කුඩා අරුමෝසම් බඩු රැසක් ද එකතුකරගැනීමට අපට හැකිවී තිබිණ. "ග්‍රේට් ඇට්ලැන්ටික්" තානායමේ අරක්කැමියාගේ ආහාර ගැන ද අපි සතුටට පත්වී සිටියෙමු.

මේ අතර ලැන්කැස්ටර් පොලිසියේ පරීක්ෂක රොන් වේලර්ට ද මගේ මිත්‍රයාගේ පැමිණීම ගැන අසන්නට ලැබී තිබිණ. බේකර් වීදියේ සුප්‍රකට ෂර්ලොක් හෝම්ස් මහතාගේ හපන්කම් ඔහු හොඳින් දැනසිටියේය.

"ඒ ගැන නම් අපි ස්තුතිවන්ත වෙන්නූ ඕන වොට්සන් දොස්තර මහත්තයට" වේලර් පැවසුවේ අප හමුවූ මුල් අවස්ථාවේදීමය. "ස්කොට්ලන්ඩ්යාඩ් එකේ ලෙස්ට්‍රේඩ්ලා; ටොබියස් ග්‍රෙග්සන් ලා අපට වඩා ජ්‍යෙෂ්ඨයෝ. ස්ටැන්ලි හොප්කින්සුයි, මමයි පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී ඉගෙනගත්තෙ එකට" වේලර් කීය. විස්ට් ක්‍රීඩා කිරීමේ රුසියෙකු වූ ඔහු ඉතා ප්‍රසන්න පුද්ගලයෙකු විය.

අප හේෂාම් ගම්මානයට පැමිණ හයවැනි දිනය ඇරඹෙද්දී අපට මුහුණදීමට සිදුවූයේ කිසිසේත් බලාපොරොත්තු නොවූ ආකාරයේ සිදුවීමකටය.


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

"මුහුදේ කිමිදෙන්න ගිහින් අනතුරකට ලක්වුණු තරුණයෙක් බරපතල තුවාල ලබල රශ්ටන් මුහුදු වෙරළේ ඉන්නවා. දෙස්තර මහත්තයා ඉක්මනට එක්කගෙන එන්න කිව්වා" තානායමට කඩාවැදී පණිවුඩය දුන් තරුණයා එහාම ආපසු දිවගියේය. අපි තේ කෝප්පයක් බීමටවත් පමානොවී වහා රශ්ටන් මුහුදු වෙරළ වෙත දිවගියෙමු.

අනතුරට පත්ව සිටියේ අවුරුදු විස්සක පමණ තරුණයෙකි. මෝරෙකුගේ ප්‍රහාරයට ලක්ව ඔහු බරපතල තුවාල ලබාසිටියේය. ප්‍රතිකාර කොට ජීවිතය බේරාගත හැකි තත්ත්වයේ ඔහු නොසිටි බව, දුටු වහාම මම තේරුම් ගතිමි. අධික ලෙස ලේ ගලායාම නිසා ඔහු මියගොස් සිටියේය. මා ඒ බව පැවසූ විට එතැන රැස්ව සිටි කිහිපදෙනෙක් හඬා වැලපීමට පටන්ගත්හ.

"හෙක්ටරුයි මමයි හැමදම කිමිදෙන්නේ ලොකු ගල්පරය ළඟ" දෑත් ලෙයින් වැසුණු නාන ඇඳුමෙන් සිටි තරුණයෙක් කීය. "වෙනද විදියටම අපි මුහුදු පතුල දිහා බල බල දියඹට පිහිනාගෙන ගියා. මල්ලි ගියේ මට ඉදිරියෙන්. මං දැක්කා එක සැරේම මට ඉහළින් කළුපාට යෝධ හෙවණැල්ලක් ඉදිරියට ඇදිල ගියහැටි. යෝධ මාළුවෙක් කියල මට හිතිල තත්පර ගණනක් යන්න කලින් මට තේරුණා ඒ මෝරෙක් කියල. මල්ලිට අනතුරු අඟවන්න මට විදියක් තිබුණෙ නෑ. ඌ කට ඇරගෙනම ඉදිරියට ගිහිං හෙක්ටර්ගේ කකුලක් හපාගෙන, කඩාගෙන නොනැවතී පීනුවා. දෙයියනේ! මං දැනගත්තා ඒ මල්ලිගේ අවසානය බව. වතුර ලේවලින් වැහිල ගියා. මං බොහොම අමාරුවෙන් මල්ලිගේ අතකින් ඇදගෙන ගොඩට පිහිනුවා"

යෝධ මෝරා උගේ හනුදෙකේ තියුණු දත්වලින් තරුණයාගේ දකුණු කකුල කලවා ප්‍රදේශයෙන් සපා, කඩාගෙන ගොස් තිබිණි. ප්‍රධාන රුධිර නාලයකින් නොනැවතී ලේ ගලායාම නිසා මරණය ඉක්මනින් සිදුවන්නට ඇත. වහාම පොලීසිය කැඳවීමට මම උපදෙස් දුන්නෙමි. එද දවස අප කාටත් ඉතා ශෝකජනක එකක් වූ බව අමුතුවෙන් කිවයුතු නැත.

"තව ටිකෙන් අපිත් මේ මෝරාට ගොදුරුවෙන්න තිබුණා වොට්සන්" හෝම්ස් කීවේ අතිශය කම්පාවට පත් හඬෙනි. "මුහුදු බත්වුණු නැවේ දේවල් හොයන්න කිමිදුණේ නැතිවුණාට, අපි



http://sherlockholmesinvestigations.blogspot.com



හැමදමත් පිහිනුවේ ඔය හරියෙ නේද? මට මතකයි තානායම් පාලකයා කිව්වා යෝධ මෝරෙක් මුහුදෙ ගැවසෙනවා ධීවරයන් දැකල තිබුණා කියල"

"දැන් ඉස්සරහට මොනව වේවිද කියන්න බැහැ" මම කීවෙමි. "මං අහල තියෙනවා මිනිස් ලේවල රහ බැලුවාම මෝරු දිගටම මිනිස් ගොදුරු හොයාගෙන එනව කියල"

එයට පිළිතුරක් නොදුන් මගේ මිතුරා හිස් බැල්මෙන් බලාසිටියේය. මළසිරුර මෘතශරීරාගාරයට ගෙන යාමට උපදෙස් දී ඇති රොන් වේලර්, අප දකිමට "ග්‍රේට් ඇට්ලාන්ටික්" තානායම වෙත පැමිණියේය.

"මට දැනගන්න ලැබුණා, ඔවුන් මුලින්ම පණිවුඩය දුන්නේ වොට්සන් දොස්තර මහත්තයාට කියල" වේලර් කීය.

"ඔව් ඒක ඇත්ත" මම කීවෙමි. "මං යනකොට ඒ ඉලන්දාරියා මිය ගිහින්. එහෙම අනතුරක් ගොඩබිමදී වුණා නම්, ලේ ගලායාම නවත්වලා ජීවිතේ බේරාගන්න තිබුණා. නමුත් හැතැක්ම තුන්කාලක් දුර ඉඳන් ඒ තරුණයාව මුහුදේ ඇදගෙන එන්න සෑහෙන වෙලාවක් ගතවෙන්න ඇති. මනුස්සයෙකුගේ කකුලක් කඩාගෙන යන්න තරම් ලොකු මෝරු, වෙරළ කිට්ටුව ගැවසෙන බව අහන්නත් පුදුමයි"

"පුදුම වෙන්න දෙයක් නෑ වොට්සන් මහත්මයා" වේලර් කීය. "මාස හයකට කලින් ඩෙවොන්වල ඩාට්මත් වෙරළේ මං දැක්කා, මුහුදේ නාන්න ගිය කාන්තාවකගේ අත උරහිස් ළඟින් කඩාගෙන ගිය අවස්ථාවක්. ඒ "ටයිගර්ෂාක්" වර්ගයේ මෝරෙක්ලු. මූත් එහෙම එකෙක් වෙන්න ඇති"

"මේ මිනීමරු සතා දිගටම මේ පැත්තෙ ගැවසෙන්න ගත්තොත් මහා භයානක තත්ත්වයකට යි මුහුණදෙන්න වෙන්නෙ. එහෙම නේද?" හෝම්ස් ඇසීය.

"මේක පුදුමාකාර භයානක තත්ත්වයක්" වේලර් එකඟවිය. "එකපාරක් මිනීකෑවම ඌ නිකං ඉන්නෙ නෑ. තව කීදෙනෙක් ගොදුරු කරගනීවිද කියන්න බෑ. හැබැයි මං හිතන්නෙ නෑ මේ පැත්තෙ මිනිස්සු ඌට පණපිටින් ඉන්න ඉඩඅරීවි කියල. මුළු ගමම කෝපවෙලයි ඉන්නේ. එයාල ජීවත්වෙන්නෙ මුහුද නිසා. මිනීකන මෝරා ගැවසෙන නිසා ධීවර කර්මාන්තය වත් කරගන්න



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

බැරිවෙනවා. මං අහගෙන කියනවා ඌට ඇමක් හැටියට බැටලුවෙක් දල කොහොම් හරි ඌව මරාදමන්න ඕන කියල. අද හවස් වෙන කොටම ඒ වැඩේ පටන්ගනිව්."

පසුවද උදයේ අපි යළිත් එතැනට ගියෙමු. ගල්පර්වත කිහිපයක් අතර යකඩ කම්බි හා යකඩකූරු යොදා සකස් කළ උගුලකට මෝරා ගෙන්වා ගැනීමට ඔවුහු උත්සාහ දරමින් සිටියහ. කලින් දිනයේ ඇමක් ලෙස යෙදූ බැටලුවා, මෝරා විසින් ගොදුරු කරගෙන තිබූ බැවින්, මේ උපාය සාර්ථක වේයයි ඔවුහු විශ්වාස කළහ. "එක සැරයක් බඩපිරෙන්න රසට කෑම ලැබුණු තැනකට ආයෙමත් එන එක ඕනම මාළුවෙකුගේ පුරුද්ද" තරුණයන්ට උදව් කරමින් සිටි වැඩිහිටි ධීවරයෙක් කීය.

මුහුදේ පිහිනීමට යෑම අත්හැර දමා අපි පුවත්පත් හා පොත් කියවීමට පටන්ගත්තෙමු.

තරුණයා අනතුරට ලක්වී මියගියේ 16 වැනිදය. 20 වැනිද දහවල් එකට පමණ ආරංචියක් රැගත් කොලු ගැටයෙක් තානායම වෙත දිව ආවේය.

"අර මිනීකන මෝරා අහුවුණා. මහත්තයලටත් එන්න කිව්වා" කී කොලුවා ආවේගයෙන්ම ආපසු දිවගියේය.

ඉක්මනින් හැඳපැළඳගෙන හෝම්ස් සහ මම රත්ටන් ධීවර ගම්මානයේ වෙරළ වෙත ගියෙමු. විශාල සෙනගක් එහි රැස්වී සිටියහ. දින දෙකක් තිස්සේ රෑ දවල් නොබලා ඔවුන් යෙදූ උත්සාහයෙන් සාර්ථක ප්‍රතිඵල ලැබී තිබිණි. තම ඥාතියා මරා දැමීම ගැන කෝපයට පත් ගම්වාසීන්, අප යනවිටත් මෝරාට මරණීය දණ්ඩනය දී අවසන්ය. හෙක්ටර් එවන්ස්ගේ කඩාගත් කකුල ඉවතට ගෙන, එය දෙව්මැඳුරු සුසාන භූමියේ භූමදාන කිරීම ඔවුන්ගේ අරමුණ විය.

මේ වනවිට මෝරා ගිල දැමූ කකුල ජීර්ණ වී අවසන් විය යුතුයයි මම විශ්වාස කළෙමි. තවත් කිසිවෙකු ඒ බව පැවසුවත් මියගිය එවන්ස්ගේ මිතුරෝ තිදෙනෙක් තියුණු පිහිවලින් මෝරාගේ බඩ පැලීමට උත්සාහ කළහ. එය ඉතා දුෂ්කර කටයුත්තක් වුවත් අන්තිමේදී සාර්ථක විය. කවුරුත් මෝරාගේ ආමාශයේ දැකීමට බලාපොරොත්තු වූයේ එවන්ස්ගේ කකුලේ සුන්බුන් පමණි. එහෙත් එය සෑහෙන තරම් හොඳ තත්ත්වයෙන් ආරක්ෂා වී තිබිණ. ඊට අමතරව තවත් දෙයක් දුටු අපි කවුරුත් මවිතයට පත්වීමු.



http://sherlockholmesinvestigations.blogspot.com



මිනීමෝරා කලින් ගිල දැමූ මිනිස් අතක් ද උගේ ආමාශය තුළ විය!

"දෙයියෝ සාක්කි! මූ තවත් මනුස්සයෙක් මරාදමල වගෙයි" එතැනට පැමිණ සිටි පොලිස්භටයෙක් කීය. "මේ ගැන අපි වහාම ටේලර් මහත්තයට දන්වල යවන්න ඕන."

මෝරාගේ ආමාශය තුළින් එළියට ගත් මිනිස් අත පරීක්ෂා කර බලන මෙන් මම හෝම්ස්ගෙන් ඉල්ලා සිටියෙමි. එහෙත් පොලිස් පරීක්ෂක ටේලර්ගේ අවසරය නොමැතිව එසේ කිරීම නුසුදුසු බව මගේ මිත්‍රයා මගේ කනට කර පැවසුවේය.

පැයක් පමණ බලාසිටි අපි ආපසු තානායම වෙත යාමට තීරණය කළෙමු. පොලිස් පරීක්ෂක රොනල් ටේලර් එතැනට ළඟාවූයේ ඒ මොහොතේදීය.

"ෂර්ලොක් හෝම්ස් මහත්තයා, ඔබටත් රාජකාරියක් පැවරිලා වගෙයි නේද?" ටේලර් ඇසීය. "මෙතෙක් කිසිම කෙනෙක් මෝරෙකුට ගොදුරුවුණු බවක් මට නම් අහන්න ලැබුණෙ නෑ."

"සමහරවිට වෙනත් අසල්වැසි ධීවර ගමකින්ද දන්නෙ නෑ" හෝම්ස් කීය. "මූං වෙරළ තීරය දිගටම දඩයමේ යෙදෙනවා ඇති"

"දැන් ඉතින් මේ අතට පශ්චාත් මරණ පරීක්ෂණයක් පවත්වන්නෙ නැද්ද?" මම ඇසීමි.

"මමත් ඔය ප්‍රශ්නයමයි දෙස්තර මහත්තයා ගෙන් අහන්න හැදුවේ" ටේලර් කීය. "මෙතැන මළසිරුරක් නැති නිසා පශ්චාත් මරණ පරීක්ෂණයක් හෝ ඉන්ක්වෙස්ට් විභාගයක් පවත්වන්න බැරිවේවි. එහෙම නේද?"

"ඔව් ඒක හරි" හෝම්ස් කීය. "මෝරා මේ අත කඩාගෙන ගියාට කවුද දන්නෙ මේකෙ අයිතිකාරයා ජීවතුන් අතර ඉන්නවද කියල. මං හිතන්නේ නෑ මේක, ඔබ කිව් අර, මාස හයකට කලින් ඩෙවොන්වල ඩාට්මත් වෙරළෙදි මෝරෙක් කඩාගත් අත කියල"

"ඔව් ඒක නම් වෙන්න බැහැ" ටේලර් කීය. "කොහොමවුණත් මේක අපි ලැන්කැස්ටර් රෝහලේ මෘතශරීරාගාරය වෙත ගෙන යායුතුයි. මේ ගැන පරීක්ෂාකර බලන්න කියලා මං ඔබට නිල වශයෙන් අයදුම් කරනවා"

පොලිස් නිලධරයා කළ ඉල්ලීමට හෝම්ස් එකඟවූයෙන් අපි දෙදෙනා ආපසු තානායම වෙත පැමිණ, සුදනම් වී කුලීරියකින් ලැන්කැස්ටර් බලා පිටත්වූයෙමු.



http://sherlockholmesinvestigations.blogspot.com

"මෙක කාන්තාවකගේ අතක් බව පැහැදිලිවම කියන්න පුළුවනි" හෝම්ස් කීවේ කිරිගරුඬ මේසය මත කිබු එහි ආවරණය ඉවත්කළ විගසමය. ඒ බව අපට ද පහසුවෙන් දැකගැනීමට හැකිවිය. මීළඟට හෝම්ස් ප්‍රබල විදුලිපහනක් ලංකරගෙන, සිය උත්තලකාචය ද ආධාර කරගෙන මිනිස් හස්තය සියුම්ලෙස පරීක්ෂා කළේය.

උරහිස ප්‍රදේශයෙන් සපා වෙන් කරගත් අතක් වූ එය, මෝරාගේ ආමාශයික යුෂ නිසා මඳක් දුර්වර්ණ වී ඉදිමී තිබිණි. ටේප් පටිය අතට ගත් හෝම්ස් එහි වැළමිටේ සිට මැදගිලි තුඩ දක්වා දිග මැන සටහන් කරගත්තේය. ඇඟිලිවල දිග සහ වැළමිට අසලින් අතේ වට ප්‍රමාණයද මැන බැලූ ඔහු, මීළඟට අවධානය යොමු කළේ ඇඟිලි තුඩු වෙතය. සෑම ඇඟිල්ලකම, ඇඟිලිතුඩු, නියපොතු හා අත්ල කාචයෙන් පරීක්ෂා කරබැලීය. අවසන් වශයෙන් මැණික්කටුව ප්‍රදේශය ද සෝදිසි කළේය. මේ පරීක්ෂාවන් සඳහා පැයකට වැඩි කාලයක් ගත කළ මගේ මිත්‍රයා, අන්තිමේදී සටහන් පොතේ ලියාගත් දේ පිරික්සා බලමින්, ගණනය කිරීමක යෙදුණු බැව් මම දුටුවෙමි.

"මගේ මතකය නිවැරදි නම්, මෝරා හෙක්ටර් එවන්ස්ගේ කකුලක් කඩාගෙන ගිල දැම්මෙ පෙඟෙව්ද..... ඒ කියන්නේ 18 වැනිද. එහෙම නේද?" හෝම්ස් ඇසීය.

"ඔව්"

"මෝරා ගිලදැමූ ගොදුර උගේ ආමාශයික යුෂවලින් ජීර්ණය වෙන්නේ ඉතාම හෙමින්" හෝම්ස් කීය. "ඒයේ කියවූ පොතකිනුයි මට ඒ කරුණ දැනගන්න ලැබුණේ. එවන්ස්ගේ කකුලට වඩා මේ අතට මෝරාගේ ආන්ත්‍රයික යුෂවලින් හානි පැමිණිලා. මොකක්ද ටේලර් ඒකෙන් අපට ගන්න පුළුවන් නිගමනය?"

"මෝරා මේ කාන්තා අතක් කඩාගෙන තියෙන්නේ, එවන්ස්ගේ කකුල සපාකන්න කලින්?" ටේලර් ඇසීය.

"විශිෂ්ටයි මහත්මයා" හෝම්ස් කීය. "ඔබ ඉතාම නිවැරදියි. බොහොම වෙලාවට මේ අත ගිලදමන්න ඇත්තේ 17 වැනිද වෙන්න පුළුවනි. අනික් කරුණ මෙකයි. අර මිනීමස් රසබැලූ මෝරෙක් තවත් වරක් මිනීමස් හොයාගෙන එනවා කියන කතාව ඇත්තක් නම....."

"ඔව් මහත්මයා"


http://sherlockholmesinvestigations.blogspot.com



"මේ අත ගිල දමලා ඒකෙ රසට එවන්ස්ගේ කකුල කඩාගන්නා කියල හිතන්නත් පුළුවන්. එහෙම නේද?" හෝම්ස් ඇසීය.

"ඔව් ඔබ කියන දේ ඇත්ත" ටේලර් කීය. "ඒ වුණත් හෝම්ස් මහත්තයා. අතක් අහිමි වූ හෝ මුහුදේ ගිළුණු කාන්තාවක් ගැන තවමත් - ඒ කියන්නෙ පහුගිය සති දෙක තුන ඇතුළත අහන්න ලැබුණෙ නෑ"

"ඔබේ කතාව නිවැරදි වෙන්න පුළුවනි" හෝම්ස් කීය. "නමුත් මේ අත කඩාගත් කාන්තාව මෝරාට ගොදුරුවුණේ, මොකැම්බ් බොක්කෙදි ම ද කියන කරුණ අපි දන්නෙ නෑ. මේ බටහිර වෙරළ තීරය අවට කොහේදි හරි ඒක සිදුවුණා වෙන්න පුළුවනි."

"හෝම්ස් මහත්මයා" ටේලර් කීය. "එහෙම නම් මේ බටහිර මුහුදුතීරය දිගට, සෑම පොලිස් ප්‍රාන්තයකටම ඒ ගැන දන්වලා විදුලිපුවත් යවන්න මං උපදෙස් දෙන්නම්. මුහුදේ නාන්න ගිහින් අතුරුදන්වුණු හෝ අතක් අහිමිවුණු කාන්තාවක් ගැන තොරතුරු ඇත්නම් අපට දන්වන්න කියන්නම්. හෙට උදේ වෙද්දි ඒ තොරතුරු සියල්ලක්ම ලැබේවි."

"ඒක බොහොම නැණවත් පියවරක්" හෝම්ස් කීය. "නමුත් පරීක්ෂණ අනුව නම් කියවෙන්නේ වෙනස් දෙයක්. ඇගේ අත සිරුරෙන් වෙන්වෙලා තියෙන්නේ මෝරෙකු සපා කෑමෙන්වත් කඩාගැනීමෙන්වත් නොවෙයි. මෝරා එය ගිලදමා තිබෙන බව නම් ඇත්තයි"

"හපාකෑවෙ නැත්නම් කොහොමද ගිල දැම්මේ?"

"අත වෙන්වෙලා තියෙන්නේ මුවහත් පිහියකින් කළ කැපීමකින්"

"දෙවියනේ!" මට කියැවිණි. "ඇය පණපිටින් සිටිද්දී එහෙම දෙයක් කළේ කොහොමද?"

"නෑ වොට්සන්." හෝම්ස් කීය. "මං හිතන්නේ එය කරන්න ඇත්තේ ඇගේ අවසන් හුස්ම පිටවුණාට පස්සේ." හෝම්ස් කියද්දී ඔහුගේ මුහුණට නැගුණේ බැරෑරුම් පෙනුමක් බව මම දුටුවෙමි.

"ඇගේ උරහිසේ මාංශපේශි හැම එකක්ම තියුණු පිහියකින් රවුමටම කපලා" මගේ මිත්‍රයා කීවේ ඒ දෙසට ඇඟිල්ල දිගු කරමිනි. "උරහිස් සන්ධිය වටා ඇති ඇටක පවා මුවහත් පිහියෙන් කපා තිබෙනවා මිස ඉරී නොමැති බව ඔබට පෙනේවි."


http://sherlockholmesinvestigations.blogspot.com

"කාටද එහෙමදෙයක් කරන්න උවමනා වුණේ?" ටේලර් ඇසීය. "එහෙම නම් හෝම්ස් මහත්මයා; මේක මිනීමැරුමකට සම්බන්ධද?"

"මං හිතනවා ටේලර් ඒ සිද්ධිය විස්තර කළහැකි නිවැරදිම වචනය ඔබ පාවිච්චි කළා කියලා; තියුණු දතිරෝදයක් සහිත ලී ඉරණ යන්ත්‍රයක් වැනි යන්ත්‍රයකට හසුවී, හදිසි අනතුරකින් මෙහෙම දෙයක් සිදුවී නැත්නම්....."

"මේ අත පරීක්ෂා කරලා, මොනවද හෝම්ස් මහත්මයා ඔබ හොයාගත් අනෙක් කරුණු?"

"ඔව්, මං ඒ ගැනත් ඔබට කියන්නම්" හෝම්ස් කීය. "මං බොහොම කාලයකට පෙරත් මගේ මිත්‍ර දොස්තර වොට්සන්ට කියා තියෙන දෙයක් තමයි, පුද්ගලයෙකුගේ අත්වලින් ඔහු පිළිබඳ කරුණු රාශියක් හෙළිවෙන බව. මේක විශේෂයෙන්ම අදාළ වෙන්නේ පිරිමියෙකුට. මේසන් වැඩකරන්නෙකුගේ ඇඟිලිවල ස්වභාවය, මුද්‍රණ කර්මාන්තයේ යෙදෙන්නෙකුගේ ඇඟිලිවලට වඩා වෙනස්. නිතරම කතුර සහ දැලිපිහිය භාවිතකරන කරණවෑමියකුගේ ඇඟිලි හා අත්ල වෙනස්, රෙදිකපන ටේලර් කෙනෙකුගේට වඩා. බර මිටියක් ඔසවා යකඩ තලන කම්මල්කරුවෙකුගේ අත, ටෙනිස් ක්‍රීඩකයෙකුගේ හෝ දන්ත වෛද්‍යවරයෙකුගේ අතින් වෙන්කර හඳුනා ගැනීමේ ලක්ෂණ තියෙනවා. මං ඒ ගැන කුඩා පොත් පිංචක් ලියා තිබෙනවා.

රැකියාවල නොයෙදෙන කාන්තාවකගේ අතක් ගත්තාම අපි යම් ආකාරයක ගැටලුවලට මුහුණදෙනවා. නමුත් මට පැහැදිලිවම කියන්න පුළුවනි, මැය බරවැඩ කරන්නියක හෝ කම්කරු ස්ත්‍රියක නොවන බව; මුළුතැන්ගෙයි සේවිකාවක නොවෙයි. ගෘහසේවිකාවකත් නොවෙයි. සෑහෙන තරම් වත් පොහොසත් කම් ඇති තැනැත්තියක්. මියයනවිට ඇඳ සිටියේ රතු පැහැති ඇඳුමක්. බොහොම වෙලාවට ඇය රෙදි හෝ සෙල්ලම් බඩු පින්තාරු කරන තැනක හෝ මුද්‍රණාලයක රැකියාව කරන වෙන්න පුළුවනි."

"ඔබ කොහොමද හෝම්ස් මේ වගේ දේවල් කියන්නේ?" මම ඇසීමි.

"ඒවා තේරුම් ගැනීම ඒ තරමටම අමාරු නැහැ වොට්සන්. ඇය බර ඔසවා වැඩකරන්නියක නොවන බව කීම හරි පහසුයි. ඒ මොකද ඇගේ අතේ මස්පිඩු වර්ධනය වෙලා නැහැ. මුළුතැන් ගෙයි සේවිකාවන්ගේ ඇඟිලි තුඩුවල, නිතර එළවළු ආදිය කැපීමේදී



http://sherlockholmesinvestigations.blogspot.com



ඇතිවන කැපීම් ලකුණු බොහොමයක් දක්නට ලැබෙනවා. නමුත් මැයගේ අතේ තිබෙන්නේ එවැනි එක් ලකුණක් පමණයි. ගෘහසේවිකාවන්ගේ ඇඟිලි පුරුක් දෙකක හෝ තුනකම සම හුගක් රළුයි. ඊට හේතුව ඔවුනට නිතර කරන්න සිදුවන රෙදි සේදීමේ කටයුතු හා උද්‍යානයේ වැඩ. ඒවා එකක්වත් මැයගේ අතේ නෑ.

ඇය ඇඳසිටියේ රතු ගවොමක් බව ස්ථිරයි. ඒ මොකද අත උරහිසෙන් කපා වෙන්කරද්දී ගවොම් අතේ ඉතා කුඩා කෑබැල්ලක් කැපී වෙන්වී, ලේ සමඟ තදින්ම සමට ඇලී තිබෙනවා. ඒක නිල් හා කහ ඉරි මෝස්තරයක් ඇති, තද රතුපාට ගවොමක් වියයුතුයි. ඇය සෑහෙන තරම් වත්පොහොසත්කම් ඇති එකියක බව කීම අමාරු නැහැ. ඒ මොකද ඇගේ නියපොතුවලට ආලේප කර තිබෙන නිය සායම්, පැරිසියෙන් ගෙන්වන ඉතා හොඳ වර්ගයේ ඒවා. අනෙක ඇය කලක් තිස්සේ ඇඟිලි දෙකක මුදු දෙකක් පැළඳ සිටි බවට සලකුණු ඉතිරිවී තිබෙනවා. මේවා මඟුල් මුදු නැත්නම් තරුණියන් අලංකාරය සඳහා පළඳින ඒවාද කියා මට හරියටම කියන්න බැහැ. කෙසේ වෙතත් ඒවා බලෙන් ගළවා ඉවත් කළ බවට සාක්ෂි තියෙනවා. ඒ ඇඟිලිවල සම පළුදු වී ගැලවී ගිහින්. කාරණා දෙකක් නිසා ඒ මුදු ඉවත්කළා කියලා අපට හිතන්න පුළුවනි. එකක් ඒ මුදුවල දියමන්ති වැනි වටිනා මැණික් තිබුණා නම් ඒවා සොරකම් කරගැනීමට. එහෙමත් නැත්නම් මොන ක්‍රමයකින් හෝ අත කාටහරි අහුවුණොත් හඳුනාගැනීම වළක්වන්න."

"ඇය කළ රැකියාව ගැන ඔබ කියුවේ කොහොමද?" පොලිස් නිලධරයා ඇසුවේය.

"ඇයගේ නියපොත්ත යටිමසට සම්බන්ධ වෙන තැන කළුපාට ද්‍රව්‍යයක් තියෙනවා" හෝම්ස් කීය. "ඒක සායම් හෝ තීන්ත වර්ගයක්. මෙම කළුපාට තීන්ත සෙල්ලම් බඩු හෝ රෙදි සායම් කිරීමට යොදගත් තීන්ත වියහැකියි. නමුත් ඒ මුද්‍රණ තීන්ත ද කියල මගේ හිතේ සැකයක් ඇතිවෙනවා. මෝරාගේ ආමාශයික යුෂ සමඟ එහි ප්‍රතික්‍රියාවක් වෙලා තියෙනවා. ඒ නිසා ඒ ගැන හරියටම යමක් කීම අමාරුයි"

"හෝම්ස් මහත්තයා" ටේලර් කීය. "ඔබ කියූ හැමදෙයක්ම හරියි කියමුකෝ. ඔබ කියන හැටියට ඇය මරාදමලා, අතක් කපලා. ඇයි කවුරු හරි ඒක මුහුදට විසිකළේ? කෝ ඇගේ ශරීරයේ අනෙක් කොටස්? මෝරාගේ බඩේ ඒවා නොතිබුණේ ඇයි? හේතුම



http://sherlockholmesinvestigations.blogspot.com

රෂ්ටන්, වැල්මන් මුහුදු තීරයේම, වැඩිහිටියන් හා තරුණයන් පසුගිය දිනවල නිතර ගැවසුණා. කෝ ඇගේ සිරුරේ අනෙක් කොටස්? ඇයි ඒවා මුහුදු රළ සමඟ ගොඩට ආවේ නැත්තෙ?"

"ඒකට හේතුව නිශ්චිතවම කීම අමාරුයි ටේලර්" හෝම්ස් කීය. "එක් හේතුවක් නම්, එය මුහුදු රැල්ල සමඟ දියඹටම ගසාගෙන ගියා වෙන්න පුළුවනි. එහෙම නම් වෙනත් පළාතකට ගොඩගහන්න ඇති; බාගවෙලාවට සමහර කොටස් මුහුදුපතුලට කිඳාබහින්නත් ඇති. එහෙමත් නැත්නම් තවත් මාළුන් විසින් ආහාරයට ගන්නත් ඇති. ඒ එක් විකල්පයක්. ඒක එහෙම වෙන්නේ අපරාධකාරයා සිරුරේ කැබලි මුහුදට දැම්මා නම්. නමුත් තවත් දේවල් වෙන්න පුළුවනි"

"ඒ මොනවද?"

"අපි හිතමු මේ අපරාධකරුවා ශරීරයේ කොටස් රටේ විවිධ ප්‍රදේශවලට ගෙනිහිං දැම්මා කියල." හෝම්ස් කීය. "අපරාධකරුවන් මීට පෙර එහෙම දේවල් කරල තියෙනවා. එහෙම කළා නම් සිරුරේ අනෙක් කොටස් අපට මෙහාම අවටින් හමුවෙන එකක් නෑ. ඒවා රටේ විවිධ පළාත්වලින් හමුවුණු බවට වාර්තා ලැබෙන තුරු බලාගෙන ඉන්න වෙනවා. තවත් දෙයක් වෙන්න පුළුවනි. අපරාධකරුවා මළසිරුර පිටින්ම ලොකු පෙට්ටියක් තුළට දමලා, ඒක උඩට මතුනොවෙන්න ඒක ඇතුළට බරට ගල්දමලා මුහුදට දැම්මා නම්? මුහුදේ ගැඹුරු හරියකට එය දැම්මා නම් එය හොයාගැනීම අමාරුවේවි."

"හොඳයි අපි එහෙම වුණා කියමු" ටේලර් කීය. "ඔබ කියන විදියට පෙට්ටියක් ඇතුළට දමලා, බරක් දමලා මුහුද පතුලට දැම්මා. ඉතින් කොහොමද මෝරාට එක් අතක් විතරක් අහුවුණේ? මුහුද පතුලේදි පෙට්ටිය විවෘතවෙලාද?"

"එහෙම වෙන්නත් පුළුවනි. නමුත් මං හිතන්නේ වෙනත් දෙයක්" හෝම්ස් තවදුරටත් පැහැදිලි කළේය. "මං ඇයගේ අතේ සෑම තැනක්ම ඉතා සූක්ෂ්ම ලෙස පරීක්ෂා කළා. මැණික් කටුව ප්‍රදේශය කඹයකින් ගැටගසා තිබුණු බවට සලකුණු පැහැදිලිවම පෙනෙනවා. වතුර උරාගනිමින් අතේ අනෙක් කොටස් ඉදිමීමට ලක්වෙද්දී, කඹය තදින් ගැටගසා තිබූ හරිය පමණක්, එසේ නොවී ඉතිරිවෙලා තියෙනවා. ඊළඟට මෝරා උගේ දත්වලින් අල්ලා අත අදිද්දී කඹය ගැලවී ගිහින්."



http://sherlockholmesinvestigations.blogspot.com



"එතකොට ඔබ හිතන්නේ...."

"මං නිගමනය කරන්නේ මෙහෙමයි ටේලර්" හෝම්ස් කීය. "අපරාධකරුවා මුළු සිරුරම පෙට්ටියට දමන්න උත්සාහ කරන්න ඇති. නමුත් පෙට්ටිය පිරිගියාම ඔහුට ඒ අත පමණක් ඇතුළට දැම්ම අපහසු වෙන්න ඇති. ඔහු මොකද කරන්නේ? ඔහු ඒක කඹයකින් ගලකට ගැටගසන්න ඇති. බාගවෙලාවට ඒ පෙට්ටියේම කොක්කට ගැටගැසුවා වෙන්නත් පුළුවනි."

"හෝම්ස් මහත්මයා. මේ සම්බන්ධයෙන් මොකක්ද දැන් මං ගතයුතු පියවර?" පොලිස් නිලධාරියා විමසුවේය.

"අනෙක් විකල්ප ගැන මොහොතකට අමතක කරලා, මුහුදු පතුල බලන්න කිමිදුම්කාරයන් යවන එක නුවණට හුරුයි" හෝම්ස් පැවසුවේය. "ඒ අහළ විමසිල්ලෙන් ඉන්න, වෙනත් පළාත්වලින් මොනවා හරි සොයාගැනීම කරනවාද කියල. මට නිකමට හිතෙනවා, මේ අපරාධකාරයා මීට කලින් මේ පළාතට ඇවිත් තියෙන කෙනෙක් කියල. මුහුදේ ගැඹුරු බව, එහෙම තැනකට යාත්‍රාකරන්න පහසුවෙන් බෝට්ටුවක් ලබාගන්න ඇති හැකියාව ඔහු දැනහිටින්න ඇති."

ගල්පරය අවට මුහුදේ කිමිදී මුහුදු පතුල පරීක්ෂාකිරීම සඳහා, පළාතේ කිමිදුම්කරුවන් සොයාගැනීමට, රොනු ටේලර් දැඩි උත්සාහයක් දැරුවේය. එහෙත් මෝර ප්‍රහාරයෙන් එවන්ස් තරුණයා මරුමුවට පත්වීම ගැන, කාගේත් සිත්වල තිබුණේ කැලඹීමකි. මෝරා අසුවුවත් තවත් මෝරුන් ඇතැයි සැකය නිසා මුහුදට බැසීමට කවුරුත් දක්වූයේ චකිතයකි. ඒ අනුව ලන්ඩන් නගරයෙන් පොලිස් කිමිදුම්කරුවන් ගෙන්වීමට රොනු ටේලර් තීරණය කළේය.

"ෂර්ලොක් හෝම්ස් මහතාගේ උපදෙස් පරිදි" යනුවෙන් සඳහන් කර ඔහු යැවූ විදුලිපුවතට, ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියෙන් ඉක්මන් ප්‍රතිචාරයක් ලැබිණි. පොලිස් කිමිදුම්කරුවෝ තිදෙනෙක් එදා රාත්‍රී තැපැල් දුම්රියෙන් මෝකැම්බ් වෙත ළඟාවූහ.

නවීන කිමිදුම් උපකරණවලින් සන්නද්ධව සිටි ඔවුන් මුහුදේ කිමිදෙන ආකාරය නැරඹීමට, විශාල පිරිසක් වෙරළේ රැස්වී සිටියහ. හෝම්ස් සහ මම උදේ ආහාරයෙන් පසු ඒ දෙසට පා නැගුවෙමු. දහවල් වෙද්දී තිබූ දැඩි උෂ්ණය නිසා වෙරළේ රැඳී සිටීම අපහසු වන බවක් පෙනිණි. ධීවරයන්ගෙන් කුලියට ගන්නා ලද බෝට්ටු දෙකක් කිමිදුම්කරුවන්ගේ ආරක්ෂාව සඳහා ඔවුන් අසලින්



http://sherlockholmesinvestigations.blogspot.com

යාත්‍රා කෙරිණි. දහවල් එක පමණ වනතුරු දිගටම කිමිදුණු ඔවුනු, සාර්ථක ප්‍රතිඵල නොලබා ගොඩට පැමිණියහ.

දහවල් ආහාරය ගෙන, පැය දෙකක පමණ විවේකයකින් පසු කිමිදුම් කටයුතු යළිත් ඇරඹෙන බව අපට අසන්නට ලැබිණි. දිවා ආහාරයට තානායමට පැමිණි අපි, සවස හතරට පමණ යළිත් වෙරළට ගියෙමු. කිමිදුම්කරුවන් මෙවර සෝදිසි කළේ රැෂ්ටන්වලට යාබද ගම්මානය වූ වැල්මත්ති මුහුදු තීරයයි. ඉර බැස යාමට ආසන්න වෙද්දී කිමිදුම්කරුවන් නංවාගත් බෝට්ටු ගොඩට එන බව දක්නට ලැබිණ. මුහුදු වෙරළට ළංවෙද්දී ඔවුන්ගේ උත්සාහය සාර්ථක වූ බවට කිමිදුම්කරුවෝ සංඥා කළහ. බෝට්ටුව ගොඩට ඇදගත් වහාම එහි තිබූ කොළ පැහැති විශාල ට්‍රන්ක පෙට්ටියක් අපි දුටුවෙමු.

"මේක තිබුණෙ බඹ 3ක් විතර ගැඹුරේ" එක් කිමිදුම්කරුවෙක් රොන් ටේලර් අමතා කීය. "බොහොම දුරට වැලිවලින් වැහිල වගේ තිබුණෙ. මාළු රංචු හුඟක් ඒ හරිය කැරකුණා. කහපාට කඹය වැල්ලෙන් ඉහළට මතුවෙලා තිබුණා. ඒක නොවෙන්න අපට පෙට්ටිය මග ඇරෙනවා. මේක මුහුදු පතුලට ගිල්ලවන්න, ඒ කඹයෙන් ලොකු කළුගලක් ගැටගහලා තිබුණා. අපි ඒ කඹය කපලයි මේක ගොඩට අරගත්තෙ"

කහපැහැති කඹයක කැබලි තවමත් ට්‍රන්කපෙට්ටියේ දෙපැත්තේ වූ කොකුවල ඉතිරිව තිබිණි. පෙට්ටියේ පියන මත ARA නමින් අකුරු තුනක් පින්තාරු කොට තිබූ අතර එහි මුලින් තිබූ පැහැය කොළ බවද දුටුවෙමු. තැන් තැන් මලකඩ බැඳී තිබූ මෙහි අගුල හොඳින් වසා ලොකු යකඩ ඉබ්බෙකු දමා යතුරුලා තිබිණ.

"හෝම්ස් මහත්තයා" ටේලර් කීය. "අපට හොයාගන්න කියල ඔබ කිව්වේ මේකද?"

"කිසිම සැකයක් නෑ මේක තමයි" හෝම්ස් කීවේ, ඉතිරිව තිබූ කඹ කෑබැල්ල පරීක්ෂා කිරීමට තත්පර කිහිපයක් ගත කළ පසුය. "ඔබ බලාපොරොත්තුවෙන්නෙ මේක මෙතැනදී විවෘත කරන්නද? මං යෝජනා කරනවා ඒ කටයුත්ත සඳහා අපි මේක පොලිස් ස්ථානයට ගෙනයමු කියලා"

හෝම්ස්ගේ යෝජනාව රැස්ව සිටි අයගේ සතුටට හේතුවූයේ නැත. පොලිස් නිලධාරියාගේ උපදෙස් පිට කුලීරියක් කැඳවන ලදි.


http://sherlockholmesinvestigations.blogspot.com



"හෝම්ස් මහත්තයා. ඔබට හිතෙන්නේ නැද්ද මේක කෙළින්ම මෘතශරීරාගාරයටම ගෙන ගියොත් හොඳයි කියලා?" පොලිස් නිලධාරයා විමසුවේ ඒ වනවිටත් ට්‍රන්ක පෙට්ටිය වෙතින් නැගුණු දුර්ගන්ධය නිසා මැස්සන් රැසක් ඒ දෙසට ඇදී ආ බැවිනි.

"ටේලර් මහත්මයා" හෝම්ස් කීය. "කළයුතු සුදුසුම දේ එයයි. ඔබ මේකත් අරගෙන යන්න. අපි තානායමට ගිහිං ඇඳුම් මාරුකරගෙන එන්නම්. තවත් කරුණක් තියෙනවා ඔබට මතක් කරන්න. මේ ගැන කිසිම දෙයක් පුවත්පත්වල පළවෙන්න ඉඩතියන්න එපා. ඒක අපේ ඉදිරි පරීක්ෂණ කටයුතුවලට බාධාවක් වේවි."

"හොඳමයි මහත්මයා"

ට්‍රන්ක පෙට්ටිය පටවාගෙන පොලිස් නිලධරයන් පිටත්ව ගිය පසු අපි ආපසු තානායම වෙත පැමිණියෙමු. මේ වනවිට රෑ බෝවී තිබිණ. තවත් පැය භාගයක් ප්‍රමාදවිය හැකි නම් අපට රාත්‍රී ආහාරය ලබාදිය හැකි බැව් තානායම්කරු කීය.

"ඔබට ස්තුතියි මහත්මයා" හෝම්ස් කීවේ මා දෙස බලා ඉඟිකරමිනි. "අපි මේ ලැන්කැස්ටර් වෙත යන්නෙ මෘතශරීරයක් පරීක්ෂා කරන්න. රෑ කෑම කාල ඊකට යනවිද, නැත්නං ගිහිං ඇවිත් කනවද කියන එක මට කොහොමටවත් හිතාගන්න බෑ. මට නම් හිතෙන්නේ අපි අද රෑ කෑම ගැන අමතක කරලා හෙට උදේ කෑම ගැන හිතුවොත් හොඳයි කියලයි"

තානායම් පාලකවරයා පුදුමයෙන් මෙන් බලා සිටියදී අපි කුලීරථගාල වෙත ගියෙමු. වැඩි පමාවකින් තොරව ලැන්කැස්ටර් රෝහලේ මෘතශරීරාගාරය වෙත යෑමට අපට හැකිවිය.

ඉබ්බයතුරු කඩා පෙට්ටිය විවෘත කරන ලදි. එය ඇතුළත තිබුණේ කිසිසේත් ප්‍රසන්න දසුනක් නොවේ. මුහුදුවතුර ද ඇතුළට කාන්දුවී තිබීම නිසා තත්ත්වය තවත් නරක අතට හැරී තිබිණි. අප බලාපොරොත්තු වූ අයුරින්ම එහි තිබුණේ කොටස්වලට වෙන්කළ කාන්තා මළසිරුරකි. කකුල් දෙක, අතක් හා කඳ වෙන්වෙන් වශයෙන් ඔතා තිබිණි. ඒ සඳහා පාවිච්චිකර තිබුණේ විශාල කඩදාසි හා රෙදි කැබලි කිහිපයකි. ලෙයින් පෙඟුණු ඒවා දුර්වර්ණ වී තිබිණ. මා ශල්‍ය වෛද්‍යවරයෙකු වුවත්, යුදබිමේ අත්දැකීම් ඇතත් සංවේදී පුද්ගලයෙක්මි. පශ්චාත් මරණ පරීක්ෂණවල ද යෙදී ඇත්තෙමි. එහෙත් ට්‍රන්ක පෙට්ටිය තුළ තිබුණේ මට බැලීමට අපහසු බිහිසුණු දසුනකි.


http://sherlockholmesinvestigations.blogspot.com

මළසිරුර මෙ වනවිටත් නරක් වීමට පටන්ගෙන තිබු නිසා එතැනින් නිකුත්වූයේ දැඩි දුර්ගන්ධයකි. තම රාජකාරි කටයුතු කිරීම සඳහා පොලිස් ශල්‍ය වෛද්‍යවරයා එහි පැමිණියේය. හෝම්ස් ඔහු සමඟ කතාබස් කරන අතරේ මම මෘතශරීරාගාරයෙන් එළියට පැමිණියෙමි.

හෝම්ස්ට එතැනින් එළියට ඒමට පැයකට වැඩි කාලයක් ගතවිය. "වොට්සන් ඔබ මාව එක්ක ආවෙ හොඳ විවේකයක් ගන්න කියල නේද?" ඔහු ඇසීය. "මට විවේකයක් ගන්න නම් ඉඩක් ලැබෙන එකක් නෑ. මෙතැන අබිරහස් මිනීමැරුමක් සිදුවෙලා තියෙනවා. ඇය කවුද කියලා හඳුනාගැනීම ඒ තරම් ලේසි වෙන එකක් නෑ වගේ."

"ඇයි ඔබට හෝඩුවාවක් මොකුත් ලැබුණෙ නැද්ද?"

"සුළු සුළු දේවල් කිහිපයක් නම් ලැබුණා" හෝම්ස් කීවේ ඔහු අතේ තිබූ මල්ල ඔසවා පෙන්වමිනි. "නමුත් ඒවායින් සතුටුදායක ප්‍රතිඵල ලැබේවිද කියල මට නම් කියන්න අමාරුයි. දැන් ඉතින් අපි ආපහු යමු වොට්සන්"

කුලීරියක නැගී අප ආපසු "ග්‍රේට් ඇට්ලැන්ටික්" තානායම වෙත ළඟාවෙද්දී රාත්‍රි එකොළහ පමණ වී තිබිණි. ආහාර ගැනීමට ප්‍රියතාවයක් අප දෙදෙනාටම නොවූ බැවින් කෝපි පානය කළෙමු. හෝම්ස් ඔහුගේ අදහස් පළකළේ තානායමේ විසිත්තකාමරයේ වූ සෝපාවේ හිඳගෙන කෝපි බොන අතරය.

"මුලින්ම අපට සොයාබලන්න වෙනවා මේ පෙට්ටිය මුහුදට දැමූ පුද්ගලයා ගැන" හෝම්ස් කීය. "මට නම් හිතෙන්නේ ඒ මෙහේ කෙනෙක් නෙමෙයි කියලයි. ලන්ඩනයෙන් හෝ වෙනත් නගරයක ඉඳන් මෝකැම්බ් දක්වා දුම්රියෙන් ගෙනැවිත්, කුලීරියකින් බෝට්ටු තොටුපොළක් දක්වා ගෙනියන්න ඇති. ඊළඟට ඔහු මොකක්ද කරන්න ඇත්තෙ?"

"මං හිතන්නෙ ඔහු කවුරු හරි ධීවරයෙකුගේ උදව් ලබාගන්න ඇති" මම කීවෙමි. "ඒ මිනිහා ළඟ බෝට්ටුවෙන් මුහුදට ගෙනිහිං ගලක් ගැටගහල ඒ පෙට්ටිය මුහුදට දාන්න ඇති."

"මං හිතන්නෙ නෑ වොට්සන් ඒක සිද්ධවුණේ ඔය පිළිවෙළටය කියල" මගේ මිත්‍රයා කීය. "මේ වගේ අපරාධයක් කළ කෙනෙක්, නාඳුනන පළාතක, නාඳුනන මිනිහෙකු ගැන විශ්වාසය තියලා එහෙම උදව් ලබාගනීවි කියල හිතන්න අමාරුයි."



http://sherlockholmesinvestigations.blogspot.com



"ඉතිං කොහොමද ඔහු පෙට්ටිය මුහුද මැද්දට අරගෙන ගියේ?" මම ඇසීමි.

"මං මේ කියන්න හදන්නෙත් අන්න ඒක තමයි" ඔහු කීය. "මට හිතෙනවා ඔහු බෝට්ටු කුලියට දෙන තැනකින් බෝට්ටුවක් කුලියට අරගන්න ඇති. බොහොම වෙලාවට ඒක කරන්න ඇත්තෙ හැන්දෑවෙලාවෙ..... අඳුරු වැටීගෙන එද්දී. ඒ මොකද ඒ වෙලාවට මුහුදෙ ගැවසෙන යාත්‍රා අඩුයි. ඊළඟට පෙට්ටියත් පටවාගෙන ගිහිං මුහුදේදී ගලක් ගැටගහලා එය දමලා ආපහු එන්න ඇති. ඒ හින්ද අපි මුලින්ම වැල්මත් සහ ඒ අවට තොයල බලන්න ඕන, මේ විදියට කවුරු හරි බෝට්ටුවක් කුලියට ගත්තාද කියල"

"මෘත ශරීරාගාරයේ අද කළ පරීක්ෂණයේදී මොනවද ඔබට සොයාගන්න හැකිවුණේ?" මම ඇසීමි.

"ඔව්. මං ඒ ගැන කියන්නම්. මේ කාන්තාව වයස අවුරුදු තිස්පහක හෝ ඊට මදක් වැඩි කෙනෙක්. උස අඩි පහමාරක් පමණ. කළු හිසකෙස් කොටට කැපූ තැනැත්තියක්. අත්දෙකේම නියපොතු තරමක් දිගට වවලා. ඒවායේ දාර සියුම්ලෙස කඩතොලු වෙලා. ඒ බව මං දුටුවේ කාචයේ ආධාරයෙන්. ඇඟිලිතුඩු පරීක්ෂා කිරීමේදී, නියපොතු හා නියමස අතර එකතුවී තිබුණු සායම් ස්වල්පයක් ඉවත්කර ගැනීමට මට හැකිවුණා. මං ඔබට කලිනුත් කිව්වා වගේ ඒ මුද්‍රණ තීන්ත. ඒක රසායනික පරීක්ෂණයක් මගින් තහවුරු කරගන්න පුළුවනි. මළසිරුරේ කැබලි එතීමට යොදගෙන තිබුණේ වැඩිවශයෙන්ම කඩදසි සහ රෙදි කැබලි කීපයක්. ඒවායේන් රතුපාට ගවොමෙන් තිබුණේ මුද්‍රණ තීන්ත බව පැහැදිලියි. සෙල්ලම් බඩු හෝ ලීබඩුවල ආලේප කරන තීන්තවල ඔපවත් බව මුද්‍රණ තීන්තවල නැහැ"

"ඔබ කිව්වා නියපොතුවල දාර සියුම් ලෙස කඩතොලු වෙලා කියල. ඒ මොකක් නිසාද?" මම ඇසීමි.

"තමන් යෙදෙන රැකියාවේ හැටියට කාන්තාවන්ගේ නියපොතුවල මේ ආකාරයේ කඩතොලු ඇතිවෙන්න පුළුවනි" හෝම්ස් කීය. "බොත්තම් ඉදිකටු හා යතුරුකටු නිපදවන කම්හල්වල සේවය කරන අයගේ, පාසල්වල භාවිතයට ගන්නා ගණක හා ජ්‍යාමිතික උපකරණ එකලස් කරන අයගේ සහ මුද්‍රණ ක්ෂේත්‍රයේ අකුරු අමුණන්නන්ගේ මේ විදියට නියපොතු කඩතොලු



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

වෙන්න පුළුවනි. දැන් ඔබට පෙණෙනවා ඇති අපි යලිත් වරක් මුද්‍රණ ක්ෂෙත්‍රය පැත්තට යොමුවෙන බව."

"නමුත් හෝම්ස් මෙහෙම දේකුත් තියෙනවා" මම කීවෙමි. "මම දන්නා පමණින් එංගලන්තයේ මුද්‍රණාලවල, අකුරු ඇමිනීමේ කටයුතු සඳහා කාන්තාවන් යොදගන්නේ නැහැ. මගේ මතකය නිවැරදි නම් මේ කටයුතුවලට කාන්තාවන් යොදගැනීම නීතියෙන් තහනම්. ඉතින් කොහොමද ඔබ කියන්නේ....."

"ඔබේ මතයට මං එකඟවෙනවා වොට්සන්. එංගලන්තයේ පමණක් නොවෙයි; යුරෝපයේ බොහොමයක් රටවල්වල, අකුරු ඇමිනීම පිරිමින්ගේ වෘත්තියක්. ඇය මේ ක්ෂෙත්‍රයේ කෙනෙක් වුණේ කොහොමද කියන එක මටත් තේරුම් කරන්න අමාරුයි. අනික් අතට ඇය අත්මිට සෑහෙන තරම් මිලමුදල් තිබුණු තැනැත්තියක්. ඇගේ පෞර්ෂණයේ අඩුපාඩුවක් නැහැ. මුදු හැරුණාම ඇය පැළඳහිටි අණෙක් ආභරණ සිරුරෙන් ඉවත්කර නැහැ. බාගවෙලාවට කලබලේ නිසා ඒවා මගහැරුණා වෙන්නත් පුළුවනි. ඇගේ බෙල්ලේ තිබුණු මාලය හොඳ රත්රන් මාලයක්. ඒකෙ තිබුණා වටිනා මැණික්ගල් ඇල්ලූ පෙන්ඩනයක්. මුද්‍රණාලයක අකුරු ඇමිනූ තැනැත්තියක් මේ තරම්ට ආර්ථික අතින් සුරුසාරවීම පුදුමයක්."

"හොඳයි වෙන මොනවද ඔබට ට්‍රන්කු පෙට්ටිය තුළ තිබී හමුවුණේ?"

"ඇගේ අත්බෑගය හමුවුණා. එය තුළ තිබුණේ කොණ්ඩ කටු කිහිපයක් හා පනාවක්. සේද ලේන්සුවක්, කුඩා සුවඳවිලවුන් බෝතලයක් හා ඔරලෝසුවකුත් පමණයි. එය පිටුපස ML යන අකුරු කොටා තිබුණා. සුවඳ විලවුන් නම් මිල අධික වර්ගයක්. එපමණයි. ඇගේ ඇඳුමේ හෝ ලේන්සුවේ කිසිම ලොන්ඩ්‍රි ලකුණක් නැහැ. ඇය හැඳසිටි රතු ගවොම පැරිසියේ නිෂ්පාදිත එකක්. ඒ බව සඳහන් ලේබලය මා දුටුවා. ඒකත් මිල අධික එකක් බවට සැකයක් නෑ"

"කොහොමද ඇය මරණයට පත්වෙලා තියෙන්නෙ?"

"පොලිස් ශල්‍ය වෛද්‍යවරයා කියන්නෙ, ඇගේ හිස පිටුපසට එල්ල වූ තදබල පහරක සලකුණු තියෙන බව. ඒ අනුව හිස්කබල පුපුරාගොස් මොළයට ලේ ගැලීම නිසා මරණය සිදුවෙන්න ඇතිලු."

"මෙතැනින් ඉදිරියට මොනවද ඔබ කරන්න බලාපොරොත්තු වෙන්නෙ?" මම ඇසීමි.





"අපි තීරණය කළා ඇය ගැන සම්පූර්ණ විස්තර හෙළි නොකොට, පුවත්පත් දැන්වීමක් පළකරන්න" හෝම්ස් කීය. "මේ විදියට මළසිරුරක් සහිත ට්‍රන්ක පෙට්ටියක් මුහුදෙන් ගොඩට ගත් බව සඳහන් ප්‍රවෘත්තිය පවා තාවකාලිකව යටපත් කරනවා"

"ඇයි ඒ විස්තර හෙළිනොකරන්නේ?"

"ඇයට අත්වුණු ඉරණම ගැන ප්‍රචාරය වුණොත් සමහර වෙලාවට, ඇය ගැන දන්න කෙනෙක් පවා සාක්කිදෙන්න ඉදිරිපත් වෙන එකක් නැහැ. අපි හිතන්නෙ එහෙමයි." හෝම්ස් තවදුරටත් කීය. "රොන් වේලර් කිව්වා ඇය ගැන පළකරන දැන්වීම අදම විදුලිපුවත් මගින් ලන්ඩනයට දන්වනවා කියල. මෙන්න ඒ දැන්වීම.

පවුම් පහක ත්‍යාගයක්.

කාන්තා මළසිරුරක් හමුවී ඇත. වයස අවුරුදු 35ක් පමණ. කළු පැහැති කොණ්ඩය කොටට කපා ඇත. සිරුර මධ්‍යම ප්‍රමාණයේ එකකි. ඇගේ අත්බෑගයේ තිබූ ඔරලෝසුවේ අකුරු කැටයම් කර තිබූ අතර, වම් කන ඉදිරියෙන්, කම්මුල මත, ඇපල් ඇටයක ප්‍රමාණයේ රතු පැහැති උපන් ලපයක් ඇත. හැඳ සිටියේ තද රතු පැහැති ගවොමකි. රැකියාව කරන ලද්දේ මුද්‍රණාලයක බව දැනගන්නට ලැබී ඇත. ඇය ගැන නිවැරදි ආරංචියක් සපයන කෙනෙකුට ඉහත සඳහන් ත්‍යාගය ලබාගත හැක....."

"පවුම් පහක තෑග්ගක් දෙනවා කිව්වත් මිනීමැරුමකට ලක්වුණු කෙනෙක් ගැන සාක්කිදෙන්න ඉදිරිපත් වෙන්න, මිනිස්සු සමහර වෙලාවට කැමැති නැහැ" හෝම්ස් කීය. "මෙතැන අබිරහස් මිනීමැරුමක් සිදුවී ඇති බව පුවත්පත්වල පළ නොකරන්න, පත්තර වාර්තාකාරයින් කැමැති කරවා ගන්නේ අමාරුවෙන්"

"ඒ වුණත් එද මෝරාගේ බඩේ තිබිල එවන්ස්ගේ කකුල සහ තරුණියකගේ අතක් හමුවුණා කියල පුවත්පත්වල පළවුණා නේද?" මම ඇසීමි.

"ඒක ඇත්තයි වොට්සන්." හෝම්ස් කීය. "නමුත් මේ මළසිරුර හමුවුණේ කොහේ තිබිලද කුමන තත්වයෙන්ද කියන එක අපි සඳහන් කරල නැහැ. ඒකයි මේකයි එකට සම්බන්ධ කළ හැකි කරුණක් මොකුත් නෑ. ඒක නෙමෙයි මිත්‍රයා. හෙට උදේ තවත් රාජකාරියකට යන්නයි අපි හිතාගෙන ඉන්නෙ. රොන් වේලර් උදෙන්ම ඒවි. ඔබත් එනවාද ඒ කටයුත්තට?"


http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ මොකක්ද?"

"අපරාධකාරයා කොහෙන් හරි බෝට්ටුවක් කුලියට අරගෙන තියෙනවාද බලන්න, අපි යනවා වැල්මත්වලට" හෝම්ස් කීය. "ඔබත් කැමතිද වොට්සන් ඒ වැඩේට හවුල්වෙන්න?"

"හෝම්ස්" මා කීවේ තරවටුවක ස්වරයෙනි. "ඔබ මෙහේ ආවෙ වෛද්‍ය උපදෙස් මත විවේකයක් ගන්න. ඒ මිසක් අබිරහස් ගැටලු විසඳන්න නෙමෙයි. මේ කටයුතුවල යෙදිලා මහන්සිවුණොත්, මොළය අවුල් කරගත්තොත් ඔබේ අප්නිප ගතිය හොඳ අතට හැරෙන එකක් නෑ....."

"මගේ හිතවත් මිත්‍රයා" හෝම්ස් කීවේ මගේ කථාවට අවහිර කරමිනි. "ඔබ මට මේව කියන්නෙ යහපත් චේතනාවකින් බව මම දන්නවා. ඔබ කියන විදියට කකා බිබී සැපට නිදාගෙන හිටියොත් ඇඟටත් මොළයටත් විවේකය නම් ලැබේවි. නමුත් මොකක්ද ඒකෙන් ඇති ප්‍රයෝජනේ? මොළය තියෙන්නෙ පාවිච්චි කරන්න. ගැටලු විසඳන කොට මගේ මොළයට හොඳ ප්‍රබෝධයක් උත්තේජනයක් ලැබෙනවා. ඒක මොළයට ව්‍යායාමයක්. වොට්සන්. ඔබ වෛද්‍යවරයෙක් හැටියට උපදෙස් දෙනවා නිරෝගීව ඉන්න නම් නිතර ව්‍යායාම කළ යුතුයි කියලා. ඒක මොළයටත් අදාළයි. එහෙම නේද?"

"ඔබේ ඔය තර්කවලට පිළිතුරු දෙන්නෙ කොහොමද කියල මට නම් තේරෙන්නෙ නෑ" මම කීවෙමි. "නමුත් වෛද්‍ය ක්වින්සි මොන්රෝ විවේකයක් ගන්නවා කියන එකෙන් අදහස් කළේ නම් මෙහෙම දෙයක් නොවෙන බව මං දන්නවා"

පසුවදා උදෑසන මා අවදිවන විටත්, මගේ මිත්‍රයා තානායමෙන් පිටව ගොස් සිටියේය. පොලිස් පරීක්ෂක රොන් ටේලර් ආ අශ්වකරත්තයෙන්, ඔහු සමග හෝම්ස් ද ගිය බැව් තානායම් පාලකයා මට කීය.

හෝම්ස් ආපසු එනවිට දහවල් දෙළහට ළංවී තිබිණි. විඩාපත්ව සිටියත් ඔහුගේ දෙනෙත්වල තිබූ දීප්තියෙන් මම එක් කරුණක් වටහාගතිමි. එනම් ඔවුන් කළ සෙවීම සාර්ථක වී ඇති බවයි. සේවකයකු රැගෙන ආ දෙඩම් යුෂ වීදුරුව බීමට හෝම්ස් පැමිණියේ මුහුණකට දෝද ගැහීමෙන් පසුවය.

"කොහොමද? ගමන සාර්ථකද?" මම ඇසීමි.



http://sherlockholmesinvestigations.blogspot.com



"ඇත්තෙන්ම ඔව් වොට්සන්" හෝම්ස් කීය. "ඒක මං හිතූ තරම් අමාරුවුණේ නැහැ. නිවාඩු ගතකරන්න සංචාරකයන් හරියට මේ ප්‍රදේශයට එනවලු. ඒ අය මුහුදේ යාත්‍රා කරන්න ආස නිසා, පැය ගණනට මුදල් අයකරලා බෝට්ටු කුලියට දෙන තැන් තියෙනවාලු. ඒ බව දැක්වෙන පුවරු සවිකරල තියෙනවා. අපි වැල්මත්වල එහෙම තැන් හතරකට ගියා. අන්තිමේදී සතුටුදායක ආරංචියක් ලැබුණෙ රයිලි කියන වයසක මනුස්සයෙකුට අයිති තැනින්.

පහුගිය 17 වැනිදා බෝට්ටුවක් කුලියට ගන්න මිනිහෙක් ඇවිත් තියෙනවා රයිලි ළඟට. ඔහු ඇවිත් තියෙන්නෙ හැන්දෑවෙ පහට විතර. ඒ වෙලාවෙ බෝට්ටුවක් කුලියට ගන්න ආවාම රයිලි පුදුමවෙලා තියෙනවා. ඒ මොකද හැම සංචාරකයෙක්ම බෝට්ටු කුලියට ගන්නේ උදේ පාන්දර නිසා.

"මට පැය හතරකට විතර බෝට්ටුවක් කුලියට ගන්න පුළුවන්ද?" අමුත්තා ඇහුවලු.

"බෝට්ටුව දෙන්න නම් බැරිකමක් නෑ" රයිලි කිව්වලු. "මං අයකරන ගාස්තුව පැයකට සිලිං පහයි. මගේ "සොෆියා" බෝට්ටුව නම් මේ පැත්තෙ වේගෙන්ම යන්න පුළුවන් යාත්‍රාව. බෝට්ටුව පදවන්න කප්පිතෙකුත් දෙන්න පුළුවන්. ඒකට අපි පවුම් භාගය ගණනේ අයකරනවා"

"බෝට්ටුව පදවන්නෙක් නම් උවමනා නැහැ" අමුත්තා කිව්වලු. "ඒ මොකද මේ වර්ගයේ බෝට්ටු පදවල මට හුරු පුරුදුයි. මං චිත්‍රශිල්පියෙක් සහ ඡායාරූප ශිල්පියෙක්. අර පෙට්ටියේ සහ බෑග්වල තියෙන්නේ ඒවට ඕනකරන බඩු. මං අදහස් කරන්නේ මුහුදෙන් ඉර බැහැගෙන යන අපූරු චිත්‍රයක් සිතුවම් කරන්න සහ ඡායාරූප ගතකරන්න." එහෙම කියූ ඔහු පැය හතරක ගාස්තුව හැටියට රයිලි අතට රන්පවුමක් දුන්නලු. කොළ පාට ට්‍රන්කපෙට්ටියක් සහ බෑග් තුනක් එයා බෝට්ටුවට පටවාගෙන තියෙනවා. බෝට්ටුව දියත්කරගන්න රයිලි උදව්වුණාලු. ඒ වෙලාවෙ හොඳ සුළඟක් හමමින් තිබිල තියෙනවා. අර අමුත්තා රුවල ඔසවලා වේගයෙන් දියඹට ගියාලු"

"ඉතිං?"

"රෑ අට වෙන්නත් කලින් රයිලි නිකමට ආවලු මුදු වෙරළට" හෝම්ස් කීය. "තමන්ගෙ බෝට්ටුව නියමිත තැන නවත්වලා



http://sherlockholmesinvestigations.blogspot.com

තියෙනවා දැකලා ඔහු හරි පුදුමයකට පත්වුණාලු. බෝට්ටු කුලියට ගන්න හුගක්දෙනා, ඒවා ආපහු ගෙනැත් බාරදෙන්නෙ නියමිත කාලයට වඩා ප්‍රමාද වෙලාලු. නමුත් ගොඩට ආව මිනිහා ඒ බව බෝට්ටුව අයිතිකාරයට දැනුම්දෙන්න ඕනනෙ. ඒ අමුත්තා ගිහින් තියෙන්නෙ ඒක නොකරම. රයිලි සහතික වෙනවා බෝට්ටුවට කිසිම හානියක් වෙලා නැහැ කියල."

"එහෙම නම් අපරාධකාරයා තමන්ගේ කටයුත්ත ඉක්මනටත් පහසුවටත් කරගෙන ඇති පාටයි."

"ඔව් වොට්සන්. මට ඊළඟට දැනගන්න උවමනාව තිබුණේ ඒ අමුත්තාගෙ හැඩරුව ගැන" හෝම්ස් කීය. "නමුත් ඒ මිනිහගේ පෙනුම ගැන රයිලිට ඒ හැටි මතකයක් තිබුණේ නැහැ. කෙට්ටු උස පුද්ගලයෙක්ලු. මුහුණෙන් බාගයක් තරම් වැහෙන විදියේ ලොකු හිස්වැස්මක් දමාගෙන හිටියලු. මුහුණ වැහෙන්න කළු රැවුලක් තිබුණු බවයි රයිලිට මතක. බාගවෙලාවට ඒක බොරු රැවුලක් වෙන්නත් පුළුවනි. අමුත්තා කතා කළේ මහ ගොරෝසු කටහඬකින් බව රයිලිට හොඳට මතකයි. ඒ අමුත්තා කතාකළේ ලන්ඩන් නගරයේ සිද්ද උච්චාරණයෙන් බව රයිලිට මතකයි. මං ඔහුගෙන් ඇහුවා ලන්ඩන් සිද්දියේ උච්චාරණය හඳුනන්නේ කොහොමද කියල. මීට අවුරුදු හත අටකට කලින් රයිලි තේම්ස් ගඟේ බෝට්ටු ආශ්‍රිත රැකියාවක් කරල තියෙනවා. ඒ දිනවල ඔහු පදිංචිවෙලා ඉඳල තියෙන්නෙ නැගෙනහිර ලන්ඩනයේ. අන්න ඒ කරුණ අපට වැදගත් වෙනවා."

"මොන කරුණද?"

"ට්‍රන්ක පෙට්ටිය මුහුදට දැමූ නැන්දැත්තා ලන්ඩන් නගරයෙන් ආව කෙනෙක් වියයුතුයි" හෝම්ස් කීය. "ඒක බොහොම ප්‍රයෝජනවත් තොරතුරක්. එතකොට අපේ ඉදිරි විමර්ශණ කටයුතු ලන්ඩන් නගරයට සීමාකරන්න පුළුවන්."

"ඔය කියන පසුගිය 17 වැනිද වෙනකොට දුම්රිය මාර්ගය අලුත්වැඩියා කරල අවසන්. ලන්ඩන් ඉඳන් එන දුම්රිය මෝකැම්බ්වලටම ආවා. මං හොයල බැලුවා. නමුත් මේ කියන විදියේ ට්‍රන්ක පෙට්ටියක් සහ ගමන්මලු අරගෙන හැන්දෑවේ ආව කෙනෙක් ගැන දුම්රියපොළේ කාටවත් මතක තිබුණේ නැහැ. දහස් ගණනක් සෙනඟ මේ දුම්රියපොළවල එහා මෙහා යන නිසා, ඒක


http://sherlockholmesinvestigations.blogspot.com



මතක නොතිබීමේ පුදුමයක් නෑ. දැන් ඉතින් ඉතුරු වැඩටික කරන්න අපට ආපහු ලන්ඩන් යන්න වෙනවා වොට්සන්"

"මොනවා? එතකොට මගේ විවේක නිවාඩුව?"

"අපි දවස් අටක් විතර මෙහේ ගතකළා නේ" හෝම්ස් කීය. "ඒ නිවාඩුව මෙතැනින් අවසන් කරන්න වෙයි වගේ. ඔබේ ඉල්ලීම නිසා මං මෙහේ රැඳී හිටියා කියල හිතමු. ඒත් මගේ මොළේට විවේකයක් නම් ලැබෙන එකක් නෑ"

"අනේ මං දන්නෙ නෑ" මම කීවෙමි. "වෛද්‍ය මොන්රෝ නම් කිව්වෙ ඔබ දීර්ඝ විවේකයක් ලබාගතයුතු බවයි. එහෙම නොකර දැලින් වැඩ පටන්ගැනීම ඔබේ සිරුරට කොයිතරම් හිතකර වේද කියන එක....."

"ඉක්මනට දවල් කෑම කාලා අපි වහාම ලන්ඩන් බලා පිටත්වෙමු" හෝම්ස් කීවේ මගේ කතාවට අවහිර කරමිනි. "ඊළඟට මේ ගැටලුව ඉක්මනින් විසඳලා අවසන් කරලා ආයෙමත් මෙහේ එමු"

කතාබහ එතැනින්ම අවසන් විය. හෝම්ස් කී අයුරින් අපි ඉක්මනින් ලන්ඩනය බලා එවිට පිටත්වුණෙමු. බේකර් විදියේ නිවහනට ළඟාවන විට රාත්‍රි දහය පමණ වී තිබිණ.

ගමනෙන් අධික තෙහෙට්ටුවට පත්වී සිටි මම, වහාම රාත්‍රි ආහාරය ගෙන නින්දට යෑමට තීරණය කළෙමි. එහෙත් හෝම්ස්ට නම් නිදිමතක සලකුණක්වත් නොවීය. අකාලපාට ට්‍රන්ක පෙට්ටිය තුළ තිබී හමුවූ කාන්තා අත්බෑගය හා කුඩදසි රැසක් මේසය උඩ දිගහැරගත් ඔහු, ඒවා පරීක්ෂාකිරීම ආරම්භවිය.

පසුවද උදයේ මා අවදිවන විටත් මගේ මිත්‍රයා නිවහනෙන් බැහැර ගොස් සිටියේය. උදේ ආහාරපානයෙන් පසු මම පුවත්පත් කියවීමට පටන්ගතිමි.

පොලිසියෙන් කළ විශේෂ ඉල්ලීම නිසා මෙම අපරාධය පිළිබඳ තොරතුරු පුවත්පත්වල පළනොවිණි. මේරාගේ උදරයේ තිබී හමුවූ "අබිරහස් හස්තය" පිළිබඳව කාටත් අමතක වෙමින් තිබිණි. ඊට ප්‍රධානම හේතුව වූයේ ඒ දිනවලම මැංචෙස්ටර් දුම්රියපොළේ සිදුවූ දුම්රිය අනතුරය. මෙහිදී දුම්රිය රියැදුරෙකු මරණයට පත්වූ අතර බොහෝ ගණනකට තුවාල සිදුවිය. මෙම අනතුර සිදුවූයේ දුම්රිය ඉංජිනේරුවන්ගේ නොසැලකිල්ල නිසා බැව් හෙළිවිය. එවිට බලවත් මහජන විරෝධයක් පුවත්පත් මාර්ගයෙන් එළිදැක්විණි.


http://sherlockholmesinvestigations.blogspot.com

ෂර්ලොක් හෝම්ස් ආපසු නිවස බලා එද්දි සවස තුන පමණ වී තිබිණ. "අපි අර ට්‍රන්ක් පෙට්ටිය පිරිසිදු කරලා තැනින් තැනට අරගෙන ගියා වොට්සන්" ඔහු කීවේ දහවල් ආහාරය නිමකොට විසිත්ත කාමරයේ සෝපාවේ වැතිරෙමිනි. "ලන්ඩන් නගරය පුරා පරණබඩු අලෙවිකරන තැන් දොළහකට පමණ ගියා. රොන් ටේලර්ගේ මිත්‍රයා ස්ටැන්ලි හොප්කින්ස් තමයි මෙහෙදි මෙකට උදව්වෙන්නෙ. අන්තිමට හැම්ෆ්ටේ පරණ බඩු වෙළෙන්දෙක් මේ ට්‍රන්කපෙට්ටිය හඳුනාගත්තා. ඔහු ඒක විකුණුවේ කාටද කියන එක වෙළෙන්දට හොඳට මතක තිබුණා.

"මහත්තයා. මං ඕක විකුණලා තියෙන්නේ පහුගිය 16 වැනිද" ඔහු කිව්වේ ගනුදෙනු සටහන් පොත දිගහරිමින්. "කුලීරියකින් ආව ඒ මහත්තය හිටියෙ ලොකු හදිස්සියකින්. මගෙන් ඒකෙ මිල ගණන අහන්නෙ නැතුවම ඒ ට්‍රන්ක පෙට්ටිය මිලට ගන්න ඔහු කැමැතිවුණා. ඒක කුලීරියට දගන්න කියලා රියැදුරාට නියම කළා. ඒ හින්දම සිලිං අටකට විකුණන්න හිටි පෙට්ටියට මං සිලිං දහයක් කිව්වා. හෙට්ටු කිරීමක් නැතුව එවෙලේම මුදල් පසුම්බිය එළියට අරගෙන මුදල් ගෙව්වා."

මං ඇහුවා ඔහුගේ පෙනුම ගැන. "උසයි අඩි හයක් විතර. ඒ වුණාට එච්චරම මහත නැහැ. ඒ වෙලාවෙ හිස්වැස්මක් පැළඳ හිටියේ නැහැ. හිසකෙස් දුඹුරුපාටයි. හමුද සෙබලුන්ගේ මෝස්තරයට, කොණ්ඩය කොටට කපලා හිටියා."

"මුහුණ අව්වට පිළිස්සුණු එකක්ද?" මං ඇහුවා. "එහෙමත් නැත්නම් මුහුණ වැහෙන්නම කළු රැවුලක් තිබුණද?"

"නැහැ. රැවුල වවපු කෙනෙක් නෙමෙයි. අව්වට පිළිස්සිලත් නෑ. මං හිතන්නේ මුහුණේ තිබුණා සුදුමැලි ගතියක්..... නිකං අසනීපෙන් උන්නු කෙනෙකුගේ වගේ" වෙළෙන්ද කිව්වා.

"ට්‍රන්ක පෙට්ටියේ පිටත මේ ARA ලකුණ මොකක්ද?" හොප්කින්ස් ඇහුවා. "ඒක කලින් ඉඳන්ම තිබුණු එකක්" වෙළෙන්ද කිව්වා. "මං මිලට ගනිද්දිත් ඒක තිබුණා. මං හිතුවා මේක මලකඩ කාල නිසා විකුණගන්න අමාරුවේවි කියල. නමුත් ගැනුම්කාරය ඒ ගැන හැඳීමක් කළේ නෑ. එයා බැලුවෙ පෙට්ටියේ පියන හොඳට වැහෙනවාද, අගුල හරිහැටි වැඩකරනවාද කියල විතරයි."

"කුලීරථ රියැදුරා මේ පැත්තෙත කෙනෙක්ද? එහෙමත් නැත්නම් ඔබ දකපුරුදු කෙනෙක්ද?"



http://sherlockholmesinvestigations.blogspot.com



"මේ පැත්තෙ කෙනෙක් නෙමෙයි. ඔහු [illegible]න් දකපු බවක් මට මතක නෑ."

"ට්‍රන්ක පෙට්ටිය කුලීරියෙන් ගෙනගියේ කොහේටද කියලා දැනගන්න තිබුණා නම්, තොරතුරු හෙළිකරගැනීම තවත් පහසු වෙනවා. එහෙම නේද හෝම්ස්?" මම ඇසීමි.

"ඇත්තෙන්ම ඔව් වොට්සන්" හෝම්ස් කීය. "ඒ තොරතුරු හොයාගන්න පුළුවන් වුණා නම් අපට පැහැදෙන තරම් ඉදිරියට යන්න තිබුණා. නමුත් ලන්ඩන් නගරය තුළ කොච්චරමක් කුලීරථ එහා මෙහා යනවද; බඩු ප්‍රවාහනය කරනවද. ඒ නිසා මේකට අදාල රියැදුරා අපට අල්ලගන්න හැකිවේවි කියල මං හිතන්නෙ නෑ."

එද සවස පොලිස් පරීක්ෂක ස්ටැන්ලි හොප්කින්ස් අප දකීමට බේකර් වීදියට පැමිණියේය.

"හෝම්ස් මහත්මයා." හොප්කින්ස් කීවේ මගේ මිත්‍රයා පිළිගැන්වූ පුටුවිටුවක් අසාට ගනිමිනි. "මට නම් පේනෙන්නේ මිනීමරුවා ඔහුගේ කටයුත්ත බොහොම සාර්ථකව කර ඇති බවයි. ඔහු කිසිම හෝඩුවාවක් ඉතිරිකරල ගිහින් නෑ. දැන් පෙනෙන විදියට ලෝක ප්‍රකට අපරාධ පරීක්ෂණ විශේෂඥ ෂර්ලොක් හෝම්ස් මහත්තයාවත් පරාජය කරන්න ඔහු ප්‍රමත්වෙලා වගෙයි. මගේ ප්‍රධානීන් අහනවා මේ කාන්තාව මරණයට පත්වුණු ආකාරය ප්‍රසිද්ධ කරන්නේ නැත්තෙ ඇයි කියල. එහෙම කළොත් ඒ ගැන මහජනයාගෙ අවධානය වඩාත් යොමුවේවිලු."

"ඒ කතාවෙත් ඇත්තක් තියෙනවා හොප්කින්ස්" හෝම්ස් කීය. "නමුත් මගේ විශ්වාසයක් තියෙනවා, මේ අපරාධය කළ මිනීමරුවා තවමත්, ලන්ඩන් නගරයේ කොහේ හෝ නිදහසේ ගැවසෙනවා කියල. අර ඔබේ ප්‍රධානියා කිව් හැටියට මිනීමැරුමේ බිහිසුණු බව ප්‍රචාරය වුණු ගමන් මිනිස්සු ඒ ගැන කතාබහ කරන්න පටන්ගන්නවා. එතකොට ඔහු හැංගේවි, නැත්නම් රටින් පැනයාවි. එතකොට අපේ කටයුත්ත තවත් අමාරු වෙනවා. අපි තවත් දවස් තුනක් හතරක් වත් ඉවසීමෙන් බලා ඉඳිමු. බලමු අර කාන්තාව ගැන පුවත්පත් දැන්වීමට මොකක් හරි ප්‍රතිචාරයක් ලැබේවිද කියල. අතුරුදන්වුණු කාන්තාවන් ගැන පොලිස් ලිපිගොනු ඔබ සෝදිසි කරල බැලුවද?"

"ඔව් මහත්මයා" හොප්කින්ස් කීය. "ලන්ඩන් නගරයෙන් පමණක් නෙමෙයි, මුළු එංගලන්තයේම අතුරුදන්වුණු කාන්තාවන්



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

ගැන වාර්තා අපි පරීක්ෂා කරගෙන යනවා. නමුත් මළසිරුරු පරීක්ෂා කරල ඔබ කියූ ආකාරයේ කෙනෙකුව, තවමත් අපට හමුවුණේ නෑ. කොහොම වුණත් ඒ කටයුත්ත තවමත් ඉවර නෑ. අපි තවත් ටිකක් ඉවසල බලමු. ඔබ මොනවද හෝම්ස් මහත්මයා, ඊළඟට කරන්න බලාපොරොත්තුවෙන්නෙ?"

"මං බලාපොරොත්තුවෙන් ඉන්නවා, සම්භාව්‍ය නවකථා කිහිපයක් කියවන්න ගන්න." හෝම්ස් කීය. "ලෝකයේ සුප්‍රසිද්ධ ලේඛකයන්ගේ ප්‍රබන්ධ අපි කියවලා තියෙන්නෙ අල්පයයි." හෝම්ස්ගේ මේ පිළිතුරෙන් ස්ටැන්ලි හොප්කින්ස් පමණක් නොව මම ද අතිශය පුදුමයට පත්වුණෙමි.

"නවකථා කියවන්න?" මම ඇසීමි. "ඇයි මේ විදියේ අපරාධ ගැන ඒ පොත්වල සඳහන් වෙනවා කියල ඔබ හිතනවද?"

"මළසිරුරු කැබලිවලට කපලා දුන්න පෙට්ටියක දලා, මුහුදට දැමූ අපරාධකාරයෙකු ගැන, ඒ නවකථාවල සඳහන් වෙන්නෙ නැතුවා වෙන්න පුළුවනි." හෝම්ස් කීය. "නමුත් ඒ වගේ නවකථා කියවීමෙන් අපට සුවිශේෂ චරිත හඳුනාගන්න පුළුවනි. ඒ අපරාධකාරයින්ගේ යටිහිතේ ස්වභාවය, ඒ අනුව ඔවුන් හැසිරෙන, ක්‍රියාත්මක වෙන හැටි. ඒවා හොඳින් තේරුම් ගැනීම අපට ප්‍රයෝජනවත් හොප්කින්ස්. මං ඔබට අවවාද කරනවා, හැකිනම් රුසියානු හා ප්‍රංශ ලේඛකයන් ලියා, මෑතකදී ඉංග්‍රීසියට පරිවර්තනය කළ නවකථා කිහිපයක් කියවා බලන්න කියල. හැකිනම් අයිල්මර් මෝඩ් හෝ රිචඩ් ෆ්‍රීබෝන් කළ ඉංග්‍රීසි පරිවර්තන හොයාගන්න. ඒවා විශිෂ්ටයි"

ස්කොට්ලන්ඩ්යාඩ් පොලිස් නිලධාරියාගේ මුහුණට නැගුණේ උපහාසාත්මක සිනාවකි. "හෝම්ස් මහත්මයා. ඔබ අපට විහිළු කරනවා වගෙයි. කියන්න බලන්න මොනවද ඔබ අපට කියවන්න කියන පොත්. කවුද ඒ ලේඛකයන්?"

"හොඳයි මම කියන්නම්" හෝම්ස් කීය. "රුසියානු ලේඛක ෆියදෝර් දොස්තොව්ස්කි ලියූ අපරාධය හා දඬුවම, ඊළඟට ලියෝ ටෝල්ස්ටෝයිගේ යුද්ධය හා සාමය, මිහයිල් ලර්මොන්තොෆ්ගේ අපේ කාලයේ වීරයෙක්, ඉවාන් තුර්ගෙනිෆ්ගේ ප්‍රථම ප්‍රේමය සහ තවත් කථා, මොලියෙර්ගේ දෙන් ජුවන් සහ තවත් නාට්‍ය"

"ඇයි ඔබ විදේශීය නවකථාම කියවන්න කියල අපට කියන්නෙ?" මම ඇසීමි.



http://sherlockholmesinvestigations.blogspot.com



"මේ විදේශීය කථාවල ඉංග්‍රීසි පරිවර්තන, දැන් පාඨකයන් අතර හරිම ජනප්‍රියයි" හෝම්ස් කීය. "ඒවා ඉතාම ඉහළ සම්භාව්‍ය ගණයේ කථා බවට සැකයක් නෑ. ඊට අමතරව පාඨකයන් අතර හුගක්ම ජනප්‍රිය ඉංග්‍රීසි ලේඛක ලේඛිකාවන්ගේ කථාන්තරත් තියෙනවා. ඒවාත් ඉතාම විශිෂ්ට ගණයේ ඒවා. චාල්ට් බ්‍රොන්ටේගේ ජේන් අයර්, ෂර්ලි, විලට්, මේරි ශෙලීගේ ෆ්රැන්කන්ස්ටයින්, චාල්ස් ඩිකන්ස්ගේ පික්වික් පේපර්ස්. මං දන්නෙ නෑ වොට්සන්වත් මේවා කියවලා තියෙනවද කියල?"

"මං පාසල් යන කාලෙදී නම් ඒවා සමහරක් කියවලා තියෙනවා." මම කීවෙමි. "ඒත් ඒවා සමහරක් සංක්ෂිප්ත කළ ඒවා. නමුත් ඔබ කියන ඔය රුසියන් කථා ඔය තරම් රසවත්ද? රුසියානුවන්ගේ දිග හා වැටහිලි සහිත නම් ගම් නිසා, කථාවේ රසයට බාධාවක් ඇතිවෙනවා....."

"කොහොමටවත් නෑ, වොට්සන්" හෝම්ස් කීය. "රුසියන් ලේඛකයන්ගේ කථා නම් කලබලේට කියවන්න බෑ. අනික ඒවායේ හොඳ ඉංග්‍රීසි පරිවර්තන ඔබට නොලැබුණා නම්....."

මේ අවස්ථාවේ හෝම්ස්ගේ කථාවට බාධාකරමින් අප නිවසෙහි සීනුව නාදකරන ශබ්දයක් ඇසිණි. අනතුරුව දොර විවෘත වන හඬ ද, කිසිවෙකු තරප්පු පෙළ නැග උඩට එන හඬ ද අසන්නට ලැබිණ. මගේ මිතුරාගේ මුවගට නැගුණේ සිනාවකි.

"ඇතුළට එන්න බිලී" හෝම්ස් කීවේ දොරට තට්ටු කිරීමටත් පෙරය.

කාමරයට පිවිසියේ අපගේ සේවක ළමයා වූ බිලීය. ඔහුගේ දෑතේ දුඹුරු කඩදාසිවලින් එතූ ලොකු පාර්සල් හතරක් තිබිණි. ඔහු ඒවා මේසය මත තබා අපට ආචාරකොට පිටවී ගියේය.

"මේ පාර්සල්වල තියෙන්නේ, මං දැන් කියූ සමහර පොත්" හෝම්ස් කීය. "මේවා ප්‍රකාශයට පත්කරන්නේ, හම්බර්ඩ් ප්‍රකාශක සමාගම, ඒ. සී. වයිට් සහ සමාගම, කැම්බ්‍රිඩ් විශ්වවිද්‍යාල ප්‍රකාශන අංශය සහ පුත්‍රකට ගේජ් අත විලියම් සමාගම. මේ පොත්වලට විශාල ඉල්ලුමක් තියෙනවා. ඒකෙන් තේරෙනවා එංගලන්තයේ පාඨකයන් මේ පොත් කියවීමට කොයිතරමක් ආශාකරනවද කියලා"

පාර්සල් විවෘත කළ හෝම්ස්, එහි තිබූ කථාන්තර පොත් ඉවතට ගෙන පොලිස් නිලධාරියා සහ මා අතට දුන්නේය. ඒවා ඉතා



http://sherlockholmesinvestigations.blogspot.com

මෑතකදී මුද්‍රණය කළ ඒවා බව කවදාසියෙන් නිකුත් වූ සුවඳින් අපි තේරුම් ගත්තෙමු.

"හෝම්ස්, ඔබ මේ හැම එකක්ම කියවන්නද හදන්නෙ?" මම පුදුමයෙන් ඇසුවෙමි. මගේ මිත්‍රයාට රහස්පරීක්ෂණ වෘත්තිය සඳහා ගතකිරීමට තිබූ කාලය අනුව, කතන්දර පොත් කියවීමට කාලයක් නොතිබුණු බව මම දැනසිටියෙමි.

"කියවන්න? ඔව්." හෝම්ස් කීය. "ඒත් එක්තරා වෙනස් විදියක කියවීමක් මට කරන්න වෙනවා. හැම පිටුවක් ගණනේම හැම පේළියක් ගණනේම කියවන්න කාලෙවලා මදිවේවි. අවශ්‍ය කොටස් තෝරාගෙන කියවා බලන්නයි මං හිතාගෙන ඉන්නෙ"

ස්ටැන්ලි හොප්කින්ස් එතැනින් පිටවී යාමට සූදානමෙන් මෙන් අසුනෙන් නැගී සිටියේය.

"හෝම්ස් මහත්තයා" ඔහු කීය. "මට නම් ඔව කියව කියව ඉන්න තරම් වෙලාවක් ලැබේවි කියල මං හිතන්නෙ නෑ. ඔබ ඕව කියවලා බලල, වැදගත් යමක් තිබුණොත් අපටත් කියන්න." අපට ආචාර කළ ඔහු නිවසෙන් පිටවී ගියේය.

අසල තිබූ පුවත්පතක් අතටගත් මගේ නෙත ගැටුණේ එහි පළව තිබූ දැන්වීමක් වෙතය. ඒ එදිනම හවස පැවැත්වීමට නියමිතව තිබූ සංගීත ප්‍රසංගයක් පිළිබඳ දැන්වීමකි. [illegible] නිවාඩුව ගතකරමින් සිටියදී මෙය නැරඹීමට යාමට අපි දෙදෙනාම සිතාසිටියෙමු.

"හෝම්ස් අර සංගීත ප්‍රසංගය ගැන සම්පූර්ණයෙන්ම අපට අමතක වුණානෙ" මම කීවෙමි"

"ආ..... අර ජෝජ් මවුන්ට්ගේ සහ [illegible]ගෙ ප්‍රසංගය නේද?" ඔහු ඇසීය.

"ඔව්. ඇයි ඔබ යන්නෙ නැද්ද?"

"ඒක බොහොම විශිෂ්ට ප්‍රසංගයක් වෙන බවට සැකයක් නෑ වොට්සන්" ඔහු කීය. "නමුත් මේ ගැටලුව විසඳාගන්න බැරුව මගේ මොළේ හොඳටම අවුල්වෙලා. ඕකට ගියත්, හිතේ සැනසිල්ලෙන් ඕක රසවිඳින්න පුළුවන් වේවි කියල මං හිතන්නෙ නෑ. වොට්සන් මං ඔයගෙන් ඉල්ලා හිටින්නෙ තනියම ගිහිං සංගීත ප්‍රසංගයට සහභාගිවෙන්න කියල"

ඔහුට විසඳීම සඳහා සංකීර්ණ ගැටලුවක් ලැබුණු විට හෝම්ස් සතුටට පත්වීම සිරිතකි. ඒ ඔහුගේ බුද්ධියට ව්‍යායාමයක් ලබාදෙන



http://sherlockholmesinvestigations.blogspot.com



ගැටලුවක් විසඳීමෙන් ලැබෙන තෘප්තිය නිසාය. එහෙත් එම ගැටලුව විසඳාගැනීමට නොහැකිවුණු කල, ඔහු අසහනයට පත්වේ. හැම නොකා නොබී, නිදිමරමින් අප්‍රමාණ වෙහෙසක් දරමින් ඔහු ගැටලුවට විසඳුම සොයයි. මෙවැනි වෙලාවලට ඔහු සංගීත ප්‍රසංගවලට සහභාගිවීමට නොකැමැතිය. මා කාමරයේ රැඳී සිටීම පවා ඔහුගේ සිතුම් පැතුම්වලට බාධාවක් බව මම දැනසිටියෙමි. එබැවින් ඔහුට නිදහසේ කල්පනාකිරීමට ඉඩදී කාමරයෙන් පිටවීයාමට තීරණය කළෙමි.

නියමිත වේලාවට පැය දෙකක් පමණ කලින් මම ශාන්ත ජේම්ස් ශාලාව වෙත ගියෙමි. [illegible] ශාලාවේදී මා සමඟ එකට උගෙන, ශාන්ත [illegible] රෝහලේ සේවය කළ ශල්‍ය වෛද්‍යවරයෙකු වූ [illegible] ද සංගීත ප්‍රසංගය නැරඹීමට පැමිණ සිටියේය. [illegible] හාලේගේ වාදක මණ්ඩලය ඉදිරිපත් කළ සංගීතයෙන් අපි වශීවූයෙමු. ප්‍රසංගය අවසන් වන විට රෑ නවය පමණ විය. රාත්‍රී ආහාරය සඳහා ඉතාලි අවන්හලකට යාමට [illegible] මට ඇරයුම් කළේය. ඉතාලි වයින් තොලගාමින් වෛද්‍ය විද්‍යාලයේ විනෝදයෙන් කාලය ගතකළ අයුරු සිහිකළ අපට, කාලය ගතවී යනු නොදැනිණි. රාත්‍රී ආහාරය අවසන් කොට අප අවන්හලෙන් නික්මයද්දී මැදියම රැයට ආසන්නව තිබිණ. මිතුරාට ආයුබෝවන් කියා, මම කුලීරියකින් බේකර් වීදියට පැමිණියෙමි.

මා බලාපොරොත්තුව සිටියේ මගේ මිත්‍රයා පයිප්පය ද දල්වාගෙන කල්පනා කරමින් නොනිදා සිටිනු දකීමටය. එහෙත් මා පුදුමයට පත්වූයේ හෝම්ස් නිවසේ නොසිටි බව දුටු විටය. රාත්‍රී ආහාරයෙන් පසු ෂර්ලොක් හෝම්ස් මහතා නිවසෙන් පිටවී ගිය බවත්, ගිය තැනක් තමාට දැනුම් නොදුන් බවත්, අවදියෙන් සිටි බිලී පැවසුවේය. හෝම්ස් මා වෙනුවෙන් ලියුම් කැබැල්ලක් හෝ ලියා තබා ගොස් නොතිබිණ. මම නින්දට යාමට තීරණය කළෙමි. වයින් පානය කොට කුසපුරා ආහාර ගෙන තිබූ බැවින්, මට තදින්ම නින්දගියේය.

කිසිවෙකු මගේ නිදන කාමරයේ දොරට තට්ටු කළ හඬින් මම තිගැස්සී අවදිවීමි. ඒ මගේ මිත්‍රයාය. ඔරලෝසුව දෙස බැලූ මා දුටුවේ වෙලාව උදේ හතරට ළංවී ඇති බවයි.

"පරීක්ෂණය දැන් වෙනත් [illegible] යොමුවෙමිනුයි තියෙන්නෙ වොට්සන්. මට මුළු රෑම නින්දක් නෑ. හෙට දවස..... දැන් එළිවේගන



http://sherlockholmesinvestigations.blogspot.com

එනවා..... ඒ කියන්නෙ අද දවස, අපට වැඩකටයුතු අධික දවසක් වෙනවාට සැක නෑ. ඒ නිසා මං පැයක් දෙකක්වත් නිදගන්න උත්සාහ කරනවා. ස්ටැන්ලි හොප්කින්ස් සහ ඔහුගෙ සේවක මණ්ඩලය, ඊයෙ රෑ කිස්සෙ මට උදව්වුණා. ඔහු මෙහේට ඒවි උදේ දහය වෙද්දි. උදේ ආහාරය ගන්නා අතරෙ මං ඔබට විස්තර කියන්නම්."

මෙසේ කියූ මගේ මිත්‍රයා තම නිදන කාමරයට වැදී දොර වසාගත්තේය. මම යළිත්වරක් නින්දට යෑමට තීරණය කළෙමි.

මා උදේ තේ පානය කරන විටත් හෝම්ස් අවදිව් සිටියේ නැත. නියමිත වේලාවට කලින්, එනම් උදේ නවයයි තිහට පමණ පොලිස් පරීක්ෂක හොප්කින්ස් අපේ නිවසට පැමිණියේය.

"හෝම්ස් මහත්තයා ඔබව බලාපොරොත්තු වෙන්නෙ උදේ දහයට" මා කීවේ මගේ මිත්‍රයාගේ නින්දට බාධාකිරීමට මට තිබූ අකමැත්ත නිසාය.

"ඔව්. ඒක ඇත්තු වොට්සන් මහත්තයා. නමුත් වැඩකටයුතු සිද්ද වුණේ අප හිතූ විදියට නෙමෙයි. හෝම්ස් මහත්මයාට සිදුවෙනවා දැන් මේකට කෙළින්ම ඇදිහක් වෙන්න."

තද නින්දකට වැටී සිටි මගේ මිතුරා අවදිකරවා ගැනීම අපහසු විය. එහෙත් හොප්කින්ස් නියමිත වෙලාවටත් කලින් පැමිණ ඇතිබව ඇසූවිට හෝම්ස් කලබල විය.

"එහෙනම් වැඩේ ගැස්සිලා වගෙයි" හෝම්ස්ගේ කටින් පිටවූයේ එපමණකි. කෝපි කෝප්පයක් පමණක් පානය කළ ඔහු, උදේ ආහාරයවත් නොගෙන, පොලිස් නිලධරයා සමඟ වහාම පිටවී ගියේය.

උදේ එකොළහ වෙද්දී මා නමට විදුලිපුවතක් ලැබිණ.

"මා ගිනටත් වොට්සන්

ගොඩොල්ෆින් විදියේ අංක 73 දරන ස්ථානයට වහාම එන්න

එස්. එච්"

ඔහුට යම්කිසි කරදරයකට මුහුණපාන්නට සිදුවී ඇත්ද? මට කිසිවක් සිතාගැනීමට අපහසුවිය. තම රාජකාරි සඳහා ලන්ඩන් නගරයට යන හෝම්ස්, මේ අයුරෙන් මා කැඳවමින්, විදුලිපුවතක් එවන්නෙ ඉතාමත් කලාතුරකිනි. කෙසේ වෙතත් ඔහු පිටත්වී ගියේ පොලිස් නිලධරයකු සමඟ නිසා, හෝම්ස්ට හිරිහැරයක් වීමට ඉඩ



http://sherlockholmesinvestigations.blogspot.com



නොමැති බැව් මම සිතාගත්තෙමි. එබැවින් වහා හැඳ පැළඳගෙන මම කුලීරියකින් ගොඩොල්ෆින් විදිය බලා ගියෙමි.

එම ස්ථානයට ළඟාවීමට මට පැයකට කිට්ටු කාලයක් ගතවිය. පොලිස් භටයන් කිහිපදෙනෙකු ඇතිත් පාරේ ගැවසෙන අයුරු ගොඩොල්ෆින් විදිය දිගේ ඉදිරියට යද්දී දුටුවෙමි. එහෙත් මට කිසිවක් සිතාගැනීම අපහසු විය.

73 අංකය සහිත තහඩුව සවිකොට තිබුණේ අඩි දහයක් පමණ උස්වූ පාරට සමාන්තරව පිහිටි නිවසක් මතය. එහි එක් පසෙකින් එනම් අංක 71, අශ්වකරත්ත අලුත්වැඩියා කරන කම්හලකි. අනෙක් පසින් අංක 75 වූයේ බොහෝ පෙඩීන් අබලන් තට්ටුදෙකේ ගොඩනැගිල්ලකි. නගරසභාව මඟින් එය ළඟදීම කඩාදමන බවට දැන්වීමක්, එහි ගේට්ටුවේ අලවා තිබිණි. අංක 73 ලෙස මා සඳහන් කළ උස්තාප්පයට සවිකොට නාමපුවරුවක් විය.

"කායික හා මානසික ආබාධිතයන් සඳහා වෘත්තීය පුහුණු පාසල"

එහි ගේට්ටුව අසල මුරට සිටි පොලිස් භටයෙක් මා හඳුනාගෙන, මට එහි ඇතුළුවීමට අවසර දුන්නේය.

ගේට්ටුවට යාර පනහක් පමණ ඈතින් තිබ්බු දෙකේ පැරණි ගෙයක් මට යන්තමින් දකින්නට ලැබිණ. මිදුල පුරා සිටුවා තිබූ ඝනව අතුවිහිදුණු මල් පඳුරු නිසා නිවස බොහෝදුරට ආවරණය විය. කෙසේ වෙතත් එය අලංකාරව තබාගත් නිවසක් නොවූ බව එතැනට ළංවෙද්දී මම දුටුවෙමි. තට්ටු ගණන් දූවිලිවලින් වැසුණු බිත්ති තිබූ එම නිවස, මිනිස්වාසයෙන් තොර එකක් ලෙස බැලුබැල්මට පෙනිණ. ඉදිරි දොරටුව කෙළින්ම මිදුලේ වැලි පොළොව ලෙයින් තෙත්වී තිබූ අයුරු ද මම දුටුවෙමි.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා ඇතුළෙ ඉන්නවා. ගෙ ඇතුළටම යන්නු" කියූ පොලිස් භටයා මා ඉදිරියට යොමු කළේය.

එය පදිංචිකරුවන් නොමැතිව අත්හැර දැමූ නිවසක් ලෙස එළියට දිස්වූ බව මම කලින් සඳහන් කළෙමි. පාළුවට තිබූ ඉස්තෝප්පුවේ දොරෙන් විසිත්ත කාමරයට ඇතුළුවූ මම, ඉමහත් පුදුමයට පත්වුණෙමි. එය යන්ත්‍රසූත්‍රවලින් පිරී තිබිණි. ඉන් බොහොමයක් නවීන මාදිලියේ මුද්‍රණ යන්ත්‍ර වූ අතර, පැරණි යන්ත්‍ර



http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

කිහිපයක් ද විය. විසිත්ත කාමරයට සම්බන්ධව තිබූ ලොකු කාමරයක, මුද්‍රණ කටයුතු සඳහා මහා කඩදාසි රෝල් ගණනාවක්, කැපූ කඩදාසි මිටි, මුද්‍රණ තීන්ත අඩංගු බෝතල් රැසක් ද විය. ඒ කාමරයේම එක් මුල්ලක ලී වලින් පැදූ ලාච්චු හත අටක් ගොඩගසා තිබිණ. කුඩා කුටීරවලට වෙන්කොට තිබූ ලාච්චු, මුද්‍රණ යන්ත්‍රවලින් ඉවත්කළ අකුරු ගබඩා කිරීම සඳහා තිබූ ඒවා බැව් දකිය හැකි විය.

මම ඊළඟ කාමරයට එබිකම් කොට බැලීමි. එය පිරෙන්නටම ගොඩගසා තිබුණේ අලුතෙන්ම මුද්‍රණය කළ පොත් රාශියකි.

නිවස ඇතුළට වන්නට තිබූ තවත් කාමරයක, මගේ මිත්‍රයා සහ ස්ටැන්ලි හොප්කින්ස් පොත් කියවමින් සිටි අයුරු දුටුවෙමි. හෝම්ස් සැපපහසු පුටුවක වාඩිවී, මේසයක් මත තබාගත් පොතක්, ලන්තල කාචයේ ආධාරයෙන් පරීක්ෂා කරමින් සිටියේය.

"මෙතෙක ඔබටත් අලුතක් තියෙනවා වොට්සන්. ඇතුළටම එන්න" මගේ මිත්‍රයා කිව්වේ හිස ඔසවා බලා සිනාසෙමිනි. "බලන්න වොට්සන්, හොප්කින්ස් අතේ තියෙන පොත මොකක්ද කියල..... ඉවාන් තුර්ගෙනිව්ගේ 'ප්‍රථම ප්‍රේමය සහ තවත් කථා.' ලෝකයේ ශ්‍රේෂ්ඨ සාහිත්‍ය කෘති කියවන්න කියල මං ඔබට කිව්වෙ ඇයි කියල ඔබට දැන් තේරෙනවා ඇති"

"හෝම්ස්. මට නම් මේ කිසිම දෙයක් තවමත් තේරුම්ගන්න අමාරුයි" මම කීවෙමි. "මේ ස්ථානය කොහොමද සිදුවෙලා තියෙන අපරාධයට සම්බන්ධ වෙන්නෙ? කෝ අපරාධකාරයා? කාගෙද අර මිදුලෙ තියෙන ලේ? ඊළඟට මේ පොත් නිසා කොහොමද කෙනෙක් මරණයට පත්වුණේ?"

"කලබලවෙන්න එපා මිත්‍රයා." හෝම්ස් කීය. "ඔය ප්‍රශ්න හැම එකකටම පිළිතුරු අප ළඟ තියෙනවා. අපරාධකාරයා මේ වෙලාවෙ නම් ඉන්නෙ පොලිස් අත්අඩංගුවෙ. මිදුලෙ තියෙන ලේ ගැන කියනවා නම් ඒ අසරණ පොලිස් භටයෙකුගේ. ඔහු ඇතුළු තවත් භටයන් කිපදෙනෙක් නිවස වට කළා. මේ පොලිස් භටයා එන්නට ඇතුළුවුණා. අපරාධකාරයා වෙඩි පහරක් එල්ල කළේ පැනයන අරමුණෙන්. ඊට කලින් ඔහු තමයි කාන්තාවක් ඝාතනය කළේ. ඒ ඔක්කොම, සාහිත්‍යයට සේවයක් කරන ධනපතියෙකුගේ හපන්කම්"

හෝම්ස් එසේ කියද්දී පොලිස් මෘත ශරීරාගාරයෙන් කරත්තය හා සේවකයන් පැමිණ ඇති බව පොලිස්භටයෙක්






දැනුම්දුන්නේය. ඒ අනුව ඉස්වාත් මරණ පරීක්ෂණය සඳහා, මළසිරුර ගෙනයන ලදී.

"මං මෙච්චර වෙලා මෙහෙ හිටියෙ වොට්සන් එනතුරු" හෝම්ස් කීය. "ඔබගේ පාඨකයන් සඳහා මේ කථාව කියනවා නම් මේ තැන හොඳින් බලාගැනීම ඔබට ප්‍රයෝජනවත් වේවි කියල මට හිතුණා."

මුද්‍රණාලයේ මුද්‍රණය කර තිබූ විවිධ පොත්වලින් එක බැගින් ගෙන හෝම්ස් වෙනුවෙන් පාර්සලයක් සාදන ලද්දේ ස්ටැන්ලි හොප්කින්ස් විසිනි. කාමරයක ගොඩගසා තිබූ මුද්‍රණයේදී නරක්වූ ලොකු කඩදාසි රැසකින් කිහිපයක් තෝරාගත් මගේ මිත්‍රයා, ලාච්චුවක තිබූ ලිපිගොනු කිහිපයක් ද තම භාරයට ගත්තේය.

"මම දන්නවා වොට්සන් තවම මේ කිසිදෙයක් හරිහැටි තේරුම් ගන්න බැරි බව" හෝම්ස් කීය. "පොලිස් ස්ථානයට යන අතරේ මං ඔබට හැමදෙයක්ම තේරුම් කර දෙන්නම්"

නිවස මුරකිරීමට පොලිස්භටයන්ට පවරා හොප්කින්ස් ද අප සමඟ පැමිණියේය. අප වෙනුවෙන් සූදානම් කර තිබූ ලොකු අශ්වකරත්තයට නැගී අපි ගොඩොල්ෆින් වීදියෙන් පිටත්ව ආවෙමු.

"පහුගිය කාලෙ, ඒ කියන්නෙ අවුරුද්දකට කලින් ඉඳන් පොත් ප්‍රකාශන ආයතන කිහිපයක්ම පොලිසියට පැමිණිලි කරල තිබුණා." හෝම්ස් පැවසුවේ අප අශ්වකරත්තයෙන් පොලිස් ස්ථානය වෙත යන අතරය. "මගේ හිතවත් ලෙස්ට්‍රේඩ්ට තමා ඒව බාරවුණේ. හම්බෝල්ඩ්, ඒ. සී. වයිට්, කැම්බ්‍රිජ් විශ්වවිද්‍යාල ප්‍රකාශන හා ජෝජ් සහ විලියම්, තමා ලන්ඩන් සහ ඒ අවට ඉන්න ප්‍රධානම පොත් ප්‍රකාශකයින්. ඔවුන් ප්‍රකාශයට පත්කරන්නේ නවකථා සහ නාට්‍ය පොත්. එයිනුත් වැඩියෙන්ම අලෙවි වන පොත් විදේශීය භාෂාවලින් ඉංග්‍රීසියට පරිවර්තනය කළ පොත්. එංගලන්තයේ පමණක් නොවෙයි, ලෝකයේ හැමරටකම පාහේ ටෝල්ස්ටෝයි, දොස්තයෙව්ස්කි ආදී රුසියන් ලේඛකයන්ගේ පොත් ඉතාම ජනප්‍රියයි. ඉතාලි හා ප්‍රංශ ලේඛකයන්ගේ කෘතීන්, අපේම ජේන් ඔස්ටන්, බ්‍රොන්ටේ සොයුරියන්ගෙ, ආදීන්ගේ කෘතීන් ජනප්‍රිය බව අමුතුවෙන් කියන්න උවමනා නැහැ. නීත්‍යානුකූලව මේ පොත් මුද්‍රණය කරන්නේ මං අර කලින් සඳහන් කළ සමාගම්. නමුත් කවුරුන් හෝ නීතිවිරෝධීව මේ පොත් මුද්‍රණය කර බෙදාහැරීම




www.sinhalaelibrary.com

කරන බව අපට දැනගන්න ලැබුණා. මේකෙ පිටිපස්සෙ ඉන්න මහා මොළකාරයා කවුද කියන එක සොයාගැනීමයි ලොකුම ප්‍රශ්නය වුණේ. ඊළඟට මේවා කරන්නේ කොහේද, බෙදහරින්නේ කොහොමද කියන ඒවාත් කිසිම පිළිතුරක් නොලැබුණු ගැටලු.

පොත් ප්‍රකාශන සමාගම්වලින් පැමිණිලි ලැබුණාම ලෙස්ට්‍රේඩ් මා හමුවෙන්න ආවා. හොර තක්කඩියන් අසුව හෝ අල්ලාගැනීමයි අපේ අරමුණ වුණේ. ඒ සඳහා අපි පොත් සමාගම්වලට උපදෙස් දුන්නා, ඔවුන් මුද්‍රණය සඳහා යොදාගන්නා කඩදාසිවලට විශේෂ දියසලකුණු යෙදීමට. පාඨකයාට හිරිහැරයක් නොවන අන්දමෙන් "මුද්‍රණදෝෂ" රහස් ලෙස සිතාමතා යෙදීම, පොත් බැඳීමේදී එහි හාරවියට ඇතුළු කරන වර්ණවත් කඩදාසි තීරු ආදී තවත් දේවල්. මේ ආදී සූක්ෂම උපාය මාර්ග විසිහතරක් අපේ මුද්‍රණකරුවන් පොත්වලට ඇතුළු කළා. හොරෙන් පොත් මුද්‍රණය කරන අය මේ කිසිවක් දැනගෙන හිටියේ නෑ. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳන්න අපට අවශ්‍යව තිබුණේ කාලය පමණයි. හොර පොතක් අල්ලාගත්තාම, ජිග්සෝ ප්‍රහේලිකාවක් විසඳනු ආකාරයට, ගැටලුව ලිහන්න පුළුවන් වෙන විදියටයි හැමදෙයක්ම සැලසුම් කළේ. මේ කටයුත්තේ යෙදෙන එක් පුද්ගලයෙකු හෝ අල්ලාගත්තාම, හොරු රැනම අල්ලාගන්න පුළුවන් බව මං ස්කොට්ලන්ඩ්යාඩ් එකට පැවසුවා.

මා පොලිසියට කිව්වේ මුලින්ම හොර මුදල් නෝට්ටු මුද්‍රණය කරන්නන් ගැන සෝදිසියෙන් ඉන්න කියලයි. ඒක කරල පුරුදු අයට හොර පොත් මුද්‍රණය බොහොම පහසුයි. අනෙක අවුරුද්දේ හැමකාලයකම පොත් විකිණීම එක වගේ කෙරෙන්නේ නෑ. පාරිභෝගිකයා අතේ මුදල් හිඟ කාලෙට, විශේෂයෙන්ම උත්සව සමයට පොත් විකිණෙනවා හුඟක් අඩුයි. හොර පොත් මුද්‍රණකරුවා මේ කාලෙට කරන්නේ හොර මුදල් නෝට්ටු මුද්‍රණය. ඒක රටක ආර්ථිකය මුළුමනින්ම බිඳ දමා විනාශකරන්න පුළුවන් අපරාධයක්.

නැතැනියෙල් ගිබ්සන් ගැන ඔබ අහල ඇති වොට්සන්. ඔහු හුඟක් ප්‍රසිද්ධ ධනපතියෙක් හැටියට, එහෙම නේද? වෙවන් ප්‍රාන්තයේ මෙතෝදිස්ත දේවගැතිවරුන් පවත්වාගෙන යන අනාථ නිවාසයකට වරක් ඔහු පවුම් දහසක් පරිත්‍යාග කළා. තවත් සැරයක් ඊස්ට් ඇන්ග්ලියාහි සුළිසුළඟින් කඩාවැටුණු දේවමැදුරක්



http://sherlockholmesinvestigations.blogspot.com



ගොඩනැගීම ස්වකීය ධන පරිත්‍යාගයෙන් කළා. තවත් වතාවක් යුද්ධයෙන් අසරණවූ ළමයින් වෙනුවෙන් අරමුදලක් පිහිටුවීමට කටයුතු කළා"

"ඔහු වංචනිකව මුදල් උපයන කෙනෙක් කියලද ඔබ කියන්නේ?" මම ඇසීමි. "ඔහුද මෙතැන මොළකාරයා?"

"අන්න හරි"

"වංචනිකව මුදල් උපයනවා නම් ඇයි ඔහු මේ විදියට මුදල් පරිත්‍යාග කරන්නේ?"

"එහි අරමුණ රටේ මිනිසුන් මුළාමග යැවීම" හෝම්ස් කීය. "ඔබට මතක ඇති අපි අල්ලාගත් අර බැංකු හොරා ජෝන් ක්ලේ..... සිටි ඇන්ඩ් සබර්බන් බැංකුවේ ගාලවත් බිඳලා ප්‍රංශ රත්රන් අරන් පනින්න හැදූ මිනිහා. ඔහු එක් සතියක ස්කොට්ලන්තයේ බැංකුවක් බිඳලා මුදල් කොල්ලකෑවා. ඊළඟ සතියේ කෝන්වෝල්හි අනාථ නිවාසයක් හදන්න විශාල මුදලක් පරිත්‍යාග කළා. ඒ වගේම ඔහු හොර නෝට්ටු අච්චු ගැහුවා. මිනීමැරුවා. මෙහෙම අපරාධ කරද්දීත් පරිත්‍යාගවල යෙදෙන එකට හේතුව දන්නෙ දෙවියො තමයි. සමහරවිට ත්‍යාගශීලී ධනපතියෙක් හැටියට රටට පෙන්වලා තමන්ගේ අපරාධ හංගාගන්න වෙන්නත් පුළුවනි. ඔබ දන්නවාද වොට්සන් ලෙස්ට්‍රේඩ් ඒක තේරුම් කළේ කොහොමද කියලා?"

"කොහොමද?"

"ලෙස්ට්‍රේඩ් කියන්නේ මේ අය ස්වර්ගයට යන්නත් බලපත්‍රයක් හොරෙන් මුද්‍රණය කරගෙන, දෙවියන් වහන්සේ රවටන්න බලාපොරොත්තු වෙනව ඇති!"

ස්ටැන්ලි හොප්කින්ස්ට මෙන්ම මට ද සිනාපහළ විය.

"කොහොම හරි ඔහු සුප්‍රකට ප්‍රකාශන සමාගම් හතරක පොත් හොරෙන් මුද්‍රණය කළා." හෝම්ස් කීය. "මේ සඳහා නැතැනියෙල් ගිබ්සන් තෝරාගත්තේ ඉතාම ඉහළින් අලෙවිවන ජනප්‍රිය පොත්. අප අර ගිය තැන තමයි ඔහුගේ හොර මුද්‍රණාලය.

මේ මුද්‍රණාලයේ ප්‍රධාන මුද්‍රණ ශිල්පියා මෙන්ම කළමනාකාරිය වුණේ මරීටා ලොරේන් නම් අවිවාහක තරුණ කාන්තාව. හොඳ ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලැබූ ඇය, මුලින් කටයුතු කරල තියෙන්නේ ගුරුවරියක හැටියට. මුද්‍රණාලයකට කළමනාකාරවරියක් අවශ්‍යයි කියලා පුවත්පතක පළවුණු දැන්වීමකට, ඇය අයදුම්කරල



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

තියෙනවා. ඒකෙනුයි මරිට්‍රා ලාරේන්ට, නැතැනියෙල් ගිබ්සන් හමුවුණේ. මේ මුද්‍රණාලයේ මුද්‍රණ කටයුතු කෙරුණේ හොර රහසේ. එක්පැත්තකින් අබලන් නිසා කඩාදමන්න නියමිතව, අත්හැරදමූ විශාල මන්දිරයක්. අනෙක් පැත්තෙන් අශ්වකරත්තවල යකඩසැකිලි සාදන ලෝහ වැඩපොළක්. මේ දෙක අතරේ මුද්‍රණාලය රහසිගතව පවත්වාගෙන යන්න ඔවුන්ට අපහසුවුණේ නෑ. වොට්සන් ඔබ කැමති ඇති මේ කතාවේ ඉතිරිහරිය ගිබ්සන්ගේ කටින්ම අහගන්න....."

මේ වනවිට අප ගමන්ගත් අශ්වකරත්තය ස්කොට්ලන්ඩ්යාඩ් පොලිස් මූලස්ථානයට ළඟාවී තිබිණ. දෑත් විලංගු දමූ අපරාධකරුවා අසුනක වාඩිවී සිටි අතර හෝම්ස්ගේ හා හොප්කින්ස්ගේ ඇමිණීම බලාපොරොත්තුවෙන් පොලිස් ප්‍රධානියෙක් ඉහළ පහළ සක්මන් කරමින් සිටියේය.

"මං මේ බලාගෙන හිටියේ ඔබ දෙන්දෙනා එනතුරු. මේ අපරාධකරුවා අල්ලාදීම ගැන මුළු පොලිස් සේවයම ඔබට ණයගැතියි හෝම්ස් මහත්මයා. මේනු කර ඇති අපරාධ මදිවාට අහිංසක පොලිස්භටයෙකුටත් වෙඩි තියලා ඝාතනය කළා. ගිබ්සන්. දැන් ඉතින් කියනව බලන්න තමුන්නැහේගේ කතාව. මේ කටඋත්තරය තමුසෙට එරෙහිව සාක්ෂියක් හැටියටත් යොදාගන්න පුළුවනි. මං කැමතියි කල් ඇතුවම ඒක මතක්කරලා හිටින්න"

අපරාධකරුවා අපගේ මුහුණු දෙස බැලුවේ, තමාගේ කථාන්තරය පටන්ගත යුත්තේ කොතැනින්දැයි විමසීමට මෙනි.

"ඔබේ කථාව මුල ඉඳලම අපට කියන්න මහත්මයා" හෝම්ස් කීය.

මඳවේලාවක් නිහඬව සිටි ඔහු අන්තිමේදී කථාව ඇරඹුවේය. ඔහුට තිබුණේ ඉතාම රළු කටහඬකි.

"..... මං දන්න කාලෙ ඉඳලම මගේ තාත්තා කළේ පොත් වෙළඳාම. ඒ කාලෙ දැන් තරම් නීතිරීති තද නැහැ. හොරට මුද්‍රණය කළ පොත් අපේ පොත් සාප්පුවේ එළිපිට විකුණුවා. පොත් හොරෙන් මුද්‍රණය කිරීම කළේ වෙනත් පුද්ගලයින් දෙන්නෙක්. ඔවුන් ඒවා ගෙනත් තාත්තාට විකුණා මුදල් අරගෙන ගියා. ඒ කාලේ හුඟක්ම ජනප්‍රියව තිබුණේ වෝල්ටර් ස්කොට්ගේ හා ඩැනියෙල් ඩෙෆෝගේ පොත් බව මට මතකයි. මුදල් ගනුදෙනුවක්



http://sherlockholmesinvestigations.blogspot.com



සම්බන්ධයෙන් ඇතිවුණු දබරයකදී තාත්තා මේ එක් හොර මුද්‍රණකාරයෙකුට වෙඩිතබා මරාදැම්මා. ඒ අපරාධයට තාත්තාට මරණ දඬුවම ලැබුණා.

එතකොට මගේ වයස අවුරුදු විස්සයි. මගේ ඉගෙනීම හරිහැටි අවසන් කරල තිබුණෙත් නැහැ. රැකියාවකට පුහුණුවක් ලබල තිබුණෙත් නැහැ. තාත්තාගේ හදිසි මරණය නිසා අටදෙනෙකුගෙන් යුත් අපේ පවුල අනාථ වුණා. මම තමයි පවුලේ වැඩිමහල් පිරිමි දරුවා. පොත් වෙළඳාමෙන් තාත්තා විශාල ආදායමක් ලැබුවත්, අපට කියල ඉතිරි කළ දෙයක් තිබුණේ නැහැ. ඒ මොකද ඔහු හරි හම්බ කළ මුදල් මත්පැන් බීමට හා සූදුවට ගිහිං විනාශ කළා.

තාත්තාගෙන් ලැබුණු වැරැදි ආදර්ශය නිසා මමත් වැරැදි රැකියාවකටම යොමුවුණා. අනෙක් අය හොරට මුද්‍රණය කරන පොත් විකුණලා තමයි තාත්තට මැරුම් කන්න සිදුවුණේ. ඒ නිසා මං තීරණය කළා ඒ වැඩකටයුතුවලට මගේම මුද්‍රණාලයක් පටන්ගන්න. සූදුවට ණය දෙන්නෙකුගෙන් මං ගිනිපොලියට ණයක් ගත්තා. අයිතිකාරයා වයස්ගත වීම නිසා විකිණීමට තිබූ පරණ මුද්‍රණ යන්ත්‍රයක්, ඒ ණය මුදලෙන් මං මිලට ගත්තා. ඒ යන්ත්‍රාලයේම සේවය කළ මැදිවිය ඉක්මවූ සැන්ඩර්ස් නම් මුද්‍රණ ශිල්පියා මගේ ළඟ රැකියාවට එන්න කැමැතිවුණා.

මාස කිහිපයක් ගතවෙද්දී මට හැකිවුණා ණය බේරන්න. ඊළඟට එකතුවුණු මුදලෙන් මං තවත් මුද්‍රණයන්ත්‍රයක් අරගෙන තවත් සේවකයෙකු බඳවාගත්තා. ආදායම හොඳවෙද්දී මං ඔවුන්ගේ වැටුප් වැඩිකළා. අවුරුදු එකහමාරක් ගතවෙද්දී මට හොඳ ආදායමක් ලැබුණා. මගේ සේවකයන්ට මං ගෙව්වා වෙනත් මුද්‍රණාලවල එවැනි සේවකයන් ලබන වැටුප මෙන් දෙගුණයක්.

අවුරුදු තුනක් පමණ අපි සාර්ථකව වැඩකටයුතු කරගෙන ගියා. හම්බර්ඩ්ලා, ජේ. සී. වයිට්ලා මුද්‍රණය කරන පොත් තරමටම හොඳට අපි අපේ පොතුත් හොරට මුද්‍රණය කළා. ඔය කාලයේ තමයි මං විවාහවුණේ. ඒ ඉරිද දෙව්මැඳුරේදී හඳුනාගත් වැදගත් පවුලක තරුණියක්. ඔවුන් බොහොම භක්තිමත් අය. ඔවුන් දැනහිටියේ මං ව්‍යාපාරිකයෙකු බව පමණයි. පුණ්‍යායතනවලට මං මුදල් පරිත්‍යාග කළෙත් ආගමට ලැදි සත්ගුණවත් කෙනෙක් කියා රටට පෙන්වන්න.



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

මං කළේ නීතිවිරෝධී කටයුත්තක් බව දන්න නිසා, සේවකයන් මට යටහත් පහත්වුණේ නැහැ. අවංක වුණේ නැහැ. මුද්‍රණ කඩදසි ඔවුන් රෝල්පිටින් හොරෙන් විකුණුවා. මුද්‍රණ තීන්ත බෝතල් හොරකම් කරගෙන ගිහින් වෙන මුද්‍රණාලවලට විකුණා තිබුණා. මේවා ගැන මට පොලීසියට පැමිණිලි කරන්න විධියක් නොතිබුණු බව ඔවුන් දැනහිටියා. මේ අතරේ ඔවුන් බලෙන් වගේ වැටුපත් වැඩිකරවා ගත්තා.

මීට අවුරුදු තුනකට පෙර, ඔහුගේ වැටුප යළිත් වරක් දෙගුණයකින් වැඩිකරන මෙන්, සැන්ඩර්ස් මගෙන් ඉල්ලා හිටියා. මං ඒකට කැමතිවුණේ නැහැ. ඒ වෙනකොටත් ඔහුට විශාල වැටුපක් ගෙවූ බව මම සැන්ඩර්ස්ට මතක් කළා. නමුත් ඔහු ඒක පිළිගත්තේ නැහැ. වැටුප් වැඩි නොකොළොත් මං ගැන පොලීසියට ඔත්තුවක් දෙන බවට ඔහු තර්ජනය කළා.

මහත්වරුනි. මට කරන්න තිබුණේ එක දෙයයි. මේ ආකාරයට ඔහු මාව ප්‍රාණ ඇපකාරයෙකු කරගෙන, දිගින් දිගටම කප්පම් ඉල්ලීමට ඉඩ ඇති බව මම තේරුම්ගත්තා. ඉතින් මට සිද්ධවුණා සැන්ඩර්ස්ගේ ඉරණම පාතාල ලෝකයේ මැරවර කල්ලියකට භාරදෙන්න. මං කර්නල් සෙබස්ටියන් මොරාන් හමුවෙන්න ගියා. සැන්ඩර්ස් අතුරුදන් කරන්න මොරාන් ඉල්ලා හිටියේ පවුම් තුන්සීයක් පමණයි. මොරාන් ඒ වැඩේ සාර්ථකව ඉටුකළා.

ඊළඟට මං තීරණය කළා මුද්‍රණාලයේ පාලනය මම ම කරන්න. නමුත් මට එතැනටම වී සිටීමට නොහැකි නිසා වැඩ කළමනාකරණයට කෙනෙකු අවශ්‍ය වුණා. මොවුන් වැඩි වැටුපක් ඉල්ලන්නේ මුද්‍රණාලවල පළපුරුදු අය වුණාම. ඒ නිසා මං තීරණය කළා වැඩ නොදන්නා කෙනෙක් බඳවාගෙන වැඩ පුහුණු කරන්න. හොරමැරකම් තර්ජන කළේ පිරිමි අය නිසා, මං හිතුවා කාන්තාවක රැකියාවට බඳවාගන්න.

මරීටා ලොරේන් මගේ ආයතනයේ රැකියාවට ආවෙ මං පුවත්පත්වල පළකළ දැන්වීමකට. ඉතාලි සම්භවය තිබූ පවුලකින් පැවත ආ ඇය, මුලින් ඉංග්‍රීසි ගුරුවරියක්. ඇගේ පියා මියගිහින්. මව ඇතුළු පවුලේ හයදෙනෙකුගේ බර කරටගන්න ඇයට සිදුවී තිබුණා. ඒ නිසා ඇයට උවමනාවී තිබුණේ වැඩි පඩියක් ගෙවන මොකක් හෝ රැකියාවක්. ඇය ඉතාම දක්ෂ තැනැත්තියක්. මුද්‍රණ කටයුතු


http://sherlockholmesinvestigations.blogspot.com



ගැන හැමදෙයක්ම මරීටා ඉතාම ඉක්මනින් ඉගෙනගත්තා. අකුරු ඇමිනීමේ කටයුතු ඇය ඉක්මනින්, ඉතා හොඳින් කළා. හොරෙන් මුද්‍රණය කරන පොත්වලට ඉල්ලුම වැඩිවෙද්දී, අපි තවත් තරුණ සේවකයෙකු බඳවාගත්තා. එයින් එක් කෙනෙක් රාත්‍රිකාලයේ පොත් බෙදාහැරීමට. ඔවුන් නැවතී හිටියේ මුද්‍රණාලයේම පිටුපස තිබූ කාමරවල.

මරීටාගේ නිවස තිබුණේ ලන්ඩනයෙන් පිටත. ඒ නිසා ඇයට දිනපතා ගෙදර ඉඳන් රැකියාවට එන්න හැකියාවක් තිබුණේ නැහැ. අනෙක මුද්‍රණ වැඩකටයුතු හැමදෙයක්ම කෙරුණේ රාත්‍රී කාලයේ. දවාලට එතැන වහල දමලයි තිබුණේ. මුලින් නවාතැන් පොළක නැවතී රැකියාවට ආ ඇය, පසුව මුද්‍රණාලයේම නවාතැන් ගැනීමට ඉඩදෙන ලෙස මගෙන් ඉල්ලා හිටියා. උඩ තට්ටුවේ කාමර දෙකක් නිතරම වසා දමා තිබුණු නිසා මං ඒකට ඉඩදුන්නා. එයින් එක් කාමරයක පදිංචි වූ ඇය, අනෙක් කාමරය ඇගේ මුළුතැන්ගෙය හා කෑමකනකාමරය ලෙස පාවිච්චි කළා.

පසුගිය අවුරුදු තුනක පමණ කාලයක් මුද්‍රණාලයේ කළමනාකාරිය හැටියට කටයුතු කළේ මරීටා. මේ කාලය තුළ ඇගේ වැටුප් වැඩිකරන මෙන්, තුන්පාරක් මගෙන් ඉල්ලා හිටියා. මං බොහොම කැමැත්තෙන් ඊට එකඟවෙලා ඇගේ වැටුප් වැඩිකළා. නමුත් අන්තිමේදී ඇය මගෙන් ඉල්ලා හිටියේ මට කළ නොහැකි දෙයක්"

"ඒ මොකක්ද?" හොප්කින්ස් විමසුවේය.

"දරුවන් තුන්දෙනෙකු සහිත මගේ පවුල දික්කසාද කර දමලා තමා විවාහ කරගන්නා මෙන් මරීටා මගෙන් ඉල්ලා හිටියා." ගිබ්සන් කීය. "ඒකට මං කැමතිවුණේ නැහැ. මුලින් මගේ ප්‍රතික්ෂේප කිරීම්වලට ඇය නිහඬව සිටියා. මාස තුනහතරක් යද්දී, ඇයව විවාහකරගන්නා මෙන් මරීටා දිගින්දිගටම මට බලකරන්න පටන්ගත්තා. මං කිව්වා ඇයට මාස හයක වැටුප් අරගෙන රැකියාවෙන් ඉවත්වෙන්න කියලා. එතකොට ඇය, මගේ වංචනික කටයුතු පොලීසියට හෙළිකරන බව කියලා මට තර්ජනය කළා"

"ඉතින් ඇයවත් නිශ්ශබ්ද කරන්න ඔබට සිද්ධවුණාද?" කථාවට බාධාකරමින් හොප්කින්ස් ඇසුවේය.

"මේ වංචනික ව්‍යාපාරවලට හැටි එහෙමයි මහත්මයා" ගිබ්සන් කිවේ යළිත් පාපෝච්චාරණය අරඹමින්. "අපරාධ ලෝකයේ


http://sherlockholmesinvestigations.blogspot.com

කටයුතුවලට හවුල්වුණු කෙනෙකුට, මගදී ඒවායින් අයින්වෙලා යන්න අවසර නැහැ. මුල්දීම ඉවත්වෙලා ගියා නම් ඒක වෙන දෙයක්. නමුත් අවුරුදු ගණනක් හවුලේ එකට නීතිවිරෝධී කටයුතුවල යෙදිලා, පස්සේ එයින් අයින්වෙලා පොලිස් ඔත්තුකරුවෙකු වෙන්න කිසිම ඉඩක් නැහැ.

ඒ වුණත් නිදහසේ කතාබහ කරලා, ඇයට ලොකු වන්දියක් ගෙවලා හරි නිදහස් වෙන්නයි මං හිතුවේ. මුද්‍රණාලය සතියකට වහලා සේවක ළමයින් ගෙදර යැව්වා. ඒ බැරිම වුණොත් මගේ අවසන් විසඳුම ක්‍රියාත්මක කරන අදහසෙනි.

මම සාමාන්‍යයෙන් මගේ පෞද්ගලික අශ්වකරත්තයෙන් දවල් වෙලාවලට මුද්‍රණාලයට එන්නේ නැහැ. එහෙම කළේ ආරක්ෂක පියවරක් හැටියට. එදා දවලුත් පුරුදු විදියට කුලීරියක ඇවිත් ගොඩොල්ෆින් විදියට හැරෙන තැනින් බැහැලා, පයින්ම ආවා. මං ඇයට කියලා තිබුණේ මේ ගැන කතාබහ කරලා විසඳුමකට එමු කියලා. ඒ හින්ද ඇය හිතන්න ඇත්තේ ඇගේ අරමුණු ඉටුවේවි කියලා. මං කන්තෝරු කාමරයට ඇවිත් වාඩිවුණාම මරීටා තේ පිළියෙල කරන්න ගියා. මිනිත්තු දහයකින් පමණ ඇය අප දෙදෙනාටම උණු තේ කෝප්ප දෙකක් හදාගෙන ආවා. ඇය සුළුදේටත් තදින්ම කෝපවෙන කෙනෙක්. ඒ නිසා තේ බොන අතරේ මං කථාව පටන්ගත්තේ සුහදව - මං ඇයගෙන් ඇහුවා, මාස හයක වැටුප අරගෙන මෙහෙන් ඉවත්වී යන්න කැමති නැත්නම්, ඇය ඉල්ලන මුදල කොපමණද කියලා. එහෙම මුදලක් අරගෙන කොහේ හෝ ඈත පළාතකට ගිහිං, රැකියාවක් කරගෙන, විවාහයක් කරගෙන, වැදගත් විදියට ජීවත්වෙන්න පුළුවන් බව මං ඇයට කිව්වා.

නමුත් එයට තදින්ම කෝපාවිෂ්ට වූ ඇය කළේ මොකක්ද? කෝපයෙන් වියරු වෙලා, ගින්දර මෙන් උණු තේ කෝප්පය මගේ මුහුණට දමාගැසීමයි. උණු තේවලට මගේ මුහුණ පිළිස්සී දැඩිවේදනාවක් දැනුණා. මට හිතුණේ ඒ වේදනාව නිසා මං ක්ලාන්ත වේවි කියලයි. දෙවියනේ! යක්ෂාවේශ වුණු මගේ දෑතින් මොනවා වුණාද කියල මම ම දන්නෙ නෑ. මගේ සිහිකල්පනාව යථා තත්ත්වයට එද්දී මා අතින්වුණු අපරාධය මට දකින්න ලැබුණා. මොන තරම් වංචා කටයුතුවල යෙදුණත්, කවදවත් මගේ දෑතින්



http://sherlockholmesinvestigations.blogspot.com



කුකුළ් පැටියෙකුවත් මරාදමලා නැහැ. ඉතින් මෙවැනි පාපයක් මා අතින් සිදුවුණේ කොහොමද? දැන් මං මොකක්ද කළයුත්තේ? මට හිතාගන්න බැරිවුණා. මේ විදියේ වංචනික ව්‍යාපාරයක යෙදීම නිසා මගේ ජීවිතයම අවුල්කරගත් බව වැටහුණේ ඒ වෙලාවේ.

ඇගේ මළසිරුර ඉක්මනින් මෙතැනින් ඉවත්කරගෙන ගිහින් කොහේ හෝ දැමිය යුතු බව මං තේරුම් ගත්තා. කොහොමද මං තනියම එහෙම දෙයක් කරන්නේ? මට ඒවට හවුල්කරගන්න කෙනෙක් හිටියේ නැහැ. මළසිරුර කොටස්වලට කපලා ට්‍රන්ක පෙට්ටියකට පටවාගත්තොත්, කාටවත් නොපෙනෙන අන්දමට මට තනියෙන් ගෙන යාහැකි බව මං තේරුම් ගත්තා. අලුත් ට්‍රන්ක පෙට්ටියකට වඩා පරණ එකක් ගත්තොත්, පොලීසිය පහසුවෙන් නොමඟ යවන්න පුළුවන් කියලයි මට හිතුණේ. මං එවේලේම ගිහින් පරණ බඩු කඩයකින් ට්‍රන්ක පෙට්ටියක් අරගෙන ආවා. මස් කපන ලොකු පිහියක් මරීටාගේ මුළුතැන් ගෙයි තිබුණා. ලේ හැමතැනම ගලායන එක වළක්වන්න මං ඉවතදමන කඩදාසිවලින් ඇගේ සිරුරේ කැබලි ඔතුවා. අන්තිමට කඩදාසි මදිවුණාම ජනේල දෙකක තිර ගලවලා ඒවාත් දැම්මා. මළසිරුර සම්පූර්ණයෙන්ම ට්‍රන්ක පෙට්ටියට දමන්න හැකිවේවි කියලා හිතුවත්, එක් අතක් ඉතිරිවුණා. එයත් දෙල් රෙද්දක හා වැහිකබායක ඔතලා දිග ගමන්මල්ලක දමා ගත්තා. මගේ ඇඳුම් මාරුකරලා ලේ සහිත ඇඳුමත් ඒ ගමන් මල්ලටම දැම්මා.

බොහෝ කලකට ඉස්සර විනෝද ගමනක් ඇවිත් මට මෝකැම්බ් බොක්ක හා වැල්මත් ගම්මානය ගැන මතක තිබුණා. ඒ ආ වෙලාවක කුලියට ගත් බෝට්ටුවක රුවලක් දමාගෙන, දවසක් ම මුහුදේ ගතකරලා මට අත්දැකීමුත් තිබුණා. වැල්මත්වල හා රෑටන්වල මුහුදේ, ගල්පර අසල සමහර තැන් ගැඹුරු බවත් ධීවරයන් කිව් බව මට මතක්වුණා. ඉතින් කළයුතු හොඳම දේ ලොකු බර කළුගලක් ගැටගහලා පෙට්ටිය මුහුදට දැමීම බව පැහැදිලියි. ඒකට අවශ්‍ය වෙන කඹ සහ ගලුත් තවත් ගමන්මල්ලක දමලා එද රෑ මගේ අශ්වකරත්තයෙන් මුද්‍රණාලය වෙත අරගෙන ආවා. ට්‍රන්ක පෙට්ටියට සහ අනික් ගමන්මල්ලට ඉබ්බයතුරු දමලා ඒ තුනම දුම්රියපොළට අරගෙන ගිහිං ඒවා මෝකැම්බ් වෙත යවන්න ගමන්බඩු අංශයට භාරදුන්නා. මොකක් හරි ප්‍රශ්නයක් වුණොත්



http://sherlockholmesinvestigations.blogspot.com

මාව අඳුනාගැනීම අපහසුවෙන්න මං බොරු රැවුලක් මුහුණේ අලවාගෙන, මුහුණ ආවරණය වන විදියේ හිස්වැස්මකුත් දමාගත්තා.

එද රාත්‍රී ඒවා ගමන්බඩු දුම්රියෙන් යවලා, මං පසුවද උදේ මගී දුම්රියෙන් මෝකැම්බ් බලාපිටත්වුණා. සවස්වෙද්දී මං එහේට ළඟාවුණා. හෝටලයක කාමරයක් කුලියට අරගෙන හැන්දෑවෙන තුරු ඉඳලා, රෑළඟට කුලීරියකින් දුම්රියපොළට ගිහිං, මගේ ගමන් බඩු ටිකත් එයට දමාගෙන වැල්ලත් බලා ගියා. අඳුරු වැටිගෙන එද්දී බෝට්ටු කුලියට දෙන තැනකින් මං බෝට්ටුවක් කුලියට ගත්තා. ට්‍රන්කපෙට්ටිය සහ ගමන්මලු දෙක පටවාගෙන මුහුදේ ගැඹුරු යයි හිතූ පැත්තට මං යාත්‍රා කළා. එතැනට ළංවුණාම රුවල බාලා, ගමන්මල්ලක තිබූ වැහිකබායේ එතූ අත අරගෙන එය ඔතා තිබූ කඩදසි හා වැහිකබාය ඉවත්කරලා, ඒ අත ට්‍රන්ක පෙට්ටියට ගැටගැසුවා. මං ගෙනගිය ගලත් ඒකටම ගැටගැසුවා. මං හිතුවේ ඒ අත මාළුන් විසින් කා දමාවි කියලයි. නමුත් ඒක මෝරෙකු විසින් ගිල දමා තිබුණේ මං නොහිතූ විදියට. ඒක පුවත්පත්වල පළවුණාම මගේ හිතට බයක් ඇතිවුණා. මුද්‍රණාලයේ වැඩ පටන් ගැනීම තවත් දින කිපයකින් කල් දැමුවා"

"ලොරේන් මෙනෙවියගේ මළසිරුර හමුවුණාම අපි ඇය ගැන විස්තරයක් පුවත්පත්වල පළකළා" හෝම්ස් කීය. "ඇය හොයාගෙන ඇගේ ඥාතීන් පොලීසියට හෝ ඔබේ කාර්යාලයට නොආ එක පුදුමයි"

"කාර්යාලය පිහිටි තැන හෝ කරන රැකියාව ගැන විස්තර, ගෙදරඅයට දැනුම්දෙන්න එපා කියලා, මං මරීටාට කියලයි තිබුණේ. අනික ඊට දිනකිහිපයකට කලින් ඇය ගෙදරගොස් ආව නිසා ඔවුන් සැකයක් හිතන්න නැහැ" කී නැතැනියෙල් ගිබ්සන් ඔහුගේ පාපෝච්චාරණය අවසන් කළේය.

"ඔබ කොහොමද හෝම්ස් මේ හැමදෙයක්ම හොයාගත්තෙ?" මා හෝම්ස්ගෙන් ඇසුවේ එද සවස අපගේ නිවහනේදීය.

"මෙහෙම වෙලාවට අපි දෙපැත්තකට අවධානය යොමු කරන්න ඕන" ඔහු පැවසුවේ තම හාන්සිපුටුවේ වැතිර සුපුරුදු ලෙස පයිප්පය මුවේ රඳවාගනිමිනි. "එක් පැත්තක් මිනිස් සිරුරේ කැබලි මගින් එය හඳුනාගැනීම. බොහෝවිට අපට එයට



http://sherlockholmesinvestigations.blogspot.com



උදව්වෙන්නේ ශරීරයේ ඇති උපන්ලප, තුවාල කැළැල්, පච්ච කෙටීම් ආදිය. හැඳසිටි ඇඳුම්වල ලොන්ඩ්‍රි ලකුණු තිබුණේ නැහැ. පැළඳසිටි ආභරණ ආදිය ලැබුණා. නමුත් ඒවායිනුත් සතුටුදයක ප්‍රතිඵල නොලැබුණු බව ඔබට මතක ඇති. ඇගේ මුහුණේ තිබූ සුවිශේෂ උපන් ලපය ගැනත් අත්බෑගයේ තිබූ ඔරලෝසුවේ කොටා තිබූ M. L. අකුරු ගැනත් රතුපාට ගවුම ගැනත් කියල අපි පුවත්පත් දැන්වීමක් දැමුවා. නමුත් අපි හිතන තරම් මිනිස්සු පුවත්පත්වල පළවෙන ඔය වගේ දැන්වීම කියවන්නෙ නෑ. ඇය ළඟකදී ගෙදර ගිහින් ආව එකත්, රැකියාව කළ තැන ගැන විස්තර ගෙදර අය දැන නොසිටීමත් අපට බාධාවක් වුණා.

අපේ අවධානය යොමුකරන්න ඕන අනෙක් පැත්ත තමා සිරුර සමග හමුවෙන දේවල්. ට්‍රන්ක පෙට්ටිය හෝ යොදගෙන තිබූ කඹය සාමාන්‍ය ඒවා නිසා ඒවායින් එතරම් ප්‍රයෝජනයක් වුණේ නෑ. කොහොම නමුත් පෙට්ටිය තමාගෙන් මිළට ගත්තේ මේ විත්තිකරු බවට පරණබඩු වෙළෙන්ද නඩුවේදී සාක්ෂි දේවි. මට ලැබුණු වැදගත්ම හෝඩුවාව මොකක්ද දන්නවද? ඇගේ සිරුරේ කැබලි එතීමට අපරාධකාරයා යොදගෙන තිබූ කඩදසි. ඒවට ලේ උරාගෙන තිබුණත්, පසුව මුහුදු වතුරෙන් සේදී තිබුණත් මට හරි ප්‍රයෝජනවත් වුණා. ඒ කඩදසි වියළා සියුම් ලෙස පරීක්ෂා කරද්දී මට හැකිවුණා එක් වැදගත් කරුණක් හොයාගන්න. ඒ තමයි මේවා මුද්‍රණාලයකින් ඉවත දැමූ කඩදසි බව. යන්ත්‍රයක් ක්‍රියාකරවලා පොතක පිටු මුද්‍රණය කිරීමට පෙර, මුද්‍රණ ශිල්පීන් කඩදසියක් යන්ත්‍රයට දමා පිටුවල අකුරු සැකැස්ම නිවැරදිද කියා පරීක්ෂා කර බලනවා. වැරදි තිබුණොත් ඒවා නිවැරදි කර යළිත් යන්ත්‍රයට දමන්නේ බොහෝවිට අර කඩදසියේම අනෙක් පැත්ත. මීළඟට මුද්‍රණයේදී නරක්වූ කඩදසි, යන්ත්‍රවල තැවරුණු තීන්ත පිසදැමීමට යොදගත් කඩදසි ආදියත් මේවාට අයත්. මෙවැනි අත්හද බැලීමට යොදගත් අහක දමන විශාල කඩදසි තොග සෑම මුද්‍රණාලයකම එකතුවෙනවා. බොහොම වෙලාවට ඔවුන් ඒවා යොදගන්නේ විකිණීම සඳහා ගෙනයන පොත් පාර්සල් කිරීමට. නමුත් ගිබ්සන් ඒවා යොදගත්තේ වෙනත් වැඩකට.

ලේ තැවරුණු නිසා තරමක් නොපැහැදිලි වුණත්, කඩදසිවල මුද්‍රණය වූ අකුරු තවමත් ඉතිරි වී තිබුණා. කාචයේ උපකාරයෙන් මේවා පරීක්ෂා කර බලන්න මට සෑහෙන වෙලාවක් ගතවුණා.



http://sherlockholmesinvestigations.blogspot.com

මොනවද මේවල මුද්‍රණය කරල තියෙන්නේ? අර ඉංග්‍රීසි ලේඛකයන්ගේ පොත්, මං ළමා කාලයේදී කියෙව්වත් රුසියන් ලේඛකයන්ගේ පොත් මං කියවලා නැහැ. ඒකට හේතුවුණේ ඒවා සාර්ථකව ඉංග්‍රීසියට පරිවර්තනය වුණේ මෑත කාලවල. ඒවායේ හොඳ ඉංග්‍රීසි පරිවර්තන ඒ කාලේ ඒතරම් සුලභවුණේ නෑ. නමුත් අර කොළවල තිබුණු රුසියානු නම් ගම් නිසා ඒවා මොනවද කියල තේරුම් ගැනීම මට අපහසුවුණේ නෑ. ඊට අමතරව මං අර කලින් සඳහන් කළ ඉංග්‍රීසි හා ප්‍රංශ ලේඛකයන්ගේ පොත්වල නරක්වුණු කඩදසිත් මට හමුවුණා.

ඇයි මේ නරක්වුණු, නොකැපූ මුද්‍රණ කඩදසි මේ තරමක්, කියා මං කල්පනා කළා. ඊළඟට මට මතක්වුණා ඇගේ ඇඟිලි තුඩුවලින්, ඇය මුද්‍රණාලයක සේවය කළ තැනැත්තියක් යන කරුණ අප සොයාගත් බව. එතකොට මට හොයාගන්න තිබුණේ මේවා මුද්‍රණය කළ මුද්‍රණාලය. ඉතින් ප්‍රධාන ප්‍රකාශන සමාගම් හතරකින් පොත්වල සාම්පල ගෙන්වාගෙන මං පරීක්ෂා කළා. නමුත් අර ලේ තැවරුණු කඩදසිවල තිබුණු, මං ගෙන්වාගත් පොත්වල නොතිබුණු මුද්‍රණ වෙනස්කම්. එතකොට කොහොමද මෙහෙම දෙයක් වුණේ? මට එක්වරම මතක්වුණේ අර ප්‍රසිද්ධ සමාගම් කලකට පෙර ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලිසියට කර තිබූ පැමිණිලි. ජනප්‍රිය පරිවර්තන කෘති හොරට මුද්‍රණය කරන තැන් කොහොමද අපි හොයාගන්නේ? මං ස්ටැන්ලි හොප්කින්ස්ට මේ ගැන කිව්වා.

"හෝම්ස් මහත්මයා. මං රටපුරා තැන් තැන්වලින් පොත් ගෙන්වා ගෙන ඔබට දුන්නොත්, ඔබට පුළුවන්ද හොර පොතෙත්, හොඳ පොතෙත් වෙනස හඳුනාගන්න?" ඔහු ඇහුවා.

"ඔව් මට පුළුවනි" මං කිව්වා.

"හරි. මං මේ එංගලන්තය පුරාම ඇති පොත් වෙළඳසල්වලින් පොත් එකතුකරනවා" ඔහු කිව්වා. "වොට්සන්. මං ඔබට කලිනුත් කියල ඇති, ස්ටැන්ලි හොප්කින්ස් මේ ස්කොට්ලන්ඩ්යාඩ් එකේ ඉන්න පොලිස් නිලධරයන් අතර දක්ෂයෙක් බව. ලෙස්ට්‍රේඩ්ල, බ්‍රැඩ්ස්ට්‍රීට්ලට වඩා ඉදිරියෙන් තමයි හොප්කින්ස් ඉන්නෙ."

"ඔබ කොහොමද ඉමී පොත් එකතුකරන්න බලාපොරොත්තු වෙන්නෙ?" මං ඇහුවා.


http://sherlockholmesinvestigations.blogspot.com



"බයවෙන්න එපා හෝම්ස් මහත්තයා. මං ඒක නියම පිළිවෙළට කරන්නම්" ඔහු කිව්වා. "මං ඒකට යවන්නේ සිවිල් ඇඳුමෙන් සැරසුණු පොලිස් භටයන් නෙමෙයි"

"එහෙනම්?"

"මං යවන්නේ මගෙන් හොඳින් උපදෙස් ලැබූ සාමාන්‍ය මිනිස්සු..... ඒ කියන්නේ පාසැල් ශිෂ්‍යයින්, ශිෂ්‍යාවන්, කම්කරුවන්, ලිපිකරුවන්, දේවගැතිවරු, හෙදියන්, ගෙවල්වල මෙහෙකරුවන් සිය මුණුබුරු මිණිබිරියන් සමඟ වයස්ගත සීයල ආච්චිල, කුලීරථ රියැදුරන්..... වගේ අය"

"විශිෂ්ටයි" මං කිව්වා "ඔවුන් පොත් මිලට ගත්තේ කොහෙන්ද කියල ඔබ හඳුනාගන්නේ කොහොමද?"

"පොත් වෙළඳසැලෙන් පිටියට ආව ගමන් ඔවුන් එහි නම හා ලිපිනය පොතේම ලියාගනීවි. එයින් හොඳපොත් මොනවද හොර පොත් මොනවද කියල හෝම්ස් මහත්මයා තෝරල දෙන්න. ඉතිරි හරිය මං බලාගන්නම්"

"ඔබ මේක ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නෙ ලන්ඩන් නගරයෙද?" මං ඇහුවා.

"ඇයි පිටපළාත්වලත් මේ ගැන හොයල බැලීම වඩා සුදුසුද?"

"ඔව්" මං කිව්වා. "බොහොම වෙලාවට මේ වගේ වංචනික දේවල් වඩාත්ම යැවෙන්නේ ලන්ඩන් නගරයෙන් බොහොම ඈතට. ඒ අනුව එඩිංබරෝ, ග්ලාස්ගෝ, මැංචෙස්ටර්, බ්‍රිස්ටල්, ප්ලිමත් ආදී ඈත පළාත්වලින් හොයල බැලුවොත් හොඳ පොත්වලට වඩා හොරපොත් අල්ලගන්න පුළුවන් වේවි. ඒ මොකද හොර නෝට්ටු මුද්‍රණය කරන වංචනිකයන් ඒවා මුලින්ම මහජනයා අතර බෙදහැරීම කරන්නේ ඈත පළාත්වල"

මං කියූ දේවල් නිශ්ශබ්දව අහගෙන හිටි හොප්කින්ස්, වහාම ඔහුගේ පොලිස් නිලධාරියන් කිහිපදෙනෙකු කැඳවලා උපදෙස් දීල තියෙනවා. ළමයින් දෙදෙනෙකු යවා කළ මිලදී ගැනීම්වලින් පොටර් චතුරශ්‍රයේ හා පිංචිං පටුමගේ වෙළඳසල් දෙකක් හොයාගන්න ඔවුනට හැකිවුණා. පොලිස් කණ්ඩායම් දෙකක් සමඟ ගිහින් හොප්කින්ස් ඒ ස්ථාන වැටලුවා. තමන්ට හිරේ යන්න වෙන බව තේරුම් ගත් වෙළඳසල් හිමියන් හොර පොත් මුද්‍රණාලය පිහිටි තැන හා ඒවා ලබාදෙන පුද්ගලයා ගැන තොරතුරු හෙළිකරල තියෙනවා.


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

මේ හොරපොත් මුද්‍රණයේ මොළකාරයා නැතැනියෙල් ගිබ්සන් බව දැනගන්න ලැබුණාම, හොප්කින්ස් පවා පුදුමයට පත්වුණා. ඒ මොකද ගිබ්සන් ප්‍රසිද්ධියට පත්වෙලා තිබුණේ දානපති ව්‍යාපාරිකයෙක් කියලයි.

මුද්‍රණාලයේ වැඩකටයුතු කෙරෙන්නේ රෑ කාලයේ බව අශ්වකරත්ත කම්හලේ සේවකයන් දැනහිටියා. එතෙට්ටම උස තාප්පයක් තිබුණු නිසා ඔවුන් කවදාවත් ඒ පැත්ත දකල තිබුණේ නැහැ. නිතරම රතුපාට ගවොම් ඇඳි කාන්තාවක් මේ මුද්‍රණාලයේ සේවය කරන බව, කම්හලේ කළමනාකරු කිව්වා. ඇය කුලීරියකින් ඇවිත් හැන්දෑයාමයේ අංක 75 දොරටුවෙන් ඇතුළුවෙන හැටිත්, සමහරදාට උදයකාලයේ පිටවී ගිය හැටිත්, ඔහු දැකතිබුණා. ඔහු හිතල තිබුණේ ඒ කාන්තාව, මේ ආයතනය අයිති තැනැත්තාගේ බිරිඳ කියලයි. ඔවුන් අසල්වාසීන් සමඟ කිසිදු ආශ්‍රයක් තිබිල නැහැ. බලාගෙන ගියාම ඒකෙ පුදුමයකුත් නැහැ. ඊයෙ රාත්‍රී පොලිස් කණ්ඩායමක් ගිහින් මෙම මුද්‍රණාලය සහිත නිවස වැටලුවා. අශ්වකරත්ත කම්හලේ වහලට නැඟුණු පොලිස්භටයෙකු දැකල තිබුණා, නිවස ඇතුළේ කවුදෝ සිටිබව. අපි බලාපොරොත්තු වුණේ උදේ දහයට පමණ ගිහිං ඔහු සිරභාරයට ගන්නයි. නමුත් අර පොලිස්භටයා ඔහුගේ හිතේ ඇතිවී තිබුණු උද්යෝගයට උදේ පාන්දරම ගසකට නැගලා, මුද්‍රණාලයට අයත් වත්තට පැනලා තියෙනවා. තමන් කළ අපරාධය පොලීසියට හෙළිවී ඇති බව තේරුම් ගෙන තමන් කොටුවී ඇති බව වැටහී ගිබ්සන් පොලිස්භටයාට වෙඩිතියලා. ගිබ්සන් එහෙම කරන්න ඇත්තේ පැනයන අරමුණෙන්. නමුත් ඒක සාර්ථක වුණේ නෑ. ගේට්ටුවල අගුල් කඩාගෙන ඇතුළුවුණු පොලිස් කණ්ඩායම් දුටු ඔහු යටත්වුණා" හෝම්ස් තම දීර්ඝ කථාව අවසන් කළේය.

"කොහොම හරි මේ වාරයේත් අපි හිතූ විදියේ දීර්ඝ නිවාඩුවක් ගතකරන්න අපට බැරිවුණා නේද හෝම්ස්" මම කීවෙමි. "වෛද්‍ය මොන්රෝගේ අවවාද ඒ ආකාරයෙන්ම පිළිපදින්න අපි හෙටම ආපහු යමු මෝකැම්බ්වලට."

"මගේ හිතවත් වොට්සන්. මම නම් හිතන්නේ මගේ සිරුරට ඉතාම හොඳ විවේකයක් ලැබුණා කියලයි. අර කලින් තිබූ අමාරු, අසනීප මොකක්වත් දැන් නෑ. ආයිත් ඒ රෝග ලක්ෂණ මතුවුණොත් විතරක් අපි වහාම යමු මුහුදුබඩ ගම්මානයක නිවාඩුවකට.



http://sherlockholmesinvestigations.blogspot.com



ඒක තමයි වොට්සන්" හෝම්ස් යළිත් කීය. "බලාගෙන ගියාම මේ පරීක්ෂණයත් අර ඉන්ද්‍රනීල මාණික්‍යය පරීක්ෂණයට හුගක් සමානයි නේද? ඒක පටන්ගත්තේ පාත්තයෙකුගේ බඩේ තිබුණු මැණිකකින්. අවසන් වුණේ හොර වංචාවක් එළිදරව්වීමෙන්. මේක පටන්ගත්තේ අසරණ තරුණියෙකුට මිනී මෝරෙකුගෙන් එල්ලවුණු ප්‍රහාරයකින්. අවසන්වුණේ වංචනික ව්‍යාපාරයක සුලමුල හා බිහිසුණු ඝාතනයක් හෙළිදරව් වෙමින්."

නැතැනියෙල් ගිබ්සන්ට එරෙහි නඩුව ඕල්ඩ්බේලි අධිකරණයේදී විභාගයට ගැනිණ. මරියා ලෝරේන් ඝාතනය සහ පොලිස්භටයා ඝාතනය යන නඩු දෙකෙන්ම වරදකරු බවට තීරණය වූ ඔහුට මරණදඬුවම නියමවිය.

www.sinhalaelibrary.com
Reading Purpose Only



http://sherlockholmesinvestigations.blogspot.com

# සුදුඅන්තුවා

1905 වසරේ ශීත ඍතුවේ එක් උදෑසනක මම වෙනදට වඩා කලින් අවදිවූයෙමි. කෑමමේසය අසල මට දකින්නට ලැබුණු දසුනෙන් මම එක්වරම පුදුමයට පත්වීමි. මගේ හිතවත් ෂර්ලොක් හෝම්ස් මහතා, මොහොතක් හෝ අපතේ නොයවා උදෑසන ආහාරය ගනිමින් සිටියේය. "මෝනිං ටෙලිග්‍රාෆ්" පුවත්පතට මුහුණ යොමුකරගෙන කේජු සමග බිත්තර ගිල දමූ ඔහු, මා දුටු විගස මට සංඥාවක් කළේය. ඒ ඔහු අසලට පැමිණෙන ලෙසය. උදේ දහය වනතුරු නිදාගන්නා හෝම්ස් කල්තබා උදේ ආහාරය ගැනීම අසාමාන්‍ය සිදුවීමකි. එබැවින් කුමක් හෝ වැදගත් ප්‍රශ්නයක් මතුවී ඇතිබව මම සිතාගත්තෙමි. උදේ ආහාරය මා සඳහා ද එවන මෙන්, ගෙහිමි කාන්තාවට සීනුව නාදකොට දැනුම් දී, මම හෝම්ස් අසලින් අසුන්ගත්තෙමි.

ඔහු වෙත ප්‍රශ්න කිහිපයක්ම එල්ල කළත් ඔහුගෙන් කිසිවක් අසාගැනීමට මට නොහැකි විය. ඔහු මා සමග කථාව පටන්ගත්තේ කෝපි කෝප්ප දෙකක්ම පානය කොට පයිප්පය ද දල්වාගැනීමෙන් පසුව ය.

"මිත්‍රයා ඔබ අද උදේ පාන්දරින්ම නැගිටලා කෑම ගත්තේ මොකක් හරි ලොකු ප්‍රශ්නයක් මතුවෙලා වගෙයි." මම කීවෙමි.

"ඔබේ නිගමනය හරි. බලන්න වොට්සන් තව ටිකක් ඉදිරියට යන්න පුළුවන්ද කියලා"

මම වටපිට බැලීමි. මේසය මත වූ කඩදාසි කිහිපයක ලියා තිබූ යමක් මට දකින්නට ලැබිණි. මම ඒවා අතටගෙන පරීක්ෂාකර බැලුවෙමි. බයිසිකල් ටයර් හා අශ්වකරත්ත රෝදවලින් ඇතිවන සලකුණු මගින් ඒවා හඳුනාගත හැකි ආකාරය ගැන හෝම්ස් ලියූ සටහනකි ඒ. බයිසිකල් ටයර්වල කට්ට රටාව ගැන රූප සටහන් රැසක් ද සහිතව ඔහු විස්තර ඉදිරිපත් කර තිබිණි.

"සැකයක් නෑ" මා කීවේ ඒ දෙසට අත දිගු කරමිනි. "ඔබ පටන් අරගෙන තියෙනවා තවත් පොත් පිංචක් ලියන්න. ඒකෙ මුල්පිටුව


http://sherlockholmesinvestigations.blogspot.com



මට නොපෙනුණත්, මම කියන්නද එහි මාතෘකාව - "රෝද සලකුණු මගින් අපරාධකරුවන් හඳුනාගැනීම"

"මට කණගාටුයි වොට්සන්" ඔහු කීවේ පයිප්පය මුවෙන් ඉවතට ගෙන මා දෙසට දුම් වලාවක් පිඹිමිනි. "ඔබේ නිරීක්ෂණ හැකියාව මං හිතූ තරම් ශක්තිමත් නෑ. ඔබ මෙතැනට එද්දී මං කරමින් හිටියේ මොකක්ද? පුවත්පත කියවීම. මගේ දැඩි අවධානයත් යොමුවුණේ ඒකෙ තිබූ පුවතකට කියල ඇයි ඔබට නොහිතුණේ?"

මට සිදුවූ අතපසුවීම ගැන මගේ හිතේ සියුම් කලකිරීමක් මෙන්ම ලැජ්ජාවක් ද ඇතිවිය.

"ඇයි මොකක්ද සිදුවෙලා තියෙන්නේ? බරපතල අපරාධයක්ද?" මා ඇසුවේ මේසය අසලින් හිඳගනිමිනි.

"මගේ හිතවත් මිත්‍රයා" හෝම්ස් කීය. "විස්තරය මං දැනගත්තේ පුවත්පතෙන්. කිසි සැකයක් නෑ. ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පරීක්ෂකයෙක් වැඩි වෙලාවක් නැතිව අපව හොයාගෙන එනවා. ඒ හින්ද මේ විස්තර ඉක්මනින් කියවලා හිතට ගන්න. ඊයේ හවස "ස්ටාර්" පුවත්පතේත් "ඊවනිං නිවුස්" පුවත්පතේත් මේ ගැන සඳහන්කර තිබුණා. නමුත් විස්තර කිසිවක් තිබුණේ නෑ. ඔබම කියවලා බැලීම වඩා සුදුසුයි"

## මැකෝලි සාමි අභිරහස් ලෙස ඝාතනයට ලක්වේ.

දශක දෙකකට පෙර සුප්‍රකට රග්බි මෙන්ම පෝලෝ ක්‍රීඩකයෙකු වූ මැකෝලි සාමිවරයා ඔහුගේ හිසට එල්ල වූ වෙඩිපහරකින් ඊයේ උදෑසන අභාවප්‍රාප්ත විය. මියයන විට ඔහු 38හැවිරිදි වියේ පසුවිය.

අවිවාහකයෙකු වූ සාමිවරයාගේ ඝාතනය ගැන තවමත් කිසිවෙකු අත්අඩංගුවට ගෙන නොමැති බව, යෝක්ෂයර් පොලිසියේ අපරාධ පරීක්ෂණ අංශයේ භාර ඩන්කන් බෝල්ටන් මහතා "මෝනිං ටෙලිග්‍රාෆ්" පුවත්පතට පැවසුවේය. මෙය ඉතාම සංකීර්ණ මෙන්ම අභිරහස් මිනීමැරුමක් නිසා මෙය ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය වෙත යොමුවෙතැයි විශ්වාස කෙරේ. එම පරීක්ෂණය භාරවනුයේ අපරාධ පරීක්ෂක ලෙස්ට්‍රේඩ් හෝ බ්‍රැඩ්ස්ට්‍රීට් මහත්වරුන් දෙදෙනාගෙන් එක් අයෙකුට යයි විශ්වාස කටයුතු මාර්ගයකින් දැනගන්නට ලැබී ඇත. ඒ දෙදෙනාගෙන් කාට භාරවුවත් එය සාර්ථක ලෙස විසඳන බවට සැක නැතැයි තතු දත්තෝ පවසති.


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

අපරාධය පිළිබඳ සියලුම තොරතුරු තවමත් හෙළිකරගෙන නැතැයි ස්ප්‍රිංෆීල්ඩ් පොලිස් ස්ථානයේ නිලධරයෙක් අපට පැවසුවේය. දැනට හෙළි වී ඇති තොරතුරු අනුව මෙම සිද්ධියේ තොරතුරු මෙසේය.

ස්කොට්ලන්තයේ රජ පෙළපතට නෑකම් කියන පරම්පරාවකින් බිහිවුණු මැකෝලි සාමි, ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ ගණනාවක අනුශාසකත්වය දරුවෙකි. ගැටවර කාලයේ රග්බි ක්‍රීඩාවෙන් විශිෂ්ට දක්ෂකම් දක්වා ඇති ඔහු, ක්‍රීඩාවේ දියුණුව සඳහා සිය ධනය නොමසුරුව වියදම් කළේය. "බුයන්" යන නමින් තම මිතුරන් අතර හැඳින්වුණු ඔහු, ශ්‍රීමත් ඩෙනිස් කැමරන්ගේ එකම දියණිය වූ කැතරින් කැමරන් මෙනෙවිය සමග විවාහ ගිවිසගෙන සිටියේය.

ඉකුත් ජනවාරි 23 වැනිදා රාත්‍රියේ ගෝල්ඩන් ඊගල් සමාජ ශාලාවේ පැවැත්වුණු මිත්‍රි භෝජන සංග්‍රහයකට හා බාල් නැටුමකට ඔවුහු සහභාගි වූහ. 24 වැනිදට එළිවෙන පාන්දර කැමරන් මෙනෙවිය ඇගේ නිවස වෙත කැඳවාගෙන එන ලද්දේ මැකෝලි සාමිවර්යා විසිනි. තමාම පදවාගෙන ආ අශ්වකරත්තයෙන් කැමරන් මෙනෙවිය ඇගේ නිවසට ඇරලූ සාමිවරයා, ඉන්පසු තනිවම ටොරිංටන් හී පිහිටි තම නිවස බලා පිටත් වී ගියේය.

පික්ටන් අසල නිව්ෆෙඩ්ල් නම් කිරි ගොවිපොළේ කිරිදෙවීමේ කටයුතු හිමිදිරි පාන්දරයාමයේ සිදුවේ. ඒ සඳහා ගොවිපොළ වෙත සේවයට පැමිණෙමින් සිටි තරුණයන් දෙදෙනෙකුට අසාමාන්‍ය දර්ශනයක් දකගන්නට ලැබී ඇත. එනම් පාරෙන් ඉවතට පැන මඩ වගුරක එරී, පෙරළී තිබුණු අශ්වකරත්තයකි. අශ්වයාගේ ජීවිතය හානිවී නොතිබිණි. එහෙත් කරත්තය පෙරළී යාම නිසා ඇතිවුණු තුවාලවලින් ඌ වේදනාවෙන් කෑගසමින් සිටියේය. කිසිවක් තේරුම් ගැනීමට නොහැකි වූ තරුණයන්ට අශ්වකරත්තය තුළ දක්නට ලැබුණේ ලේ විලක් මැද මළසිරුරකි. වහා තම සේවා ස්ථානය බලා ගිය ඔවුහු ඒ මගින් පොලීසියට දැනුම් දුන්හ. එම අදාළ ස්ථානය වෙත පැමිණි ස්ප්‍රිංෆීල්ඩ් පොලීසියේ ඇන්ඩ්‍රූ කෝසන් මහතා පළපුරුදු පොලිස් නිලධරයෙකි. මෙය ගිනිඅවියකින් කළ මිනිස් ඝාතනයක් බව ඔහු වහා හඳුනාගත්තේය.

මේ පිළිබඳව පශ්චාත් මරණ පරීක්ෂණය ස්ප්‍රිංෆීල්ඩ් අසල මිඩ්ල්බර්ග් රෝහලේදී සිදුකරන ලදී. වෛද්‍ය රොජර් ඕ කොනර්



http://sherlockholmesinvestigations.blogspot.com



ගේ නිගමනය වූයේ, ළඟ සිට තබන ලද වෙඩි පහරක් නිසා මරණය සිදු වී ඇති බවය.

පළාතේ ජනප්‍රිය පුද්ගලයෙකු වූ මැකෝලි සාමිට සතුරන් සිටි බවක් දැනගන්නට නැතැයි ඔහුගේ සමීප මිතුරෝ පවසති. මෙය, මඟ රැක සිට කොල්ලකෑමකට කළ උත්සාහයක් විමට ඉඩ ඇති බව සමහරුන්ගේ මතයයි. සාමිවරයා නිතර ළඟ තබාගත් රත්රන් ඔරලෝසුව, ඔහුගේ කබාසාක්කුවේ නොතිබිණි. එහෙත් ඔහුගේ මුදල් පසුම්බිය එහි තිබිණි. මහමඟ ගැවසෙන මංකොල්ලකරුවන් කළ අපරාධ ගැන, මීට පෙර කිහිපවතාවක්ම මේ පුවත්පත මගින් වගකිවයුත්තන්ට දැනුම්දී ඇත. මෙවැනි වටිනා ජීවිතයක් විනාශ වීමෙන් පසුව වත් ඔවුන්ගේ ඇස් ඇරේදැයි අපි දැඩි ඕනෑකමකින් බලාසිටිමු.

පුවත්පත මුද්‍රණයට යද්දී.....

මේ සංකීර්ණ අපරාධය විසඳීමට, ලන්ඩනයේ විශේෂඥ රහස් පරීක්ෂක ෂර්ලොක් හෝම්ස් මහතා ගෙන්වා ගැනීමට තමා සැම උත්සාහයක්ම දරන බව යෝක්ෂයර් පොලිස් ප්‍රදේශයේ අපරාධ අංශය භාර ඩන්කන් බෝල්ටන් මහතා පවසයි"

"එහෙනම් මෙන්න මේ අලුත්ම පුවත නිසයි ඔබ ඉක්මනින් කෑම නැවේ?" මම ඇසීමි. "ඒ වුණත් ඇයි මට අවදි නොකළේ? මේකට මාව එක්කරගෙන යන්න ඔබේ කැමැත්තක් නැද්ද?" මා ඇසුවේ සිත් වේදනාවෙනි.

"මගේ හිතවත් වොට්සන්" හෝම්ස් මා ඇමතුවේ ළයාන්විත සිනාවකින් මුව සරසාගෙනය. "මේ වගේ සංකීර්ණ ගැටලුවක් විසඳීමට යාමේදී, මොනම හේතුවක් නිසාවත්, මගේ මිත්‍රයා මෙහි දමා යන්න මං බලාපොරොත්තුවෙන්නෙ නෑ. මං දන්නවා, ඔබ ඊයේ රෑ එක දෙක වනතුරු, අපේ අපරාධ පරීක්ෂණ ගැන සටහන් ලියමින් සිටි බව. ලෙස්ට්‍රේඩ්ල එද්දි කොහොමටත් නවයහමාර දහය වේවි. ඉතින් අනවශ්‍ය ලෙස ඔබ උදේ පාන්දරින්ම අවදිකිරීමට....."

ඔහුගේ කථාවට බාධාකරමින්, අපේ නිවසට පැමිණෙන්නෙකුගේ පාගැටෙන හඬක් අපේ තරප්පු පෙළ දෙසින් ඇසිණ. කථාව නැවැත්වූ මගේ මිත්‍රයා හොඳින් සවන්දීගෙන සිටියේය.



http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

"මට වැරදුණා වොට්සන්, මට වැරදුණා" හෝම්ස් කීය. "මං හිතුවට වඩා නුගක් කලින් ඔය එන්නේ නිලලත් රහස්පරීක්ෂකයෙක්. මේ සැරේ එන්නේ ලෙස්ට්‍රේඩ් නෙමෙයි, බ්‍රැඩ්ස්ට්‍රීට්. ඒ ගැන සැකයක් නෑ"

මගේ මිත්‍රයා පැවසූ දෙය නිවැරදි බව ඔප්පුකරමින්, ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ රහස් පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් දොරට තට්ටුකර කාමරයට පිවිසියේය. ඔහුගේ දෑතේ පුවත්පත් රාශියක් තිබිණ.

"සුභ උදෑසනක් හෝම්ස් මහත්මයා" බ්‍රැඩ්ස්ට්‍රීට් කීය. "මං හිතුවා ඔබ තවමත් නිදි ඇති කියල. නමුත් මට පෙනෙනවා ඔබ උදේ කෑම කාලත් අවසන් බව. ඒ වගේම මං ආවෙ මොන අරමුණකින්ද කියන එකත් ඔබ දන්නා බවට සැක නෑ"

"මං කෑම ගෙන් .අවසන් වුණත්, මගේ හිතවත් දොස්තර වොට්සන් තවම කෑම ගත්තෙ නෑ" හෝම්ස් කීය. "මැකෝලි සාමිගේ ඝාතනය ගැන මාව යෝක්ෂයර්යට කැඳවාගෙන යන්න ඔබ මෙහේ එන බව මම දනහිටියා. මෙහෙන් පිටත්වෙලා යන්න කලින්, මං කැමතියි ඔබට කියන්න තියෙන හැමදේකටම සවන්දෙන්න. ඊයේ හවස පුවත්පත්වලත්, අද "මෝනිං ටෙලිග්‍රාෆ්" පුවත්පතේ පළවූ තොරතුරුත් ඇරෙන්න ඔහු ගැන කිසිම දෙයක් මම දන්නෙ නෑ."

"හෝම්ස් මහත්මයා" බ්‍රැඩ්ස්ට්‍රීට් කීය. "අපට හොයාගන්න ලැබුණු විස්තර හැමඑකක්ම මං ඔබට කියන්නම්. කොහොමටත් යෝක්ෂයර් පැත්තට යන සීඝ්‍රගාමී දුම්රිය තියෙන්නෙ දහයයි පනහට. නිව්හැනිල්ලේ කෑම කාල කෝපි කෝප්පයක් බොන්න දොස්තර මහත්මයාට වෙලා තියෙනවා." බ්‍රැඩ්ස්ට්‍රීට් කීවේ හාන්සිපුටුවකට බරවෙමිනි.

සීනුව නාද කළ හෝම්ස් සේවක ළමයා කැඳෙව්වේය. ඔහුට, පොලිස් නිලධරයා සඳහා ද උදේ ආහාරය ගෙන එන මෙන් හෝම්ස් නියම කළේය.

"කමක් නෑ බ්‍රැඩ්ස්ට්‍රීට්" හෝම්ස් කීය. "අපට දුරගමනක් යන්න තියෙන නිසා, දවාලටත් එක්ක කෑම කාල තිබීම වඩාත්ම ප්‍රයෝජනවත්. ඒක නෙමෙයි, මේ මැකෝලි සාමිල, කැමරන්ල ගැන මං කිසිම දෙයක් නොදන්නා තරමයි. හැමදේකටම කලින්, මට ඔවුන් ගැන කියන්න"


http://sherlockholmesinvestigations.blogspot.com



"හෝම්ස් මහත්තයා. මං හිතන්නේ කතාව අරඹන්න සුදුසු තැනත් එතැනයි" කී පොලිස් නිලධාරියා තම අසුන මඳක් ගිනි උදුන දෙසට ලංකර ගත්තේය.

"මේ මිනීමැරුම ගැන සැකය පැහැදිලි ලෙසම යොමුවෙලා තියෙන්නේ, මියගිය පුද්ගලයාගේ මාමණ්ඩිය වීමට සිටි සර් ඩෙනිස් කැමරන් වෙතට. ඒ ඇයි කියන එක මං කථාව කියාගෙන යද්දී ඔබට වැටහේවි. ඒ නිසා පුද්ගලයින් හඳුන්වා දුන්නට පස්සේ, සර් ඩෙනිස් හා ඔහුගේ දුව මේ මිනීමැරුම සිදුවූ 23 වැනිද රාත්‍රිය ගතකළ හැටි විස්තර කරන්නම්.

සර් ඩෙනිස් කැමරන් කියන්නේ වංශවත් පරම්පරාවක ඉඩම් හිමි ධනවතෙක්. ඒ වුණත් ඔහු අවුරුදු විසිපහකට පමණ කලින් උක් වගාකිරීම සඳහා බටහිර ඉන්දීය කොදෙව්වල පදිංචියට ගිහින් තියෙනවා. බාබෙඩෝස්වල සාර්ථක ලෙස උක් වගා කළ ඔහුට, විශාල ධනයක් රැස්කර ගැනීමට හැකිවුණු බවයි පැවසෙන්නේ. ඔහුගේ විවාහය සිදුවුණෙත්, දුව කැතරින් උපත ලැබුවේත් එහිදී. සර් ඩෙනිස්ගේ වයස දැන් අවුරුදු හැටයි. ඒත් ඔහු තවමත් ක්‍රියාශීලී නිරෝගී පුද්ගලයෙක්. මීට අවුරුදු තුනකට පමණ කලින් බාබෙඩෝස්වලදී ඔහුගේ බිරිඳ මියගිහින් තියෙනවා. ඇය උණ රෝගයකට ගොදුරුවෙලා, නිසි වෙලාවට හරිහැටි ප්‍රතිකාර කර ගැනීමට නොලැබුණු නිසා මියගිය බවයි දැනගන්න ලැබුණේ. කොහොම වුණත් ඒ කණගාටුදායක සිදුවීම නිසා, බටහිර ඉන්දීය දූපත්වල ජීවිතය ගැන ඔහු කලකිරුණා. ඉතින් ඔහු තමන්ගේ එකම දියණියත් සමග ආපහු එංගලන්තයට ආවා. ඔහුගේ පරම්පරාගත නිවස බොහොම අබලන් තත්ත්වයකයි තිබුණේ. ඒක කඩා දමා, අලුතෙන් විශාල නිවසක් ඉදිකරගෙන ඔහු එහි පදිංචි වුණා. ස්ප්‍රිංෆීල්ඩ් හි පිහිටි එය එංගලන්තයේ දකින්න ලැබෙන මනරම් සුඛෝපභෝගී නිවසක්"

මේ අවස්ථාවේ ඔහුගේ කථාවට බාධාකරමින් බිලී නම් සේවක ළමයා අප දෙදෙනා සඳහා උදේ ආහාරය ගෙන ආවේය. කෝප්පයට උණුසුම් කෝපි ස්වල්පයක් වත්කර ගැනීමෙන් පසු බ්‍රැඩ්ස්ට්‍රීට් යළිත් වරක් කථාව ඇරඹුවේය.

"තරුණ කාලයේ දක්ෂ ක්‍රීඩකයෙකුව සිටි සර් ඩෙනිස් එංගලන්තයට ආපහු ආවට පස්සේ ගෝල්ඩන් ඊගල් ක්‍රීඩා


http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

සමාජයට බැඳුණා. සමහරු නම් කියන්නේ ධනකුවේරයකු වන සර් ඩෙනිස්, ක්‍රීඩා සමාජය විසින් බලෙන් බඳවාගත් බවයි. කොහොම වුණත් ඔහුට මැකෝලි සාමිවරයා අඳුනාගන්න ලැබුණේ මේ ක්‍රීඩා සමාජයේ වැඩකටයුතුවලදී.

මැකෝලි සාමි ස්කොට්ලන්තයේ බොහොම ඉහළ ප්‍රභූ පරම්පරාවකින් පැවත එන්නෙක්. නමුත් ඔහු දැන් ඒ හැටි වත්පොහොසත් කම් ඇති අයෙක් නොවෙයි. තමන්ගේ පියාගෙන් ඔහුට උරුමවුණු දේපොළ ඉඩකඩම් විකුණමින්, ඔහු කරල තියෙන්නේ ලොවපුරා සංචාරය කරමින් විනෝද වීම. ඔහුගේ ධනයෙන් තුන්කාලකම අහිමිකර ගත්තේ අශ්වරේස්වලට ගිහිං බව ප්‍රසිද්ධ කරුණක්.

සර් ඩෙනිස් කැමරන්ගේ දියණිය කැතරින් කැමරන් ඉතාම සුරූපී තරුණියක්. ළමා කාලය බටහිර ඉන්දීය දූපත්වල ගතකළ ඇය, එංගලන්තයේ පදිංචියට ආවට පස්සේ මෙහේ තරුණ තරුණියන් අතරේ මංමුලා වුණා. ඕනෑතරම් මුදල් හදල් තිබුණු නිසා කැමරන් මෙනෙවියට විවාහ යෝජනා ගණනාවක් තිබුණාලු. කොයිතරම් කඩවසම්, වංශවත් තරුණයන් හිටියත්, කැති කැමරන්ගේ සිත් ඇදගැනීමට සමත්වුණේ, තරුණාවිය ඉක්මවා යමින් සිටි මැකෝලි සාමි."

"ඔහු මීට පෙර විවාහ වී නැද්ද?" මම ඇසීමි.

"ඔහු දෙවරක්ම විවාහවෙලා, දික්කසාද වුණු කෙනෙක්" බ්‍රැඩ්ස්ට්‍රීට් කීය. "මුලින් ඔහු විවාහවෙලා තියෙන්නේ, එඩිංබ්‍රෝ විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකුගේ දියණිය සමග. ඒ විවාහයෙන් දරුවන් තිදෙනෙකු සිටිනවා. ඊළඟට ඇය දික්කසාද කර දමලා ඇමරිකාවට ගිය ඔහු, සැන්ෆ්‍රැන්සිස්කෝවේ නළගනක් සමග විවාහවී සිටියාලු. ඇය ගැන ඒ තරම් තොරතුරු අපි දන්නේ නෑ. නමුත් ඒ විවාහය දික්කසාදයකින් අවසන් කරලා, ඔහු ආපනු එංගලන්තයට ආවාලු. ඔහුගේ චරිතය ගැන කාගෙන්හරි චරිත සහතිකයක් ගන්න වුණා නම්, ඒක ඉතාම දුෂ්කර කටයුත්තක් වෙන බවයි ස්ප්‍රිංෆීල්ඩ් ප්‍රදේශයේ අයගේ මතය. කොහොම වුණත් කැතරින් කැමරන් මෙනෙවිය හමුවීමත් සමගම, ඔහුගේ ජීවිතය වෙනස් අතකට හැරුණු බව කවුරුත් පිළිගන්නවා. අධික ලෙස මත්පැන් පානය කළ, රේස්පුදුවේ ඇලීගැලී සිටි ඔහු, ඒ


http://sherlockholmesinvestigations.blogspot.com



හැමදෙයක්ම නවත්වා දැම්මලු. ඔවුන් මාර්තු මාසයේ විවාහවීමට නියමිතවයි ඉඳල තියෙන්නේ"

මේ වනවිට අපි කා බී අවසන් කළෙමු, යෝක්ෂයරය බලා පිටත්වීමට සූදානම් වුණෙමු. කථාවේ ඊළඟ කොටස අපට අසන්නට ලැබෙන්නේ දුම්රියේදී බව මම තේරුම් ගතිමි.

කල්වේලා ඇතිව දුම්රියපොළට පැමිණීමට අපට හැකිවිය. පළමුවන පංතියේ මැදිරියක කොටසක් අප සඳහා කලින් වෙන්කරවාගෙන තිබූ නිසා, බාධාවකින් තොරව නිදහසේ කතාබහ කිරීමට අපට අවස්ථාවක් ලැබිණ. මගේ මිතුරා ඔහුගේ වෙරිවුඩ් සයිප්පයට දුම්කොළ පුරවාගත්තේ අප දුම්රියට නැගුණු විගසමය. අනතුරුව ඔහු එය දල්වා ගත්තේ කථාවේ ඉතිරි කොටසට සවන්දීමට තමා සූදානම් බව හඟවමිනි.

"බ්‍රැඩ්ස්ට්‍රීට්" හෝම්ස් කීය. "මේ සිද්ධියට අදාළ චරිතවල පසුබිම ක්‍රමානුකූලව පැහැදිලි කිරීම ගැන මං ඔබට කෘතඥවෙනවා. ඔබ කථාව කියාගෙන යද්දී ඔබෙන් ඇසීමට ප්‍රශ්න දෙකක් හෝ තුනක් මගේ හිතට නොආවාම නොවෙයි. නමුත් මං එවෙලේ හිතුවා ඔබට බාධා නොකරන්න.

මෙන්න මෙකයි මගේ පළමුවැනි ප්‍රශ්නය. තමන්ගේ දියණිය විවාහය සඳහා මැකෝලි සාමිවරයා තෝරා ගැනීම ගැන ඇගේ පියා දක්වූයේ මොන වගේ ආකල්පයක්ද?"

"ඒකට පිළිතුර මං හිතන්නේ ඕනම කෙනෙකුට අනුමාන කරන්න පුළුවනි" පොලිස් නිලධරයා කීය. "මං හිතන්නේ මොනම තාත්තා කෙනෙකුවත් කැමති වෙන එකක් නෑ මැකෝලි සාමි වැනි කෙනෙකුට තමන්ගේ දුව විවාහකරල දෙන්න. සර් ඩෙනිස් මේ විවාහයට මුල ඉඳලම එකහෙළාම විරුද්ධවුණාලු. නමුත් ඔහුගේ දුව ඒ ගැන තැකීමක් කරල නෑනෑ. ඒවුලේ ඥාතීන්, වැඩිහිටි හිතවතුන්, කවුරු මොනවා කිව්වත්, කැති කැමරන් ඇගේ තීරණය වෙනස් කළේ නැහැ. මැකෝලි සාමිට උවමනා වුණේ කැතී මෙනෙවිය විවාහකර ගැනීමට වඩා, ඇගේ පියාගේ ධනස්කන්ධයේ හිමිකාරයා වීම බව කවුරුත් දන්නවා."

"නමුත් ඇය ඒක තේරුම් ගත්තේ නෑ?" මම ඇසීමි.

"ඇත්තෙන්ම ඔව් වොට්සන්" හෝම්ස් කීය. "මේ වගේ වෙලාවට තරුණ වයසේ අය කටයුතු කරන්නේ අන්ධයන් වගේ. ජීවිතය ගැන කිසිම අත්දැකීමක් පළපුරුද්දක් නැති ඔවුන්, තම පියා


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

හෝ මට පෙන්වාදෙන කරුණු පවා නොසලකා හරිනවා. ඔබට මතක ඇති මේ වගේ තරුණියක් අපට මීට කලිනුත් මුණගැහිලා තියෙනවා. මම ඒකෙදි බිහිසුණු අත්දැකීමකටත් මුහුණදුන්නා....."

"ඔව් මට මතකයි" මම කීවෙමි. "අර ඇඩල්බට් ග්‍රුනර් ආදිපාදවරයා සහ වයලට් ද මර්විල් මෙනෙවිය සම්බන්ධ සිද්ධිය. ඒකෙදි චණ්ඩින්ගෙන් හෝම්ස් මහත්තයාට මැර ප්‍රහාරයකුත් එල්ල වුණා."

"හරි මට මතකයි" බ්‍රැඩ්ස්ට්‍රීට් කීය. "කැෆේ රෝයල් අවන්හල ඉදිරිපිටදී එල්ලකළ ප්‍රහාරය නේවැ? මේ මැකෝලි සාමිත් ඒ ඇඩල්බට් ග්‍රුනර්ට සමාන චරිතයක්. විවාහකරගන්නා බවට පොරොන්දුවෙලා, ඔහු ආශ්‍රය කළ තරුණ වංශවත් කාන්තාවන් ගණන, මං හිතන්නේ අතක ඇඟිලි ගණනට වැඩියි"

දුම්රිය භෝජනාගාර සේවය මගින් අප වෙත ගෙන එනු ලැබූ තේ පානය කිරීමෙන් පසු, සුරුට්ටුවක් ද දල්වාගෙන, බ්‍රැඩ්ස්ට්‍රීට් කථාන්තරය කීම ඇරඹුවේය.

"මේ සිද්ධිය හරිහැටි පැහැදිලිව තේරුම් ගන්න නම් සර් ඩෙනිස් කැමරන්ගේ නිවසේ - එනම් "රීස්ටලින්" මන්දිරයේ නිවැසියන් ගැන මං මුලින්ම කියන්න ඕන.

සර් ඩෙනිස් හා කැතී ඇරෙන්න මේ ගෙදර ඔවුන්ගේ ඥතිවරියක වන අමෙලියා ටයිලර් මහත්මියත් පදිංචිව සිටිනවා. අවුරුදු හැටපහක් පමණ වයස්ගත ඇය, සර් ඩෙනිස්ගේ වැඩිමහල් සොහොයුරියක්. ඇගේ සැමියා ඉන්දියාවේ ඩාජ්ලිංහි තේ වගාවේ නියැළී සිටි කෙනෙක්. කලකට පෙර ඔහු මියගිහින් තිබෙනවා. ඔහුගේ මරණයෙන් පසු ඇය එංගලන්තයට සංක්‍රමණය වුණා. ඇගේ දරුවන් ඕස්ට්‍රේලියාවේ පදිංචියට ගියාලු. මේ ගෙදර වැඩ කටයුතු පරිපාලනය කෙරෙන්නේ ඇය අතින්. මීට අමතරව ඉන්නේ ප්‍රධාන ගෘහසේවකයා ඔලිවර් වෙස්ට් සහ තරුණ සේවිකාව මියුරියල් විතරයි. අනෙක් සේවකයන් හැමදෙනෙකුම ජීවත්වෙන්නේ මන්දිරයට පිටතින්, වෙන් වෙන්ව පිහිටි පැරණි නිවාසවල. ඔවුන් මේ සිද්ධියට මොනම ආකාරයකින් හෝ සම්බන්ධ නැති නිසා, මං ඔවුන් ගැන ඔබට කියන්න යන්නේ නැහැ.

සිද්ධිය වුණේ ජනවාරි 23 වැනිදා. එදා තමයි ගෝල්ඩන් ඊගල් ක්‍රීඩා සමාජයේ වාර්ෂික වර්ණ ප්‍රදනෝත්සවය පැවැත්වෙන දවස.



http://sherlockholmesinvestigations.blogspot.com



එය අවසානයේ බාල් නැටුමක් සහ රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වෙන්න නියමිතව තිබුණා. රාත්‍රී 7.30ට සර් ඩෙනිස් කැමරන්, ටයිලර් මහත්මිය සහ කැතී මෙනෙවිය මේ උත්සවයට සහභාගිවීම සඳහා ක්‍රීඩා සමාජයට පැමිණියා. වර්ණ ප්‍රදනෝත්සවය රෑ 10ට අවසන්වුණාලු. ඉන්පසුව පැවැත්වෙන උත්සවයට කවුරුත් සමාජ ශාලාව වෙත ගිහින් තියෙනවා"

"මොහොතක් ඉන්න" හෝම්ස් කථාවට බාධාකළේය. "ගෝල්ඩන් ඊගල් ක්‍රීඩා සමාජයත්, රාත්‍රී සමාජ ශාලාවත් දෙකම තියෙන්නේ එකම ගොඩනැගිල්ලේද? මට ඒක පැහැදිලි නෑ"

"නැහැ නැහැ" බ්‍රැඩ්ස්ට්‍රීට් කීය. "ක්‍රීඩා පිට්ටනිය තියෙනවානෙ. ඒ ළඟම ක්‍රීඩා මණ්ඩපය තියෙනවා. ඒකෙ උඩ තට්ටුවේ තමා වර්ණ ප්‍රදනය පැවැත්වුණු රැස්වීම් ශාලාව තියෙන්නේ. නමුත් බාල්නැටුම ඇතුළු උත්සව තිබුණේ වෙනත් තැනක. ඒ පිහිනුම් තටාකය අසල ගෝල්ඩන් ඊගල් රාත්‍රී සමාජ ශාලාවේ"

"කොයි තරම් දුරකින්ද?"

"ගොඩනැගිලි දෙක අතර දුර යාර සියයක් හෝ ඊට ටිකක් වැඩි ඇති. මේ සමාජශාලාව තියෙන්නේ මහපාරට යාබදව. අශ්වකරත්ත නැවැත්වීමට විශාල රියගාලකුත් ඒ ළඟම තියෙනවා"

"හොඳයි ඔබේ කථාව කියන්න" හෝම්ස් ඉල්ලා සිටියේය.

"බාල්නැටුම පටන්ගැනුණේ රාත්‍රී දහයයි කාලට. සර් ඩෙනිස් ඒ වෙලාවේ සිටම අධික වශයෙන් මත්පැන් පානය කර තිබෙනවා. ඔහු සමග එකම මේසයේ සිටියේ අමෙලියා ටයිලර් මහත්මිය, කැතී කැමරන් මෙනෙවිය, රොනල්ඩ් හෙයා නම් හිතවතුන් යුවළ පමණයි.

මැකෝලි සාමි උත්සවයට පැමිණ තියෙන්නේ රෑ එකොළහට පමණ. නමුත් සර් ඩෙනිස් සහ කැතී මෙනෙවිය ඉඳපු මේසය ළඟට එන්න ඔහුගේ හිතේ ධෛර්යයක් තිබුණේ නැහැ. ඔහු ඒ වෙනුවට කැතීගෙ මිතුරියක එවා තිබෙනවා. තමන් පැමිණි කාරණය මිතුරිය රහසින් කිව්වාම, කැතී ඇගේ අසුනෙන් නැගිට්ටාලු. මැකෝලි සාමි පැමිණ ඇති බවත්, ඔහු සමග බාල් නැටුමට තමා යායුතු බවත්, කැතී ඇගේ පියාට කියා තිබෙනවා. මේ වෙලාවේ සෑහෙන තරම් වෙරිමතින් සිටි ඔහු, අමුත්තන් ඉදිරියේදීම ඇයට බැණවැදී තිබෙනවා. අන්තිමට ඔහු කිව්වාලු:



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

"කොහෙ ගියත් පාන්දර තුනට කලින් ගෙදර වරෙන්! මේක මගේ නියෝගයක් බව මතක තියාගනිං!" සර් ඩෙනිස් මේක උස්හඬින් කියා තියෙන්නෙ ළඟ තිබුණු මේසවල හිටි අයට ඇහෙන පරිදි. හෝම්ස් මහත්මයා..... සමහරවිට ඔබට හිතේවි මං මේ කියන දේවල් මිනීමැරුමට අදාල නැහැ කියලා"

"මං කොහොමටවත් එහෙම හිතන්නේ නෑ බයිඩස්ට්‍රිට්" හෝම්ස් කීවේය. "ඔය කරුණු හැමඑකක්ම මට අවශ්‍යයි. ඒවා පැහැදිලිව පිළිවෙළට කීම ගැන මං ඔබට ස්තූතිවන්ත වෙනවා"

"හොඳයි. මං ඉතිරි හරියත් කියන්නම්. ඉතින් කැති මෙනෙවිය, ටයිලර් මහත්මිය ගෙනුත් සමුගෙන රෑ 11.10ට පමණ එතැනින් පිටවී ගියා. ඒ 2 වැනිදා පාන්දර තුනට පෙර ගෙදර එන්න පොරොන්දු වෙලා.

මේ මේසයටම වාඩිවෙලා හිටි හෙයා යුවළ ගැන මං ඔබට සඳහන් කළා. ඒ, හමුදා නිලධරයෙකුව ඉඳලා විශ්‍රාමලත් බ්‍රිගේඩියර් රොනල්ඩ් හෙයා සහ ඔහුගේ බිරිඳ. සර් ඩෙනිස් මේ අය සමග කිව්වලු කැති, මැකෝලි සාමි සමග විවාහවුණොත්, තමන්ගේ දේපොළ එක පැන්සයක් ඇයට හිමිවෙන්න ඉඩ නොතබන බව. සෙබඩු සුදුඅන්තුවෙකුට විනාශකරන්න තමන්ගේ දේපොළ දෙනවට වඩා, බොහොම සන්තෝසයෙන් එය, බෝවර් යුද්ධයෙන් අසරණ වුණු ළමයින් සඳහා වෙන්වුණු ළමා නිවාසයකට ලියන බව. ඔහු නිතරම මෙවැනි දේ කියන බව ටයිලර් මහත්මිය මා සමග කිව්වා.

කොහොම හරි ඔවුන් - ඒ කියන්නේ, සර් ඩෙනිස්, ටයිලර් මහත්මිය, රොනල්ඩ් හෙයා යුවළ රෑ කෑම අරගෙන තියෙන්නේ රෑ එකොළහමාරට පමණ. එය අවසන් වෙලා ඔවුන් සමාජශාලාවෙන් ගෙදර එන්න පිටත්වෙලා තියෙන්නේ 24 වැනිදා පාන්දර 1.30ට පමණ....."

පොලිස් නිලධරයා එය පැවසුවේ සාක්කුවෙන් ගත් සටහන් පොත පෙරලා බලමිනි.

"මොහොතක් ඉන්න" කී හෝම්ස් තමාගේ සටහන් පොත ගෙන එය ලියාගත්තේය. "හරි දැන් දිගටම ඔබේ කථාව කියන්න"

"සර් ඩෙනිස් හා ටයිලර් මහත්මිය ආපහු ගෙදර ගිහින් තියෙන්නේ ඔවුන්ගේ පවුලේ අශ්වකරත්තයෙන්. ඔවුන්ගේ නිවස



http://sherlockholmesinvestigations.blogspot.com



වන "ඊස්ට්ලිනයට" ඔවුන් ළඟාවෙද්දී රෑ දෙක පමණ වුණාලු. ඉදිරි දෙර විවෘතකළේ මියුරියෙල් නම් තරුණ සේවිකාව. ටයිලර් මහත්මිය විසින්, මියුරියෙල්ගේ ද උදව් ඇතිව අධික ලෙස බීමත්ව සිටි සර් ඩෙනිස් උඩතට්ටුවට කැඳවාගෙන ගියාලු. උඩුමහලට නැඟුණු වහාම ඔවුනට සුභ රාත්‍රියක් පැතූ සර් ඩෙනිස් තමන්ගේ නිදන කාමරයට ගියාලු.

ටයිලර් මහත්මිය දින කිහිපයක ඉඳල උණ සහ සෙම්ප්‍රතිශ්‍යාව රෝගයෙන් පෙළෙමින් ඉඳල තියෙන්නේ. යළිත් උණගතිය දැනුණු නිසා පහළ තට්ටුවේ තිබුණු "පෝටබරිස්" කොෆ්සිරප් බෝතලය ගෙනැත් දෙන මෙන්, තරප්පුව නගිද්දිම ඇය මියුරියෙල්ට කිව්වාලු. නමුත් මියුරියෙල් බෙහෙත් බෝතලය අරගෙන ආපහු එන්න කලින් සර් ඩෙනිස් යළිත් වරක් තරප්පුවේ උඩ පඩිය අසලට ආවාලු. මෙවර ඔහු ඇඳුම් මාරුකරගෙන. ඔහු ටයිලර් මහත්මියගෙන් අහල තියෙනවා ඇගේ උණ සෙම්ප්‍රතිශ්‍යාව අඩුවෙලාද කියලත්. මේ වෙලාවෙ තමයි මියුරියෙල් "පෝටබරිස්" බෝතලය අරගෙන යළිත් උඩුමහලට ආවෙ. එතකොට වෙලාව 2.10යි.

මැකෝලි සාමි හෙවත් බ්‍රයන්, කැති රැගෙන "ඊස්ට්ලිනයට" ළඟාවෙද්දී, වෙලාව පාන්දර 2.25ලු. ඔහු සමාජශාලාවෙදි මිතුරෙකුට කියා තියෙනවා "නාකියා කිව්වා පාන්දර 3ට කලින් කැති කොහොම හරි ගෙදර ආ යුතු බව. ඒක මටත් හොඳයි. ඒ මොකද හෙට පාන්දර දුම්රියෙන් මං බර්මිංහැම් බලා යන්න ඕනෙ, වැඩ රාජකාරි ගොඩකට"

2.25ට මියුරියල් ගෙදර දොර අරින ශබ්දය ටයිලර් මහත්මියට ඇහිල තියෙනවා. ඊළඟට පහළ තට්ටුවේ විසිත්ත කාමරයේ බ්‍රයන් හා කැති සිනාවෙමින් කතාබහ කරන හඬ ඇහිල තියෙනවා. ඊට මිනිත්තු දහයකට පස්සේ ඒ කියන්නේ 2.35ට පමණ මැකෝලි සාමිගේ අශ්වකරත්තය, ඊස්ට්ලිනයෙන් පිටවී යන ශබ්දය ටයිලර් මහත්මියට පැහැදිලිවම ඇහුණාලු.

ඊළඟට මඳවෙලාවකින් කැති උඩුමහලට නැගලා ටයිලර් මහත්මියගේ කාමරයට ඇවිත් තියෙනවා. ඇවිත් පැය බාගයක් පමණ කතාබහකරමින් ඉඳල තියෙනවා. කැති තමන්ගේ කාමරයෙන් පිටවී යද්දී 3.10 නැත්නම් 3.15 වත් වෙන්න ඇති කියලයි ටයිලර් මහත්මිය කියන්නේ. ඊටත් ටික වෙලාවකට පස්සේ සර් ඩෙනිස් බරාඳය දිගේ ඇවිද එන ශබ්දය ටයිලර් මහත්මියට



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

ඇසුණාලු. ඔහු ඇවිත් යළිත් වරක් ඇගෙන් අහල තියෙනවා ඇගේ අසනීපය ගැන. "ඒ තැනී පිටවී ගියින් මිනිත්තු දහයකට හෝ පහළොවකට පස්සේ. වෙලාව හරියටම කියන්න අමාරුයිලු. නමුත් එතකොට පාන්දර 3.30 නැත්නම් 3.35 වෙන්න ඇති කියලයි ඇය කිව්වේ.

23 වැනිද රාත්‍රිය හා 24 වැනිදට එළිවෙන්න පාන්දර යාමයේ සිදුවීම් ගැන අමෙලියා ටයිලර් මහත්මියගෙන් අපට දැනගන්න ලැබුණේ ඔය තොරතුරු ටිකයි."

මීළඟට අපි සර් ඩෙනිස්ගෙන් ප්‍රශ්න කළා. ඇය කී කිසිවක් වැරදියි කියල ඔහු කිව්වේ නෑ. තමන් පමණට වඩා මත්පැන් පානය කළ නිසා තමන්ට නොයෙක් දේවල් අමතක බවයි ඔහු කිව්වේ. මැකෝලි සාමිගේ කරත්තය තමන්ගේ නිවසට ළඟාවෙන ශබ්දය සර් ඩෙනිස්ට ඇහිලා තිබුණා. ඒක ඔහුට මතකයි. නමුත් ටයිලර් මහත්මියගේ අසනීපය ගැන ඇගෙන් දෙවරක්ම ඇසූ බව ඔහුට මතක නෑ. ඔහු කියන්නේ තමන්ට උදේ වනතුරු හොඳින් නින්ද ගියබවයි. උදේ හතට පමණ නින්දෙන් ඇහැරිලා ඔහු ටිකක් ඇවිදින්න ගිහින් තියෙනවා. ඊළඟට ආපහු ඇවිත් ඇඳුම් මාරු කරලා යළිත් නිදාගත්තලු. මැකෝලි සාමිගේ මරණය ගැන ආරංචිය ගෙදරට ආවෙ උදේ 9 ට පමණ."

කරුණු සටහන් කරගනිමින් සිටි හෝම්ස් අත ඔසවා, බ්‍රැඩ්ස්ට්‍රීට්ගේ කථාව මදකට නැවැත්විය. "මොහොතක් ඉන්න. මං මේ වෙලාවල් යළිත් කියවා බලන්නම්. මේක සිහියට ගන්න මට මිනිත්තු දෙකක් තුනක් ගතවෙනවා" හෝම්ස් කීය.

පොලිස් නිලධරයාට ද මඳ විවේකයක් ලැබිණ. අපේ ගමනේ සෑහෙන දුරක් ගෙවී අවසන් වී තිබුණත්, කථාන්තරයට සවන්දෙමින් සිටි මට මහන්සියක් නොදැනිණ. මිනිත්තු කිහිපයකින් පසු හෝම්ස්ගේ සංඥාවත් සමග බ්‍රැඩ්ස්ට්‍රීට් යළිත් කථාව ඇරඹුවේය.

"මැකෝලි සාමි පදිංචි නිවස තියෙන්නේ ටොරිංටන්වල. ඒකට යෑමට ස්ප්‍රිංෆීල්ඩ් සිට ග්‍රිම්ස්බි දක්වා යන පාරේ හමුවන මංසන්ධියෙන් දකුණට හැරී යායුතුයි. මේ මංසන්ධිය තියෙන්නේ පික්ටන්වල. පික්ටන් හන්දියට කිට්ටුව ස්කන්තෝප් පාරේ නිව්ඩෙල් නම් සත්ත්ව ගොවිපොළක් තියෙනවා. මේකෙ



http://sherlockholmesinvestigations.blogspot.com



කිරිපට්ටියේ වැඩට සේවකයන් එන්නේ පාන්දර තුනට. 24 වැනිද පාන්දර 3ට ගොවිපොළේ සේවය සඳහා ආ තරුණයන් දෙදෙනෙකුට තමයි මුලින්ම මේ අනතුර දකින්න ලැබිල තියෙන්නෙ. ප්‍රධාන පාරෙන් ඉවතට ගිය අශ්වකරත්තයක් කාණුව අසල පහන්ටිමට වැටී තියෙන හැටි දැකලා, ඔවුන් එතැනට ගියාලු. ඔවුන් මුලින් හිතලා තියෙන්නේ බීමතින් රිය පැදවූ කුලීරථ රියැදුරෙක් වෙන්න ඇති කියලයි. ළං වී බැලූ ඔවුනට දකින්න ලැබුණා; අශ්වයා වේදනාවෙන් කෙඳිරිගාමින් සිටි අයුරු හා කරත්තයේ ඉදිරිපස ආවරණය කඩන කප්පිර ඇත්කර තිබූ හැටි. ඇතුළට මුහුණ යොමා බැලූ ඔවුන් දුටුවා, කරත්තය පැදවූ තැනැත්තා ඇතුළේ මුනින් අතට වැටී සිටි අයුරු.

වැටී සිටි පුද්ගලයා එළියට ගන්න, මේ තරුණයින් උත්සාහ කළාලු. එතකොටයි ඔවුන් දුටුවේ ඔහු මියගොස් ඇති බව. එපමණක් නොවෙයි, ඔහුගේ ඇඟ ලේවලින් නැහැවී ඇති බව. ඔවුන් තමන් වැඩකරන ගොවිපොළ වෙත ගිහින්, ස්ප්‍රිංෆීල්ඩ් පොලීසිය වෙත පණිවුඩකරුවෙකු යවල තියෙනවා. පොලීසියට හැකිවුණා උදේ හත වෙද්දී මෙතැනට එන්න.

මළසිරුර පරීක්ෂා කළ ස්ප්‍රිංෆීල්ඩ් පොලීසියේ උපපරීක්ෂක කෝසන්ට පෙනීගියා, මේක හදිසි අනතුරක් නොව, මිනීමැරුමක් බව. ඒ නිසයි වහාම ස්කොට්ලන්ඩ්යාඩ් වෙත දැන්නුවේ. දැනට තත්ත්වය ඒකයි"

"බොහොම ස්තුතියි බ්‍රැඩ්ස්ට්‍රීට්" හෝම්ස් කීය. "මං හිතන්නේ අපට දැනගන්න උවමනා මූලික සිදුවීම් පෙළ, ඔබ ඉතා හොඳින් විස්තර කළා. දැන් ඉතින් මේ ප්‍රශ්නය ගැන අපි මොහොතකට අමතක කරමු. ඔබ දන්නවාද අපි දැන් මේ පසුකරමින් යන්නේ උතුරු යෝක් විල්ලුව බව? මේක ඉතාම විශාල භූමි ප්‍රදේශයක්. එක් අතකට නෝත් ඇලර්ටන් සිට ස්කාබරෝ දක්වාත් අනික් අතට පිකරිං සිට ගයිස්බරෝ දක්වාත් මේක විහිදී තියෙනවා. ටීස් ගංගාවේ අන්තිමට කොටස ගලාබහින්නේ විල්ලුව හරහා"

ඉන්පසු හෝම්ස් කථාකළේ මේ අඩවිය ශතවර්ෂ ගණනාවක් තිස්සේ දුර්ලභ ශාක වර්ග හා සත්ත්ව වර්ග රැකගත් ආකාරය ගැනය. එංගලන්තයටම ආවේණික, එහෙත් දැන් විනාශ මුඛයට පා තබා ඇති උභයජීවීන් හා පක්ෂීන් ගැන තොරතුරු රැසක් හෝම්ස් අපට පැවසුවේය. ඒ පිළිබඳ ඔහු සතු දැනුම ගැන අපි මවිතයට



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

පත්විමු. මෙය අභයභූමියක් හා රක්ෂිත වනාන්තරයක් කළ යුතු බව ඔහු අවසන් වශයෙන් කීය.

මරණයට පත්ව ඇති මැකෝලි සාමි හෙවත් බ්‍රයන් ගැන සහ, සර් ඩෙනිස් කැමරන් ගැන, තමාට අසන්නට ලැබුණු ඕපාදූප ප්‍රයෝජනයට ගනිමින් කිසියම් විග්‍රහයක යෙදීමට බ්‍රැඩ්ස්ට්‍රීට් උත්සාහ කළේය. එහෙත් ප්‍රමාණවත් සාක්ෂි නොමැතිව නිගමනයන්ට එළැඹීම භයානක කටයුත්තක් බව මගේ මිත්‍රයා කීය.

වැඩි පමාවකින් තොරව අපි පිට්ස්ෆීල්ඩ් දුම්රියපොළට ළඟාවූයෙමු. ස්ප්‍රිංෆීල්ඩ් වෙත යෑම සඳහා මෙතැනින් අශ්වකරත්තයක යාමට සිදුවී තිබිණ. යෝක් ප්‍රදේශයේ අපරාධ අංශය භාර පොලිස් පරීක්ෂක ඩන්කන් බෝල්ටන්, අප හමුවීමට දුම්රියපොළට පැමිණ සිටියේය. අඩි හයකට වඩා උස, එමෙන්ම තරබාරු සිරුරක් තිබූ බෝල්ටන්ගේ සුන් උඩුරැවුලක් විය. ඒ නිසා ඔහුට තිබුණේ මංකොල්ලකාරයෙකුගේ පෙනුම මිස පොලිස් නිලධරයෙකුගේ පෙනුම් නොවේ.

දුම්රියපොළේ නවත්වා තිබූ ලොකු අශ්වකරත්තයක නැගී, අපි එලිෆන්ට් ඇන්ඩ් කාසල් තානායම වෙත ගියෙමු. අපගේ නවාතැන්පොළ ලෙස කල්තබා වෙන්කරවා ගෙන තිබුණේ එතැනය.

දහවල් ආහාරයෙන් පසු හෝම්ස්ගේ ඉල්ලීම අනුව මුලින්ම අප කැඳවාගෙන යනු ලැබුවේ අශ්වකරත්ත අනතුර සිදුවූ ස්ථානයට ය. ස්ප්‍රිංෆීල්ඩ් සිට පික්ටන් වෙත එන පාර ගල්දමා සකස් කළ තරමක පුළුල් එකක් විය. විශාල බීච් හා එල්ම් ගස්වලින් මඟදෙපස සෙවණ වී තිබිණ. කලින් සඳහන් කර තිබූ සතරමං සන්ධිය වෙත අපි ළඟාවූයෙමු. එය ද පසුකොට ඉදිරියට යද්දී පාරේ දෙපසින්ම පිහිටි ඉඩම්වල අර්තාපල් හා නොයෙකුත් බෝග වර්ග වගාකර තිබූ අයුරු දක්නට ලැබිණ. කුලිරිය තරමක් පාළු අඩවියකට පැමිණි පසු, පාරේ අයිනට කර නවත්වන ලදී.

"හෝම්ස් මහත්මයා, මෙන්න මෙතැනයි තැන" බෝල්ටන් පැවසුවේ අශ්වකරත්තයෙන් බිමට බැසීමට සූදානම් වෙමිනි.

ප්‍රධාන පාරට මඳක් පහතින් පිහිටි බිමක, මැකෝලි සාමිගේ අශ්වකරත්තය, පාරෙන් ඉවතට ගමන්කළ සැටියෙන්ම නවත්වා තිබිණි. එය මුරකිරීම සඳහා යෙදවූ පොලිස්භටයෙක් ඒ අසල සිටියේය. තම ප්‍රධානීන් දුටු ඔහු සිරුවෙන් සිට ආචාර කළේය.





"ජනවාරි 23 වැනිද හවස්වරුවේ තරමක වැස්සක් තිබුණා. නමුත් ඊ වෙද්දි වැහි නැවතුණා" ළප පොලිස් පරීක්ෂක කෝසන් කීය.

"පා සටහන්, කරත්ත රෝද ලකුණු, පරීක්ෂණයට උදව්කරගන්න හෝම්ස් මහත්තයා දක්වන කැමැත්ත ගැන මං අහල තියෙනවා. ඒ නිසාම මං කරත්තය එහෙමම තියෙන්න ඇරලා මිනිය පමණක් ඉවත් කරගත්තා. කරත්තය ඇතුළත පරීක්ෂාකිරීමේ රාජකාරිය ඔබට ඉතිරිකළා. නමුත් කණගාටුවෙන් කිවයුතු එක දෙයක් තියෙනවා. මං මෙතැනට එනකොටත්, ඇතැම් සෙනගක් පාරෙ ඉඳන් අශ්වකරත්තය වෙත ගිහින්, අනතුර නරඹලා අවසන්. ඒ නිසා පා සටහන්....."

"ඔව් කෝසන්. ඒක ලොකු පාඩුවක්" හෝම්ස් කීය. "හරක් රැළක් ගමන් කරලා වගේ මට නුගත් ප්‍රයෝජනවත් වෙන්න තිබුණු සලකුණු ඔක්කොම මැකී ගිහින්, සැකයක් නෑ. ඒ හැමඑකක්ම වැදගත් හෝඩුවාවන්. ඒ ගැන ඔබට දොස් කියන්න බෑ. මෙහෙම දෙයක් වෙලා ඇති කියල මං සැක කළා"

කරත්තය අවට පොළොව මඳ වේලාවක් පරීක්ෂා කළ හෝම්ස්, සුසුමක් හෙලා උරහිස් හැකිළුවේ, බලාපොරොත්තු කඩවූ බවක් හඟවමිනි. මීළඟට පෙරළී තිබූ අශ්වකරත්තය කෙළින් කර මහපාර අසලට ගන්නා මෙන් ඔහු උපදෙස් දුන්නේය. එහෙත් මඩේ එරී තිබූ එය ආපසු ගැනීමට පොලිස්භටයන් දෙදෙනාට හැකිවූයේ නැත. ඒ නිසා අපි සියලුදෙනාගේම උදව් ඊට අවශ්‍ය විය. පොළොවේ එකතු වී තිබූ මඩ තට්ටු කිහිපයක්, අපේ පාවහන්වල පතුල්වල ඇලිණි. නණබිස්සක අතුල්ලා තම පාවහන් පිරිසිදු කරගත් හෝම්ස් තම උත්තල කාචය අතටගෙන අශ්වකරත්තය තුළට නැගුණේය. ඔහු එය පරීක්ෂාකරන අයුරු අපි එළිමහේ සිට බලාසිටියෙමු. කරත්තය තුළ එක්තැනකට ගලාගිය ලේ, කැටිගැසී දුර්වර්ණ වී දුගඳ හමමින් තිබිණ. නිලමැස්සෝ කිහිපදෙනෙක් ද ඒ වටා සැරිසරමින් සිටියහ. ඒ කිසිත් නොතකූ හෝම්ස් රියදුරු අසුන, පිටුපස අසුන, හා රිය ඇතුළත සෑම තැනක්ම මුහුණ ළංකරගෙන පරීක්ෂා කළේය. පැය භාගයක් පමණ ඒ සඳහා ගතකළ ඔහු, තෘප්තියට පත්වූ බවක් මම දුටුවෙමි. තම සාක්කුවෙන් ගත් පිරිසිදු කඩදාසියක් දිගහැරි හෝම්ස්, පොලිස් නිලධර බෝල්ටන් ඇමතුවේය.

"බෝල්ටන් මහත්තයා, මට හමුවුණා රිවෝල්වර උණ්ඩයක්. ඒක .32 වර්ගයේ රිවෝල්වරයකින් නිකුත්වූ එකක් බව නිගමනය කරන්න පුළුවනි. ඊට අමතරව මට ලැබුණා කාන්තාවන් කොණ්ඩයට ගහන කොණ්ඩකටු දෙකක්. එයින් එකක් තිබුණේ අපුනක් උඩ වුවත් ලේ ස්වල්පයක් තැවරී තියෙනවා." කී හෝම්ස් ඒවා කඩදසිය මත තබා, එය නමා බෝල්ටන් අතට දුන්නේය.

"හෝම්ස් මහත්තයා, මේ ලේ තැවරුණු කොණ්ඩ කටුව නිසා, ඔබ කියන්නේ මේක කාන්තාවකගේ වැඩක් කියලද?" බෝල්ටන් ඇසුවේය.

"බෝල්ටන් ඇයි ඔබ එහෙම අහන්නේ?" හෝම්ස් ඇසීය. "එහෙම සැකකරන්න පුළුවන් කාන්තාවන් කවුරු හරි ගැන ඔබට හිතන්න පිළිවන්ද? මැකෝලි සාමි එක්ක වෛරයෙන් පසු වූ කෙනෙක් ගැන?"

"එවැනි තරුණියන් ගණන මං හිතන්නේ එකකට වැඩියි කියලයි" පොලිස් නිලධරයා පිළිතුරු දුන්නේය. "කෙළින්ම සැකකළ හැකි කාන්තාවක් ගැන නම් මට තවමත් දැනගන්න ලැබිල නෑ"

"මේ කොණ්ඩකටු සමහරවිට කැති කුමරුන් මෙනෙවියගේ ඒවා වෙන්නත් පුළුවනි" හෝම්ස් කීය. "ඒවායේ ලේ තැවරෙන්න ඇත්තේ, බාගවෙලාවට මිනීමැරුමට පස්සේ වෙන්නත් පුළුවනි"

මගේ මිත්‍රයා මීළඟට අශ්වකරත්තයට නගින පාපුවරුව, කරත්තයේ පිටුපස රෝද දුනු සමඟ සම්බන්ධවන අලවංගුව හා ඒ ඒ මත සවිකළ වානේ පුවරුව ද පරීක්ෂා කළේය.

"දැන් මං කැමතියි දැනගන්න පශ්චාත් මරණ පරීක්ෂණයේ තොරතුරු" හෝම්ස් කීවේ කාචය තම සාක්කුවට දමාගෙන අප ආ කුලීරිය දෙසට ගමන්කරමිනි.

"මැකෝලි සාමිගේ මරණය ගැන පරීක්ෂණය ඊයේ හවස පැවැත්තුවා" බෝල්ටන් කීය. "පොලිස් ශල්‍ය වෛද්‍යවරයා කියන්නේ මෙය රිවෝල්වරයකින් ළඟ සිට කළ වෙඩි තැබීමක් කියලා. වෙඩි තබලා තියෙන්නේ සාමිවරයාගේ පිටුපස සිට. රිවෝල්වරය හා හිස අතර දුර අඟල් 9 සිට 18 දක්වා ප්‍රමාණයේ වියහැකියි කියලා අවෛද්‍ය කොනර් පැවසුවා. වෙඩිපහර එල්ලවෙලා තියෙන්නේ වම්කනට මදක් පහළින්..... ඒ කියන්නේ


http://sherlockholmesinvestigations.blogspot.com



කනට අඟලක් පමණ පහළින් බෙල්ලට. තුවාලය වටේටම වෙඩිබෙහෙත් දැවුණු සලකුණු තිබුණා. ඒකෙනුයි අපි ස්ථිරව හිතාගත්තේ වෙඩිපහර එල්ලකරලා තියෙන්නේ බොහොම ළඟ ඉඳලා කියල.

පශ්චාත් මරණ පරීක්ෂණයේදී කෑලි දෙකකට වෙන්වුණු උණ්ඩය හමුවුණා. එය මැකෝලිගේ හිස්කබලේ පහළ කොටස සිදුරුකරගෙන ගොස්, මොළයට ඇතුළුවෙලා තිබුණා. මරණය ඉතා ක්ෂණික සිදුවී ඇතිබවයි වෛද්‍ය නිගමය. එපමණයි. හෝම්ස් මහත්මයා, තවත් වෙඩි උණ්ඩයක් අශ්වකරත්තය තුළ තිබුණේ කොහොමද?"

"මට හිතෙන්නේ මෙහෙමයි" හෝම්ස් කීය. "මිනීමරුවා කවුරු වුණත් ඔහු තැබූ පළමුවැනි වෙඩිල්ල වැරදුණා. බාගවෙලාවට ඒ හරිහැටි ඉලක්කය ගැනීමට නොහැකිවුණු නිසා. එහෙමත් නැත්නම් අශ්වකරත්තය වේගයෙන් ගමන්කරද්දී අපරාධකාරයාගේ අත ගැස්සුණු නිසා. එහෙමත් නැත්නම් අපරාධකාරයා ගැන දැනගත් වහාම මැකෝලි සාමි ක්ෂණිකව හිස අහකට ගත්තා වෙන්නත් පුළුවනි"

මීළඟට අපි ස්ප්‍රිංෆීල්ඩ් පොලිස් ස්ථානය බලාපිටත්වී ගියෙමු.

"අපරාධය කළ ආයුධය හොයාගන්න ඔබ උත්සාහ දරන්න ඇති" හෝම්ස් ඇසීය.

"ඔව් මහත්මයා" උප පොලිස් පරීක්ෂකයා පිළිතුරු දුන්නේය. "අශ්වකරත්තය පෙරළී තිබුණු තැන සිට යාර දෙසියයක පමණ අධිවිෂ්කම්භයක ප්‍රදේශය අපි තියුණු පරීක්ෂාවකට ලක්කළා. සැකකටයුතු කිසිම දෙයක් හමුවුණේ නෑ"

"පොළොවේ තිබූ සලකුණු මැකියන්න ඒකත් හේතුවක් වෙන්න ඇති" හෝම්ස් කීය. "..... ඒකට කමක් නෑ. මේ අපරාධයට වගකිව යුත්තේ කවුරුන් කියලද ඔබ අනුමාන කරන්නේ? මැකෝලි සාමිට හිටි සතුරන් ගැන ඔබ හොයා බැලුවද?"

"දෙපාර්ශ්වයක් ඇරෙන්න, මැකෝලි සාමිට සතුරන් කියා කොටසක් හිටි බවට කිසිම ආරංචියක් නෑ. ඔහුට හිටි මිතුරන් නම් අප්‍රමාණයි. කාගෙන් වුණත් අහන්න ලැබුණේ - බ්‍රයන්ට හිටියේ මිතුරන් .....ඔහුට කොහෙන්ද සතුරන්? කියන කතාවයි"

"මොකක්ද ඔබ දෙපාර්ශ්වයක් ගැන කිව්වේ?" මම ඇසීමි.


http://sherlockholmesinvestigations.blogspot.com

"එක් පාර්ශවයක් තමා ඔහුගේ පෙම්වතිය කැතීගේ පියා - සර් ඩෙනිස් කැමරන්" බෝල්ටන් කීය. "මෑත කාලයක ඉඳල ඔහු මැකෝලි සාමි සමග තදබල වෛරයකින් ඉන්නා බව ප්‍රසිද්ධ කරුණක්. ඒ නිසා අපේ ප්‍රධාන සැකකරුවා ඔහු"

"එතකොට අනෙක් පාර්ශවය?"

"ඒ තමා මැකෝලි සාමි විවාහ කරගන්නා බවට පොරොන්දු වී පසුව අත්හැර දැමූ තරුණියන් කිහිපදෙනා"

"කවුද ඔවුන්?" හෝම්ස් ඇසීය. "ඔබ දන්නවාද ඔවුන් ගැන තොරතුරු? නම හා පදිංචි තැන්?"

"අපි ඒ ගැන පරීක්ෂණ පවත්වාගෙන යනවා." කෝසන් කීය. "තරුණු එක්රැස් කිරීම අපි දැන් පටන් අරගෙන. ඒක සම්පූර්ණ කරගන්න තවත් දවස් කිහිපයක් යාවි. කොහොම නමුත් මේ එක්කෙනාක්වත් මැකෝලිට මරණ තර්ජන කළ බවට පැමිණිලි නැහැ. ඒ වගේම ඒ බවට ආරංචියක් වත් නැහැ"

"ඔබට හොඳටම විශ්වාසද?"

"ඔව්" බෝල්ටන් කීය. "අඩු ගණනේ ප්‍රසිද්ධියේ බැණවැදුණු බවට හෝ නීතිමාර්ගයෙන් කටයුතු කරන බවට තර්ජනය කළ බවක් වත් දැනගන්නට නැහැ"

"එහෙම නොකළා කියල අපට කාන්තා පක්ෂය සම්පූර්ණයෙන්ම අමතක කරදමන්න අමාරුයි" හෝම්ස් පවසද්දී ඔහුගේ දෙතොලට සිනාවක් නැගිණ. "බ්‍රැඩ්ස්ට්‍රීට් මා සමග කිව්වා 23 වැනිදා රාත්‍රියේ ඉඳල 24 වැනිදා උදේ පාන්දර වනතුරු සර් ඩෙනිස් හා ඔහුගේ පවුලේ අය කාලය ගතකළ හැටි. මං කැමතියි ඒවා නිවැරදිද කියලා, ඔබේ සර්ජන් සමග සසඳලා බලන්න"

ඉන්පසු පැය කාලක් පමණ ගතවූයේ හෝම්ස් සටහන් කරගෙන තිබූ ඒ කාල වේලාවන් නිවැරදිදැයි පරීක්ෂාකර බැලීම සඳහාය.

"හෝම්ස් මහත්මයා" බ්‍රැඩ්ස්ට්‍රීට් මගේ මිත්‍රයා ඇමතුවේ අප පොලිස්ස්ථානයෙන් එළියට බැසීමට සූදානම්වෙද්දීය.

"ඔබ කැමති ආපසු නානායමට ගිහින් ටිකක් විවේක ගන්නද? එහෙම නැත්නම් අපට පුළුවනි දැන් ගිහින් සර් ඩෙනිස් හමුවෙන්න"

"ඔව්. අපි සර් ඩෙනිස් හමුවෙන්න යමු" හෝම්ස් කීය. "මං හිතන්නේ මේ මරණය ගැන අපට ඉන්න එකම සැකකාරයා ඔහු. මේ දක්වා පොලීසිය ඔහුගෙන් ප්‍රශ්න කිරීමක් කළේ නැද්ද?"



http://sherlockholmesinvestigations.blogspot.com



හෝම්ස් ඇසුවේ ස්ප්‍රිංෆීල්ඩ් පොලිසියේ උපපරීක්ෂක කෝසන්ගෙනි.

"හෝම්ස් මහත්මයා. ඔබ කියනා දේ මට තේරෙනවා" කෝසන් කීය. "නමුත් මේ පිට පළාත්වල පොලීසිවලට කළ හැකි දේ සීමිතයි."

"ලන්ඩන් නගරයේදී නම් මේ වගේ සැකකටයුතු පුද්ගලයෙක් මේ වෙනකොට භාරකාරයටත් අරගෙන ඉවරයි. එහෙම නේද බ්‍රැඩ්ස්ට්‍රීට්?"

"ඔබේ කතාව ඇත්ත හෝම්ස් මහත්මයා" ලන්ඩන් පොලිස් නිලධරයා පිළිතුරු දුන්නේය.

"ඒ වුණත්....." උප පොලිස් පරීක්ෂක කෝසන් කීය. "එක පැත්තකින් සර් ඩෙනිස්ට විරුද්ධව ඍජු සාක්ෂි කිසිවක් නැහැ. අනික් අතට මේ වගේ ප්‍රභූවරයෙකුට විරුද්ධව කටයුතු කිරීමේදී ඉහළින් අප වෙත එල්ලවිය හැකි බලපෑම එමටයි. පියවරක් ගන්න කලින් ඒ ගැනත් හිතාබලන්න ඕන."

"මං ඔබේ අඩුපාඩුවක් කිව්වා නෙමෙයි කෝසන්" හෝම්ස් කීය. "සර් ඩෙනිස්ට විරුද්ධව ඍජු සාක්ෂි නැහැ කියන එක සම්පූර්ණ ඇත්ත. එහෙනම් අපි යමු සර් ඩෙනිස් හමුවෙන්න, ඔහුගේ නිවසට."

සර් ඩෙනිස් කැමරන්ගේ වාසස්ථානය වූ "ඊස්ට්ලින්" නම් මන්දිරය වෙත යාමට අපට පැය භාගයක් පමණ ගතවිය. ප්‍රධාන පාරෙන් ඇතුළත වත්තක් මැද ඊස්ට්ලිනය පිහිටා තිබිණ. එය වෙත පිවිසෙන පාර ගල් දමා නවීන ක්‍රමයට සකස්කළ එකක් විය. පාර දෙපස ඉතා අලංකාරවත අයුරෙන් මල් පඳුරු වවා තිබිණි. කැමරන් පවුලේ පැරණි නිවස සම්පූර්ණයෙන්ම කඩා ඉවත්කොට මේ නව නිවස ඉදිකළ බැව් අපට අසන්නට ලැබිණ. නිවසේ ඉදිරිපස ගොඩනංවා තිබුණේ ග්‍රීක් ගෘහනිර්මාණ ශිල්පය අනුවය. ධනවත් පුද්ගලයෙකු වීම නිසා, කැමරන් එහි සෑම නවීන සැපපහසුකමක්ම එකතුකොට තිබිණි. මෙම මන්දිරය වඩාත් ලංවූයේ, ලන්ඩනයේ රිජන් වීදියේ සුඛෝපභෝගී හෝටලයකට මිස, ගම්බද වංශවතෙකුගේ නිවසකට නොවේ.

ප්‍රධාන මෙහෙකරු ඇමිණ අප පිළිගෙන විසිත්ත කාමරයට කැඳවාගෙන ගියේය. අප එහි අසුන්ගත් පසු සර් ඩෙනිස් කැමරන්



http://sherlockholmesinvestigations.blogspot.com

සහ අමෙලියා ටයිලර් මහත්මිය එහි පැමිණියහ. උසින් අඩි හයක් පමණ වූ සර් ඩෙනිස්ට තිබුණේ, ක්‍රීඩකයෙකු සතු කෙට්ටු එහෙත් ශක්තිමත් සිරුරකි. තරුණ කාලයේ ඔහු දක්ෂ ටෙනිස් ක්‍රීඩකයෙකු මෙන්ම රග්බි ක්‍රීඩකයෙකු ද බැව් මා අසා තිබිණ. ඔහු දිනාගත් කුසලාන රැසක් විසිත්ත කාමරයේ වීදුරු කැබිනෙට්ටුවක් මත තිබෙනු මම දුටුවෙමි. එනැම අභියෝගයක් භාරගත හැකි තියුණු බැල්මක් ඔහු සතුවිය. අමෙලියා ටයිලර් මහත්මියට තිබුණේ වයෝවෘද්ධ කාන්තාවකගේ දුබල සුදුමැලි පෙනුමකි.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඔබ මෙහි පැමිණීම මට ගෞරවයක්" සර් ඩෙනිස් කීවේ අසුන්ගන්නා මෙන් අපට සංඥා කරමිනි. "කව්රුත් කෙළින්ම මට නොකිව්වත්, ඇත්ත තත්වය මොකක්ද කියන එක ඔබට හොඳට තේරෙනවා. බ්‍රයන්ගේ මරණය ගැන සැකය එල්ල වෙලා තියෙන්නේ මට. එක අතකින් ඒකෙ පුදුමයක් නෑ. ඒ මොකද ඔහුට විරුද්ධව එළිපිටම කතාකළ, එකම පුද්ගලයා මා නිසා. නමුත් ඔහුව ද්වේෂ කළ තරුණ කාන්තාවන්, ඔවුන්ගේ දෙමව්පියන්, සහෝදරයන් බොහොම දෙනෙක් ඉන්නවා. ඒ අය කිසිකෙනෙක් බ්‍රයන්ට එරෙහිව එළිපිට කතා කිරීමට කැමති අය නෙමෙයි."

"කෙළින්ම අපේ මාතෘකාවට පිවිසීම ගැන, මම ඔබට ස්තුතිවන්ත වෙනවා සර් ඩෙනිස්" හෝම්ස් කීය. "ඔබෙන් ඇසිය යුතු ප්‍රශ්න කිහිපයක් මට තියෙනවා. ඔබේ දියණිය මැකෝලි සාමි සමග මිත්‍ර සම්බන්ධයක් ඇතිකර ගත්තා. එය නවත්වන්න කියා ඔබ දියණියට අවවාද කරන්න ඇති?"

"අවවාද පමණක් නෙමෙයි මහත්මයා. මං ඇයට තර්ජනය කළා. තරවටු කළා. නමුත් කැතීගේ තිබෙන මෝඩකම නිසා ඇය මං කියූ දේ කිසිවක් කනකට ගත්තේ නැහැ."

"මේ විවාහය සිදුවුණොත් ඔබේ දේපොළ කිසිවක් ඇයට නොදෙන බව කියමින් ඔබ වරක් ඇයට තර්ජනය කළ බව ඇත්තද?" හෝම්ස් ඇසීය.

"එක් වරක් නෙමෙයි හෝම්ස් මහත්මයා. මං ඒ බව ඇයට පනස්වාරයක් කියන්න ඇති"

"ඔබේ විරුද්ධත්වයට මැකෝලි සාමි දක්වූවේ මොන වගේ ආකල්පයක්ද?" හෝම්ස් විමසුවේය.


http://sherlockholmesinvestigations.blogspot.com



"ක්‍රීඩා සමාජයේදී හමුවුණු වෙලාවලදී දෙතුන් වරක් මං ඔහු එක්ක කථාකළා. ඔහු, මාව එක පැණ්සයකට ගණන් ගත්තේ නැහැ හෝම්ස් මහත්මයා." සර් ඩෙනිස් කීය. "ඔහු මාව සැලැකුවේ බොහොම වයසට ගිය, ඒ නිසාම මෝඩ දුර්වල මිනිහෙකු ලෙස. මං කියූ දේවලට ඔහු මහහඬින් හිනාවුණේ උපහාසාත්මක අයුරෙන්; හරියට ඔහු වයස අවුරුදු විස්සක තරුණයෙක් කියා හිතමින්. දෙයියම්පා! මට ඒ වෙලාවෙ ඌ අහුවුණා නම්.....!"

"ඇයි ඔහු මොකක්ද කිව්වේ?"

"කැතීට කියලා පුළුවන් නම් අපේ සම්බන්ධය නවත්වන්න බලනවා නාකියා!" ඔහු එහෙම කිව්වේ සමාජ ශාලාවේ තවත් ප්‍රභුවරු කිහිපදෙනෙකු ඉදිරිපිට. ඔහුට උවමනා වෙලා තිබුණේ මගේ දුව නෙමෙයි; මගේ ධනය. මං ඒක හොඳින් දැන හිටියා"

"මේ මිනීමැරුම සිදුකළේ කවුද කියන එක ගැන ඔබේ අදහස මොකක්ද?" බ්‍රැඩ්ස්ට්‍රීට් විමසීය.

"ඒක හොයාදීම මට අයිති කටයුත්තක් නෙමෙයි මහත්මයා" සර් ඩෙනිස් කීය. "ඒක ඔහේලාගෙ රාජකාරියක්. කවුද දන්නෙ? බොහෙවෙලාවට මේක ඇමරිකන්කාරයෙකුගේ වැඩක් වෙන්නත් පුළුවනි. බ්‍රයන් ඒ රටෙත් දරුවන් සහිත පවුලක් අත්ඇරදමලයි ඇවිත් තියෙන්නෙ"

"ඒ පවුල ගැන ඔබ මොනවද දන්න තොරතුරු?" බ්‍රැඩ්ස්ට්‍රීට් විමසුවේය.

"ඒ හැටි තොරතුරක් මං දන්නෙ නෑ" සර් ඩෙනිස් කීය. "මං ඒව හොයන්න උත්සාහ කළෙත් නෑ. ඒ මොකද මැකෝලි සාමි කියන්නෙ මොන වගේ කෙණෙක්ද කියන එක, මං හොඳින් දැනහිටියා. මං විතරක් නෙමෙයි; මේ සළාතේ හැමකෙනෙක්ම දැනහිටියා, මගේ දුව ඇරෙන්න."

"සර් ඩෙනිස්" හෝම්ස් කීය. "මං කැමතියි දැනගන්න ඔබ සතුව ගිනිඅවි මොනවා හරි තියෙනවා ද කියලා?"

"ඔව්. මා ළඟ රිවෝල්වර දෙකක් තිබුණා." සර් ඩෙනිස් පිළිතුරු දුන්නේ කෙළින්ම මගේ මිත්‍රයා දෙස නොබලා ටයිලර් මහත්මිය දෙස බලමිනි. "දෙකම හව්ංසන් වර්ගයේ රිවෝල්වර. එකක් .32 අනික .45. මේ අපරාධයට දින දහයකට කලින් ඒ ආයුධ දෙකම නැතිවුණා".


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

"නැතිවුණා? ඒ කොහොමද?"

"මං ඒ දෙක තියල තිබුණේ මගේ ගෙදර ඉස්සරහම, බිලියඩ් කාමරයේ මේසයක ලාච්චුවක. එක දවසක් බලද්දී ඒවා තිබුණේ නෑ. කවුරු හරි හොරකම් කරලා. ඒ එක්කම මගේ සිගරට් අපුරණ වටිනා රිදී කොපුවක් සහ රන්පවුම් කිහිපයකුත් සොරකම් කරගෙන"

"මොනවද ඔබ ඒ ගැන කළේ?"

"මං හොයල බැලුවා. මගේ කාමර පිරිසිදු කරන ළමයාගෙන් ඇහුවා. ඔහු දකල තිබුණෙත් නෑ. ගෙදර හැමතැනක්ම පරීක්ෂා කළා. ඒත් ආයුධ හමුවුණේ නෑ. ඉතින් මං පොලීසියට පැමිණිලි කළා. උප පොලිස් පරීක්ෂක කෝසන් තමා මගේ පැමිණිල්ල ලියාගත්තේ"

"ඇයි ඔබ ඒ රිවෝල්වර ආයුධ කාමරයේ නොතබා බිලියඩ් කාමරයේ තැබුවේ?" බ්‍රැඩ්ස්ට්‍රීට් ඇසීය.

"මහත්මයා. මේ අලුත් මෝස්තරයේ ගෙවල්වල ආයුධ කාමරය කියා එකක් නෑ" සර් ඩෙනිස් කීය. "ඒ කටයුත්තට යොදගන්නේ බිලියඩ් කාමරය හෝ කන්තෝරු කාමරය. මගේ ආයුධ මං සාමාන්‍යයෙන් තියාගන්නේ නිදන කාමරයේ, ඇඳ අසල මේසයේ ලාච්චුව තමා ඒකට පාවිච්චි කළේ. නමුත් මෑතකදී මට හිතුණා ඒක පරෙස්සම් මදි කියලා"

"ඒ ඇයි?"

"රිවෝල්වරය සමග එහි උණ්ඩත්, එකම මේසයේ එකම ලාච්චුවේ තිබීම අවදානම් කියල මට හිතුණා. ඒකයි ඒව එතනින් ඉවත් කළේ"

මේ වෙලාවේ මඳ නිහඬතාවයක් ඇතිවිය. සර් ඩෙනිස් මේ පවසන්නේ බොරුවක්ය යන හැඟීම කාගේත් සිත්වල ඇතිවූවා නොඅනුමානය.

"එයින් පස්සේ රිවෝල්වර ගැන කිසිම ආරංචියක් ලැබුණේ නෑ?" බ්‍රැඩ්ස්ට්‍රීට් ඇසීය.

"කිසිම ආරංචියක් නෑ"

"ඔබ ඉඳහිටවත් මේ රිවෝල්වරවලින් වෙඩිතියලා ඉලක්කය ගැනීම පුහුණුවුණාද?" හෝම්ස් ඇසීය.

"ඔව් මහත්මයා. ඒත් ඒ හුඟක් කාලෙකට පෙර"

"කොච්චර කාලෙකට පෙරද? ඒ කොහේදිද?"


http://sherlockholmesinvestigations.blogspot.com



"මට මතක හැටියට මාස හතරකට හෝ පහකට කලින්" සර් ඩෙනිස් කීය. "නැත්නම් ඊටත් කලින්ද කියලත් මට හරියට මතක නෑ..... සමහරවිට මාස හයකටත් වැඩි ඇති"

"කමක් නෑ. ඒ කොහේදිද?"

"මං ඉඳහිට ගියා මගේ පරණ මිතුරෙක් වන කර්නල් බිකර්ටන් හමුවෙන්න. දවල් කෑමකට ඔහුගෙන් ආරාධනා ලැබුණොත්, ඔහුගේ නිවසේදී අපි දෙන්නා තරඟෙට වෙඩිතැබුවා"

"ඒ මොන වගේ තැනකද?"

"ඉලක්ක පුවරුවක් (ටාගට් එකක්) තිබුණා ගහක කඳට සවිකරලා. නමුත් බිකර්ටන් අසනීපවුණාට පස්සේ, ඒ කියන්නේ මෑතකදී මං එහේ ගියේ නෑ"

"ඔබේ මිත්‍රයා ඉන්නේ කොහේද?"

"ඔහු හිටියේ බ්‍රැක්හිල්වල. මාස දෙකකට පමණ පෙර ඔහු මියගියා." සර් ඩෙනිස් පිළිතුරු දුන්නේය.

මම ෂර්ලොක් හෝම්ස්ගේ මුහුණ දෙස බැලීමි. ඔහුගේ මුහුණේ පෙනුණේ බලාපොරොත්තු කඩවී ගිය සළකුණු යයි මට සිතිණි. "බ්‍රැඩ්ස්ට්‍රීට්" හෝම්ස් කීය. "දැනට මං අසා දැනගතයුතු වෙනත් මොකක්වත් නැහැ. ඔබට තියෙනවද සර් ඩෙනිස්ගෙන් ඇසිය යුතු මොනවා හරි ප්‍රශ්න?"

"ඔව් මහත්මයා" කී බ්‍රැඩ්ස්ට්‍රීට් තමාගේ ප්‍රශ්නය සර් ඩෙනිස් වෙත යොමුකළේය. "ඔබේ දියණිය කැතී කැමරන් මෙනෙවිය අපට හමුවුණේ නෑ. කෝ දැන් ඇය?"

"මේ මරණය නිසා ඇතිවුණු සිත්වේදනාව නිසා ඇය නිවසින් පිටවී ගියා" ටයිලර් මහත්මිය කීවාය. "මේ දිනවල ඇගේ මිතුරියකගේ නිවසේ නැවතී ඉන්නවා"

"මේ ඛේදජනක මරණය ගැන ඇය දක්වන ආකල්පය මොකක්ද?"

සර් ඩෙනිස්ගෙන් හෝ ටයිලර් මහත්මිය ගෙන් එම ප්‍රශ්නයට එක්විටම පිළිතුරු නොලැබිණි. මඳවේලාවකට පසු ටයිලර් මහත්මිය කථාකළාය.

"කැතී මේ දවස් දෙකම හිටියේ හඬා වැලපෙමින්. ඇය සනසන්න කියලා අපට කළහැකි දෙයක් තිබුණේ නැහැ. මමයි ඇයට කිව්වේ ගිහින් මිතුරියකගේ ගෙදර නවතින්න කියල. ඔබට


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

ඇය හමුවී ප්‍රශ්න කරන්න උවමනා නම්, මට පුළුවනි ඒතැන ලිපිනය ලබාදෙන්න"

"කරුණාකර ඒ ලිපිනය අපට දෙන්න" හෝම්ස් ඉල්ලා සිටියේය.

ටයිලර් මහත්මිය එය ලබාදුන් පසු අපි ඊස්ට්ලින් මන්දිරයෙන් පිටවීමට සූදානම් වූයෙමු.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා" සර් ඩෙනිස් කිවේ අසුනෙන් නැගී සිටි මගේ මිත්‍රයා වෙත සුරත දිගුකරමිනි. "මං අහල තියෙනවා අභිරහස් හෙළිකරන්න ඔබ ඉතා දක්ෂයෙක් කියල. මේ මිනීමැරුම ගැන චෝදනාව එල්ල වෙලා තියෙන්නේ මට බව අමුතුවෙන් කියන්න උවමනා නැහැ. නමුත් මේ අපරාධය කළ නියම මිනීමරුවා හොයන්න නම් බොහොම අමාරු වේවි. ඒකට ඔබෙයි මගෙයි මොළවලට වඩා බොහොම තීක්ෂණ මොළයක් උවමනාවෙයි කියලයි මට හිතෙන්නෙ. එහෙම නේද?"

"එහෙම වෙන්න පුළුවනි" හෝම්ස් කීය. "ඒත් මං මගේ සම්පූර්ණ උත්සාහය යොදනවා මහත්මයා"

අපි අශ්වකරත්තයෙන් ආපසු නානායම බලා පිටත්ව එද්දී බ්‍රැඩ්ස්ට්‍රීට්, බෝල්ටන් සමග පොලිස් නේවාසිකාගාරය වෙත ගියේය.

දිගින් දිගටම කල්පනා කරමින් සිටි හෝම්ස්ට, මා සමග කතාබහ කිරීමට වත් උවමනාවක් නොතිබිණ. බේකර්වීදියේ අපේ නිවහනේ තිබෙන ආකාරයේ හාන්සිපුටුවක් මෙම නානායම් කාමරයේ ද විය. එහි වාඩිවී දෙපා උඩට ගත් මගේ මිත්‍රයා, පයිප්පය දල්වා ගැනීමටවත් උනන්දු නොවී කල්පනා කළේය. රෑ කෑම ගන්නා අතරේ ඔහු මේ අභිරහස පිළිබඳව යමක් කියනු ඇතැයි මම බලාපොරොත්තු වූයෙමි. එහෙත් ඔහු සාකච්ඡාව ඇරඹුවේ රාත්‍රී කෑම අවසන්කොට, තවත් පැය භාගයක් පමණ ගතකළ පසුවය. මේ වනවිට මට මඳ නිදිමතක් ද දැනී තිබිණ.

"මගේ හිතවත් වොට්සන්" හෝම්ස් කීවේ යළිත් වරක් හාන්සිපුටුවේ දිග ඇදෙමිනි. මෙවර තම පයිප්පය දල්වාගැනීමට ඔහු අමතක නොකළේය.

"මගේ දිගු නිහඬතාවය, ඔබේ සිත කලකිරවන දෙයක් බව මං දන්නවා" හෝම්ස් කීය. "මේ විදියට මට කල්පනා කරන්න ඉඩ දී, ඔබ නිහඬව සිටීම මං හුඟක් අගයකරන දෙයක්.



http://sherlockholmesinvestigations.blogspot.com



මගේ හිතෙන් කාරණා එකින් එක ගෙන, මං ඒවා පෙළ ගැස්සුවා වොට්සන්. එතකොට ගැටලුව තියෙන්නේ කොතැනකද කියල අපට තේරුම් ගැනීම පහසුයි. ඒ හැමදෙයක්ම මං ඔබට පිළිවෙළින් කියන්නම්"

හෝම්ස් තම සටහන් පොත අතටගෙන කරුණු එකින් එක පැහැදිලි කිරීම ඇරඹුවේය.

පාන්දර 2 ට - සර් ඩෙනිස් සහ ටයිලර් මහත්මිය ඊස්ට්ලින් මන්දිරයට එනවා.

2.10 ට - සර් ඩෙනිස් කාමරයට ගිහින් ඇඳුම් මාරුකරලත් ඉවරයි. ඔහු ආපහු තරප්පුව ළඟට ඇවිත් ටයිලර් මහත්මියගෙන් අහනවා ඇගේ අසනීපය ගැන.

2.25 ට - මැකෝලි සාමි, කැරී මෙනෙවිය සමග අශ්වකරත්තෙන් ඒ ගෙදරට එනවා.

2.35 ට - ඒ කියන්නේ මිනිත්තු දහයකට පසු මැකෝලි සාමි කරත්තය අක්කාගෙන පිටවෙලා යනවා.

3.00 ට - මැකෝලිගේ මළ සිරුර හමුවෙනවා. ඊස්ට්ලිනයට හැතැක්ම 2 1/2 ක් පමණ දුරින් තැනක තිබී.

2.35 ඉඳල 3.10 පමණ වෙනතුරු ඩෙනිසුත් ටයිලර් මහත්මියවත් කාමරයෙන් එළියට ආවෙ නෑ. ඔවුන් කාමරය තුළ කතාබහ කරමින් සිටියා.

පාන්දර 3.30 ට - සර් ඩෙනිස් යළිත් වරක් එනවා ටයිලර් මහත්මිය සමග කථාකරන්න. තවමත් ඔහු පිටකබායෙන් සැරසිලා.

ඇඳුම් මාරුකරගෙන හිටි ඔහුට පුළුවන් යළිත් වරක් එළියට යන්න සුදුසු ඇඳුමක් ඉක්මනින් ඇඳගන්න. පැයකුත් මිනිත්තු දහයක කාලයක් ඔහුව දැකපු කවුරුවත් නෑ. ඒත් කොහොමද ඔහු මැකෝලි පිටුපස ගියේ? අපි හිතමු සර් ඩෙනිස්, මැකෝලි පිටුපස ගිහින් ඔහුට වෙඩිතැබුවා කියල. මතක තියාගන්න ඔහු හැතැක්ම 2 1/2ක් දුර ගියේ රාත්‍රියේ. ඊළඟට ඔහු පාන්දර 3ට මැකෝලිව ඝාතනය කරලා 3.30 වෙනකොට පැය භාගයකින් ආපහු ගෙදර ඇවිත්. ඔබට මොනවද වොට්සන් ඒක ගැන හිතෙන්නෙ? මෙකෙ කොතැනක



http://sherlockholmesinvestigations.blogspot.com

හරි, මොකක් හරි පටලැවිල්ලක් තියෙනවා. එහෙම නේද? එක්කො මේක වෙනිං කවුරු හරි කළ ඝාතනයක්. එහෙමත් නැත්නම් කාටකාටත් වෙලාවත් හුගක් වැරදිලා!"

"ඔබ මේ විදියට පෙන්වාදෙනකොට නම් මගේ හිතෙත් සැකයක් ඇතිවෙනවා" මම කීවෙමි. "ඒක සර් ඩෙනිස්ට කරන්න අමාරුදෙයක්"

"ඊළගට මෙහෙම දේකුත් තියෙනවා" හෝම්ස් කීය. "ටයිලර් මහත්මියට තිබුණේ බරපතල අසනීපයක් නෙමෙයි. 2.35ට ඇගේ අසනීප ගතිය ගැන විමසූ ඔහු පාන්දර තුනහමාරට යළිත් වරක් ඇවිත් ඒක විමසන්නේ ඇයි? ඒකත් සැකසහිතයි නේද? ඒක හරියට, ඔහු ඒ වෙලාවට ගෙදර හිටි බව ඇයට මතක් කළා වගෙයි. එහෙම නේද?"

"ඔව්. ඔබේ ඒ අදහසත් නිවැරදියි" මම එකගවුණෙමි.

"වොට්සන්. මං හිතන්නේ අපට තවමත් අහුනොවුණු හෝඩුවාවල් රැසක් තියෙනවා. මෙයින් එක පොටක් හෝ දෙකක් අල්ලාගන්නෙ නැතුව මේ ප්‍රශ්නය විසඳාගන්න බෑ. හෙට දවසම අපට ගතකරන්න වෙනවා ඒ ගැන ක්‍රියා කිරීමට. දැන් ඉතින් නිදගමු"

පසුවද උදේ මා අවදිවන විට කළුව පහව් තිබිණ. මගේ මිත්‍රයා කාමරයේ නොවීය. කල්තබා උදේ ආහාරය ගත් ඔහු ඉක්මනින් තානායමෙන් පිටවී ගිය බව තානායම් පාලකවරයා පැවසුවේය. මම උදෑසන පුවත්පත කියවීම පටන්ගතිමි.

දින කිහිපයක්ම මුල්පිටුවේ පළවූ මැකෝලි සාමි ඝාතනය ගැන පුවත තුන්වැනි පිටුව වෙත ගොස් තිබිණ. එහි අලුතෙන් සඳහන්ව තිබුණේ, මෙම පරීක්ෂණය විශේෂඥ රහස්පරීක්ෂක, ෂර්ලොක් හෝම්ස් මහතාට භාරකෙරුණු බැව් පමණි.

උදේ එකොළහ වෙද්දී හෝම්ස් ආපසු තානායමට පැමිණියේ, පොලිස් පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් ද සමගය.

"මං උදෙන්ම පිටත්වෙලා ගියා වොට්සන්" හෝම්ස් කීවේ තානායමේ සේවකයා ගෙන ආ තේ බන්දේසිය තමා වෙතට ළංකර ගනිමිනි. "ඔබට හොඳටම නින්ද ගිහින් තිබුණා. ඒකට බාධාකරන්න මට හිතුණේ නෑ. මං යන ගමන් බ්‍රැඩ්ස්ට්‍රීට්වත් කැඳවාගෙන ගියා. අපි ගියේ කොහේටද දන්නවද?"

"මට හිතාගන්න අමාරුයි"



http://sherlockholmesinvestigations.blogspot.com



"අපි බ්ලැක්හිල්වල කර්නල් බිකර්ටන්ගේ නිවසට ගියා"

"ඒත් ඔහු මියගිහින් නේද?"

"කර්නල් බිකර්ටන් මාස දෙකකට පෙර මියගිහින්" හෝම්ස් කීය. "ඔහුගේ බිරිඳ මියගිහින් තියෙන්නේ ඇහෙන කාලෙකට පෙර. නමුත් මට උවමනාවුණේ ඔවුන් හමුවීම නෙමෙයි. මට උවමනා වුණේ සර් ඩෙනිස් සහ කර්නල් වෙඩිතැබීම පුහුණු වූ තැන බලන්න"

"ඉතින් වැඩේ හරි ගියාද?" මම ඇසීමි.

"ඔව්" හෝම්ස් කීවේ ජයග්‍රාහී සිනාවක් පා, අතේ තිබූ තේ කෝප්පය බන්දේසිය මත තබමිනි. "මේ මිත්‍රයන් දෙන්නා ඉලක්කයට වෙඩිතැබීම පුහුණු වී තිබුණේ විශාල එල්ම් ගහක කඳක සවිකළ ඉලක්කයකට. කර්නල්ගේ සේවකයා අපව එතැනට කැඳවාගෙන ගියා. විශාල ගස නිසා ඒ හරිය හොඳට සෙවණ වෙලා තිබුණා. ඔවුන් බොහොම විනෝදයෙන් ඒ ක්‍රීඩාවේ යෙදෙන්න ඇති. මගේ අරමුණ වුණේ සර් ඩෙනිස්ගේ රිවෝල්වරයෙන් නිකුත්වුණු උණ්ඩ කිහිපයක් සොයාගැනීම. ඒක සාර්ථක වුණා"

"සැකයක් නෑ. කර්නල් බිකර්ටන් සහ ඉලක්කයට වෙඩි තැබීම පුහුණුවුණු ඔහුගේ අනිත් යහළුවන්ගේ පිස්තෝලවල උණ්ඩත් එතැන තියෙන්න ඇති? එහෙම නේද හෝම්ස්?" මම ඇසීමි.

"මං ඒ ගැන බිකර්ටන්ගේ ප්‍රධාන ගෘහසේවකයාගෙන් විමසුවා" හෝම්ස් කීය. "පහුගිය අවුරුදු දෙකක පමණ කාලයක් කර්නල් බිකර්ටන් ළඟින් ආශ්‍රය කරල තිබුණේ සර් ඩෙනිස් කැමරන් විතරයි. කර්නල් ඉලක්ක පුහුණුව සඳහා සෑමවිටම යොදගත්තේ එක් අලුත් රිවෝල්වරයක්ලු. ඒක .38 ස්මිත් වර්ගයේ රිවෝල්වරයක්"

මීළගට මගේ මිත්‍රයා බ්‍රැඩ්ස්ට්‍රීට් ළඟ තිබූ කුඩා මල්ල ඉල්ලා ගත්තේය. එය විවෘත කළ හෝම්ස් කඩදාසි කවරයක දමා තිබුණු වෙඩි උණ්ඩ රාශියක් මේසය මතට හැළුවේය.

"මේ බලන්න. නියතක ආධාරයෙන් මට එල්ම්ගසේ කඳෙන් ඉවත්කර ගැනීමට හැකිවුණු වෙඩි උණ්ඩ. මෙතැන තියෙනවා උණ්ඩ 88ක්. මෙයින් 40ක් කර්නල් බිකර්ටන්ගේ ස්මිත් රිවෝල්වරයෙන් නිකුත් වූ ඒවා බවට සැක නෑ. තවත් 37ක් .32 ප්‍රමාණයේ ඒවා. ඒ සර් ඩෙනිස්ගේ හවිංසන් රිවෝල්වරයෙන් නිකුත් වූ ඒවා වියයුතුයි. තවත් 11ක් විවිධ ප්‍රමාණවල. නමුත් එතැනින් නවතින්න මං බලාපොරොත්තු වෙන්නෙ නෑ"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ කියන්නෙ මොකක්ද?" මම ඇසීමි. "ඔබ අදහස් කරන දේ මට තේරුම් ගන්න අමාරුයි"

"ඇයි වොට්සන්, මැකෝලි සාමිගේ මොළයට ඇතුළුවුණු සහ අශ්වකරත්තය තුළ තිබී අපට උණ්ඩ දෙකක් හමුවුණා නේ. ඒ දෙකත්, බිකර්ටන්ගේ ඉලක්ක පුවරුවෙන් හොයාගත් උණ්ඩත් එකම ආයුධයකින් නිකුත් වූ ඒවාද කියල අප හොයාගත යුතුයි"

"ඔබ කොහොමද ඒක මේ ස්ප්‍රිංෆීල්ඩ්වලදී කරගන්න බලාපොරොත්තුවෙන්නෙ?" මම ඇසීමි.

"ඇයි බ්‍රැඩ්ස්ට්‍රීට් කියන්නේ අපට උදව්කරන්න සූදනම කියල" මගේ මිත්‍රයා කීවේ පොලිස්නිලධරයා දෙස බලමිනි. "ඔහු 12.30 දුම්රියෙන් ලන්ඩනය බලා පිටත්වෙනවා. අප කලින් සොයාගත් උණ්ඩ 2කත් මෙවුත් මං යවනවා රජයේ විශ්ලේෂකයා වෙත. ඒව පරීක්ෂා කරල අපට වාර්තාවක් දෙන එක ඔහුට අමාරුවෙන එකක් නෑ"

"ඔබ දෙදෙනා ගියේ බ්ලැක්හිල්වල කර්නල් බිකර්ටන්ගේ ගෙදරට පමණද?" මම ඇසීමි.

"ඔව්" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඒ වුණත් අපව හමුවෙන්න පොලීසියට එන්න කියලා කෝසන් තවත් දෙදෙනෙකුට දනුම් දී තිබුණා. ඒ මැකෝලිගේ මළසිරුර හොයාගත් නිව්ඩෙල් ගොවිපොළේ තරුණයන් දෙදෙනාට"

"හැබැට? ඔවුන්ගෙන් අලුත් යමක් දැනගැනීමට හැකිවුණාද?"

"ඒ හැමදෙයක්ම මං ඔබට පසුව කියන්නම්" හෝම්ස් කීය. "හැතැක්ම පහක දුරක් වේගයෙන් ඇවිදලා අපි ඉන්නේ හරිම මහන්සියෙන් වගේම බඩගින්නෙන්. ඒ තැනත් බ්‍රැඩ්ස්ට්‍රීට් ලන්ඩන් යන දුම්රිය අල්ලාගත යුතුයි. ඒ නිසා අපි ඉක්මනට කෑමකාලා ඉඳිමු"

මට එතරම් බඩගින්නක් නොතිබුණත් මම ද ඔවුන් සමග දහවල් ආහාරය ගත්තෙමි. එය අවසන් කළ වහාම බ්‍රැඩ්ස්ට්‍රීට් අපෙන් සමුගත්තේය.

"එලිෆන්ට් ඇන්ඩ් කාසල්" තානායම කුඩා කඳුගැටයක් මත පිහිටි නිසංසල තැනක් විය. ඒ නිසාම දෝ අවට ගම්වල සිටි ප්‍රභූවරු හා ධනවත්තු තම මිතුරන් හමුවී කතාබහ කිරීමටත්, ආහාර වේලක් ගැනීමටත් මෙම තානායම වෙත පැමිණීමට පුරුදුව සිටියහ. මේ නිසා තානායමේ විශාල ආලින්දයේ මෙන්ම මනරම්



http://sherlockholmesinvestigations.blogspot.com



උද්‍යානයේ ද සැහෙන දෙනෙක් ගැවසුණහ. එබැවින් අපේ පෞද්ගලික කතාබහ සඳහා කාමරයට යාමට අප දෙදෙනාට සිදු විය.

"ඔබට මතක ඇති කිරිගොවිපොළේ තරුණයන් දෙදෙනා, රිය අනතුර දැකල තිබුණු වෙලාව?" හෝම්ස් ඇසුවේ හාන්සිපුටුවේ හිඳගනිමිනි.

"ඔව්. ඔවුන් කියල තිබුණේ පාන්දර 3.00ට එය දුටුවා කියල"

"හරි. ඔවුන් කියල තිබුණේ එහෙම තමයි. නමුත් මට හිතෙන්නේ ඇත්ත වෙලාව ඒක නෙමෙයි." හෝම්ස් කීවේ අපේ කාමරයේ දොර වසාදමන මෙන් මට සංඥකරමිනි. "ඔවුන් අවුරුදු දහඅට විස්ස වයසේ තුගත් ගැමි කොල්ලො. මය ඕනෑම වැඩකට යොදවන්න කර්මාන්ත ශාලාවලට, ගොවිපොළවලට බඳවා ගන්නේ..... අන්න ඒ වගේ දෙන්නෙක්. මට දැනගන්න උවමනා වුණේ ඔවුන් ඒ අනතුර දුටු නිවැරදිම වෙලාව. ඒ දෙන්නගෙන් එක්කෙනෙකුටවත් ඔරලෝසු නැහැ. එයාලගෙ ගෙවල්වල තියෙනවාලු පරණ බිත්ති ඔරලෝසු. පාන්දර 3.30ට ඔවුන් ගොවිපොළේ ඉන්න නියමිතයිලු. ඒ නිසා තුනට කාලක් තියෙද්දි අවදිවෙලා කෝපි කෝප්පයක් පමණක් බීලා රැකියාවට එනවාලු. දෙදෙනාගේම ගෙවල් තියෙන්නේ, මේ සිද්ධිය වුණු තැනට හැතැක්මකට වඩා දුර. ඒ නිසා කොයිතරම් වේගයෙන් ඇවිදගෙන ආවත් රිය අනතුර වුණු තැනට එන්න ඔවුන්ට පැය කාලක් විතර ගතවෙනවා. මගේ නිගමනය මේකයි වොට්සන්. ඔවුන් මේ අනතුර දකිද්දී වෙලාව පාන්දර 3 නෙමෙයි. 3.30යි. ඔබ මොනවද ඒ ගැන කියන්නේ?"

"ඔව්. ඔබ සමහරවිට නිවැරදි ඇති. එතකොට අර සර් ඩෙනිස් හා අදාළ පුද්ගලයින් ගැන ඔබ සකස් කළ චර්යා සටහන වෙනස්කරන්න සිද්ධවෙනවා. එහෙම නේද?"

"මේ තරුණයන් දෙන්නාගෙන් මං ඇහුවා ඔවුන් රිය අනතුර දැකලා ගොවිපොළට යද්දි වෙලාව කීයද කියලා"

"ඉතින්?"

"එතැනට ගිහිං වෙලාව බැලීමේ හෝ පැමිණි වෙලාව සටහන් කිරීමේ සිරිතක් ගොවිපොළේ නැහැ" හෝම්ස් කීවේ සිනාසෙමිනි. "මේ තරුණයන් දෙන්නා ගොවිපොළට ඇතුළුවෙන්නේ ගොරවමින් නිදා ඉන්න මුරකාරයා අවදිකරල. ඊළඟට ඔවුන්

http://sherlockholmesinvestigations.blogspot.com



www.sinhalaelibrary.com

කිරිදෙවීම පටන්ගන්න සුදනමෙන් එළදෙනුන්ට වතුර බොන්න දීලා, ආහාර සපයනවා. ඊළඟට කිරි එකතු කිරීම, බඳුන් පිරිසිදු කිරීම ආදී හැමදෙයක්ම ඔවුනට භාරයි. ගොවිපොළේ කළමනාකරු හා තවත් සේවකයෙකු එනතුරු තරුණයන් දෙන්නා දිගටම වැඩකළයුතුයිලු. ඒ මොකද කිරිභාජන එකතුකරගෙන යන අශ්වකරත්තය උදේ පහුට ගොවිපොළට ළඟාවෙනවලු. කළමනාකරු එද වෙනදටත් වඩා පැය කාලක් පමණ පමාවුණාලු. කොහොමවුණත් පොලිසියට ! පණිවුඩය යවලා තියෙන්නේ, කළමනාකරු වැඩට පැමිණියාට පස්සේ, කිරි එකතුකරගෙන යන අශ්වකරත්තයේ රියැදුරා අතේ"

"ඒකෙන් ඔබ ගන්නා නිගමනය මොකක්ද?"

"ප්‍රධානම කරුණ තමයි, මේ අනතුර දුටු තරුණයන් දෙන්නාගෙ සාක්ෂියේ සඳහන් කරන වෙලාව" හෝම්ස් කීය. "ඔවුන් පාන්දර 3.00යි කියන එක පැය බාගයක් ඊට වඩා කලින් වෙන්නත් පුළුවනි; පහුවෙලා වෙන්නත් පුළුවනි. එහෙම නේද?"

"එතකොට සිද්ධීන් වුණු අනුපිළිවෙළ දක්වන ඔබේ කාල සටහන වෙනස්වෙනවා නේද?"

"ඇත්තෙන්ම ඔව් වොට්සන්" කී ඔහුගේ මිතුරා කරුණු කඩදසියක සටහන් කොට එය කියෙව්වේය.

"දැන් අපි ඒක මේ විදියට කියවමු.

පාන්දර 2.00ට - සර් ඩෙනිස් හා ටයිලර් මහත්මිය ඊස්ට්ලිනයට ළඟාවෙනවා.

2.10 ට - සර් ඩෙනිස් ඔහුගේ කාමරයට ගියා.

2.25 ට - මැකෝලි සාමි කැනී කැමරන් සමග ඊස්ට්ලිනයට ළඟාවෙනවා.

2.35 ට - මැකෝලි ගෙදරින් පිටවී ගියා.

2.35 සිට 3.10ට - කැනී සහ ටයිලර් මහත්මිය කතාබහ කරමින් සිටියා.

3.30 - සර් ඩෙනිස් යළිත් එනවා ටයිලර් මහත්මිය එක්ක කතාකරලා ඇගේ අසනීපය ගැන විමසන්න.

3.30ට (පමණ) - මැකෝලිගේ මළසිරුර හමුවෙනවා ඊස්ට්ලිනයට හැතැක්ම 2 1/2ක් දුරින්.

වොට්සන් ඔබ එකඟද මේ අලුත් කාල සටහනට?"







"ඔව්" මම කීවෙමි. "මෙහෙ හැටියටත් 2.10 ඉඳල 3.30 දක්වා කාලයේ අනෙක් අයට සර් ඩෙනිස් දකින්න ලැබිල නැහැ. එහෙම නේද?"

"විශිෂ්ටයි. මට උවමනා වුණේත් අන්න ඒ පැයකුත් මිනිත්තු විස්සේ වැදගත්කම ඔබට පෙන්වන්න.

අපි මෙහෙම හිතමු, උපකල්පනයක් හැටියට. ඔහු යම් ක්‍රමයකින් 2.10ට හෝ 2.15ට ගෙදරින් පිටවී ගියා. කොහොම හරි ක්‍රමයකින් ඔහු මේ ඝාතනය පාන්දර 3ට හෝ ඊට කලින් කළා නම් 3.30 වෙනකොට ආපහු ගෙදර එන්න පුළුවනි. 2.35ට අශ්වකරත්තයෙන් පිටත්වී ගිය මැකෝලි, අනතුර සිදුවූ තැනට ළඟාවෙන්න ඇති මිනිත්තු දහයකින්, ඒ කියන්නේ 2.45ට.

මෙතැනදී මුලින්ම මතුවෙන ප්‍රශ්නය තමයි සර් ඩෙනිස් කොහොමද ගෙදරින් ගියේ? කොහොමද ආපහු ආවෙ? ඊස්ට්ලින් මැඳුරේ ඉඳලා අපරාධය සිදුවුණු තැනට දුර හැතැක්ම 2 1/2 යි. මේ දුර ගිහින් එන්න, ඒ කියන්නේ හැතැක්ම පහක ගමනකට ඔහුට තියෙන කාලය පැයකුත් මිනිත්තු 20යි. වේගයෙන් ඇවිදගෙන ගියා නම් නිරෝගී ශක්තිමත් ක්‍රියාශීලී කෙනෙකුට මේක කරන්න බැරි දෙයක් නෙමෙයි."

"ඔව්. ඒකට මම එකඟයි" මම කීවෙමි. "ඒ වුණත් එද රෑ ඔහු හිටියේ මත්පැනින් හොඳටම වෙරිවෙලා. ඔහු උඩුමහලට නැඟුණේත් ටයිලර් මහත්මියගේ හා සේවිකාවගේ උදව්වෙන්. එහෙම කෙනෙක් කොහොමද මේ වගේ හපන්කමක් කරන්නේ?"

"කවුද දන්නෙ වොට්සන් ඒක රඟපෑමක්ද කියලා?" හෝම්ස් ඇසීය. "ඔහු මත්පැන් පානය කළ එක ඇත්ත. නමුත් මෙහෙම අපරාධයක් කරන්න සැලසුම් කරගෙන හිටියා නම්, ඇත්තවශයෙන්ම ඔහු මත්පැන් බොන්න ඇත්තේ ඉතාම සුළු වශයෙන්. නමුත් අනික් අයට පෙන්නුවා තමන් හුඟක් බීල වෙරිවුණා කියල"

"හොඳයි ඒක එහෙමයි කියමුකෝ" මම කීවෙමි. "ඔහු කොහොමද කාටවත් නොපෙනෙන්න උඩුමහලින් පහළට බැස්සෙ? ආයෙත් ඇවිත් උඩට නැග්ගෙ? හැතැක්ම පහක දුරක් වේගයෙන් ඇවිදලා ආව කෙනෙක් ඉන්න ඕන, හතිදමමින් ඩහදිය වගුරුවමින්. නමුත් සර් ඩෙනිස් එහෙම තත්ත්වයක හිටි බවක් කවුරුවත් දැකලා නෑ?"





www.sinhalaelibrary.com

"ඒත් ඔහු පයින් නොගිහින් වාහනයක ගියා නම්?" හෝම්ස් ඇසීය.

"වාහනයක? අශ්වකරත්තයක් හෝ අශ්වයෙකු ආගිය බවට කිසිම සාක්ෂියක් නෑ. කවුරුවත් ඒ බවක් කිව්වෙ නෑ නේද හෝම්ස්?"

"මගේ හිතවත් වොට්සන්. ඔබට හිතෙන්නේ නැද්ද වෙනත් වාහනයක් ගැන?"

"වෙනත්.....?" මම මඳක් කල්පනා කළෙමි. "..... බයිසිකලයක්?"

"විශිෂ්ටයි වොට්සන්" හෝම්ස් කීය. "ඔය හැතැක්ම පහක දුර ගියේ බයිසිකලයක නම් අර හතිය හෝ ඩහදිය ඒ තරමට දකින්න ලැබෙන්නෙ නෑ. අනික ඔහුට දෙගුණයක් වේගයෙන් ක්‍රියාකරන්න පුළුවනි. ඔහුට පුළුවනි මිනිත්තු 15කින් හෝ 20කින් එතැනට ගිහින්, එම කාලයම ගතකරල ආපහු එන්න. ඝාතන කටයුත්තට ඔහුට පැය භාගයක් ගතවුණා කියල හිතමු. එතකොට ඔහුට මිනිත්තු 20ක්වත් තියෙනවා කාටවත් නොපෙනී උඩුමහලට නැගීමට හා බැසීමට.....ඇඳුම් මාරු කරන්න."

"ඔව් එහෙම නම් ඔබ දෙන අම විසඳුම නිවැරදි ඇති"

"දැනට අපි එහෙම හිතමු" හෝම්ස් කීය. "ඒ වුණත් මං බලාපොරොත්තු වෙනවා හෙට උදේ සර් ඩෙනිස් කැමරන්ගේ ඊස්ට්ලින් මන්දිරයේ ඉඳලා අනතුර සිදුවුණු තැනට බයිසිකලයකින් යන්න. එතකොට අර කරුණ තහවුරු කරගැනීමට මට පහසුයි. අනෙක් කරුණ මේකයි. ප්‍රධාන තරප්පු පෙළ පාවිච්චි නොකර උඩුමහලේ ඉඳල පහළට බහින්න හා යළි නගින්න පහසු ක්‍රමයක් තියෙනවද කියල බලමු"

"ඔබ හිතන්නෙ හෝම්ස්, ඔබට ඔය හැමදෙයක්ම සෝදිසිකරල බලන්න සර් ඩෙනිස් ඉඩදේවි කියලද?"

"ඇයි නැත්තේ? අපරාධකාරයා හොයාගන්න මට සම්පූර්ණ සහයෝගය දෙනවා කියල ඔහු මට කිව්ව නේ. ඔහු අපට බාධා කළොත්, ඒකම ඔහුට විරුද්ධව සැකයක් ඇතිකරන දෙයක් වියහැකියි. සර් ඩෙනිස් ඒ තරම් මෝඩයෙක් කියල මං හිතන්නෙ නෑ"

මගේ මිත්‍රයා එද සවස්වරුවම ගතකළේ නිදනකාමරයට වී, ගැඹුරින්ම කල්පනා කරමිනි. අපේ ගමන්මල්ලේ තිබූ පයිප්ප දුම්කොළ පසුම්බිය හා චෙරිවුඩ් පයිප්පය ළංකරගෙන, ඔහු



http://sherlockholmesinvestigations.blogspot.com



හාන්සිපුටුවේ වැතිරුණේය. මා කාමරයේ රැඳී සිටීම පවා ඔහුගේ සිතීමට බාධාවක් වියහැකි නිසා, කාමරයෙන් ඉවතට යාමට මම තීරණය කළෙමි.

තානායමේ උද්‍යානයේ තිබුණු බංකුවක වාඩිවී, හෝම්ස් කී කරුණු ගැන මම කල්පනා කරන්නට පටන් ගත්තෙමි. තරුණ කාලයේ දක්ෂ ක්‍රීඩකයෙකු වූ සර් ඩෙනිස්ට තවමත් ඇත්තේ තරුණයෙකුගේ මෙන් නිරෝගී සිරුරකි. කාටවත් නොදැනෙන්නට ජල නළයක් දිගේ පහළට බැසීම හා උඩට නැගීම ඔහුට අපහසු කාරියක් විය නොහැක. අලුත් රේසිං බයිසිකලයකින් රාත්‍රී කාලයේ හැතැක්ම පහක දුරක් වේගයෙන් පැදයාම සර් ඩෙනිස්ට තබා මටවත් වෙහෙසකාරී කටයුත්තක් නොවේ. එසේ නම් මැකෝලි සාමිවරයා ඝාතනය කිරීමට ඔහුට අවශ්‍යතාවටත් වඩා කාලය ඇත.

එහෙත් අපට අමතක වූ යම් ප්‍රධාන ගැටලුවක් මේ අවස්ථාවේ මට සිහිවිය. අපරාධකරුවා වෙඩිතැබීම කර ඇත්තේ මැකෝලිගේ හිසට ඉතා ළඟින් සිට බැව් වෛද්‍ය සාක්ෂියෙන් කියැවේ. ඒ අනුව අපරාධකරු ඉන්නට ඇත්තේ කරත්තය ඇතුළත ය. සර් ඩෙනිස් බයිසිකලයක නැගී ගොස් උවමනා තැනට ළඟාවුණත්, මැකෝලිට නොපෙනෙන්නට ඔහුගේ අශ්වකරත්තයට නැගුණේ කෙලෙසද? තමාගේ සතුරා වන සර් ඩෙනිස් නම් අශ්වකරත්තයට නංවා ගැනීමට තරම් මැකෝලි මෝඩයෙකු නොවේ. දහවල් කාලයේ දැඩි රථවාහන තදබදයක් ඇති ලන්ඩන් නගරයේ නම්, රියැදුරාට නොපෙනෙන්නට අශ්වකරත්තයකට නැගගැනීම ඒ තරම් අපහසු කරුණක් නොවේ. එහෙත් ගම්බද පෙදෙසක පාළු පාරක වේගයෙන් පදවාගෙන යන අශ්වකරත්තයකට නැගීම? එවැන්නක් සිතාගැනීමටවත් අපහසුය.

සවස තේ පානය සඳහා තානායමේ භෝජනාගාරය දෙසින්, පීරිසි කෝප්ප හේත්තුවී ගැටෙන ශබ්දය ඇසිණි. හෝම්ස් කැඳවාගෙන ඒමට කාමරයට යාමට මම තීරණය කළෙමි.

අපේ කාමරයේ දොරට මම සෙමින් තට්ටු කළෙමි. එහෙත් ඇතුළෙන් පිළිතුරක් නො ලැබිණ. කිහිපවරක් දොරට තට්ටුකොට ශබ්දයක් නොමැති නිසා, මම දොර තල්ලුකරගෙන ඇතුළුවුණෙමි.

අපේ කාමරය පයිප්ප දුමින් පිරී තිබිණි. හුස්මගැනීමේ අපහසුතාවයක් ද එක්වරම මට ඇතිවිය. මට දකින්නට ලැබුණේ



http://sherlockholmesinvestigations.blogspot.com

මගේ මිත්‍රයා ඇඳේ වැතිරී නිදසිටි ආකාරයයි. හුස්මගැනීමේ අපහසුතාවය නිසා, මම නොනවත්වාම කැස්සෙමි. ඒ හඬට මගේ මිත්‍රයා අවදිවිය.

"ආ.....වොට්සන්! දැන් වෙලාව කීයද?"

"හවස හතරයි"

"දෙයියෝ සාක්කි! මට තදින්ම නින්ද ගියා" ඔහු කීවේ ඇඳෙන් නැගිටිමිනි. "කළ යුතු වැඩ රාශියක් තියෙනවා. මං හිතාගෙන හිටියේ අද හවස සර් ඩෙනිස් හමුවෙන්න යන්න. ව්‍යායාමයටත් එක්ක බයිසිකලයක් පැදගෙන යමු වොට්සන්."

"කෝ ඒවට බයිසිකල්?"

"මේ කිට්ටුව තියෙනවා බයිසිකල් කුලියට දෙන තැනක්" හෝම්ස් කීය. "ඒක මට කිව්වේ මේ තානායමේ සේවකයෙක්. ගාස්තුව, පැයකට පැන්ස තුනයිලු. අපි තේබීලා ඉක්මනට පිටත්වෙමු."

සේවකයා ලවා බයිසිකල් දෙකක් ගෙන්වාගෙන සවස 4.30ට අපි තානායමෙන් පිටත්වී ගියෙමු. කුලියට දෙන බයිසිකල් නිසා ඒවා ඉතා අබලන් තත්ත්වයේ තිබිණ.

"මුලින්ම අපි යමු මැකෝලිගේ අශ්වකරත්තය අනතුරට ලක්වුණු තැනට" හෝම්ස් කීය. "එතැන ඉඳන් අපි පුළුවන් උපරිම වේගයෙන් සර් ඩෙනිස්ගේ ඊස්ට්ලින් මන්දිරය ළඟට පැදගෙන යමු. බලමු අපට ඒකට කොයිතරම් වෙලාවක් ගතවෙනවද කියල"

ගම්බද පාරක බයිසිකලයක් පැදයාමට මට අවස්ථාවක් ලැබුණේ බොහෝ කාලයකට පසුවය. එබැවින් එය මට නම් වෙහෙසකාරී කටයුත්තක් විය. එහෙත් යහපත් ශරීර සුවතාවයෙන් සිටි මගේ මිත්‍රයාට නම්, එය විනෝද ක්‍රීඩාවක් වූ බව මම දුටුවෙමි. මා ගැන අමතක කළ හෝම්ස්, බයිසිකලය වේගයෙන් පැදගෙන ගියේ අවුරුදු දහසයක කොලුගැටයකු තරම් විනෝදයක් ලබමිනි. මා හතිදමමින් ඊස්ට්ලින් මන්දිරය අසලට ළඟාවෙන විට හෝම්ස් තම සාක්කු ඔරලෝසුව අතට ගෙන ඒ දෙසට නෙත් යොමුකරගෙන සිටියේය. සටහන් පොත එළියට ගෙන ඔහු යමක් ලියූ බව ද මම දුටුවෙමි.

"හැතැක්ම දෙකහමාරක් එන්න මට ගතවෙලා තියෙනවා මිනිත්තු දහහතරකට තත්පර ගණනක් අඩු කාලයක්." හෝම්ස් කීය. "මේ



http://sherlockholmesinvestigations.blogspot.com



තබල් බයිසිකලයට එච්චර කාලයක් ගතවුණාට, හොඳ තත්ත්වයේ බයිසිකලයකින් මේක මිනිත්තු දොළහකට අඩුවෙන් කරන්න පුළුවන් කියල මට විශ්වාසයි."

"හෝම්ස් ඔබට අමතකවුණු එක් කරුණක් තියෙනවා"

"ඒ මොකක්ද?"

"සර් ඩෙනිස් බයිසිකලයෙන් ආව කියමු" මම කීවෙමි. "ඒත් ඔහු කොහොමද වේගයෙන් ආ අශ්වකරත්තයට නැගුණේ? ඔබ හිතනවාද මේ මහ රෑ පාර අයිනේ සර් ඩෙනිස් ඉන්නවා දුටුවොත්, ඔහු සමඟ කතාකරන්න මැකෝලි අශ්වකරත්තය නවත්තාවි කියලද?"

"මැකෝලි එහෙම කරත්තය නවත්තාවි කියල මම නම් හිතන්නෙ නෑ" හෝම්ස් කීය. "හැබැයි මෙහෙම හිතන්න. මැකෝලි පාන්දර 2.25ට කැතී මෙමනෙවිය සමඟ ඊස්ට්ලින් නිවසට ළඟාවෙනවා. ඔවුන් මිනිත්තු 10ක් විසිත්ත කාමරයේ කතාබහ කරමින් ඉන්නවා. සර් ඩෙනිස්ට උඩුමහලෙන් බැහැලා, ගෙවත්තේ හංගා තිබූ බයිසිකලයක නැගී පාර දිගේ වික්ටන් දෙසට යන්න ඒ මිනිත්තු දහය හොඳටම ඇති.

ඔහු පාරෙ පටු අඳුරු තැනක පාර අවහිර වෙන විදියට, පාර හරහට ලීකොට දෙකක් ඇද දමනවා. වික්ටන් හා ස්ප්‍රිංෆීල්ඩ් අතර පාර දෙපසම, ළඟදී කපාදැමූ ගස් හා විශාල අතුකැබලි තිබුණු බව ඔබ දකින්න ඇති. ඔහු ඒ අඳහා යොදාගන්න ඇත්තෙ, අනතුරු සිදුවුණු තැනට යාර සීයක් මේ පැත්තෙ තිබුණු, පටු වංගුව කියල මං විශ්වාස කරනවා. යන්න බැරි විදියට පාර අවහිර බව දුටුවාම මැකෝලි මොකද කරන්නේ? ඔහුගේ උදව්වට කරත්තයේ කවුරුවත් නැහැ. කරත්තය නවත්තලා බැහැල ගිහින්, ඔහු ලී කොටය ඉවත් කරනවා. අඳුරේ හැංගිලා හිටි සර් ඩෙනිස් මේ අතරේ හොරෙන්ම කරත්තයට නගිනවා. අවහිරය ඉවත්කළ මැකෝලි කරත්තයට නැගලා, එය දක්කාගෙන ඉදිරියට යනවා. ඔහු දන්නෙ නෑ කරත්තයේ පිටුපස තමන්ගේ ඝාතකයා ඉන්න බව. නිකං නෙමෙයි, භයානක ආයුධයක් අතැතිව. එතැනින් එහාට දර්ශනය මං ඔබට කියන්න යන්නෙ නෑ. ඔබට ඒක හිතාගන්න පුළුවනි. තමන්ගේ කටයුත්ත අවසන් කරන සර් ඩෙනිස් කරත්තයෙන් එළියට පනින්නෙ, එය කාණුවට පෙරළෙන්න කලින්. ඊළඟට ඔහු බයිසිකලයෙ නැගිලා ආපහු එනවා. ඔහුට පුළුවනි පැය කාලකින්



http://sherlockholmesinvestigations.blogspot.com

ආපහු ඇවිත් උඩුමහලට නැඟිලා ඇඳුම් මාරුකරගන්න. ඊළඟට ටයිලර් මහත්මිය ඉන්න තැනට ඇවිත්, ඇගෙන් අසනීපය ගැන විමසනවා. හොඳයි වොට්සන්. දැන් අපි නිශ්ශබ්දව ගිහින් සර් ඩෙනිස් හමුවෙමු."

වැඩි පමාවකින් තොරව සර් ඩෙනිස් කැමරන් අප හමුවට ආවේය. වෙහෙස මහන්සි වී බයිසිකල්වලින් එහි පැමිණීම ගැන ඔහු කණගාටුවට පත්වූ බවක් පෙනිණ.

"හෝම්ස් මහත්මයා" ඔහු කීය. "ඔබ දන්වලා එව්වා නම් මං රියැදුරා අතේ මගේ අශ්වකරත්තය එවනවා නෙ. මොකටද මේ බයිසිකල් දෙකක් පැදගෙන එන්න මහන්සිවුණේ?"

"නෑ සර් ඩෙනිස්" හෝම්ස් කීය. "අපට හිතුණා ව්‍යායාමයටත් එක්ක බයිසිකල් පදින්න. ඒක නොමෙයි මට තවමත් බැරිවුණා මේ අපරාධයේ අගක් මුලක් හොයාගන්න. ඒ හින්ද මං හිතුවා ඒ පිළිබඳ පරීක්ෂණය ඔබේ ඊස්ට්ලින් මන්දිරයෙන් පටන්ගන්න. ඒකට ඔබෙන් අවසර ලැබෙනවාද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා" සර් ඩෙනිස් වහා පිළිතුරු දුන්නේය. "ඔබට ඕනෑම වෙලාවක මේ මුළු ගේම සෝදිසි කරල බලන්න පුළුවන්. ඇයි මං ඔබට මුලදීම කිව්වානෙ මගේ සම්පූර්ණ සහයෝගය ලැබෙනවා කියල. ඔබගේ සෝදිසි කිරීම ඔබ අරඹන්නෙ කවදද?"

සර් ඩෙනිස් මෙයට එක්වරම කැමැත්ත පළකිරීම ගැන මා පමණක් නොව හෝම්ස් ද පුදුමයට පත් වූ බවක් පෙනිණ.

"ඔබට කරදරයක් නැත්නම්" හෝම්ස් කීය. "මං කැමතියි ඒ කටයුත්ත හෙට උදේ 10ට පමණ පටන්ගන්න"

"මට කිසිම කරදරයක් නෑ" සර් ඩෙනිස් කීය. "ඒ වුණත් හෙට උදේම මට ලන්ඩනය බලා පිටත්වෙන්න සිදුවෙලා තියෙනවා. වැවිලිකරුවන්ගේ සංගමයේ රැස්වීමක් හෙට, ලැංහැම් හෝටලයේ පැවැත්වෙනවා. මං ඒකට යායුතුමයි. ඒත් ඒකෙන් ඔබේ පරීක්ෂණයට කිසිම අවහිරයක් වෙන්නෙ නෑ. මගේ සොහොයුරිය ටයිලර් මහත්මිය ඉන්නවා. ප්‍රධාන ගෘහසේවක ඔලිවර්ටත් මං නියමකරනවා, ඔබට සම්පූර්ණ සහයෝගය ලබාදෙන්න. හෝම්ස් මහත්තයා. ඔබට උවමනා නම් මේ ගෙදර වහල උඩට නැගල සෝදිසි කරන්න. ඒ මොනවා කළත් මගෙන් කිසිම ප්‍රශ්නයක් නෑ" සර් ඩෙනිස් පිළිතුරු දුන්නේ සිනාමුසු මුහුණෙනි.


http://sherlockholmesinvestigations.blogspot.com



"ඔබට බොහොම ස්තුතියි සර් ඩෙනිස්" හෝම්ස් කීය. "එහෙනම් මං හෙට උදේ ඒ සඳහා පැමිණෙන්නම්. රෑ වෙගන එන නිසා මට තවදුරටත් පමාවෙන්න හැටියක් නෑ. ඔබට ශුභ රාත්‍රියක්"

ඊස්ට්ලින් මැඳුරේ සිට නාතායමට එන අතරේ මා සමග කතාබහ කිරීමට මගේ මිත්‍රයාගේ කැමැත්තක් තිබූ බවක් නොපෙනිණ. බයිසිකල් ආපසු භාරදී කාමරයට පැමිණි පසුව ද ඔහුගේ නිහඬ බවේ වෙනසක් නොවීය.

"හෝම්ස්, සර් ඩෙනිස් දුන්නු පිළිතුරෙන් ඔබ මොකක් හරි ගැටලුවකට මුහුණදුන්නා වගෙයි?" මම ඇසීමි.

"එක්තරා ගැටලු සහගත තත්ත්වයක් නම් පැන නැඟුණා තමයි" ඔහු කීය. එහෙත් හෝම්ස් තවදුරටත් කල්පනා කිරීමට පටන්ගත්තා මිස, එම ගැටලුව කුමක්දැයි කියන්න මට පහද දුන්නේ නැත. අප රාත්‍රී ආහාරය ගන්නා අතරත් දිගින් දිගටම ඔහු කල්පනාකරමින් සිටියේය. එබැවින් මම නාතායම වෙත ලැබී තිබුණු සවස පුවත්පතක් කියවා නින්දට යාමට තීරණය කළෙමි.

පසුවද උදයේම මා අවදිවනවිටත්, මගේ මිත්‍රයා සිටියේ පෙර දිනයේ මෙන් කල්පනා කරමිනි. උදේ ආහාරයට යෑමට සූදානමෙන් ඔහු හැඳපැළඳ ගෙන සිටියේය. අන්තිමේදී කිසිවෙකු අපේ කාමරයේ දොරට තට්ටුකළ හඬෙන් කලබල වී හෝම්ස් වහා දොර වෙත ගියේය. ඔහු එවැන්නක් බලාපොරොත්තුවෙන් සිටි විලසක් මම ඔහුගේ මුහුණෙන් දුටුවෙමි.

"හෝම්ස් මහත්මයාට විදුලිපුවතක්" කී සේවක ළමයා එය මගේ මිත්‍රයා අත තැබීය. ඔහු එය වහා විවෘතකොට කියවූයේ මට ද ඇසෙන අයුරෙනි.

**"මිනිස් ඝාතනයට යොදාගත් .32 උණ්ඩයේ සලකුණු සියල්ලක්ම, ඉලක්ක පුවරුවෙන් ගලවාගත් උණ්ඩවල ද ඇත. දෙවර්ගයම නිකුත් වී ඇත්තේ එකම රිවෝල්වරයෙන් බවට සහතිකයි. සවිස්තර වාර්තාව පසුව ලබාදෙමි.**

**ෆොක්ස්"**

මගේ මිත්‍රයාගේ මුහුණේ තිබූ කැලඹුණු ගතිය වහා ඉවත් විය. විදුලිපුවත නමා සාක්කුවට දමාගනිද්දී ඔහුගේ මුහුණේ සිනාරැල්ලක් ඇතිවූ බව මම දුටුවෙමි.


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

"ඊයෙ රෑ තිස්සෙ මං කල්පනා කර කර හිටියේ ඊස්ට්ලින් මන්දිරය සෝදිසියට නොයන්නමද කියල වොට්සන්" හෝම්ස් කීය. "නමුත් මෙක කියෙව්වාම මං නැවතත් තීරණය කළා ඒ කටයුත්තට යන්න. දැන් අපට පැන නැඟෙනවා ප්‍රශ්නයක්. ඒ මොකක්ද? සර් ඩෙනිස් කැමරන් සතුව තිබී, සති කිහිපයකට පෙර අතුරුදන්වුණා කියන 32 කැලිබර් රිවෝල්වරයෙන් නමයි, 24 වැනිද පාන්දර මැකෝලි සාමි ඝාතනය කෙරුණේ. ඒක පාවිච්චි කළේ සර් ඩෙනිස් නොවෙයි නම්, වෙන කවුද?"

උදේ දහය වෙද්දී කුලී රියක නැඟී අපි ඊස්ට්ලින් මන්දිරය වෙත ළඟාවූයෙමු. ප්‍රධාන සේවක ඔලිවර් වෙස්ට් පැමිණ අප පිළිගත්තේය. මඳ වේලාවකට පසු ටයිලර් මහත්මිය ද විසිත්ත කාමරය වෙත පැමිණියාය.

"නිවස පරීක්ෂාකරන කටයුත්තට ඔබට සම්පූර්ණ සහයෝගය දෙන්න කියල සර් ඩෙනිස් මට කියල ගියා" ඇය කීවාය. "මහත්වරුනි, අපෙන් කිසිම බාධාවක් නැහැ. මෙ පැත්තෙන් ආවොත් ඔබට පුළුවනි උඩුමහලට යන්න" ඇය කීවේ තරප්පු පෙළ දෙසට අත දිගුකරමිනි.

නවීන මාදිලියේ පුළුල් තරප්පු පෙළක් වූ එය පාමුලදී, අපව යාමට ඉඩහැර ඇය නැවතුණාය. "අතන තියෙන කෑමකාමරයට වෙලා මං ගෙතුමක් කරනවා. ඔබට මොනවා හරි මගෙන් දැනගන්න උවමනා නම් ඇවිත් කථාකරන්න"

"ඔබට ස්තූතියි ටයිලර් මහත්මිය" යි හෝම්ස් ඉතා සෙමින් තරප්පු පෙළේ ඉහළට නගින්නට විය. ප්‍රධාන ගෘහසේවක ඔලිවර් අප පිටුපස නොපැමිණ, නිවසේන් එළියට යෑමට සූදානම් වෙන අයුරු අපි දුටුවෙමු.

"ඔලිවර්" හෝම්ස් සේවකයා ඇමතුවේය. "කරුණාකර එන්න අප එක්ක. ඔබෙ උදව් අපට උවමනා වෙනවා. කෝ මියුරියෙල්?"

"ඇය මේ වෙලාවෙ විවේක ගන්නවා" සේවකයා පිළිතුරු දුන්නේය. "ඔබට උවමනා නම් මං ඇය කැඳවාගෙන එන්නම්"

"නැහැ. දැනට උවමනා නැහැ" හෝම්ස් කීවේය. "මං උවමනා වෙන කොට කියන්නම්. ඒක නෙමෙයි ඔලිවර්. මේ ගෙදරට සම්බන්ධව ඉන්න අනිත් සේවක සේවිකාවන් කවුද? මං කැමතියි ඒ අය ගැනත් දැනගන්න."


http://sherlockholmesinvestigations.blogspot.com



"මේ මන්දිරය ඇතුළතම පදිංචි අය ඉන්නේ මියුරියෙල් සහ මා පමණයි" ඔලිවර් කීය.

"අනිත් සේවක සේවිකාවන් ඉන්නේ ඔය උද්‍යානය එහා පැත්තේ තිබෙන කුඩා නිවාස තුනේ. එයින් එකක් සේවිකාවන් සඳහා. ඒකෙ ඉන්නේ මුළුතැන්ගෙයි සේවිකාව වෝර් මහත්මිය සහ මේරි ගිල්මටන් නම් සේවිකාව. ඇය තමා කැති මෙනෙවියගේ පෞද්ගලික සේවිකාව. ඒ ළඟම තියෙන නිවසේ ඉන්නේ ෆ්‍රෙඩ්රික් මුලාලි නම් කාර්මිකයා පමණයි."

"ඔහු මොනවද මේ ගෙදර කරන්නේ?" මම ඇසීමි.

"මේ අලුත් ගෙවල්වල පිළිවෙළ වෙනස් වෙන් මහත්මයා" ඔලිවර් කීය. "මෙහෙ කුස්සියට සහ නානකාමරවලට ජලය සපයන්න ඊයම් පයිප්ප තියෙනවානේ. අනික් ඒවායින් ජලකාන්දු හා අලුත්වැඩියා කටයුතු තියෙන නිසා මුලාලිට වැඩවලින් අඩුවක් නෑ. ඊට අමතරව ගෙදර විදුලි, වඩුවැඩ හා පෙද්රේරු වැඩ තියෙනවා"

"හොඳයි. අනෙක් නිවසේ ඉන්නෙ කවුද?"

"ඒකෙ ඉන්නේ, වයස්ගත ෆර්ගසන් ජෝඩුව සහ ඔවුන්ගේ තරුණ දියණිය." ඔලිවර් කීය. "ෆර්ගසන් තමා දීර්ඝකාලයක ඉඳල මෙහෙ උද්‍යාන සේවකයා ලෙස වැඩ කරන්නේ."

"හොඳයි. දැන් මට උඩුමහලේ කාමර පෙන්වාදෙන්න" හෝම්ස් ඉල්ලා සිටියේය.

"මෙක තමා සර් ඩෙනිස්ගේ නිදනකාමරය" සේවකයා ඇරඹුවේ දොරක් විවෘතකරමිනි. අපි එය තුළට පිවිසුණෙමු. පෑහෙන තරම් විශාල කාමරයක් වූ එහි සුඛෝපභෝගී ගෘහ උපකරණ රැසක් හා පොත් රාක්කයක් විය. උද්‍යානය දෙසට මුහුණලා තිබූ ජනේලය දෙසට, හෝම්ස් වැඩි අවධානයක් යොමු කළේය. විශාල ජනෙල් පියන් විවෘත කළ විට කෙනෙකුට පිවිසිය හැකි කුඩා සඳළුතලයක් ද එහි විය. අපි එතැනට ගියෙමු. උඩහට්ටුවේ නානකාමරයට ජලය සපයෙන ඊයම් ජලනළ, බිත්තියට සවිකොට තිබුණේ සඳළුතලය අසලිනි.

"හරි. දැන් අපි බලමු අනික් කාමර"

"නෝනා මහත්වරුන්ගේ නිදන කාමර තියෙන්නේ උඩුමහලෙම අනෙක් පැත්තේ" ඔලිවර් කීවේ ඒ දෙසට අප කැඳවාගෙන යමිනි.

"මේ තියෙන්නේ ටයිලර් මහත්මියගේ කාමරය. මෙක කැති මෙනෙවියගේ කාමරය"


http://sherlockholmesinvestigations.blogspot.com

සේවකයා එම කාමරවල දොරවල් විවෘත කොට පෙන්වූවත් එහි ඇතුළුවීමට හෝම්ස් එතරම් උනන්දුවක් නොදක්වීය. සිරිත්පරිදි කාන්තාවන්ගේ කාමරවල දක්නට ලැබෙන විශාල කණ්ණාඩි මේසය හා ඇඳුම් අල්මාරිය බැගින් ඒවායේ තිබිණ. මෙම කාමරවල ජනෙල් විවෘතවූයේ, උද්‍යානයේ විශාල මල්පඳුරු සහිත වූ පෙදෙසටය. ඒ බැව් ජනෙල් විදුරු තුළින් අපට දැකගන්නට ලැබිණ.

"දැන් අපි ගෙයින් එළියට යමු" හෝම්ස් කීවේ නොඉවසිලිමත් බවක් පළකරමිනි.

උද්‍යානයේ සෑම තැනකම ඉතා අලංකාර මෙන්ම දුර්ලභ මල් පඳුරු වවා තිබිණි.

"උද්‍යාන සේවකයා ෆර්ගසන් බොහොම දක්ෂයෙක්. ඒ වගේම කැපවීමෙන් වැඩකරන කෙනෙක්" ඔලිවර් කීය. "ඒ වුණාට එයාගෙ දුව වෙරෝනිකා නම් මහා ආඩම්බරකාර ළමිස්සියක්. ඒක එයාට ලැබෙන්න ඇත්තෙ එයාගෙ අම්මගෙන්. ඒ අම්මන්ඩිට උවමනා වෙලා තියෙන්නෙ දුවට ඉහළට උගන්වන්න. දුව හැඩකාර නිසා අම්මා උවමනා වුණා ඉහළ තැනකින් කරයුත්තක්....."

"ඔලිවර්" හෝම්ස් කෑගැසුවේ, නොනවත්වා ම දෙඩවමින් සිටි සේවකයා තමා අසලට කැඳවමිනි. මගේ මිත්‍රයා මේ වනවිට සර් ඩෙනිස්ගේ කාමරයේ ජනේලය කෙළින්ම පහළ පොළොව පරීක්ෂා කරන අයුරු මම දුටුවෙමි.

"මොකක්ද මේ පස්ගොඩ? දවස් කීයක ඉඳලද මේක මෙතැන තියෙන්නෙ?" හෝම්ස් විමසුවේය.

"මෙච්චර දවසක් ඕක ඔතැන තියෙනවා මං දැක්කෙ නෑ" ඔලිවර් කීය. "ඕක ගෙනැත් දන්න ඇත්තෙ ඊයෙ හැන්දෑවෙ. මේ අලුත් මල්පාත්ති වගයක් හදන්න ෆර්ගසන් ගෙනැත් දැමූ පෝර පස්. ඔහුට ඊයෙ හවස මහත්තයා කිව්වා මට මතකයි, මේ අයින දිගට මල්පාත්ති කීපයක් හදන්න කියල"

බිත්තිය දිගේ ඉහළට සවිකළ ජලනලය ඇරඹුන තැන් සිට අඩි හතරක් පමණ පහළට පස්තට්ටුව අසුරා තිබිණි. තමා දකින්නට බලාපොරොත්තු වූ යමක් වැසී යාම නිසාදෝ හෝම්ස්ගේ මුහුණ කෝපයෙන් රතු වූ අයුරු මම දුටුවෙමි.

"තවත් මේ හරියෙ බලන්න දෙයක් නෑ වොට්සන්. අපි යමු අර පැත්තට" ඔහු කීවේ උද්‍යානයේ අනෙක් කෙළවර දෙසට අත දිගු කරමිනි. ඒ හරියේ මැදින් තිබුණේ නිල්වන් තණකොළ වවා, ඒවා



http://sherlockholmesinvestigations.blogspot.com



මට්ටම් වනසේ කපා සකස් කළ, සෑහෙන තරම් විශාල තණබිමකි. වැස්සට පෙඟුණු පස බුරුල් වී තිබිණ. මෙම නිවස වෙත පැමිණි අශ්වකරත්ත නැවැත්වීමට, මෙතැන යොදාගෙන තිබීම නිසා අලංකාර තණබිම පළුදු වී ඇති අයුරු ඈත සිටම දැකිය හැකි විය. අපට පෙර එහි ගොස් සිටි හෝම්ස් අත ඔසවා අපේ පැමිණීම නැවැත්වීය.

"ඔය දෙන්නා ඔහොමම ඉන්න." ඔහු කීය. "මං මේ හරියේ බිම ටිකක් පරීක්ෂා කරන්නම්"

මගේ මිත්‍රයාගේ පරීක්ෂාවට සෑහෙන වේලාවක් ගතවෙන බව පෙනුණෙන් මම ඒ අසල වූ උද්‍යාන මංකුඩික වාඩිවී සේවකයා ද එහි කැඳවාගත්තෙමි. කථා කිරීමට ඇසියෙකු වූ ඔහු නොනවත්වාම දෙඩෙව්වේය. තමා මේ රැකියාවෙන් දුරේ සේවයට පැමිණීමට පෙර සේවය කළ මැදුරුවල, ප්‍රභූන්ගේ පවුල්වල තොරතුරු ඔහු පැවසීය. මගේ මිත්‍රයාගේ උදව්වට මට කළ හැකි යමක් නොතිබුණෙන් ඔලිවර් වෙස්ට්ගේ විස්තරයට මම කන්දී ගෙන සිටියෙමි.

වරක් දෙවරක් මා හිස ඔසවා බැලුවේ හෝම්ස්ට සිදුවූයේ කුමක් ද යන්නයි. ඔහු තම කාචය ද අතට ගෙන තණබිම පරීක්ෂා කරමින් සිටියේය. විටෙක දණගසාගෙන, විටෙක බිම පෙරළී හෝම්ස් පරීක්ෂා කළ අයුරෙන්, ඔහුට යම් හෝඩුවාවක් ලැබී ඇති බව මම තේරුම් ගත්තෙමි. තණබිමෙන් තෙත් ඉවතට නොගෙනම විටෙක මගේ මිත්‍රයා ඈතට ගමන් කළේය.

"දවස් හතරකට පහකට කලින් මෙහෙට සෑහෙන්න වැස්සා" ඔලිවර් පැවසුවේ අවධානය තමා වෙත යොමුකරවා ගැනීමේ අරමුණෙන් මගේ කබාඅතෙන් අදිමිනි.

"උද්‍යානයේ තණකොළ මැරිල තියෙන තැන් මඩවෙලත් ඇති. ඔය විදියට බිම පෙරළුණොත් ෂර්ලොක් හෝම්ස් මහත්තයාගෙ ඇඳුම්වලින් ගන්න දෙයක් හිටින එකක් නෑ. ඒක නෙමෙයි වොට්සන් මහත්තයා ඔබ අහල තියෙනවද සර් ට්‍රෙවෝ ජෙනිංස්ලගෙ පවුලෙ හුටපට? එයාගෙ ලොකු පුතා ඇල්ලී ජෙනිංස් තමා පවුලෙ ඉන්න නරකම එකා. එයා හිතාගෙන ඉන්නෙ එයා එංගලන්තෙ මහරජ්ජුරුවෝ කියල. සර් ට්‍රෙවෝ ඉඩම් පවා විකුණලා පුතාව විශ්වවිද්‍යාලයට යැව්වා. ඒත්....."

ගෘහ සේවකයාගේ ඕපාදූප කථාව අසා සිටීමට තරම් අපහසු එකක් නොවීය. එහෙත් මේ වෙලාවේ මගේ සිත දිවගියේ හෝම්ස්



http://sherlockholmesinvestigations.blogspot.com

කරමින් සිටි සෝදිසිය වෙනස මගේ මිත්‍රයාට වැදගත් හෝඩුවාවක් මොනවා හෝ ලැබී ඇතුවා නිසාවද, ඔහු සමීපයට ගොස් ඒ ගැන දැනගැනීමට ඇත්නම් එය මේ සිපාදූපවලට වඩා වැදගත්වනු නොඅනුමානය. එහෙත් මගේ අතින් අදිමින් කථාකළ ගෘහසේවකයා, එම අනුනෙහ් නැගිටීමට මට ඉඩක් නොතැබුවේය. ඇය තුන්කාලකට පමණ පසු හෝම්ස් අප සිටි තැනට එද්දී, ඔලිවර් ඇවඩූ කරුණ ඇත්තක් බව මම දුටුවෙමි. මගේ මිත්‍රයාගේ ඇඳුම්වල, පාවහන්වල හා මුහුණේ සැහෙන තරම් මඩ තැවරී තිබිණ. කෙසේවෙතත් ඔහු සැහෙන තරම් සතුටකට පත්ව සිටි බවත් මම තේරුම් ගතිමි. ඔහුගේ එක් අතක තිබූ සටහන් පොත හා පැන්සල සාක්කුවට දමා නොගත්තේ, ඔලිවර්ගෙන් යමක් විමසා ලියාගැනීමට බැව් මම තේරුම් ගත්තෙමි.

"අන්තිමට මෙහේට වැස්සෙ 22 වැනිදද 23 වැනිදද?" හෝම්ස් ඇසුවේ ගෘහසේවකයාගෙනි. "ඒ කියන්නේ සර් ඩෙනිස්ලා ක්‍රීඩා සමාජයේ උත්සවයට ගිය දවසෙද? ඊට කලින් දවසෙද?"

"දවස් හතරක් එහෙම දිගටම වැස්සා" ඔලිවර් කීය. "උත්සවය දවසෙ උදේ වරුවෙ වැස්සෙ නෑ. හවස ටිකක් වැස්සා. හදිස්සිම වැස්සොත් නම් ඇය උත්සවයට යන්නෙ නෑ නැහැ කියලා ටයිලර් මහත්මිය කිය කිය හිටියා.

"ඒ මොකද?" මම ඇසීමි.

"ටයිලර් මහත්මියට උණ සෙම්ප්‍රතිශ්‍යාව හැදිලා දවස් කිහිපයකට කලිනුත් බෙහෙත් ගත්තා" සේවකයා කීය. "වැස්සෙ එළියට ගියොත් ඒක වැඩිවෙයි කියල ඇය බයෙන් හිටියෙ. කණවර වැටෙන්න කලින් පොදවැස්ස නැවතුණා. කැතී මෙහෙවිය ටයිලර් මහත්මියට හරියට වද කළා යමු යමු කියලා."

"ඒ ඇයි?"

"කැතී මෙහෙවියගේ උනන්දුව තිබුණේ උත්සවයෙන් පස්සේ බෝල්නැටුම ගැනයි" සේවකයා කීය. "ඒ කෑම වෙලාවෙදි සර් ඩෙනිස් පිළිගන්නවා කලබල කරාවි කියන භය කැතී මෙහෙවියගේ හිතේ තිබුණා. සර් ඩෙනිස්ට කේන්තිගියාම ටිකක් හරි පාලනය කරන්න පුළුවන්, ටයිලර් මහත්මියට විතරයි"

ඔලිවර් බෙහෙවින් ඇඩමණ් පුද්ගලයෙකු බව හෝම්ස් තේරුම් ගත්තේ මේ අවස්ථාවේදී වියයුතුය.



http://sherlockholmesinvestigations.blogspot.com



"එද - ඒ කියන්නේ 23 වැනිද ඉඳල මේ ගෙදරට ආව ගිය අශ්වකරත්ත මොනවද, ඒවල ආව ගියේ කවුද කියන එක, ඔලිවර්ට මතකද?"

"මට අමතක නෑ මහත්තයා" ඔලිවර් කීවේ තරමක් ආඩම්බර ලීලාවෙනි. "මහොම ඉන්න. මං මහත්තයලා පිළිවෙළින් කියන්නම්. .....මේ ගෙදර අශ්වකරත්තය ඇරුණාම..... පිටකරත්ත ආවෙ එකක් විතරයි. ඒ මැකෝලි සාමීගේ අශ්වකරත්තය. ඒක දක්කාගෙන ආවෙ එයාමයි. .....ආව ගිය මනුස්සයො ගැන කියනවා නම්....."

මේ වෙලාවේ ඔහුගේ කතාවට බාධාකරමින්, ගෙදර සේවිකාව වූ මියුරියල් එහි පැමිණියාය.

"මහත්මයාලට තේ සදනම් කරද. ටයිලර් නෝනා බලාගෙන ඉන්නවා මහත්තයලා එනතුරු" ඇය කීවාය.

මේ අවස්ථාවේ හෝම්ස් සිටියේ තම සටහන් පොතේ යම් යම් දේ සටහන් කරගනිමිනි. ඒ ඔලිවර්ගෙන් අසන්නට ලැබුණු තොරතුරු වියයුතුය.

"..... බොට්සන්" මගේ මිත්‍රයා කීවේ ඔහුගේ ඔරලෝසුව දෙස බලමිනි. "ඔබ මියුරියල් එක්ක සේවලයා යන්න. අපි දැනටමත් ප්‍රමාදයි. ඔලිවර්ගෙන් අහල කරුණු කිහිපයක් සටහන් කරගෙන, අත් පා සෝදගෙන මං එන්නම්..... මේ මඩ නිසා මට කොහොමටවත්, තේ බොන්න මේ පිළිවෙලට එන්න බැහැනෙ." අන්තිම වාක්‍යය ඔහු කීවේ තරුණ සේවිකාව දෙස බලමිනි. මගේ මිත්‍රයා එනතුරු නවතුරටත් බලා නොසිට, මම ඇය සමග නිවස වෙත ගියෙමි.

අමෙලියා ටයිලර් මහත්මිය කරුණාවන්ත කාන්තාවක වූවාය. මා හමුද වෛද්‍යවරයෙකු ලෙස කලක් ඉන්දියාවේ සිටි බැව් දැනගත් පසු, ඇය ඉතා සුහදව මා සමග කථාකිරීමට පටන් ගත්තාය. ඩාජිලිංහි මුල් කාලයේ ඇය ඇගේ සැමියා සමග සතුටෙන් කාලය ගෙවූ හැටි, සැමියා අසනීප වූ අන්දම, ඔහුගේ මරණය, ඇය විස්තර කළාය. මම ඊට කනදීගෙන සිටියෙමි. ඉන්දියාවේදී යුද පෙරමුණේ මගේ අත්දැකීම් පිළිබඳව ද ඇය විමසුවාය. හෝම්ස්ට එහි පැමිණීමට පැය භාගයකට වඩා කාලය ගතවන්නට ඇතැයි මට සිතිණ. මේ වන විට කාල වේලා වඩාත් ළංවී තිබුණේ, දහවල් කෑමට මිස තේ පානයට නොවේ. හෝම්ස් ටයිලර් මහත්මිය වෙත ද ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කළේය.



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

අප ආපසු තානායම බලා එන අතරතුර මගේ මිතුරා දැඩි උද්‍යෝගයකින් කථාකළේ, මැඳුරේ ගෘහසේවක ඔලිවර් වෙස්ට් පිළිබඳවය.

"ඔය වගේ මිනිස්සු හමුවෙන්නේ හරි කලාතුරකින් වොට්සන්. වැඩිය ඉහළට ඉගෙනගන්න මුදල් හදල් නැති නිසා, ඔවුනට ලැබෙන්නේ පහළ මට්ටමේ රැකියාවක්. මේ වගේ බුද්ධිමත් අයට ඉහළට ඉගෙනගන්න නොලැබීම හරි කණගාටුවට කරුණක්. ඔලිවර් වෙස්ට්ට තියෙනවා ඉතාම හොඳ මතක තබාගැනීමේ ශක්තියක්. තමන් දකින දේ සියුම්ව නිරීක්ෂණය කරන්න ඔහුට සහජ කුසලතාවයක් තියෙනවා. ඔහුට නැත්තේ විශ්ලේෂණ බුද්ධිය පමණයි. නිසි පුහුණුවක් දුන්නා නම් ඒකත් ලැබෙනවා."

"ඒ කියන්නේ ඔහු බුද්ධිය අතින් ස්කොට්ලන්ඩ්යාඩ් එකේ අයට වඩා ඉදිරියෙන් සිටිනවාද?" මම ඇසීමි.

"ඇත්තෙන්ම ඔව්" හෝම්ස් කීය. "ලෙස්ට්‍රේඩ්ට වඩා නම් පැහැදිලිවම ඉදිරියෙන්. මං උදාහරණයක් කියන්නම්. මං ඔහුගෙන් ඇහුවා 20 වැනිද ඉඳල ඊස්ට්ලින් මැඳුරට ආව අශ්වකරත්තවල තොරතුරු. ලිපිගොනුවක් දිගහරින්න වගේ, ඔහු ඒවා ගැන විස්තර කිව්වේ පිළිවෙලින් එකින් එක. තණබිමේ මං නිරීක්ෂණය කළ හෝඩුවාවන් සමග ඒ විස්තර අකුරටම ගැළපුණා. ඊළඟට ගෙදරට ආවගිය උදවිය ගැන මං විමසුවා. ඒ ගැනත් පිළිවෙලින් කියන්න ඔහුට හැකිවුණා. ඒක නෙමෙයි වොට්සන්. ඔබ හුගක් වෙලා ටයිලර් මහත්මිය සමග කතාබහ කළානේ. ඇය දවල් කෑමෙන් පස්සේ එළියට යන බවක් ඔබට කීවේ නැද්ද?"

"ඇය එහෙම දෙයක් කිව්වා තමයි" මම පිළිතුරු දුන්නෙමි. "ස්ප්‍රිංෆීල්ඩ් කාන්තා සංගමයේ රැස්වීමක් සඳහා දවල් 2ට නගරයට යායුතු බව ඇය කිව්වා. ඒ නිසා දහවල් කෑම කල් ඇතුව පිළියෙල කරන්න කියලා මියුරියල්ට මතක් කළා. නමුත් කොහොමද හෝම්ස් ඔබ ඒක දැනගත්තෙ?"

"ඒක ඒ තරම් අමාරුවෙන් හොයාගත් එකක් කියලා මං හිතන්නේ නෑ වොට්සන්" ඔහු කීය. "අශ්වකරත්ත රියැදුරා, අශ්වයින්ට කෑම දීලා, කරත්තය පිරිසිදු කරලා, ඔහුගේ නිල ඇඳුම සකස් කරගන්න හැටි මං දුටුවා. ගෙදර ස්වාමියාත්, ඔහුගේ දියණියත් දෙදෙනාම ගෙදර නෑ. එහෙම නම් අශ්වකරත්තයෙන් එළියට යන්න ඉන්නේ ටයිලර් මහත්මිය වියයුතුයි"


http://sherlockholmesinvestigations.blogspot.com



"දැන් නම් මටත් පැහැදිලියි" මා කීවේ මේ වනවිට තානායම ඉදිරියට ළඟා වූ අශ්වකරත්තයෙන් බසිමිනි.

"මට එක්තරා දෙයක් සම්පූර්ණයෙන්ම අමතකවුණා වොට්සන්" හෝම්ස් කීවේ අප දහවල් ආහාරය ගනිමින් සිටියදීය. "සර් ඩෙනිස්ගේ සපත්තුවල අඩියේ ප්‍රමාණය මැන ගැනීමට මට උවමනා වෙලා තිබුණා. නමුත් කලබලේට ඒක අමතකවුණා"

"දැන් ඉතින් මොකක්ද කරන්නෙ? ඉක්මනටම ආපහු යනවද?"

"ඔබ එන්න අවශ්‍ය නෑ වොට්සන්. මං දෙකට විතර ගිහිං, ඒකත් මැනලා, මගේ සටහන් පොතේ ලියාගෙන එන්නම්. සර් ඩෙනිස්ගේ සපත්තු අඩිය මේ පරීක්ෂණයේදී බොහොම වැදගත්"

දහවල් ආහාරයෙන් පසු මා ඇඳේ වැතිරෙද්දී, මගේ මිතුරා යළිත් ඊස්ට්ලින් බලා පිටත්ව ගියේය. පැයකට වැඩි කාලයක් නිදගත් පසු මට ඇහැරිණි. අප මුහුණදී ඇති ගැටලුව ගැන මට යළි යළිත් කල්පනා විය. ස්ප්‍රිංෆීල්ඩ් වෙත පැමිණ අපි දින කිහිපයක් ගතකළෙමු. එහෙත් මෙය ඉක්මනින් අවසන් කළ හැකි අයුරක් මට නම් නොපෙනිණ. සර් ඩෙනිස්ට විරුද්ධව සාධු සාක්ෂි නොමැති නිසාදෝ, ඔහු හිරභාරයට ගැනීමට පොලිසිය පැකිළෙයි. වෙඩි උණ්ඩ පිළිබඳව රජයේ විශ්ලේෂකයා කර ඇති සොයාගැනීම ම ප්‍රබල සාක්ෂියකි. මෙවැනි වක්‍ර සාක්ෂියක් ලැබුණේ දුප්පත් අසරණ මිනිසෙකුට එරෙහිව නම්, ඔහු පොලිස් අත්අඩංගුවට ගන්නේ අප්‍රමාදවය. ප්‍රභුවරුන් කරන වැරැදිවලදී බ්‍රිතාන්‍ය පොලිසිය හැමවිටම ක්‍රියාකරන්නේ මන්දගාමී අයුරිනි. එය මීට පෙර ද මා දැක ඇති තත්ත්වයකි.

සවස පහ පමණ වනවිට මගේ මිතුරා ආපසු පැමිණියේය. ඔහු බෙහෙවින් විඩාපත්ව සිටියත්, ඔහුගේ දෙනෙත්වල යම්කිසි දීප්තියක් මම දුටුවෙමි. මෙම ගැටලුව සාර්ථකව විසඳීම සඳහා, ඔහු නියම මගට පිවිසී ඇතිබවට සලකුණකි ඒ.

"මං එහේට යනකොට මං හිතූ විදියටම ටයිලර් මහත්මිය ගෙදරින් පිටවෙලා ගිහින්" හෝම්ස් කීය. "සර් ඩෙනිස් ආපහු ඇවිත් හිටියෙත් නෑ. ඔහු එන්නේ අද හැන්දෑවෙ හයට, මෙහේට ළඟාවෙන දුම්රියෙන්."

"ගිය වැඩේ සාර්ථකව කරගන්න ඔබට හැකිවුණාද?"

"ඉතාම සාර්ථකව කරගත්තා කියන්න පුළුවනි" ඔහු කීවේ තම අතේ තිබූ කාඩ්බෝඩ් පෙට්ටිය මේසය මත තබමිනි. "අපරාධ


http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

පරීක්ෂණයේදී අඩිසටහන්වල වැදගත්කම මං හැමදම කියන දෙයක්. ඒක වාර්තා කර ගැනීම සඳහා ප්‍යැරිස්බදමය යොදු ගතයුතු බව මං හැමවිටම අවධාරණය කරනවා. ඔබට මතක ඇති, මං ඒ ගැන පොත් පිංචකුත් ලියල තියෙනවා. එපමණක් නොවෙයි; පොලිස් නිලධරයන් ඒ ගැන දැනුවත් කිරීමට මං ඔවුනට දේශනත් පවත්වලා තියෙනවා."

කාඩ්බෝඩ් පෙට්ටිය විවෘත කළ ඔහු, පැරිස් බදමයෙන් ගත් සපත්තු ලාංඡන, හත අටක් මේසය මත තැබුවේය.

"මෙම සිද්ධියට කලින් දින කීපයේම තරමක වැසි ගතියක් තිබිලා, ඉන්පසුව වැස්සක් නොතිබුණු එක අපේ වාසනාව වුණා වොට්සන්" හෝම්ස් කීවේ එක් ලාංඡන සටහනක් අතට ගනිමිනි. "පෙඟුණු පස් මත අඩි සටහන් වැදීලා පසුව අව්වෙන් ඒවා ශක්තිමත් වෙලා තිබුණා. මේ තියෙන්නේ සර් ඩෙනිස්ගේ සපත්තුවල ලාංඡන දෙකක්. ඔහුගේ කකුල පළලින් අඩුයි, දිගින් වැඩියි. මෙයින් එකක් මං සකස් කර ගත්තේ ඔහුගේ කාමරයේ තිබූ සපත්තුවකින්. අනෙක දින කිහිපයකට පෙර මඩ සහිත පොළොවේ වැදී තිබුණු අඩි සටහනෙකින්. ඒවා මොනතරම් සමානද කියන කරුණ බැලූ බැල්මට පෙනෙනවා.

මෙන්න මේවා පලල් රවුම් හැඩයේ අඩි. මේ ඔලිවර් වෙස්ට් ගෘහ සේවකයාගේ සපත්තු අඩි. ඔබට පෙනෙනවා ඇති ඒවා ගෘහ සේවකයන් ගෙදරට අඳින, සපත්තු; ඉත්තෑවෙකුගේ විහිදුණු කුරු මෙන් කට්ට රටාවක් ඇති, කැන්වස් සපත්තුවලින් ඇතිවුණු ලාංඡන.

මෙන්න මේ සලකුණු තිබුණේ ඉතාම ස්වල්පයයි. විළුඹ කොටස වෙන්ව පිහිටි, ඉදිරිපස හතැරැස්, තරුණියන් පළඳින ආකාරයේ සපත්තු. මේ කට්ට රටාව එංගලන්තයේ සපත්තු නිෂ්පාදකයන් නොයොදන "හෙරිංබෝන්" ආකාරයේ කට්ට රටාව. මේවා මිලෙන් වැඩි ඇමරිකානු සපත්තු. ඔබ හිතන්නේ මේ කාගෙ සලකුණු කියලද?"

"මැකෝලි සාමිගේ?"

"හරියටම හරි වොට්සන්" හෝම්ස් කීය. "හොඳයි ඊළඟට බලමු කාන්තා පාවහන් සලකුණු. මෙන්න මේවා ටයිලර් මහත්මියගේ හා මියුරියෙල් ගේ සැහැල්ලු රබර් පාවහන්වලින් ඇතිවුණු ලකුණු. ඒ



http://sherlockholmesinvestigations.blogspot.com



බව ගෙදර තිබුණු ඔවුන්ගේ පාවහන් පරීක්ෂා කිරීමෙන් ම මං ස්ථිර කරගත්තා.

ඊළඟට මගේ හිතේ පටලැවිල්ලක් ඇතිකළේ, මැකෝලි සාමිගේ පාවහන් සමග දක්නට ලැබුණු කාන්තාවන් දෙදෙනෙකුගේ පාවහන් ලකුණුවලින්"

"ඔබ ඇයි හෝම්ස් එහෙම කියන්නේ?"

"පාවහන් වර්ග දෙකක ලකුණු" ඔහු කීය.

"මං හිතන්නේ එතැනදී නම් ඔබට වැරදුණා" මම කීවෙමි. "ඒ මොකද ධනවත් තරුණ කාන්තාවන් ළඟ තියෙන පාවහන් ජෝඩු අප්‍රමාණයි. විවිධ වර්ගවල විවිධ රටාවල හැඩි මිල අඩු වැඩි, ඒවා ඔවුන් ළඟ තියෙනවා"

"ඔබ කියන ඒ තරුණ සත්‍යයක් ඇත්ත මිතුයා" හෝම්ස් කීය. "නමුත් මේවා නම් දෙදෙනෙකුගේ බව මට විශ්වාසයි. ඒ ඇයිද කියා මං ඔබට කියන්නම්.

එක් වර්ගයක් මිල අධික වර්ගයේ පාවහන්. හම් අඩියක් සහිත කකුලේ ඉදිරියට වඩා විළුඹ ඉහළට ඉස්සී සිටින ඒවා." හෝම්ස් කීවේ පැරිස් බදම නිදර්ශකයක් මගේ අතට දෙමිනි. "මෙවල විළුඹ හරිය හොඳින් නොවදින නිසා දිග මැනගන්න අමාරුයි. නමුත් ඉදිරිපස කොටසේ පළල අපට පහසුවෙන් මැනගන්න පුළුවනි. එය ඉතා කුඩායි. කැති මෙනෙවියගේ කාමරයේ තිබූ පාවහන් ජෝඩු විස්සක් පමණ මං පරීක්ෂා කර බැලුවා. පාවහන්වල ප්‍රමාණය අංක 5. ඇගේ පාවහන් මෙම එක් ලාංඡනයකට අකුරටම ගැළපුණා."

"එතකොට අනෙක?"

"ඔව් වොට්සන්. බලන්න මේකෙ හැඩය හා ප්‍රමාණය" ඔහු කීවේ පැරිස් බදම ලාංඡන සටහන් මා අතට දෙමිනි. "මේවායේ ප්‍රමාණය හුගක් විශාලයි. ප්‍රමාණය අංක 7 හෝ 8 පිරිමියෙකුගේ කකුල්වගේ. එහෙම නේද?"

"ඇත්තෙන්ම ඔව්"

"අනෙක මේවා එතරම් මිල අධික වර්ගයක් නෙමෙයි. ඉතාලියේ නිෂ්පාදනය කරල එංගලන්තයට ගෙන්වන ඒවා. ගෙදරට අඳින වර්ගයේ සැහැල්ලු පාවහන්. උත්සවයකට අඳින ඒවා නෙමෙයි."

"එහෙනම් මියුරියල්ගේ හෝ ටයිලර් මහත්මියගේ ද?"

"නැහැ. ඔවුන් දෙදෙනාගේම පා ඉතා කුඩා ඒවා..... දිගෙන් මෙන්ම පළලිනුත් අඩුයි. මේ ලාංඡන වැදී තිබුණු තැන් මං මගේ



http://sherlockholmesinvestigations.blogspot.com
www.sinhalaelibrary.com

ප්‍රබල උත්තල කාචයෙන් පරීක්ෂා කර බැලුවා. වම් කකුලේ සපත්තුව දකුණට වඩා වැඩිපුර ගෙවීගිහින් බව මට කියන්න පුළුවනි.

අනික ඒක බිම වදින්නේ කෙළින්ම ඉදිරියට නෙමෙයි. අංශක කිහිපයක් ඇලයට."

"ඒකෙන් ඔබ අදහස් කරන්නේ මොකක්ද?" මම ඇසීමි.

"මේ පාවහන් පැළැඳි තැනැත්තියගේ වම් කකුලේ සුළු ආබාධයක් තියෙනවා." ඔහු කීය. "ඒ නිසා ඇය ඇවිදින විට පය බිම වැදෙන්නේ මදක් අසාමාන්‍ය පිළිවෙළකට."

"ඒ විදියට ඇවිදින ඊස්ට්ලින් මැඳුරේ අදිංචි කාන්තාව කවුද?" මම ඇසීමි. "ඊළඟට ඇය කොහොමද මේ අබිරහසට සම්බන්ධ වෙන්නෙ? මං හිතනවා ඔබ ඔය සඳහන් කරන්නේ මුළුතැන්ගෙයි සේවිකාව, නැත්නම් කැනී මෙනෙවියගේ පෞද්ගලික සේවිකාව....."

මගේ කථාවට බාධාකරමින් කිසිවෙක් අපේ කාමරයේ දොරට තට්ටු කළේය.

"කවුද මේ වේලාවේ....!" යයි විමසූ හෝම්ස් දොර වෙත ගියේය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා" දොරට තට්ටුකළ පුද්ගලයා කියනු ඇසිණ.

"ඔබට උපපොලිස් පරීක්ෂක කෝසන් ගෙන් ලියුමක්"

මගේ මිත්‍රයා දොර විවෘත කළේය. ලියුම් කවරයක් රැගත් පොලිස් භටයෙක් දොර අසල විය. ලියුම හෝම්ස් අතට දුන් පොලිස්භටයා ආචාරකොට වහා පිටවී ගියේය.

"මොකක්ද?" මා ඇසුවේ කවරය විවෘතකර බලා එහි වූ දෑ කියවූ මගේ මිත්‍රයාගෙනි.

"ඇයි අර මැකෝලි සාමිගේ අපකීර්තිමත් ඉතිහාසය හොයල බලල. ඒ ගැන වාර්තාවක් අපට ලබා දෙන්න කෝසන් පොරොන්දු වුණා නේ. මේ ඒක." එසේ කී හෝම්ස් ෆාන්සි පුටුවේ වාඩිවී ලිපිය කියවීමට පටන්ගත්තේය. එය මදක් කියවා මගදී නැවැත්වූ ඔහු නළල රැළි කරගෙන කල්පනා කළේය. ඔහුගේ සිතිවිලිවලට බාධා නොකොට මම නිහඬ වූයෙමි.

පැය භාගයක් ගතවීමට පෙර යළිත් වරක් කිසිවෙක් දොරට තට්ටු කළේය.

"ඇතුළට එන්න". මම කීවෙමි.



http://sherlockholmesinvestigations.blogspot.com



අප පුදුමයට පත්කරමින් කාමරය තුළට පිවිසියේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලිස් පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට්ය.

"ආයුබෝවන් මහත්වරුනි. ඔබ දෙදෙනාගෙන් කිසිම ආරංචියක් නැති නිසයි, මං මේ විශේෂයෙන්ම ආවේ. මගේ ප්‍රධානීන් අහනවා මේ මිනීමැරුම ගැන සෙවීම අත්ඇරලද කියලා."

"මේ ගැන කිසිම දෙයක් ඔබට දැනුම් දෙන්න බැරිවීම ගැන මට කණගාටුයි බ්‍රැඩ්ස්ට්‍රීට්" හෝම්ස් කීවේ අසුන්ගන්නා මෙන් අමුත්තාට සංඥාකරමිනි. "මෙපමණ දවසක් දැනුම්දෙන්න නොහිතුවේ, අපේ පරීක්ෂණයේ කිසිම ප්‍රගතියක් නොතිබුණු නිසා. නමුත් දැන් තත්ත්වය ඊට වඩා ටිකක් වෙනස්"

කථාව මදකට නැවැත්වූ මගේ මිත්‍රයා, ඔහුගේ පයිප්පය ගෙන එයට දුම්කොළ පුරවා, එය දල්වාගත්තේය. අනතුරුව කථාව ඇරඹුවේ පයිප්පයෙන් දුම් ගුලි පිටකරමිනි.

"මෑත කාලයක මේ තරම් සංකීර්ණ ගැටලුවක් අපට ලැබුණෙ නැහැ කියලයි මට හිතෙන්නේ. මිනීමරුවා යයි සැක කළ හැකි පුද්ගලයෙක් ළඟම ඉන්නවා. නමුත් ඔහුට විරුද්ධව සතුටුදායක සාක්ෂි කිසිවක් නෑ."

"නමුත් හර්බට් ෆොක්ස් කිව්වා සර් ඩෙනිස් වැරැදිකාරයා වෙන විදියේ සාක්ෂි අර වෙඩිඋණ්ඩ පරීක්ෂණයෙන් ලැබුණා කියල....."

"මෙහෙමයි බ්‍රැඩ්ස්ට්‍රීට්" හෝම්ස් කීය. "මැකෝලි සාමි මරණයට පත්වුණු වෙඩිල්ල පිටවුණේ සර් ඩෙනිස්ට අයිති රිවෝල්වරයෙන් බව ඇත්තයි. නමුත් ඒ ආයුධය සර් ඩෙනිස් ළඟ තිබිලා අත්අඩංගුවට ගන්න පොලීසියට හැකිවුණෙත් නෑ. ඉතින් මේ ආයුධය පාවිච්චි කළේ සර් ඩෙනිස්ද නැත්නම් වෙනිං කවුරුවත්ද කියලා අපි තීරණය කරන්නෙ කොහොමද? අන්න ඒ නිසයි අපට අමතර දවසක් දෙකක් ගතවුණේ.

මං බලාපොරොත්තු වෙනවා හෙට උදේ මේ ගැන ඉදිරි පියවරක් ගන්න. ඒ සඳහා ඔබට මෙහේ එන්න කියලා මං ලන්ඩනයට විදුලිපුවතක් යැව්වා. ඔබ පිටත්වෙන්න ඇත්තේ ඒක ලැබෙන්න කලින්"

"ඇත්තෙන්ම ඔව් හෝම්ස් මහත්මයා. මං ලන්ඩනයෙන් ආවෙ උදේ 9.50 දුම්රියෙන්. මගදී ඇතිවූ දුම්රිය අවහිරතාවයක් නිසයි එන්න ප්‍රමාද වුණේ..... එහෙනම් හෙට උදේ නවය වෙනකොට මං මෙහේට එන්නම්" කී පොලිස් නිලධරයා අපෙන් සමුගත්තේය. ඔහු



http://sherlockholmesinvestigations.blogspot.com

පිටත්ව ගියේ පොලිස් නිවාසයේ නවාතැන් ගැනීමට බව මම දැනසිටියෙමි.

මේ ප්‍රශ්නය ගැන රාත්‍රී ආහාරය ගන්නා අතර හෝම්ස් සමග කතාබහ කිරීමට මං බලාපොරොත්තු වූයෙමි. එහෙත් ඔහු ඊට කැමැත්තක් දක්වූයේ නැත. අපරාධකාරයා අත්අඩංගුවට ගැනීමට පෙර ඒ පිළිබඳව කිසිවක් සාකච්ඡාකිරීම ඔහු මග හැරියේය.

පසුවද උදෑසන නවය වීමටත් පෙර පොලිස් පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් තානායම වෙත පැමිණියේය. සූදානම් කර තිබූ කුලී රියෙන් අපි ඊස්ට්ලින් මන්දිරය බලා පිටත්ව ගියෙමු.

"එදා ඊස්ට්ලින් මන්දිරයට සම්බන්ධ අය ගැන කියද්දී බ්‍රැඩ්ස්ට්‍රීට් මට මෙහෙම දෙයක් කිව්වා" හෝම්ස් කීය. "..... මැඳුර ඇතුළෙම පදිංචි මියුරියල් නම් සේවිකාව සහ ඔලිවර් නම් සේවකයා පමණයි. අනික් සේවකයන් මේ සිද්ධියට සම්බන්ධ වෙන්නෙ නැහැ..... ඒ නිසා මං ඔවුන් ගැන කියන්න යන්නෙ නැහැ..... එහෙම නේද?"

"ඔව් මං කිව්වා තමයි. ඇයි ඒක වැරැද්ද?"

"අපි දැන් මේ යන්නෙ ඒක හරිද වැරැද්ද කියල හොයල බලන්න තමයි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔයා උවමනා කරන්නෙ ඉස්සරවෙලා සර් ඩෙනිස්ව අත්අඩංගුවට ගන්නද?"

"හෝම්ස් මහත්මයා, මට හිතෙනවා අපි ඉස්සරවෙලා එහෙම කරල හිටියොත් හොඳයි කියල." කී බ්‍රැඩ්ස්ට්‍රීට් මාංචු යුගල තම සාක්කුවේ ඇති බව පෙන්වීමට එයට තට්ටු කළේය. සාක්කුව තුළින් ලෝහ ගැටෙන හඬක් ඇසිණ.

ප්‍රධාන පාරෙන් හැරවූ අශ්වකරත්තය ඊස්ට්ලින් දෙසට වැටුණු අතුරු පාරේ ගමන් කළේය.

"ඔබ හිතන්නෙ සර් ඩෙනිස්ට විරුද්ධව ඇති සාක්ෂි ප්‍රමාණවත් කියලද?" මගේ මිත්‍රයා ඇසුවේ පයිප්පය නිමා, කබා සාක්කුවට දමා ගනිමිනි.

"හොඳටම ප්‍රමාණවත් හෝම්ස් මහත්මයා" පොලිස් නිලධරයා කීය. "මැකෝලි සාමි ඝාතනය කළේ සර් ඩෙනිස් කැමරන් බව මට සහතිකයි. ඒ බව ජූරි සභාවකට ඒත්තු ගන්වන්න තරම් සාක්ෂි මට තියෙනවා."

මේ වනවිට අප ආ කුලීරිය ඊස්ට්ලින් මැඳුරේ මල්උයන මැද තණබිමට ළඟාවී තිබිණ. හෝම්ස්ගේ උපදෙස් අනුව රියැදුරා රථය එහි නැවැත්විය.



http://sherlockholmesinvestigations.blogspot.com



"මං යෝජනා කරනවා, අපි මුලින්ම සර් ඩෙනිස් හමුවෙන්න නොගිහිං ඔහුගේ සේවකයෙකු හමුවෙලා එමුයි කියලා" හෝම්ස් කීවේ, මැඳුරට යාර දෙසියයක් පමණ ඈතින්, උද්‍යානයේ ඈත කෙළවරේ වූ නිවාස දෙසට අත දිගු කරමිනි.

"ඒ මොකටද? කවුරු හම්බවෙන්නද?" පොලිස් නිලධරයා විමසුවේ තරමක විමතියකට පත්ව ය.

"අපි යමු අන්න අර ඈතින්ම තියෙන නිවසට" හෝම්ස් කීය. "ඒකෙ පදිංචිවෙලා ඉන්නෙ සර් ඩෙනිස්ගෙ උද්‍යාන සේවකයා - ඒ වයස්ගත ෆර්ගසන්, ඔහුගේ බිරිඳ සහ දියණිය. ඔවුන් හඳුනාගන්න ඔබ දෙදෙනා කැමැති වෙනවාට සැක නෑ. උද්‍යාන සේවකයා ඉංග්‍රීසි ජාතිකයෙක්. ඔහු තරුණ කාලයේ නාවිකයෙක් හැටියටයි රැකියාව කරල තියෙන්නේ. ඔහුගේ බිරිඳ දකුණු ඇමරිකාවේ බ්‍රසීල ජාතික කාන්තාවක්. ඔහුට ඇය හමුවෙලා තියෙන්නේ ඔහු සේවය කළ නැව, බ්‍රසීලයේ රියෝ ග්‍රෑන්ඩේ කිට්ටුව මුහුදුබත්වෙලා ගම්වාසීන් විසින් ඔවුන් බේරාගත් වෙලාවෙ. ඔවුන්ගේ දියණිය වෙරෝනිකා ෆර්ගසන් හමුවෙන්නහත් ඔබ කැමැතිවේවි. ඔන්න අපි ඔවුන්ගේ ගේ ළඟටම ආවා"

මල් උයන මායිමේ පිහිටි ඇපල් හා පීච් ගස් අතරින් පහළට බැස යා හැකි තරප්පු පෙළක් පිහිටා තිබිණි. මා ඔබට කලින් ද සඳහන් කළ නිවාස තුන අතුරෙන්, ෆර්ගසන්ගේ නිවස වූයේ ඈතින්ම වූ විශාල පැරණි නිවසය.

කෙළින්ම සර් ඩෙනිස් හමුවීමට නොයා මගේ මිත්‍රයා අප මෙහි කැඳවාගෙන ආවේ, යම්කිසි වැදගත් අරමුණකින් බව මම දැනසිටියෙමි. උද්‍යාන සේවකයා, මේ මිනීමැරුම කුමන ආකාරයකින් හෝ දකින්නට ඇතැයි මම අනුමාන කළෙමි. ඔහු ප්‍රබල මෙන්ම අත්‍යවශ්‍ය සාක්ෂිකරුවකු වනු ඇත. එහෙත් සර් ඩෙනිස් භාරයට ගැනීමේ කටයුත්ත අසෙකට ලා මෙහි පැමිණීම ගැන බ්‍රැඩ්ස්ට්‍රීට් සිටියේ නොසතුටෙනි.

ඉතා පිරිසිදුව තබාගෙන පුදුවැලි අතුරා තිබූ මිදුල සෑහෙන තරම් විශාල එකක් විය. නිවසේ දොර ජනෙල් වසා තිබිණ. තම නළල රැළිකර පුදුමයෙන් මෙන් මා දෙස බැලූ හෝම්ස් දොරට තට්ටු කළේය. මඳ වේලාවකින් දොර විවෘත විය. එසේ කරන ලද්දේ වයස අවුරුදු හැත්තෑවක් පමණ වූ එහෙත් ශක්තිමත්, මදක් කුදු ගැසුණු



http://sherlockholmesinvestigations.blogspot.com

මිනිසෙකු විසිනි. උද්‍යාන සේවක ෆර්ගසන් මොහු විය යුතු යයි මම අනුමාන කළෙමි. කවරයක දමූ ඇමිණුම් ලියවිල්ලක් ඔහු අතේ තිබෙනු මම දුටුවෙමි.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඇතුළට එන්න" ඔහු කීය. "ඔබතුමා අද යලිත් වරක් මෙහේ එන්න ඉඩතියෙන බව මගේ බිරිඳ හා දුව කිව්වා. මේ ලියුම ඔබට භාරදෙන්න කිව්වා"

"භාරදෙන්න කිව්වා?" හෝම්ස් එයට ප්‍රතිචාරය කළේ විස්මයට පත් අයුරෙනි. "ඇයි කෝ ඒ දෙන්නා දැන්?"

"බිරිඳගේ ඥතීන් බලන්න ලන්ඩන් බලායන්න ඊයෙ රෑ ඔවුන් තීරණය කළා." ෆර්ගසන් කීය. "ඒකට ඔවුන් කලින් ඉඳලම බලාපොරොත්තුවෙන් ඉඳල තියෙනවා. ඒත් මට ඒක කිව්වෙ ඊයෙ රෑ දහයට විතර. ඊටපස්සෙ කුලී කරත්තයක් ගෙන්වාගෙන රෑ දොළහට විතර දුම්රියපොළට ගියා"

කිසිවක් නොකී හෝම්ස්ගේ දකුණු අත්ල නළලට ගියේ නිතැතිනි. ඔහු බලාපොරොත්තු නොවූ යමක් සිදුවී ඇති බවත්, එයින් ඔහු කැලඹීමට පත්ව ඇති බවත් මම තේරුම් ගතිමි. අසුනක වාඩිවූ ඔහු කවරය විවෘතකර ලිපිය කියවීමට පටන්ගත්තේය. ඒ අසලින් සිටගත් අපි ලිපිය වෙත නෙත් යොමු කළෙමු.

"රහස් පරීක්ෂක ෂර්ලොක් හෝම්ස් මහතා වෙතටයි.

මේ ලිපිය ඔබ අතට පත්වන විට, අපට ස්ප්‍රිංෆීල්ඩ්වලින් ඈතපුම් සියගණනක් ඈතට යාමට හැකිවේතැයි මම විශ්වාස කරනවා. අප සොයන්න උත්සාහ කරන්න එපා. ඒක නිශ්ඵල ව්‍යායාමයක් වේවි. මා ගත් ක්‍රියාමාර්ගය සාධාරණ මෙන්ම නිවැරදි එකක් බව ලිපිය කියවූ පසු ඔබට තේරුම් යාවි! ඒ නිසා මම සම්පූර්ණ සත්‍යය හෙළිකරන්නම්.

මගේ තාත්තා දුප්පත් නුගත් උද්‍යාන පාලකයෙකු වුණත්, මගේ අම්මා බ්‍රසීලයේ හමුදා නිලධරයෙකුගේ දියණියක්. තරමක අධ්‍යාපනයක් ලැබූ ඇය බුද්ධිමත්, එහෙත් අයුක්තිය අසාධාරණය ඉදිරියේ තදින් කෝපයට පත්වන තැනැත්තියක්. ඇගේ ඒ ස්වභාවය ජන්මයෙන් මට ද උරුම වී තිබෙන බව, මගේ පියා නිතර කියන දෙයක්. දකුණු ඇමරිකානු සර්ම කලාපීය රටවල වැසියන්, ක්ෂණිකව කෝපාවිෂ්ට වන, වෛර බැඳගත් විට එය අමතක නොකරන පළිගන්නා අය යයි එංගලන්තයේ අය පවසනවා. එය



http://sherlockholmesinvestigations.blogspot.com



ඇත්තක්ද යන්න මම දන්නේ නෑ. කෙසේ වුණත් මට ඉතිරිව ඇත්තේ මඳ කාලයක් පමණක් නිසා සියල්ල ඔබට කෙටියෙන් පවසන්නම්.

මැකෝලි සාමි හෙවත් බ්‍රයන්, මට මුලින්ම හමුවුණේ මීට අවුරුදු දෙකකට පෙරදී. නත්තල් උත්සවය වෙනුවෙන් ගමේ දේවමැඳුරේ කැරොල් ගායක කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස මම ද සිටියා. කැරොල් කණ්ඩායමට හා දුප්පතුනට තෑගි බිරි නැමූ උත්සවයේ ප්‍රධාන අමුත්තා වුණේ මැකෝලි සාමි.

ඔහු මීට පෙර දෙවරක්ම විවාහ වී, එම විවාහ දෙකම දික්කසාදයෙන් කෙළවර කොට තිබූ පුද්ගලයකු බව මට දැනගන්න ලැබී තිබුණා. ඔහු මේ ගමේ ප්‍රදේශයේ තරුණියන් කිහිපදෙනෙකුට ආදරය කොට, ඔවුන්ගේ හදවත් බිඳ දැමූ චපල පුද්ගලයෙකු බවත් මගේ මිතුරියන්ගෙන් මට අහන්න ලැබුණා. ඔහු සුදුවට ගොස් විශාල ධනස්කන්ධයක් විනාශකර දැමූ සුදුඅන්තුවෙකු බවත්, බේබද්දෙකු බවත් මා නොදැන හිටියා නොමෙයි. ඒත් අවාසනාවක මහත! මගේ හිත ඇදී ගියේ ඔහුටයි. මගේ ආදරණීය මව සහ පියා මේ සම්බන්ධයට විරුද්ධවෙලා ඒක නවත්වා දමන මෙන් මට ආයාචනා කළා. ඒත් මම අන්ධයෙකු වගේ බිහිරෙකු වගේ ඔහුට ආදරය කළා. මා විවාහකරගන්නා බවට ඔහු දුන් පොරොන්දු විශ්වාස කළා. එහෙත්..... අහෝ දෙවියනි!

මගේ පියා වූ සර් ඩෙනිස්ගේ දියණිය රූප සුන්දරියක් පමණක් නොමෙයි; ඇය රාජකුමාරිකාවක් මෙන් ධනවත් තැනැත්තියක්. මං දුප්පත් උයන්පල්ලෙකුගේ දියණියක්.

ඇය හඳුනාගන්න ලැබුණාට පස්සේ, මට දුන් පොරොන්දු හැම එකක්ම ඔහුට අමතක වුණා. ධනකුවේරයකුගේ දියණිය විවාහකර ගැනීම වඩාත් වාසිදායක බව ඔහුට සිතෙන්න ඇති. ඔහුට උවමනා ඇගේ පියාගේ වස්තුව බව කැනී කැමරන් කොහොම හිතන්නද?

මම කිහිපවරක් ඇය හමුවී මේ ගැන ඇයට කරුණු පැහැදිලි කරන්න උත්සාහ කළා. මං වගේම මෝඩියක වූ ඇය, මං කියූ හැම දෙයක්ම ප්‍රතික්ෂේප කළා. තව තවත් අසරණ ජීවිත විනාශකරන්න මැකෝලි සාමිට ඉඩදිය යුතුද? අන්තිමට මගේ හිතේ ඔහු වෙත තිබූ ආදරය හැරුණේ වෛරයට. එහෙත් ඔහුගේ හිත කොහොම හරි වෙනස්කරගන්න අන්තිම උත්සාහයත් යොදන්න මං හිතාගත්තා.



http://sherlockholmesinvestigations.blogspot.com

ක්‍රීඩා සමාජයේ බාල්නැටුමට දෙදිනකට පෙර ද හැන්දෑවේ මං ඔහු හමුවෙන්න ඔහුගේ නිවසට ගියා. මාව අත්හැර නොදමන මෙන් මං ඔහුට ආයාචනා කළා. නමුත් ඔහු කළේ මොකක්ද? මට අපමණ නින්දා අපහාස කළ බ්‍රයන්, මට තර්ජනය කළා. කැතී මෙනෙවිය හා ඔහුගේ විවාහයට මං බාධා කළොත් මාව මරාදමන බවට ඔහු තර්ජනය කළා. එවැනි දේ තුමන් මීට පෙර ඇමරිකාවේදී කර තිබෙන බවට ඔහු වහසිබස් දෙඩුවෙ, රිවෝල්වරයක් මගේ මුහුණට එල්ල කරමින්. මං කියූ කිසිදේකට කන්දෙන්න ඔහු කැමතිවුණේ නෑ. එද මහවැසි තිබුණු දවසක්. ඔහුගේ නිවසෙන් එළියට "පලයන්! පලයන්!" කියමින් මා තුල්ලුකර දමූ ඔහු අවඥ සහගත ලෙස මහ හඬින් හිනාවෙලා දොරවහල දැම්මා.

අන්තිමට මගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගියා. දකුණු ඇමරිකානු ගැනුන්ගේ ලේවල ඇති වෛරය හා කෝපය, උතුරු ඇමරිකානු අයගේට වඩා වෙනස් බව ඔහු දැනගෙන ඉන්න නැහැ. මං තීරණයක් ගත්තා.

සර් ඩෙනිස්ගේ උද්‍යානයේ වැටීමට මල්පැළ ඇත පළාත්වලින් හා පිටරටින් ගෙන ඒම වරින්වර සිදුවෙන දෙයක්. එහෙම දවස්වලට ඒ කටයුතු තනියෙන්ම කරගන්න, මගේ පියාට හැකියාවක් තිබුණේ නෑ. ඔහුගේ උදව්වට කැඳවාගෙන ගියේ මාව. ඊට අමතරව ජෝන් නම් කොලුගැටයාත් මේ වැඩට කැඳවාගත්තා. ඔහු ටොරිංටන්වල කෙනෙක්. ඊස්ට්ලින් මන්දිරය පිරිසිදු කිරීමේ කටයුතුවලටත් ඔහු දවසක් ඇර දවසක් ආවා. මේ ජෝන් මට හරි හිතවත්. මාසෙකට විතර කලින් දවසක් අපි දෙන්නා මල්පැළ හිටවමින් ඉන්නා අතරේ ඔහු මට කථාකළා.

"අක්කේ" ඔහු කිව්වා. "මං ළඟ තියෙනවා වටිනා බඩුවක්. මට හදිසියකට මුදල් ඕනවෙලා තියෙනවා. පවුම් දෙකක් දෙන්න පුළුවන් නම් මං ඒක අක්කට විකුණන්නම්."

"මොකක්ද බඩුව?" මං ඇහුවා.

"කාටවත් කියන්න එපා" ඔහු රහසින් කිව්වේ මා ළඟටම ඇවිත්. "හොඳ රිවෝල්වරයක්. මේක පවුම් පහකට වඩා වටිනවා. උණ්ඩත් තියෙනවා. මේක ලන්ඩන්වල ඉන්න මගේ යාළුවෙකුට හදිසියේ සල්ලි උවමනාවෙලා මට විකුණපු එකක්"

"මට මොනවටද මල්ලි රිවෝල්වරයක්?" මං ඇහුවා. "ඔයාට මුදල් හදිසියක් නම් මං අම්මගෙන් ඉල්ලලා පවුම් දෙකක් දෙන්නම්.



http://sherlockholmesinvestigations.blogspot.com



ඔයාට කියල කියන්නෙ නෑ. අපි දුප්පත් මිනිස්සු. ඒ නිසා ඔයාගෙ හදිසිය ඉවරවුණාම මුදල් ආපහු ගෙනැත් දෙන්න"

"හරි. මට පුළුවන් ඉක්මනටම මං අක්කට පවුම් දෙක බේරන්නම්. ඒ වුණත් දැනට ඔයා රිවෝල්වරය ඒකෙ උණ්ඩත් එක්ක ගෙදර ගෙනිහිං හංගල තියාගන්න. කවුද දන්නෙ? බාගවෙලාවට ගෙදරට හොරු ආවොත්? ආයුධයක් උවමනා වෙන වෙලාව කියන්න බෑ"

එහෙම කියූ ඔහු එද නවක හීස් පෝර උරයක දමා එය මට ගෙනවිත් දී, පවුම් දෙක මගෙන් ලබාගත්තා. එයට වෙඩිඋණ්ඩ දමන හැටිත්, එය ක්‍රියාකරවන හැටිත් ජෝන් මට රහසින් පෙන්නුවා. කොයි වෙලෙත් ඒකෙ වෙඩි උණ්ඩ දමා තිබීම නුවණට හුරු බවයි ඔහු කිව්වෙ.

ගෝල්ඩන් ඊගල් ක්‍රීඩා සමාජයේ බාල්නැටුමට කැතී හා බ්‍රයන් සහභාගි වෙන බව මං දැනහිටියා. ඔවුන් ආපහු එනතෙක් රාත්‍රි එකේ සිට මං ඇපල් ගහක් යට හැංගී බලාගෙන හිටියා. අන්තිමට ඔවුන් ආපහු එද්දී පාන්දර තුනට ළංවී තිබුණා. එකිනෙකාගේ දෑත් පටලවාගත් ඔවුන් ඊස්ට්ලින් මන්දිරයට ඇතුළුවෙන තුරු, මං බලාගෙන හිටියේ නොඉවසිල්ලෙන්. ඊටපසු මගේ අතේ තිබුණු ගිනිඅවිය මගේ ගවොමේ සාක්කුවට දමාගෙන අඳුරේ නවත්වා තිබූ අශ්වකරත්තයට නැඟුණා. එහි පිටුපස අසුන ළඟ පහත්වෙලා මං හැංගුණා.

මිනිත්තු කිහිපයකින් බ්‍රයන් ආපහු ආවා. ඔහු කරත්තයට නැගී එය දක්කාගෙන යන්න පටන්ගත්තා. ගෙවල් දොරවල් නැති පාළු අඩවියකට කරත්තය යන තුරු, මං ඉවසාගෙන හිටියේ හරි අපහසුවෙන්. මංසන්ධිය පහුකළා වගේම ඒ පාළු අඩවිය. මං හැංගී හිටි තැනින් ඉහළට එසවුණා.

"බ්‍රයන්! මේ බලපං!" මං කිව්වේ ඔහු දෙසට රිවෝල්වරය එල්ල කරමින්.

එක්වරම තිගැස්සුණු ඔහු ආපසු හැරී බැලුවා. "නැතිරි! උඹ මොකක්ද මේ කරන්න හදන්නේ!" ඔහු කෑගැහුවේ වියරුවෙන් වගේ. "උඹ හදන්නේ මාව..... මාව..... මාව....."

ළඟ ඉඳන් ම මං වෙඩිපහරක් එල්ල කළත් ඒක වැරදී ගියා. ඒත් දෙවැනි වාරයේ එහි ඉලක්කය වැරදුණේ නැහැ. ඔහු අසුන මත



http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

ඇදවැටෙද්දී, අශ්වකරත්තය කාණුව දෙසට ඇදීගියා. මීළඟට මම කරන්න ඕන කුමක්ද කියන එක මට හිතාගන්න බැරිවුණා. කරත්තය කාණුවට වැටී නැවතුණු වහාම මම එයින් එළියට පැනගත්තා. ඊළඟට නිවස දෙසට ආපහු එන්න පිටත්වුණා. ප්‍රධාන පාරෙන් ආවොත් කිසිවෙකු හමුවේය කියන බියෙන්, මං ආවේ වතු උඩින් වැටී තිබුණු අඩිපාරවලින්. ඊළඟට උද්‍යානයේ මල් සිටුවීමට කපා තිබූ වළකට රිවෝල්වරය දමලා පස්වලින් වැහුවා.

මං හිතාගෙන හිටියේ අපරාධය කළ පුද්ගලයා සොයාගත නොහැකිව, ඒ ගැන සෙවීම පොලීසිය විසින් අත්හැර දමාවි කියලයි. නමුත් අද උදේ වරුවේ ඔබ ඊස්ට්ලින් මන්දිරයට ඇවිත් මල්උයන හා තණබිම පරීක්ෂා කළ හැටි මං ඈත සිට බලාගෙන හිටියා. ඔබ හුඟක්වෙලා ඔලිවර් වෙස්ට් සමග කතාබහ කළ හැටි මං දුටුවා. ඔහු කථාකළේ අපේ නිවස පිහිටි පැත්තට අත දිගු කරමින්. ඒ අනුව මේ රහස ඉක්මනින් හෙළිවීමට ඉඩ ඇති බව මට වැටහුණා. ඕපාදූප කප්පිත්තෙකු වන වෙස්ට්, ඔහු දැනසිටි සියල්ල, ලුණු ඇඹුල් ඇතිව ඔබට කියන්නට ඇතුවා නොඅනුමානයි.

ෂර්ලොක් හෝම්ස් මහතාණෙනි. සුළු සුළු හේතුවල් නිරීක්ෂණය කර නිගමනවලට ඒමට ඔබට ඇති විශිෂ්ට හැකියාව ගැන මං සගරා, පුවත්පත්වලින් කියවා තියෙනවා.

ඊළඟට අද හැන්දෑවේ ඔබ අපේ නිවස ළඟට ඇවිත් මගේ පියා එක්ක කළ කතාබහට මං කන්දුන්නා. වැඩියමක් ඔබ නොකිව්වත් මට හිතුණේ ඔබ තීරණයකට ඇවිත් කියලයි. මගේ පියා අවංක කෙනෙක්. ඔහුගේ හිතේ මැකෝලි සාමිගේ මරණය ගැන කණගාටුවක් නැතිබව, ඔහු හංගන්න උත්සාහ කළෙත් නෑ. මැකෝලි ඝාතනය කළේ සර් ඩෙනිස්ටත්, වෙනිං කවුරුහරිවත් නොවෙන බව, ඔබට වැටහෙන්න ඇති. ඒ නිසා හෙට පාන්දර ඔබ පොලීසිය සමග ඇවිත් මාව හිරබාරයට ගන්න බව මට සහතිකයි. මට විරුද්ධව නඩු විභාගයක් පැවැත්වුණොත් මට මරණ දඬුවම නියමවේවි. එහෙම වුණොත් ඒ දුකෙන්ම අඬා වැලපිලා මගේ අම්මාත් තාත්තාත් මියයාවි. ඒ නිසා මං තීරණයක් ගත්තා. මං මෙහෙන් පැනයනවා. ඒ ඔබ කාටවත් කවදාවත් හොයන්න බැරි තැනකට. එංගලන්තයේ ඉඳන් යුරෝපයට පැනගැනීම බොහොම පහසුයි. යුරෝපය කියන්නේ මහ විශාල ප්‍රදේශයක්. ඔබ කොයිතරම් දක්ෂවුණත් මාව හොයාගැනීමට ඔබට හැකිවෙන්නේ නෑ. මා සමග මගේ අම්මාත් පිටත්වී යනවා. ඒ එක් අතකින් මගේ ආරක්ෂාව ගැන හිතලා. අනෙක අම්මාගෙන් වෙන්වෙලා නාඳුනන රටක තනියෙන් මට ජීවත්වීම අමාරු නිසා.

අවසන් වශයෙන් තවත් කරුණක් මං කියන්නම්. මේ මිනීමැරුමට වෙන කිසිම කෙනෙක් සම්බන්ධ නෑ. සර් ඩෙනිස් කැමරන් වැදගත් මහත්මයෙක්. මා මෙවැන්නක් කරන බව ඔහු දැනහිටියේ නෑ. මගේ අසරණ තාත්තාට මේ කිසිදෙයක් කියන්න එපා. ඔහු ඉවසීමෙන් පරිපූර්ණ කරුණාවන්ත ගම්බද ගොවියෙක්. නෑදෑයින් දකිමට ලන්ඩනයට යන බවයි මං ඔහුට කිව්වේ. දැන් ඉතින් ඔබට ආයුබෝවන්.

ඔබයට අවංක,

වෙරෝනිකා ෆර්ගසන්.

ප.ලි. මා පාවිච්චි කළ රිවෝල්වරය උද්‍යානයේ උතුරු කෙළවරේ පාමගස් සෙවණේ අලුතෙන් හිටවූ ලිලැක් මල්පඳුරු යට ඇත.

"මෙකී නම් යක්ෂ ගෑහැනියක්" හෝම්ස් කීවේ ලිපිය නමා කබා සාක්කුවට දමාගනිමිනි. මෙම තරුණ කාන්තාව තමා පරාජය කර පැනයාම ගැන ඔහු අතිශය ලැජ්ජාවට පත්වූ බව මම තේරුම් ගතිමි.

එතැනින් පිටවී ආ අපි, සර් ඩෙනිස් කැමරන්ගේ ඊස්ට්ලින් මැඳුරට ද ගොඩවැදුණෙමු. ඔහුට තොරතුරු එක්වරම හෙළිකිරීමට බ්‍රැඩ්ස්ට්‍රීට් කැමැත්තක් දක්වූයේ නැත.

"හෝම්ස් මහත්මයා. ඔබ හිතන්නේ වෙරෝනිකා ෆර්ගසන් කළ දේ සාධාරණයි; ඒ නිසා හැමදේයක්ම මෙතැනින් අත්හැර දැමිය යුතුයි කියලද?" බ්‍රැඩ්ස්ට්‍රීට් විමසුවේ, ලන්ඩන් බලායාමට අප දුම්රියේ අසුන්ගත් පසුවය.

"මං කොහොමටවත් එහෙම හිතන්නේ නෑ" හෝම්ස් කීය. "මේක මනුෂ්‍ය ඝාතනයක්"

"එහෙම නම් අපි වහාම ඇය සෙවීමේ කටයුතු අරඹන්න ඕන. ඇය ගැන පුවත්පත්වල ප්‍රසිද්ධ කරලා, වරායවලට දැනුම්දීලා යුරෝපා මහාද්වීපයේ පොලිසි දැනුවත් කළ යුතුයි"

"ඔව්. ඒක ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ වගකීම" හෝම්ස් කීය. "නමුත් මම හිතන්නේ මෙහෙමයි. යුරෝපයට යන බවක් ඇය







www.sinhalaelibrary.com

කියලා තියෙන්නෙ අප කොහොමද යවන්න. ඈය ලන්ඩන් හෝ සවුත්හැම්ටන් වෙත ගිහිං ඒ කිට්ටුව කොහේ හරි හැංගිලා ඇති. ඒවට ඔනතරම් පහසුකම් වරාය කිට්ටුව ගෙවල්වල තියෙන බව ඔබ දන්නවා. ඈය යන්නෙ යුරෝපයට නෙමෙයි"

"එහෙනම්?" බ්‍රැඩ්ස්ට්‍රීට් මෙන්ම මා ඇසුවේ එක්වරමය.

"ඈය යන්නෙ බ්‍රසීලයට" හෝම්ස් කීවේ සිනාසෙමිනි. "ඇගේ මවගේ රට බ්‍රසීලය. ඒක රටකට වඩා මහාද්වීපයක්. ඒ රටවල නීතිය ක්‍රියාත්මක වෙන හැටි ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැනේ. මං හිතන්නෙ නෑ ඈයව අල්ලාගන්න අප කාටවත් හැකිවේවි කියලා. නමුත් උත්සාහ කර බලන්න"

"හෝම්ස් මහත්මයා, මටත් හිතෙනවා ඔබ නිවැරදියි කියලා" බ්‍රැඩ්ස්ට්‍රීට් කීය. "කොහොම වුණත් දකුණු ඇමරිකාව බලා යාත්‍රා කරන නැව්වල කාමර වෙන්කරන අම්මලා දුවලා ගැන සෝදිසියෙන් ඉන්න කියල මං වරාය පොලිසිවලට දැනුම් දෙනවා"

"ඒක නෙමෙයි හෝම්ස්" මම කීවෙමි. "මේ ඝාතනය කළ අපරාධකාරිය වෙරෝනිකා බව ඔබ සොයාගත්තෙ කොහොමද? ඒ ගැන කිසිවක් ඔබ අපට කිව්වේ නැහැනෙ"

"ඔව් වොට්සන්. මට ඒක කියන්න අවස්ථාවක් ලැබුණෙ නැහැනෙ" මගේ මිතුරා කීවේ දිගු කථාවකට මුලපුරමිනි. "ඊස්ට්ලින් මැදුරට එන අශ්වකරත්ත නවත්වන තැන ඔබ දෙදෙනාම දුටුවා. නිතර වාහන එහා මෙහා යෑම නිසා උද්‍යානයේ ඒ හරියේ තණකොළ මැරී කළු පස මතුවී තිබුණා. 22 හා 23 වැනිදා තිබූ වැස්සෙන් බුරුල් පොළොවට වතුර උරාගෙන. මං අවධානය යොමු කළේ ඒ මෘදු පොළොවේ සලකුණු වී තිබූ පා සටහන්වලට.

සර් ඩෙනිස්, මැකෝලි සාමි, ඔලිවර් යන පිරිමි තිදෙනාගේත් කැති මියුරියෙල් හා ටයිලර් මහත්මිය යන ගැහැනු තුන් දෙනාගේත් පා සටහන් පිළිබඳව මා වොට්සන්ට කලින් කිව්වා. මේ අයගේ නොවෙන ප්‍රමාණයෙන් විශාල කාන්තා පා සටහන් ගැනත් මං ඔබට කිව්වා. ඒවායේ විශේෂත්වය වුණේ මට ඒවා දකින්න ලැබුණේ එකම පේළියක් පමණයි. ඒකත් පුළුල්ව අතුවිහිදුණු ඇපල් ගහක මුල ඉඳල පටුරෝද සහිත අශ්වකරත්තය වෙත ආ කෙනෙකුගේ අඩි සලකුණු. ඒකෙන් අපට හිතාගන්න පුළුවනි, ඒ තැනැත්තිය රියට නැඟී පිටවී ගිය බව. ඒවා පිරිමියෙකුගේ වැනි ප්‍රමාණය ලොකු පා සටහන්.



http://sherlockholmesinvestigations.blogspot.com



ඊළඟට ඔලිවර් සමග ඔහුගේ උදේ කළ කතාබහෙන් මට අත්‍යවශ්‍යම තොරතුරු දැනගැනීමට හැකිවුණා. සවස මං යළිත් වරක් එහි ගිය වෙලාවෙ ෆර්ගසන් නිවසටත් ගියා. මං කියූ ඒ පා සටහන්, වැලි ඇතිරූ මිදුලේත්, පැහැදිලිවම දකින්න ලැබුණා. ගෙදර පිරිසිදු කිරීමේ කටයුතුවලට පැමිණෙන ජෝන් ෆර්ගසන් පවුල සමග හිතවත් බව මට ඔලිවර්ගෙන් දැනගැනීමට හැකිවුණා. සර් ඩෙනිස් කිව්වේ ඇත්ත නම්, ඔහුගේ රිවෝල්වරය නැතිවුණේ කොහොමද, එය අන්තිමට ගියේ කොහේටද කියන එක මට හිතාගැනීම අපහසු වුණේ නැහැ. මුලින් මගේ හිතේ සැකයක් ඇතිවුණේ බ්‍රසීල ජාතික ෆර්ගසන් මහත්මිය ගැනයි. නමුත් ඊයේ හැන්දෑවේ මං තානායමට එමට පෙර මැකෝලිසාමිගේ නිවසට ගියා. මරණයට දින දෙකකට කලින් ඔහු වෙරෝනිකා ෆර්ගසන් මෙනෙවියට අවිනීත ලෙස බැණවැදී ඈය ගෙදරින් එළවා දැමූ බව ඔහුගේ සේවකයාගෙන් දැන ගැනීමට හැකිවුණා."

ස්කොට්ලන්ඩ්යාඩ් නිලධරයන් කොපමණ උත්සාහ දැරුවත් වෙරෝනිකා හා මව අල්ලාගැනීමට නොහැකි විය. චෝදනා එල්ල කිරීමට සැකකරුවකු නොවූ බැවින් මිනීමැරුම පිළිබඳ පරීක්ෂණය අත්හැර දමන ලදී. මාස කිහිපයකට පසු කැතරින් කැමරන් මෙනෙවිය, දකුණු අප්‍රිකාවේ සිවිල්සේවය සඳහා තේරී සිටි ග්‍රැහැම් තොම්සන් නම් තරුණයෙකු සමග විවාහ වී, කේප්ටවුන් බලා පිටත්ව ගිය බවට පුවත්පත්වල පළවිය. මෙම සිදුවීමෙන් අවුරුද්දකට පසු සර් ඩෙනිස් කැමරන් ගෙන් හෝම්ස් වෙත ලිපියක් ලැබිණි.

හිතවත් ෂර්ලොක් හෝම්ස් මහතාණනි,

මැකෝලි සාමිගේ මරණය සම්බන්ධයෙන් මට විරුද්ධව චෝදනා එල්ල වෙමින් තිබියදී, ඔබ මැදිහත්ව සත්‍යය හෙළිකළ අයුරු මට අමතක කළ නොහැක. මා මෙය ලිවීමට සිතුවේ ඒ හා සම්බන්ධ තවත් කරුණක් ගැන ඔබ දැනුවත් කිරීමටය.

වෙරෝනිකා හා ඇගේ මව නිවසෙන් පැනගිය පසුව ද ෆර්ගසන් මාස කිහිපයක් මගේ උද්‍යාන සේවකයා ලෙස කටයුතු කළේය. දිනක් තම ඥතීන් දැකීමට ලන්ඩන් යන බව කියා පිටත්ව ගිය ඔහු, යළි ආපසු ස්ප්‍රිංෆීල්ඩ් වෙත පැමිණියේ නැත. ඔහු පිළිබඳ කිසිම ආරංචියක් නොලැබිණි.



http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු මා වෙත එවා තිබූ ලිපියක් ඊයේ තැපැල් මගින් මා අතට පත්විය. මට නොදන්වා සේවය අත්හැර යාම ගැන ඔහු මගෙන් සමාව අයැද ඇත. ලිපිය බ්‍රසීලයේ සාඕ පාවුලෝ නගරයෙන් තැපැල්කර ඇති බව කවරයේ ඇති තැපැල් මුද්‍රාවේ සඳහන් වේ.

දෙස්තර වොට්සන් වෙතද මගේ ආශිංසන පිරිනමනු මැනවි.

මෙයට හිතවත්,

සර් ඩෙනිස් හැමරන්.

"මං ඔබට කිව්ව නේද වොට්සන් ඈය යන්නේ බ්‍රසීලයට මිස යුරෝපයට නොවෙයි කියල?" කී හෝම්ස් ලිපිය ලාච්චුව තුළට දමා වයලීනය අතට ගත්තේය.

**නිමි.**

බලාපොරොත්තුවන්න,

ළඟදීම.....

**ප්‍රදීපාගාරයේ වික්‍රමය සහ**
**තවත් ෂර්ලොක් හෝම්ස් කථා**

Reading Purpose Only.. Not For Print.
www.sinhalaelibrary.com
Reading Purpose Only.. Not For Print.


http://sherlockholmesinvestigations.blogspot.com
http://sherlockholmesinvestigations.blogspot.com

# THE WOMAN IN RED

# රතුවත හැඳි කත



- පොලීසියට භීතිකර තිගේ

[illegible]

- රතුවත හැඳි කත

"...වයස අවුරුදු 35 යි [illegible] 5 යි. [illegible]"

- සුදුඅන්තුවා

[illegible]

සමග

- මැණික් පළඳනාව
- ශාපලත් සොහොන

ISBN 955-1262-00-X

මිල රු. 225/-

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන